භදන්තාචරිය ධම්මපාල ස්ථවිරපාදයන් විසින් විරචිත

## පරමත්ථ දීපනී නම් වූ

# පේතවත්ථු අට්ඨකථා

## (සිංහල පරිවර්තනය)



ප්‍රකාශනය

**බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය**

# පේතවත්ථු අට්ඨකථා
# පළමුවැනි භාගය

භදන්තාචරිය ධම්මපාල මහා ස්ථිවිරපාදයන් විසින් විරචිත පරමත්ථදීපනී නම් වූ අට්ඨකථාව බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ මෙහෙයවීම පරිදි සිංහලට පරිවර්තනය කරන ලද විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා ප්‍රාචීන භාෂා ධ්‍යයනය කරන ලද්දේ, විද්‍යා විශාරද රාජකීය පණ්ඩිත ඉඳුරුවේ උත්තරානන්ද මහානායක මාහිමියන් වෙතින් හා මරදානේ ශ්‍රී ලංකා විද්‍යාලයයෙනි. 1961 දී කැළණියේ විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට ඇතුළත්ව හදාළ අධ්‍යාපනය අවසන්කොට 1965 සිට, රත්මලානේ පරමධම්මචෛතිය පිරිවෙන්හි ගුරුවරයකු වශයෙන් සේවයට පත්විය. 1970 දී ඔහු සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ ව්‍යාප්ති නිලධාරියකු ලෙස පත්වීම භාරගත්හ. 1998 දී බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ සේවයට බැඳුනු සරත්චන්ද්‍ර මහතා බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණයේ කාර්යයන් නිමකොට අට්ඨකථා සිංහල පරිවර්තන ව්‍යාපෘතියේ සම්බන්ධීකාරක වශයෙන් සේවය කරයි. ත්‍රිපිටක අර්ථ කෝෂයේ සංස්කරණයද ඔහු අතින් නිමාවිය.

VOL I

භදන්තාචරිය ධම්මපාල ස්ථවිරපාදයන් විසින් විරචිත

## පරමත්ථ දීපනී නම් වූ

# පේතවත්ථු අට්ඨකථා

(සිංහල පරිවර්තනය)

බුද්ධශාසන අරමුදලේ භාරකාර මණ්ඩලයේ
අනුග්‍රහයෙනි.

පාලි අට්ඨකථා සිංහල පරිවර්තන.23

භදන්තාචරිය ධම්මපාල ස්ථවිරපාදයන් විසින් විරචිත

## පරමත්ථ දීපනී නම් වූ

# පේතවත්ථු අට්ඨකථා

(සිංහල පරිවර්තනය)

සිංහල පරිවර්තනය.
**විජිතනන්ද සරත්චන්ද්‍ර**

අධීක්ෂණය.
**රාජකීය පණ්ඩිත විදුරුපොල ආනන්ද හිමි.**
බී.ඒ. ගෞරව
හොරණ විද්‍යාරත්න මහා පිරිවෙන්හි ආචාර්ය.

ප්‍රකාශනය.

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල

භදන්තාචරිය ධම්මපාල ස්ථවිරපාදයන් විසින් විරචිත

# පරමත්ථ දීපනී නම් වූ
# පේතවත්ථු අට්ඨකථා
(සිංහල පරිවර්තනය)

ප්‍රථම මුද්‍රණය 2008

ISBN- 978-955. 1604-13-4

*පරිගණක අකුරුකරණය*
ලිතෝ ප්‍රින්ටස් - කොහුවල

*පිටකවරය*

සුසිල් ජයශාන්ත පෙරේරා- මහරගම

මුද්‍රණය
**අජිත් ප්‍රින්ටර්ස්**
85/4, පරණ කැස්බෑව පාර, ගංගොඩවිල නුගේගොඩ.
දුරකථනය: 2517269

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල
දු.ක. 2734256, 2728468,2726234 / ෆැක්ස් 2736732
විද්‍යුත් තැපෑල:bcc456@sltnet.lk
www.buddhistcc.com

# ප්‍රස්තාවනා (අට්ඨකථා)

පාළි භාෂාව මධ්‍යතන ඉන්දු ආර්ය පූර්ව අවධියට අයත් ප්‍රාකෘත විශේෂයක් බවත්, එම ප්‍රාකෘතය වූ කලි එකල උත්තර භාරතයේ ඒ ඒ ප්‍රදේශ වල පැවති පොදු ජනයාගේ කථා ව්‍යවහාරය බවත්, පිළිගත් විද්වත් මතයයි. ප්‍රාකෘත ව්‍යවහාරය පොදු ජනතාවගේ හා ශ්‍රමණ සම්ප්‍රදාය ගරුකල චින්තකයන්ගේද භාෂා මාධ්‍යය විය. එය උත්තර භාරතයේ පැතිරී ගිය ඉන්දු යුරෝපීය භාෂා ව්‍යවහාරයෙන් ජනිත වුවක් සේ සැලකිය යුතුය. මෙම ප්‍රාකෘත ව්‍යවහාරයේ ලිඛිත සාධක අනුව මුල අවස්ථාවක් සේ පෙනෙන පාළි භාෂාව උත්තර භාරතයේ කිසියම් විශේෂ ප්‍රදේශයක කථා ව්‍යවහාරයේ මාධ්‍යයක් විය.

1. පාළි භාෂාව ක්‍රි.පූ. 6 වැනි 7 වැනි සියවස් වල කොසොල් රට පැවති කථා ව්‍යවහාරය පදනම් කොට ඇති වූවෙකැයි ද එය නොයෙක් ජනපදවල ජනයාගේ පොදු භාෂා මාධ්‍යය වී යැයි ද මහාචාර්ය රීස් ඩේවිඩ්ස් තුමා පවසයි.

2. පාළිය උජ්ජයිනී ප්‍රදේශයේ භාෂාව යැයි වෙස්ටර් ගාඩ් , ඊ කූන් සහ ඔටෝ ප්‍රොන්කේ වැනි විචාරකයෝ පවසති.

3. පාළිය මගධයේ කථා ව්‍යවහාරයයි යන බුද්ධඝෝෂ හිමියන්ගේ මතය මහාචාර්ය ගෛගර් තුමා අනුමත කරයි.

4. බුදු රජාණන් වහන්සේ මුලදී කොසොල් රට බසින් දහම් දෙසන්නට ඇතැයි සළකන වින්ටර්නිට්ස් පාළි ත්‍රිපිටකයේ භාෂාව පැරණි මගධ ව්‍යවහාරය පදනම් කොට වෙනත් ප්‍රදේශ ව්‍යවහාරයන්ගේ සම්මිශ්‍රනයද ඇතිව, ගොඩනැගුණු බෞද්ධයන්ගේ සාහිත්‍යයික භාෂාවකැයි පවසයි.

5. බුදුන් වහන්සේ ධර්ම ප්‍රචාරයේ යෙදුනු පන්සාලිස් වසින් වැඩි කොටසක් කොසොල් මගධ ප්‍රදේශවල සැරිසැරූ බව බෞද්ධ සාහිත්‍යයයේ පෙනෙන බැවින් පාළි භාෂාව කොසොල් මගධ දෙරට කථා ව්‍යවහාරය පදනම් කොටගෙන බිහි වුවාක් සේ සැලකීමට පුළුවන් බව ඊ කූන් නම් විචාරකයා පෙන්වා දෙයි.

මෙම විග්‍රහයන් ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වන අතර විශේෂයෙන් සැලකිය යුත්තේ බුදුන් වහන්සේගේ මතයයි. බුදු රජාණන් වහන්සේ දක්වා වදාළ ආකල්ප විග්‍රහ වන්නේ මජ්ඣිම නිකායේ අරණ විභඞ්ග සූත්‍රයෙනි. මෙම සූත්‍රයෙන් පෙන්වන්නේ උන්වහන්සේ භාෂා මාධ්‍යයෙහි අනවශ්‍ය ලෙස දැඩිව එල්බ ගත් ශාස්තෘවරයෙකු නොවන බවයි. එකම දෙය විවිධ ජනපදවල නාම කීපයකින් හඳුන්වනු ලබන කළ ඒ එක නාමයක් දැඩිව අල්වා නොගෙන ඒ ඒ ලෙසට ව්‍යවහාර කළ යුතු බවත් ලෝක ව්‍යවහාරය නෙඉක්මවිය යුතු බවත් අරණ විභඞ්ග සූත්‍රයෙහි උගැන්වෙයි.

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ත්‍රිපිටකය සංගීත වූ භාෂාව වන පාළි භාෂාව ථේරවාදීන්ගේ ආගමික භාෂාව විය. එය සමස්ත ත්‍රිපිටකය පුරා රැඳී ගියේය. ථේරවාදීන්ගෙන් බිඳී ගිය මහායානිකයෝ බුද්ධ ධර්මය සංස්කෘතයට පෙරලා ගත්හ. ඔවුන්ගේ සංස්කෘත සාහිත්‍යය දියුණුවීමත්, මුස්ලිම් ආක්‍රමණ වැනි ආක්‍රමණත්, මහායානික දර්ශනය විශ්ව විද්‍යාල මගින් රට මුලුල්ලේහි බෙදා හැරීමත්, මහායානිකයන් ආමිස පූජා යන්ත්‍ර,මන්ත්‍ර ආදියෙන් පෘථග්ජන ජනතා ප්‍රසාදය දිනාගැනීමත්, භික්ෂු විනය නීති ලිහිල් ලෙස මහායානිකයන් විසින් සකස්කිරීමත්, ආදිය නිසා බුද්ධ ධර්මයත්, පාළි භාෂාවත්, බුද්ධජන්මභූමියෙන් අතුරුදහන් විය. එය ශ්‍රී ලංකාද්වීපයේ තහවුරු විය.

හෙළ අටුවා (හෙළටුවා)

සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙසිය පන්තිස් වැන්නෙහි අශෝක අධිරාජයාගේ දායකත්වයෙන් පැලලුප් නුවරදී තුන්වන සංගායනාව පැවැත් වීය. මොග්ගලීපුත්තතිස්ස මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රහතන් වහන්සේලා දහසක් සම්බන්ධ වෙමින් මෙම සංගායනාව පවත්වා ඇත. සාහස්සිකා නමින් හඳුන්වන මෙම සංගායනාව නව මසකින් සම්පූර්ණ විය.

තෘතිය සංගායනාවසානයේ දඹදිව ථේරවාදාචරිය පරම්පරාවේ අවසන් පුරුෂයා වූ මොග්ගලීපුත්තතිස්ස මහා රහතන් වහන්සේගේ ශිෂ්‍ය මිහිඳු මහා රහතන් වහන්සේ විසින් තෘතීය සංගායනාවේදී තෝරා බේරා ගෙන සංග්‍රහ කළ, ථේරවාදී ත්‍රිපිටකය ශ්‍රී ලංකාවට ගෙන එන ලදි. මිහිඳු හිමියන් විසින් ලක්දිවට ගෙන එන ලද පාළි ත්‍රිපිටකය මහා අරිට්ඨ රහතන් වහන්සේ ප්‍රමුඛ කොට ඇති සිංහල භික්ෂූන් වහන්සේලා උගත්හ. පාළියෙන්

තිබූ ත්‍රිපිටකයේ ගැටලු තැන් සිංහල ජනතාවට පැහැදිළි කරදීම අවශ්‍ය විය. බුද්ධ කාලයේ සිට වාචනා මාර්ගයෙන්, ආචාර්ය පරම්පරා වලින් පැවත ආ අර්ථ විවරණ ක්‍රම මිහිඳු හිමියන්ගෙන් සිංහල භික්ෂූන් වහන්සේලා උගෙන පාළි ත්‍රිපිටකයේ ගැටලු තැන් හෙළ බසින් අරුත් විවරණය කළහ. හෙළටුවා නමින් මේවා හඳුන්වයි.

අටුවා වනාහි ත්‍රිපිටකයට අයත් පොත් වලට ලියා ඇති ව්‍යාඛ්‍යාන සංග්‍රහ සමූහයයි. අටුවාවල පරමාර්ථය පෙළෙහි ඇති දුරවබෝධ වචන සහ ධර්මයේ ගැඹුරු තැන් විස්තර කිරීමත් අවශ්‍ය තැන් වලදී විස්තරාර්ථ සැපයීමත් ය. මෙම පරමාර්ථයෙන් ලියන ලද හෙළටුවා නම්,

**මහා අට්ඨකථා**
**කුරුන්දි අට්ඨකථා**
**පච්චරිය අට්ඨකථා නම් වේ.**

හෙළ අටුවා අතුරින් ප්‍රමුඛ ස්ථානය දැරුවේ මහා අට්ඨකථාව හෙවත් මූල අට්ඨ කථාවයි. බුද්ධඝෝෂ හිමියන්ගේ අට්ඨ කථා සියල්ලටම පාහේ ශරීරය කරගෙන ඇත්තේ මෙම අටුවාවයි. තුන් පිටකයටම අයත් අට්ඨ කථාවන්හි මහා අට්ඨකථාව ගැන සඳහන් වන බැවින් එය තුන්පිටකයම අළලා සකස් වුනු හෙළටුවාවක් වශයෙන් සැලකිය හැකිය. වස්තු විෂය අතින් සෙසු හෙළටුවාවන්ට වඩා පරිපූර්ණ වී තිබුණ මහා අට්ඨ කථාවේ, ලක්දිව සිදුවූ දේ පිළිබඳව බොහෝ වෘතාන්ත ද සඳහන්ව තිබුණ බව සිතා ගත හැකිය.

මහා පච්චරිය අට්ඨකථාවට එම නම ලැබුනේ පච්චරියක් හෙවත් පහුරක් උඩදී එය ලියන ලද බැවිනි. කුරුන්දිවේලු විහාරයේදී ලියන ලද හෙයින් කුරුන්දි අටුවා නම් විය.

මෙම ප්‍රධාන හෙළටුවාවන්ට අමතරව තවත් අටුවා කීපයක් දක්නට ඇත. අන්ධ අට්ඨකථාව එයින් එකකි. දකුණු ඉන්දියාවේ කාඤ්චිපුර (කොන්ජිවරම්) යෙහි පැවති අටුවාවයි. එය ආන්ධ්‍රා භාෂාවෙන් ලියා ඇතැයි සැලකේ.

**බුද්ධඝෝෂ හිමි**

දඹදිව බෝමැඩට නුදුරු ඝෝෂ නම් ග්‍රාමයේ බමුණු කුලයක උපත ලද බුද්ධඝෝෂ වාදයෙහි දක්ෂ වූ රේවත නම් මහා තෙරපාණන් වෙත පැවිදි

වූ බව ප්‍රචලිත මතයයි. බුද්ධඝෝෂ මහාබෝධි මණ්ඩපයට දකුණු දිග බමුණුගම උපන් බව සද්ධම්මසංගහ නම් පොතෙහි සඳහන් වේ. බෝමැඩට නුදුරෙහි ඝෝෂ නම් වූ ගමේ උපන් බව බුද්ධඝෝසුප්පත්ති නම් කථාවේ ද සඳහන් වේ. මෙවැනි විවිධ කරුණු විමර්ශනයෙන් පසුව බුද්ධඝෝෂ ජන්ම භූමිය මොරණ්ඩඛේටක නම් ගම බව පිළිගෙන ඇත. ආන්ධ්‍රා දේශයේ ගුන්ටූර් දිස්ත්‍රික්කයේ පාල්නාඩ් තලුක් පෙදෙසේ "කෝටනේමලී පුරි" "ගුන්ඩ්ලු පල්ලි" යන ලඟ පිහිටි ගම් දෙක මොරන්ඩඛේටක යැයි පැවසේ. උන් වහන්සේ උපන් පෙදෙස මොරන්ඩඛේටක යැයි විසුද්ධි මග්ගයෙන් පෙනේ. මජ්ඣිමනිකායට්ඨ කථාවේ කතෘ සංදර්ශක ගාථාවක මයූර සුත්ත පට්ඨන හෝ මයූර රූප පට්ඨන සඳහන් වන බැවින් එතුමා එහි විසූ බව ද සිතිය හැකිය.

ව්‍යාකරණ විෂයෙහි ද දර්ශන ශාස්ත්‍රයෙහි ද වෛදික ග්‍රන්ථ විෂයෙහිද ඉතිහාස පුරාවිද්‍යා විෂයෙහිද කායව්‍යවච්ඡෙද විද්‍යාවන් හිද ලක්‍ෂණ ශාස්ත්‍රයෙහිද පැතිරී ගිය බුද්ධි ප්‍රභාවයක් එතුමා කෙරෙහි පැවති බව පැහැදිලිය. බුද්ධඝෝෂ හිමියන් ලංකාවට පැමිණීමට පෙර ඤාණෝදය නම් ධර්ම ප්‍රකරණයත් අත්ථසාලිනී අටුවාවත් දඹදිව දී කළ බවද සඳහන් ය. බුද්ධඝෝෂ හිමියන් කලින් සර්වාස්ති වාදියෙකුව සිට පසුව ථේරවාදී වූ බව ඇතැම් විචාරකයන්ගේ පිළිගැනීමයි.

බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට පැමිණියේ අනුරාධපුරය රාජධානිය කරගත් මහානාම රජ දවස බුද්ධ වර්ෂ 953-975 අතර කාලයේ ය. උන් වහන්සේ ලංකාවට වඩින විට අට්ඨකථා සංහිතා කීපයක්ම මේ දිවයිනේ පැවති බවත් ඒවා හෙළ බසින්ම උගත් බවත් මෙයින් සමහරක් ග්‍රන්ථ ස්වරූපයෙන්ද සමහරක් පූර්වාචාරීන්ගේ මතවාද ඇතුළත් වුන සාහිත්‍යය වශයෙන්ද පැවති බවත් ආචාර්ය අදිකාරම් මහතා පවසයි.

මිහිඳු හිමියන් දවසම ආරම්භ වූ සිංහල අටුවා කථා වසර 700ක පමණ කාලයක් සිංහල ත්‍රිපිටකය හෙළි පෙහෙළි කරමින් පැවතියහ. ත්‍රිපිටක පාළියට සිංහල අටුවා ලියා ඇතිබව දඹදිව විසූ රේවත හිමියන් දැන ගැනීමෙන් සිංහල අටුවා පාළියට පරිවර්තනය කිරීම, බුදු දහම චිරස්ථායි වීමට හේතුවක් යැයි උන් වහන්සේ සලකා හෙලටුවා පාළියට පරිවර්තනය කිරීම සඳහා බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට එවන්න ඇතැයි සැලකිය හැකිය.

"බුද්ධඝෝෂ හිමියන් මෙහි පැමිණ බුදුන් වදාළ දෙලක්‍ෂ පන්සැත්තෑදහස් දෙසියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ආගමයට තුන්ලක්‍ෂ එක්සැටදහස් සත්සියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණ අටුවා කථා ලියා ආගමයෙහි පහන් නැගූ සේකැයි දත යුතු යැයි" පූජාවලියේ සඳහන්ව තිබේ.

සංස්කාරකයෙකු හා අනුවාදයකු වශයෙන් බුද්ධඝෝෂ හිමියන්ගේ කාර්යය වූයේ තමන් ඉදිරියේහි වූ හෙළටුවාවන්හි අන්තර් ගත වූ විවරණ වෙනස් කිරීම නොව, ඒවා සකස් කිරීම සහ අවශ්‍ය ස්ථාන පිඩු කරමින්, විස්තරාර්ථ දක්වමින්, විධිමත්ව සුගමව පාළි භාෂාවට නැගීමයි. බුද්ධඝෝෂ හිමියන්ට අට්ඨකථා සකස්කරන්නට මහාවිහාරයෙන් ඉඩ ලැබී ඇත්තේ මහාවිහාර වාචනා මාර්ගයට විරුද්ධ මත ඒවායේ ඇතුලත් නොවිය යුතුය. යන කොන්දේසිය ද සහිතවය.

"මහා අට්ඨකථාව ශරීරය කොටගෙන මහාපච්චරිය කුරුන්දි ආදි විශ්‍රැත අර්ථ කථාවන්හි යම් විනිශ්වයක් වේද එහි යුක්තාර්ථ සහ ඇතුලත් වන්නාවූ ස්ථවිර වාදයද අත්නොහරිමින් සංවර්ධනය හොඳින් ආරම්භ කරන්නෙමු"

"තවද එම අර්ථ කථාවලින් භාෂාන්තරය පමණක් අත්හැර විස්තර තැන් පිඩුකොට සියලුම විනිශ්වයන් ඇතුලත් කොට කිසිම තන්හි යුත් අත් නොඉක්මවා සංවර්ණනය කරන්නෙමු."යි බුදුගොස් හිමියෝ පවසති.

බුද්ධඝෝෂ හිමියන් විසින් කරන ලද අට්ඨකථා සියල්ලම මිහිඳු මාහිමියන් විසින් ලක්දිවට ගෙන එන ලදුව මහා විහාරිකයන් විසින් ආරක්‍ෂා කරනු ලැබූ හෙළටුවාවන්හි පාළි අනුවාද බවත් මහා අට්ඨකථාවේ සාරය ගෙන පාළි අට්ඨකථා රචිත බවත් මෙම අට්ඨකථාවල සඳහන් වේ.

මේ අනුව බුදුගොස් හිමියන්ගේ කාර්යය වූයේ බුදු සමය පිළිබඳව අමුතුවෙන් පොත් ලිවීම නොව එතෙක් හෙළටුවා වන්හි ආ කරුණු විධිමත්ව හා සුගමව පාළි භාෂාවට නැගීම වෙයි. පාළි අටුවා පොත් වලින් අඩකටත් වඩා සපයා ඇත්තේ බුදුගොස් හිමියන් විසිනි. බෞද්ධ අට්ඨකථාචාරීන් අතුරෙන් එතුමා ශ්‍රේෂ්ඨතමයා යි. එතුමාගේ ජීවන චරිතය වටා විවිධ ජනප්‍රවාද ගෙතී ඇත්තේ ඒ නිසාමය. එතුමා මෙලොව පහල වූයේ "බුදුන්ගේ පර්යාප්ති ශාසනය දීර්ඝ කාලයක් නිර්මලව පවත්වාගෙන යාම සඳහා පාළි අට්ඨකථා ලිවීමටමය" යන ජනප්‍රවාදයක් ද ඇත.

**අටුවා විස්තර**
**විනය පිටකය**

| | පෙළ | | අටුවාව | කතෘ | කාලය |
|---|---|---|---|---|---|
| උභය විභඞ්ග | 1 පාරාජික පාළි<br>2. පාචිත්තිය පාළි | 1. ආණා දෙසනා<br>2. යථාපරාධ සාසන | සමන්තපාසාදිකා<br>විනය අට්ඨකථා | බුද්ධඝෝෂ හිමි | 5වන ශ ව |
| ඛන්ධක | 3. චුල්ල වග්ග පාළි | 3 සංවරාසංවර කථා | | | |

4. මහාවග්ග පාළි

පරිවාර 5. පරිවාර පාළි

| | | | |
|---|---|---|---|
| භික්ඛුපාතිමොක්ඛ | කඞ්ඛා විතරණී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| භික්ඛුණී පාතිමොක්ඛ (මාතිකට්ඨකථා) | | | |

## අභිධර්ම පිටකය

| | | | | |
|---|---|---|---|---|
| 1. ධම්මසංගණිප්පකරණ | 1. පරමත්ථ දේසනා | අත්ථසාලිනී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| 2. විභංගප්පකරණ | 2. යථාධම්ම සාසන | සම්මෝහ විනෝදනී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| | 3. නාමරූප පරිච්ඡේදකම් | | | |
| 3. කථාවත්ථුප්පකරණ | | | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| 4. පුද්ගලපඤ්ඤත්තිප්පකරණ | | | | |
| 5. ධාතුකථාප්පකරණ | | පරමත්ථදීපනී | | |
| 6. යමකප්පකරණ | | පඤ්චප්පකරණට්ඨකථා | | |
| 7. පට්ඨානප්පකරණ | | | | |

## සූත්‍ර පිටකය

| | | | | |
|---|---|---|---|---|
| 1. දීඝනිකාය | 1. වොහාර දේශනා | සුමඞ්ගල විලාසිනී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| 2. මජ්ඣිමනිකාය | 2. යථානුලෝමසාසන | පපඤ්ච සූදනී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| 3. සංයුක්තනිකාය | 3. දිට්ඨි විනිවෙඨන කථා | සාරත්ථප්පකාසිනි | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව |
| 4. අංගුත්තරනිකාය | | මනෝරථපූරණී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| 5. ඛුද්දකනිකාය | | | | |
| 1. ඛුද්දකපාඨ | පරමත්ථ ජෝතිකා | | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| 2. ධම්මපද | ධම්ම පදට්ඨ කථා | | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව |
| 3. උදාන | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය | 5වන ශ.ව. |
| 4. ඉතිවුත්ථක | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය | 5වන ශ.ව. |
| 5. සුත්තනිපාත | පරමත්ථ ජෝතිකා | | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| 6. විමානවත්ථු | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය | 5වන ශ.ව. |
| 7. පේත වත්ථු | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය | 5වන ශ.ව. |
| 8. ථේර ගාථා | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය | 5වන ශ.ව. |
| 9. ථේරී ගාථා | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය | 5වන ශ.ව. |
| 10. ජාතක | ජාතකට්ඨකථා | | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| 11. නිද්දේස (චුල්ල - මහා ) | සද්ධම්ම ජෝතිකා | | උපසේන ආචාර්ය | 6වන ශ.ව. |
| 12. අපදාන (ථේර-ථේරී) | විසුද්ධජනවිලාසනී | | මහානාම ආචාර්ය | 7වන ශ.ව. |
| 13. පටිසම්භිදා මග්ග | සද්ධම්මප්පකාසිනි | | ධම්මපාල ආචාර්ය | 5වන ශ.ව. |
| 14. බුද්ධ වංස | මධුරත්ථප්පකාසිනි | | බුද්ධදත්ත හිමි | 5වන ශ.ව. |
| 15. චරියාපිටක | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය | 5වන ශ.ව. |
| | විසුද්ධි මග්ග | | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| නෙත්තිප්පකරණ | නෙත්තී අට්ඨකථා | | ධර්මපාල ආචාර්ය | 5වන ශ.ව. |
| චතුභාණවාරපාළි | චතුභාණවාර අට්ඨකථා | | ආනන්ද වනරතන | 8වන ශ.ව. |

බුද්ධඝෝෂ හිමියන් විසින් පාළියට නොනගන ලද අට්ඨ කථා පාළියට නගන

ලද්දේ බුද්ධදත්ත, ධම්මපාල, උපසේන සහ මහානාම තෙරණුන් විසින්ය.

**බුද්ධදත්ත හිමි**
බුද්ධඝෝෂ හිමියන්ගේ සමකාලීනයෙකි. මධුරත්ථ විලාසිනි නම් බුද්ධ වංශ අටුවාව උන්වහන්සේ ලියා ඇත.

**උපසේන හිමි**
සද්ධම්මජෝතිකා නම් නිද්දේශ අට්ඨකථාව මහාපරිවේනවාසී උපසේන හිමියන් විසින් කරන ලදි.

**මහානාම හිමි**
පටිසම්භිධාමග්ග අට්ඨකථාව වන සද්ධම්මප්පකාසනිය මුන්වහන්සේ විසින් ලියා ඇත.

**ධම්ම පාල හිමි**
පරමත්ථදීපනී අට්ඨකථා - (උදාන - ඉතිවුත්තක - විමානවත්ථු - පෙතවත්ථු - ථෙර ථෙරී ගාථා අට්ඨකථා) මුන්වහන්සේ ලියා ඇත.

මෙම අට්ඨකථාවන් උගෙන ඒවා ආරක්‍ෂා කළ අය අට්ඨකථිකා නමින් හඳුන්වා ඇත. අට්ඨකථා චරියා යනු අට්ඨකථා සම්පාදනය කළ ආචාර්යවරයෝය. ආචරිය වාද ආචරිය මත ආචරියා වාද යන නම් වලින් කියවෙන්නේ අට්ඨකථාවන් මැයි.

අට්ඨකථාවන් පිළිබඳ විවිධ විවේචන හා මතවාද උගතුන් අතර පවති. මෑතකාලීන වියතුන් අතුරින් අග්ගමහා පණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ එවැනි විවේචකයෙකි. උන්වහන්සේගේ අටුවා පරීක්‍ෂණ නම් පොතෙන් එවැනි විවේචන ඉදිරිපත් කර ඇත. අටුවාකථා බුදුන් වහන්සේගේ දේශනා නොවන බව කවුරුත් පිළිගනිති. අටුවාචාරීන් වහන්සේලා අතරද විවිධ මතබේද තිබූ බව දක්නට ඇත. වසර හත්අට සියයක් ගෙන ආ ලිඛිතව නොතිබූ අර්ථ කථා සාහිත්‍යයට ඒවැනි දේ ඇතුලත් වන්නට පහසුකම් තිබේ. මිහිඳු හිමියන් විසින් ගෙන එන ලද පාළි විවරණ මහාවිහාරික භික්‍ෂුන් විසින් සිංහලට පරිවර්තනය කොට එම හෙළටුවා පස්වන සියවසේ දී බුද්ධඝෝෂ හිමියන් විසින් නැවත පාළි භාෂාවට පරිවර්තනය කළ බව පිළිගත් සම්ප්‍රදායයි. මේ තැන් වලදී එම මතිමතාන්තර ඇතුලත් වන්නට ඇති බව සිතිය යුතුයි.

මහාවිහාරීය සම්ප්‍රදාය එකකි. අභයගිරි ජේතවන පරම්පරාහිද එවැනි සම්ප්‍රදායයන් පැවතුන බවට සැකයක් නැත. ස්වකීය පාරම්පරික

මත වලට පටහැනි සූත්‍ර ධර්මයන් පෙළෙහි ඇති බව දැන දැනත් සිය මතය තහවුරු කරණු සඳහා ඒවා මදකිනිදු වෙනස් නොකර, සංගායනා වලදී පැවති තත්ත්වයෙන්ම ත්‍රිපිටකය රැකගෙන ඒම ගැන මහාවිහාරීය පරම්පරාවට බෞද්ධයාගේ ප්‍රණාම පූර්වක ගෞරවය හිමිවිය යුතුය.

මේ අන්දමින් පැවතගෙන ආ අට්ඨකථා අපේ හාමුදුරුවරු තවත් වර්ෂ සිය ගණනක් තම ආරාම වල පොත්ගුල් වල තබා පුස්තකාල වල තැන්පත්කොට උදේ සවස සුවඳ දුම් අල්ලා ධර්ම ගෞරවයෙන් ධර්ම රත්නය රැකගෙන ආහ. අනගාරික ධර්මපාලතුමාගේ ජාතික ආගමික වැඩපිළිවෙල ආරම්භ වීමෙන් පසුව එතුමාගේම පවුලේ නෑයන් විසින් අට්ඨකථා මුද්‍රණය කිරීමේ වැඩපිළිවෙළ ආරම්භ කර ඇත. ඒ ධර්මපාල තුමා විසින් ඇති කරණ ලද ආගමික ප්‍රබෝධයේ එක් ආභාෂයකි. 1916 ජුලි 05 වන දින ත්‍රිපිටක මුද්‍රණ සභා නම් ආයතනයක් සයිමන් ඇලෙක්සැන්ඩර් හේවාවිතාරණ මහතුන්ගේ මැදිහත් වීමෙන් කොල්ලුපිටියේ ප්ලාම්ස් හවුස්හි පිහිටුවා ඇත. 1929 ජුනි 29 දින මෙම ත්‍රිපිටක සභාවේ රැස්වීමක් කොළඹ ඩික්මන් පාරේ තක්සලා හීදී පවත්වා තිබේ. මෙම රැස්වීමට අති පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මහ නාහිමියන්ද, රත්මලානේ ශ්‍රී ධම්මානන්ද ධර්මාලෝක නායක හිමිවරුන්ද ප්‍රධාන පණ්ඩිත ධර්මධර භික්ෂූන් වහන්සේලා 25 නමක් සහභාගී වූ බව සඳහන් වේ. අනගාරික ධර්මපාල තුමා ප්‍රධාන සාසනමාමක පිරිසක්ද මෙම රැස්වීමට සහභාගී වී ඇත. මෙම නායක පණ්ඩිත ස්වාමීන් වහන්සේලා එක් එක් අටුවා ග්‍රන්ථ සංස්කරණය භාරගත් බවද සඳහන් වේ.

සයිමන් හේවා විතාරණ මහතාගේ අභාවයෙන් පසුව සෝමලතා හේවාවිතාරණ ළමාතැනී විසින් ත්‍රිපිටක මුද්‍රණය සඳහා අරමුදල පිහිටුවීය. ඒම අරමුදල මගින් හේවා විතාරණ අට්ඨකථා ග්‍රන්ථ සමූහය මුද්‍රණය කර ඇත. ආගම ධර්මය ඉතිහාසය පුරාවිද්‍යාව, සාහිත්‍යය ආදී ශ්‍රී ලංකා සංස්කරණ විවිධ ක්ෂේත්‍රයන් පර්යේෂණාත්මක අධ්‍යයන වලට යොමු කරමින් ශාස්ත්‍රීය පොතපත සපයා සංස්කෘතිය පිළිබඳව අවබෝධයක් ජනතාවට ලබාදීමේ අරමුනින් 1845 දී ආරම්භ කළ ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය මගින් පොත් දහයක් මුද්‍රණය කිරීම මහඟු කාර්යයකි.

අභාවයට යන පැරණි බෞද්ධ පොත්පත් හා අලුතින් ලියැවෙන බෞද්ධ පොත් පත් මුද්‍රණය කරවීමත් ඉංග්‍රීසි බෞද්ධ පොත්පත් සිංහලයට පරිවර්තනය කර මුද්‍රණය කිරීමෙන් පරපුරෙන් පරපුරට බුද්ධ ධර්මය ගෙන යාමත් බෞද්ධ සංස්කෘතියේ ආරක්ෂාවත් සඳහා පිහිටුවා ඇති අප

ආයතනය වන බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් බුද්ධ ජයන්ති ත්‍රිපිටකයේ පුනර්මුද්‍රණය නිමවීමෙන් පසුව අට්ඨකථා සිංහලට පරිවර්තනය කොට මුද්‍රණය කිරීමට ප්‍රතිපත්ති සකස් කළහ. සිංහලෙන් මුද්‍රණය අවසන් කොට අටුවා කථා ඉංග්‍රීසියට පරිවර්තනය කර මුද්‍රණය කිරීම අපේ අදහසයි.

"කථා පවත්තිනී " නම් පාඨයක් ත්‍රිපිටකයේ අංගුත්තර නිකායේ සඳහන් වෙයි. ධර්ම දේශකයා පෙළත් අටුවාවත් දනී නම් දහම් අසන්නා පෙළත් අටුවාවත් දනීනම් දහම් දෙසන්නාත් අසන්නාත් දෙදෙනාම පෙළත් අටුවාවත් දනීනම් එම ධර්ම දේශනාව සාර්ථක දේශනාවක් වන බව මෙහි සාමාන්‍ය අදහසයි. තථාගත ධර්මය වඩාත් ප්‍රකට වීම විවෘත වීම එහි පැවැත්මට හා උත්තරීතර භාවයට හේතුවන බව සඳහන්ය. මෙම කරුණු පිළිබඳ විමසිලිමත් වන විට අට්ඨකථා පරිවර්තනයේ හා මුද්‍රණයේ අවශ්‍යයතාවය වඩාත් පැහැදිලි වන්නේය. එයට අමතරව විශ්ව විද්‍යාලවල පාළි හා බෞද්ධ අධ්‍යයනංශවල උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට විෂය නිර්දේශානුකුල අට්ඨකථා වල සිංහල පරිවර්තන නොමැති කමේ බාධාවද, එම ගුරු ශිෂ්‍ය දෙපිරිසටම මේ මගින් දුරු කිරීමද අපේ පරමාර්ථයකි

අපගේ ඉල්ලීම ද, පූජ්‍ය රාජකීය පණ්ඩිත වැලමිටියාවේ කුසලධම්ම නාහිමියන්ගේ අනුශාසනාව ද, අනුව අටුවා කථා සිංහලට පරිවර්තනය කර මුද්‍රණය කරවීමේ භාරදූර කර්තව්‍යවය ශ්‍රී ලංකා ජනරජයේ වර්තමාන ආගමික අමාත්‍යාංශය මගින් ඉතාම කෙටි කාලයක් තුල අවසන් කිරීම සඳහා අපට පවරන ලදී. බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය මගින් අප දක්වු ආදර්ශයත් ගොඩනැගු විශ්වාසයත් මෙයට හේතු වු බව නිසැකය. මෙම කාර්ය අපට පැවරීම පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ ගරු ජනාධිපතිතුමන්ට ගරු අගමැති තුමන්ට ගරු බුද්ධ ශාසන නියොජ්‍ය ඇමතිතුමන්ට අමාත්‍යාංශයේ ලේකම් මහතාට, අමරහේවා මද්දුම මහතාට අපේ කෘතඥතාවය පුණ්‍යානුමෝදනා පූර්වකව පළකරමු.

අටුවා පරිවර්තනයේදී එක් එක් පොත භාරගෙන මැනවින් සිංහලට පරිවර්තනය කරදුන් පණ්ඩිත ස්වාමීන් වහන්සේලාට ද උගත් ගිහි මහතුන්ට ද අපගේ කෘතඥතාවය හිමි වේ. සිංහල අටුවා පරිවර්තන සමීක්ෂණය කළ උගත් ගිහි පැවිදි දෙපිරිසටම අපගේ කෘතඥතාව හිමිවේ.

අටුවා කථා පරිවර්තන කාර්යය සම්බන්ධ කරමින් කටයුතු කළේ විජිතනන්ද සරත්චන්ද්‍ර මහතාය. එම ග්‍රන්ථාවලිය මුද්‍රණය කරවීමේ කාර්යය භාර වුයේ අප ආයතනයේ මුද්‍රණ කටයුතු අධ්‍යක්ෂ පාලිත ලියනගේ මහතාට ය. මෙම මහත්වරු දෙපලම ඉතා උනන්දුවෙන් මෙම කටයුතු වල

නියැලීම පිළිබඳව එම මහත්වරුන්ට ද මාගේ කෘතඥතාවය පළවේ. මෙයට අමතරව මෙම කාර්යයට හොඳ හිතින් අවංකව සහාය දුන් සියලුදෙනාටම පින් පුරවමින් ආසිරි පතම්හ.

මෙයට

ශාසනස්ථිතිකාමී,
**කිරම විමලජෝති ස්ථවීර**
**අධ්‍යක්‍ෂ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය**
නැදිමාල
දෙහිවල.

# බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තන මණ්ඩලය.

පූජ්‍ය රාජකීය පණ්ඩිතඅම්බලංගොඩ ශ්‍රී සුමංගල නායක මාහිමිපාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත යටගම ධම්මපාල අනුනායක මාහිමිපාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත ආඳාවල දේවසිරි නායක මාහිමිපාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත තුඹුල්ලේ ධම්මානන්ද නායක මා හිමිපාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත යාලේගම චන්දකිත්ති හිමිපාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත වටගෙදර විමලබුද්ධි හිමිපාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත විදුරුපොල ආනන්ද හිමිපාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැස්ටියේ උපනන්ද හිමිපාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත හත්තොටුවේ ඉන්දරතන හිමිපාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත පල්ලේගම සමිත හිමිපාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත මාවනානේ සෝමින්ද හිමිපාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත බලපිටියේ සිරි සීවලී හිමිපාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත පැපිලියානේ සුමිත්ත හිමිපාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත බමුණුගම ධම්මවංස හිමිපාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදගම් පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ.
පූජ්‍ය රාජකීය පණ්ඩිත පන්නල සුමේධ හිමිපාණන් වහන්සේ.

| | |
|---|---|
| රාජකීය පණ්ඩිත | කීර්ති නාරම්පනාව මහතා. |
| ශාස්ත්‍රවේදී | ඇන්.එච්. පෙරේරා මහතා. |
| රාජකීය පණ්ඩිත | ජේ.පී. නිමල් ලාල් රංජිත් මහතා. |
| රාජකීය පණ්ඩිත | ටී.ජී. ජයතිලක මහතා. |
| රාජකීය පණ්ඩිත | ඒ.ඇම්.ඩී.වයි. සරත්චන්ද්‍ර අමරතුංග මහතා. |
| රාජකීය පණ්ඩිත | එච්.පී.ඇස්. නිශ්ශංක මහතා. |
| රාජකීය පණ්ඩිත | බී.එම්.වී. බාලසූරිය මහතා. (නීතිඥ) |
| රාජකීය පණ්ඩිත | සෝමරත්න ගම්ලත් වෙල ගෙදර මහතා |
| රාජකීය පණ්ඩිත | දයා ගුණසේකර මහතා. |
| ශාස්ත්‍රවේදී | ඩබ්ලිව්.ඇල්.පී. ධර්මදාස මහතා |
| ශාස්ත්‍රවේදී | ජිනදාස ගොඩකන්ද මහතා. |
| රාජකීය පණ්ඩිත | ලසිත් නලත්ත මහතා. |
| රාජකීය පණ්ඩිත | පී.ඇල්.කේ. පෙරේරා මහතා. |

**සම්බන්ධීකරණය** :- විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා.

# බෞද්ධ මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තන සමීක්ෂණ මණ්ඩලය

01. පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
(ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය පේරාදෙණියේ කථිකාචාර්ය)

02. පූජ්‍ය කොටියාගල උපරතන හිමිපාණන් වහන්සේ
(කැලණිය විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය)

03. පූජ්‍ය අම්පාරේ ධම්මෝදය හිමිපාණන් වහන්සේ ශාස්ත්‍රපති

04. පූජ්‍ය මැදඋයන් ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ ශාස්ත්‍රපති.

05. පූජ්‍ය ඇස්වත්තේ රේවත හිමිපාණන් වහන්සේ ශාස්ත්‍රපති

06. පණ්ඩිත දයාගුණසේකර මහතා (රාජ්‍යභාෂා දෙපාර්තමේන්තුව)

07. හේමචන්ද්‍ර දිසානායක මහතා ශාස්ත්‍රවේදී.

08. පණ්ඩිත ඒ. ලසිත් නලන්ත මහතා (රාජ්‍යභාෂා දෙපාර්තමේන්තුව)

09. පණ්ඩිත සිරිමෙවන් සේනක මහතා ශාස්ත්‍රවේදී

10. අභිධම්මාචාර්ය බුද්ධික විජේසිංහ මහතා ශාස්ත්‍රවේදී-විද්‍යාවේදී

# පටුන

## 01. උරග වර්ගය.


| | | |
|---|---|---|
| 1-1 ඛෙත්තූපමා | ප්‍රේත වස්තුව | 04 |
| 1-2 සූඛර මුඛ | ප්‍රේත වස්තුව | 11 |
| 1-3 පූති මුඛ | ප්‍රේත වස්තුව | 14 |
| 1-4 පිට්ඨ ධීතලික | ප්‍රේත වස්තුව | 19 |
| 1-5 තිරෝකුඩ්ඩ | ප්‍රේත වස්තුව | 22 |
| 1-6 පඤ්චපුත්තඛාදක | ප්‍රේත වස්තුව | 34 |
| 1-7 සත්ත පුත්ත ඛාදක | ප්‍රේත වස්තුව | 39 |
| 1-8 ගෝන | ප්‍රේත වස්තුව | 42 |
| 1-9 මහාපේසකාර | ප්‍රේත වස්තුව | 47 |
| 1-10 ඛල්ලාටිය | ප්‍රේත වස්තුව | 51 |
| 1-11 නාග | ප්‍රේත වස්තුව | 58 |
| 1-12 උරග | ප්‍රේත වස්තුව | 65 |


## 02. උබ්බරී වර්ගය


| | | |
|---|---|---|
| 2-1 සංසාර මෝචක | ප්‍රේත වස්තුව | 71 |
| 2-2 සාරිපුත්ත ථෙර මාතු | ප්‍රේත වස්තුව | 81 |
| 2-3 මත්තා | ප්‍රේත වස්තුව | 85 |
| 2-4 නන්ද | ප්‍රේත වස්තුව | 93 |
| 2-5 මට්ට කුණ්ඩලී | ප්‍රේත වස්තුව | 96 |
| 2-6 කණ්හ | ප්‍රේත වස්තුව | 97 |
| 2-7 ධනපාල | ප්‍රේත වස්තුව | 104 |
| 2-8 චුල්ල සෙට්ඨි | ප්‍රේත වස්තුව | 110 |
| 2-9 අඞ්කුර | ප්‍රේත වස්තුව | 115 |
| 2-10 උත්තර මාතු | ප්‍රේත වස්තුව | 141 |
| 2-11 සුත්ත | ප්‍රේත වස්තුව | 145 |
| 2-12 කණ්ණ මුණ්ඩ | ප්‍රේත වස්තුව | 150 |
| 2-13 උබ්බරී | ප්‍රේත වස්තුව | 159 |

03. චුල වර්ගය


| | | |
|---|---|---|
| 3-1 අභිජ්ජමාන | ප්‍රේත වස්තුව | 166 |
| 3-2 සාණුවාසි | ප්‍රේත වස්තුව | 174 |
| 3-3 රථකාර | ප්‍රේත වස්තුව | 182 |
| 3-4 භුස | ප්‍රේත වස්තුව | 187 |
| 3-5 කුමාර | ප්‍රේත වස්තුව | 190 |
| 3-6 සේරිණී | ප්‍රේත වස්තුව | 196 |
| 3-7 මිගලුද්දක | ප්‍රේත වස්තුව | 200 |
| 3-8 දෙවැනි මිගලුද්දක | ප්‍රේත වස්තුව | 204 |
| 3-9 කුට විනිච්ඡයික | ප්‍රේත වස්තුව | 206 |
| 3-10 ධාතු විවණ්ණක | ප්‍රේත වස්තුව | 210 |


04 මහා වර්ගය


| | | |
|---|---|---|
| 4-1අම්බසක්ඛර | ප්‍රේත වස්තුව | 214 |
| 4-2 සෙරිස්සක | ප්‍රේත වස්තුව | 239 |
| 4-3 නන්දක | ප්‍රේත වස්තුව | 240 |
| 4-4 රේවති | ප්‍රේත වස්තුව | 253 |
| 4-5 උච්ඡු | ප්‍රේත වස්තුව | 254 |
| 4-6 කුමාර | ප්‍රේත වස්තුව | 258 |
| 4-7 රාජපුත්‍ත | ප්‍රේත වස්තුව | 261 |
| 4-8 ගුථ ඛාදක | ප්‍රේත වස්තුව | 265 |
| 4-9 ගුථ ඛාදක පේති | ප්‍රේත වස්තුව | 268 |
| 4-10 ගණ | ප්‍රේත වස්තුව | 269 |
| 4-11 පාටලී පුත්ත | ප්‍රේත වස්තුව | 272 |
| 4-12 අම්බ | ප්‍රේත වස්තුව | 275 |
| 4-13 අක්ඛරුක්ඛ | ප්‍රේත වස්තුව | 279 |
| 4-14 භෝග සංහරණ | ප්‍රේත වස්තුව | 281 |
| 4-15 සෙට්ඨි පුත්ත | ප්‍රේත වස්තුව | 283 |
| 4-16 සට්ඨී කුට සහස්ස | ප්‍රේත වස්තුව | 286 |

# සංඥාපනය.

ප්‍රේතවත්ථු වර්ණනාව රචනා කර ඇත්තේ ප්‍රේතයන්ගේ කථා මගින් කර්ම ඵල සිද්ධාන්තය සාමාන්‍ය ජනතාවට උපයෝගී වන ලෙස දක්වීම සඳහා ය. තමන්ගේම කර්මය විසින් වළකන ලද බත් පැන් ඇත්තාහු අනලස්ව සැනසීමක් නැතිව ආහාර සඳහා ඔබ මොබ යෙති යි යන අරුතින් ප්‍රේතයෝ වී ය යි යන උගැන්වීමෙක් "**සද්ධම්මොපායන** " නම් ග්‍රන්ථයේ ඇත. එසේ වූ ප්‍රේතයෝ වර්ග හතරක් වෙති.

1. නිජ්ඣාම තණ්හික - කර්මය තේජසින් ඇතුළත දැවෙන ප්‍රේතයෝ
2. ඛුප්පිපාසිකා - සෙම් -සොටු පමණකුදු ආහාර නැතිව කල්ප ගණන් සාපිපාසා දෙකින් යුතු ව දුක් විඳින ප්‍රේතයෝ
3. පංසු පිසාචිකා - කසල ගොඩවල් ආදී අපවිත්‍ර තන්හි ආහාර සොයා හැසිරෙමින් දුක් විඳින ප්‍රේතයෝ.
4. පරදත්තුපජීවී - අනුන් දෙන පිනින් ජීවත්වන ප්‍රේතයෝ

මෙසේ ප්‍රේතයන් වී බොහෝවිට උපදින්නේ,

1. සත්ත්ව ඝාතනය.
2. ලෝභය හා තද මසුරුබව.
3. ඊර්ෂ්‍යාව සහ වෛරය.
4. පරදාර හා පරපුරුෂ සේවනය
5. සඟසතු දේ අයථා පරිභෝජනය
6. බොරු කීම හා බොරුවට දිවිරීම
7. පින්කම් වලට අකුල් හෙළීම.
8. හොර තරාදි පඩි හා හොර මැනුම් භාවිතා කරමින් පරිභෝගිකයන් වංචාකිරීම, යන අකුසල් හේතුවෙන් බව ප්‍රේතවත්ථුවේ එන උදාහරණ කතා වලින් පැහැදිලි වෙයි. මෙම අකුසල කර්ම වලින් ප්‍රේතයන් වී උපදින්නෝ කල්ප ගණන් ඒ දුක් විඳිති. තමන් විසින් කරන ලද කර්මයන් තමන් විසින්ම විඳ ගෙවිය යුතුය යන සංකල්පය මෙහි මැනැවින් විදහා දක්වෙයි. සමහරවිට කර්ම විපාක පල දෙන්නේ පුදුම ආකාරයකට ය. කරන ලද ක්‍රියාවම ආපස්සට ඒ අන්දමින්ම විපාක දෙන බව පෙනේ. ප්‍රේතවස්තු වර්ණනාවේ දක්වෙන අන්දමට කරන ලද කර්මය එක එල්ලේම විපාක දෙයි.

එක්තරා බමුණෙක් යාගයක් සඳහා එළුවෙකු මරන්නට සූදානම් විය. මරන්නට පෙර ඒ එළුවා පිරිසිදු කිරීම සඳහා නැවූ විට ඒ එළුවා වරක් සිනාසී වරක් හැඬුවේය. ඒ මන්දැයි බමුණා එළුවාගෙන් ඇසීය. එළුවා කීවේ.

ඔබ වාගේම මමත් සසර දී එළුවෙකු මැරුවෙමි. එහි කර්ම විපාක වසයෙන් මම ආත්ම පන්සියයක් එළුවකු වී ඉපදී බෙල්ල කැපී මැරුම් කෑවෙමි. මේ මගේ අන්තිම ආත්ම භාවයයි. මගේ අද සිදුවන මරණයෙන් පසුව මම නැවත එළුවකු වී නූපදින්නෙමි. ඒ බව දැන මම සිනාසුනෙමි. එසේම ඔබ අද මා මරා ඉන්පසුව ඔබ ආත්ම ගණනක් එළුවකු වී මැරුම් කන අයුරු දැක ඔබ කෙරෙහි අනුකම්පාවෙන් ඇඬුවෙමි. මෙහි දී බමුණා එළුවා මැරීම අත්හැර ඌ ආරක්ෂා කළත් එදිනම වෙනත් හදිසියේ ඇති වූ හේතුවකින් එළුවාගේ බෙල්ලම කැපී මරණයට පත්විය. මෙය ජාතක පොතේ ද ජාතක කථාවක් ලෙස එයි.

එක් වෙළෙන්දකුට බිරියන් දෙදෙනෙකු වූහ. පළමු බිරිඳ දෙවැනි බිරිඳ කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් පෙළුනීය. ඇය ඒ ස්වාමී පුරුෂයා හා දෙවැනි බිරිඳ නිදාගන්නා ඇඳේ කහඹිලියා ඇට විසිරවීය. ඇගේ වටිනා ඇඳුමක් සොරකම් කළාය. ඇය දවසක් දිය නා ස්වාමි පුරුෂයා සමග කථා කරමින් සිටියදී, පළමුවන බිරිඳ ඊර්ෂ්‍යාවෙන් පෙළී ගේ අතුගා කුණු ටික දෙවැනි බිරිඳගේ හිසමත දැමී ය. මෙසේ කළ පළමු බිරිඳ ටික දිනකින් මළාය. ඇය ප්‍රේතියක්ව ඉපදුනාය. ඇගේ ඇඟ පුරාම හැමතැනකම නිතරම කසයි. ඒ කහඹිලියා දැමීමෙනි. ඇය නිර්වස්ත්‍ර වූවාය. ඒ ඇඳුම් සොරකම් කිරීම නිසා ය. ඇය සිටින විට නිතරම ඇයගේ ඔළුවට කුණු රොඩු වැටේ. ඒ හිස උඩට කුණු දැමීම නිසාය. මේ මත්තා ප්‍රේත වස්තු කථාවයි.

එක්තරා පුරුෂයෙකුට බිරිඳක් වුවාය. ඇයට දරුවන් නැත. ඒ නිසා ඔහු වෙනත් බිරිඳක් ගෙනාවාය. ඇයට දරුගැබක් හටගත් වේලේ පළමු බිරිඳ වෙදකු ලවා ඒ දරුගැබ හෙළීය. මේ පිළිබඳව ස්වාමියාත් නෑයනුත් විමසූ විට ඇය මා විසින් දරු ගැබ හෙළුවා නම්, මම මින් මතු උපදින ආත්මයක දී මගේ දරුවන් පස්දෙනා බැගින් කෑමට සිදුවේ වා යි, බොරුවට දිවුළාය. ඇය ටික කලකින් මිය ගොස් ප්‍රේතියක් ව උපන්නීය. ඇය උදේට දරුවන් පස් දෙනෙකු වදන්නීය. ඒ පස්දෙනාම ඇය විසින් කා දමයි. සවසට තවත් පස් දරු කෙනෙක් ලැබ ඒ දරුවන්ද කයි. පඤ්ච පුත්‍ර ඛාදක ප්‍රේතවස්තුව හා සත්තපුත්‍ර ඛාදක ප්‍රේත වස්තු මේවාට උදාහරණ යි.

තමන්ගේ ගෙදර උදැල්ලක්, තාච්චියක් පොරවක් වැනි භාණ්ඩයක් තියාගෙන අසල්වැසියකු ටිකකට ඉල්ලුවිට එය නැතැයි කීම බොරුවකි. එය

අකුසලයකි. එක්තරා පවුලක ගෘහණියක්. අසල්වැසි කාන්තාවක් එවැනි භාණ්ඩයක් ටිකකට ඉල්ලූ වේලේ ඇය එය තියාගෙන නැතැයි කීවාය. අනිත් ගැහැනිය පෙරළත්ත කරද්දී භාණ්ඩය අයිති ගැහැණිය මම අපේ ගෙදර මෙය තියාගෙන ඔයාට නොදෙනවා නම් මා මින්මතු උපදින ආත්මයක දී මා අසුචි කන්න ඕනෑයයි බොරුවට දිවුලාය. ඕ ටික කලකින් මැරී ප්‍රේතියක් ව උපන්නී ය. ඒ ප්‍රේතියට සුවඳ ඇල් හාලේ බතක් ලැබුනත් ඇගේ අතට එය ගත් විට බත් පිඟාන අසුචි වේ. මේ බොරුවට දිවිරීමේ විපාකයයි. එවැනි භාණ්ඩයක් ලඟ තබාගෙන නැතැයි කිම අල්පසාවද්‍ය මුසාවාදා අකුසලයක් බව සුත්තසඞගහ අට්ඨකථා වේ එයි. ඉහත සඳහන් ප්‍රේතියට එසේ වුයේ බොරුවට දිවිරීම නිසා ය.

යමෙක් කරන පින්කමට අකුල් හෙළීම ද පවකි. එක්තරා පවුලක ප්‍රධාන ගෘහණියත් ඇගේ ලේලියත් චෛත්‍යයක් වැඳීම සඳහා යන්නට පිටත් වූහ. ගෙදර ස්වාමියා සිටුවරයෙකි. ඔහු තම බිරිඳටත් ලේලියටත් ඔය ඇට කටුවලට වැඳීමෙන් මොන අර්ථයක්ද කියා ගමනට අවහිර කළේය. එහෙත් ඒ දෙදෙනා ගොස් චෛත්‍යය වැඳී ය. ඔවුන් දෙදෙන මියගොස් දෙව්ලොව උපන්හ. සිටුවරයා මිය ගොස් ප්‍රේතයකු විය.

තිරෝකුඬ්ඩ ප්‍රේතවත්‍ථුවේ එන්නේ භික්‍ෂූන්ට දන් දීම සඳහා එකතු කළ මුදල් හා දාන වස්තු වංචා කළ පිරිසක් විඳී දුක් පිළිබඳව ය.

ප්‍රේතවත්‍ථුවෙන් මේ උදාහරණ කීපය ගෙන දක්වූයේ කිසිවෙක් අකුසල කර්මයක් කළවිට එහි විපාකය එයට සමගාමීව සිය ගණනක් ගුණාත්මකව විපාක දෙන බව පැහැදිලි කිරීම සඳහායි. ප්‍රේතවත්‍ථු වර්ණනාවේ ප්‍රේතයින්ට අමතරව තවත් වර්ගයක් සිටිති. ඒ විමාන ප්‍රේතයෝය. පින්කම්කොට තිබිය දී කරන ලද අකුසල කර්මයක් හෝ ලෝභාදී චේතනාවක් ආසන්න කර්මය වසයෙන් මරණයේ දී චුතියේදී පෙරට ආයේ නම් එ වැනි පුද්ගලයෝ විමාන ප්‍රේතයින් ලෙස ඉපදෙන බව පෙනෙයි. සුත්ත ප්‍රේතවස්තුව එයට හොඳ නිදසුනකි. එක්තරා මවක් තම පුතුට විවාහයක් කර දුන්නීය. ඔහු විවාහ වූ දිනයේ ම සර්පයකු විසින් දෂ්ටකර මරණයට පත්විය. ඔහු මියයද්දී විවාහ වූ තරුණ බිරිඳ සිහිපත්ව ඇයගැන ආදරයෙන්, තෘෂ්ණාවෙන් මිය ගියේය. මේ තරුණයා මීට ඉහත ආත්මයක දී පසේබුදුවරයකුට දන් දී උවැටන් කොට සිදුකර ගත් පිනක් තිබිණ. ඔහු විමාන ප්‍රේතයකු වී උපන්නේය. බිරිඳ ගැන තණ්හාව නිසා ආශාව නිසා ප්‍රේතආත්ම භාවය ලැබීය. ඉහත සඳහන් පින නිසා දිව්‍යසම්පත් පහළ විය. විශාල විමානයක් වාහන, ද ඔහුට පහළවිය. ඔහු පසුව බිරිඳගේ නිවසට

පැමිණ. බිරිඳගේ මවට වස්තු සම්භාරයක් මිල මුදල් දී (දුව) බිරිඳ රැගෙන ඔහුගේ විමානයට ගොස් ඇය සමග කම් සැප වින්දේය. ඇයගේ ආයුකාලය අවසන්ව ඉදිරියට දින හතක් තිබියදී නැවත ඇය ගෙදරට ගෙනත් ඇරලා තමන් දුන් වස්තුවෙන් පින්කම් කරන ලෙස කියා ගියේය. ඕද ඉතිරි දින හතේම මහා දන් දී පින්කම් කොට දිව්‍ය ලෝකයේ උපන්නී ය.

කර්ණමුණ්ඩ නම් කථා වස්තුවද මෙවැන්නකි. ස්ත්‍රීහු පන්සියයක් නිතර පොහොයට සිල් සමාදන්වූහ. එක් දිනක් මෙයින් එක් ස්ත්‍රියක් සිල් සමාදන් ව සිට පරපුරුෂ සේවනයේ යෙදුනාය. මේ ගැන විභාග කිරීමේ දී අනෙක් උපාසිකාවෝ මෙය දැන සිටියත් එවැන්නක් සිදු වූයේ නැතැයි කියා තම මිතුරිය නිදහස් කරගත්හ. ඇය පරපුරුෂ සේවනයේ යෙදීම පිළිබඳව අප බොරුවක් කියන්නේ නම් අප සියලු දෙනා ඇගේ දාසියෝ විය යුතුයයි බොරුවට දිවුළාහ. මේ සියලු දෙනා මරණින් මතු විශාල දිව්‍ය අඹ වනයක් සහිත දිව්‍ය විමන්වල උපන්නාහ. පරපුරුෂ සේවනයේ යෙදුනු තැනැත්තියගේ පරිවාර සේවිකාවන්ව මේ පිරිස ද එහි උපන්හ. පරපුරුෂ සේවනයේ යෙදුනු ස්ත්‍රිය හැමදා මැදියම් රැයේ නදී තෙරට යයි. එහිදී කන්කොට බල්ලෙකු විසින් ඇගේ මස් සියල්ල කා දමා ඇටකටුව වතුරට ඇදගෙන යයි. එය වතුරෙන් පෙඟුණු පසුව යළි දිව්‍ය ආත්ම භාවය ලබයි. ඇය දෙවඟනක් වසයෙන් ජීවත් වෙයි. දිනක් බරණැස රජු දුන්නෙන් විද මේ බල්ලා මැරීය. දෙවඟනක් වූ ඇය බරණැස් රජු සමග පස්කම් සැප වින්දාය. යෙහෙළියෝ පන්සියය ද එසේ දිව්‍ය පස්කම් සැප වින්දහ.

මේ අනුව පෙනෙන්නේ කුසල් අකුසල් දෙකම එකම ජීවිතයකදී විපාක දෙන බවයි. අප කථාකරන යමරජු ද විමාන ප්‍රේතයකු බව කියවේ.

ඈත අතීතයේ එක් වෙළෙන්දෙක් වෙළඳ සැලක් පවත්වාගෙන ගියේ ය. ඔහු කාටත් ප්‍රිය වචනයෙන් කථාකරයි. ඔහුගේ බෑණා අනුන්ගේ වස්තු සොරකම් කොට ඒ භාණ්ඩ මේ කඩේ තබා විකුණයි. මේ කඩේ තරාදි පඩි ආදිය ද එතරම් හොඳ නැත. මේ තැනැත්තා දවසක් තමන්ගේ යහළුවෙක් දිය නාන විට ඔහුගේ සරම හා ඇඳුම් සැඟවුයේය. මෙය කළේ විහිළුවටය. පසුව ආපසු දුනි. මෙසේ හැසිරුණු මොහු, තම වෙළඳසැල ඉදිරි පිට තිබුණු මහා මඩ වළක් ගොඩකර සමතලා කොට යන එන මගීන්ට පහසුකම් සැළැස්සූහ.

ඔහු කළ මේ අකුසල කර්ම නිසා ඔහු ප්‍රේතයකුවී ඉපදිනි. ඔහු මාර්ගය තැනීමේ කුශලකර්මය නිසා දෙවියෙකුව ඉපිද දිව්‍යමය වූ සුදු අශ්වයකු

වාහනය වසයෙන් ද ලැබිණ. මිතුරාගේ රෙදි සැඟවූ නිසා නග්නව ඉපදුනි. ඔහුද විමාන ප්‍රේතයෙකි. දිව්‍ය විමානයක් තිබිණ.

මෙකල අම්බසක්ඛර නම් ලිච්ඡවී රජු සිටියේය. ඔහු මිථ්‍යාදෘෂ්ඨිකයෙ කි. භික්ෂූන්ට හිරිහැර කරදර කළ අයෙකි. මේ රජු හා ඉහත සඳහන් ප්‍රේතයා අතර ඇති වූ කතා බහකදී නග්නව සිටින ප්‍රේතයාට වස්ත්‍ර දීමට ඔහු කැමති විය. ප්‍රේතයා කිවේ මට වස්ත්‍ර දීමට ඔබ කැමති නම්, ඔබ කප්පින හාමුදුරුවන්ට පළමුව වස්ත්‍ර පුදා ඒ පින් මට අනුමෝදන් කරනු යන්නයි. අම්බසක්ඛර රජු වස්ත්‍ර අටක් ගෙන කප්පින හාමුදුරුවන් වෙත ගියේය. එහි දි කප්පින හාමුදුරුවන් වදාළේ ඔබ රජ වුවත් මිථ්‍යාදෘෂ්ඨිකය. ඔබ භික්ෂූන් වහන්සේලාට හිරිහැර කරදර කරන්නේය. ඒ නිසා ඔබේ වස්ත්‍ර දානය පිළිගත නොහැකි බවයි. ඒ එදා අපේ ප්‍රතිපත්තිගරුක හාමුදුරුවන්ගේ ස්වරූපයයි. පසුව මෙයට අදාල ප්‍රේතයා මැදහත් කරුවකු කොට, ඇස් පනාපිටම අකුසල කර්මයන්ගේ විපාකය දැක රජු ද ධාර්මික බෞද්ධයකු වී ප්‍රේතයාද ප්‍රේත ආත්මයෙන් මිදවීය.

ප්‍රේතවස්තු කියවීමෙන් තවත් බොහෝ දේ උගතහැකිය. අංකුර රජු බොහෝ ධනය වැයකොට මහා දානශාලා තනවා දිනපතා දහස් ගණන් දුගී මගී යාචකාදීන්ට දන් දුන්හ. ඉන්දක නම් මාණවකයා එකම බත්පිඩක් අනුරුද්ධ හාමුදුරුවන්ට පූජා කළේය. මේ දෙදෙනාම මියගොස් තව්තිසා දෙව්ලොව උපන්හ. එහිදී ඉන්දක දෙවියා අංකුර දෙවියන්ට වඩා කරුණු අටකින් ඉදිරියෙන් පිනින් වැඩී සිටියේය. මෙහිදී අංකුර දෙවියා කීවේ මා අවුරුදු ගණනක් ලක්ෂගණන් වැයකොට දන් දුන්නත් මගේ දානය පිළිගැනීමට සුදුසු දක්ෂිණාර්හයන් මට සමු නොවූ අතර ඉන්දික දෙවියන්ට දක්ෂිණාර්හ සම්පත්තිය ලැබුණු බවයි. මේ අනුව දන්දීමේ දී වඩාත් වැදගත් වන්නේ දානය පිරිනැමීමට සුදුසු දක්ෂිණාර්හයන් ප්‍රතිග්‍රහ සම්පත්තිය සොයාගත යුතු බවයි. දක්ෂිණාර්හ සම්පත්තිය සම්පූර්ණ වුයේ නැතිනම් ඒ කුසලය මහත්ඵල මහානිසංස වන්නේ නැත.

පින්කම් කරන්නට තමන්ට නො හැකිනම් අනුන් කරන පින්කම්වලට සතුටු සිතින් සහාය දක්වීමෙන් උසස් ප්‍රතිඵල නෙලාගත හැක. අසය්හ සිටුවරයා මහා දන් දෙද්දී, ඒ අසය්හ සිටුවරයාගේ දානශාලාව සමීපයේ කුඩා ටේලර් සප්පුවක් විය. එහි සිටි සන්නාලියා අසය්හ සිටුවරයාගේ දාන ශාලාව සොයා එන දුගී මගී යාචකාදීන්ට තමන්ගේ දකුණත දිගුකොට සැදැහැ සිතින් දාන ශාලාව පෙන්වීය. ඒ සන්නාලියා මරණින් පසු දෙවියකු ව උපන්නේය. ඔහුගේ දකුණත ඇඟිලි පහ සිතු පැතු සම්පත් දෙන කප්රුක්

පහක් විය. මේ දාන ශාලාවේම දන් බෙදන්නට සිටි සමහර සේවකයන් ඒ රාජකාරිය නිසි අයුරින් නො කිරීම නිසාත්, දුගී මගී යාචකාදීන් කෙරෙහි වපර ඇසින් බැලීම නිසාත් ප්‍රේතයන් වී උපන්හ. මේ කුසලා කුසල කර්ම පළදෙන ආකාරයයි. ප්‍රේතවත්‍ථු අට්ඨකථාව කියවීමෙන් තවත් බොහෝ දේ උගත හැකියි. ඒ මේ ප්‍රේත ලෝකය මිනිස් ලොවම පිහිටි බවයි. බොහෝ දෙනාට ප්‍රේතයන් විමාන ප්‍රේතයන් හමු වී ඇත. කථාබස්කර ඇත. විශේෂයෙන් මහා මුගලන් හාමුදුරුවෝ ප්‍රේතයන් සමුවී ඔවුන් කළ කුසලා කුසල කර්මයන් පිළිබඳව විමසා ඇත. තවත් හාමුදුරුවන්ට, සිටුවරුන්ට, රජවරුන්ට ප්‍රේතයන් මුණගැසී ඇත. අද ජීවත්වන අපට ප්‍රේතයන් මුණ නොගැසුනත් අප අතර ම ප්‍රේතයෝ ද සිටිති.

ප්‍රේතවත්‍ථු අට්ඨකථාවේ වෙළඳ ශ්‍රේණි ගැන නිතර නිතර දක්වේ. අංකුර එවැන්නෙකි. ගැල් සියගණනක බඩු පුරවා රටින් රට ගොස් වෙළඳාම් කරන සාත්තුවාහකයෝ ප්‍රේතවස්තු කියවීමේ අපට හමුවේ. ප්‍රේතයන් වසයෙන් ජීවත්වන මිනිසුන් ගැන මහාචාර්ය නන්දසේන රතනපාල මහතා පර්යේෂණයක් කර ඇත.

මෙහි නන්දක නම් ප්‍රේතවස්තුවේ පිඞ්ගල නම් රජුද ඔහුගේ සෙන්පතියා ද සමුවේ. පිඞ්ගල රජු ධර්මාශෝක රජුට අවවාද දෙනලද බවක් පෙළේ ඇත. එහෙත් ගාථාවල සඳහන් වන්නේ පිඞ්ගල රජු ධර්මාශෝක රජුට උපස්ථාන කිරීමට ගිය බවයි. පිඞ්ගල මිථ්‍යාදෘෂ්ටික රජෙකි. ධර්මාශෝකට අවවාද දීමට ඔහුට සුදුසුකම් නැත. සත්‍යය නම් පිඞ්ගල ධර්මාශෝක රජුගේ යටත් රජෙකු බවයි. වරින්වර ඔහු උවැටන් සඳහා ගොස් ඇත. නන්දක (නම් ප්‍රේතයා) පිඞ්ගල රජුගේ සේනාපතියාය. ඔහු සේනාපති කාලයේ බලය අනිසි ලෙස පාවිච්චි කිරීම නිසා. අල්ලස් දූෂණ වල යෙදීම නිසා ජනයා පෙළීම නිසා මහා දුක් විඳින ප්‍රේතයකු වූ බව පෙනේ. පිඞ්ගල රජුට අවවාද කරන නන්දක ප්‍රේතයා විතණ්ඩ වාදයෙන් ඈත් වී ධාර්මික වන ලෙස පිඞ්ගල රජුට අවවාද කරයි. දෙසැට මිසදිටු වලින් එකක් වන විතණ්ඩ වාදය පිළිබඳව පැහැදිලි දීර්ඝ විස්තරයක් නන්දක ප්‍රේතවස්තුවේ සඳහන් වේ.

පේතවත්‍ථු අට්ඨකථාව භදන්තාචරිය ධම්මපාල මහාහිමියන්ගේ කෘතියකි. මෙහි කථා පනස් එකකි. මේ කථා පනස් එක

| | | | |
|---|---|---|---|
| උරග වර්ගය | 12 | උබ්බරී වර්ගය | 13 |
| චූල වර්ගය | 10 | මහා වර්ගය | 16 |

මෙය පේතවත්ථු අට්ඨකතාව වුවද මෙහි විමාන වත්ථු කීපයක්ද ඇතුළත් වී ඇත. ජාතක කථා කිහිපයක් ද වෙති.

මිහිඳු මහරහත් වහන්සේ බෞද්ධ දර්ශනය හා උගැන්වීම් ද ගෙන ලංකාවට වැඩමවා පසුදින රජමාලිගයේ දී දන් වළඳා අවසානයේ භුක්තානුමෝදනාව කර ඇත්තේ ප්‍රේතවස්තු වෙනි. එකල පැවැති මළවුන් පිදීමේ චිරාගත චාරිත්‍රය නැවැත්වීමටත්. මළවුන්ට කළ හැකි එකම උපකාරය නම් අප විසින් පිනක් දහමක් කොට ඒ පින් අනුමෝදන් කරවීම, උදෙසීම පමණක් ම ය යන කාරණය උගැන්වීමටත් මිහිඳු හිමියෝ එසේ ප්‍රේත වස්තුවෙන් දහම් දෙසුහ. මෙයින් පැහැදිලිවන තවත් කරුණක් නම් බුදු දහම වැළඳගත් සිංහල බෞද්ධයා එදා පටන්ම ප්‍රේතවත්ථු කථා පරිශීලනය කර ඇති බවයි.

වර්තමාන හොඳ කෙටි කතා පොතක් කියවන්නාක් මෙන් දිගටම කියවාගෙන ගියහැකි ප්‍රේත වස්තු කථා පනස් එක කියවීමෙන් තමන් අනාගත ප්‍රේත ලෝකයෙන් මිදෙන්නේ කෙසේද යන්නත්, කුසලා කුසල කර්ම විපාක දෙන්නේ කෙසේද යන්නත් පැහැදිලිව අවබෝධ කරගත හැක්කේය.

# පරමත්ථ දීපනී නම් වූ
# පේතවත්ථු අට්ඨකථා
## (සිංහල පරිවර්තනය)

### නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

1. සියලු ලෝක සත්ත්වයන් වෙත පතල මහා කරුණා ඇති, දතයුතු සියළු දේ නමැති (දැනුම නමැති) සාගරයේ පරතෙරට පැමිණි, විවිධන්‍යායන්හි හා විචිත්‍ර ධර්ම දේශනා වෙහි ගැඹුරු නුවණැති දක්ෂවූ, සකල ලෝකයාට ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ නමස්කාර කරමි.

2. අෂ්ට විද්‍යා හා පසළොස් චරණධර්මයන්ගෙන් යුක්ත වූ, සම්මා සම්බුදු රජුන් විසින් පුදන ලද, ලෝක සත්ත්වයා නිවන්පුරට පමුණු වන්නාවූ උත්තම ශ්‍රී ධර්මරත්නය වඳිමි.

3. ශීල - සමාධි -ප්‍රඥා ආදී නිමල ගුණයෙන් යුක්තවූ, සතර මග සතර ඵලයන්ට පැමිණියාවූ අනුත්තර වූ පින් කෙතක් වන් මහා සංඝයා වඳිමි.

4. මෙසේ රත්නත්‍රයට වැඳීමෙන් අත්කර ගන්නාවූ පින් බලයෙන් ද, රත්නත්‍රයේ තේජසින් ද සියලු කරදර අතුරු ආන්තරා දුරු වේවා.!

5. මියගිය අය විසින් ඒ ඒ අයගේ පූර්ව ජන්මයන්හිදී, කරන ලද කර්මයන් නිසා, ලබාගත් ප්‍රේත ආත්මභාවයන්හි විවිධ ස්වරූපයන් විවිධ ආකාරයෙන්,

6. බුද්ධාදී උත්තමයන් විසින් වර්ණනා කරන ලද විස්තර කරන ලද, සංවේගය උපදවන්නාවූ කර්ම හා කර්ම විපාකයන් හෙළිකරන්නා වූ ධර්ම දේශනයක් වන

7. ත්‍රිපිටකය සංගායනා කරන ලද මහාස්ථවිරයන් වහන්සේලා විසින්, ඛුද්දක නිකායෙහි ඇතුළත් "පේතවත්ථු" නම් වූ කරන ලද, විශේෂයෙන් දතයුතු කථාවස්තූන් ගෙන් පිරි "පේතවත්ථු" නම් ග්‍රන්ථය.

8. ඒ ඒ කථාවන්හි නිදානය, විස්තරාර්ථ, විශේෂයෙන් සඳහන් කරමින්, පුරාණ අර්ථ කථාචාර්ය වරුන්ගේ විස්තර කිරීම් අනුව ම.,

9. සුපිරිසිදු වූ, අසඞ්කීර්ණ වූ, දක්ෂයන් විසින් විනිශ්චය කරනලද්දාවූ, එම ප්‍රකරණය. මහා විහාර වාසීන්ගේ නය ක්‍රමය නො ඉක්මවා,

10. මගේ ශක්ති ප්‍රමාණයෙන් ප්‍රේත වත්ථුවේ අර්ථ වර්ණනාව කරන්නෙමි. සකස්කොට මැනවින් එය කියවන්නේ, යහපත් සේ සාවධාන ව ඇසිය යුතු.

එහි පේතවත්ථු - සිටු ප්‍රත්‍රාදී වූ ඒ ඒ සත්ත්වයන්, ප්‍රේතව ඉපදීමට හේතු වූ යම් අකුසල කර්මයක් වේද ? ඒ අකුසල කර්ම ප්‍රකාශ කිරීම් වශයෙන් පැවති "ඛෙත්තූපමා අරහනෙතා" යනාදි වූ පර්යාප්ති ධර්මය පේතවත්ථු යන්නෙන් ගැනේ.

ඒ ප්‍රේතවස්තු දේශනාව කවරෙකු විසින් කියන ලද්දේ ද? කොතැන්හිදී කියන ලද්දේ ද? කිනම් හේතුවක් නිසා පවසන ලද්දේ ද? යන විස්තර මතු කියනු ලැබේ.

මේ ප්‍රේතවස්තු වනාහි දෙපරිදිව පැවතේ. අර්ථෝත්පත්ති වශයෙන්ද , ප්‍රශ්න විසඳීම් වශයෙන් ද වේ. යම් ප්‍රේතවස්තුවක් අර්ථෝත්පත්ති වශයෙන් පැවැත්තේද එය භාග්‍යවතුන් වහන්සේ විසින් ම වදාරන ලදි. ප්‍රශ්න විසඳීම් නම් වූ අනේක නාරද ස්ථවිරයන් ආදීන් විසින් ඒ ඒ ප්‍රේතයන්ගෙන් විමසන ලද ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් ඒ ඒ ප්‍රේතයින් විසින් කියන ලදී. නාරද ස්ථවිර ආදීන් විසින් ඒ ඒ ප්‍රශ්න විචාරණ ලදුව, ඒ ඒ ප්‍රේතයන් විසින් කියන ලද ගාථා යම් හෙයකින් නාරද ආදී ශ්‍රාවකයන් විසින් ඒ ඒ අවස්ථාවන්හි දී ශාස්තෘන් වහන්සේට ඉදිරිපත් කරන ලදුව, එය විසඳන මෙන් ආරාධනා කිරීමෙන්, ශාස්තෘන් වහන්සේ අර්ථෝත්පත්ති කොට ගෙන පැමිණ සිටි සිව් පිරිසට ධර්මය දේශනා කරයි. එහෙයින් සියලු ප්‍රේතවස්තු ශාස්තෘන් වහන්සේ විසින්ම දේශිතයයි දතයුතුය.

ධර්මචක්‍ර සූත්‍ර දේශනාව පැවැත්වීමෙන් පසුව ශාස්තෘන් වහන්සේ රජගහ නුවර ආදී ඒ ඒ තැන්වල වැඩවසමින් බොහෝ සෙයින් අර්ථෝත්පත්ති වශයෙන් එළඹ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම් වශයෙන් සත්ත්වයන්ට කර්මඵල කර්මවිපාක ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා ඒ ඒ ප්‍රේත වස්තු දේශනාකොට ඇත. මෙහි පළමුකොට "කවරෙකු විසින් කියන ලද්දේ ද ආදී පදයන්ට සාධාරණ විසඳුමයි. අසාධාරණ විසදීම් වනාහි ඒ ඒ වස්තූන් සම්බන්ධ අර්ථවර්ණනාවන්හි ම එන්නේ ය. මේ ප්‍රේතවස්තු දේශනාව, විනය, සූත්‍ර, අභිධර්ම තුන් පිටකය අතුරෙන් සූත්‍රපිටකයෙහි ම ඇතුළත් වේ. දීඝනිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අඞ්ගුත්තර නිකාය, ඛුද්දක නිකාය යන නිකාය පහෙන් ඛුද්දක නිකායෙහි ම ඇතුළත් වන්නේ ය. සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූත ධම්ම, වේදල්ල, යන නවාංග ශාස්තෘ ශාසනයේ ගාථාඞ්ගයට ඇතුළත් වන්නේ ය.

සුවාසූ දහසක් ධර්මස්කන්ධයන්ගෙන් දෙ අසූ දහසක් සම්මා සම්බුදුන් වහන්සේ වෙතින් ද, දෙදහසක් සැරියුත් මුගලන් ආදී ශ්‍රාවක සඞඝයා වෙතින් ද අවබෝධ කරගත්මි යි ධර්මභාණ්ඩාගාරික (ආනන්ද) ස්ථවිරයන් විසින් ප්‍රතිඥා දෙන ලදී. ඒ අසූහාර දහසක් ධර්මස්කන්ධය ධර්මස්කන්ධ කිහිපයකින් සමන් විත ය. බණවර වසයෙන් බණවර සතරක්, වර්ග වශයෙන් උරග වර්ගය, උබ්බරී වර්ගය, චූල වර්ගය මහා වර්ගය යන වර්ග සතරකින් සමන්විත ය. එහි පළමුවන වර්ගයේ කථාවස්තු දොළසකි. දෙවෙනි වර්ගයෙහි කථා වස්තු දහතුනකි. තුන්වෙනි වර්ගයෙහි කථා දහයෙකි. හතර වෙනි වර්ගයෙහි කථා දහසයෙකි. යනුවෙන් එක් පණස් කථා වලින් සරසන ලද්දී ය. එහි වස්තු අතුරෙන් උරගවර්ගයට ඇතුළත් ඛෙත්තූපම ප්‍රේත වස්තුව මුල් වේ. ඒ වස්තුවෙන් ද "ඛෙත්තූපමා අරහනෙතා" ආදී ගාථාව පළමුවම දැක් වේ.

# 1-1

භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ඇසුරු කරමින්, ලෙහෙනුන්ට බත් වැටුප් දුන් බැවින් කලන්දක නිවාප නම් වූ වේළුවනාරාමයෙහි වසන කල්හි එක්තරා සිටු පුතෙකු අරභයා මේ ඛෙත්තූපම ප්‍රේත වස්තුව දේශනා කළ සේක. රජගහනුවර ධන සම්පත්තියෙන් ආඪ්‍ය වූ, මහත් ධන ඇති, මහා සම්පත් ඇති, නොයෙක් වස්තු හා උපකරණ ඇති, රැස්කරන ලද කෝටි ගණන් ධනය ඇති, එක්තරා සිටුවරයෙක් සිටියේ ය. ඔහුගේ මහා ධන සම්භාරය නිසා ඔහු මහාධන සිටාණෝ යයි නම් ලදහ. ඔහුට එක් පුතෙක් විය. ඔහු ප්‍රිය මනාපය. ඒ පුත්‍රයා නුවණැති බවට පත් කල්හි දෙමාපියෝ මෙසේ සිතූහ. අපේ පුතා දිනපතා දහස බැගින් වියදම් කළත් අවුරුදු සියයකින් වත් මේ ධනය අවසන් නොවේ. ඒ නිසා ශිල්ප ශාස්ත්‍ර උගැන්වීමෙන් අර්ථයක් නැත. ක්ලාන්ත නුවූ කයින් හා සිතින් යුතුව සුවසේ මේ සම්පත්වලින් සැප විඳීවා යි සිතා කිසිවක් නො ඉගැන්නුවේ ය. වයසට පැමිණිකල ඔහුට කුලයෙන් ද රූපයෙන් ද, යෞවන විලාසයෙන් ද සම්පූර්ණ වූ පඤ්චකාම රසාස්වාදයට ම සිත නැමුණු. ධර්මය පිළිබඳ නො සිතන කාන්තාවක් විවාහ කර දුන්හ. ඔහු ඇය සමග අභිරමණය කරන්නේ කුසල ධර්මයන් පිළිබඳව කල්පනා නො කළේ ය. ශ්‍රමණ බ්‍රාහ්මණයන් හා ගුරු දෙමව්පියන් කෙරෙහි ආදර ගෞරව රහිතව, සුරා සොඬුන් ආදීන් ඇසුරු කරමින් තුටු පහටු වෙමින් පස්කම් සැප විඳීමෙහි ම ඇලෙමින් මෝහයෙන් අන්ධ වී කල් යවා, දෙමාපියන් මිය ගිය කල්හි නළු නිළි ගායක ගායිකාවන්ට කැමති පරිදි දෙමින් ධනය විනාශ කොට, කෙටිකලකින් ම වස්තුව පිරිහී ණයට ගෙන ජීවත්වන්නේ, පසුව ණය ද නො ලබා, ණය හිමියන්ට තමන් සතු ඉඩකඩම් ගෙවල් දොරවල් දී කබල් ගත් අත් ඇති ව හිඟා කමින්, එම නුවර අනාථ ශාලාවක ජීවත් වේ.

එකල්හි එක් දවසක් සොරුන් පිරිසක් පැමිණ ඔහුට මෙසේ කීය.
එම්බල පුරුෂය ! ඔබ තව ම තරුණය, අත් පාවල ශක්තිය හොඳට තිබේ. අත් පා විකල වුවෙකු මෙන් මේ අන්දමට දුක් ජීවිතයක් ගත කරන්නේ ඇයි? අපත් සමග එකතු ව අප සමග අනුන්ගේ ධන සම්පත් සොරකම් කොට සුවසේ ජීවත් වෙමු. යි කීහ. හෙතෙම මම සොරකම් කරන්න නො දනිමි යි කීයේය. සොරු අපි ඔබට උගන්වන්නෙමු. හුදෙක් අප කියන දේ පමණක් කරව යි කීහ. හෙතෙම මැනවැයි පිළිගෙන ඔවුන් සමග ගියේ ය. අනතුරුව සොරු ඔහුගේ අතට පොල්ලක් දී, ගෘහ සන්ධි බිඳිමින් ගෙට ඇතුල් වෙමින්,

ඔහු ව ගේ බිඳි කපොල්ල ලඟ සිටුවා ඉදින් යම් කෙනෙක් මෙහි ආයේ නම් ඔහු මේ මුගුරෙන් ගසා එක පහරින් ම මරව යි කීයේ ය. අඳ බාල වූ හෙතෙම කිසිවක් නො දන්නේ අනුන්ගේ පැමිණීම ම බලමින් එහි සිටියේ ය. සොරු ගෙට පිවිස ගත යුතු දේ ගෙන, ගෙදර මිනිසුන් දැනගත් කල්හිම එහෙන් මෙහෙන් පලාගියහ. ගෙදර මිනිස්සු නැගිට වහ වහා දුව ගොස් එහෙ මෙහ බලන්නේ ගේ බිඳි තැන සිටි ඒ පුරුෂයා දැක, එම්බා දුෂ්ට හොරා යයි කියා අල්ලා ගෙන පොලුවලින් ගසා අත් පා ආදිය බැඳ මුගුරු ආදියෙන් තලා මහරජ මෙතෙම අපේ ගෙවල් බිඳි මහ සොරා ය. ගෘහසන්ධියෙහි සිට අල්ලාගත්තේ ය. යි කියා රජුට භාර දුන්නේ ය. එවිට රජතුමා මේ සොරාගේ හිස කපා දමවයි නගරගුත්තිකට පැවරීය. අණ කළේ ය. නගරගුත්තිකයා ද යහපති දේවයිනි යි කියා ඔහු ගෙන්වාගෙන පිටිතල හයා දැඩිකොට බැඳ රත් පැහැ මල්දම් බෙල්ලේ දමා, ගඩොල් සුණු ගල්වන ලද හිස් ඇති ව වධය සඳහා ගසන බෙරහඬින් යුතුව වීදියෙන් වීදියට මංසන්ධියෙන් මංසන්ධියට ගෙනයමින් කසවලින් ගසමින්, වධකස්ථානයට ගෙනගියේ ය. මේ නගරයෙහි දේපල පැහැරගත් සොරා අප විසින් අල්ලා ගන්නා ලදැයි නගරයේ හැම තැන පැතිර ගියේ ය.

එකල්හි එම නගරයෙහි සුලසා නම් වූ නගරසෝභිණිය ප්‍රාසාදයෙහි සිට කවුළුවෙන් බලන්නේ, එසේ වධයට ගෙන යන ඒ පුද්ගලයා දැක, පෙර ඔහු සමග වාසය කර පුරුදු ඇත්තී, මේ පුරුෂයා මේ නගරයෙහි ම මහත් සම්පත් විඳ දැන් මෙබඳු වූ අනතුරකට විපතකට පැමිණියේයයි ඔහු පිළිබඳ ව කරුණාව උපදවා අග්ගලා සතරක් හා පියයුතු පැන් ද මෙහෙ කරුවකු අත යැවී ය. මේ පුරුෂයා මේ අග්ගලා කා පැන් බොනතුරු ස්වාමි තෙමේ බලාපොරොත්තු වේවායි කියා නගර ගුත්තික ඇමතියාට ආයාචනයක් ද යැවී ය.

මේ අතර මහා මුගලන් ස්ථවීරයන් වහන්සේ දිවැසින් බලන්නේ ඔහු ව්‍යසනයට පැමිණි බව දැක, කරුණා පෙරදැරිව. මේ පුරුසයා පින් නොකළ කෙනෙක. පව් කළ කෙනෙක, ඒ හේතුවෙන් මොහු නරකයෙහි උපදින්නේ ය. මා එහි ගිය කල්හි අග්ගලා හා පැන් මට දී භුමාටු දේවියෙක් වී උපදින්නේ ය. එබැවින් මේ තැනැත්තාට පිහිට වන්නේ නම් මැනවියි සිතා පැන් හා අග්ගලා ගෙනෙන මෙහොතෙහි ඒ පුරුෂයා ඉදිරියේ පහළ වූ සේක. ඒ විපතට පත් පුරුෂයා මුගලන් මහ තෙරුන් වහන්සේ දැක පහන්සිත් ඇතිව, තව මොහොතකින් මේ වධකයෝ මා මරා දමති. අග්ගලා කෑමෙන් මට කවර ප්‍රයෝජනද, මෙය පරලොව යන්නා වූ මට මග වියදම්

වන්නේ යයි සිතා අග්ගලා සහ පැන් තෙරුන්වහන්සේට පූජා කළේ ය. ස්ථවිරයන් වහන්සේ ද ඔහුගේ ප්‍රසාදය වර්ධනය කිරීම පිණිස ඔහු බලා සිටිය දී ම සුදුසු තැනෙක වැඩ හිඳ, අග්ගලා වළඳා, පැන් බී, හුනස්නෙන් නැගිට වැඩියේ ය.

ඒ පුරුෂයා චෝරඝාතකයන් විසින් වධකස්ථානයට පමුණුවා හිස කපා මරණයට පත්කරන ලදී. අනුත්තර වූ පින්කෙත් වූ මුගලන් හිමියන් කෙරෙහි කරන ලද පින්කම හේතුවෙන් මහත් සම්පත් ඇති දිව්‍ය ලෝකයෙහි ඉපදීමට සුදුසුකම් පැවැතියත්, සුලසාව නිසා මා විසින් දානමය පින්කම කරන ලද්දේයයි සුලසාව පිළිබඳව ඇතිකර ගත් ස්නේහය නිසා මරණ මොහොතෙහි සිත කිලුටුවූයෙන්, හීනාත්මයක් ලදුයේ පර්වතයෙන් ගැවසීගත් පෙදෙසක ගන සෙවණ ඇති මහා නුග රුකෙක රුක් දෙවියකු වී උපන්නේ ය.

හෙතෙම වනාහී ප්‍රථම වයසේ කුලවංශය ආරක්ෂා කළේ නම් මධ්‍යම සිටු කෙනෙක් වෙයි. පැසුළු වියෙහිදී උත්සාහ කළේ නම් සුළු සිටුවරයෙක් වෙයි. ප්‍රථම වියෙහි දී පැවිදි වූයේ නම් රහත් වන්නේ ය. මැදි වියේදී පැවිදි වූයේ නම් සකෘදාගාමී හෝ අනාගාමී වේ. පැසුළු වියේදී පැවිදි වූයේ නම් සෝවාන් වන්නේ ය. පවිටු මිතුරන් ඇසුරෙන් ස්ත්‍රී ධූර්ත වූයේ සුරා ධූර්ත වූයේ දුශ්චරිත වූයේ ශ්‍රමණ බමුණන් කෙරෙහි අනාදර වූයේ වී අනුක්‍රමයෙන් සියලු සම්පත් පිරිහී මහා විපතකට පත්වූයේ යයි කියත්.

ඊට පසු දවසක උයනට ගොස් සිටි සුලසාවන් දැක, හටගත් කාමරාග ඇත්තේ අඳුරක් මවා සුලසාව ඔහුගේ භවන යට ගෙන ගොස් සත්දිනක් ඇය සමග සංවාස කළේ ය. තමන්ගේ තොරතුරු ද කීය. සුලසාවගේ මව සුලසා නොදක්නී හඬා වැළපෙමින් ඔබ මොබ ඇවිදියි. මහාජනයා ඈ දැක කියන්නේ ආර්ය වූ මහ මුගලන් තෙරුන් වහන්සේ මහා ඍද්ධි ඇති මහානුභාව ඇති කෙනෙකි. උන්වහන්සේ ඇගේ ස්වභාවය දන්නා හ. උන්වහන්සේ වෙත පැමිණ විචාරවයි කීහ. ඕ තෙරුන් වහන්සේ වෙත පැමිණ ඒ කාරණය විචාළා ය. මෙයින් සත්වන දිනයෙහි වේළුවනයෙහි දී භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්ම දේශනා කරන කල්හී පිරිස් කෙළවර දී ඇය දක්ක හැකි. වන්නේ යයි තෙරණුවෝ වදාළහ. අනතුරුව සුලසා ඒ දේව පුත්‍රයාට මෙසේ කීය. පින්වත් දෙවිය! නුඹගේ භවනයෙහි වසන්නා වූ මට අද සත්වන දවස ගතවිය. මමය සුදුසු නොවේ. මගේ මව මා නොදක

විලාපයට හා ශෝකයට පත්වන්නීය. එබැවින් මා එහිම පමුණුවන්නේ නම් මැනැවි" (යයි කීය.)

ඒ දිව්‍ය පුත්‍රයා ඈ ගෙන ගොස්, භාග්‍යවතුන් වහන්සේ වේළුවනාරාමයෙහි ධර්ම දේශනා කරන වේලේ පිරිස් කෙළවර නවතා තමන් අදෘශ්‍යමාන ව සිටියේ ය. එකල් හි සුලසාව දුටු මිනිස්සු ඇයට මෙසේ කීහ. සුලසා නැගනියනි! ඔබ මෙතෙක් දවස් කොහි ගියේ ද? ඔබ නොදුක ඔබේ මව විලාපකීමට හා ශෝක කිරීමට පැමිණියේ උමතුවූවාක් මෙන් විය. සුලසා යටගිය සියලු පුවත් මහජනයාට කීවේය. (එයසා) එසේ පව් රැස්කළා වූ පින් නොකළා වූ ඒ පුරුෂයා කෙසේ නම් දෙවියෙක් වී දැයි මිනිස්සු විචාළහ. එකල්හි මා විසින් මරණ මොහොතේ ඔහුට දෙන ලද අග්ගලා හා පැන් මුගලන් මහරහතන් වහන්සේට පූජා කොට ඒ පිනින් ඔහු දේවාත්ම භාවයක් ලැබී යයි සුලසා පැහැදිලි කළා ය. ඒ අසා මහජනයා පුදුමසහගත සිත් ඇත්තෝ වූහ.

රහතන් වහන්සේ වනාහි ලෝවැස්සාට මහත් පින්කෙතකි. මෙබඳු රහතන් වහන්සේ විෂයෙහි කරන, ඉතා ස්වල්ප වූ ද සත්කාරය සත්ත්වයන්ට දිව්‍යෝත්පත්තිය ගෙන දේ යයි මහත් වූ ප්‍රීති සොම්නසට පැමිණියහ. භික්ෂූන් වහන්සේ ඒ කාරණය භාග්‍යවතුන් වහන්සේට සැළ කළහ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ එම කරුණ අර්ථෝත්පත්ති කොට ගෙන, මේ ගාථාවෝ වදාළහ.

1. ක්ෂීණාශ්‍රව වූ රහතන් වහන්සේ (ඵලදායී) ක්ෂේත්‍ර සමාන ය. දායකයෝ ගොවීන් හා සමාන වෙති. දියයුතු දානවස්තුව බිත්තර වී  හා සමාන ය. මේ හේතුවෙන් (උදාරතර) විපාකය උපදී.

2. කියන ලද පරිදි බීජය ද, කෘෂිකර්මය ද, කුඹුර ද, යන මෙම කරුණු තුන ප්‍රේතයන්ට ද දායකයන්ට ද (උපකාර පිණිස පවතී) ඒ දාන විපාකය ප්‍රේතයෝ විඳිති. දායකයෝ පින් බලයෙන් මහත්සේ වැඩේ.

3. කුසල් කොට මේ ආත්මයේදීම ප්‍රේතයන් ද අනුමෝදන් කරන්නේ, යහපත් වූ කුශල කර්ම කොට දෙව්ලොව ඉපදීමට ද පැමිණේ.

මෙහි **ඛෙත්තූපමා** - බහන ලද වපුරණ ලද බීජ ආරක්ෂා කරයි. බොහෝ අස්වැන්න ගෙන දීමෙන් රකියි, යන අර්ථයෙන් වී බීජ ආදිය විසුරුවන

ස්ථානය, ඉහිත ස්ථානය කෙත නම වේ. එම උපමාව මෙහි රුදේනුයි ඛෙත්තූපම වේ. කුඹුර හා සමාන වේ යන අර්ථයි. **අරහනෙතා** - ආශ්‍රවයන් ක්ෂය කළ තැනැත්තා රාග ද්වේෂ ආදී ක්ලේශයන්ගේ හා සංසාර වෘත්තය නමැති රෝදයේ ගරාදි නැසූ හෙයින්, ද එසේ නැසූ හෙයින් චීවරාදි සිව්පසය පිළිගැනීමට සුදුසු හෙයින් ද, පව් කිරිමේ රහසක් නැති හෙයින් ද (රහසින් වත් පව් නොකරන හෙයින් ද) අර්හත් යයි කියනු ලැබේ. යම්සේ තණ වල් පැළැටි ආදී දෝෂ විරහිත ව, මනා කොට සකස් කළ කෙතෙහි බීජ වැපිරූ කල්හි, සුදුසු කල්හි ජලය සැපයීම් ආදියෙන් යුක්ත වූ ගොවීන්ට බොහෝ අස්වැන්න ලැබේ ද? එසේම ලෝභ ද්වේෂ ආදී ක්ලෙශ රහිත වූ යහපත් ලෙස සකස් කරන ලද රහතුන්ගේ සන්තානයෙහි දාන වස්තු නමැති බීජ වපුල කල්හි, ප්‍රත්‍යාන්තර සහිත වූයේ දායකයා මහත් ප්‍රතිවිපාක ලබන්නේ ය. එබැවින් භාග්‍යවතුන් වහන්සේ "ඛෙතතූපමා අරහනෙතා " යයි දක් වූ සේක. එය උසස් වූ නිර්දේශයකි. ශෛක්ෂයන් ද, ක්ෂේත්‍ර ද සමානත්වයේ පිහිටුවන ලදී, දායක - චීවරාදී සිව්පසයන් දෙන තැනැත්තා, පරිත්‍යාග කරන ජනයා මේ සිව්පස පරිත්‍යාගයෙන් තමන්ගේ සිතෙහි පවතින ලෝභාදී අකුසල ධර්ම සිඳ දමයි. විනාශකරයි. එයින් තමන්ගේ සන්තානය පිරිසිදු කරයි. (ක්ලේෂයන්ගෙන්) ආරක්ෂා කරයි. යන අර්ථයි **කසසකූපමා** - ගොවියෙක් සමාන වේ. ගොවියා යම්සේ හැල්කෙත් ආදිය සා සුදුසු කාලයේ දී, වැස්ස ලැබීම, දිය ලබා දීම, වැඩි ජලය පහකිරීම, ගවමහීෂාදීන්ගේ රැකීම. ආදී (කෘෂිකාර්මික වෘත්තීයෙහි) අප්‍රමාදී වූයේ මහත් වූ සක්‍රිය වූ අස්වැන්නක් ලබයි. මෙසේ දායකයාද රහතුන් කෙරෙහි දීමට සුදුසු දාන වස්තු පරිත්‍යාග කිරීමෙන් හි උපස්ථාන කිරීමෙ හි අප්‍රමාදී වූයේ මහත් වූ විපුල වූ මහත් වූ දාන විපාක ලබයි. දායක **කසසා කූපමා** යනු එහෙයින් කියන ලදී.

**බීජූපමං දෙය්‍ය ධම්මං** - ලිඞ්ග විපර්යාසයෙන් කියන ලදී. බීජ සමාන වූ දාන වස්තුව යන අර්ථයි. ආහාර පානාදී වූ දියයුතු දශවිධ දාන වස්තුව මෙයින් කීහ. **එත්‍තතො නිබ්බත්තතෙ ඵලං** - දායක, ප්‍රතිග්‍රාහක, පරිත්‍යාග කළයුතු දෙය්‍ය ධර්මය දාන ඵලය උපදවන්නේ ම ය. එසේ උපදින ඵලය බොහෝ විපාක දෙමින් බොහෝ කලක් පවතී යන අර්ථය. මෙහි යම්හෙයකින් පරිත්‍යාගී චේතනාවට සම්බන්ධ වූ ආහාර පාන ආදී වස්තු හා අනෙක් උපස්ථාන ආදිය, දෙය්‍යධර්ම වස්තුව බිජුවටට උපමාවෙයි.

**එතං බීජං කසී ඛෙත්තං** - සුදුසු පරිදි සැකසු බීජය, යම්සේ කියන ලද කෙත,

එම බීජ එම කෙතෙහි වපුරන ක්‍රියාව කරන ගොවියා යන අර්ථය. වැපිරීම් සංඛ්‍යාත කෘෂිකර්මය ද, රහතන් නමැති කෙත ද, බිජුවට නම් වූ දාන වස්තුව ද යන කරුණු තුන ප්‍රේතයාටත් දායකයාටත් උපකාර පිණිස පවතී. යම් කිසි දායකයෙක් ප්‍රේතයන් උදෙසා දන් දෙයි ද, ප්‍රේතයාට ද දායකයාට ද, එය උපකාර වේ. ඉක්බිති ප්‍රේතයන් නො උදෙසා දන් දෙයි ද එය දායකයාට ම පිහිටවේ. මේ බීජය, ගොවියා, මේ කෙත, ඔවුනොවුන්ට උපකාරක වේ යන අදහසයි. දැන් ඒ උපකාරය දැක්වීමට "**ඒ ප්‍රේතයෝ භුක්ති** නොවිඳිත් ද දෙන්නාගේ ම දායකයාගේ ම පින වැඩේ. එහි "**තං පෙතා පරිභුඤ්ජන්ති**" දායකයා විසින් ප්‍රේතයන් උදෙසා දන් දුන් කල්හි, (යම් පරිද්දෙකින් කියන ලද කෙතෙහි ගොවියා බීජ සම්පත්) ඒ පින් අනුමෝදන් කරන්නේ ද? ප්‍රේතයෝ ද ඒ දාන විපාකය අනුමෝදන් ව පරිභෝග කරයි. **දාතා පුඤ්ඤේන වඩ්ඪති** දෙන තැනැත්තා වනාහි තමන්ගේ දානමය පින්කමෙහි හේතුවෙන් දෙව්මිනිස් සුව, භව භෝග සම්පත් ආදිය පින්පලයෙන් වර්ධනය කරයි. පුඤ්ඤ එලම්පිහී පින්එල වනාහී "**කුසලානං භික්ඛවෙ ධම්මානං සමාදාන හෙතු යවමිදං පුඤ්ඤං වඩ්ඪති** " ආදී වශයෙන් පින් යයි කියයි.

**ඉධෙව කුසලං කත්වා** - මෙම ආත්ම භාවයෙහි දීම, නිවැරදි සැප විපාක සඳහා, ප්‍රේතයන් උදෙසා දානමය පුණ්‍ය කර්මයන් රැසි කොට, **පෙතෙච පටිපූජයන්ති** - දායකයන් විසින් ප්‍රේතයන් උදෙසා දන් පුදා ඔවුන් විඳින්නාවූ දුක්වලින් මුදා ප්‍රේතයන් උදෙසා දෙනු ලබන දානය ඔවුනට කරන පූජා නම් වේ. සත්කාරය නම් වේ. එහෙයින් **අමභා කඤ්ච කතං** යනාදිය කීහ. ප්‍රේතයන්ට පින්දීම් වශයෙන් යහපත් කුශල ක්‍රියා කරන දායකයා මේ ආත්මයේම, ලෝකයාට ප්‍රිය මනාප කෙනෙක් වේ. නුවණැත්තන් විසින් එළඹිය යුත්තෙක් වේ. විශ්වාස කටයුත්තෙක් වේ. සැළකිය යුත්තෙක් වේ. ගරුකළ යුත්තෙක් ප්‍රශංසා කළ යුත්තෙක් වේ. වර්ණනා කටයුත්තෙක් වේ. මෙවැනි දිට්ඨ ධම්ම විපාක දානානි සංසයන් ලැබේ. **සග්ගඤ්ච කමතිට්ඨානං කම්මං කත්වාන භද්දකං** - යහපත් වූ කල්‍යාණ වූ කුශල කර්මයන් කොට දිව්‍යමය වූ ආයුෂ ආදී දස කරුණකින් යුත්ත ව, සුවයූ අග්‍රහෙයින් ස්වර්ගයයි ලද නම් ඇති පින් කළවුන් උපදින්නාවූ දෙව්ලොව උපදී. අනන්තරජාති වශයෙන් උපදී. මෙහිද "**කුසලං කත්වා**"යයි කියා නැවත කුසල් කොට දෙය්‍ය ධර්ම පරිත්‍යාග ය මෙන්, ප්‍රාප්ති දාන වශයෙන් දාන ධර්ම පරිත්‍යාගය ද දානමය කුසල කර්මය මැයි දක්වනු සඳහා යයි දතයුතු.

සමහර කෙනෙක් "පේත" යන්නෙන් රහතුන් ද අදහස් කරයි. ඒ ඔවුන්ගේ මති මාත්‍රයකි. "පේත" කියන නමක් ක්ෂීණාශ්‍රවයන්ට ආ තැනක් නැති බැවිනි. බීජාදි භාවයගේ හා දායකයාගේ මෙන් ඒ රහතුන් නොයෙදෙන බැවින් හා ප්‍රේතයෝනික සත්ත්වයන් පිළිබඳව ම යෙදෙන බැවින් ය. දේසනාවසානයේ දේවපුත්‍රයා හා සුලසාවන් ආදිකොට ඇති සුවාසූ දහසක් සත්ත්වයන්ට ධර්මාභිසමය වූයේ ය.

**පරමත්ථ දීපනී නම් වූ පේතවත්ථු වර්ණනාවෙහි**
**ඛෙත්තූපමා ප්‍රේත වස්තුව**
**නිමියේ ය.**

—//—

## 1-2

**කායො තෙ සබ්බ සො වණ්ණො** - මෙම ධර්ම දේශනාව ශාස්තෲන් වහන්සේ රජගහනුවර ඇසුරු කොට ලෙහෙනුන්ට බත් වැටුප් දුන් තැන වූ වේළුවනාරාමයෙහි කලන්දක නිවාපයෙහි වැඩ වසන්නේ එක්තරා ඌරු මුවක් ඇති ප්‍රේතයකු අරභයා දේශනා කළ සේක.

ඈත අතීතයෙහි කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි එක් භික්ෂුනමක් කායද්වාරයෙන් හික්මීම ඇත්තේ විය. වාක් ද්වාරයෙන් හික්මීම නැත්තේ විය. භික්ෂුන්ට ආක්‍රොශ කරයි. පරිභව කරයි. ඒ භික්ෂුව කළුරිය කොට නිරයෙහි උපන්නේ, එක් බුද්ධාන්තරයක් මුළුල්ලේ ම ඒ නරකයෙහි පැසී, එයින් චුත ව මේ බුද්‍ධොත්පාදයෙහි දී රජගහ නුවර සමීපයෙහි ගිජ්ඣකූට පර්වත ප්‍රාන්තයෙහි, ඔහුගේ ම කර්මයේ විපාක වසයෙන් දුකෙන් හා පිපාසයෙන් මඩනා ලදුව ප්‍රේතයකු වී උපන්නේ ය. ඔහුගේ ශරීරය රන්වන් පැහැ විය. මුහුණ ඌරු මුවක් වැනි ය. එක් දිනක් ආයුෂ්මත් නාරද භික්ෂුව පර්වතයෙහි වසන්නේ උදේ ට ශරීරය පිළිදගුම් කොට පා සිවුරු රැගෙන රජගහ නුවරට පිඬු පිණිස වඩින්නේ අතරමග දී ඒ ප්‍රේතයා දැක ඔහු විසින් කරන ලද කර්මය විමසන්නේ.

4. ඔබගේ ශරීරය සියල්ල රන්වන්ය. සියළු දිශාවන් බබළන ශරීර ප්‍රභාවෙන් බබ ළයි. එහෙත් තොපගේ මුඛය වනාහි සූකරයකුගේ බඳු ය. පෙර ජාතියෙහි කෙබඳු කර්මයක් කළේ ද.

එහි **කායො තෙ සබ්බ සොවණ්ණො** - ඔබගේ ශරීරය දේහය සියල්ල ස්වර්ණ වර්ණය. රත් වී දිලිසෙන රත්රන් සමානය. සබ්බාදිසා - තොපගේ ප්‍රභාවෙන් හාත්පස සියලු දිසා ප්‍රභාශ්වර වී බබළයි - ආලෝකමත් වෙයි. අන්තර්ගත හේතු එහි අරුත්ය. ඔහුගේ ශරීරය මුළුමණින් රන්වන් වී සියලු දිසා බබළයි, සියලු දිසා ආලෝක වෙයි. විදුලියක් සේ දිලෙයි. **මුඛනෙත සූකරසෙසවා** - මුඛය වනාහි ඌරකුගේ මෙනි. ඔබගේ මුහුණ ඌරකුගේ මුහුණ හා සමාන ය. අර්ථයි. පෙර අතීත ආත්ම භාවයන්හි දී කවර ආකාරයේ අකුසල කර්මයක් කරන ලදදැයි විචාළේය. තෙරුන් විසින් කරන ලද කර්මය විචාරණ ලදුව ඒ ප්‍රේතයා එයට පිළිතුරු දෙමින් මේ ගාථා ව කීහ.

5. කාය ද්වාරික වූ සංවරයෙන් කාය සංවර ඇත්තෙක් වීමි. වාග් ද්වාරයෙන් වචනයෙන් අසංවරයෙන් යුක්ත වීමි. පින්වත් නාරදයන් වහන්ස ඔබ වහන්සේ යම් සේ පැහැදිලි වසයෙන් මා දුටුවේද? මම එබඳු වූ ශරීර වීමි. යි කීය. එහි **කායෙන සඤ්ඤතො ආසී** කායද්වාරයෙන් සංවරවීම හික්මීමෙන් යුක්තවීමි. කායද්වාරයෙන් සංවර වීමෙන් යුක්ත වූයේ වෙමි. **වාචායාසිං අසඤ්ඤතො** වචනයෙන් කථා කිරීමෙන් අසංවර වීමි. නොහික්මීමි. **තෙන** - මේ දෙක්හි සංයමයෙන් අසංයම වීමි, නොහික් මීමි. මේ - මගේ **තාදිසො වණ්ණ** - මේ හා සමාන වූ (ප්‍රත්‍යක්ෂ වන්නා වූ, පෙනෙන්නා වූ ) ඔබ වහන්සේ විසින් ප්‍රත්‍යක්ෂ වශයෙන් දකින්නා වූ මෙබඳු වූ ශරීරයකින් මිනිසකු වශයෙන් පිහිටියේ, ස්වර්ණ වර්ණ විය. මුහුණින් ඌරෙකු සමාන විය. වර්ණ ශබ්දයෙන් මෙහි සිවිය හම අදහස් කරන්නේ යයි දත යුතු.

මෙසේ ප්‍රේත තෙමේ තෙරුන් විසින් විමසන ලද ප්‍රශ්නයට, තමන් විසින් විසඳුම් දී, තමාගේ කාරණය ම උදාහරණයට ගෙන තෙරුන්ට අවවාද දෙන්නේ මේ ගාථාව කීය.

6. පින්වත් නාරදයන් වහන්ස! නුඹ වහන්සේ විසින් තෙමේ ම මාගේ ශරීරය දක්නා ලද්දේය. එහෙයින් නුඹ වහන්සේට මම (අවවාද වශයෙන්) කියමි. මුකයෙන් හෙවත් වාග් ද්වාරයෙන් පව්කම් නොකරනු මැනවි. ඌරු මුව ඇත්තෙක් නොවේවා !

අර එහි - '**ත**' යනු එහෙයින්, **තාහ** යනු ඒ මම, නාරද ස්ථවිරයන් අමතයි. බ්‍රෑමි, කීවෙමි. සාම - යනු තමාම, **ඉදං** යනු තමාගේ ශරීරය සඳහා කියන ලදි. මේ එහි අර්ථයයි. ස්වාමීනි.

යම් හෙයකින් නාරද වූ ඔබ වහන්සේ මේ මගේ ශරීරයේ ගෙල පටන් මිනිස් සටහන් ඇත්තේ, ඔබ වහන්සේ විසින් ප්‍රත්‍යක්ෂයෙන් ම දක්නා ලද්දේ ය. එහෙයින් අවවාද වසයෙන් කියමි යි. ප්‍රේතයා කීහ. "**මාකාසි මුඛනොපාපං මා ඛො සූකර මුඛො අහු**" මෙහි 'මා' යනු පටිසෙධාර්ථයෙහි නිපාතයි. "මුඛසා" යනු කටින් මුඛයෙන්, "ඛො" යනු වචනයෙන් පාපකර්ම නො කළ යුතු යයි අවධාරණය කරයි. "**මාඛො සූකරමුඛො අහු**" මා මෙන්ම ඌරු මුව ඇත්තෙක් වන්නේ ය. යම්කිසි හෙයකින් ඔබගේ මුඛය මෙහෙයවා වචනයෙන් පව්කම් කෙරේද? අනිවාර්යයෙන් ම, සූකර මුව ඇත්තෙක් වන්නෙහි ය. එහෙයින් එය නොකළ මැනවි. ඔබ වහන්සේ දොඩමළුව වචනයෙන් පව් කම් කරන්නාහු නම් එහි විපාක වශයෙන් ඒකාන්තයෙන්,

මුඛයෙන් කරන පව් මුඛයෙන්ම ප්‍රතිවිපාක දීමට හේතු වන්නේ මය.

ඉක්බිති ආයුෂ්මත් නාරද ස්ථවීරයන් වහන්සේ රජගහනුවර පිඬු සිඟා වැඩ බතින් පසුව පිණ්ඩපාතයෙන් වැළකුණේ (පෙරළා පැමිණ) සිව්පිරිස මැද වැඩහුන් ශාස්තෘන් වහන්සේට මේ කථා පුවත දැන්වීය. ශාස්තෘන් වහන්සේ නාරදය ! පෙර ද මා විසින් ඒ සත්ත්වයා දක්නා ලද්දෙම් යි වදාරා, නොයෙක් ආකාර වාග් දුශ්චරිතයන් හී ආදීනව විපාක පෙන්නා, වාක් සුචරිතයන් ඇසුරෙන් ආනිසංස ප්‍රකාශ කරමින් ධර්මය දේශනා කළ සේක. එම දේශනාව එතැන්හි පැමිණි පිරිසට සාර්ථක විය.

"ඌරු මුව" ප්‍රේත වස්තු වර්ණනාව

නිමි ය.

—— // ——

## 1-3

**දිබ්බං සභං ධාරෙසි වණ්ණ ධාතු** - මේ ධර්ම දේශනාව ශාස්තෘන් වහන්සේ වේළුවන යෙහි ලෙහෙණුන්ට අභය දුන් තැන වැඩ වසන්නේ එක්තරා "පූතිමුඛ" ප්‍රේතයකු අරබයා වදාළ සේක. අතීතයෙහි කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි උන්වහන්සේගේ සසුනෙහි කුල දරුවන් දෙදෙනෙකු පැවිදි වී සීලාචාර සම්පන්න ව සැහැල්ලු පැවතුම් ඇතිව, එක්තරා ගමක ආවාසයක සමගිව විසූහ. ඉක්බිති එක්තරා පාපී අදහස් ඇති, කේලාම් කීමෙහි ඇලුණු භික්ෂුවක් ඔවුන් වසන තැනට පැමිණියේ ය. තෙරුන් වහන්සේලා දෙනම පිළිසඳර කථාකොට වසන තැන් දක්වා, දෙවන දිනයෙහි ඔහු ද සමගින් ගමට පිඬු පිණිස වැඩියහ. මිනිස්සු ඒ තෙරුන් දැක ඉතා යටහත් පහත් බවින් වත් පිළිවෙත් කොට කැඳ බත් ආදියෙන් පූජා කළහ. එසේ විහාරයට පැමිණි ආගන්තුක භික්ෂුව මෙසේ සිතී ය. මේ ගොදුරුගම ඉතා යහපත් ය. මිනිස්සු ද ඉතා ශ්‍රද්ධා සම්පන්නයෝ ය. ප්‍රණීත ප්‍රණීත වූ පිණ්ඩපාතය දෙති. මේ විහාරය ද ආවාසයද සිහිල් සෙවණින් හා මිහිරි ජලයෙන් යුක්ත ය. මෙහිම සුවසේ වසන්නට හැකි ය. මේ භික්ෂු දෙනම මෙහි ම සිටිද්දී මට පහසු විහරණයක් නො වන්නේ ය. අතවැසිව විසීමක් මෙන් වේ. එහෙයින් මේ තෙරුණුවන් දෙදෙන ඔවු නොවුන් බිඳවා, යම්සේ ඔවුන් මෙහි නොවසන්නෝද එසේ කරමි යි කල්පනා කළේ ය.

එක් දවසක් මහා ස්ථවිරයන් වහන්සේ අනෙක් දෙනමට අවවාද දී, තමන් වසන තැනට පිවිසියේ ය. කේලාම් කියන ආගන්තුක භික්ෂුව, ටික වේලාවක් ගෙවා මහ තෙරුන් වෙත එළඹ වැඳ (සිටියේ ය) මහතෙරුන් වහන්සේ ආයුෂ්මතිනි කුමක් හෙයින් මේ නොකල්හි පැමිනියේ දැයි විමසී ය. එසේය ස්වාමීනි කිවයුතු කිසිවක් ඇතැයි කියා, ආයුෂ්මත්නි කියව යි, තෙරුන්ගේ අනුදැක්මෙන් මෙසේ කීය. ස්වාමීනි ! ඔබගේ සහායක ස්ථවිරයෝ ඔබ හමුයෙහි මිතුරෙකු මෙන් තමන් පෙනී සිට, අනභි මුඛයෙහි (නැති තැන) සතුරෙකු මෙන් නුගුණ කීයයි. කීය. කුමක් කීයේ දැයි විචාළ කල්හි "මේ මහා ස්ථවිරයෝ කපටියෙක, කළ වරද සගවන මායා ඇත්තෙක. (නැති ගුණ පෙන්වන) කුහකයෙක මිථ්‍යා ආජීවයෙන් ජීවිකාව කරන්නෙක ආදී වශයෙන් ඔබගේ අගුණ කීවේයයි කීහ.

ඇවැත්නි එසේ නොකියව ඒ භික්ෂුව මා පිළිබඳව එසේ නො කියත් ගිහි

කාලයේ පටන් මගේ ස්වභාව දනියි. පුපේශලය යහපත් සිල් ඇත්තේ ය. ස්වාමීනි ඔබ වහන්සේ පිරිසිදු සිත් ඇති බැවින් මෙසේ සිතන්නේ ය. එසේ සලකන්නේ ය. ඒ තෙරුන් සමග මගේ වෛරයක් නැත. කුමක් හෙයින් ඔවුන් විසින් නොකියන ලද්දක් මම ඔබ වහන්සේට කියන්නෙම් ද? එය එසේ වේවා ! කල් යාමකින් තමන් විසින්ම දැනගනු ලබත්වා. යයි කී ය. මහ තෙරුන් වහන්සේ ද පෘථග්ජන බැවින් දෙගිඩියා සිත් ඇති ව මෙසේ වන්නට පුළුවන් යයි, සැක සහිත හදවතින් යුතුව විශ්වාසය මදක් ලිහිල්ව ගියේ ය. ඒ බාල භික්ෂුව පළමුව මහතෙරුන් බිඳවා අනෙත් භික්ෂුවද මේ ආකාරයෙන් ම බිඳවන ලදි. ඉක්බිති මේ තෙරුන් දෙදෙන, දෙවෙනි දවසෙහි ඔවු නොවුන් කථා නොකොට පාසිවුරු ගෙන ගමෙහි පිඬු පිණිස හැසිර, පිණ්ඩාහාරය ගෙන තම තමන් වසන තැන්වලට ම ගොස් වළඳා කථා මාත්‍රයකුදු නො කොට ඒ දවස එසේ ම වැස පහන් වූ කල්හි ඔවුනොවුන් නො දන්වා ම පහසු තැන් සොයා වැඩියහ. කේලාම් කීමෙහි යෙදුන මහණ ඉටු වූ බලාපොරොත්තු ඇති ව ගමට පිඬු පිණිස වැඩියේ ය. මිනිස්සු ඔහු දැක ඇසූහ. ස්වාමීනි ! අනෙක් තෙරවරු දෙනම කොහේ වැඩියහුද? සැමදා රාත්‍රියෙහි ඔවුනොවුන් දබර කොට, මා විසින් දබර නො කරව්, සමගි වව්, දබරය අනර්ථ කාරීයයි. මතු භවයෙහිත් දුක් උපදවන්නේ යයි, පෙර දබර කෙරුවෝ විනාශයට පත් වූහයි මා විසින් කියන ලද්දේ නමුදු, මගේ අවවාද නො පිළිගෙන කොහේද ගියාහුය යි කේලාම් කී භික්ෂුව කීහ. ඉක්බිති මිනිස්සු "ඒ තෙරුන් වහන්සේ කැමති තැනකට වඩිත්වා ! නුඹ වහන්සේ අපට අනුකම්පා පිණිස මෙම ආවාසයෙහි නො කළකිරී වසත්වා" යි අයැද සිටියහ. හෙතෙමේ මැනැවැයි පිළිගෙන දින කීපයකින් මෙසේ සිතී ය. සීලවන්ත වූ ද, යහපත් පැවැතුම් ඇත්තාවූ ද ඒ භික්ෂුන් වහන්සේලා දෙනම මා විසින් ආවාසය පිළිබඳ ලෝභකමින් බිඳුවන ලද්දේ ය. මා විසින් බොහෝ වූ ලාමක පාප කර්මයක් කරන ලද්දේ ය යි බලවත් විපිලිසර භාවයෙන් මඩනා ලද්දේ ශෝක වේගයෙන් ගිලන් වී නොබෝ කලකින් ම කළුරිය කොට අවීචි මහා නරකයෙහි උපන්නේ ය.

අනෙක් සහායක භික්ෂූහු දෙනම ජනපදයන්හි සැරිසරා එක්තරා ආවාසයක දී මුණගැසී ඔවුනොවුන් සතුටු වී ඒ කේලාම් කී මහණ විසින් කියන ලද භේදකාරී වචන අන්‍යෝන්‍යයන්ට සැළකොට, ඒවායේ හිස් බොරු බව දැනගෙන සමගි වී හිටපු ආරාමයට වැඩමවූහ.

මිනිස්සු ඒ තෙරුන් වහන්සේලා දෙනම දැක තුටු පහටු සිත් ඇත්තාහු,

හටගත් සොම්නසින් යුතු ව, සිව්පසයෙන් උපස්ථාන කළහ. තෙරුන් වහන්සේලා එහි වසමින් සත්ප්‍රාය වූ ආහාර ලැබීමෙන් එකඟ වූ සිත් ඇත්තේ විදසුන් වඩා වැඩි කල් නොයවා ම රහත් බවට පැමිණියහ.

කේලාම් කී භික්ෂුව එක් බුද්ධාන්තරයක් නිරයේ පැසී, මෙම බුද්ධෝත්පාද කාලයෙහි, රජගහ නුවරට නුදුරින් "කුණු" වූ කටක් ඇති ප්‍රේතයෙක් ව උපන්හ. ඔහුගේ ශරීරය රන් වන් විය. කටින් පණුවන් නික්මී ඔබමොබ යමින් කට කති. ඔහුගේ මුඛයෙන් ඉතා දුරවුවද අවකාශය පැතිර දුගඳ හමයි. නාරද ස්ථවිරයන් වහන්සේ ගිජුකුළු පව්වෙන් බසිද්දී ඔහු දැක,

7. දෙවියන්ගේ ශරීරයට බඳු වූ යහපත් වූ රන්වන් සමක් ඔබ දරන්නෙහි ය. වේහාස යයි නම් ඇති අහසෙහි සිටින්නෙහි ය. එසේ වුවත් කුණු ගඳ වූ ඔබේ මුඛය පණුවෝ කති. පෙර ජාතියෙහි කිනම් කර්මයක් කරන ලද්දේ ද?

යනුවෙන් මෙම ගාථාවෙන් කරන ලද කාර්යය විචාළේ ය.

එහි දිබ්බ නම් දෙව් බවයි. දිව්‍යාත්ම භාව පර්යාපන්න වූ, මෙහි දෙවියන් මෙන් වූයේ "දිබ්බං" සුභං - දැකුම්කළු, සුන්දර භාවය, යහපත් බව, මනොඥ බව, **වණ්ණධාතුං** හමේ පැහැය, ධාරෙසි - උසුලයි, දරයි. **වෙහායසං තිට්ඨසි අන්තලික්ඛෙ** - වෙහාස නම් සංඥා ඇති අහසෙහි සිටින්නෙහි ය. සමහර කෙනෙක් "විහාසයං තිට්ඨසි අන්තලික්ඛෙ" යන පාඨය දක්වා අහස හාත්පස අලංකාර කරමින් අහසෙහි සිටි යන වසයෙන් අර්ථ කියත්. පූතිගන්ධං කුණු ගඳ, දුර්ගන්ධ ය. යන අර්ථයි. **කිං කම්මකාසි පුබ්බෙ**, ඔබගෙන් ඉතාම දුගඳක් හමයි. මුඛය පණුවෝ කති. එහෙත් ශරීරය රන්වන් ය. මෙබඳු ආත්ම භාවයක් ලබන්නට ඔබ පූර්ව ජන්මයේ කරන ලද කර්මය පිළිබඳව විචාළේ ය. මෙසේ තෙරුන් විසින් ඒ ප්‍රේතයාගෙන් තමන් විසින් කරන ලද කර්මය විචාරණ ලද්දේ ඒ කාරණය පැහැදිලි කරමින්, මේ ගාථාව කීහ.

8. මම ශ්‍රමණ ප්‍රතිරූප වූ, වාග්ද්වාරයෙන් අසංවර වූ, දුෂ්ඨවචන හෙවත් බොරු කීම, කේලාම් කීම, හිස්වචන කීම ආදී වාග් දුශ්චරිතයෙන් යුත් වූ, පව්ටු මහණෙක් වීමි. මා විසින් රකින ලද බ්‍රහ්මචරියාව නිසා එහි ගුණයෙන් ශරීර වර්ණය ලබන ලදී. කේලාම් කී අකුසලයෙන් මගේ කට කුණු විය.

එහි **සමණො අහං පාපො** - මම ලාමක වූ, පහත් වූ, නීච වූ, ශ්‍රමණයෙක්, පාපී භික්ෂුවක් වීමි. **දුට්ඨවාචො** - දුක් ගෙන දෙන වචන - මෙරමා ගුණ නසන, වචන ඇත්තෙක් වීමි යන අර්ථයි. අනුන්ගේ ගුණ ඉක්මවා නැති කරන පැවතුම් ඇත්තේ වීමි. ඉතා දුක් වචන, ඉතා එරුස වචන, බොරු කීම , කේලාම් කීම, ආදී වූ වාග් දුශ්චරිතයෙන් ඇලුණු , **තපස්සි රූපො** - ශ්‍රමණ ප්‍රතිරූපකයෙක්, (ශ්‍රමණයෙක් සමාන හොරෙක්) **මුඛසා** - කටින්, **ලද්ධා** - ලබන ලදී 'ච' කාරය කෙටි කිරීමේ අර්ථයෙහි වැටේ. තපසා - බඹසර රැකීමේ අනුහසින්, **පෙසුණියෙනා** ප්‍රිය ශූන්‍ය වචන කීම, කේලාම් කීම, **පූති** - කුණු ගඳ

මෙසේ ඒ ප්‍රේතයා තමන් විසින් කරන ලද කර්මය කියා, තෙරුන් වහන්සේට අවවාද දෙමින් අවසාන ගාථාව කීය.

ආයුෂ්මත් නාරදයන් වහන්ස ! ඒ මාගේ රූපය ඔබ වහන්සේ විසින් තමන් ම දක්නා ලද්දේ ය. අනුකම්පාශීලි වූ, යම්බඳු වූ, පරහිත ප්‍රතිපත්තියෙහි දක්ෂ වූ, බුද්ධාදී උතුමෝ යමක් කීවහු ද? එය ම කියමි යි අදහසයි. කේලාම් නො කියනු බොරු නො කියනු, නුඹ කැමති පරිද්දෙන් ඉන්ද්‍රියයන් හැසිරවීමෙහි දක්ෂ වූ, යුත්ත වූ, දෙවියන් අතුරෙන් එක් අයෙක් වන්නෙහි ය.

එහි **තයිදං** ඒ මම මගේ රූපය, **අනුකම්පකා යෙ කුසලා වදෙය්‍යුං** - යම් කිසි අනුකම්පාසහගත වූ, කාරුණික වූ, අනුන් කෙරෙහි පෑ දයාවෙහි දක්ෂ වූ එසේ යෙදුනා වූ බුද්ධාදී මහෝත්තමයන් යමක් වදාරණ ලද ද? එය ම කියමි යි යන අදහසයි. දැන් අවවාද දක්වමින් මෙසේ කීහ. මා "**පෙසුණං මාච මුසා, අභාණි - යක්ඛො තුවං හොහිසි කාම කාමී**"

**පෙසුණං** - ප්‍රිය ශූන්‍ය වචන, කේලාම් කීම, බොරු කීම, නො කියව, ඉදින් ඔබ බොරුකීම, කේලාම් කීම දුරු කොට, වචනයෙන් සංයමයෙන් හැසිරෙන්නේ ද ඔබ දෙවියෙක් හෝ දෙවියන් ගෙන් අන්‍යතරයෙක් හෝ වන්නෙහි ය. කැමති කැමති පරිද්දෙන් මහත් වූ දිව්‍ය සම්පත් ලබා, එහි සැප පරිදි ඉඳුරන් හැසිරවීමෙන්, අභිරමණශීලී වූ දෙවියෙක් හෝ යක්ෂයෙක් වන්නේ ය.

එය අසා තෙරුන්වහන්සේ රජගහ නුවරට ගොස් පිඬු පිණිස හැසිර පසු

බත් වේලෙහි පිණ්ඩපාතයෙන් වැළකුණේ ශාස්තෘන් වහන්සේට එහි අර්ථය දැන්වීය. ශාස්තෘන් වහන්සේ එය අර්ථෝත්පත්ති කොට ගෙන ධර්මය දේශනා කළේ ය. ඒ ධර්මදේශනා තොමෝ එහි පැමිණිසිටි පිරිසට සාර්ථක වූයේ ය.

තුන්වන පූතිමුඛ ප්‍රේතවස්තුව
නිමියේ ය.

—//—

# 1-4

"යං කිඤ්චාරම්මණං කත්වා" යන මේ ධර්ම දේශනාව ශාස්තෲන් වහන්සේ ජේතවන විහාරයෙහි වැඩ වසන සමයෙහි අනේපිඩු සිටාණන්ගේ දානයක් අරභයා දේශනා කළ සේක.

අනේපිඩු සිටු නම් ගෘහපතියාගේ මිනිබිරියක් වූ ළඳරියකට ඇගේ කිරිමව් තොමෝ පිටියෙන් තැනූ රුවක් දුන්නා ය. මේ ඔබේ දුව ය. මෙය ගෙන සෙල්ලම් කරන්නැයි කීවා ය. ඇය එහි දුව යන හැඟීම ඇතිකර ගෙන ක්‍රීඩා කළා ය. ඉක්බිති එක් දවසක් එය ගෙන ක්‍රීඩා කරන්නේ කිසියම් ප්‍රමාදයකින් එය බිම වැටී කැඩිණ. එ දූරිය මගේ දියණිය මියගියා යයි හැඬුවා ය. ඇගේ හැඩීම ගෘහවාසී කිසිවකු විසින් සනසාලිය නො හැකිවිය. ඒ සමයෙහි ශාස්තෲන් වහන්සේ අනේපිඩු සිටුතුමාගේ නිවසේ පණවන ලද අසුනෙහි වැඩහුන්සේක. මහා සිටුතුමා ද භාග්‍යවතුන් සමීපයෙහි ම සිටියේ ය. කිරිමව ඒ ළඳරිය ගෙන සිටුතුමන් සමීපයට ගියා ය. සිටුතුමා ඇය දැක කුමක් නිසා හඬන්නේ දැයි ඇසී ය. කිරිමව ඒ පුවත සිටුතුමන්ට කීවා ය. සිටුතුමා ඒ දූරිය ඇකයෙහි හිඳුවා, නුඹේ දුව සඳහා දානයක් දෙන්නෙමු යි කියා ශාස්තෲන් වහන්සේට කීය. ස්වාමීනි ! මගේ මිණිබිරියගේ "පිටි වලින් තැනූ දියණිය උදෙසා දානයක් දෙනු කැමැත්තෙමි. හෙට ඒ දානය සඳහා පන්සියයක් භික්ෂූන් සමග ඉවසා වදාරන සේක්වා ! යි ආරාධනා කළේ ය. උන්වහන්සේ නිශ්ශබ්දතාවයෙන් ආරාධනය පිළිගත්හ. දෙවන දවසෙහි පන්සියයක් භික්ෂූන් සමග සිටුතුමාගේ ගෙදරට වැඩ දානය වළඳා අවසන්හි, අනුමෙවෙනි බණ කියන්නේ මේ ගාථාව වදාළහ.

10. නො මසුරු තැනැත්තේ යම් කිසි අරමුණක් කොට, පෙර කළුරිය කළවුන් ද, ගෘහවස්තු ආදීන්හි අධිගෘහිත දේවතාවන් ද, නැතිනම් අනෙක් දෙව් මිනිසුන් අරභයා දානය දෙන්නේ ය.

11. කුවේර, ධෘතරාෂ්ට්‍ර, විරූපාක්ෂ, විරූළ්හ. යන යසස් ඇත්තා වූ ලෝක පාලක සිව්වරම් මහරජුන් (අරභයා දන් දෙයි)

12. ඔවුහු ද දායකයා විසින් පුදන ලද්දාහු වෙත්. දායකයෝ ද නිෂ්ඵල නො වන්නෝ වෙති. මියගිය අය වෙනුවෙන් හැඬීම හෝ ශෝක වීම හෝ,

විලාපකීම, නො කළයුතු ය. මියගිය අයට ඒ හැඬීම විලාප කීම් ප්‍රයෝජන නොවේ. අනුවණ ඥාතීහු මෙසේ සිටිත්.

13. දෙන ලද මෙම දානය වූ කලි සඞ්ඝයා විෂයෙහි මොනවට පිහිටියා ය. මේ ප්‍රේතයාහට බොහෝ කලක් මුළුල්ලෙහි හිත සුව පිණිස එවේලෙහි ම පැමිණේ.

එහි **යං කිඤ්චාරම්මණං කත්වා** මඞ්ගලා දී කිසියම් එක්තරා කරුණක් අරමුණු කරගෙන, උදෙසා **දජ්ජා** දෙන්නේ ද, **අමච්ඡරී** - තමාගේ සම්පත්තියෙන් අනුන් හා සාධාරණ භාවය, නො ඉවසීම ලක්ෂණ කොට ඇති මසුරුකම නො මැත්තේ "අමච්ඡරී" පරිත්‍යාගශීලි බව, සිතෙහි ඇතිවන්නා වූ ලෝභාදී මසුරු මල දුරුකොට දන් දෙන්නේ ය. යන අදහසයි. **පුබ්බ පෙතෙච ආරබ්භ** - පෙර මිය ගියාවූ (කිසියම්) මව්පියාදීන් උදෙසා. **වත්ථුදෙවතා** ගෘහ වස්තු ආදීන්හි අධිගෘහිත දෙවි දේවතාවුන් අරභයා යන යෙදීමයි. අථවා මොවුන්ගෙන් අන්‍යවූ දෙව්මිනිස් ආදී යම්කිසි කෙනෙක් උදෙසා දන් දීම දක්වයි. එහි දෙවියන් අතුරෙන් ප්‍රකට වූ සමහර දෙවි කෙනෙක් දක්වන්නේ සතරවරම් මහ දෙව්රජවරු කියා, නැවත ඔවුන් නම්වලින් දක්වන්නේ **කුවෙර - ධතරට්ඨං** - ආදිය කීහ. කුවේර නම් වෛශ්‍රවණ ය, ධෘතරාෂ්ට්‍ර ආදී අනෙක් තිදෙන ලෝක පාලක නම්. **තෙ චෙව පූජිතා හොන්ති** - මේ මහරජවරුන් ද, පෙර මියගිය අයද, වත්තු දේවතා ආදීන් ද, උදෙසා කරන කාර්යයක් වශයෙන් ගෞරව කිරීම් වෙත්, **දායකා ච අනිප්ඵලා** - යමෙක් දන් දෙත් ද ඔවුහු දායකයෝ ය. අනුන් උදෙසා දෙන පමණින් එය නිෂ්ඵල නොවේ. තමන්ගේ දාන ඵලයේ විපාකය තමන්ට ලැබෙන්නේ ය.

දැන් යමෙක් තමන්ගේ ඥාතීන් මළ කල්හි හඬත් ද, ශෝක කරත් ද වැළපෙත් ද ඒ සියල්ල අරුත් රහිත ය. නිරර්ථක ය. තමන් ම තැවෙන්නේ ම යයි දැක්වීමට - **නහිරුණ්ණං** වා අදී ගාථාව කීහ. එහි **රුණ්ණං** හැඬීම, කඳුළු හෙළීම,

**සොකො** - සොව, හිතේ තැවිල්ල, අවබෝධය නැතිවීම යන අර්ථයි. **යාවඤ්ඤා පරිදෙවනා** හැඬීමේ ශෝකයෙන් වෙනස් වූ විලාපකීම. අහෝ එක ම පුතා ආදී වශයෙන් (අනන් මනන්) දෙඩවීම. පරස් පර විරුද්ධ අර්ථ ඇති කථාව - එය ද නො කළ යුත ය. යන අර්ථයි. සියළු ශබ්දයන්හි විකල්පාර්ථයි. **න තං පෙතස්ස අත්ථායා** - හැඬීම, දුක්වීම, ශෝකය, වැළපීම,

ආදී මේ සියල්ලගෙන් ම කළුරිය කළ තැනැත්තාට පිළිසරණක් උපකාරයක් අර්ථයක් නැත. එබැවින් ඒවා නො කළ යුතු ය. එසේ වුවත් (විද්‍යාවෙන්) නුවණින් තොර වූ ඤාතීහු එසේ කරති. යන අදහසයි.

මෙසේ හැඩීම්, විලාපදීම් ආදියෙහි නිරර්ථක බව දක්වා දූන් පෙර මියගිය ඤාතීන් ආදීන් (වෙනුවෙන්) උදෙසා දායකයන් විසින් සංඝයාට දානය දෙන ලදි. එහි සාර්ථක භාවය දක්වමින්, "අයඤ්ච බො දක්ඛිණා - පෙ ඨානසො උපකප්පති" ආදි ගාථා කීහ.

එහි **අයං** - දායකයන් විසින් දෙන ලද දානය ප්‍රත්‍ය වශයෙන් දක්වමින් කීය. 'ච' ශබ්දය අතිරේක ය. එහෙයින් යම් සේ හැඩීම් ආදී යමක් කියන ලද ද, ඒ කිසිවකින් ප්‍රතිඵල නැතිබව දක්වයි. එය එසේ දක්වමින්, මේ සඞ්ඝ දක්ෂිණාව වනාහි

දිගු කලක් හිතසුව පිණිස පවතින්නේ මයයි ද, එකෙනෙහි ම විශේෂයෙන් බබළයි. **බො** - යනු අවධාරණයෙහි නිපාතයි. **දක්ඛිණා** - දාන වස්තුව. **සඞ්ඝම්හි සුප්පතිට්ඨිත** - අනුත්තරවූ, පුණ්‍යක්ෂේත්‍රවූ, මනාව සුපසන් ව පිහිටි සඞ්ඝයා කෙරෙහි, **දීඝරත්තං හිතායස්සා** මෙය ප්‍රේතයන් බොහෝ කලක් හිතසුව පිණිස පවත්නේ ය. **ඨානසො උපකප්පති** ඒ ක්ෂණයකින් ම ප්‍රතිඵල (විපාක) උදාවේ. කල්යාමක් නැත්තේ ය. මේ එහි ධර්මතාවයයි. යම් ප්‍රේතයෙක් උදෙසා දානයක් දෙන ලද්දේ ද? ඒකාන්තයෙන් ඒ ප්‍රේතයා අනුමෝදන් වේ. එහි විපාකයෙන් ප්‍රේතයා. ප්‍රේත දුකින් මිදෙත්.

දෙවන දවස් හි සිටු බිරිඳ හා සෙසු ඤාතීහු සිටුවරයා අනුව යමින් මෙසේ මාසයක් පමණ මහා දන් පැවැත් වූහ. අනතුරුව ප්‍රසේනජිත් කොසොල් මහරජු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ, කවර හෙයකින් මාසයක් පමණ භික්ෂූන් වහන්සේලා මගේ ගෙදරට නො වැඩියේ මන්දැයි ඇසීය. ශාස්තෘන් වහන්සේ අදාළ කරුණ වදාළ කල්හි රජතුමා ද සිටුවරයා අනුව පවතිමින් බුදුන් ප්‍රමුඛ මහා සඞ්ඝයාට මහදන් පැවැත්වීය. ඒ දැක නගර වැස්සෝ ද රජු අනුව යමින් මාසයක් පමණ මහදන් පැවැත්වූහ. මෙසේ මාස දෙකක් (පිට්ඨි ධීතලිකාව) පිටිවලින් තැනූ දියණිය මුල් කරගෙන මහා දන් පැවැත් වූහ.

"පිට්ඨි ධීතලිකා " ප්‍රේත වස්තු වර්ණනාව

නිමියේ ය.

—//—

# 1-5

"තිරො කුඩ්ඩෙසු තිට්ඨන්ති" ආදී මෙම ධර්මදේශනාව ශාස්තෘන් වහන්සේ රජගහ නුවර වැඩ වාසය කරමින් සිටිය දී, බොහෝ වූ ප්‍රේතයන් අරභයා දේශනා කළසේක. මේ එහි විස්තර කථාවයි. මෙයින් දෙයානුවන කල්පයෙහි කාසිපුර නම් නුවරක් විය. එහි ජයසේන නම් රජු රාජ්‍ය ය කරවීය. ඔහුගේ දේවිය සිරිමා නම් ඇගේ කුසෙහි "ඵුස්ස" නම් බෝසත් තුමා පිළිසිඳ ඉපදී, අනු පිළිවෙළින් සම්මා සම්බුද්ධත්වයට පත්විය. ජයසේන රජු, මගේ පුතා මහාභිනිෂ්ක්‍රමණ යෙන් නික්මී, බුදු වූයේ ය. බුද්ධරත්නය මගේ ය. ධර්මරත්නය මගේ ය. සංඝ රත්නය මගේ යයි මමත්වය උපදවා සියලු කල්හි තමා ම උපස්ථාන කරයි. අන්‍යයන්ට අවස්ථාවක් නො දෙයි භාග්‍යවතුන් වහන්සේගේ බාල සහෝදර වූ, සුළු මවගේ පුතුන් තිදෙනා සිතුහ. බුදුවරයෝ නම් සියළු ලෝවැස්සන්ට හිතසුව පිණිස ම උපදනාහු ය. එක් අයෙකුගේ ම හිත සුව පිණිස නූපදී, අපගේ පියා අන්‍යයන්ට අවස්ථාවක් නො දෙයි. භාග්‍යවතුන් වහන්සේට හා සඞ්ඝයාට උපස්ථාන කරන්නට කෙසේ හෝ ඉඩ ප්‍රස්ථා ලබමියි, සිතුහ. ඒකාන්තයෙන් අපි කිසියම් උපායක් කරමුයි සිතු ඔවුහු, එක්තරා ප්‍රත්‍යන්ත ජනපදයක කැරැල්ලක් (කුපිතකිරීමක්) ඇති කළහ.

ඉක්බිතිවැ රජතෙම ප්‍රත්‍යන්ත දේශය කුපිත වීය යි අසා, පුතුන් තිදෙනා එම කැරැල්ල මැඩ පැවැත්වීම සඳහා, සන්සුන් කිරීම සඳහා පිටත්කර යැවූහ. ඔවුන් ගොස් ජනපදය සන්සිඳුවා ආවහු ය. රජතුමා තුටු වී ඔවුන්ට වරයක් දුන්නේ ය. යමක් කැමති නම් එය ගනුවයි කීය. ඔව්හු අපි භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කිරීමට කැමැත්තෙමු. (ඒ වරය අපට ලැබේවා) රජු එය හැර වෙනත් දෙයක් ගනුවයි කීහ. ඔව්හු අපට වෙනත් කිසිවක් එපා යයි කීහ. අනිත් දෙයකින් ප්‍රයෝජන නැතැයි කීහ. එසේ නම් "කාල සීමාවක් කොට ගණුවයි කීහ. ඔව්හු සත් වසක් ඉල්ලුහ. රජු නුදුන්හ. මෙසේ සය වසක්, පස්වසක් සතර වසක්, තුන් වසක්, දෙවසක්, වසක්, සත් මසක්, සය මසක්, පස් මසක් සිව්මසක්, තුන් මසක් ඉල්ලුහ. එකල්හි රජු ගණුවයි දුන්නේ ය. ඔව්හු භාභාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ මෙසේ කීහු. අපි භාග්‍යවතුන් වහන්සේට තුන් මසක් උපස්ථාන කිරීමට කැමැත්තෙමු. භාග්‍යවතුන් වහන්සේ ඉවසාවා ! ස්වාමීන් මේ තෙමස වස් වසවයි ඉල්ලුහ. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද භාවයෙන් එය ඉවසී ය. පිළිගත්හ.

ඒ තිදෙන තමාගේ ජනපදයන්හි නියුතු පිරිසට ලිපියක් යැවූහ. මේ තෙමස අප විසින් භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කළ යුතු ය. භාග්‍යවතුන් වහන්සේට විහාර ආරාමාදිය කොට සියලු උපස්ථාන කිරීමට අවශ්‍ය දේ සම්පාදනය කරව" ඔහු සියල්ල සකසා පිළිතුරු එවී ය. ඔව්හු කසාවත් වස්ත්‍ර හැඳ වතාවත් කරන්නා වූ දහස සමග භාග්‍යවතුන් වහන්සේට හා මහා සඞ්ඝයාට උපස්ථාන කරමින්, ජනපදයට වැඩමවා විහාරය පවරා වස් වැස්සවූහ. ඔවුන්ගේ භාණ්ඩාගාරික වූ එක් ගෘහපති පුත්‍රයෙක් බිරිඳ සමගම තුනුරුවන් කෙරෙහි පැහැදී ශ්‍රද්ධාසම්පන්න විය. හෙතෙම බුදුන් මුල් කොට ඇති මහා භික්ෂු සංඝයාට සකස් කොට දාන වස්තුව දුන්නේ ය. ජනපදයෙහි නියුක්ත පුරුෂයා හෙවත් ජනපදාධිපතියා ජනපදයෙහි එකොළොස් දහසක් පමණ මිනිසුන් සමග සකස් කොට දාන වස්තුව යැවීය. ඔවුන් අතුරෙන් සමහර ජනපද වැස්සෝ ශ්‍රද්ධා නැත්තෝ වූහ. ඒ සැදැහැ නැති අය දාන වස්තුවට අන්තරාය කොට දාන වස්තුව තුමූ ම කෑහ. දන් සැලද ගිනිලූහ. පිරිවර සහිත වූ ඒ රාජපුත්‍රයෝ භාග්‍යවතුන් වහන්සේට සත්කාර කොට, භාග්‍යවතුන් වහන්සේ පෙරටු කොට පිය රජු සමීපයට නැවත ගියහ. භාග්‍යවතුන් වහන්සේ එහි වැඩ පිරිනිවන් පෑ සේක. රාජ පුත්‍රයෝ ද, ජනපදයෙහි නියුක්ත පුරුෂයෝ ද, භාණ්ඩාගාරික ද, පිළිවෙලින් කළුරිය කොට පිරිස සමග දෙව්ලොව උපන්හ. සැදැහැසිත් නැති (දන්කෑ) ජනයෝ නිරයෙහි උපන්හ. මෙසේ දෙපිරිස ස්වර්ගයෙන් ස්වර්ගයෙහි, නිරයෙන් නිරයෙහි, උපදිමින් දෙයානූ කපක් ඉක්ම වීය. ඉක්බිති මේ මහා භද්‍ර කල්පයෙහි කාශ්‍යප බුදුන් දවස ඒ ශ්‍රද්ධා නැති (දන්කෑ) පිරිස ප්‍රේතයන් ව ප්‍රේත අපායේ ඉපදුනහ. එකල්හි මිනිස්සු තම තමන්ගේ ඥාති ප්‍රේතයන්ට හිත වැඩ පිණිස දන් දී, "ඉදං නො ඤාතීනං හොතුති" පින් අනුමෝදන් කළහ. ඔවුහු සම්පත් ලබත්, එකල්හි මේ ප්‍රේතයෝ ද එය දැක කාශ්‍යප සම්බුදුන් වෙත පැමිණ ස්වාමීනි ! කුමක් හෙයින් අපිත් මෙබඳු සම්පත් ලබන්නමෝදැයි විචාළහ. භාග්‍යවතුන් වහන්සේ දැන් නො ලබයි. මතු කාලයෙහි ගෞතම නමින් සම්බුදුවරයෙක් පහළ වන්නේ ය. එකල්හි බිම්බිසාර නම් රජෙකු වන්නේ ය. හෙතෙම මෙයින් දෙයානූකපකට පෙර තොපගේ ඤාතියෙකි. හෙතෙම බුදුනට දන් දී තොපට පින් අනුමෝදන් කරන්නේ ය. එදා තොපට සම්පත් ලැබෙන්නේය යි වදාළහ. එසේ වදාළ කල්හි ඒ වචනය ප්‍රේතයන්ට සෙට දවසෙහි තොප සම්පත් ලබන්නහු යයි කීවාක් මෙන් වූයේ ය.

එයින් පසු එක් බුද්ධාන්තරයක් ඉක්මගියහ කල්හි අපගේ භාග්‍යවතුන්

වහන්සේ ලොව පහළ වූ සේක. එකල ඉහත කී රජපුත් තිදෙන පුරුෂයන් දහසක් සමග දෙව්ලොව වැඩ එයින් චුතවැ මගධ රට බ්‍රාහ්මණ කුලයෙක ඉපිද පිළිවෙලින් තවුස් පැවිද්දෙන් පැවිදිව ගයා ශීර්ෂයෙහි තුන් බෑ ජටිලයෝ වූහ. ජනපද නියුක්තක පුද්ගලයා බිම්බිසාර රජු විය. භාණ්ඩාගාරික ගෘහපති පුත්‍රයා විශාඛ නම් සිටුවරයා වූයේ ය. ඔහුගේ බිරිද ධම්මදින්නා නමින් සිටු දියණිය වූවා ය. සෙසු ජනයා රජ පිරිස වශයෙන් උපන්හ. අපගේ භාග්‍යවතුන් වහන්සේ සත් සතියක් ගෙවා පිළිවෙලින් බරණැසට පැමිණ ධම්සක් පවත්වා පස්වග මහණුන් ආදිකොට ඇති දහසක් පිරිවර ඇති ව තුන් බෑ ජටිලයන් දමනය කොට රජගහ නුවරට වැඩමවිය. එදින එහි පැමිණ බිම්බිසාර රජු සෝවාන් පෙළෙහි පිහිටුවා, ඒ සමග අඞ්ග මගධවාසී එකොළොස් නහුතයන් බ්‍රාහ්මණගෘහපතියන්ට ද ධර්මාභිසමය උදාකළේ ය. ඉක්බිති රජු හෙට දවසට බතින් ආරාධනා කළෙන් එය ඉවසා වදාරා දෙවන දවස්හි, මාණවකයකු වශයෙන් වෙස්ගත් ශක්‍ර දේවේන්ද්‍රයා පෙරටුව යමින්.

"දැමුණු ඉඳුරන් ඇති වාසනා සහිත වූ සියලු කෙළෙසුන්ගෙන් මිදුණු රන්වන් වූ බුදු බඳ ඇති භාග්‍යවතුන් වහන්සේ, ඉන්ද්‍රිය දමනයෙන් දැමුණු, සසරින් මිදුණු පුරාණ ජටිලයන් සමග රජගහ නුවරට වැඩි සේකැයි" තුති ගී ගයද්දී, රජගහ නුවරට වැඩ බිම්බිසාර රජුගේ මාළිගයෙහි දී මහදන් පිළිගත්තේ ය. යට කියන ලද (දන්කෑ) ප්‍රේතයෝ දැන් රජු දන් දී අපට පින් පමුණුවනු ඇතැයි සිතා මාලිගය පිරිවරා සිටියා හු ය. රජතෙම දන් දී භාග්‍යවතුන් වහන්සේ කොහේ වැඩ සිටින්නේ ද යි. උන්වහන්සේ ගේ විහාර පහසුව පිණිසම සිති ය. කිසිවෙකුටත් පින් අනුමෝදන් නො කළේ ය.

එසේ ඒ දන් දීමෙන් කිසිදු පිනක් නොලත්. ඒ ප්‍රේතයෝ සිඳුණු ආශා ඇතිව රාත්‍රි කාලයේ රජ මාලිගය වටකොට ඉතා බියකරු ලෙස ශබ්ද නැගූහ. රජු භයට ද, සත් ත්‍රාසයට ද සංවේගයට ද පැමිණ රැය පහන් වූ කල්හි ම ගොස් බුදුරදුන්ට එපවත් කීය. වහන්ස මම මෙබඳු වූ බියකරු ශබ්ද ඇසුවෙමි. මට කුමක් වන්නේ ද? එවිට භාග්‍යවතුන් වහන්සේ "මහරජ බිය නොවෙව තොපට මෙයින් කිසි නපුරෙක් නැත. තොපට යහපතක් වන්නේ ය. ඔබගේ පුරාණ ඥාතීහු ප්‍රේත ලෝකයෙහි උපන්නෝ වෙති. ඒ ප්‍රේතයෝ එක් බුද්ධාන්තරයක් මුළුල්ලෙහි ඔබව ම පතමින් ආහ. ඔව්හු ඔබ බුදුන්ට දන් දී අපට පින් දෙන්නේය යි සිතමින් ඔව්හු හැසිරුණෝ ය. එහෙත් තොප

විසින් ඊයේ දන් දී පින් නුදුන් බැවින් සුන් වූ බලාපොරොත්තු ඇති ව එබඳු වූ භයානක ශබ්ද කළෝ ය යි වදාළහ. කිමෙක් ද ස්වාමීනි දැන් පින් දුන් කල්හි ඔවුන් සම්පත් ලබාවිදැයි විචාළේ ය. එසේය මහරජ ! එසේ නම් ස්වාමීනි ! භාග්‍යවතුන් වහන්සේ අද දවසේ මගේ දානය ඉවසාවා ඒ ප්‍රේතයන්ට පින් දෙමැයි කීහ. භාග්‍යවතුන් නිශ්ශබ්ද භාවයෙන් එය ඉවසා වදාළ සේක.

රජු මාළිගාවට ගොස් මහා දන් පිළියෙළ කරවා බුදුන් වහන්සේට කල් දැන්වී ය. භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සඞ්ඝයා සමග රජගෙදරට වැඩමවා පණවන ලද අසුනෙහි වැඩහුන්සේක. ඒ ප්‍රේතයෝ ද "අද අපි සැප ලබන්නෙමු යයි සිතා ගොස් බිත්ති ප්‍රාකාර ආදියෙන් පිටත උන්නාහ. යම් සේ ඒ ප්‍රේතයින් සියල්ලන් ම, භාග්‍යවතුන් වහන්සේ විසින් රජුගේ ඇස් හමුවට දක්වන ලද සේක. රජු දානය සඳහා පැන් පිළිගන්වමින් "මාගේ ඥාති ප්‍රේතයින්ට මේ පින ලැබේවා"යි උදෙසුවේය. එකෙණෙහි ම ප්‍රේතයින්ට නෙළුම් උපුල් ආදියෙන් ගැවසී ගත් සිසිල් සෙවණ ඇති පොකුණු පහළවූහ. ඒ ප්‍රේතයෝ ඒ පොකුණුවලට බැස දිය නා වතුර බී සිරුරු දාහය වළක්වා රන්වන් ශරීර ඇත්තෝ වූහ. රජතෙම කැඳ බත් කැවිලි පෙවිලි පිරිනමා එහි පින් උදෙසුවේය. එකෙණෙහිම ඔව්හු දිව්‍යමය වූ කැඳ බත් කැවිලි පෙවිලි ලදහ. ඔව්හු ඒවා භුක්තිවිඳ පිණ වූ ඉඳුරන් ඇත්තෝ වූහ. අනතුරු ව රෙදි පිළි හා සෙනසුන් පුදා ඒ පින් උදෙසූහ. ඔවුන්ට දිව්‍ය වස්ත්‍ර ප්‍රාසාද පසතුරුණු. සෙනසුන් ආදී විසිතුරු දේවල් පහළවිය. ඔවුන් ලත් මේ සියළු සම්පත් රජුට ප්‍රකට වේවායි භාග්‍යවතුන් වහන්සේ අධිෂ්ඨාන කළහ. රජු එය දැක ඉතා සතුටු සිත් ඇත්තේ විය. ඉන්පසුව භාග්‍යවතුන් වහන්සේ දන් වළඳා පවාරණය කොට බිම්බිසාර රජුට අනුමෝදනා කරමින් තිරෝකුඩ්ඩ ප්‍රේත වස්තුව වදාළහ.

14. තමන්ගේ ඥාති ප්‍රේතයෝ ගෙවල්, තාප්ප, බිත්ති වලට පිටත් තන්හි ද සතර මං සන්ධි, තුංමං සන්ධි, ගෘහ සන්ධි හා බිත්ති සන්ධි වල ද, නගරයන්හි හා ගෙවල් වල දොර බාවන්හි ද, තමන් විසූ ගෘහයට ද අවුත් සිටිති.

15. බොහෝ වූ ආහාර පාන ද කන බොන දේවල් ද පිළියෙළ කළ කල්හි ඒ (ප්‍රේත) සත්ත්වයන්ගේ කර්ම හේතුවෙන්, තද මසුරු බවින් කිසිවෙක් ඔවුන් සිහි නො කරයි.

16. නෑයන් අතුරෙන් අනුකම්පා කරන්නා වූ හිතවත් වූ යම් කිසි පුත්‍රාදී කෙනෙක් ඇද්ද ? ප්‍රණීත වූ උදාර වූ කැප වූ ආහාර පාන වර්ග, සුදුසු කාලයෙහි දක්ෂිණාර්හයන්ට පරිනමා,

17. මේ පින අපගේ ඥාති ප්‍රේතයන්ට වේවා. අපගේ ඥාති ප්‍රේතයෝ සුවපත් වෙත්වා ! යි පින්දෙත් ද? ඒ ඥාති ප්‍රේතයෝ ඒ දන් දෙන තැනට අවුත් එක් රැස් ව,

18. බොහෝ වූ ආහාර පාන වර්ග (දුන්කල්හි) එකඟ සිත් ඇති ව අනුමෝදන් වෙත් යම් අය නිසා මෙවැනි සම්පත් ලබමෝ ද? ඒ අපගේ නෑයෝ බොහෝ කලක් ජීවත් වෙත්වා.

19. අපටත් පූජා කරන ලද්දී ය. දායකයෝත් ප්‍රතිඵල සහිතයෝ වෙත්, ඒ ප්‍රේත විෂයෙහි ගොවිතැන් බත් නැත්තේ ය. ගෙරි සරක් රැකීමක් ද නැත්තේ ය.

20. එබඳු වෙළඳාමකුත් නැත. රන් රිදී කහවණු ආදියෙන් ගනු දෙනුවක් ද නැත. කළුරිය කරන ලද ප්‍රේතයෝ ඒ ප්‍රේත අපායෙහි මෙලොවින් දෙන පිනින් පමණක්ම යැපෙති.

21. උස් ප්‍රදේශයේ වැස්සෙන් වසින ජලය යම්සේ පහත් තැන කරා යයි ද එපරිද්දෙන් මේ මිනිස්ලොව සිටින නෑ මිතුරන් විසින් දෙන ලද පින් ප්‍රේතයන් වෙත පැමිණේ.

22. යම්සේ මහා නදීහු වැස්සෙන් පිරී මහ සයුර පුරවන්නේ ද? එසේ ම මෙලොවින් දෙන ලද පින් ප්‍රේතයන්ට ලැබේ.

23. මේ මගේ ඥාතියෙකි. මොහු විසින් මට මේදේ දෙන ලදි. මගේ මේ කාර්ය යය කළේ ය. මගේ යහළුවෙක, සහායයෙක ඔවුන් විසින් පෙර කරන ලද උපකාර සිහි කිරීමෙන් ප්‍රේතයන්ට පින් දිය යුතු ය.

24. හැඩීම හෝ ශෝක කිරීම හෝ විලාප කීම නො කටයුතු ය. ඒ ශෝක කිරීම් හැඩීම් විලාප කීම් ආදියෙන් ප්‍රේතයන්ට (මළගියවුන්ට) වැඩක් නො වේ.

25. සඞ්ඝයා විෂයෙහි දෙන ලද දක්ෂිණාව, බොහෝ කාලයක් ඒ ප්‍රේතයන්ට හිත සුව පිණිස පවතින්නේ ම ය.

26. ඒ දක්වන ලද්දේ ඥාති ධර්මයයි. නෑයන්ට නෑයන් විසින් කළයුතු දේයි. ප්‍රේතයන්ට මහත් වූ උපකාරයක් කරන ලදී. භික්ෂූන්ට කාය බලය ද දෙන ලද නිසා තොප ද පින් රැස් කර ගත්තාහු වෙති.

එහි **තිරොකුඩ්ඩෙසු** - බිත්ති පිටුපස, **තිට්ඨන්ති** - හිදීම් නිදාගැනීම් ආදිය ප්‍රතික්ෂේපකොට සිටීමට පමණක්, ගෘහයෙහි තාප්ප, බිත්ති, දොරකොටු, ආදියට පිටින් සිටී යන අර්ථයි. **සන්ධිසඞ්ඝාට කෙසුච** - සන්ධි ද, කුරුසයක් වැනි තැන් ද සන්ධියන්නෙන් ගැනේ. සතරමං සන්ධි, ගෙවල් අතරත ඇති සන්ධි, බිත්ති සන්ධි, ජනේල වාකවුළු ආදිය කියයි **"සිඞ්ඝාටකං" සතරමංසන්ධි** - තුන්මංසන්ධි, **ද්වාර බාහාසු තිට්ඨන්ති** - නගර දොරටු - ගෙයි දොරටු පිටුපස (මුළුවල) ඇසුරකරගෙන සිටිත් - **ආගන්ත්වාන සකං ඝරං** - ස්වකීය. ගෘහය නම් පෙර ඥාතීන්ගේ ගෙය ද, තමන් ස්වාමී භාවයෙන් ගෘහමූලික වශයෙන් සිටි ගෙය ද වේ. මේ දෙක ම ඔහු තමන්ගේය යන හැඟීමෙන් ඒ ගෙවලට පැමිණෙති එහෙයින් සිය ගෙදරට ආවේය යි කීය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ (එකී ප්‍රේතයන්) පෙර නො විසූ නමුත්, අතීතයේ නෑයෙකුගේ ගෙයක් බැවින් බිම්බිසාර රජුගේ මාලිගාවට තමන්ගේ ගෙයය යන හැඟීමෙන් අවුත්, බිත්ති ආදියෙන් පිටත සිටියා වූ ඊර්ෂ්‍යාව තන්හාව මසුරු බව, යන අකුසලසන්ගේ විපාක විඳින්නා වූ අතිශයින් දක්ක නො හැකි වූ විරූපව වූ, බියකරු වූ දැකුම් ඇත්තා වූ ප්‍රේතයන් රජුට දක්වමින් **"තිරො කුඩ්ඩෙසු තිට්ඨන්ති"** ආදී ගාථාව වදාරා, නැවත ඔවුන් විසින් කළ අකුශලයන්ගේ දරුණු බව දක්වමින් **"පහූතෙ අන්නපානම්හි"** යන දෙවෙනි ගාථාව වදාළහ.

එහි **පහූතෙ** - ආහාර හා බීම වර්ග බොහොමයක්, යම්තාක් යන අර්ථයි 'බ' කාරය වෙනුවට 'ප' කාරය ලබයි. "පහුසනෙතා නහරති " ආදියෙහි මෙනි. සමහර තැනක "බහුක" යයි පාඨයන් එයි. එය වනාහි වරදසහිත යෙදුමකි. **අන්නපානම්හි** - කන බොන දේ, **"ඛජ්ජ භොජ්ජෙ** - ඛාද්‍ය භෝජ්‍ය, වළඳන ද්‍රව්‍ය, කැඳ ආදී බොන ද්‍රව්‍ය, පිටි කැවුම් ආදී කැලි කඩා කන ද්‍රව්‍ය, මී පැණි වැනි බොන ද්‍රව්‍ය, යන සතරාකාර ආහාර දක්වයි. **උපට්ඨිතෙ** - පැමිණි සිටි කල්හි, සූදානම් ව සිටි කල්හි, පිළියෙළ කළ අවස්ථාවේ යන අර්ථයි.

න තෙසං සරති සත්තා නං - යනු, මෙසේ ප්‍රේත යෝනියෙහි උපන් සත්ත්වයන් මව් හෝ පියා හෝ, දූ දරුවන් හෝ මුණුබුරු මිණිබිරියන් හෝ සිහි නො කරයි. කවර හෙයින් ද? කම්ම පච්චයා - තමන් විසින් කරන ලද, දන්නොදී, දෙන දන වැළැක්වීම, තද මසුරුකම, ආදී කර්මයන්ගේ හේතුවෙනි. ඒ කර්මයන් නිසා මළ ගියවුන් සිහි කිරීමට ඥාතීන්ට අවකාශ නො දෙණි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ බොහෝ වූ ආහාර පාන ඇති කල්හි ද, ඥාතීන් බලා පොරොත්තුවන ප්‍රේතයන්ගේ පාප කර්ම නිසා නෑයන්ට සිහි කිරීම් පමණටවත් අවස්ථාවක් නො දක්වා , ප්‍රේත විෂයෙහි උපන්නා වූ මේ නෑදෑයන් උදෙසා රජු විසින් දෙන ලද දානය ප්‍රශංසා කරමින් "එව දදන්ති ඤාති නං" යන ගාථා වදාළහ.

එහි එවං යනු උපමා වචනයි - එය දෙපරිද්දෙකින් සම්බන්ධ වේ. ඒ ප්‍රේත සත්ත්වයන් ගේ අකුශල කර්ම හේතුවෙන් ඔවුන් සිහි නො කරන කල්හි ද, යම්කිසි කෙනෙක් ඒ ඥාතීන්ට අනුකම් පා කරන්නේ වේද? මහරජතුමනි ! යම් පරිද්දෙකින් ඔබ විසින් දෙන ලද මේ පිරිසිදු වූ ප්‍රණීත වූ, දක්ෂිණාර්හයන්ට සුදුසු වූ කාලයෙහි, ආර්යයන්ගේ පරිභෝගයට කැප වූ, ආහාර පාන දන් දුන්නේ, ඒ ඥාති ප්‍රේතයන්ට අනුකම්පාවෙන් ම ය. එහි දදන්ති උදෙසා දෙනු ලබයි. ඤාතීනං මව් පිය දෙපාර්ශවයෙන් ම සම්බන්ධ වූ, යේ කිසියම් පුත්‍රාදී කෙනෙක් හොන්ති වෙත්, අනුකම්පකා යනු හිත වැඩ පිණිස පවත්නා හිතවත් බව සුචිං - පිරිසිදු මනහර වූ, සිත් පිනවන්නා වූ, පණීතං - මහත් වූ, මිහි රි වූ, කාලෙනා, දක්ෂිණාර්හයන්ගේ පරිභෝගයට සුදුසු කාලයෙහි, ඥාති ප්‍රේතයින් බිත්ති ප්‍රාකාර සමීපයට පැමිණ සිටි කල්හි, කප්පියං - යනු සුදුසු වූ, යෝග්‍ය වූ, ආර්යයන්ගේ පරිභෝගයට උචිත වූ රුචිකර වූ, පාන භොජනං - යනු - පියයුතු වූ ද, කෑ යුතු වූ ද, ඒ ප්‍රදේශයේ ඇති සියලු දිය යුතු වස්තු - කියයි. මේ අයුරින් දක්ෂිණාර්හයන්ට දන් දීම, ඒ ප්‍රේතයන්ට දුන්නා නම් වේ. එය දක්වන්නේ "ඉදං මෙ ඤාතීනං හොතු සුඛිතා හොනතු ඤාතයො" ආදීය පූර්වයෙහි කියන ලදී. එහි තෙවැනි ගාථාව පූර්වාර්ධයට සම්බන්ධ කටයුතු යි. යම්කිසි කෙනෙක් අනුකම්පා පූර්වකව මෙසේ ඤාතීන්ට පින් දෙන්නේ ද, "ඉදං තො ඤාතීනං හොතු සුඛිතා හොනතු ඤාතයො" එහෙයින් ඉදංවා ඤාතීනං හොතුති, මේ අයුරින්

එහි ඉදං යනු දියයුතු දාන වස්තුව දක්වයි - වො යනු නිපාත මාත්‍රයකි, යෙහි වො අරියාති ආදියෙහි මෙනි, ඤාතීනං හොතු - ප්‍රේතයෝනියෙහි උපන්නා

වූ ඤාතීන්ට වේවා. නො ඤාතීනං යනු ද පාඨයකි. අපගේ නෑයින් යන අර්ථයයි. **සුඛිතා හොන්තු ඤාතයො** - ඒ ප්‍රේත යෝනියෙහි උපන්නා වූ ඤාතීහු, මෙහි ඵල විපාක විඳිමින් සුවපත් වෙත්වා. සැපයට පැමිණෙත්වා යම්හෙයකින් මේ පින් ඤාතීන්ට වේවා යි කී කල්හි දු අනිකෙකු විසින් කළ කර්මය අනිකු හට විපාක දෙන්නේ නො වේද? හුදෙක් වනාහි එසේ උදෙසා දෙනු ලබන්නා වූ ඒ දාන වස්තුව ඤාති ප්‍රේතයින්ට කුශල කර්මයට ප්‍රත්‍යය වේද? ඒ කෙණෙහි ම විපාක උපදින්නා වූ කුශල කර්මයක් වේ. එය දක්වමින් තෙවතත්‍ථ ආදිය කීය.

එහි **තෙ** යනු ඤාති ප්‍රේතයෝ වෙති. **තත්‍ථ** යම් දානයක් දෙනු ලැබූ වේද? එයයි සමාගතත්‍වා යනු. මේ අපගේ ඤාති හූ අප වෙනුවෙන් දන් දී උදෙසන්නේයයි අනුමෝදන් වීම සඳහා එහි එක් රැස් වී, **පහූතෙ අන්නපානම්හි** තමන් උදෙසා දෙන ලද එම වස්තුවෙහි **සක්කච්චං අනුමොදරෙ** - (එකග සිත් ඇතිව අනුමෝදන් වෙත්) කර්ම ඵල විශ්වාස කරමින්, ගෞරව කරමින් (සිතෙන අයුරින්) අදහමින්, සත්සුන් සිතින් යුතු ව මේ දානය අපට හිත සුව පිණිස වේවායි අනුමෝදන් වෙති. අනුමෝදන් වී ප්‍රීතියට ද සොම්නසට ද පත්වෙති. **චිරං ජීවන්තු** - චිරාත් කාලයක් බොහෝ කාලයක් ජීවත් වෙත්වා - දීර්ඝ ආයුෂ ඇත්තෝ වෙත්වා.- දීර්ඝ ආයුෂ ඇත්තෝ වෙත්වා. **නො ඤාතීහි,** අපගේ නෑදෑයෝ **යෙසං හෙතු** - යම් කරුණක් හේතුවෙන්, යමක් නිසා, **ලභාමසෙ** - මෙවැනි සම්පත් ලැබූ වෙමු. දුන් උදෙසන ලද පිණින් ලත් සම්පත් භුක්තිවිඳිමින්, තමන්ගේ ඤාතීන්ට ස්තුති කරන අයුරු දක්වයි. තමන්ගේ අනුමෝදනයෙන් ද, දායකයන්ගේ උදෙසීමෙන් ද, දක්ෂිණාර්හ සම්පත්තියෙන් ද, යන තුන් අයුරින් දක්ෂිණාව ඒ ක්ෂණයෙ ම විපාක උපදවන්නේ වේ. එහි දායකයෝ විශේෂ හේතුවයි. **යෙසං හොතු ලභාමසෙ** යන්න එහෙයින් කියන ලදී. **අම්හා කඤ්ච කතා. පූජා** - ඉදං මෙ ඤාතීනං හොතු යනුවෙන් උදෙසන්නාවූ දායකයන් විසින් අපටත් පූජාවක් කරන ලදී. **දායකාච අනිප්ඵලා** - යම් කෙනෙකුගේ සිත්හි පරිත්‍යාගමය කර්මය උපන්නේ ද? එහි ඵල විපාක දෙන හෙයින්, එහි ප්‍රේත විෂයෙහි උපන් අය පමණත්ම, ඤාතීන් විසින් දෙන සම්පත් ලබත්ද? නොහොත් අන්‍යයෝත් ලබත් ද? මෙහි අප විසින් කිවයුත්තේ නැත. භාග්‍යවතුන් වහන්සේ විසින් ම එය කියන ලද හෙයිනි.

භගවත් ගෞතමයෙනි ! අපි බ්‍රාහ්මණයෝ නම් වෙමු. දන් දෙමු. පින් කරමු. මේ දානය අපේ සහලේ ඤාතීන් වූ ප්‍රේතයන්ට ලැබේවා. මේ දානය අපේ

සහලේ ඥාතීන් වූ ප්‍රේතයෝ භුක්ති විඳීවා. කෙසේ ද? පින්වත් ගෞතමයන් වහන්ස ඔවුන්ට ඒ දානය ලැබේ ද? ඔවුන් ඒ දානය පරිභෝග කරන්නහුද? ස්ථානයෙහි ම ලැබේ. අස්ථානයේ නො ලැබේ. ගෞතමයන් වහන්ස ! ස්ථාන ය කුමක් ද? අස්ථානය කුමක් ද? බ්‍රාහ්මණය මෙහි එකෙක් ප්‍රාණඝාතාදී අකුසල කර්ම කෙරේ ද මිථ්‍යාදෘෂ්ටික වේ ද? ඔවුහු කය බිඳීමෙන් මරණයට පත්ව මතු නිරයෙහි උපදිත්. නිරයෙහි උපන් සතුන්ට යම් ආහරයක් වේ ද එය එහි දී ලැබෙයි. එයින් යැපෙයි. ඒ ආහාරයෙන් ඔහු එහි සිටියි. බමුණ ! මේ වනාහි අස්ථානයයි.

බ්‍රාහ්මණය සමහර කෙනෙක් ප්‍රාණඝාතාදී අකුසල් කෙරේ ද? මිථ්‍යාදෘෂ්ටි වූයේ ද? ඔහු ශරීරයාගේ භේදයෙන් මරණින් මතු තිරිසන් යෝනියෙහි උපදී ද? හෙතෙම තිරිසන්යෝනියට සුදුසු වූ ආහාර ලබයි. ඔහු ඒ අතරින් යැපෙයි. එහි සිටී. බමුණ ! මේ අස්ථානය යි. එහි සිටියහුට මේ දානය නො ලැබෙයි. බ්‍රාහ්මණය ! මෙහි සමහර කෙනෙක් ප්‍රණඝාත ආදියෙන් වෙන් වූයේ වේ ද? සම්‍යක් දෘෂ්ටික වේ ද? හෙතෙමේ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු මිනිසුන් ස්වභාවයට පැමිණියේ මිනිස් ලොව උපදී. දෙවියන් හා සමභාවයං පැමිණියේ දෙව්ලොව උපදී. හෙතෙම දෙවියන්ට සුදුසු වූ ආහාර ගෙන එහි යැපෙයි. එහි සිටියි. බමුණ මේ වනාහි ඒ ස්ථානය යි. එහි සිටින්නා වූ ඔහුට මේ දානය නො පැමිණෙයි.

බ්‍රාහ්මණය මෙහි සමහර කෙනෙක් ප්‍රාණඝාතා දී අකුසල් කරයි ද, මිථ්‍යා දෘෂ්ටික වෙයි ද ඔහු කායයාගේ බිඳීමෙන් මරණයට පත් වේ. ඔහු මරණින් මතු ප්‍රේත විෂයෙහි ප්‍රේත ආත්ම භාවයේ උපදියි. ප්‍රේත විෂයෙහි උපන් සත්ත්වයින්ට යමක් ආහාර වේ නම් එයින් ඒ සත්ත්වයා එහි යැපෙයි. එයින් එම ප්‍රේතයා එහි ජීවත්වෙයි. මිතුරෝ හෝ සහලේ නෑයෝ හෝ ඒ ප්‍රේතයාට යම් පිනක් පමුණුවත් ද එයින් ඔව්හු එහි යැපෙත්. එයින් ඒ ප්‍රේතයා එහි සිටී. බමුණ යම්තැනක සිටියාහට ඒ දානය පැමිණේ නම් මෙම ප්‍රේත යෝනිය ස්ථානය වේ.

භවත් ගෞතමයන් වහන්ස ! ඉදින් සහලේ නෑයෙක් වූ ඒ ප්‍රේතයා දන් දෙන තැනට නො ආවේ නම් කවරෙක් ඒ දානය අනුභව කරන්නේ ද? විචාළේ ය. බ්‍රාහ්මණය ! ඒ දායකයාගේ සහලේ නෑයින් වූ අනෙක් ප්‍රේතයෝ වෙත් ද ඔව්හු ඒ දානය අනුභව කරත් යයි වදාළහ. භවත් ගෞතමයන් වහන්ස! ඉදින් සහලේ නෑ වූ ප්‍රේතයාත්, අනෙක් සහලේ නෑයින් වූ ප්‍රේතයෝත් ඒ දන්

දෙන තැනට නො පැමිනියෝ නම් ඒ දානය කවරෙක් වළඳයි ද? එහි අස්ථාන වීමට ඉඩක් නැත්තේ ය. එහි හිස්බවක් ඇති නො වන්නේ ය. මේ දිර්ඝ වූ සසර ගමනේ හැසිරෙන සත්ත්වයන් අතුරෙන් යම්කිසි සහලේ ඥාති ප්‍රේතයකුගෙන් ඒ දන් දෙන ස්ථානය හිස් නො වන්නේ ය. එසේ වුවත් දායකයෝ ඵලසහිතව වෙත්. ප්‍රේත ලෝකයෙහි උපන් සතුන්ට, කෘෂිකර්ම - ගෙරි සරක් රැකීම ආදී අනෙක් සම්පත් ලඟාකර දෙන්නාවූ අනෙක් කාර්යක් නැත්තේ ය. මෙයින් දෙන ලද දානමය පින්කම්වලින් ම යැපෙන බව දැක්වීමට "නහි" ආදිය වදාළහ.

එහි "**නහි තත්‍ථකසි අත්‍ථි**"එම ප්‍රේත ලෝකයෙහි ගොවිතැන් ආදී කිසිවක් නැත. යමක් නිසා ප්‍රේතයෝ සුවසේ ජීවත් වන්නහු ද? ගොරකෙඛත්‍ථ නවිජ්ජති ඒ සඳහා වූ ගොවිතැන් කිරීමක් ප්‍රේත ලෝකයෙහි නැත. තව ද ගව මහීෂාදීන් රැකීමක් ද නො පෙනේ. යමක් නිසා සැපසේ ජීවත් වන්නාහුද? **වණිජ්ජා තාදිසු නත්‍ථි** වෙළ හෙළදාම් කිරීමක් ද නැත. යම්කිසි සම්පත් ප්‍රතිලාභයට හේතුවන්නා වූ හිර **ඤ්ඤකයකකය** " රන් රිදී ගනුදෙනුවක් ද නැත්තේ ය. ඔවුන්ගේ සම්පත් ප්‍රතිලාභයට යමක් හේතු වන්නේ නම්, "**ඉතො දිනෙනත යාපෙන්ති පෙතා කාලකතා තහං** "හුදෙක් මෙහි සිටින ඥාති මිත්‍රාදීන් විසින් දෙනලද දාන සම්පතින් ම යැපෙති. ආත්ම භාව පවත්වත්. **පෙතං** ප්‍රේත විෂයෙහි උපන්නාහු "**කාලකතා**" තමන්ගේ මරණ කාලයෙහි යාම, කාලගතා යයි ද පාඨයකි. කරන ලද කළුරිය කිරීම, පැමිණෙන ලද මරණය - **තහිං** - එම ප්‍රේත විෂයෙහි, දූන් යට කියන ලද කාරණය උපමාවකින් පැහැදිලි කරන්නට උනනමෙ උදකං වටටං ආදී ගාථා දෙක වදාළ හ. උන්නත ප්‍රදේශයෙහි උස් තැනෙකින් වර්ෂාවෙන් උපදවන ලද ජලය යම් සේ පහත් තැන කරා, යම් භූමි භාගයක පහත් තැනක් වේද එහි පැමිණෙන්නේ ද එසේ ම මේ මිනිස් ලොව සිට දෙන ලද දානය ප්‍රේතයන්ට පැමිණේ එ ලෝත්පත්තිය පිණිස යෙදෙයි. දියෙහි පැවැත්මට පහත් තැන ම උපයෝගී වන්නා සේ දානයෙන් පින් පැමිණවීමට ප්‍රේතලෝකයම සුදුසු වේ. බමුණ ! යම් තැනක සිටියහුට ඒ දානය පැමිණේ නම් ඒ මේ ස්ථානයයි. (ප්‍රේතලෝකයයි) වදාළහ. යම් සේ කඳුරැළි, විවර, ඇළ දොළ, වළ මහා වළ වල් වලින් ගලා බසින ජලයෙන් මහා ගංගා පිරී සාගරය පුරවත් ද, මෙසේ දෙන ලද දානයෙන් පෙර කියන ලද ආකාරයෙන් ප්‍රේතයන්ට ලැබෙයි. යම් හෙයකින් ප්‍රේතයෝ මේ මිනිස්ලොවින් කිසිවක් ලබමුයි ආශාවෙන් මඩනා ලදුව නෑ ගෙවල්වලට පැමිණ, මේ මේ දේ අපට දෙනුමැනවැයි ඉල්වන්නට නොහැක්කේ ද එහෙයින් මේ කියන සිහිකටයුතු කරුණු, සිහි කරන්නා වූ කුලපුත්‍රයා දක්ෂිණාවන් දෙන්නේ **අදාසි** මෙ ආදි ගාථා කීහ.

එහි අර්ථය - මේ තැනැත්තා මට ධනය හෝ ධාන්‍ය හෝ දුන්නේ ය. මගේ මේ අසවල් කාර්යය අවසන් කර දුන්නේ ය. අසවලා මගේ මව් පාර්ශවයෙන් හෝ පිය පාර්ශවයෙන් හෝ ඤාතියෙකි. ස්නේහ වසයෙන් සංරක්ෂණයෙහි සමර්ථ බැවින් මිත්‍රයෝ ය. අසවලා වැලි කෙළියෙහි පටන් මගේ සහායයෙක. මේ ආදී වසයෙන් කරන ලද සියලු ගුණ සිහි කරමින් මළගිය අය වෙනුවෙන් ඤාතීන් විසින් පින් දිය යුතු වන්නේ ය. "**දක්ඛිණ දජ්ජාති**" යනු පෙළයි. ප්‍රේතයන් වෙනුවෙන් දක්ෂිණා දිය යුතු ය. ඔවුන් විසින් මෙසේ දෙන ලදී මෙසේ කරන ලදී ආදී වශයෙන් පෙර කරන ලද උපකාර සිහිකළ යුතුයයි කියන ලදී. මේ කරණාර්ථයෙහි ප්‍රත්‍යාර්ථ වචනයි. යම් කිසි සත්ත්වයෙක් නෑයකුගේ මරණයෙන් හැඬීම හෝ ශෝක කිරීමෙහි ම නියැලී සිටිති. එයි කිසි ප්‍රයෝජනයක් ගෙන නොදේ. එහෙයින් ඒ හැඬීම් ශෝක කිරීම් ආදිය හුදෙක් ආත්මය තැවීමක් පමණක් ම වේ. එයින් මළගිය වුන්ට කිසි ප්‍රයෝජනයක් අත් නොවන්නේ යයි දක්වමින්, **නහිරුණ්ණංවා** යන ගාථාව කියා, නැවත මගධරජු විසින් දෙන ලද දානයෙහි සාර්ථක භාවය දක්වීමට **අයඤ්ච ඛො** යන ගාථාව වදාළහ ඒ ගාථාවල තේරුම යට කියන ලද්දේ ය.

දැන් යම් හෙයකින් මේ දක්ෂිණා ව පිරිනැමූ රජු විසින්, නෑයන් වෙනුවෙන් කළ යුතු කාර්යයක් ඉටුකළ බැවින් ඤාති ධර්මය දක්වන ලද්දේ ද? බොහෝ ජනයා ඉදිරියේ එය කළයුතු දෙයක් යයි නිදර්ශනයක් වශයෙන් ප්‍රකට කරන ලද්දේ ය. බොහෝ ජනයා ඉදිරියේ එය කළයුතු දෙයක් යයි නිදර්ශනයක් වශයෙන් ප්‍රකට කරන ලද්දේ ය. තෙපි (අනෙක් අය ද) විසින් ද මේ ඤාති ධර්මය මෙපරිද්දෙන් ම ඉටුකළ යුතු යයි (දක්වන ලද්දේ ය) ඒ ප්‍රේතයන් දිව්‍ය සම්පත්තියට පැමිණවීමෙන් ප්‍රේතයන්ට මහත් පූජාවක් (පරිත්‍යාගයක් කරන ලද්දේ ය. කාය බලය ශරීර ශක්තිය දෙන ලද්දේ ය. අනුකම්පාදී ගුණ පිරිවර කොට ඇති ත්‍යාග චේතනාව ඉපදවීමෙන් අනල්ප වූ සිත් රැස් කරන ලද්දේ ය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මේ විද්‍යාමාණ වූ සත්‍ය වූ ගුණවලින් රජුට ප්‍රශංසා කරමින් "**සො ඤාති ධම්මො** " යන අවසන් ගාථාව වදාළහ.

එහි ඤාති ධම්මො - ඤාතීන් උදෙසා කරන ලද කාර්ය, උළාරා - කාර්ය සිද්ධියට පැමිණීමට, බලං - ශරීර ශක්තිය, කායබලය, පසුතං - රැස්කළ, මෙහි ද සො ඤාති ධම්මොච අයං නිදස්සිතො - මෙසේ භාග්‍යවතුන්

වහන්සේ ඤාති ධර්මය පිළිබඳ ව කරුණු දක්වීමෙන්, හේතු දක්වීමෙන් රජුට ධාර්මික කථාවෙන් (කරුණු දක්වී ය) පෙතාන පූජා ච කතා උළාරා - මේ කාරණයෙහි නැවත නැවත පූජා කරණයෙහි සමාදන් කරවී ය. බලඤ්ච භික්ඛූන මනුප්පදින්නං - මෙයින් උත්සාහවත් කරවී ය. භික්ෂූන්ට කාය බලය ලබා දීමට එබඳු බලය ලබා දීමෙහි ම උත්සාහ කරවී ය. තුම්හෙහි පුඤ්ඤං පසුතංහි අනප්පකං - මෙයින් ප්‍රශංසා කළ සේක. පින් රැස් කිරීම වර්ණනා කිරීම රජුගේ ගුණ සංවර්ණන භාවයෙන් සතුටු කරවයි. මෙසේ මෙහි යෙදීම දත යුතුයි.

දේශනාවගේ කෙළවර ප්‍රේත විෂයෙහි ඉපදීමේ ආදීනව වර්ණනාවෙන් කළ කිරුණු සිත් ඇති ව නුවණින් වීර්ය කළ අසූහාරදහක් ප්‍රාණීන්ට ධර්මාභිසමය විය. දෙවන දිනයේ ද මෙසේ තිරෝකුඩ්ඩ දේශනාව කළ සේක. සත්දින ම එබඳු වූ ම ධර්මාවබෝධය වූයේ ය.

**තිරොකුඩ්ඩ ප්‍රේත වස්තු වර්ණනාව**

**නිමියේ ය.**

——//——

## 1-6

"නගගා දුබ්බණ්ණ රූපා" ආදී වූ මේ ධර්ම දේශනාව ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර ඇසුරු කරමින් වැඩ වසන කල්හි පුතුන් පස්දෙනෙකු කන ප්‍රේතියක් අරබයා වදාළ සේක.

සැවැත් නුවර ට නුදුරු සමීප ගමක එක් ගෘහපතියකුගේ බිරිඳ වඳ වූවා ය. ඔහුට නෑදෑයෝ මෙසේ කීහු. ඔබගේ බිරිඳ වඳ ය. අනෙක් කාන්තාවක් කැදවාගෙන එමු. ඒ ගෘහපතියා තම බිරිඳට ඇති ස්නේහය නිසා එයට කැමති නො වී ය. ඉක්බිතිව ඒ බිරිඳ මේ කතාබහ අසා ස්වාමියාට මෙසේ කීය. ස්වාමීනි ! මම වඳ වූයෙමි. නුඹ වෙනත් කන්‍යාවක් කැඳවා ගෙන අවුත් නුඹ වහන්සේ ගේ කුලවංශය ගෙන යායුතු ය. හෙතෙම ඇගේ පෙළඹවීම උඩ අනෙක් බිරිඳක් ගෙන ආවේ ය. ඕ තොමෝ මෑත කලෙකින් ගැබිනියක් වූවා ය. වඳ ස්ත්‍රිය මෝතොමෝ පුතෙක් ලබා මේ ගෙදර ඉසුරු වන්නේ ය. (බල පුළුවන්කාරිය) යයි සිතා ඊර්ෂ්‍යාවෙන් මඩනා ලදුව ඇගේ දරු ගැබ හෙලීමට උපායක් සොයන්නී, එක්තරා පරිබ්‍රාජිකාවක් ආහාර පානාදියෙන් සතප්වා ඈ ලවා දරුගැබ වැටෙන බෙහෙත් දෙවී ය. ඈ දරු ගැබ වැටුණු කල්හි තමා ගේ මවට කීවා ය. මව් තොමෝ තමන්ගේ නෑයින් කැඳවා මේ කරුණු කීවා ය. ඔව්හු, වඳ ස්ත්‍රීයගෙන් තී විසින් මේ තැනැතියගේ දරු ගැබ හෙළන ලද්දේ නේ දැ යි විචාළහ.

එවිට මම දරුගැබ නො හෙළුවෙමි යි ඈ කීවා ය. ඉදින් තී විසින් දරුගැබ නො හෙළන ලද්දේ නම් දිවිරීමක් කරවයි ඔව්හු කීහ. එවිට වඳ ස්ත්‍රිය "ඉදින් මා විසින් දරු ගැබ හෙළන ලද්දේ නම් දුගති පරායණව සා පිපාසා දෙකින් යුතුව සවස් කාලයේ ද උදය කාලයේ ද දරුවන් පස් පස් දෙනා බැගින් වදා, ඒ වැදූ දරුවන් තෙමේම කා සෑහීමකට නො පැමිණෙන්නෙමි යි, නිතර දුර්ගන්ධ වූ තිලමැස්සන් ගෙන් ගැවසී ගන්නා වූ ශරීර ඇත්තියක් ද වන්නේ මැ යි" බොරු කියා දිවිරීමක් කළා ය. ඒ ගැහැණි තොමෝ නොබෝ කලකින් ම කළුරිය කොට එම ගමට සමීපයේම දුර්වර්ණ ස්වරූප ඇති ප්‍රේතියක් ව උපන්නී ය.

එකල්හී එම ජනපදයෙහි වස් විසූ භික්ෂූන් අට නමක් බුදුන් දක්නා පිණිස සැවැත් නුවරට වඩින්නාහු එගමට නුදුරු තැනක සිහිල් සෙවණින් හා ජලයෙන් යුත් වනයක විසීමට පැමිණියහ. ඉක්බිති ඒ ප්‍රේතිය තෙරුන්

වහන්සේලාට තමා දැක්වී ය. ඒ තෙරුන් අතරින් සංඝස්ථවිරයන් වහන්සේ ඒ ප්‍රේතියගෙන් විචාරන්නාහු මේ ගාථාවෙන් විචාළේ ය.

27. නිර්වස්ත්‍ර වූ ඉතාම බියකරු රූපයෙන් යුතු ය. ශරීරයෙන් කුණු ගඳ ගසමින් හාත්පසින් නිලමැස්සන් ගැවසී ගත්තා වූ තී කවුද? කිනම් ඇත්තීද? කුමක් නිසා මෙතැන සිටින්නෙහි ද?

එහි **නග්ගා** - වස්ත්‍ර රහිත, **දුබ්බණ්ණරූපාසි** - විරූපී වු අතිශයින් බිය උපදවන්නා වූ, රූපයෙන් සම්පුර්ණ වූවා ය. **දුග්ගන්ධා** - ඉතා පිළිකුල් වූ ගඳ ඇත්තී ය. **පූති වායසි,** ශරීරයෙන් කුණු ගඳ හමයි. **මක්ඛිකා පරිකිණ්ණාවා** නිලමැස්සන් විසින් හාත්පසින් පිරිවරා ගෙන ඇත. (නිල මැස්සෝ හාත්පස ගැවසී ගත්තේ ය) **කානු ත්වං ඉධ තිට්ඨසී,** මෙබඳු වූ රූප ඇති කවරෙක් නම් ඔබ මොබ හැසිරෙන්නේ ද යන අර්ථයි.

ඉක්බිති තෙරුන් විසින් විචාරන ලදුව, ඒ ප්‍රේතිය සත්ත්වයන්ගේ සන්තානයන්හි සංවේගය උපදවමින්, තමන්ගේ ආත්ම කථාව කීවා ය.

28. ස්වාමීනි ! මම යම ලෝකය නම් වූ ප්‍රේත ලෝකයෙහි උපන්නා වූ දුකට පැමිණියා වූ ප්‍රේතියක් වෙමි. පාප කර්මයක් කොට මිනිස් ලොවින් ප්‍රේත ලෝකයට පැමිණියා වෙමි.

29. උදය කාලයෙහි දරුවන් පස් දෙනෙක් ද, සවස් කාලයෙහි දරුවන් පස් දෙනෙක් ද වදමි. ඒ වැදූ දරුවන් මම ම කමි. ඒ දරුවන් දස දෙනාම මගේ කුසගින්න නිවා ගැනීමට ප්‍රමාණවත් නොවේ.

30. මගේ හෘදය උදරාග්නියෙන් හාත්පස දැවෙයි. දුම් දාන්නේ වෙයි. (ඒ දැවිල්ල නිවාගැනීමට) පිය යුතු පැන් මට බීමට නො ලැබේ. විපතට පත් වූ මා දෙස බලනු මැනවි යි මේ ගාථාතුන කීවා ය.

මෙහි **භන්තෙ** - ස්ථවිරයන් ගෞරවයෙන් ආමන්ත්‍රණය කිරීම යි. **දුග්ගතා** දුගතියට ගියා ය. **යමලොකිකා** - යම ලොව යයි ලද නාමයෙන් ප්‍රේත ලෝකය කිය යි. එහි එය යමලොවට ම අන්තර්ගත හෙයින් මෙසේ කියන ලදී. **ඉතො ගතා** - මෙම මනුෂ්‍ය ලෝකයෙන් ප්‍රේත ලොවෙහි ඉපදීම් වශයෙන් උත්පත්ති වශයෙන් ගියා ය. **කාලෙන** - යනු රාත්‍රියේ අලුයම කාලයෙහි - මෙය භුම්‍යර්ථයෙහි කරණ වචනයි. **පඤ්චපුත්තානි.** පුතුන් පස්

දෙනෙක් ලිඬ්ග විපර්යාස වශයෙන් මෙසේ කියන ලදී. **සායං පඤ්චපුත්තා** පරෙයනු සවස් කාලයෙහි නැවත තවත් පුතුන් පස්දෙනෙකු කමි. යන යෙදීමයි. **විජායිත්වා** - දවස දවස පුතුන් දහය බැගින් වදා **තෙපි නාහොන්ති මෙ අලං** - මේ පුතුන් දසදෙනාම එක දවසක් මගේ කුසගින්න නිවා ගැනීමට ප්‍රමාණවත් නොවේ. දීර්ඝ කොට කීමෙන් කවර වැඩක් ද? **පරිඩය්හති. ධූමායති ඛුදාය හදයං මමා** - බඩ ගින්නෙන් කනු කැමති වීමෙන් පෙළෙන්නා වූ මගේ හෘද ප්‍රදේශය උදරාග්නියෙන් හාත්පස (තැවෙ යි) දුම් දම යි. තැවෙ යි. **පානීය න ලභෙ පාතුං** යනු පිපාසාවෙන් මඩනා ලදුව, තැන් තැන්වල හැසිරෙන්නේ බීමට පැන් නො ලබමි. **පස්ස මං බ්‍යසනං ගතං** ස්වාමීනි! ප්‍රේතෝත්පත්තියෙන් සාධාරණ වූ ද, අසාධාරණ වූ ද, මෙබඳු දුකකට විපතකට පැමිණියා වූ මා දෙස (අනුකම්පාවෙන්) බලනු මැනැවි. යනුවෙන් තමන් විඳින්නා වූ දුක ඒ ස්ථවිරයන්ට පැවසී ය.

එය අසා තෙරුන් වහන්සේ ඇය විසින් තී විසින් කරන ලද කර්මය විචාරන්නේ,

31. කායද්වාරයෙන් ද, වචී ද්වාරයෙන් ද, මනෝ ද්වාරයෙන් ද, කිනම් දුශ්චරිතයක් තී විසින් කරන ලද්දේ ද? කිනම් අකුශල කර්ම විපාකයකින් දරු මස් කන්නේ ද? යන ගාථාව කීහ.

එහි **දුක්කටං** යනු දුශ්චරිතයි. **කිස්ස කම්ම විපාකෙන** - කවරාකාර වූ කර්මයක විපාකයෙන් කුමක් ද ප්‍රාණඝාත නැතිනම් අදත්තාදාන අකුසලයක් ද එසේත් නැත්නම් වෙනත් අකුසලයක් ද යන අර්ථයි. කවර කර්ම විපාකයක් ද?

ඉක්බිති ඒ ප්‍රේතිය තමන් විසින් කරන ලද කර්ම තෙරුන්ට කියන්නේ මේ ගාථාවෝ කීහ.

32. මාගේ සමාන ස්වාමියා ඇති ගර්භිනී ස්ත්‍රියක් වූවා ය. ඇ කෙරෙහි රෞද්‍ර වූ ක්‍රියාවක් කිරීමට සිතිමි. ඒ මම (දූෂිත) ඊර්ෂ්‍යා සහගත සිතින් ඇගේ දරුගැබ හෙළීම කළෙමි.

33. ඇගේ හටගෙන දෙමසක් වූ දරුගැබ ලේ වසයෙන් ම වැගිරුණේ ය. එකල ඇගේ මව මට කිපී නෑයින් රැස් කරවී ය.

34. (ඇගේ මව) මා ලවා දිවිරිමක් කරවී ය. මම බියෙන් තැති ගැන්වී, දරුණුම වූ දිවිරීමක් කොට බොරුවක් ව කීවෙමි.

35. ඉදින් මම ඒ පුත්‍ර ගර්භය පාතනය කළේ නම්, මගේ ම දූ දරුවන් කන්නියක් වෙමි යි ඒ ගැබ හෙළීමේ ප්‍රාණඝාත කර්මයාගේ ද, මුසාවාද අකුසල කර්මයා ගේ ද, විපාක දෙකම කරණ කොට ගෙන, පූයා වෙන් හා ලෙයින් වැකුණු සිරුරු ඇති ව, දරු මස් අනුභව කරමි.

එහි **සපත්නී** - සමාන ස්වාමියා ඇති ස්ත්‍රිය කිය යි. **තස්සා පාපං අචෙතයී** - සමාන ස්වාමියා ඇති ඒ ස්ත්‍රිය කෙරෙහි රෞද්‍ර වූ කර්කශ වූ පාප ක්‍රියාවක් සිතුවෙමි. **පදුට්ඨ මනසා** - දූෂිත වූ සිතින්, අතිශයින් දුෂ්ට වූ මනසින්, **ද්වෙමාසිකො** - ගැබ පිහිටා දෙමාසයක් ගත වූ කල්හී, **ලොහිතඤෙඤව පග්ඝරි** - විසිරියාමෙන් ලේ වසයෙන් ම (විසිරී ගියේ ය) ගලා ගියේ ය. **තදස්සා මාතා කුපිතා මය්හං ඤාති සමානයී** - එම සපත්නී වූ මැගේ මව, මට කිපී තමාගේ ඤාතීන් කැඳවී ය. "තතස්සා" යනු ද පාඨයකි. තතො - අස්සා යනු පද බෙදීම ය. සපථං - යනු දිව්රවී ය. **පරිභාසයිත්වා** - බියෙන් තැතිගැන් වී ය. "**සපථං මුසාවාදං අභාසි**" ඉදින් මා විසින් කරන ලද්දුවූ, මෙවැනි වූ පාපකර්මය, නො කළෙමියයි ම දක්වමින් බොරුවට අභූත ලෙස සපථ කෙරුවෙමි. දිව්රුවෙමි. "**පුත්තමංසානි ඛාදාමි සචෙ තෙ පකතං මයා**" එදා දිව්රීම් කල ආකාරය දක්වයි. යම් ලෙසකින් මා විසින් මේ ගැබ හෙළීම කරන ලද්දේ නම්, අනාගතයේ පුනර්භවයෙක උපන් අවස්ථාවන් හි දී මගේ ම දරුවන්ගේ මස් මමම අනුභව කරන්නෙමි යන අර්ථයි. **තස්ස කම්මස්සා** - ඒ ගැබ හෙළීම වසයෙන් පැවැති ප්‍රාණඝාත අකුසලයෙන්, **මුසාවාදස්ස** චා - මුසාවාද අකුසල කර්මයෙන්, උභයං - කර්ම ද්වයාගේ කර්ම දෙකේ ම විපාක වශයෙන් මෙය කරණාර්ථයෙහි පච්චත්ත වචනයි. **පුබ්බ ලොහිත මක්ඛිතානි** - ප්‍රසවන වසයෙන් ද, අනුභව කිරීම් වසයෙන් ද, සැරව වලින් ද ලේ වලින් ද, තවරණ ලද දරුවන්ගේ මස් කමි - යන යෙදීමයි.

මෙසේ ඒ ප්‍රේතී තොමෝ තමාගේ කර්මය හා විපාකය හෙළිදරව් කොට නැවත ස්ථවිරයන්ට මෙසේ කීය. ස්වාමීනි ! මම මේ ගමේ ම අසවල් ගෘහපතියාගේ භාර්යාව වී ඊර්ෂ්‍යාවෙන් මඩනා ලදුව පාපකර්මයක් කොට මෙසේ ප්‍රේත යෝනියෙහි උපනිමි. ස්වාමීනි ! ආයාචනා කරමි. ඒ කෙළඹියාගේ ගෙට වඩිනු මැනව, එවිට ඒ ගෘහපතියා ඔබ වහන්සේලාට දන් දෙන්නේ ය. ඒ දක්ෂිණාව (දානමය පින) මට දෙනු මැන ව, එසේ කළ කල්හි

මේ ප්‍රේතලෝකයෙන් මාගේ මිදීම වන්නේ ය. යි කීවා ය. ස්ථවිරයන් වහන්සේ එය අසා අනුකම්පා උපදවා, දුකින් මුදවන ස්වභාවයේ පිහිටියේ ම ඒ කෙළඹියාගේ ගෙදරට පිඩු පිණිස වැඩියහ. ගෘහපතියා තෙරුන් වහන්සේලා දැක හටගත් පැහැදීම ඇතිව, පෙර ගමන් කොට පාත්‍රය ගෙන තෙරුන් වහන්සේලා අසුන්හි වඩා හිඳුවා. ප්‍රණීත ආහාර වළඳවන්නට ආරම්භ කළේ ය. තෙරුන් වහන්සේ (ප්‍රේතියගේ) ඒ ප්‍රවෘත්තිය කෙළෙඹි පුත්‍රයාට දැනුම් දී. ඒ දානානිසංසය ප්‍රේතිය උදෙසා දෙවුසේක. එකෙණෙහි ම ඒ ප්‍රේතිය ඒ ප්‍රේත දුකින් මිදී මහත් සම්පත් ලබා රාත්‍රි කාලයේ කෙළෙඹියා තමන් දැක්වී ය.

අනතුරුව තෙරුන් වහන්සේලා පිළිවෙලින් සැවැත් නුවරට වැඩ භාග්‍යවතුන් වහන්සේට එපවත් සැළ කළහ. භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය අර්ථෝත්පත්ති කොට පැමිණි පිරිසට දහම් දෙසූ සේක. මහා ජනයා ලද සංවේග ඇති ව ඊර්ෂ්‍යා මාත්සර්ය ආදී අකුසලයන් ගෙන් වැළකුණා හු ය. මෙපරිද්දෙන් ඒ ධර්ම දේශනාව මහජනයාට සාර්ථක විය.

**පංචපුත්‍ර ඛාදක ප්‍රේත වස්තුව**
**නිමියේ ය.**

—— // ——

## 1-7

"නග්ගා දුබ්බණ්ණ රූපා - ආදී වූ මේ ධර්මදේශනාව ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර වැඩ වසන කල්හී දරු සත්දෙනෙකුන් කන ප්‍රේතියක් අරභයා දෙසූ සේක.

සැවැත් නුවර සමීපයේ එක්තරා ගමක උපාසකයකු හට පුත්තු දෙදෙනෙක් වූහ. ඔව්හු ප්‍රථම වයසෙහි සිටියාහු රූප සම්පත්තියෙන් සමෘද්ධ වූ, ශීලාචාර ගුණසම්පන්නයෝ වූ හ. ඒ පුතුන්ගේ මව් මම පුත්‍රයන් ඇත්තියක් වෙමි යි, පුත්‍රයාගේ මහන්තත්වය හිතට ගෙන (අහංකාර උපදවා) ස්වාමි පුත්‍රයාට අවමන් කෙරෙයි. (මෙසේ) බිරිඳ විසින් අවමන් කරන ලද ඒ පුරුෂයා කලකිරුණු සිතින් අනෙක් ස්ත්‍රීයක් ගෙන ආයේ ය. ඕ තොමෝ ටික කලකින් ගර්භනී වූවා ය. එකල්හි ජ්‍යෙෂ්ඨ භාර්යාව (පළමු බිරින්ද) ඊර්ෂ්‍යාවෙන් වඩනා ලදුව එක්තරා වෙදෙකුට මුදල් දී ඔහු ලවා ඇගේ තෙමස් වූ දරුගැබ හෙළී ය. එවිට ඇගේ ඤාතීන් විසින් ද ස්වාමියා විසින් ද "තී විසින් මෑගේ දරුගැබ හෙළවන" ලද්දේ දෑ යි විචාරණ ලද්දාහු තමන් විසින් ගැබ් හෙලීම නො කෙරෙව්වෙමි යි. බොරු කියා එය නො අදහන්නා වූ ඔවුන් විසින් "දිව්රීම් කරව"යි කියන ලදුව උදේ හා සවස දරුවන් සත් සත් දෙනා බැගින් වදා දරු මස් කන්නියක් වෙමියි ද, නිතර දුගඳ ව නිල මැස්සන්ගෙන් පිරිවරන ලද තැනැත්තියක් වන්නෙමි ය යි කියා දිවුළා ය. මෝ තොමෝ මෑත කාලයක කළුරිය කොට, ගැබ හෙළීමේ හා බොරු කීමේ විපාක වසයෙන් ප්‍රේත යෝනියෙහි ඉපදී කියන ලද ක්‍රමයෙන් ම දරුමස් කමින්, එම ගමට සමීප තන්හී හැසිරෙයි. එසමයෙහි බොහෝ තෙරුන් වහන්සේලා ගම් පෙදෙසක වස් වැස වස් පවරා බුදුන් වහන්සේ දක්නා පිණිස සැවැත් නුවරට එන්නාහු ගමට නුදුරු එක් තැනක රාත්‍රියෙහි නවාතැන් ගත්හ. එකල්හි ඒ ප්‍රේතිය තෙරුන් වන්සේලාට තමන් දැක්වී ය.

36. නග්න ව විරූප වූ බියකරු රූපයෙන් යුතු ව, දුගඳ වූ කුණු ගඳ හමන්නා වූ හාත්පස නිල මැස්සන්ගෙන් පිරිවරන ලදු ව, මෙහි සිටින තී කවරී දැයි විචාළේ ය. තෙරුන් විසින් එසේ විමසන ලදු ව, ප්‍රේතිය ගාථා තුනකින් උත්තර දුන්නා ය.

37. ස්වාමීනි ! මම යම ලොව යයි කියන ලද නම් ඇති , ප්‍රේත ලෝකයෙහි උපන්නාවූ දුකට පත් වූ ප්‍රේතියක් වෙමි. පාප කර්මයක් කොට, මිනිස් ලොවින් (චුත ව) ඉපදීම් වශයෙන් ප්‍රේතලෝකයට පැමිණියේ වෙමි.

38. උදය කාලයේ පුතුන් සත් දෙනෙකු ද, සවස් කාලයේ පුතුන් සත් දෙනකු ද, වදමි එසේ වැදූ දරුවන් මම ම කමි. මේ තුදුස් දෙනාම නමුදු මගේ කුස ගින්නට ප්‍රමාණවත් නො වේ. (බඩ නො පිරේ)

39. බඩ ගින්නෙන් (පෙළෙන්නා වූ) මගේ හෘදය හාත්පස දැවෙයි. දුම් නගින් නේ වෙයි. අධික රශ්මිය සහිත අව්ව ඇති කල්හි, ගින්නෙන් දැවුණු තැනැත්තියක මෙන් සා පිපාසා දුක සන්සිඳීමකට නො පැමිණෙමි.

මෙහි **නිබ්බුතත්ති** - සා පිපා සා දුක නැති කිරීමට, **නාධිගච්ඡාමි**, ඉඩක් නො ලබමි, **අග්ගිද ඩඩාව ආපතෙ** - යනු අධික උෂ්ණ වූ අව්ව ඇතිකල්හි ගින්නෙන් දැවෙන්නියක මෙන් නිවීමකට නො පැමිණියේ වෙමි. යනු යෙදිම ය.

ඒ අසා මහ තෙරුන් වහන්සේ ඇය විසින් කරන ලද පාප කර්මය විමසන්නේ මේ ගාථාව කීහ.

40. තිගේ කායද්වාරයෙන් වාග්ද්වාරයෙන් කිනම් දුශ්චරිතයක් කරන ලද්දේ ද? කවර අකුශල කර්මයක විපාකයෙන් දරුමස් කන්නේ ද? එයට පිළිතුරු දෙමින් ප්‍රේතිය මේ ගාථා කීවා ය.

41. සමෘද්ධ වූ යොවුන් වයස් ඇති පුත්තු දෙදෙනෙක් මට වූහ. ඒ පුතුන් ගේ බලයෙන් යුක්ත වූ (ඉදිමුණු) මම මගේ ස්වාමි පුත්‍රයා අතික්‍රමණය කොට විසුවෙමි.

42. ඒ හේතුවෙන් මගේ සැමියා මා කෙරෙහි කිපුණේ සෙවෙතක්, අන් ස්ත්‍රියක ගෙන ආවේ ය. ඕ තොමෝ දරු ගැබක් ලැබී ය. ඈ කෙරෙහි පාප කර්මයක් සිතුවෙමි.

43. ඒ මම දූෂිත වූ සිතින් ඇගේ ගැබ හෙළීම කළෙමි. ඇගේ තෙමස් වූ ගැබ කුණු ලේ වී වැටුණේ ය.

44. එවිට ඇගේ මව කිපී ඤාතීන් රැස් කරවී ය. රැස් වී මා ලවා දිවුර වී ය. බියෙන් තැතිගත් මා දරුණු ම දිවිරීමෙන් දිවිරුවෙමි.

45. ඒ මම දරණු ම දිවුරුමින් දිව්රා බොරු බස් කීම් මා විසින් ඒ දරු ගැබ හෙලන ලද්දෙන් දරුමස් කමි.

46. ඒ ගැබ හෙළීමේ කර්මය ද, මුසාවාද කර්මය ද, යන උභය කර්මයන් හේතුවෙන් දරුමස් කමි. පුයාවෙන් හා ලෙයින් වැකුණු සිරුරු ඇත්තියක් වීමි.

**එහි පුත්ත බලු පෙතා** - දරුවන්ගේ බලයෙන් යුක්ත වූ, දරුවන්ගේ වසයෙන් ලද බලය. **අතිමඤ්ඤිසං** - ඉක්මවා සිතුවෙමි. මැඩ පවත්වා සිතුවෙමි. **පූති ලොහිතකො පති.** කුණු ලේ සහිත ව ගැබ වැටුනේ ය. සෙසු සියල්ල යටගිය කථාව මෙනි. එහි තෙරුන් අට දෙනෙකි. මෙහි බොහෝ තෙරනුවෝ වෙති. එහි පුතුන් පස් දෙනෙකි. එය පමණක් වෙනස් වේ. මෙසේ ඒ ප්‍රේති තොමෝ තමාගේ කර්මය පවසා නැවත මහ තෙරුන්ට මෙසේ කී වා ය.

ස්වාමීනි !මම මෙම ගමෙහි අසවල් ගෘහපතියාගේ භාර්යාව වී ඊර්ෂ්‍යාවෙන් වැඩී පව්කම් කොට මෙසේ ප්‍රේත යෝනියෙහි උපන්මි. වහන්ස කරුණා පෙරදැරිව ඒ ගෘහපතියාගේ ගෙට වඩිනු මැනැව. ඔහු ඔබ වහන්සේලාට දන් දෙන්නේ ය. ඒ දක්ෂිණාවේ පින් මා කෙරෙහි උදෙසා වදාළ මැනව. මේ ප්‍රේත ලොවින් මිදෙන්නෙමියි කීවා ය.

තෙරුන් වහන්සේ එය අසා අනුකම්පා පෙරදැරි ව ඈ ප්‍රේත දුකින් මුදවන ස්වභාවයෙහි පිහිටා ඒ ගෘහපතියාගේ නිවසට පිඩු පිණිස වැඩම කළහ. ගෘහපතියා ද තෙරුවන් වහන්සේ දැක හටගත් පැහැදීමෙන් යුක්ත ව පෙරගමන් කොට වඩමවා තෙරුන් වහන්සේලා අසුන් හි වඩා හිඳුවා ප්‍රණීත වූ බොජුන් වළඳවන්නට පටන් ගත්තේ ය. තෙරුන්වහන්සේලා ඒ කථා ප්‍රවෘත්තිය ගෘහපතියාට කියා ඒ දානය එම ප්‍රේතියට උදෙසෙව්වාහ. එකෙණෙහි ම එම ප්‍රේතිය දුකින් මිදී මහත් සම්පත් ලබා කෙළඹියාහට තමා දැක්වීය. නැවත තෙරුන් වහන්සේලා පිළිවෙලින් සැවැත් නුවරට වැඩමවා ඒ පුවත බුදුරජාණන් වහන්සේට සැළකළාහු ය. භාග්‍යවතුන් වහන්සේ එය අර්ථෝත්පත්ති කොට ගෙන පැමිණි පිරිසට ධර්මය දේශනා කළ වදාළහ. දේශනාව මහා ජනයාට ප්‍රයෝජනවත් විය.

**පුතුන් සත්දෙනා බැගින් කෑ ප්‍රේතියගේ කථා වස්තුව නිමියේ ය.**

—//—

# 1-8

"කිනනු උමමත්තරූපො වා" මේ ආදී ධර්මදේශනාව ශාස්තෲන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වාසය කරන්නේ, පියා මළා වූ එක්තරා කෙළෙඹි පුත්‍රයකු අරබයා වදාළ සේක.

සැවැත් නුවර එක්තරා කෙළෙඹියකුගේ පියා කළුරිය කළේ ය. හෙතෙම පියාගේ මරණය නිසා ශෝකයෙන් තැවෙන සිත් ඇති ව විලාප කියමින් හඬමින් උමතු වුවකු මෙන් ඇවිදිමින් යම් යම් කෙනෙක් දකී ද? ඒ ඒ අයගෙන් "කිමෙක් ද මගේ පියා දුටු වේ දූ යි" අසයි. ඒ කෙළඹියාගේ ශෝකය දුරුකරන්නට කිසිවෙකුට නො හැකි විය. ඒ කෙළඹියාගේ හෘදයෙහි කළයක් තුළ දැල්වුණු පහනක් මෙන් සෝවාන් ඵලයට හේතු සම්පත් දැල් වෙයි. ශාස්තෲ වූ බුදුරජාණන් වහන්සේ අළුයම් කාලයෙහි ලොව බලා වදාරන්නේ ඔහුගේ සෝවාන් ඵල ලැබීමට ඇති හේතු සම්පත් දැක, මොහුට අතීත කාරණය පැහැදිලි කොට ශෝකය නිවා, සෝවාන් ඵලය ලබා දීමට වටනේය ය යි සිතා දෙවන දවසේ බතින් පසුව පිණ්ඩපාතයෙන් වැළකුනේ දෙවැනි ශ්‍රමණයෙකු ද සමග ඔහුගේ ගෙදොර වෙත වැඩි සේක. හෙතෙම ශාස්තෲන් වහන්සේ පැණවූ අසුනෙහි වැඩහුන් කල්හි තෙමේ ම භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව සිටිමින්, කිමෙක් ද ස්වාමීනි ! මගේ පියා ගියතැන නුඹ වහන්සේ දන්නේ දූ යි ඇසී ය. ඉක්බිති ශාස්තෲන් වහන්සේ කිමෙක් ද උපාසකය ! නුඹ මේ අත්බැව්හී පියා විචාරන්නේ ද? නැතිනම් අතීතභවයේ පියා විචාරන්නේ දූ යි ඇසී ය. ඒ කෙළඹියා ඒ වචනය අසා " මට පියවරු බොහෝ වෙත්ල" යි සිතා තුනී වූ ශෝක ඇති ව, ස්වල්පයක් මැදිහත් බවට පැමිණියේ ය. එකල්හි ශාස්තෲන් වහන්සේ ඔහුගේ ශෝකය දුරු කිරීම පිණිස, ධාර්මික කතාවක් කොට, පහ වූ ශෝක ඇති ව සිත මෘදු වූ බව දැන, සිව්සස් ඇතුළත් වූ සාමුක්කංසික ධර්ම දේශනාවෙන් සෝවාන් ඵලයෙහි පිහිටුවා විහාරයට වැඩම කළ සේක.

ඉක්බිතිව භික්ෂූන් වහන්සේලා ධර්ම සභාවට රැස්ව "ඇවැත්නි බුද්ධානුභාවය බලනු මැනවි. (පියා මළ) ශෝකයෙන් පීඩිත වූ, අතිශයින් ශෝක කළා වූ උපාසකයා, භාග්‍යවතුන් වහන්සේ ඇසිල්ලකින් සෝවාන් ඵලයෙහි පිහිටුවන ලද්දේ යයි කථාව ඉපිද වූහ. ශාස්තෲන් වහන්සේ එහි වැඩමවා පනවන ලද උතුම් ධර්මා සනයෙහි වැඩ හිඳ මහණෙනි ! දැන් කවර

කථාවකින් යුක්ත ව තෙපි උන්නාහු ද යි විචාළ කල්හි භික්ෂූහු එපවත් බුදුන්ට සැළකළාහු ය. එකල බුදුරජාණන් වහන්සේ වදාරණසේක් "මහණෙනි ! මා විසින් මොහුගේ ශෝකය පහකරන ලද්දේ දැන් පමණක් නො වේ. අතීතයේ ද ශෝකය පහකරන ලද්දේමය යි "වදාරා ඒ භික්ෂූන් විසින් අයදින ලදු ව අතීත කථාව ගෙනහැර දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර එක්තරා ගෘහපතියකුගේ පියා කළුරිය කලේය. හෙතෙම පියාගේ මරණයෙන් ශෝකයට හා විලාප කීමට පැමිණියේ කඳුළු පිරි මුහුනින් යුතු ව ළෙහි අත් ගසා හඬමින් ඔහුගේ චිතකය පුදක්ෂිණා කරයි. එවිට ඔහුගේ පුත්‍ර වූ නුවණැති වූ ව්‍යක්ත වූ, බුද්ධිසම්පන්න වූ, සුජාත නම් වූ, දරුවා පියාණන්ගේ ශෝකය පහකිරීමට සිතමින්, එක්දවසක් නගරයෙන් පිටත මළ ගොනෙකු දැක තණ කොළ ද, වතුර ද ගෙන වුත් ඒ (මළ) ගොනුගේ ඉදිරියේ තබා, ටික ටික දෙමින් ජීවත්ව සිටින කෙනකුට මෙන් කාපිය කාපිය බීපිය බීපිය ආදිය කියමින් අණ කරමින් සිටියේ ය. එතැනට පැමිණි පැමිණි අය ඒ ක්‍රියාව දැක යහළු සුජාතය නුඹ මියගිය ගොනකුට තණකොළ හා දිය ගෙනවුත් දෙන්නේ නුඹ පිස්සෙක් වූයේ ද? යනුවෙන් කියත්. හෙතෙම කිසිත් නොකියයි. මිනිස්සු ඔහුගේ පියා හමුවට ගොස්, "නුඹේ පුතා උමතු වුයේ ද මළ ගොනෙකුට තණ හා වතුර දේ යයි කීහ. ඒ අසා කෙළඹියාට තම පියා අරමුණු කොට තිබූ ශෝකය පහව ගියේ ය මාගේ පුත්‍රයා උමතු වුයේ ය. යන ශෝකයෙන් තැවුණු සිතින් වේගයෙන් පුතා වෙත ගොස් "සුජාතය, නුඹ ඥාණවන්ත, ව්‍යක්ත, බුද්ධි සම්පන්න කෙනෙක් නොවේ ද? කුමක් හෙයින් මේ මියගිය ගොනාට තණ හා වතුර දෙන්නෙහි ද? චෝදනා කරමින් ,

කිමෙක් ද? උමතු බවට පැමිණියකු මෙන් නිල් තණ කපා ගෙනැවිත් (මිය ගිය) දිවි පහ වූ, මහලු ගොනෙකුට කාපිය කාපිය කියන්නෙහි ද

දෙන ලද ආහාර වූ නිල් තණ වලින් ද, වතුරෙන් ද මිය ගිය ගොනා නැගිටුවීමට නො හැක්කේ ම ය. වෙනත් උමතු වූ අයෙකු මෙන් නුඹත් අනුවණ බාලයෙන් වුයේ ද? යන ගාථා දෙක කීහ

එහි අර්ථය **ඉමස්ස ගොනස්ස** මේ සතර පාද ඇත්තහුගේ, මේ බෙරයක් හා සමාන වූ හිස, සහ වලිගය පවතී වලිගය සහිත වූ මේ කය, මේ නේත්‍රයෝ යම්සේ මරණයට පෙර තිබුනේ ද දැනුත් එසේම තිබේ. අයං **ගොණෝ සමුට්ඨහෙ** එහි **කිනනු** ති - විචාළ වචනය යි. **උම්මත්ත** රූපො වා- උමතු

ස්වභාවයට පත් චිත්ත වික්ෂෝපයට පත් වූවාක් මෙන් **ලායිත්වා** කපා **හරිතං තණං** හරිතවර්ණ තෙත් (අලුත්) තණ කොළ - **ලපසි** - විලාප කියයි - වැළපෙයි. **ගතසත්තං** - පහවූ දිවි ඇති - මළාවූ සත්ත්වයා - ජරගවං - ගොනා මහළු ගොනා, **අන්නපානෙනා** තොප විසින් දෙන ලද කොල පැහැ තණවලින් හෝ ජලයෙන්, **මතො ගොණෙ න සමුට්ඨහි** - මියගිය ගොනා නැවත දිවි ලැබ නො නැගිටින්නේය. **ත්වංසි බාලොව දුමෙමධො** - තෝ බාලබවෙහි යෙදුන් ද? මෝඩයෙක් වී ද? නුවණ සංඛ්‍යාත ප්‍රඥාව අභාවයට ගොස්,අඥානයෙක් වුයෙහි. **යථා තඤ්ඤාව දුම්මති** - යම් පරිද්දෙකින් ඔබත්, අනෙක් අඥානයන් මෙන්, විකාර දොඩවයි ද කරයි ද එය අරුත් සුන් වූ විකාරයකි යන අර්ථයි. **යථාතං** යනු නිපාත මාත්‍රයකි. **අඤ්ඤා වා දුම්මතී** - ඔබ ප්‍රඥාවන්තයෙකි. අනෙක් උම්මත්තක පුද්ගලයන් මෙන් ඔබ ද උමතු වී විකාර දොඩවයි යන අර්ථය.

ඒ අසා සුජාත තෙමේ පියාට දූන්වීමට හැගවීමට තමාගේ අදහස ප්‍රකාශ කරමින් මේ ගාථා දෙක කීහ.

49. මේ පාද හතර ද, බෙරයක් බඳු වූ මේ හිස ද, වල්ගය සහිත වූ මේ ශරීර ය ද, ඇස් දෙක ද එසේ ම පවතිත්, මේ නිසා මේ ගොනා නැගිටින්නේ ය යනු මාගේ අදහස යි.

50. මගේ සීයාගේ අත් පා හා ශරීරය ද, හිස ද දක්නට නො ලැබේ. ඇටකටු තැන්පත් කර මැටියෙන් කළ සෑය නිමිති කරගෙන හඬන්නා වූ නුඹ ම මෝඩයෙක් නොවන්නේ ද?

එහි තේරුම මේ ගොනාගේ පා සතර පෙනේ. බෙරයක් හා සමාන වූ හිස තිබේ. වලිගය ද පවතී. මේ කය ද නේත්‍රයෝ ද මරණයට පෙර තිබුණක් මෙන් පවතී. අයංගොණෙ - **සමුට්ඨහෙ** - මේ කරුණු වලින් මේ ගොනා නැගිටින්නේ ය යි මට සිතේ. එය මගේ අදහස වන්නේ ය. මේ ගොනාගේ සියලු අඟපසඟ පෙනෙන්නට තිබේ. ඒ කාරණයෙන් මේ ගොනා නො නැගිටින්නේ ය යි කව්රු කියත් ද? මෙතෙමේ නැගිටින බව අදහස වන්නේ ය.

මගේ සීයාගේ අත් පා හෝ ශරීරය හෝ හිස හෝ දක්නට නැත. හුදෙක් ඔහුගේ ඇටකටු බහා කළ මැටි ථූපය පමණක් දක්නට ඇත. ඒ මැටි ථූපය බලමින් හඬන්නා වූ වැළපෙන්නා වූ පියාණන් ඔබ මට වඩා සිය දහස්

ගුණයකින් මෝඩයෙක් දුෂ්ප්‍රාඥයෙක් නො වන්නේ ද?

බිඳෙනසුළු වූ සංස්කාරයෝ බිඳෙන්නාහු ම ය. එහි ඒ බව දන්නා වූ අය කුමකට විලාප නගත් ද ආදී වසයෙන් පියාට ධර්මය කීයේ ය. එය අසා බෝසතුන්ගේ පියා නුවණැති වූ මගේ පුතා මා සන්සිඳුවනු සඳහාම මේ ක්‍රියාව කළේ ය යි සිතා (පිළිගෙන) සුජාත දරුව සියළු සත්ත්වයෝ මරණ ධර්මය ස්වභාව කොට ඇත්තෝ ය. යන මේ කාරණය දැන ගන්නා ලදී. මෙවක් පටන් ශෝක නො කරමි ශෝකය නිවීමට සුදුස්සා නම් නුඹ වැන්නකුම විය යුතුය යි කියා පුතණුවන් පසසමින් මේ ගාථා හතර කීයේ ය.

51. ශෝකාග්නියෙන් ගිනිගත්තා වූ (මගේ) සිත ජලය වත්කර ගින්න නිවන්කු මෙන් ද, ගිතෙල් වත්කර (දාහය) සිසිල් කරන්නෙකු මෙන් ද (සාතේ දැවිල්ල) නිවුයේ ය.

52. මාගේ හදවත ඇසුරු කළ ශෝකය නැමැති හුල උදුරන ලද්දේ ය. යම් දරුවෙක් ශෝකයෙන් මඩනා ලද්දා වූ පියා අරභයා ඇති වූ ශෝකය පහ කළේ ද?

53. මම ඉදුරුණු ශෝක නමැති හුල් ඇත්තේ වෙමි. සිහිල් වුයේ වෙමි. නිවුණෝ වෙමි. ඔබගේ වචනය අසා ශෝක නො කරමි. නො හඬමි.

54. යම්සේ සුජාත නම් දරුවා පියා ශෝකයෙන් මුදාලුයේ ද? ප්‍රඥ සහිත වූ අනුකම්පා වූ යම් ජන කෙනක් වේ ද එසේ ශෝකයෙන් මුදත්.

එහි - **ආදිත්ත** යනු ශෝකය නමැති ගින්නෙන් දිලුණු - **සත්ත‍ං** - සමාන වූ, පාවකං ගින්න **වාරිනා** විය **මසිඤ්ච‍ං** දිය ඉසින්නක් මෙන්, **සබබං නිබ්බාපයෙ දරං** - සියලු චිත්ත දාහය නිවී ය. **අබ්බූළහං** වතා - බැහැර කරන ලදී. **සලලං** - ශෝක නමැති හුල **හදය නිසසිතං** - හෘදය නිශ්‍රිත වූ ශෝක නමැති හුල **සොකපරෙතසස** ශෝකයෙන් මැඩුණු, **පිතු සොකං** - පියාගේ මරණයෙන් උපන් ශෝකය, **අපානුදී** දුරු කළේ ය. **තවසුතවාන මාණවා** - යනු දරුවා ඔබගේ වචනය අසා ශෝක නොකරමි. නො හඬමි. **සුජාතො පිතරං යථා** - යම්සේ සුජාත කුමාර තෙම තමන්ගේ පියා ශෝකයෙන් මිදෙව් වේද? එසේම අන්‍යවූ ද අනුකම්පා කරන,

අනුග්‍රාහකසීලී වූ, යම් සත්පුරුෂයෝ වෙත්නම්, ඒ ප්‍රාඥයෝ ද එසේ කරත් පියවරුන්ට ද අනෙක් අයට ද, උපකාර කරත් යන අර්ථයි.

තරුණයාගේ වචනය අසා පියා පහවූ ශෝක ඇති ව, ජලස්නානය කොට ආහාර ගෙන කර්මාන්තයන් පවත්වා, කළුරිය කොට ස්වර්ගයේ උපත ලැබීය.

ශාස්තෘන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා ඒ භික්ෂූන්ට සිව්සස් වදාළ සේක. චතුස්සත්‍යයාගේ කෙළවර බොහෝ දෙනෙක් සෝවාන් ආදී මාර්ග ඵලවල පිහිටියාහු ය.

ගෝන ප්‍රේත වස්තු වර්ණනාව
නිමියේ ය.

—— // ——

# 1-9

"ගූථඤ්ච ඛාදා මුත්තං රුහිරඤ්ච පුබ්බං " යන මේ ධර්ම දේශනාව ශාස්තෲන් වහන්සේ සැවැත් නුවර වැඩවාසය කරන්නේ එක්තරා පේශකාර ප්‍රේතියක අරභයා (මේ ප්‍රේත වස්තුව) වදාරණ ලදී.

දොළොස් නමක් පමණ වූ භික්ෂූන් වහන්සේලා බුදුන් සමීපයෙන් කමටහන් ගෙන, වාසයට සුදුසු තැනක් සොයමින්, වස්විසීමට කාලය ළංවූ හෙයින්, සිසිල් සෙවණක් යුතු ජල පහසුකම් ඇති - සිත්කළු වූ, එක්තරා අරණ්‍යයක් හා එයට ම නුදුරින් ඉතා ළං නො වූ ගොදුරු ගම ද දැක එහි එක් රැයක් වැස දෙවෙනි දවසේ ගමට පිඬුසිඟා වැඩියහ. ඒ ගම ද පේශකර්මාන්තයෙහි නියුතු වූ එකොළොස් දෙනෙක් වාසය කරත්. ඔව්හු ඒ භික්ෂූන් දැක හටගත් සොම්නසින් යුතු ව තම තමන්ගේ ගෙවලට වඩවඩා ප්‍රණීත ආහාරයෙන් වළඳවා, ස්වාමීනි ! ඔබ වහන්සේලා කොහි වඩින්නහු ද? ඇසූහ. යම්කිසි තැනක් අපට පහසු වන්නේ ද අපි එහි යන්නෙමුයි කීහ. එසේනම් මෙහි ම වස් වසන්නැයි උන්වහන්සේලාට ගම්වැස්සෝ ආරාධනා කළාහු ය. භික්ෂූන් වහන්සේලා ආරාධනාව පිළිගත් හ. උපාසකයෝ ඒ අරණ්‍යයෙහි භික්ෂූන්ට ආරාම තනවා දුන්හ. භික්ෂූහු එහි වස් විසූහ. එහි ජ්‍යෙෂ්ඨ පෙහෙකරු භික්ෂූන් දෙනමකට සිව්පසයෙන් උපස්ථාන කළේ ය. අනෙක් අය එක් එක් භික්ෂු නමකට ම උපස්ථාන කළහ. එහි ජ්‍යෙෂ්ඨ පෙහෙකරුගේ භාර්යාව සැදැහැ නැත්තී ය. අප්‍රසන්නයහ. මිසදිටු අදහස් ඇත්තීය, තෘෂ්ණා ඇත්තීය. මසුරු තැනැත්තියක ඕ භික්ෂූන්ට සකස්කොට උපස්ථාන නො කරයි. හෙතෙම එය දැක ඇගේ ම බාල සොහොයුරිය ගෙනැවිත් තම ගෙදර අධි පති බව භාර දුන්නාය. ඕ ශ්‍රද්ධා සම්පන්න වූවා, සකස්කොට මනාව භික්ෂූන් පෝෂණය කළා ය. ඒ සියලුම පේශකාරකයෝ වස් පැවැරූ භික්ෂූන්ට එක් එක් භික්ෂුවට එක එක සළුව බැගින් දුන්හ. එහි දී ජ්‍යෙෂ්ඨ පේශකාරයාගේ මසුරු සිත් ඇති බිරිඳ දූෂිත වූ සිතින් තමන්ගේ හිමියාට පරිභව කළා ය. නුඹ විසින් ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ට දෙන ලද ආහාර පාන ආදී යම් දානයක් වේනම් ඒ දානය නුඹට පරලොව දී මලමුත්‍රව ද, සැරව හා ලේ ද වී පහළ වේවා ! වස්ත්‍ර දිලිසෙන අයෝමය වස්ත්‍ර වෙත්වා කීවා ය. එගම විසූ ජ්‍යෙෂ්ඨ පේශකාර්මිකයා පසුකලක කළුරියකොට වින්ධ්‍යා පර්වතස්ථානයේ ආනුභාව සම්පන්න රුක් දෙවියෙක් ව උපන්නේ ය. ඒ ප්‍රධාන පේශකාරයාගේ මසුරු බිරිඳ කළුරිය කොට රුක් දෙවියා වසන තැනට නුදුරු ව ප්‍රේත දුවක් ව උපන්නී ය. ඒ ප්‍රේතිය නග්න ව දුර්වර්ණ ව

සාපිපාසායෙන් මඩනා ලදු ව ඒ බූමාටු දෙවියන් වෙතට ගොස් ස්වාමීනි මම වස්ත්‍ර නැති ව සාපිපාසාවෙන් මඩනා ලදු ව ඇවිදිමි. මට වස්ත්‍ර හා ආහාර පාන දුන මැනැවි යි කීය. එවිට ඒ දෙවිතෙම ඒ ප්‍රේතියට දිව්‍ය ආහාර පාන දුන්හ. ඒ ආහාර පාන වර්ග ඒ ප්‍රේතිය ගත් ඇසිල්ලෙහි ම මල මුත්‍ර බවට හා පූයා ලේ බවට පෙරළෙති. දෙන ලද සළුව ද ඇ විසින් ඇඳගත්කළ දිලිසෙන යපට වෙයි. ඒ ප්‍රේතිය මහත් දුක් විඳිමින් වස්ත්‍රය හැරදමා හඬමින් ඇවිදින්නේ ය.

එකල්හි එක්තරා භික්ෂුවක් වස්වැස පවරා බුදුන් වැඳීමට යන්නේ මහත් ගැල් සමූහයක් සමග වින්ධ්‍යා අඩවියට පැමිණියේ ය. ගැල්කරුවෝ රාත්‍රියෙහි මග ගෙවා ගොස් දවල් කාලයෙහි වනයෙහි ඝන සෙවණින් හා ජලයෙන් යුත් ප්‍රදේශයක් දැක ගොනුන් මුදා මද වේලාවක් ගිමන් හැරියහ. ඒ භික්ෂුව විවේක කැමති බැවින් මදක් ඉවත් ව ඝන සෙවණින් යුත් වනයේ සෙවණ ඇති ගහක් යට සඟල සිවුර පනවා හුන්නේ රාත්‍රි ගමන් වෙහෙස නිසා ක්ලාන්ත වූයේ නින්දට පැමිණියේ ය. ගැල් පදවන්නෝ විඩා සන්සිඳුවා ගෙන මගට පිළිපන්හ. ඒ භික්ෂුතෙම නො පිබිදියේ ය. පසුව සවස් කාලයෙහි නැගී සිට ගැල් පදවන්නන් නො දක්නේ එක්තරා වැරදි මගකට වැටී පිළිවෙලින් ඒ දෙවියා වසන තැනට පැමිණියේ ය. එකල්හි ඒ දෙව්පුත්තෙම මිනිස් වෙසින් ලගට පැමිණ පිළිසඳර කථා කොට, තම විමනට වැඩමවා පයගානා අඳුන් ආදිය දී ළංව හුන්නේ ය. එකල්හි ද ඒ ප්‍රේතිය ඇවිත් ස්වාමීනි මට ආහාර පාන වස්ත්‍ර දාන මැනවැයි කී ය. දිව්‍ය පුත්‍රයා ඇයට ආහාර පානාදිය දුන්නේ ය. ඒවා ඇ ගත් ඇසිල්ලකින් ම මළ මුත්‍ර පූයා ලේ ද, දිලිසෙන අයෝමය වස්ත්‍ර ද වූහ. ඒ භික්ෂුව ඒ දැක උපන් සංවේග ඇති ව ඒ දෙවියන්ගෙන් විචාරන්නේ,

55. මේ ස්ත්‍රිය අසුචි ද මුත්‍ර ද ලේ ද, සැරව ද, අනුභව කරයි. මේ කවර කර්ම යක විපාකයක් ද? යම්බදු ප්‍රේතියක් හැම කල්හි ලේ හා සැරව අනුභව කරන්නී ද? මේ ස්ත්‍රී තොමෝ කවර අකුසල කර්මයක් කළේ ද?

56. මැට දෙන ලද යහපත් වූ ද, මෘදු වූ ද, පිරිසිදු වූ ද, සුව පහසු ගෙන දෙන්නා වූ ද අළුත් වස්ත්‍ර ලෝහ වස්ත්‍ර සමාන වෙත් මේ ස්ත්‍රිය කවර නම් අකුශල කර්මයක් කරන ලද්දී ද?

එහි **කස්ස අයං විපාකො** - මේ කෙබඳු වූ කර්ම විපාකයක් ද? ඕ තොමෝ

දුන් විඳිනු ලබයි. **අයන්නු කිං කම්ම කාසි නාරී** - මේ ස්ත්‍රිය කවර ආකාරයේ කර්මයක් පෙර කරන ලද්දේ ද? **යා සබ්බදා ලොහිත පුබ්බ භක්ඛා** යම් තැනැත්තියක් හැමකල්හිම ලේ සැරව කයි. පරිභෝග කරයි. **නවානි** - අලුත් වස්ත්‍ර එකෙණෙහිම පහළ වෙයි **සුභානි** - සුන්දර වූ ද දැකුම්කළු වූ ද, මුදුන් සුව පහසු එළවන, පිරිසිදු වර්ණ ඇති, **ලොමසානි** - සුවපහසු ස්පර්ශය ගෙන දෙන්නා වූ, යහපත් වූ - **දිනානි මිස්සා කිතකා භවන්ති** - ගොරෝසු වූ කටුසහිත වූ යකඩ පට්ටයක් බඳු වේ. යන අර්ථය.

ඒ භික්ෂුව විසින් විමසන ලදු ව එයට පිළිතුරු වශයෙන් ඒ දේව පුත්‍රයා පූර්ව ජාතියෙහි ඇය විසින් කරන ලද කර්මය ප්‍රකාශ කරමින් ගාථා දෙක කීහ.

57. ස්වාමීන් වහන්ස ! මෝතොමෝ (පෙර අත්බවෙහි) මගේ භාර්යාව වූවා ය. මෝතොමෝ කිසිවෙකුට කිසිවක් නො දෙන සුළු වූ, මසුරු වූ, තද මසුරු සිත් ඇත්තී, වූවා ය. ඕ තොමෝ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට දන් දෙන්නා වූ මට ආක්‍රෝශ කළා ය. පරිභව කළා ය.

58. මේ දානය දී නුඹට පරලොව දී මළ ද, මුත්‍ර ද, ලේ ද, සැරව ද, වේවා ! වස්ත්‍ර ද තොපට (දිලිසෙන) යකඩ පත්‍රයක් වේවා, නුඹ හැම කල්හි ම අසුචි අනුභව කරන්න. මෙබඳු වූ වාක්දුශ්චරිතාදිය කොට මේ ප්‍රේත ආත්ම භාවයට පැමිණියා ය. බොහෝ කලක් මුළුල්ලෙහි ගූථාදිය අනුභව කරයි.

එහි **අදායිකා** - කිසිවක් කිසිවකුට නො දෙනසුළු වූවා ය. **මච්ඡරිනි කදරියා** - ස්වභාවයෙන් ම (යමක් නොදීම) මසුරු තැනැත්තිය, නැවත නැවත තද මසුරු කම දක්වමින් **මං දදන්ති** ආදිය කීහ.

එහි **එකාදිසං** - යම්සේ මෙබඳු වූ වාග් දුශ්චරිතයෙහි හැසිර, **ඉධාගතා** - මෙම ප්‍රේත ලෝකයට අවුත් ප්‍රේතාත්ම භාවයට පැමිණියා ය. **චිර රත්තාය ඛාදති**. බොහෝ කලක් ගූථාදිය ම කයි. යම් ආකාරයකින් ඇගේ නො කැමැත්තෙන් ම පවත්නා වූ විපාකය වනාහී යම් දානයක් උදෙසා අමනාප වී ද, ඒ අමනාප වීම හේතුවෙන් ඒ අත්බැවින් චුත ව අන්තැනක උපන් කල්හි පොළව මතුපිට හෙන වැටීමෙන් තමන් මතුයෙහි ම වැටේ.

මෙසේ ඒ දේව පුත්‍රයා විසින් පෙර කරන ලද අකුසල කර්මය කියා නැවත, ස්වාමීනි ! මැ ප්‍රේතලෝකයෙන් මිදවීමට යම්කිසි උපායක් වේ දැ යි ඒ

භික්ෂුවගෙන් ඇසී ය. භික්ෂුව ඇතැයි කී කල්හි, ස්වාමීනි එය කියනු මැනැව, යි දෙව්පුත් අයැදියෙන් "ඉදින් භාග්‍යවතුන් වහන්සේට, හෝ ආර්ය මහා සඞ්ඝයාට හෝ එක් භික්ෂුවකට හෝ දන් දී මැයට අනුමෝදන් කරනු ලැබෙනම්, මේ ප්‍රේතියත් අනුමෝදන් වී නම් එසේ ඇති වූ කල්හි මේ ප්‍රේත දුකින් මැගේ මිදීම වන්නේ ය. යි වදාළහ. එය අසා දේවපුත්‍රයා ඒ භික්ෂුන් වහන්සේට ප්‍රණීත වූ දිව්‍යමය වූ ආහාර පාන දන් දී එයින් ජනිත පින් ඒ ප්‍රේතියට අනුමෝදන් කළා ය. එකෙණෙහි ම ඒ ප්‍රේතිය සුවපත් වූවා පිනාගිය ඉඳුරන් ඇති ව දිව්‍ය ආහාරයෙන් සතුට විය. නැවත ඒ භික්ෂුන් වහන්සේගේ අතට දිවසළු දෙකක් බුද්ධපූජා වශයෙන් දී, ඒ දක්ෂිණා ව ද ප්‍රේතියට දුනි. එකෙණෙහි ම, ඕ තොමෝ දිව්‍ය වස්ත්‍ර හැඳ දිව්‍යලංකාරයෙන් සැරසුණා වූ සකල කාම සම්පත්තියෙන් සමෘද්ධ වී දෙවඟනක් හා සමාන විය. ඒ භික්ෂුව ද දිව්‍ය පුත්‍රයාගේ ඍද්ධි බලයෙන් සැවැත් නුවරට පැමිණ ජේතවනාරාමයට පිවිස භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ, වැඳ වස්ත්‍ර යුගලය පූජාකොට එපවත් සැළ කළේ ය. භාග්‍යවතුන් වහන්සේ ද ඒ කාරණය අර්ථෝත්පත්ති කොට ගෙන පැමිණ සිටි පිරිසට ධර්මය දේශනා කළ සේක. ඒ ධර්මදේශනා තොමෝ මහා ජනයාට සාර්ථක විය.

මහා පේසකාර ප්‍රේත වස්තු වර්ණනාව
නිමියේ ය.

—//—

# 1-10

"කානු අනෙනා විමානසම්ං" - යනා දී ධර්ම දේශනාව සැවැත්නුවර ගොදුරුගම් කොට වසන්නේ එක්තරා මුඩුහිසක් ඇති - (බල්ලාටිය) ප්‍රේතියක් අරභයා කියන ලදී.

අතීතයෙහි බරණැස් නුවර එක්තරා විශිෂ්ඨ රූ ඇත්තා වූ, දැකුම්කළු වූ, ප්‍රසාදජනක වූ වර්ණසෞන්දර්යයෙන් යුත් අතිමනෝහර කෙස් කළඹක් ඇති රූප සම්පත්තිය නිසා ජීවත් වූ එක්තරා වෛශ්‍යා ස්ත්‍රියක් ජීවත් වූවා ය. ඇගේ නිල් වූ දික් වූ, තුනී මොලොක් වූ සිනිඳු වූ වෙළන ලද අග ඇති දෙ අතින් ගතයුතු වූ කේශ කලාපය නොවිසිරී මෙවුල් කලාපය දක්වා එල්බෙත් ඇගේ ඒ කේශකලාපය දැක බොහෝසෙයින් තරුණයෝ ඇය පිළිබඳ ව සිත් ඇත්තෝ වූහ. එකල්හි ඇගේ ඒ කේශ ශෝභාව නො ඉවසමින් ඊර්ෂියාවෙන් මැඩුණු ස්ත්‍රීන් කීප දෙනෙක් කතිකාකොට ඇගේ ම මෙහෙවර කරන්නා වූ එක් දාසියකට මුදල් දී පොළඹවා ඒ දාසිය ලවා ඇගේ හිසකේ වැටෙන බෙහෙතක් දෙව්වාහු ය. ඒ දාසිය ඒ බෙහෙත නහනසුණු සමග යොදා ගඞ්ගානදියේ නානවිට ඒ වෙසඟනට දුන්නී ය. ඒ ස්ත්‍රී තොමෝ ඒ බෙහෙතින් මුල් සහිත හිසකේ තෙමා දියේ ගිලුණා ය. ගිලුණු ඇසිල් ලෙහි ම සියලුම කේශයෝ සහ මුලින් ඉදිරි වැටුණේ ය. ඇගේ හිස තිත්ත ලබු ගෙඩියක් මෙන් විය. එකල්හි ඕ තොමෝ ඉදුරුණු කෙස් ඇති ව සිදින ලද මුදුන ඇති පරෙවි ධේනුවක් මෙන් අවලස්සන ව ලජ්ජාවෙන් ඇතුළු නගරයට යා නොහැක්කේ වස්ත්‍රයකින් හිස වෙලාගෙන නගරයෙන් පිටත වෙනත් තැනෙක වාසය කළා ය. කිහිප දවසක් ගිය විට පහ වූ ලජ්ජා ඇති ව තල මිරිකා තෙල් වෙළදාම ද, සුරා වෙළදාම ද, කරමින් ජීවත් වූවා ය. ඕ තොමෝ එක් දවසක් සුරා මතින් මත් වූ මිනිසුන් දෙතුන් දෙනෙකු නිදා ගත් කල්හි ඔවුන්ගේ හැඳිවත් සොරා ගත්තී ය. ඉක්බිති එක් දවසක් එක් රහතන් වහන්සේ නමක් පිඬු පිණිස හැසිරෙනු දැක පහන් සිත් ඇති ව, තම ගෙට වැඩමවා පණවන ලද අසුනෙහි වඩා හිඳුවා තෙල් මිශ්‍ර වූ වැගිරෙන තෙල් ඇති තල කැරලි දන් දුන්නේ ය. ඒ රහත් තෙරහු ඇය කෙරෙහි අනුකම්පාවෙන් එය පිළිගෙන වැළඳූ සේක. ඈද පහන් සිත් ඇති ව තෙරුන්ගේ හිසට කුඩයක් අල්ලාගෙන සිටියා ය. ඒ තෙරුන් වහන්සේ ද ඇගේ සිත සතුටු කරමින් අනුමෝදනා බණ වදාරණ කල්හි ම මගේ හිසකේ තුනී සිනිඳු මොලොක් නැමුණු අග ඇති වෙත්වා යි ප්‍රාර්ථනා කළා ය.

ඕ තොමෝ මෑත කාලයෙහි කළුරිය කොට (පින් පව්) කුශලා කුශල කර්මයන්ගේ විපාකයෙන් මුහුද මැද රන් විමනෙක හුදෙකලාව ම උපන්නී ය. ඇගේ කේශයෝ ප්‍රාර්ථනා කළ අයුරින් ම බැබළීමෙන් පිහිටියාහු ය. මිනිසුන්ගේ හැඳිවත් සොර කම් කිරීම නිසා අකුශලයෙන් නග්න විය. ඕ ඒ රන්විමනෙහි නැවත නැවත ඉපදෙමින් එක් බුද්ධාන්තරයක් මුළුල්ලෙහි ම නිර්වස්ත්‍රව ම කල් යැවී ය.

අනතුරුව අපගේ භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වී පවත්වන ලද උතුම් ධර්ම චක්‍ර ඇත්තේ පිළිවෙළින් වැඩමවා සැවැත් නුවර වසන සමයෙහි සැවැත්නුවර වැසි සියයක් පමණ වෙළෙන්දෝ වෙළදාම් පිණිස ස්වර්ණ භූමියට යන නැවකින් මහා සමුද්‍රයට සේන්දු වූහ. ඔවුන් නැගී නැව සුළඟ සැඩ වීමෙන් ගසා ගෙන යන ලදු ව ඔබ මොබ කරකැවෙමින් ඒ විමාන ප්‍රේතිය වසන පෙදෙසට පැමිණියේ ය. එකල්හි ඒ විමාන ප්‍රේතිය විමානය සමග ම තමන් ඒ වෙළඳුන්ට දක්වී ය. ඒ දුටු ප්‍රධාන වෙළෙන්දා මෙසේ විම සීය.

59. මේ විමන තුළ සිටින තී කවර ස්ත්‍රීයක් ද? විමනෙන් නො නික්මෙයි. සොඳුර මහත් (සෘද්ධි) සම්පත් ඇති ඔබ දකිනු කැමැත්තෙමු විමනින් එළියට එනු මැනවි.

එහි **කානු අන්තො විමානස්මිං තිට්ඨන්ති** - විමානය ඇතුළෙහි සිටින ඔබ කවරීද මනුෂ්‍ය ස්ත්‍රීයක් ද? නැතිනම් අමනුෂ්‍ය ස්ත්‍රියක් ද? විචාළේ ය. **නුපනික්ඛමි** - විමානයෙන් නො නික්මෙයි. **උපනික්ඛමස්සු භද්දෙ තවං පස්සාම තං මහිද්ධිකං** - සොඳුර මහත් සම්පත් ඇති ඔබ දකිනු කැමැත්තම්හ. එහෙයින් විමානයෙන් නික්මෙනු මැනවි. **උපනික්ඛමංසු භද්දං තෙ** යනු ද පාඨයි.

ඉක්බිති තමාට එළියට පිවිසීමට නොහැකි බව පවසමින් මේ ගාථාව කීහ

60. මම නග්න වෙමි. පිටතට නික්මීමට පිළිකුල් ඇත්තේ වෙමි. දුක් ඇති වෙමි. ලජ්ජා ඇතිවෙමි. හිසකේවලින් පිළිසන් සිරුර ඇත්තියක් වෙමි. මා විසින් මද පිනක් කරන ලදී.

එහි **අට්ටියාමි** - නග්න ව සිටින බැවින් පිටත නික්මීමට දුක් ඇත්තේ වෙමි. **හරායාමි** ලැජ්ජා ඇත්තී වෙමි. **කෙසෙහම්හි පටිච්ඡන්න නතා** - මම මගේ

කේශයන්ගෙන් වසන ලද පොරවන ලද සිරුර ඇත්තේ වෙමි. මා විසින් සුළු කුශල කර්මයක් පමණක් කරන ලදී. තලමුරුවට තල කැරලි දුන් දානය පමණක් යන අදහසයි.

ඉක්බිති වෙළෙන්දා තමාගේ උතුරු සළුව දෙනු කැමැත්තෙන්, එබැවින් තිට මගේ උතුරු සළුව හැඳගන්න. සුන්දරිය.

මේ උතුරු සළුව හැඳගෙන විමානයෙන් පිටතට එන්න. සොඳුර ! බිහිදොර සිටියා වූ ඔබ ද කින්නට කැමැත්තම්හ. තී පිටතට නික්මෙව.

එහි **හන්‍දා** යනු බලන්න ගන්නා **උත්තරියං**, මත්තෙහි හෙළන උතුරු සළුව යන අර්ථයි. දදාමි තෙ. ඔබට දෙමි. **ඉමං දුස්සං නිවාසයා** - මේ මගේ උතුරු සළුව ගෙන හැඳ පෙරව ! **සොභනෙ** - දැකුම් කළු රූපය.

මෙසේ ද කියා (වෙළෙන්දා) තමාගේ උතුරු සළුව ඇයට දුන්නේ ය. ඕතොමෝ එසේ දෙන ලද්ද තමන්ට නො ලැබෙන බවත්, යමක් දෙනු කැමැත්තේ නම් ඒ පිළිවෙළත් දක්වමින් මේ ගාථා දෙක කීහ.

62. අතින් අතට නුඹ විසින් දෙන ලද්ද මට නො ලැබේ. සම්මා සම්බුදුන්ගේ ශ්‍රාවක වූ, කර්මඵල විස්වාස කරන්නා වූ එක්තරා උපාසකයෙක් ඔබ අතර (ඇත්තේ ය)

63. ඒ උපාසකයා (ඔය වස්ත්‍රයෙන් හඳවා) ඒ ප්‍රාප්ති දානය මට දෙව, එසේ කළ කල්හි සියලු සැප සම්පතින් පිරී මම සුවපත් වන්නෙමි.

**එහි හත්‍ථෙන හත්‍ථෙ තෙ දින්නං න මය්හං උපකප්පති.** නිදුකාණනි! ඔබගේ අතින් මගෙ අතට ඔබ විසින් දෙන දෙයක් මට නො ලැබේ. නො යෙදේ උපභෝගයට සුදුසු නො වේ. යන අර්ථයි. **එසෙත්ථුපාසකො සද්ධො** මෙතෙමේ තුණුරුවන් අදහා සරණගමනය වැළඳ ගත් උපාසකයෙකි. කර්මය හා කර්මඵලය ඇදහීමේ සැදැහැයෙන් යුක් එක් පුද්ගලයෙක් මෙහි ඔබේ පිරිවර සමූහයෙහි සිටී. **එතං අච්ඡාදයිත්වාන මම දක්ඛිණ මාදිසා** - මට දිය යුතු දෙනු කැමති සළුවෙන් ඒ උපාසකයා හඳවා ඒ දක්ෂිණාව ආනිසංසය ප්‍රාප්තිදානය මට දෙව ! **අථාහං සුඛිතො හෙස්ස** - එසේ කළ කල්හි මම සියලු සැපත් ලබා දිව්‍ය වස්ත්‍ර හැඳ සුවපත් වෙමි. යි කීය.

එය අසා වෙළෙන්දා ඒ උපාසකයා නාවා සුවඳ ගල්වා වස්ත්‍ර යුගලෙන් හැඳවූහ. එහි අර්ථය කියන්නා වූ සංගීති කාරකයෝ ගාථා තුනක් කීහූ.

64. ඒ වෙළෙන්දා ඒ උපාසකයා නහවා උතුම් සුවඳ ගල්වා වස්ත්‍ර දෙකකින් හඳවා ඒ ප්‍රේතියට පින් අනුමෝදන් කළහ.

65. දක්ෂිණාව උදෙසීමට අනතුරුව ම විපාකය උපන්නේ ය. දිව්‍ය භෝජන ස්ථාන වූ නන් වැදෑරුම් භෝජන ද, දිව්‍ය වස්ත්‍ර සමාන වූ වස්ත්‍ර ද, නොයෙක් පාන වර්ග ද, දානයාගේ විපාක වසයෙන් ඇයට ලැබිණ.

66. පසුව නෑමෙන් පිරිසිදුවූ ශරීර ඇති ව, හඳනා ලද පිරිසිදු වස්ත්‍ර හැඳ කසී සළුවලටත් වඩා උතුම් වස්ත්‍ර ධාරීව, සිනාසෙමින් විමානයෙන් නික්මුණා ය. මේ දානයා ගේ ප්‍රතිවිපාක වේ.

එහි 'තං' යනු උපාසකය යි. ච ශබ්දය නිපායකි. තෙ යනු වෙළෙන්දා සඳහා කියන ලදී. **විලිම්පෙත්වාන** - උතුම් වූ සුවඳ ද්‍රව්‍යයන් ආලේප කොට, **වත්ථෙහච්ඡා ද යිත්වාන** යනු වර්න ගන්ධ රසයන්ගෙන් යුත්තු වූ ව්‍යංජන සහිත වූ ආහාර වළදා යට හඳනා පිළි සහ උතුරු සළුද ඇතිවි ය. වස්ත්‍ර දෙකක් පිදීමේ ආනිසංස යි. වස්ත්‍ර දෙකක් දුන්නාහු යන අර්ථයි **තස්සා දක්ඛිණා මාදිසු** - ඒ ප්‍රේතිය වෙනුවෙන් දක්ෂිණාව දුන්නාහ. **සමනන්තරා නුද්දිට්ඨෙ** - අනු යනු නිපාත මාත්‍රයකි. ඈට දන් දීමේ කුසලය අනුමෝදන් කිරීමෙන් අනතුරුව ම, **විපාකො උපපජ්ජථා** - දක්ෂිණාවගේ ප්‍රතිඵලය විපාකය ඒ ප්‍රේතියට අත්වුනි කෙබඳු ද ප්‍රේතිය කීවා ය. **භොජනච්ඡාදන පානීය.** නොයෙක් ආකාර දිව බොජුන් සමාන වූ ආහාර, නොයෙක් වර්ණයන්ගෙන් සැදුම්ලත් දිව්‍ය වස්ත්‍ර සමාන වූ, රෙදි පිළි ද, නොයෙක් ආකාර බීම වර්ග ද, දක්ෂිණාවගේ විපාක වශයෙන් උපන්නේ ය. **තතො** - පෙර කියන ලද භෝජනාදිය ලැබීමෙන් පසුව, **සුද්ධා** නෑමෙන් පිරිසිදු වූ ශරීරය, **සුචිවසනා** - ඉතා පිරිසිදු වූ වස්ත්‍ර හැද, **කාසිකුත්තම ධාරිණී** - කසී සළුවන් උතුම් වස්ත්‍ර දරා, **හසන්තී** - දරුව බලනු මැනවි, ඔබගේ දක්ෂිණාව නිසා මේ සා ඵලවිපාක ලද්දේ ය යි ප්‍රකාශ කිරීම් වශයෙන් සිනහ සෙමින් විමානයෙන් නික්මියා ය.

ඉන්පසු ඒ වෙළෙන්දෝ මෙසේ ඇස් පනාපිට ම පින්පල දැක, පුදුමයට පත් වූ සිත් ඇති ව, ඒ උපාසකයා කෙරෙහි හටගත් ගරුබුහුමන් ඇති ව කරන ලද ඇදිලි ඇති ව, ඔහු ඇසුරු කළාහු ය. ඒ උපාසකයා ද, ඒ වෙළඳ ජනයා

බොහෝසෙයින් ධර්ම කථා වෙන් පහදවා, සරණයෙහි හා සීලයෙහි පිහිටුවීය. ඒ වෙළෙන්දා ඒ විමාන ප්‍රේතිය විසින් පෙර කරන ලද කර්මය කුමක් දැයි මේ ගාථාවලින් විචාළහ.

67. මොනවට කරන ලද විචිත්‍ර වූ සිතුවම ඇති, සිත්කළු වූ විමානය බබළයි. පින්වත් දෙවඟන ! තී ගේ කවර කුශල කර්මයක විපාක වසයෙන් මේ විපාක ලැබුවෙහි දැයි අපට කියව !

එහි **සුචිත්තරූපං** -ඇත්, අස්, ස්ත්‍රී පුරුෂ ආදී වසයෙන් වෙන් වූ, මල්කම් ලියකම් ආදී වසයෙන් ඉතා දක්ෂ කළු වූ සිතුවම් රූ ඇති, **රුචිරං**, රමණීය, දැකුම්කළු, **කිස්ස කම්මස්සදං ඵලං** කෙබඳු වූ කර්මයක, කවර නම් වූ දානමය වූ හෝ සීලමය වූ පින්කමක විපාක ද යන අර්ථයි.

මෙසේ (වෙළඳුන් විසින්) විචාරණලදින් ඕ තොමෝ මා විසින් කරන ලද සුළු කුශලකර්මයාගේ මේ විපාකය වෙයි. අකුශල කර්මයාගේ වනාහි අවීචි මහා නරකයෙහි මෙබඳු විපාක වී යයි ඒ කර්ම දෙක ම ප්‍රකාශකරමින් මේ ගාථා කී හ.

68. මම පිඬු පිණිස හැසිරෙන්නා වූ (කෙලෙස් දුරුකොට) ඍජු භාවයට පැමිණි භික්ෂුවක් හට මනා පහන් සිතින් යුතු ව තෙල් මුසු තල මුරුවටක් දුනිමි.

69. ඒ කුශල කර්මයාගේ විපාක වසයෙන් බොහෝ කලක් මුළුල්ලෙහි මෙම විමානයේ අනුභව කරමි. ඒ විපාකය දැන් අල්පාව ශේෂ විය.

70. මෙතැන් සිට සිව් මසකින් මගේ කළුරිය කිරීම සිදු වේ. මම ඒකාන්තයෙන් කටුක වූ දරුණු වූ භයානක වූ අවීචි මහා නිරයෙහි වැටෙන්නෙමි.

71. කොන් සතරක් ඇත්තේ ය. දොරවල් සතරක් ඇත්තේ ය. කොටස් වශයෙන් ප්‍රමාණ කරන ලදු ව මනාකොට හතරට බෙදන ලද්දේ ය. යකඩ පවුරකින් වට කරන ලද අතර යකඩ පියනකින් වසන ලද්දේ ය.

72. ඒ අවීචි මහා නරකයේ යකඩ වූ බිම දිලිසෙන්නේ ය. හාත්පස මහා ගිනි

දූල්වලින් නිරන්තරයෙන් රත් වන්නේ ය. සෑම කල්හි යොදුන් සියයක් තැන මෙය පැතිර සිටී.

73. මම ඒ මහා නිරයෙහි බොහෝ කලක්මුලුල්ලෙහි දුක් වේදනා විඳින්නෙමි. මා විසින් කරන ලද පාපකර්මයාගේ විපාකය හේතුවෙන් බොහෝ සෙයින් ශෝක කරමි.

එහි **භික්ඛු නො චරමාන** - ක්ලේශයන් බිඳහල එක්තරා භික්ෂුවක් පිඩු සිඟා හැසිරෙද්දී , **දොණි නිමජ්ජන** යනු උතුරා යන තෙලට දමා තෙලෙන් බදින ලද, **උජුභූතස්ස**, වංක කුටිල ආදී වූ වක් වූ කිසිවක් සිතෙහි නැති, කෙලෙස් පිසදැමීමෙන් ඍජු භාවයට පත්වුවකුහට **විප්පසන්නෙන චෙතසා** - කර්මඵල ඇදහීම් සංඛ්‍යාත ශ්‍රද්ධාවෙන් මනාව පිහිටි ප්‍රසන්න වූ සිතින්, **දීඝ මන්තරං** - මකාරය පද සන්ධිය සඳහා ය. දිගු කලක් යන අර්ථය **තයෙදානි පරිත්තකං** - යනු ඒ පින් ඵලයෙන් මුහුකුරාගිය විපාක කර්මය, දැන් අවසාන වන කාලය යි. තව ඉතිරි ව ඇත්තේ කෙටි කලකි, නොබෝ කලකින් ම මෙතැනින් චුතවෙමි යන අදහසයි. එහෙයින් **උද්ධං චතූහි මාසෙහි කාලකිරියා භවිස්සති**, තව සිව් මසකින් උපරිම වසයෙන් පස් මසක් ඇතුළත මගේ කළුරිය කිරීම සිදු වන්නේ ය යි දක්වයි. **එකන්තං කටු කං** - මේ ප්‍රේත යෝනි බවින් මිදී (යන තැන) ඒකාන්තයෙන්ම කටුක ය ඒකාන්තයෙන් ම දුක් ය. **ඝොරං** - දරුණු ය. **නිරයං පපතිස්ස හන්ති** - එහි සුවයක් නම් නැත්තේ ම ය. නිරය නම් වූ නම් ලද නරකයට වැටෙන්නෙමි. මෙහු නිරය නමින් දක්වන්නේ අවීචිමහා නරකය අදහස් කරයි. එහි ස්වභාවය දක්වමින් චතුක්කණ්ණන්ති ආදිය කීහ.

එහි **චතුක්කණ්ණන්ති** - සිව් කොන් ය. **චතුද්වාරංති**, දොරටු සතරක් සතර දිසාවෙහි වෙති. **විභත්තං** - මනාව බෙදා ඇත, **භාගසො** කොටස් වසයෙන්, **මිතං**, සමාන වූ, **අයොපාකාර පරියත්තං** - යකඩින් කරන ලද තාප්ප වලින් වටකරනු ඇත. **අයසා පටිකුජ්ජිතං** - යකඩ තහඩුවකින් උඩ (කට) වස යි. **තෙජසා යුතං** - හාත්පස නිතර ම දැල්වෙන මහත් වූ ගින්න නිරන්තරයෙන් ගිනිදැල් නගී. **සමන්තා යෝජන සතං** හාත්පස දිග පළල යොදුන් සියයක් වේ. **සබ්බදා** හැමකල්හි, **ඵරිත්වා තිටයති** - පැතිරී සිටී. **තත්ථ** - ඒ මහා නිරයෙහි (දුක) **වෙදිස්සන** විඳින්නෙමි. අනුභව කරන්නෙමි. **ඵලඤ්ච පාප කම්මස්සා** - මෙබඳු වූ මේ දුක් විඳීම මා විසින් කරන ලද අකුශල කර්මයාගේ විපාකය ම වන්නේ ය. යන අර්ථ ය.

මෙසේ ඒ දෙවඟන තමන් විසින් කරන ලද, කර්ම ඵලය හා මත්තෙහි නිරයෙහි උපදින බව ප්‍රකාශ කළ කල්හි ඒ උපාසක තෙමේ කරුණාවෙන් පිරි මෙහෙයවන ලද සිත් ඇති ව, එසේ වේ නම් මා ඇයට පිහිට වන්නෙමි ය යි සිතා මෙසේ කී ය. පින්වත් දෙවඟන හුදෙකලා ව මට දන්දීම් වශයෙන් සියලු කාමයන් සමෘද්ධ වූ මහා සම්පත් ඔබ ලැබුවා ය. දැන් මේ උපාසකයන්ට දන් දී බුදු ගුණ සිහිපත් කොට නිරයෙහි උත්පත්තියෙන් මුදන්නෙහි ය. ඕ තෙමෝ තුටු පහටු වූ සිත් ඇති ව මැනවැ යි කියා දිව්‍ය ආහාර පානයෙන් සතප්වා දිව්‍ය වස්ත්‍ර ද නොයෙක් රත්න ජාති ද දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ උදෙසා දිව්‍යමය වූ වස්ත්‍ර යුග්මයක් ඔවුන්ගේ අත්වලට දී ස්වාමීනි එක්තරා විමාන ප්‍රේතියක් භාග්‍යවතුන් වහන්සේගේ දෙපා සිරසින් වඳී යයි කියා, ශාස්තෘන් වහන්සේට මගේ වචනයෙන් සැවැත් නුවරට ගොස් වඳීවායි කියා වැඳීම ද යැවී ය.

ඒ නැව ද තමන්ගේ සෘද්ධ්‍යනු භාවයෙන් ඔවුන් විසින් පැතූ ආකාරයෙන් එදින ම (සැවැත් නුවරට) සේන්දු කරවී ය. ඉක්බිති ඒ වෙළෙන්දෝ ඒ පටුනේ පටන් සැවැත්නුවරට ගොස් ජේතවනයට පිවිස ඒ පිළි සඟල ශාස්තෘන් වහන්සේට පුදා, නමස්කාර පූර්වක වැඳීම ද දන්වා, ආදියේ පටන් සියලු විස්තර භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි කීහ. ශාස්තෘන් වහන්සේ ඒ අර්ථය අර්ථෝත්පත්ති කොට ගෙන, පැමිණි සිටි පිරිසට විස්තර වශයෙන් ධර්මය දේශනා කළ සේක. ඒ දේශනාව මහජනයාට සාර්ථක ව අවබෝධ විය.

ඒ උපාසකයෝ දෙවන දවසෙහි බුදුන් ප්‍රමුඛ මහා සංඝයාට දන් දී ඒ දෙවඟනට පින් අනුමෝදන් කළහ. ඕ තොමෝ ප්‍රේත ලෝකයන් චුත ව විවිධ රුවනින් බබළන තව්තිසා දෙව්ලොව රන් විමනෙක දහසක් අප්සරාවන් පිරිවරා උපන්නේ ය.

බල්ලාටිය ප්‍රේතවස්තු වර්ණනාව
නිමියේ ය.

——//——

# 1-11
# නාග ප්‍රේත වස්තුව

"පුරතො ච සෙතෙන පලෙති හත්ථිනා" මෙම ධර්මදේශනා කථාවස්තුව ශාස්තෲන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවාසය කරන කල්හි බ්‍රාහ්මණ ප්‍රේතයන් දෙදෙනකු නිසා වදාරන ලදහ. ආයුෂ්මත් සංකිච්ච සාමණේරයන් වහන්සේ සත්වැනි වියේ දී කරගෙහි දී ම (හිසමුඩුකරද්දීම) අර්හත්වයට පැමිණ සාමණෙර තත්ත්වයේ ම සිටියේ තිස්නමක් පමණ වූ භික්ෂූන් සමග ආරණ්‍යයෙහි වසන්නේ. පන්සියයක් සොරුන්ගෙන් භික්ෂූන්ට පැමිණි මරණ තර්ජන වලක්වා ඒ සොරුන් දමනය කොට පැවිදි කරවා, ශාස්තෲන් වහන්සේ සමීපයට වැඩියේ ය. ශාස්තෲන් වහන්සේ ඒ භික්ෂු පිරිසට ධර්මය දේශනා කළ සේක. දේශනාවසානයෙහි ඒ භික්ෂූහු රහත් බවට පැමිණියහ. ඉක්බිති සංකිච්ච තෙරණුවෝ පිරිපුන් වයස් ඇත්තේ උපසම්පදා ලාභී ව, පළමු කී භික්ෂූන් පන්සියයක් සමග, බරණැසට ගොස්, ඉසිපතනයෙහි වාසය කළහ. මහජනයා තෙරුන් සමීපයට ගොස් බණ අසා පහන්සිත් ඇති ව වීථි පිළිවෙළින් කණ්ඩායම් වශයෙන් එකතු ව ආගන්තුක දානය දුන්හ. මෙහි දී එක්තරා උපාසකයෙක් නිති බත් දීමෙහි මිනිසුන් සූදානම් කරවී ය. ඔව්හු ශක්ති පමණින් නිතිබත් පිහිටවූහ. එ සමයෙහි බරණැස් නුවර එක් තරා මිථ්‍යාදෘෂ්ටික බමුණෙකුට පුතුන් දෙදෙනෙකු හා එක දුවක් සිටියහ. ඔවුන් අතුරෙන් වැඩිමල් පුතා ඒ බ්‍රාහ්මණයාගේ මිත්‍රයෙක් විය. ඒ උපාසකයා තම මිත්‍රයා කැඳවාගෙන ආයුෂ්මත් සංකිච්ච ස්ථවිරයන් වෙත ගියේ ය. සංකිච්ච හාමුදුරුවෝ ඔහුට බණ කීහ. හෙතෙම මෘදු සිත් ඇත්තෙක් විය. ඉක්බිති උපාසකයා ඔහුට මෙසේ කී ය. ඔබ එක් භික්ෂුවකට නිතිබත් දෙවයි කී ය. ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ට නිතිබතක් දීම අප විසින් පුරුදු නො කරන ලද්දේ ය. එ නිසා මම නො දෙමි යි කී ය.

හොඳයි මට වත් බතක් දෙන්නේ ද නො දෙන්නේ දැ යි බ්‍රාහ්මණයා ඇසී ය. කෙසේ නම් නුඹට නො දෙම් ද දෙමි යි කී ය. එසේ නම් මට යමක් දෙන්නේ නම්, එය එක භික්ෂුවකට දෙව යි උපාසකයා බමුණාට කී ය. හෙතෙම මැනවැයි පිළිගෙන දෙවෙනි දවසේ උදෑසනම විහාරයට ගොස් එක භික්ෂුනමක් කැඳවා ආහාර වැළඳවී ය. මෙසේ කාලය සෙමින් ගතවෙද්දී භික්ෂූන්ගේ ප්‍රති පත්ති දැක, බණ අසා ඔහුගේ බාල සහෝදරයා ද, සහෝදරී ද, ශාසනයෙහි ප්‍රසන්න වූයේ, පින්කම් කිරීමෙහි කැමැත්ත ඇත්තෝ වූහ. මෙසේ ඒ තිදෙනා ම සම්පත් පමණින් දන් දෙමින්, මහණ බමුණන්ට

සත්කාර කළහ. ගරු කළහ. වැඳුම් පිදුම් කළහ. මව් පියන් වනාහි ශ්‍රද්ධා නැත්තේ ය. ශ්‍රමණ බ්‍රාහ්මයන් කෙරෙහි අප්‍රසන්නයහ. ඔවුනට අගෞරව කරයි. පුණ්‍යක්‍රියාවන්හි කැමැත්ත නො දක්වයි ආදරයක් නැත්තේ යි.

ඔවුන්ගේ දියණියන් මයිලණුවන්ගේ පුතුට විවාහකොට දීමට දෙපස නෑයෝ කතිකා කර ගත්හ. ඒ පුතණුවෝ ආයුෂ්මත් සංකිච්ච ස්ථවිරයන් වෙතින් ධර්මය අසා සංවේගයට කළ කිරීමට පැමිණියේ පැවිදී වී නිතර තමන්ගේ ගෙදරට දානය සඳහා වඩියි. මව් තොමෝ දියණි වූ බැමිණි කුමරිය කෙරෙහි ඒ සාමණේරයන් පොළඹවයි. ඒ හේතුවෙන් හෙතෙම උකටලී වූයේ උපාධ්‍යයන් වහන්සේ වෙත එළඹ, "මම උපැවිදි වෙමි, සිවුරු හරිමි. මට අවසර දුන මැනවැ යි කීහ. උපාධ්‍යායන් වෙහන්සේ ඔහුගේ හේතු වාසනා දැක මෙසේ කී ය. සාමණෙරය ! සත් දිනක් බලාපොරොත්තු වෙව, ඒ හෙරණ තෙම මැනවැ යි පිළිගෙන සිටියේ ය. මාසය ඉක්මගිය කල්හී නැවත එසේ ම කී ය. උපාධ්‍යායයන් වහන්සේ තව අඩ මසක් බලාපොරොත්තු වේව යි කී ය. අඩමස ඉකුත් වූ කල්හි එසේ ම තව සතියක් ඉවසන්නැයි කීහ. සාමණේරයෝ එය මැනැවැ යි පිළිගත්තේ ය.

ඉක්බිති සති අන්තයේ සාමණේරයන්ගේ මාමණ්ඩියගේ ගෙය, නටුවාවු වහළ ඇත්තේ , දිරුණු දුබල බිත්ති සුළඟින් හා වැස්සෙන් කඩා වැටුණේ ය. එහි බ්‍රාහ්මණයා ද, බ්‍රාහ්මණිය ද පුතුන් දෙදෙනා ද, දියණිය ද කඩා වැටුණු ගෙට යට වී මරණයට පත්වූහ. ඔවුන් අතුරෙන් බමුණා සහ බැමිණිය ප්‍රේත යෝනියෙහි උපත ලදහ. පුතුන් දෙදෙන ද දියණිය ද භූමාටු දෙවියන් ව උපන්හ. ඔවුනතුරෙන් වැඩිමල් පුතුට හස්තියානාවක් උපත කණිටු පුතුට අස් වෙළඹුන් යෙදු රථයක් ද, දියණියට රන්සිවි ගෙයක් ද, පහළවූහ. බමුණා හා බැමිණි මහත් මහත් යකඩ පොලු ගෙන ඔවු නොවුන් කොටාගනිත්. පහර වැදුණු වැදුණු තැන්වල මහත් ගෙඩි හටගෙන මොහොතින් පැසී පැළෙත්, ඒ දෙදෙන ක්‍රෝධයෙන් මඩනා ලදු ව එකිනෙකාගේ ගෙඩි පළා නිකරුණේ ඵරුෂ වචනයෙන් තර්ජනය කෙරෙමින් සැරව හා ලේ පානය කරමින් සතුටක් නො ලබති.

පසුව සාමණේරයන් කළකිරීමෙන් මැඩුනේ උපාධ්‍යායන් වෙත එළඹ ස්වාමීනි ! මා විසින් පිළිණ දුන් දවස් ඉකුත් විය. මම ගෙදර යන්නෙමි අනුදැන වදාළ මැනවයි කීය. ඉක්බිති එසේ කී කල්හි උපාධ්‍යයන් වහන්සේ හිරු අවරට ගියකල්හි කළුවර පක්ෂයෙහි තුදුස්වක් දින (මාසෙපෝය

දවස්වල) පවත්නා කල්හී, සාමණේරයන් ද කැඳවාගෙන, ඉසිපතනාරාමයේ පිටිපසින් ටික දුරක් ගොස් සාමණේරයන් සමගම සිටියහ. එවේලෙහි ඒ දේව පුත්‍රයන් දෙදෙන සමගින් නැගණිය ද දේව සමාගමට බුහුමන් පිණිස යති. ඔවුන්ගේ දෙමව්පියෝ පොලු ඔසවා ගෙන, අතිශය එරුස වචන කියමින්, කළු පැහැ සිරුරින් යුතු ව, අවුල් වැ ගිය කෙහෙ සහ රැවුල් ඇති ව, දැවුණු තල් කඳන් සමාන ව, වැගුරුණු ලේ සැරව ඇති ව, ඉතා පිළිකුල් ව, (ඉහත කී දෙව්වරුන්) ලුහුබැඳ යත්. එකල්හි ආයුෂ්මත් සංකිච්ච තෙරුන් වහන්සේ ඒ සියලු ම දෙන පෙනෙන පරිද්දෙන් ඍද්ධ්‍යාභිසංස්කාරයක් කොට, ශ්‍රාමණේරය ! මේ යන්නවුන් තෙපි දක්නේ ද ? ඇසී ය එසේ ය දක්නෙමි යි ඔහු කීහ. එසේනම් මොවුන් විසින් කළ කර්මයන් විමසනු යි නියම කළේ ය. තෙරණුන් ද ඇත් යානයෙන් යන්නවුන්ගේ පටන් සියලුදෙනාගෙන් ම පිළිවෙළින් විචාළේ ය. එසේ විචාරමින් මේ ගාථා කීහ.

74. සියල්ලන්ට පළමු ව ධවල වූ ඇතු පිටින් එක් දෙවියෙක් ය යි. අස් වෙළඹුන් යෙදූ රියකින් තව දෙවියෙක් මැදින් ය යි. දස දිසාවන් සිය ප්‍රභායෙන් බබුළුවමින් දීප්තිමත් වූ දිව්‍ය කන්‍යාවක් සිවියහනකින් පසු පසින් ගෙනය යි.

75. පොලු මුගුරු ගත් අත් ඇති ව, හැඬූ මුහුණින් යුක්ත ව, පොලු පහරවලින් තැනින් තැන තුවාල වුණු ශරීර ඇති ව, තොප දෙදෙන එකිනෙකාගේ ලේ බොන්නහු ද? මිනිසුන් වශයෙන් සිටි තෙපි කුමන අකුශල කර්මයකින් මේ තත්ත්වයට පත්වුණේ ද?

එහි පුරතො සියල්ලන්ට පළමු ව, පෙරටු ව, **සෙතෙනා** - සුදු පැහැයෙන් යුතු **පලෙති** - යයි. **මජ්ඣෙ පනා** - ඇතු පිටින් යන්නට ද සිවිකාවෙන් යන්නට ද අතරතුර මැදින්, **අස්සතරී රථෙනා** - සුදු අස් වෙළඹුන් යෙදූ රථයෙන් යයි යන යෙදුම යි. නීයාති - උසුළාගෙන යයි - **ඔභාසයන්ති දසදිසා** - හැම පැත්ත ම, හාත්පස ම සියලු දස දිසාවන් තමන්ගේ ශරීර ප්‍රභාවයෙන් ද, හැඳ පැළඳ ඇති වස්ත්‍රාභරණාදියෙන් ද, බබුළුවමින්, **මුග්ගරහත්ථපාණිනො** - තමන්ගෙ අත්වලින් යමෙක් පොලු මුගුරු දරා ද, හේ **මුග්ගරහත්ථපාණි** නම් වේ. **භින්න පභින්න ගත්තා** - පොලු පහරවලින් ඒ ඒ තැන කැඩුණු බිඳුණු තුවාලවුණු ශරීර ඇති ව **පිවාති** - බොයි.

මෙසේ සාමණේරයන් විසින් ප්‍රශ්න විචාරණ ලදු ව, ඒ ප්‍රේතයෝ ගාථා හතරකින් සියලු තොරතුරු කීහ.

76. සාමණේරයන් වහන්ස ! යම් දෙවි කෙනෙක් ඉදිරියෙන් ම, පා සතරක් ඇති නාග සඞ්ඛ්‍යාත ඇත් වාහනයෙන් යයි ද? ඒ අපගේ වැඩිමහල් පුතණුවන් ය. ඔහු දන් දී සුවපත් වී දූන් සතුටු වෙයි.

77. වේගවත් ගමන් ඇති වෙළඹුන් සිව්දෙනකුන් යෙදුවා වූ, අශ්ව රථයේ යම් දෙවි කෙනෙක් දෙවෙනි ව (මැදින්) ගමන් කරයි ද? ඒ අපේ බාල පුත්‍රයා ය. ඔහු මසුරු නො වී දන් දී දූන් මෙසේ බබළ යි.

78. නුවණැති වූ. මුව දෙනකට බඳු ඇස් ඇති යම් දෙවඟනක් රන්සිවි ගෙයකින් තුන්වැනිව යන්නී ද? ඕ තොමෝ අපගේ බාල දියණිය යි. ඈය තමා ලත් කොටසින් භාගයක් දන් දී ඒ පිණින් සුවපත් වී සතුටු වේ ය.

79. මොවුහු පෙර මිනිසත් බැව්හි දී, තුණුරුවන් කෙරෙහි පහන් සිත්ඇති ව, මහණ බමුණන්ට දන් දුන්නාහු වෙති. අපි මසුරු සිත් ඇති ව, මහණ බමුණන්ට අගෞරව කළෙමු. පරිභව කළෙමු. අපේ දරුවන් දන් දී දූන් දිව සැප විඳිති. අපි අව්වේ දමන ලද බටගසක් මෙන් පිපාසාවෙන් පෙළෙමින් ද එකිනෙකා පොලු මුගුරුවලින් තලා ගනිමින් ද වියලුණේ වෙමු.

එහි **පුරතො ච යො ගච්ඡති** - මේ යන්නවුන් අතුරෙන් යමෙක් පෙරටුව යන්නේ ද ඔහු **යො සො පුරතො ගච්ඡතීපි** යනු ද පෙළ යි. යම්කිසිවෙක් පෙරටුව යන්නේ ද හෙතෙමේ, යන අදහස යි. **කුඤ්ජරෙන** - පුලිල ගස් මයිලගස් ආදියෙන් හා වැල් වලින් ආවරණය වූ තැන්වල රමණය කෙරෙයි හැසිරෙ යි යන අරුතින් කුඤ්ජර වේ. ඒ කුඤ්ජර යන නම ඇති මොහුගේ ස්වභාවය මැඩ පැවැත්විය නො හැක්කේනුයි නාග නම් වේ. ඔහු විසින් යනු නාගෙන නම්.

**චතුක්කමෙනා** - සිව් පාදයෙන්, සතර පයින්, **ජෙට්ඨො** - හැමට පළමු උපන් තැනැත්තා - **චතුබ්භි** වෙළඹුන් සතර දෙනෙක්, **සුවග්ගි තෙනා** - යහපත් වූ දක්ෂම්කළ ගමනිනි, වේගවත් ගමනින්, **මිගමන්දලොචනා** - මුව දෙනකගේ මෙන් අහිංසක ඇස් ඇති, **භාගඩ්ඪභාගෙන** - කොටසින් කොටසක් තමා ලද කොටසින් භාගයක් දිම හේතුකොට ගෙන, **සුඛී** - සුවපත්වූවා ලිංග

විපර්යාසයෙන් මෙසේ කියන ලදී. **පරිභාසකා** - ආක්‍රොශ කිරීම - බැණීම, නින්දා කිරීම, **පරිචාරයනති** - දිව්‍යමය වූ කාමගුණයන්ගෙන් තමන්ගේ ඉන්ද්‍රියයන් සුවසේ පරිහරණය කිරීම, තමන්ගේ ප්‍රණාඝානුභාවයන් ගලා යන්නාක් මෙන් පිරිවර ජනයා සේවය කිරීම, **මයංච සුසසාම නළොව බිතෙතා** - අපි වනාහි අව්වේ දමන ලද බට දන්ඩක් මෙන් සා පිපාසාවෙන් පෙළෙන්නෙමු. අප එකිනෙකා දඬු ගෙන පහර දී ගනිමින් ශුෂ්ක වූ බවට පත්වීමු.

මෙසේ ඒ ප්‍රේතයෝ දෙදෙන තමන්ගේ පාපකර්මයන් පවසා, අපි ඔබ වහන්සේගේ නැන්දා සහ මාමා වූයෙමු යයි පැවසුහ. එය ඇසූ හෙරණ තෙමේ හටගත් සංවේග ඇති ව මෙබඳු වූ පව්කම් කළවුන්ට කෙසේ නම් ආහාර ලැබෙත් ද යි විචාරන්නේ

80. තොපගේ ආහාරය කෙබඳු ද? නිදා ගැනීම කෙබඳු ද? ඉතා ලාමක ස්වභාව ඇත්තා වූ තෙපි කවර ආකාරයකින් යැපෙන්නහු ද? ස්වල්ප නූ වූ ආහාර භෝග සම්පත් ඇති කල්හි පින් නො කිරීමෙන් සැපය වරදවාගෙන මේ දුකට පැමිණියාහු ය.

එහි **කිං තුමහාකං භොජනං**, කවාකාර භෝජනයක් කෙසේ ලබන්නේ ද? **කිං සයනං** නිදීම කවරාකාර වේ ද? **කිසස යානා** - කිසිවක් කියයි ද? කෙබඳු නිදීමක් ද? කෙබඳු සයනාසන ද? **කථංසු යාපෙථා** - කවර ආකාරයකින් යැපෙන්නහු ද? **සුපාපධම්මිනො** - ඉතා බරපතල පව්කම් **පහුත භොගෙසු** - සීමාරහිත මහත් වූ සම්පත් ඇතිකල්හි. **අනප්පකෙසු** - ස්වල්ප නූ වූ, බොහෝ වූ, **සුඛං විරාධාය** - සුවය බලාපොරොත්තුවෙන් පින්කම් නො කිරීම නිසා සැපය වරද්දාගෙන - **සුඛස්ස විරාධෙනා** යයි සමහරු කිය යි. **දුක්ඛප්ප පත්තා** - අද දූන් ප්‍රේත යෝනිය පිවිස දුක්ම අනුභව කරයි, දුකට ම පත්වෙයි.

මෙසේ සාමණේරයන් විසින් විමසන ලද්දෙන්, ප්‍රේතයෝ ඔහු විසින් අසන ලද කරුණු සඳහා මෙසේ පිළිතුරු දුන්හ.

81. අපි එක එකා තළාගෙන සැරව හා රුධිරය පානය කරමු. බොහෝ කොට පානය කරත් සෑහීමකට පත් නොවන්නෙමු. රුචි නො වෙමු. අපි අපේ කැමැත්තෙන් එය නො බොන්නෙමු.

82. මෙසේ ම අප මෙන් නො දෙන්නා වූ අනෙක් මිනිස්සු, පරලොව ප්‍රේත විෂයෙහි සිටිමින් ම විලාප කියත්. යම් මිනිසෙක් භෝග සම්පත් ලබාගෙන තමනුත් අනුභව නො කරන්නේ ද? පිනකුත් නො කරන්නේ ද?

83. ඒ සත්ත්වයෝ දුක්විපාක ගෙන දෙන පව්කම් කොට පරලොවෙහි දී සා පිපාසාවෙන් මඩනා ලදු ව ප්‍රේතයෝ ව බොහෝ කලක් මුළුල්ලෙහි දුක් ගිනි වලින් දැවෙමින් දැවෙත්, අනිෂ්ට විපාක වූ පව්කම් කොට දුක අනුභව කරත්.

84. ධනධාන්‍ය වෙනස්වන සුළු ය, විනාසවන සුළු ය. මේ ලෝකයෙහි මනුෂ්‍ය ජීවිතයත් කෙටි කාලින ය. නුවණැත්තේ ධනධාන්‍ය අනිත්‍යයයි දැන යහපත් දේ ම කරන්නේ ය.

85. ධර්මයෙහි දක්ෂ වූ යම් මිනිසෙක් මේ කරුණු දනිත් ද? ඒ මිනිස්සු අර්හත් වූ බුද්ධාදීන්ගේ වචනය අසා දන් දීමෙහි පමා නො වෙත්.

මෙහි **න ධාතා හොමා** - කා බී සම්පූර්ණයෙන් තෘප්තියට නො පැමිණෙන්නෙමු. **නචඡා දිමහ සෙ** - රුචිකර නොවේ - අපේ රුචියෙන් අපි නො බොන්නෙමු. **ඉචෙච වා** - එසේ ම **මචචා පරිදෙවයනති** - අපි වගේ අනෙක් මිනිස්සු කළ යුතු දේ නො කිරීමෙන් වැළපෙත් හඬත් **අදායකා** - නො දෙන පුද්ගලයා - මසුරු තැනැත්තා - **යමසස ඨායිනො** - ප්‍රේත ලෝකය පිළිබඳ හැඟීමෙන් ප්‍රේත විෂයෙහි, සිටින සුළු වූ, **යෙ තෙ විදිතවා අධිගමම හො ගෙ** - යමෙක් දැන් මේ අත්බවෙහි විශේෂ සුවදායක භවභෝග සම්පත් ලැබේ, **න භුඤජරෙ නාපි කරොනති පුඤඤං** අප මෙන් තමනුත් භුක්ති නො විඳ, අනුන්ටත් නො දී, දානාදී පින්කම් ද නො කරන්නේ **තෙ ඛුපපිපාසූපගතා පරතථා** ඒ සත්ත්වයෝ පරලොව ප්‍රේත නිකායෙහි ඉපිද බඩසයින් හා දිය පිපාසයෙන් පීඩිත වී සිටිමින්, **චිරං ඣායරෙ ඩයහමානා** - සාගිනි ආදී හේතුවෙන් දුක්ගිනි ඇවිලී අප විසින් කුසල් නො කරන ලදී, පව්කම් කරන ලදී ආදිය කියමින් පසුතැවිලි වෙමින් දැවෙමින් හඬත් ශෝකාතුර වචන කියමින් හඬත් යන අර්ථයි. දුඛුද්‍රයානි දුක් විපාක, **අනුභොනති දුකඛං කටුකපඵලානි** අනිටු විපාක දෙන පාපකර්ම කොට බොහෝ කාලයක් අපාදුක් විඳි යි. ඉතතරං බොහෝ කල් අනිත්‍ය වූ විපරිනාම ධර්ම, **ඉතතරං ඉධ ජීවනති** - මෙහි මිනිස්ලොව සත්ත්වයන් ගේ ජීවිත ද ස්වල්ප කාලයක් පවති යි. ටික කලක් පවති යි. ඉතා කෙටිකලක් පවතී. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ කියන ලදී. යමෙක් බොහෝ

කාලයක් ජීවත් වෙයි ද ඒ අවුරුදු සියයක් වේ එය ඉතා ටික කලකි. **ඉත්තරං ඉතරොති ඤත්වා** - ධන ධාන්‍යා දී උපකරණ ද, මිනිසුන්ගේ ජීවිත ද බොහෝ කලක් නො පවත්නේ ය. සුළු කලක්, කෙටි කලක්, පවතීය යි ප්‍රඥාවෙන් සලකා බලා **දීපං කයිරාථ පණ්ඩිතො** ප්‍රඥාවන්ත පුද්ගලයා පරලොව ඇති සුව පිණිස වූ කුසල් කොට තමා ම තමාට පිහිට කොට ගන්නේ ය. **යෙ තෙ එවං පජානන්ති** - යම්කිසි පුද්ගයෙක් තම ජීවිත කාලය ඉතා කෙටිය යි යථා පරිද්දෙන් දැන ගන්නේ ද ඔහු සැම කල්හිම දන් දී මි ආදියෙහි අප්‍රමාදීව ම කටයුතු කර යි. **සුත්වා අරහතං වචො** - අර්හත් වූ බුද්ධාදී ආර්යයන් ගේ වචන අසා යන අදහස යි. ඉතිරිය ප්‍රකටමැ යි.

මෙසේ සමණේරයන් විසින් විචාරණ ලද ඒ ප්‍රේතයෝ මේ සියලු පවත් කියා "අපි ඔබ වහන්සේගේ නැන්දා හා මාමා වරුන් වෙමු"යි කීහ. එපවත් අසා සාමණෙර තෙම උපන් සංවේග ඇති ව, කළකිරීම් පහකොට උපාධ්‍යායයන් වහන්සේගේ දෙපතුල් හිසින් වැඳ වැටී මෙසේ කී ය. ස්වාමීනි ! නුඹ වහන්සේ විසින් යම් අනුකම්පාවක් කළ යුතු වී ද? ඒ අනුකම්පාව නුඹ වහන්සේ විසින් කරුණාවෙන් මට කරන ලදි. ඒකාන්ත යෙන් මහත් අනතුරකට වැටීමට සිටි මා එම දුකින් මුදවා රක්ෂා කරන ලද්දේ වෙමි. දැන් මට ගිහිගෙයින් ප්‍රයෝජන නැත. ශාසන බ්‍රහ්ම චරියාවෙහි මැනැවින් ඇලෙන්නෙමි යි කීයේ ය. එකල්හි ආයුෂ්මත් සංකිච්ච ස්ථවිරයන් වහන්සේ ඔහුගේ අදහසට ගැලපෙන කර්මස්ථානයක් දෙසී ය. හෙතෙම ඒ කර්මස්ථාන අනුව හැසිරෙන්නේ කමටහන් වඩන්නේ , නොබෝ කලකින් ම රහත් බවට පැමිණූ නි. එම ප්‍රවෘත්තිය සංකිච්ච තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට දැන්වී ය. ශාස්තෘන් වහන්සේ ඒ කථාව අර්ථොත්පත්ති කොට පැමිණ සිටි පිරිසට ධර්ම දේශනා කළ සේක. එම දේශනාව මහජනයාට සාර්ථක දේශනාවක් වූයේ ය.

නාගපේත වස්තු වර්ණනාව
නිමියේ ය.

——//——

# 1-12

"උරගො ව තචං ජිණ්ණං" ආදී ධර්මදේශනාව ශාස්තෘන් වහන්සේ ජේතවනාරාමයෙහි වාසය කරන කල්හි එක්තරා උපාසකයකු අරභයා දේශනා කරන ලදී. සැවැත්නුවර එක්තරා උපාසකයකුගේ පුතෙක් කාලක්‍රියා කළේ ය. හේ පුතාගේ මරණය හේතුවෙන් හැඩීම් වැළපීම් වශයෙන් ශෝකයට පැමිණියේ , පිටත ගොස් කිසිදු කර්මාන්තයක් නො කරන්නේ ගෙයි ම සිටියේ ය. ශාස්තෘන් වහන්සේ අළුයම් කාලයෙහි මහා කරුණා සමාපත්තියෙන් නැගී සිට ලෝකය දෙස බලන්නේ ඒ උපාසකයා දැක පෙරවරු කාලයෙහි පා සිවුරු ගෙන ඔහුගේ ගෙදරට ගොස් දොරකඩ සිටියේ ය. උපාසක තෙමේ ශාස්තෘන් වහන්සේ වැඩම වූ බව අසා වහා නැගිට ගොස් පෙරගමන් කොට අතින් පා සිවුරු ගෙන ගෙට වැඩමවා ආසනයක් පනවා දුන්නේ ය. පනවන ලද ආසනයෙහි බුදුන් වහන්සේ අසුන්ගත් පසුව උපාසකයා භාග්‍යවතුන් වහන්සේට වැඳ එකක්පස්ව හුන්නේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ, ඇයි ද උපාසකය ශෝකයෙන් පීඩිත වී වාගේ පෙනේ ය යි කීහ. එසේ ය ස්වාමීනි ! මාගේ ප්‍රිය මනාප වූ පුතා කළුරිය කළේ ය. ඒ ශෝකයෙන් පීඩිත වී සිටිමි යි උපාසකයා කීහ. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ ශෝකය දුරුකරමින් උරග ජාතකය වදාළහ.

ඈත අතීතයෙහි කසීරට බරණැස් නුවර ධර්මපාල නම් බමුණු පවුලක් විය. එහි බ්‍රාහ්මණයා හා බැමිණිය ද, පුත්‍රයා දුවණිය ද, ලේලිය හා දාසිය ද යන මේ සියල්ලෝ මරණානුස්මෘති භාවනාවෙහි ඇලුණෝ වූහ. ඔවුන් අතුරෙන් යම් කෙනෙක් ගෙයින් පිටත යේ ද එතෙම සෙසු අයට අවවාද කොට ආලය නැතුව ම නික්ම යයි. එකල්හි එක් දවසක් බ්‍රාහ්මණයා පුත්‍රයා සමග ගෙදරින් පිටත් ව කුඹුරට ගොස් සී සෑම කරයි. පුත්‍රයා වියලි තණකොළ ගිනි දල්වමින් සිටියේ ය. එතැන්හි ගසක සිටි නාගයෙක් දූවිල්ල නිසා ඇති වූ බියෙන් රුක් සිදුරෙන් නික්ම විත් මේ බ්‍රාහ්මණ පුත්‍රයා දෂ්ට කළේ ය. ඒ බමුණු කුමරා විෂ වේගයෙන් මුසපත් ව එතැන ම වැටී කළුරිය කළේ ය. ඔහු ශක්‍ර දිව්‍ය රාජයා වී දෙව්ලොව උපන්නේ ය. බ්‍රාහ්මණයා පුතා මළ බැව් දැන, කුඹුර සමීපයෙන් යන මිනිසෙකුට කථාකොට මෙසේ කී ය. යහළුව ! මගේ ගෙදරට ගොස් බැමිණියට මෙසේ කියව ස්නානය කොට, පිරිසිදු ඇඳුම් ඇඳ එකෙකුට බත් හා මල් මාලා සුවඳ ආදීය ගෙන එන්නැයි" කියව ඒ මගියා ද එහි ගොස් බැමිණියට එසේ කීයේ ය. ගෙදර පවුලේ උදවිය ද

එසේ කළේ ය. බ්‍රාහ්මණයා දිය නා බත් කා, සුවඳ ගල්වා පිරිවර ජනයා විසින් පිරිවරන ලදු ව පුතණුවන්ගේ මළ සිරුර දර සෑයට නංවා ගිනි දල්වා දර කඩක් දවන්නාක් මෙන්, ශෝක නැති ව සන්තාපයක් නැති ව අනිත්‍යය යන හැඟීම මෙනෙහි කරමින් සිටියේ ය.

එකල්හි (මියගිය) බ්‍රාහ්මණ පුත්‍රයා ශක්‍රයා වී උපන හෙතෙම අපගේ බෝධිසත්ත්වයන් ද විය. හෙතෙම තමන් විසින් පෙර ආත්ම භාවයෙහි කරන ලද පින් කවරේ දැයි නුවණින් සිතා බලන්නේ, පියාට ද නෑයන්ට ද අනුකම්පා කොට බමුණකුගේ ස්වරූපයෙන් ඒ චිතකස්ථානයට ගොස් ශෝක නොකරන නෑයින් දැක, පින්වත්නි ඔබලා "මුවෙක් දවන්නේ ද" මම ද බඩගිනි ඇත්තෙක්මි මට ද මස් ටිකක් දෙන්නයයි කීය. බමුණ මේ මුවෙක් නො වේ, මනුෂ්‍යයෙකි. යි බ්‍රාහ්මණයා කී ය. කිමෙක් ද මේ දවන තැනැත්තා ඔබලාගේ සතුරෙක් ද? නැත, සතුරෙක් නො වේ. අපගේ එකම ඖරස පුත්‍රයා වූ මහා ගුණවත් තරුණ පුතා යයි කී ය. එබඳු ගුණවත් එකම තරුණ පුතා මළ කල්හි නුඹලා කුමක් නිසා ශෝක නො කරව් ද යි විචාළේ ය. එය අසා බ්‍රාහ්මණයා ශෝක නො කිරීමට කරුණු කියමින්

86. සර්පයා දිරුණා වූ තම සම (හැව) සිරුරෙන් හැර දමා යන්නේ ද? එපරිද්දෙන් ශරීරය නිරර්ථක වූ කල්හි, පහවූ කල්හි කළුරිය කළ කල්හි

87. දවන්නාවූ මළ සිරුර නෑයින්ගේ හැඬීම නො දනී. එහෙයින් මේ දරුවා නිමිති කොට නො හඬමි. හෙතෙම ඔහුගේ යම් ගමනක් කැමති වී ද? (කර්මානු රූපව) එයට පැමිණියේ ය. යන ගාථා දෙක කී ය.

එහි **උරගො** - බඩ ගා ගෙන යන්නේ නු යි උරග නම්, මේ සර්පයා යන වචන ය **තචං ජිණ්ණං** - යනු ජරා බවට පැමිණි, දිරීම් බවට පැමිණි පරණ වූ තමාගේ භාවය. **හිත්වා ගච්ඡති සං තනු** - යම්සේ සර්පයා තමන්ගේ දිරාගිය සම දුක් උපදවන්නේ, රැක් අතරෙහි හෝ, දර දඬු අතරෙහි හෝ, මුල් අතරෙහි හෝ, ගල් අතරෙහි හෝ, සැට්ටයක් ගලවා දමන්නාක් මෙන්, ශරීරයෙන් මුදා, හැර, ඉවත දමා කැමති පරිද්දෙකින් යයි. මෙසේ මෙම සංසාරයෙහි සැරිසරන සත්ත්වයෝ, තමාගේ පැරණි කර්මයන් ගෙවී ගිය කල්හි ජරාවට පත්වූ තමාගේ සිරුර හැර යයි. කර්මානුරූපව ගමන් කරයි. පුනර්භව වශයෙන් උපදී යන අර්ථයි. **එවං** යනු දවනුලබන්නා වූ පුතාගේ

ශරීරය දක්වමින් කිහ. **සරීරෙ නිබ්බොගෙ** - මොහුගේ මෙන්ම අන්‍යයන්ගේ ද ශරීරයන් ද අයිතියක් නැති ව නිරර්ථක වූ කල්හී **පෙතෙ**- ආයුෂය, උෂ්ණය, විඤ්ඤාණය, යන මේ තුන ශරීරයෙන් පහ ව ගිය කල්හි, **කාලක තෙ සති** මළ කල්හි, තස්මා යම් හෙයකින් දවන්නා වූ ශරීරයෙහි විඤ්ඤාණ ය පහ ව ගිය බැවින් දැවීමේ දුකක් හෝ, ප්‍රිය ඤාතීන් නැසීමක් වැළපීමක් හෝ නො දනි යි. එහෙයින් මගේ පුත්‍රයා අරමුණු කොට නො හඩමි. **ගතො සො තස්ස යා ගති**. යම් හෙයකින් කළුරිය කල පුද්ගලයා කරන ලද කර්මයන්ගේ අවකාශ ය පරිදි යම් ගතියක් යම් ගමනක් කැමති වී ද? චුති චිත්තයට ම අනතුරුව එහි ගියේ ය. පෙර ඤාතීන්ගේ හැඩීමක් වැළපිමක් පසුතැවිල්ලක් හේ නො දනී. පූර්ව ඤාතීන් බොහෝසෙයින් හැඩීමෙන් වැළපීමෙන් කවර අර්ථ සිද්ධියක් වේ ද යන අදහස යි.

මෙසේ බමුණා විසින් තමන්ගේ සිහි නුවණින් කල්පනා කිරීමේ දක්ෂතාව ප්‍රකාශ කළ කල්හි, බමුණු වෙස් ගත් ශක්‍රයා බැමිණිය ගෙන් මෙසේ ඇසී ය. මැණියනි ඒ මළ තැනැත්තා නුඹගේ කවරෙක් ද? දසමසක් කුසෙහි හොවා පරිහරණය කොට (ප්‍රසූතකොට) කිරි පොවා අත් පා හදා ලොකු මහත් කරන ලද මගේ පුතා ය යි කීවා ය. යම්කිසි හෙයින් පියා පුරුෂ භාවයෙන් නො හඩනා වියහැකි යි මවගේ හදවත මෘදු ය. උණුවෙන සුළු ය. කවර හෙයින් ඔබ නො හඩන්නි ද? එය අසා තමන් නො හඩනා කාරණ කියන්නී,

88. (පූර්ව ජන්මයෙහි සිටි) ඒ තැනින් නො කැඳවන ලදු ව ම ආයේ ය. මෙලොවින් අනු නො දන්නා ලදුව ම ගියේ ය. යම් ආකාරයකින් කර්මයකින් ආවේ ද? එපරිද්දෙන්ම ගියේ ය. එහිදී හැඩීමෙන් කවර අර්ථයක් ද?

89. දවන්නා වූ ශරීරය ඤාතීන්ගේ හැඩීමක් වැළපීමක් නො දනී. එහෙයින් පුතා නිමිතිකොට නො හඩමි. හෙතෙම යම් ගමනක් කැමති වී ද? ඒ ගමන ගියේ ය. යන ගාථා දෙක කීහ.

එහි **අනව්හාතො** නො කැඳවන ලදු ව, එම මගේ පුතා බවට පැමිණේවයි අප විසින් නො කැඳවන ලදී. **තතො** ඔහු පෙර සිටි පරලොවින් මෙහි පැමිණියේ ය. ආගා ආයේ ය. **අනනුඤ්ඤාතො** - පුත තෝ පරලොව යව යි අප විසින් අනුමත නොකරන ලදී. **ඉතො** මේ ලෝකයෙන්, **ගතො** - වෙන් ව ගියේ ය, **යථාගතො** - යම් හේතුවකින් ආයේ ද? අප විසින් මෙහි එන්නැයි

නො කියන ලද්දේම යන අර්ථය. **තථාගතො** - ඒ ආකාරයෙන් ම ගියේ ය. යම් සේ තමාගේම කර්මයෙන් ආවේ ද? එසේ ස්වකීය කර්මයෙන් ම ගියේ ය. මෙහි කර්මය තමා අයත් යයි දක්වත් **තත්ථ කා පරිදෙවනා** මෙසේ තමන් වසයෙහි නො පවත්නා වූ සංසාර ප්‍රවෘත්තියෙහි මරණය සඳහා කවර නම් විලාපයක් ද? නුවණැත්තන් විසින් එය නො කටයුතු අයුක්ති ධර්මයක් බව දක්වයි.

මෙසේ බැමිණියගේ වචනය අසා ඔහුගේ සහෝදරියගෙන් විචාළේ ය. නැගණියනි! මේ මළ තැනැත්තා ඔබ ගේ කවරෙක් ද? ස්වාමීනී මගේ සහෝදරයා ය. නැගණිය සහෝදරියෝ නම් සහෝදරයන් කෙරෙහි ආදරය ඇත්තාහු ය. කවර හෙයින් ඔබ නො හඬන්නී ද

90. මම හඬන්නේ නම් කෘශ වූ සරීර වෙමි. ඒ හැඬීමෙන් මට කවර ප්‍රයෝජනයක් ද? නෑ මිතුරු සුහද පුද්ගලයන් කෙරෙහි ඇලීම ම දුක් වන්නේ ය.

91. අදහස යට කියන ලදී.

එහි **සචෙරොදෙ කිසා අස්ස** - ඉදින් මම හඬන්නේ නම් වියළුණු කෘශ වූ ශරීර ඇති වන්නෙමි. **තත්ථ මෙ කිං ඵලං සියා** එහි මගේ සහෝදරයාගේ මරණය නිමිත්තෙන් හැඬීමෙන් කවර ඵලයෙක් ද? කවර යහපතක් ද? මගේ හැඬීමෙන් නැවත ඔහු නො එන්නේ ය. ඒ හේතුවෙන් ඔහු සුගතියට ද නො පැමිණෙන්නේ ය. යන අදහස යි. **ඤාති මිත්ත සුහජ්ජානං භීයොා නො අරතී සියා** - අපගේ නෑ මිතු සුහෘදයන්ට ද, මගේ ශෝක කිරීමෙන් සොහොයුරාගේ මරණ දුකෙන් බොහෝසයින් කළකිරීමේ දුක්ම ඇති වන්නේ ය.

මෙසේ නැගණියගේ වචනය අසා ඔහුගේ භාර්යාවගෙන් විමසී ය. මියගිය තැනැත්තා ඔබගේ කවරෙක් ද? ස්වාමීනි මගේ සැමියා ය. සොහොයුරිය ස්ත්‍රීන් නම් ස්වාමී පුත්‍රයා කෙරෙහි ස්නේහ, ඇත්තෝ වෙති. ස්වාමියා මළ කල්හි ඕ තොමෝ වැන්දඹු වන්නී ය. අනාථ වන්නී ය. එසේ තිබියදී කවර හෙයකින් ඔබ නො හඬන්නී ද? එය අසා ඇය තමන් නො හඬන කරුණ කියන්නී ගාථාවක් කීහ.

92. යම්සේ ළදරුවෙක් අහසින් යන්නා වූ සඳ මඬල දැක හඬයි ද? යමෙක් කළුරිය කරන ලද කෙනෙකු වෙනුවෙන් ශෝක කරයි ද මේ දෙක ම එක සමානය.

93. අදහස යට කියන ලදී.

එහි **දාරකො** - බාල දරුවෝ **චන්‍දං** - සඳමඬල, **ගච්ඡන්තං** - අහසෙහි ගමන් ගන්නා වූ **අනුරොදති** - මට කරත්තයක රෝදයක් සඳහා ගෙන දෙවයි හඬ යි. **එවං සම්පද මෙ වෙතං** යම්කිසි කෙනෙක් මියගිය අය වෙනුවෙන් සෝක කරන්නේ ද? යමෙක් අහසෙහි ගමන් කරන්නා වූ සඳමඬල රිය සකකට ඉල්ලා හඬන්නේ ද ඒ දෙක ම එක ස්ථානය (දෙදෙනම බාලයෝ ය) නො ලැබිය හැකි වස්තූන් පිළිබඳ ආශාව ඇති හෙයිනි.

මේ අන්දමට බිරිඳගේ වචන අසා දාසියගෙන් විචාළේ ය. නැගණියනි මියගිය තැනැත්තා ඔබගේ කවරෙක් ද? බමුණ ඔහු මගේ අයිතිකරුය (ස්වාමීනි) එසේනම් ඔහු මට දඩුවම් කළේ ය. මා ඔහුට වතාවත් කළේ ය. දැන් ඒ දෙකින් ම නිදහස් නිසා ගැළවීම නිසා ඔබ නො හඬන්නී ද? එසේ නො කියනු මැනවි. මගේ ස්වාමිපුත්‍රයා ඉවසීමෙන් ද මෛත්‍රියෙන් ද, දයාවෙන් ද යුත් අයෙකි. (ළෙහි වැඩුණු පුතකු වැනි විය) එසේ නම් ඔබ නො හඬන්නේ ඇයි ? ඕ ද තමන් නො හඬන කාරණය පැහැදිලි කරමින් ගාථාවක් කීය.

පින්වත් බමුණ. යම්සේ දිය කළයක් බිඳුණු විට එය නැවත නො සෑදිය හැකි ය. එමෙන් ම යමෙක් කළුරිය කළ කෙනෙකු සඳහා ශෝක කිරීම ද එසේම ය.

එහි **යථාපි බ්‍රහෙම උදකුමෙහා භිනෙහා අප්පටි සන්ධියො** - බ්‍රාහ්මණ ය, පොල්ලකින් ගසා බිඳින ලද දිය කළයක් නැවත ප්‍රකෘති තත්ත්වයට පත් කිරීමට නො හැකිවන්නේ යම්සේ ද? පරලොව ගිය කෙනෙකු වෙනුවෙන් හැඬීමෙන් ඔහු යළි නො ඒම ද එසේ ය. එය නිෂ්ඵල ය.

ශක්‍රයා ඔවුන්ගේ ධර්ම කථා අසා, පැහැදුණු සිත් ඇත්තේ, මිත්‍රවරුනි ඔබලා මරණානුස්මෘතිය මැනවින් පුහුණු කරන ලද්දාහු ය. මෙතැන් පටන් ඔබලා විසින් කෘෂිකර්මා දී කිසිවක් නො කළ යුතු ය. කියා ඔවුන් ගෙය සත්රුවනින් පුරවා, ප්‍රමාද නො වී දන් දෙව්, සිල් රකිවු. පෙහෙවස් සමාදන්ව රකිව් යයි අවවාද කොට, තමන් කවුදැයි ඔවුන්ට හඳුන්වා දී සිය ශක්‍රබවණට ම ගියේ ය.

ඒ බ්‍රාහ්මණාදී හූ ද දානාදී පින්කම් කොට ආයු ඇති පමණ සිට දෙව්ලොව උපන්නාහු ය.

ශාස්තෲන් වහන්සේ මේ කථාව ගෙන හැර දක්වා, උපාසකයාගේ ශෝක නමැති හුල සහමුලින් උදුරා දමා, චතුස්සත්‍යය ප්‍රකාශ කළසේක. සිව්සස් දේශනාවගේ අවසානයෙහි උපාසක තෙම සෝවාන් පෙළෙහි පිහිටියේ ය.

**උරග ජාතක වස්තු වර්ණනාව නිමියේ ය.**

**කතා වස්තු දොළසකින් යුත් උරග වර්ගයේ අර්ථ වර්ණනාව නිමියේ ය.**

——//——

## 2-1

"නගගා දුබ්බණ්ණ රූ පාසී" යන මේ ධර්ම දේශනාව ශාස්තෲන් වහන්සේ වේළුවනයෙහි වැඩ වාසය කරන කල්හි මගධ රට ඉට්ඨකාවතී නම් ගම එක්තරා ප්‍රේතියක අරබයා වදාළ සේක.

මගධ රට ඉට්ඨකාවතී ද දීඝරාජී ද කියා ගම් දෙකක් වූහ. එහි සංසාර මෝචක කුලයෙහි මිථ්‍යාදෘෂ්ටිකයෝ බොහෝදෙනෙක් වසති - අතීතකාලයේ අවුරුදු පන්සියයකට පෙර එක්තරා ස්ත්‍රීයක් ඒ ඉටඨකාවතී නම් ගමෙහි එක්තරා සංසාර මෝචක කුලයෙහි ඉපි ද, මිථ්‍යාදෘෂ්ටි වශයෙන් බොහෝ පණුවන් හා පලගැටියන් මරා ප්‍රේතයන් අතර උපන්හ. ඒ ප්‍රේතිය වසර පන්සියයක් මුළුල්ලේ සා පිපාසාදී දුක් අනුභව කොට, අපගේ බුදුන් ලොව පහළ වී පවත්වන ලද උතුම් දම්සක් ඇති ව, පිළිවෙළින් රජගහනුවර ඇසුරු කොට වේළුවනාරාමයෙහි වැඩ වසන කල්හි, නැවතත් ඉට්ඨකාවතී නුවර සංසාරමෝචක කුලයක ම ඉපි ද සත් අට හැවිරිදි වයස් කාලයේ අනෙක් දැරියන් සමග පාර තොටේ සෙල්ලම් කිරිමට සමත් වී ද? එකල්හි, ආයුෂ්මත් සැරියුත් තෙරුන් වහන්සේ ඒ ගම ම ඇසුරු කොට අරුනවතී විහාරයෙහි වාසය කරන සේක, එක් දවසක් දොළොස් නමක් භික්ෂූන් සමග, ඒ ගම්දොර සමීපයෙන් වඩිනසේක. එකෙණෙහි බොහෝ ගම්දැරියෝ ගමින් නික්ම ගම්දොර සමීපයෙහි ක්‍රීඩා කරන්නේ ප්‍රසන්න මනසින් යුතු ව මව් පියන්ගේ පිළිවෙත් දැකීමෙන් යුහුව ගොස් සැරියුත් තෙරුන් හා අනෙක් භික්ෂූන් පසඟ පිහිටුවා වැන්දාහු ය. සැදැහැනැති කුලයෙහි උපන් ළමයා බොහෝ කලක් කුසල් පුරුදු නො කළ බැවින් ද, යහපත් ජනයාගේ සිරිත් විරිත් නැති බැවින් ද, ආදර රහිත ව, නො හික්මුණු තැනැත්තියක් මෙන් සිටියා ය. තෙරුන් වහන්සේ ඇගේ පූර්ව චරිතය ද දැන් සංසාර මෝචක කුලයෙහි ඉපදීම ද නැවත මතු කාලයෙහි අපායෙහි උපදින්නට සුදුසු තැනැත්තියක් බව ද, දැක, ඉදින් ඕද මා වඳින්නේ නම් නිරයෙහි නූපදින බව ද, ප්‍රේතිශක වසයෙන් ඉපදුනත් තමන් නිසා ම සම්පත් ලබන්නේ යයි දැන, කරුණා පෙරදැරි සිතින් ඒ ළදැරියන්ට මෙසේ වදාළහ. "තෙපි භික්ෂූන් වදිව්. මේ දැරිය වනාහි නො හික්මුණු දැරියක් සේ සිටියාය යි කීහු. එවිට අනෙක් දැරිවියෝ ඈ අතින් අල්වා ඇදගෙන ඇවිත් බලහත්කාරයෙන් තෙරුන්ගේ පා වැන්දවුහ. ඕතොමෝ වැඩිවිය පැමිණ දීඝ රාජී නම් සංසාරමෝචක කුලයේ එක්තරා කුමාරයකුට විවාහ කොට දෙන ලදු ව, පිරුණු ගැබ ඇති ව කළුරිය කරන ලද්දී, ප්‍රේතයෝනියේ ඉපදී නග්නව දුර්වර්ණව, සා පිපාසා

දෙකින් මඩනා ඉතා බියකරු දැකුමෙන් යුතු ව ඇවිදින්නී, රාත්‍රි කාලයෙහි ආයුෂ්මත් ශාරි පුත්‍ර ස්ථවිරයන්ට පෙනෙන සේ එකත්පස් ව සිටියා ය. සැරියුත් හාමුදුරුවන් වහන්සේ ඒ ප්‍රේතිය දැක ගාථාවකින් මෙසේ ඇසීය.

1. උස්ව නැගුනු ඉල ඇට ඇති ව, කෘශ වූ තැනැත්තිය, නග්නව පිළිකුල් දනවන පැහැය ස්වභාව ඇතිව, ඉල්පී ගිය නහර වැල් ඇතිව, මෙහි සිටින තී කවරීද?

එහි - **ධමනිසන්ථතා** - මස් ලේ නැති බැවින් නහර දැල් ප්‍රකට ව පෙනෙන, උප්ඵාසුලිකෙ උස්ව නැගුණු ඉල ඇට, **කිසිකෙ** - කෙට්ටු වූ කෘශ වූ ශරීරය, පෙර "කිසා" යයි කියා නැවත "කිසිකෙ" යන වචනය - ඇට සම නහර පමණක් ඇති ශරීර ඇති බැවින් අතිශයින් ම කෙට්ටු බව දක්වන යන අර්ථය කියන ලදී. එය අසා ප්‍රේතිය තමා ව හඳුන්වමින් ප්‍රකාශ කරන්නී.

2. ස්වාමීනි මම දුකට පැමිණියා වූ, යම ලෝකයයි කියන ලද ප්‍රේත අපායෙහි උපන්නා වූ, ප්‍රේත දුවක් වෙමි. පව්කම් කොට මිනිස් ලොවින් චුත ව ප්‍රේත ලෝකයට පැමිණියෙමි. යි කියා

නැවත තෙරුන් වහන්සේ

3. කයින් - සිතින් වචනින් කවර අකුශලයක් කරන ලද්දේ ද? කවර කර්ම විපාකයකින් ප්‍රේත ලෝකයේ ඉපදුනේ ද?

කරන ලද කර්මය විචාරන ලදු ව. නො දෙන සුලු ව, මසුරුකමින් යුක්ත වීම නිසා ප්‍රේත යෝනියෙහි ඉපි ද මහත් දුක් අනුභව කරන බව දක්වන්නී.

4. ස්වාමීනි පහන් සිත් ඇති ව මහණ බමුණන්ට දන් දෙව යි කියා අනුකම්පාවෙන් මට කියාදුන් මවක් හෝ පියෙක් හෝ නෑ කෙනෙක් හෝ වෙනක් අනුකම්පා කරන කෙනෙක් හෝ මට නො සිටියේ ය.

5. මෙබඳු වූ නග්න ව බඩගින්නෙන් හා පිපාසයෙන් පෙළනු ලබමින්, මෙතැන් පටන් අවුරුදු පන්සියයක් මුළුල්ලෙහි මම හැසිරෙම් ද? මාගේ පාපකර්මයාගේ විපාකය මෙය වේ.

6. ආර්යයන් වහන්ස නුඹ වහන්සේ පහන් සිත් ඇති ව මම වදිමි. මහත් ආනුභාව ඇති ධීරයන් වහන්ස මට අනුකම්පා කරනු මැනව. යම්කිසි දාන වස්තුවක් දී මට පින් දුන මැනව. ස්වාමීනි ගතියෙන් මා මුදනු මැනවි.

එහි **අනුකම්ප** කා- පරලොව දී ලැබෙන ඵලය සඳහා උපකාර වුව මැනවි. **භන්තෙ** - තෙරුන් වහන්සේට ඇමතීම යි. **යෙ මං නියොජෙය්‍යුං** - මවක් හෝ පියෙක් හෝ - නැති නම් ඤාතියෙක් හෝ මෙ බඳු පැහැදුණු සිතක් ඇති ව මහණ බමුණන්ට දන් දෙවයි, අනුකම්පාවෙන් මා යොදවන්නට කිසිවෙක් නො සිටියේ ය. යන යෙදීමයි. **ඉතො අහං වස්සසතානි පඤ්ච යං එවරූපා විචරාමි නග්ගා** - මේ ප්‍රේතී තොමෝ මෙයින් තුන්වන ජාතියෙහි තමාගේ ප්‍රේත ආත්මභාවය සිහිකොට දුනුදු එසේ ම වසර පන්සීයයක් ගෙවන්ට වේද යි යන සිතිවිල්ලෙන් ඇද හිල්ලෙන් සිටී.

එහි - **ය** යනු යම් හෙයකින් දානාදී පිනක් නො කළ බැවින් මෙබඳු වූ නග්න වූ ප්‍රේතියක් ව, මෙවක් පටන් වර්ෂ පන්සියයක් වසන්නට වේ ද යි විමස යි. **තණ්හාසා** - පිපාසය **ඛජ්ජමානා** - කනු කැමැත්තී බොනු කැමැත්තී යන අර්ථයි.

**වන්දාමි තං අය්‍යපසන්න චිත්තා** - ආර්යයන් වහන්ස සැදැහැ සිතින් මම ඔබ වඳින්නෙමි. මට දන් කළහැකි එක ම පුණ්‍යකර්මය එය පමණක් බව දක්වයි. **අනුකම්පමං** - අනුග්‍රහය දක්වීම. මා උදෙසා දයාවෙන් කරුණාව දක්වනු මැනව. **දත්වාචමෙ ආදිස්සයංහි කිඤ්චි** - දීමට සුදුසු වූ කිසියම් දෙයක ධර්මයක් මහණ බමුණන්ට දී, ඒ දක්ෂිණා වේ, පින් මා සඳහා උදෙසන්න. ඒ පිණින් මේ ප්‍රේත ආත්මභාවයෙන් මිදී නිදහස් වන්නේ ය. යන බලාපොරොත්තුව කියයි. එහෙයින් කී ය. **මොචෙහි මං දුග්ගතියා භචන්තෙ** - ප්‍රේතිය විසින් මෙසේ කී කල්හි සැරියුත් තෙරුන්වහන්සේ යම්සේ පිළිපැද්දේ ද එය දක්වීම සංගීතිකාරකයෝ ගාථා තුනක් කීහ.

අනුකම්පා සිත් ඇති සාරිපුත්‍ර ස්ථවිරයෝ ඇගේ කීම මැනවැ යි පිළිගෙන භික්ෂු නමකට එක්බත් පිඩක් ද, එක් රියනක් පමණ රෙදිකඩක් ද, එක් පැන් තැටියක් ද දී, ප්‍රේතියට දක්ෂිණාව දුන්නේ ය.

8. ඇයට පින් පැමිණවීමෙන් අනතුරුව ම දානයාගේ විපාක උපන්නේ ය. කෙබඳු විපාකයක් ද යත් නන් වැදූරුම් දිව බොජුන්, සමාන භෝජන ද, දිව්‍ය වස්ත්‍ර සමාන වස්ත්‍ර ද, නන් වර්ග පානවර්ග ද උපන්නේ ය.

9. දිව්‍යභෝජනාදිය ලැබුණු පසු ව පිරිසිදු ශරීර ඇති ව, හඳිනා ලද පිරිසිදු වස්ත්‍ර ඇති ව, කසීසළුවලටත් වඩා උසස් සළු පැළඳ, සැරියුත් තෙරුන් වෙත එළඹී

**භික්ඛූනං** - භික්ෂූන් වහන්සේලා - වචන වෙනස්වීම් වසයෙන් කියන ලදී. - **ආලොපං භික්ඛුනො දත්වා** - සමහර තැනක පාඨය **ආලොපා** - බත් පිඩක්, එක බත් ගුලියක් **පාණි ම තතඤ්ච චොළකං** - එක් රියනක් පමණ රෙදිකඩක් යන අර්ථ යි. **ථාලකස්ස ච පානියං** එක තැලියක් පිරෙන පමණක් පැන්, ඉතිරි කොටස "බල්ලාටිය ප්‍රේත වස්තු වේ දුක් වූ පරිදි ය.

ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ, පිණාගිය ඉඳුරන් ඇති ව පිරිසිදු ශරීර වර්ණයෙන් යුක්ත ව දිව්‍ය වස්ත්‍ර වලින් සැරසී. තමන්ගේ ශරීර වර්ණයෙන් හාත්පස බබුළවමින් තමන් වෙත පැමිණි ප්‍රේතිය දක ඈ ලවා ප්‍රත්‍යක්ෂ වශයෙන් කර්ම ඵලය වර්ණනා කරනු කැමැත්තේ,

10. පින්වත් දෙවිදුව ! **යම්බඳු** වූ තී විශිෂ්ට වූ ශරීර වර්ණයෙන් ඕසධී තරුව මෙන් සියළු දිසා බබුළුවමින් සිටින්නෙහි ය.

11. කවර හේතුවකින් ඔබගේ මෙබඳු වර්ණයක් ඇති වී ද? කවර කුශල විපාකයකින් මේ යහපත් ප්‍රතිඵල ලැබුනේ ද? සිත් පිනවන වස්තුපකරණ කෙසේ උපදිත් ද?

12. මහත් ආනුභාව ඇත්තිය ! තිගෙන් විචාරමි. මිනිස් වූවා කිනම් පිනක් කරන ලද්දී ද? කවර හේතුවකින් මෙසේ දිළිසෙන ආනුභාව ඇත්තේ වී ද? තිගේ ශරීර වර්ණය දස දෙස බබුළුවයි.

එහි **අභික්කන්තෙන** - ඉතා මනවඩන විශිෂ්ට රූපයක් යන අර්ථයි. **වණ්ණෙන** - සමෙහි වර්ණයෙන්, **ඔභාසෙති දිසා සබ්බා** -මුළු දස දිසාව ම බබුළුවත් ඒකාලෝක කරයි. **ඔසධී විය තාරකා** ඉතා උසස් ප්‍රභාවත් ආලෝකයක් මොහුට ඇත්තේනුයි. මොහු දරනු ලැබේනුයි - ඖෂධයන් (සෙවීමට) අනුබල උපකාර දෙන නිසා ඕසධී නම්ලද තරුව යම්සේ හාත්පස ආලෝක කරමින් සිටී ද? එසේම ඔබ ද සියලු දස දිසාවන් බබළවත් යන අර්ථයි. **කෙනා** - කිං ශබ්දය විචාරීමෙහි ය. හේතු අර්ථයෙහි කරණ වචනයි. කවර හේතුවකින් ද යන අර්ථයි. **තෙ** - ඔබ **එතාදිසො** - මේ ආකාරයෙන් යම්

සේ දක්නා ලැබේදැයි කියන ලදී. **කෙන තෙ ඉධ මිජ්ඣති** - කවර පුණ්‍ය විශේෂයකින් මෙහි මේස්ථානයෙහි දැන් තී විසින් ලබන ලද යහපත් ප්‍රතිඵල සමෘද්ධ වී ද? නිපදවී ද? **උප්පජ්ජන්ති** - උපදිත් **භොගා** පරිභෝග කටයුතු යන අර්ථයෙන් භෝග යයි නම් ලද සිත් පිනවන සියළු වස්ත්‍රාභරණ ආදීය. **යෙ කෙචි** - යම් කිසිවක් යනු භෝගයන් ඉතිරි නොකොට වැයකොට සංග්‍රහණය කෙරේ යනුයි. කිසිවක් ඉතිරි නොකොට වැය කිරීම වනාහි මෙහි නිර්දේශිතයි. යම් සේ මේ සංස්කාරයෝ යනුයි. **යෙකෙචි මනසො පියා** - සිතින් ප්‍රිය කරන ලද දේ මනාපිය නම් වේ යන අර්ථයි. **පුච්ඡාමි** - ප්‍රශ්න කරමි. දැන ගැනීමට කැමැත්තෙමි තං යනු ඔබ, **දෙවී** - දිව්‍යානුභාවයෙන් යුක්ත වූයේ **දෙවී** - මහානුභාව යයි එහෙයින් කියන ලදී. **මනුස්සභූතා** මිනිසත් බව පතා මනුෂ්‍ය ලෝකයෙහි මිනිසුන් අතර ඉපදීම, මෙය බොහෝසෙයින් සත්ත්වයෝ මනුෂ්‍යාත්මභාවයෙහි සිට පින් කරන්නේ ය යයි දැක්වීමට කියන ලදී. මේ වූ කලි ඒ ගාථාවන්ගේ සංක්ෂේප අර්ථය යි. විස්තර වශයෙන් පරමත්‍ථදීපනී නම් වූ විමානවත්‍ථු අර්ථකථාවෙහි කියන ලද පරිද්දෙන් දත යුත්තේ ය.

මෙ පරිද්දෙන් සැරියුත් තෙරුන් විසින් විමසන ලදු ව ඒ ප්‍රේතී තොමෝ තමා ගේ සම්පත්ති ලාභය පිණිස කාරණය ප්‍රකාශ කරමින් සෙසු ගාථා කියන ලදී.

13. ලෝකයෙහි කරුණා සම්පන්න වූ ස්ථවිරයන් වහන්සේ පඬුවන් වූ, කෘශ වූ බඩසයින් පීඩිත වූ, නග්න වූ, සුන්බුන් සිරුරු සිවිය ඇති දුප්පත් වූ මා දුටුවේ ය.

14. භික්ෂූන් වහන්සේ නමකට බත් පිඩක් ද, රියනක් පමණ රෙදිකඩක් ද, පැන් තලියක් ද දී මට පින් අනුමෝදන් කළේ ය.

15. බත් පිඩෙහි විපාකය බලනු මැනවි. කැමති විය යුතු වූ කාම සම්පතින් යුතු ව, දහසක් අවුරුදු මුළුල්ලේ නොයෙක් රස මසවුලෙන් යුත්, දිව බොජුන් වළඳමි.

16. රියනක් පමණ වූ රෙදි කඩෙහි විපාකය බලනු මැනවි. නන්ද රජුගේ රටෙහි යම් පමණ වස්ත්‍රයෝ වෙත් ද?

17. ස්වාමිනී ! මට මේ කෝසෙයය වස්ත්‍ර හා කම්බිලි ද, කොමු පිළි හා කපු පිළි ද, යන හඳනා පොරෝනා වස්ත්‍රයෝ, ඊට වඩා බොහෝ වෙති.

18. මහත් වූ ද මා හැඟි වූ ද, ඒ වස්ත්‍රයෝ අහසෙහි ම එල්බෙත් ද ඒ මම යම් කිසි වස්ත්‍රයක් සිතට ප්‍රිය වේ නම් එය පරිභෝග කරමි.

19. පැන්තලියගේ විපාකය යම්බඳු ද? බලනු මැනවි ගැඹුරු වූ ද සතරැස් වූ ද, පොකුණු මනාව පහළ වූහ.

20. සුදු වැල්ලෙන් ගැවසි ගත්තා වූ. යහපත් තොටුපල ඇති, සිහිල් ජලය ඇති, සුවඳ ඇති හෙළ පියුමෙන් ගැවසීගත් මල් රේණු වලින් ගැවසුණු ජලයෙන් පිරුණ හ.

21. මම එහි ඇළෙමි. ඉඳුරන් හසුරුවමි. සතුටුවෙමි. කිසිවකින් බිය නැත්තී වෙමි. ස්වාමීනි ! ලෝකයෙහි කරුණාන්විත වූ භික්ෂු වූ ඔබ වහන්සේ වඳින්නට පැමිණියේ වෙමි.

එහි **උප්පණ්ඩුකී** - පඬුවන් පැහැය ගත්, **ජාතං** - පරිභෝගයෙහි - බඩගින්නමැඩපවත්වා - **අයපති තචජ්චිං** - සුණු විසුණු වූ ශරීර නම, **ලොකෙ** - මෙසේ කාරුණික වූ, කරුණා විශේෂය දක්වීම පිණිස කියන ලදී. **තං මං** - එබඳු වූ මම, කියන ලද පරිද්දෙන් මා කෙරෙහි කරුණාව උපදවා - **දුග්ගතං** - නිරයට ගිය, **භික්ඛුනං ආලොපං දත්වාප** - ආදී වසයෙන් ස්ථවිරයන් වහන්සේ මා වෙනුවෙන් කරුණාව ඉපිද වූ ආකාරය, කටයුතු කළ ආකාරය දක්වීම යි.

එහි **භත්තං** - යනු ආහාර යි. දිව්‍ය භෝජන යන අර්ථ යි. **වස්ස සතං දසා** දස වර්ෂ සියයක්, වර්ෂ දහසක් කියනලද්දේ වේ. මෙය අත්‍යන්ත සංයෝගයේ යේ දී මේ වචන යි. **කාම කාමීනී අනෙක රසබ්‍යඤ්ජනං** - අන්‍යයන් විසින් ද කැමති කැමති වූ පරිද්දෙන් සමන්විත වූ නොයෙක් රස මසු වලින් යුත් බත් අනුභව කරමි. යන යෙදීමයි. **චොලස්සා** - දියයුතු සුදුසු දාන වස්තුව වසයෙන් ගොදුරු කොට ඇති දානමය පුණ්‍යකර්මය දක්වයි. **විපාකං පස්ස සාදිසං** - ස්වාමීනි රියනක් පමණ වූ ඒ රෙදි දන් දීමෙන් ලත් විපාක සංඛ්‍යාත ඵලය බලනු මැනැවි. යම් බඳු වූ (දිවසළු හැඳ පෙර වූ රූපය දක්වා ප්‍රේතිය කීවා ය. **යාවතානන්දරා ජස්ස** - ආදිය කීහ.

එහි මේ නන්දරාජ යනු කවරෙක් ද?

යටගිය දවස වනාහි අවුරුදු දස දහසක් ආයු ඇති මිනිසුන් අතරෙහි බරණැස් වාසී වූ එක් කෙළඹි පුත්‍රයෙක්, අරණ්‍යයෙහි ශරීර සුවය සඳහා ඇවිදින්නේ, අරණ්‍යස්ථානයේ එක්තරා පසේ බුදුන් වහන්සේ නමක් දුටුවේ ය. ඒ පසේ බුදුන් වහන්සේ එහි සිවුර මැසීමෙහි සිටින්නේ නුවාව නො මසා ම හකුළා තබන්නට සූදානම් විය. ඒ කෙළඹියා එකල්හි එකරුණ දැක, ස්වාමීනි කුමක් කරන්නේ ද යි අසා ඒ පසේ බුදුන් සැහැල්ලු පැවතුම් ඇති බැවින් කිසිවක් නො කීයේ ය. සිවුරට රෙදි අඩු බව දත් කෙළඹි යා තමන්ගේ උතුරු සළුව පසේ බුදුන් පාමුල තබා ගියේ ය. පසේ බුදුන් වහන්සේ එය ගෙන නුවාව මසා සිව්ර පෙරවී ය. ඒ කෙළෙඹියා ආයුෂ කෙළවර කළුරිය කොට තව්තිසා දෙව්ලොව ඉපිද, එහි ආයු ප්‍රමාණය දිව්‍ය සම්පත් අනුභව කොට, එයින් චුත ව, බරණැසට යොදුනක් පමණ දුරින් එක් ගමක ඇමති කුලයෙක උපන්හ.

ඔහු තරුණ වයසට පැමිණි කල්හි, එම ගමෙහි නැකැත් කෙළි සෝෂා කරන ලදී. හෙතෙම මෑණියනි මට නැකැත් කෙළි ක්‍රීඩාවට වස්ත්‍රයක් දෙන්නැයි ඉල්ලී ය. මව ඔහුට සෝදන ලද වස්ත්‍රයක් දුන්නේ ය. මෑණියනි මෙය ගොරෝසු ය යි කී ය. ඕ අනෙක් වස්ත්‍රයක් ගෙන දුන්නා ය. ඒ වත ද ඔහු ප්‍රතික්ෂේප කළේ ය. එවිට මව මෙසේ කීවා ය. දරුව යම්කිසි ගෙයක අපි උපන්නෙමු ද? ඒ ගෙයි මීට වඩා සියුම් වූ වස්ත්‍රයක් ලබන්නට අපට පින් නැතැයි ඕ කීවා ය. මෑණියනි! ලබන තැනකට මම යමි. යන්න පුත ! අද ම ඔබට බරණැස් නුවර රජකම ලැබේ නම් මම කැමැත්තෙමි, ඇය කීවා ය. හෙතෙම මෑණියනි යහපතියි මවට වැඳ පැදකුණු කොට කීය. අම්මේ මම යමි, පුත්‍රය යන්න ! මවට මෙසේ සිතිණ, ඔහු කොහේ යන්න ද? ගෙයි මෙතැන හෝ එතැන හෝ හිඳිනු ඇත.

හෙතෙමේ වනාහි පින් බලයෙන් චෝදනා කරන ලද ගමෙන් නික්ම බරණැස් නුවරට ගොස් මගුල් ගල්තලාවෙහි හිස පටන් වසා පොරවා හොත්තේ ය. ඒ බරණැස් රජු කළුරිය කොට සත්වැනි දවස විය. ඇමතියෝ ද පුරෝහිතයා ද රජුගේ ආදාහන කටයුතු කොට, රාජාංගනයෙහි හිඳ සාකච්ඡා කළහ. රජුට එක දුවක් සිටී. පුතුන් නැත. අරාජක වූ රාජ්‍යය නො පවතී ඵුස්සරථය යොදවමු. ඔවුහු කුමුදු පැහැ (අශ්වයින්) සෛන්ධවයන් සතර දෙනෙකු යොදා ශ්වේතච්ඡත්‍රය පෙරමුණේ තබා පස්වැදෑරුම් රාජ

කකුධභාණ්ඩයන් රථයෙහි ම තබා, රථය විහිදුවා පසුපස තූර්යනාද පැවැත්වූහ. රථය පෙරදිගින් ගමන් අරඹා උයනට අභිමුඛ ව සිටියේ ය. පළපුරුද්ද වශයෙන් රථය උයනට යයි එය නවත්වනු යයි සමහරු කීහ. පුරෝහිතයා නො නවත්වන්නැ යි කීහ. රථය කුමාරයා පැදකුණු කොට නැගීමට සැරසී සිටියේ ය. පෙරෙවි බමුණා පොරවා සිටි රෙදිකොණ ඉවත්කොට පාද තලයන් බලමින්, "මේ දීපය පමණක් නො ව, දෙදහසක් කොදෙව් පිරිවර කොට ඇති සතරමහ දිවයින්හි එක ම රජ බව කරන්නට සුදුස්සෙකු යි"කියා තූර්ය නාද පවත්වව් යයි කීහ. තුන්වරක් තූර්යනාද පැවත් වූහ. එකල්හි කුමාරයා මුහුණ විවර කොට බලා දරුවෙනි කුමන කරුණක් නිසා ඔබලා මෙහි ආවහු ද යි ඇසීය. ස්වාමීනි  නුඹ වහන්සේට රාජ්‍යය පැමිණියේ යයි කීහ. තොපගේ රජ කොහිදැයි ඇසී ය. ස්වාමීනි ස්වර්ගස්ථ විය. කෙතෙක් දවස් ඉක්මගියා හු ද? අද සත්වෙනි දවස ය. පුත්‍රයෙකු හෝ දියණියක නැත්තේ ද? දේවයිනි දියණියක් සිටී. පුත්‍රයෙක් නැත. එසේ නම් රාජ්‍යය කරවන්නෙම් යි කී කල්හි ඔව්හු එකෙණෙහි ම අභිෂේක මණ්ඩපයක් කොට, රජ දියණිය සර්වාලංකාරයෙන් අලංකාර කොට, උයනට පමුණුවා කුමාරයාණන් හට අභිෂේක කළාහු ය. ඉක්බිති ව කරන ලද අභිෂේක ඇති ඔහුට ලක්ෂයක් අගනා වස්ත්‍රයක් එළවූහ. හෙතෙම දරුවනි ! මේ කුමක් දැයි ඇසී ය. දේවයින් හඳනා සළුව ය යි කීහ. දරුවෙනි දළ නො වේද යි ඇසී ය. දේවයන් වහන්ස මනුෂ්‍යයන් පරිභෝග කරන වස්ත්‍ර අතුරෙන් මීට වඩා සියුම් වස්ත්‍ර නැතැ යි කීහ. යුෂ්මතුන්ගේ රජ මෙබඳු වස්ත්‍ර හැන්දේදැ යි ඇසී ය. දේවයිනි එසේ ය. තොපගේ රජ පින් ඇත්තෙකැ යි නො සිතමි. රන් කෙණ්ඩිය ගෙන එව වස්ත්‍ර ලබමියි කීහ. රන්කෙණ්ඩිය ගෙන ආහ. හෙතෙම හුනස්නෙන් නැගී අත් සෝදා මුව සෝදා දකුණතින් පැන්ගෙන පෙර දිගට ඉස්සේ ය. එකල්හි ඝන පොළව පලාගෙන කප්රුක් අටක් පැන නැංගාහ. නැවත පැන් ගෙන පැදුම් දෙසට, දකුණු දෙසට හා උතුරු දිගට පැන් ඉසි ය. සියලු දිසාවන්හි අට අට බැගින් කප්රුක් තිස් දෙකක් පහළ වූහ. එක් එක් දිසාවන්හි දහසය දහසය බැගින් කප්රුක් හැටහතරක් පහළ වූහ යි සමහරු කියති. හෙතෙම එක් දිව්‍ය වස්ත්‍රයක් හැඳ එකක් පොරවා නන්ද රජුගේ නුවර නූල් කටින ස්ත්‍රීහු නූල් නො කටිත්වා යි අණබෙර ලව්ව යි කියා සේසත් නංවා අලංකාරයෙන් සරසන ලද ඇත් කඳට නැගී නුවරට පැමිණ, රාජ මාලිගාවට නැගී මහත් සම්පත් අනුභව කළේ ය.

මෙසේ කල් ගත කරද්දී එක් දවසක් රාජ දේවිය රජුගේ සම්පත් දැක තපස්වීන් වහන්ස ආශ්චර්යයෙකි. කියා කාරුණිකව මෙසේ දැක්වී ය.

දේවිය කුමක්ද යි රජු විසින් විමසන ලදු ව, දේවයන් වහන්ස ! නුඹ වහන්සේගේ සම්පත් අති මහත් ය. නුඹ වහන්සේ සසර අතීතයේ දී මහත් කුසල් කර ඇත. දැන් මතු කාලය සඳහා කුසල් නො කරන්නාහු ය යි කීවා ය. කවරෙකුට දන් දෙමු ද සිල්වතුන් නැත යි කී ය. දේවයන් වහන්ස ජම්බුද්වීපය රහතුන් ගෙන් හිස් නොවේ. නුඹ වහන්සේ දානය සකස්කරවනු මැනවි. මම රහතුන් වහන්සේ ලබන්නෙමි කීවා ය. දෙවෙනි දවසේ රජු මහත් අනගිදන් සකස් කරවී ය. දේ වී තොමෝ ඉදින් මේ දිශාවෙහි රහතුන් වහන්සේලා ඇත්නම් මෙහි වැඩමවා අපගේ භික්ෂාව පිළිගනිත්වා ! යි අධිෂ්ඨාන කොට උතුරු දිගට මුහුණ ලා ළපැත්ත යට කරගෙන වැද හොත්තේ ය. දේවිය එසේ වැදහොත් වේලේ, හිමවතෙහි වසන්නා වූ පද්මාවතියගේ පුත්‍ර වූ පසේ බුදුවරුන්ට ජ්‍යෙෂ්ඨ වූ පදුම පසේ බුදුන් වහන්සේ සහෝදර පසේ බුදුන් ආමන්ත්‍රණය කළ සේක. නිදුක්වරුනි ! නන්ද රජු තොපට ආරාධනා කරති. ඔහුගේ ආරාධනාව ඉවසනු මැනවි. උන්වහන්සේලා ආරාධනාව පිළිගෙන එකෙණෙහි ම අහසින් වැඩමවා උතුරු දිග දොරටුව ළග බැස්සාහු ය. රටවැසියෝ දේවයන් වහන්ස පන්සියයක් රහතන් වහන්සේලා වැඩියාහුය යි. රජුට සැළ කළහ. රජු දේවිය සමග ගොස් වැඳ පාත්‍ර ගෙන පසේ බුදුවරුන් කෙරෙහි ප්‍රාසාදයට වැඩමවා එහි දී උන් වහන්සේලාට දන් පිරිනමා, බත්කිස අවසන් වූ කල්හි රජු සඞ්ඝස්ථවිරයන් වහන්සේ ගේ ද, දේවිය දෙවන ස්ථවිර වහන්සේගේ ද පා මුල වැද වැටී ආර්යයන් වහන්සේලා ප්‍රත්‍යය පිළිබඳ ව නො වෙහෙසුන මැනැව. අපි පිනෙන් නො පිරිහෙන්නෙමු. මෙහි වැසීමට අපට ප්‍රතිඥා දුන මැනවියි ප්‍රතිඥා ලබාගෙන රජ උයනෙහි නිවාසස්ථාන කරවා ජීවිතාන්තය දක්වා පසේ බුදුවරුන්ට උපස්ථාන කොට උන්වහන්සේ පිරිනිවිකල්හි උත්සව පවත්වා අගිල් සඳුන් ආදී දරවලින් ශරීර ආදාහන කෘත්‍යය කරවා ධාතූන් ගෙන චෛත්‍යයක් බඳවා, මෙබඳු මහානුභාව සම්පන්න මහර්ෂී වරුන්ටත් මරණය වන්නේ නම් අප වැන්නන්ට කියනුම කවරේදැයි උපන් සංවේග ඇති ව, ජ්‍යෙෂ්ට පුත්‍රයාට රජකම පවරා රාජ්‍යයෙහි පිහිටුවා රජු ශ්‍රමණ ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවි ය. දේවිය රජතුමා පැවිදි වු කල්හි මම කුමක් කරන්නද යි සිතා ඕ තොමෝ පැවිදි වුවා ය. දෙදෙන ම උයනෙහි වෙසෙමින් ධ්‍යාන සැපයෙන් කල්යවා ආයුකෙළවර බඹලොව උපන්හ. එ නන්දරජ වනාහි අප බුදුන්ගේ ශාසනයෙහි මහා ශ්‍රාවක වූ මහා කාශ්‍යප තෙරුණුවෝ ය. දේවිය භද්‍රාකාපලානී නම් වුවා ය. මේ නන්ද රජතෙම වනාහි දස දහසක් හවුරුදු මුලුල්ලෙහි දිව්‍ය වස්ත්‍රම පරිභෝග කරමින්, තම රට උතුරු කුරු දිවයින මෙන් සමෘද්ධ කරමින් පැමිණි මිනිසුන්ට දිවසළු දෙමින් ජීවත් විය. ඒ මේ දිව්‍ය වස්ත්‍ර සමෘද්ධිය සඳහා මේ ප්‍රේතී තොමෝ

"යාවතා නන්දරාජ සස විජිතසමිං පටිච්ඡදා" යනාදිය කීහ. එහි **විජිතසමිං** - රටෙහි, **පටිච්ඡදා** - වස්ත්‍ර, ඒවා සංවරණයෙහි වැසීමෙහි නියුතු වේ යයි පටිච්ඡදා වස්ත්‍රයයි කියයි. මේ ප්‍රේතිය නන්ද රජුගේ සමෘද්ධිය මෙන් මගේ සමෘද්ධිය ද මහත් යයි දක්වීමට "තතො බහුතරා භන්තෙ වත්ථානච්ඡාදනානි මෙති ආදිය කී ය.

එහි **තතො** නන්දරජුගේ පරිග්‍රහණයට සුදුසු වූ බහුතර වස්ත්‍ර මෙන්, මට ද වස්ත්‍ර ඇත්තේ ය යන අර්ථය **වත්ථානච්ඡාදනානි** - හඳින වස්ත්‍ර මෙන්ම පොරවන වස්ත්‍ර ද, **කොසෙය්‍ය කම්බලියානි** - කෝසෙය්‍ය වස්ත්‍ර ද කම්බිලි ද, **ඛොම කප්පාසිකානි** - කොමු පිළි හා කපු පිළි **විපුලා** දිගින් ද පළලින් ද පුළුල් වූ මහත් වූ, මහග්ඝා වටිනාකම් වසයෙන් මහත් වූ, මහාර්ඝ වූ, **ආකාසෙව ලම්බරෙ** - අහසෙහි ම එල්බගෙන සිටිත්. **යංයංහි මහාසො පියං** - යම් යම් පරිද්දෙකින් මගේ මනස ප්‍රිය වඩන්නේ ද ඒ ඒ දෙය ගෙන පරිහරණය කරමි. පොරවමි. **ථාලකස්සව පානීය විපාකං පස්සයාදිසං** තලියක් පමණ ප්‍රමාණයෙන් පැන් දීමෙන් අනුමෝදන් කළේ ය. එහි විපාකය වනාහි මහත් කොට විශාල කොට දක්වමින් ගම්භීරා චතුරසා ච, ආදිය කීහ.

එහි **ගම්භීරා** ඉතා ගැඹුරු **චතුරස්සා** - කොන් සතරක් ඇති - **පොක්ඛරඤ්ඤො** - පොකුණු - **සුනිම්මිතා** - කුසලානුභාවයෙන් මනාව පිහිටි. **සෙතොදකා** - සුදු ජලය සුදු වැල්ලෙන් ගැවසීගත්තේ ය. **සීතා** සිසිල් ජලය - **අප්පටිගන්ධා** - පිළිකුල් රහිත, මනාසුවඳ ඇති - **වාරිකිඤ්ජක්ඛ පූරිතා** - පියුම් හෙළ පියුම්, ආදී මල් රේණු වලින් සංයුක්ත වූ පිරුණු වතුර, **සහං** - ඒ මම, **රමාමි** - ඇලීමෙන් විදිමි. **කිලාමි** - ඉඳුරන් හසුරුවමි - **මො දාමි** - භෝග සම්පත්තියෙන් ප්‍රමුදිත වීමි. **අකුතො භයා** - කිසිවක කෙරෙන් හටගත් බියක් නැති ව සුවසේ වෙසෙමි **භන්තෙ වදිතමාගමා** - ස්වාමීනි ! මේ දිව්‍ය සම්පත් ලැබීමට සේතු කාරණා වූ ඔබ වහන්සේට **නමස්කාර** කිරීමට පැමිණියේ වෙමි.

ඒ ප්‍රේතදුව විසින් මෙසේ කී කල්හි ආයුෂ්මත් සාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ඉට්ඨකාවතිය, දීඝරාජිය, යන දෙගම්වැසි මිනිසුන් තමන් වෙත පැමිණි කල්හි මේ කථා වස්තුව විස්තර වසයෙන් වදාරමින්, සංවේග උපදවා සංසාර මෝචක පාප කර්මයෙන් මුදවා උපාසක භාවයෙහි පිහිටවූ හ. එපවත් භික්ෂූන් අතර ප්‍රකට විය. භික්ෂූහු ඒ ප්‍රවෘත්තිය. භාග්‍යවතුන් වහන්සේට

සැළ කළාහු ය. භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය අර්ථෝත්පත්ති කොට ගෙන පැමිණි පිරිසට ධර්මදේශනා කළසේක. දේශනා තොමෝ මහාජනයාට සාර්ථක විය.

**සංසාර මෝචක ප්‍රේතවස්තු වර්ණනාව නිමාවිය.**

——//——

## 2-2

"නගගා දුබ්බණ්ණ රූපා සී - මේ ධර්මදේශනාව ශාස්තෘන් වහන්සේ වේළුවන විහාරයෙහි වැඩ වාසය කරන්නේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්ට මෙයින් ආත්ම පහකට පෙර මව වූ එක්තරා ප්‍රේතියක් අරභයා වදාළ සේක.

එක් දවසක් ආයුෂ්මත් සාරිපුත්‍ර, ආයුෂ්මත් මොග්ගල්ලාන, ආයුෂ්මත් අනුරුද්ධ, ආයුෂුමත් කප්පින, යන තෙරවරුන් රජගහ නුවරට නුදුරු, එක්තරා ආරණ්‍යයක වාසය කරත්. ඒ සමයෙහි බරණැස් නුවර ආඪ්‍ය වූ මහාධනවත් වූ, සම්පත් බහුල වූ, බ්‍රාහ්මණයෙක් මහණ බමුණන්ට හා දුගී මගී, යාචක. හා බැගෑපත් උදවියට ද පුලන්නන්ට ද මහා පැන් පොකුණක් සමාන ව ආහාර පාන, වස්ත්‍ර සයනාසන ආදිය දෙයි. එසේ දෙන්නේ ද පැමිණි පැමිණි අයට කාලයට සුදුසු පරිදි පා දෝනා පැන්, පා ගල්වා බෙහෙත්, ආදිය දීමෙන් පිළිවෙළින් සියල්ල දීමෙහි යෙදුනේ වෙයි. පෙර බත් කාලයෙහි භික්ෂූන්ට ආහාර පානාදිය සකස්කොට පිරිනමයි. හෙතෙමේ විදේශයකට යන්නේ සිය බිරිඳට මෙසේ කීහ. පින්වතිය, යම්කිසි ආකාරයකින් මේ දානවිධිය පවත්වා ගෙන ආයේ ද ඒ පිළිවෙළ නො ඉක්මවා සකස් කොට පවත්වාගෙන යවයි, කීයේ ය. ඕ තොමෝ මැනවැයි පිළිගෙන ඔහු ගිය කල්හි පළමුකොට භික්ෂූන්ට දෙන ලද දන්වැට නැවැත් වීය. වාසය පිණිස පැමිනි මගීන්ට ගේ පිටිපස හැරදමන ලද දිරාපත් වූ ශාලාව පෙන්වා එහි නිදාගනිවූ යයි කීවා ය. ආහාර පානාදිය සඳහා මගීන් ආ කල්හි අසුචි කා පියව්, මුත්‍රබීපියව්, ලේ බීපියවූ, තොපගේ මව්වරුන්ගේ මොළ කාපියව්, යම් යම් පිළිකුල් සහගත දෙයක් ඇද්ද ඒ ඒ දේ වල නම් කියා රළු වචන කියයි.

ඕ තොමෝ කෙටි කලකට පසුව කළුරිය කොට අකුශල කර්මානු භාවයෙන් ඔසවාදමන ලදු ව ප්‍රේත යෝනියෙහි ඉපිද, තමාගේ වාග්දුශ්චරිතයට අනුරූප ව දුක් අනුභව කරත්, පෙර ආත්ම භාවය සමරා ආයුෂ්මත් සැරියුත් තෙරුන් වෙත එළඹීමට කැමැත්තේ ඒ විහාරයට පැමිණියා ය. එවිට විහාරයට අධිගෘහිත දේවතාවෝ ඇයට විහාරයට ඇතුල් වීම වැළැක්වූහ. ඕ තොමෝ වනාහි මෙයින් (පෙර) පස්වැනි ආත්ම භාවයෙහි සැරියුත් තෙරුන්ගේ මව වුවා ය. එහෙයින් මෙසේ කීහ. "මම ආර්ය වූ සැරියුත් තෙරුන්ගේ පස් වැනි ජාතියෙහි ආත්මභාවයෙහි මව වුයෙමි. තෙරුන් දකින්නට විහාර දොරටුවෙන් ඇතුළ් වීමට මට ඉඩ හරිවු. යයි කීවා ය. ඒ

ඇසූ දෙවියෝ ඇයට ඇතුල්වීමට අවසර දුන්හ. ඕ පිවිස සක්මණ කෙළවර සිට තෙරුන් වහන්සේට තමන් දක්වීය. ස්ථවිරයන් වහන්සේ දැක කරුණාවෙන් චෝදනා කරන ලද සිත් ඇති ව

22. උස් ව නැගුණු ඉළ ඇට ඇති ව, කෘශ වූ තැනැත්තිය, විලි වැස්මක් නැති ව, දුර්වර්ණ ස්වභාව ඇති ව, ඉල්පී ගිය නහර වැල් ඇති ව, මෙහි සිටින්නා වූ තී කවරෙක් ද? යී ඇසී ය. ස්ථවිරයන්ගේ විමසීමට පිළිතුරු දෙන්නී,

23. මම මින් පෙර වෙනත් ජාතියක දී ඔබගේ මව වීමි. ප්‍රේත ලෝකයෙහි උපන්නී සා පිපාසා දෙකින් මඩනා ලද්දෙමි.

24. වමනය ද, මුව මල ද, කෙල ද, සොටු ද. සෑයෙහි දවනු ලැබූ මෘත ශරීරයන්හි වුරුණු තෙල ද, වැදූ ස්ත්‍රීන්ගේ ලේ හා ගැබ් මල ද,

25. වණ ඇත්තවුන්ගේ හා හිස හා නාසය කැපුවන්ගේ ලේ ද, ස්ත්‍රී පුරිෂ ශරීරයන් අසුරු දේ ද, සා ගින්නෙන් මඩනා ලද මම අනුභව කරමි.

26. ගෙරින්ගේ ද මිනිසුන්ගේ ද, සැරව හා ලේ, අනුභව කරන්නී වෙමි. පිහිටක් නැත්තී වසන තැනක් නැත්තී, සොහොන් අලු හා අඟුරු බහුල වූ සොහොන් බිම ම සයනය කරන්නී වෙමි.

27. පුත්‍රයාණනි ! මා උදෙසා දානයක් දුන මැනවි. එහි පින් මට උදෙසනු මැනවි. ලේ සැරව බුදීමෙන් මුදන්නේ නම් ඉතාමත් යෙහෙකි. මේ ගාථා පහ කී ය.

**එහි අහං තෙ සකියා මාතා** - මම ඔබගේ ජනනී වසයෙන් ස්වකීය මව් වෙමි. පෙර වෙනත් ආත්මයක මව් වෙමි. - මේ ආත්මයෙහි නො වේ. මෙයින් ආත්ම පහකට පෙර අනෙක් ජාතියක යනු දක්වන ලදී. **උපපන්නා පෙත්ති විසයං** - ප්‍රතිසන්ධි වශයෙන් ප්‍රේත ලෝකයට පැමිණියෙමි. **ඛුප්පිපාසා සමප්පිතා** - බඩගින්නෙන් ද පිපාසාවෙන් ද, යුක්ත වූයේ වෙමි. නිරන්තරයෙන් බඩසයින් පිපාසයෙන් පෙළෙන්නේ වෙමි යන අර්ථයි. **ඡඩ්ඩිතං** - වමනය කළ - වැමෑරූ යන අර්ථයි. **ඛිපිතං** - කිඹි සීමත් සමග මුඛයෙන් පිටවෙන මල බෙලං කෑරීම් කෙළගැසීම, **සිඞ්ඝානිකං** - හිස් මොළයෙන් ගලා බසින නාසයෙන් නික්මෙන්නා වූ මල **සිලෙසුමං** - සෙම, **වසංච ඩයහමානං** - සෑයෙහි දවන ලද මෘත ශරීරයෙන් ගලන වසාතෙල්

**විජාතානංච ලොහිතං** - ස්ත්‍රීන් දරුවන් ප්‍රසූත කිරීමේ දි වැගිරෙන ලේ හා ගැබ් මල, **වණිතානං** - හට ගත්තා වූ වණ (විශාලතුවාල) **යං** - ලේවලට සම්බන්ධයි. **සණ සීසච්ඡනනා නං** නාසය, හිස කැපීමෙන් යම් ලෙයක් ගලා නම් එය අනුභව කරමි. **සාණසිසච්ඡිනනා නං** - යම්හෙයකිනි අත් පා ආදිය කැපීමෙන් ද, ගලන්නා වු ලේ බොන්නෙමියි එසේ වර්ණනා කරන ලද්දේ යයි, මෙයින් නැගුණු ලේ එක් වුයේ ය යනුයි දත යුතුයි. **බුදා පරෙතා** - බඩගින්නෙන් පෙළුණු, **ඉත්ථිපුරිසනිස්සිතං** - ස්ත්‍රී පුරුෂ ශරීර ඇසුරු කරගෙන පවතින්නා වූ අනෙක් සම් මස් නහර, ආදිය අනුභව කරන්නෙමියි දක්වයි. **පසූනං** - එළු - ගව ආදීන්, **අලෙනා** - අසරණ වූ, **අනගාරා** - නිවාස රහිත - **නිල මඤ්චපරායනා** - සොහොනෙහි දමන ලද මෘත දේහ නමැති ආසන - ගිනි අඟුරු බහුල අළු බහුල සොහොන් බිම අභිප්‍රේත යි. **උද්දිසාහිමෙ** - යම්සේ දෙන ලද දානයක දක්ෂිණාව (පිංපෙත්) මට උදෙසනු මැනව, මා උදෙසා පත්තිදානය දෙනු මැනව. **අපෙවනාම මුඤ්චෙයාං ප්‍රබලොහිත භෝජන** - ඔබගේ පින්දීම කරණකොට ගෙන පූයා සහිත ලේ ආහාර වශයෙන් ගන්නා වූ මේ ප්‍රේත ආත්මයෙන් මිදෙන්නෙමි.

මෙය අසා සැරියුත් තෙරුන් වහන්සේ දෙවන දවස්හි මහමුගලන් ආදී ස්ථවිරවරුන් තිදෙන ආරාධනා කොට ඔවුන් සමග රජගහ නුවර පිඬු පිණිස හැසිරෙන්නේ බිම්බිසාර රජුගේ මාලිගාවට වැඩම වූහ. රජු තෙරුන් දැක වැඳ ස්වාමිනී, කවර කරුණක් නිසා වැඩියේ දැයි පැමිණි කාරණය විචාළේ ය. ආයුෂ්මත් මහා මුගලන් ස්ථවිරයෝ මේ ප්‍රවෘත්තිය රජුට විස්තර කර දුන්නේ ය. රජු ස්වාමීනි අවබෝධ කර ගතිමි යි කියා තෙරුන්ගේ ප්‍රශ්නය විසඳා සර්ව කාර්මික ඇමතියා කැඳවී ය. නුවරට නුදුරුව සෙවනින් හා ජලයෙන් යුත්ත වූ වනයෙහි කුටි සතරක් කරවාළව යි ඔහුට අණ කළේ ය. ඇතුල නුවර ද සුදුසු තැනෙක විශේෂ වශයෙන් තුනට බෙදා කුටි හතරක් කරවී ය. තෙමේත් එහි ගොස් කටයුතු දේ කළහ. කුටිවල සියලු කටයුතු නිමා වූ කල්හි පූජාකර්ම සියල්ල සලස්වා ආහාර පාන වස්ත්‍රාදිය හා බුදුපාමොක් භික්සගනට සුදුසු දේ ද පිරිකර ද එළවා තබා ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට සියල්ල භාර දුන්නේ ය. එකල්හි තෙරුන්වහන්සේ ඒ ප්‍රේතිය උදෙසා ඒ සියල්ල බුද්ධ ප්‍රමුඛ සිව්දිග වසන භික්ෂු සඞ්ඝයාට පිදූ සේක. ඒ ප්‍රේති තොමෝ ඒ පින් අනුමෝදන් වී සියළු කාම සම්පත්තියෙන් සමෘද්ධ ව දෙවැනි දිනයෙහි ආයුෂ්මත් මහා මුගලන් තෙරණුවන් වෙත පැමිණ වැඳ සිටියේ ය. ඇගෙන් තෙරුන් වහන්සේ කරුණු විචාළහ. ඕ තොමෝ තමන්ගේ ප්‍රේතෝත්පත්තිය හා දෙව්ලොව ඉපදීමත් විස්තර වශයෙන් කීවා ය.

28. දයාවන්ත වූ ශාරීපුත්‍ර ස්ථවිරයෝ මවගේ වචනය අසා, මුගලන් තෙරුන් ද, අනුරුද්ධ තෙරුන් ද, කප්පින තෙරුන් ද ඇමතුවේ ය.

29. කුටි හතරක් කොට සිවු දික්හී වූ සංඝයාට ද කුටි ද ආහාර පාන වර්ග ද දුනි. මවට දක්ෂිණාව දුන්නේ ය.

30. ඇයට පින් පැමිණවීමෙන් අනතුරුව ම විපාකය උපන්නේ ය. නානාප්‍රකාර භෝජන ද විවිධ වර්ණ සහිත වූ දිව්‍ය වස්ත්‍ර වැනි වස්ත්‍ර ද, අනේකවිධ පාන වර්ග ද උපන මේ දානය ගේ විපාක වෙයි.

31. ඒ භෝජනා දී විපාකයන්ට පසුව) නැහැමෙන් පිරිසිදු වූ ශරීර ඇති ව, හඳනා ලද පිරිසිදු වස්ත්‍ර ඇති ව. කසී සළුවලටත් වඩා අගනා වස්ත්‍ර ධාරීව, (කෝලිත) මුගලන් හිමිවෙත පැමිණියා ය.

එහි **සංඝෙ චාතුද්දිසෙ** අදා - සිව් දිගින් වඩින මහා සංඝයාට දුන්නේ ය. පමුණුවා පවරා දුන්නේ ය. ඉතිරිය කියන ලද අයුරුම ය.

එකල්හි ආයුෂ්මත් මුගලන් ස්ථවිරයෝ ප්‍රේතියගෙන් මෙසේ විචාළහ.

32. පින්වත් දෙව්දුව ! යම්බදු වූ තී විශිෂ්ඨ වූ ශරීර වර්ණයෙන් ඕසධී තාරකාව මෙන් සියලු දිසාවන් බබළවමින් සිටින්නෙහි ය.

33. කවර හේතුවකින් තිට මෙබඳු වූ ශරීර වර්ණ ඇති වී ද? කවර කුශල විශේෂයකින් තිට මේ යහපත් ඵල උපදී ද? සිත් පිනවන වස්තුපකරණ කෙසේ ලබන් නී ද?

34. මහත් ආනුභාව ඇති දෙවිය! තිගෙන් විචාරමි. තී මනුෂ්‍යයකු වී කිනම් පින් කමක් කළෙහි ද? කවර කුශල හේතුවකින් මෙසේ දිලිසෙන ආනුභාව ඇති වී ද? තිගේ ශරීර වර්ණය දසදිසා බබුළුව යි.

ඉක්බිති ඕ තොමෝ මම ශාරීපුත්‍ර ස්ථවිරයන්ගේ මව වෙමි, ආදී විස්තර කීවා ය. ඉක්බිති මහා මුගලන් තෙරහු ඒ ප්‍රවෘත්තිය භාග්‍යවතුන් වහන්සේට සැළ කළහ. භාග්‍යවතුන් වහන්සේ එය අර්ථෝත්පත්ති කොට ගෙන රැස් වූ පිරිසට ධර්මය දේශනා කළ සේක. ඒ දේශනා තොමෝ මහා ජනයාට සාර්ථක දේශනාවක් වුයේ ය.

**සැරියුත් තෙරුන්ගේ මව් ප්‍රේතවස්තුව නිමියේ ය.**

—— // ——

## 2-3

"නගගා දුබ්බණ්ණ රූපා - මේ ධර්ම දේශනාව ශාස්තෲන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ වාසය කරන්නේ මත්තා නම් ප්‍රේතියක් අරබයා දේශනා කළසේක.

සැවැත්නුවර ශ්‍රද්ධාවන්ත වූ තුණුරුවන් කෙරෙහි පැහැදුණු එක්තරා කෙළෙඹියෙක් වාසය කළේ ය. ඔහුගේ බිරිඳ ශ්‍රද්ධා නැත්තී ය. අප්‍රසන්නයහ, ක්‍රෝධ බහුලය. දරුවන් නැත්තියක් ද වූවා. නමින් මත්තා නම් විය. ඉක්බිති ඒ කෙළඹියා කුලවංශය නසී යයි බියෙන් සමාන කුලයකින් තිස්සා නම් වූ අනෙක් කන්‍යාවක් ගෙන ආයේ ය. ඕ තොමෝ සැදැහැ ඇත්තී ය. ප්‍රසන්නය හ. ස්වාමියාට ප්‍රිය ය. මනාපය වැඩිකල් නොගොස් ම ඇය ගැබිනියක වී දසමස් ඇවෑමෙන් පුතෙකු වැදී ය. ඔහුට භූත තිස්ස යයි නම් කළේ ය. ඕතොමෝ ගෙට ස්වාමි දුවක් වී භික්ෂූන් සිව් නමකට මනාව උපස්ථාන කළා ය. වඳ තැනැත්ති ය ඇයට ඊර්ෂයා කළා ය. ඔව්හු දෙදෙන ව එක් දවසක් හිස නා තෙත් කෙසින් යුතු ව සිටියාහු ය. කෙළෙඹි තෙමේ ගුණධර්ම වශයෙන් තිස්සා නම් ස්ත්‍රීය කෙරෙහි බැඳුනු සිතින් හද බැදි සිතින් ඈ සමග බොහෝ කොට කථා කරමින් සිටියේ ය. එය නො ඉවසන්නා වූ මිත්තා ඊර්ෂ්‍යාව ප්‍රකෘති කොට ඇති ව ගෙය හැම ද එකතු කර තිබුණු කසල තිස්සා නම් ස්ත්‍රියගේ හිස මත්තෙහි බහාලී ය. ඕ තොමෝ ටික කලකින් කළුරිය කොට ප්‍රේත යෝනියෙහි ඉපදී, තමන්ගේ අකුසල කර්ම බලයෙන් පස් වැදෑරුම් දුක් අනුභව කරයි. ඒ පස් වැදෑරුම් දුක් වනාහී දේශනා පෙලෙන් ම ප්‍රකාශ වේ. එක් දවසක් ඒ ප්‍රේතිය සැන්දා කාලය ඉක්ම ගිය කල්හි ගෙයි පිටිපස නහමින් සිටි තිස්සා නම් ස්ත්‍රියට තමන් දැක්වීය. ඒ ප්‍රේතිය දැක තිස්සා නම් ස්ත්‍රිය.

35. නිර්වස්ත්‍ර වූ විරූප වූ ඉතා බියකරු දැකුම් ඇති රූපයකින් යුතු ව. දුගඳ වූ, කුණුගඳ හමන ශරීරයකින් යුතු ව, හාත්පස නිල මැස්සන්ගෙන් ගැවසී ගති, මෙතැන සිටින්නා වූ තී කවරී ද?

36. පෙර ජන්මයේ මම මත්තා නම් වීමි. ඔබ තිස්සා නම් වූවා ය. ඔබගේ සම හිමියා ඇත්තේ වීමි. පව්කම් කොට මේ මිනිස් ලොවින් ප්‍රේත ලෝකයට ගියෙමි.

එහි **අහං මත්තා තුවං තිස්සා** - මම මත්තා නම් වීමි ඔබ තිස්සා ය. **පුරෙ** - පෙර ආත්ම භාවයෙහි - **තෙ** - යනු ඔබගේ ස්වාමියාගේ සම බිරිඳ (සපත්නී) වූයෙමි. යන අර්ථයි. නැවත තිස්සා විචාළා ය.

37. කයින් වචනයෙන් සිතින් කවර අකුසල කර්මයක් කළේ ද? කවර නම් කවර නම් කර්මය විපාකයක් හේතුවෙන් ප්‍රේත ලෝකයට ගියේ ද? යන ගාථාවෙන් කරන ලද කර්මය විචාළා ය. නැවත මිත්තා -

38. ක්‍රෝධ ඇත්තියක් ව ද, ඵරුෂ බස් කියන්නියක් ව ද, ඊර්ෂ්‍යා කරන්නියක් ව ද මසුරු තැනැත්තියක් ව ද, කෛරාටික පැවතුම් ඇත්තියක් ව ද විසුයෙමි. මම නිරර්ථක වචන කියා ප්‍රේත ලෝකයෙහි උපත ලැබීමි.

එහි **චණ්ඩී** - ක්‍රෝධ ඇත්තී, **ඵරුසා** - ඵරුස වචන - **ආසිං** - කියන්නියක් වූයෙමි. **තාහං** ඒ මම. **දුබ්භාසිතං** - නරක වචන - නිරර්ථක වචන, මෙයින් මතු වචන හා ප්‍රති වචන වශයෙන් ගාථා පැවැත් වී ය.

39. යම්සේ තී ක්‍රෝධ කරන්නියක් වී ද? ඒ සියල්ල මමත් දනිමි. තිගෙන් අනිකක් විචාරමි. කවර කර්මයක් හේතු කොට ගෙන කසල පස් වලින් සිරුර ගැවසුනේ වේ ද?

40. තී ඉස් සෝදා නහා පිරිසිදු ඇඳුම් ඇඳ ලස්සණට සැරසුනා ය. මම ද ඔබට වඩා වැඩියෙන් අලංකාර ඉතා (ලස්සනට සැරසුනේ වෙමි.)

41. මා බලා සිටිය දී ම ස්වාමියා සමග කථාකළා ය. ඒ දුටු මගේ හිත ඊර්ෂ්‍යාවෙන් පරිපීඩිත ක්‍රෝධය උපන්නේ ය.

42. එහෙයින් කුණු පස් ගෙන තිට පිටුපසින් සිට තිගේ ඔළුවේ සිට දැමීමි. ඒ අකුසල කර්ම විපාකයෙන් කසළ පස්වලින් ගැවසුණු ශරීර ඇත්තියක් වීමි.

43. ඒ සියල්ල මම දනිමි. තිගෙන් අනිකක් විචාරමි. කවර හේතුවක් නිසා කැසිම් රෝගයකින් පෙළෙන්නේ ද?

44. බෙහෙත් ගෙනෙන්නට අපි දෙදෙන වනයට ගියෙමු. තී බෙහෙත් ගෙන ආවෙහිය. මම කසඹිලියා ගෙඩි ගෙනයෙමි.

45. තොපට නො පෙනෙන්නට ඒ කහඹිලියා ගෙඩි තිගේ ඇඳේ හාත්පස විසුරුවා දැමීමි ඒ අකුසල කර්මයෙන් විපාක හේතුවෙන් කැසීම් රෝගයෙන් පෙළෙමි.

46. ඒ සියල්ල මම දනිමි. අනෙක් කරුණක් අසමි. ඔබ නග්න වූයේ, නිර්වස්ත්‍ර වූයේ කවර අකුශල කර්මයකින් ද,

47. ඤාතීන්ගේ මිත්‍රයන් ගේ සමාගමක් විය. සැමියා සමග තී එහි යන්ට සැරසුනා ය. මට එහි ආරාධනාවක් නොවී ය.

48. ඒ උත්සවයට තිට ඇඳන් යාමට තිබූ වස්ත්‍රයක් තී නොදැනුවත්ම මම සොරා ගතිමි. ඒ අකුසල කර්මයාගේ විපාකයෙන් මම නිර්වස්ත්‍ර වූයෙමි.

49. තී මගේ වස්ත්‍රයක් සොරාගත් බව ආදී සියල්ල මම දනිමි. වෙනත් කරුණක් විචාරමි. තී දුගඳ හමන්නී කිනම් අකුසල කර්මය කින් ද?

50. තීගේ සුවඳ ද්‍රව්‍යයන් ද, මා හැගි වූ මල් මාලාවක් ද, තිගේ සුවඳ විලෙවුන් ද අශුචි වලෙක මම දැමුවෙමි. ඒ පාප කර්මය මා විසින් කරන ලදී.

51. ඒ අකුසල කර්මය හේතු කොට ගෙන දුගඳ හමන සිරුරක් ඇත්තියක් වීමි.

52. අනිකක් ද තිගෙන් විචාරමි. කවර හේතුවකින් දුප්පත් වූයේ ද? මේ ගෙයි යම් ධනයක් තිබුනේ නම් එය අප දෙදෙනාට සමාන විය.

53. දාන වස්තුව (ධනය) ගෙදර ඇති කල්හි තමන්ට පිහිට පිණිස පිනක් නො කළේ ය. ඒ කර්ම විපාකයෙන් මම දුප්පත් වීමි.

54. එකල්හිම තී මට ඒ දවස්වලට මෙසේ කීය. පව්කම් සේවනය කිරීමෙන් සුගතියකට යාම ලෙහෙසි නො වේ.

55. තී මා නො මගින් නොවැළකුවෙහි ය. මට ඊර්ෂ්‍යා කළා ය. වෙනස්කම් කළා ය. ළාමක වූ පාප කර්මයන්ගේ දරුණු වූ විපාකයක් වේ ද එය දැන් බලව.

56. තිගේ වැඩකාරියන් සහ ආභරණ වූයේ ද ඒ ආභරණත් මෙහෙකාරියෝත් දැන් වෙනත් අය පරිභෝග කෙරෙති. සම්පත් වූ කලි සදා කාලික නො වේ.

57. දැන් පුතාගේ පියා සල්පිලෙන් ගෙදර එන්නේ ය. තිට කිසිවක් දෙන්නේ නම් යෙහෙක ඔහු ගෙදර එන තෙක් කොහේවත් නො ගොස් රැඳී සිටින්න.

58. මම නිර්වස්ත්‍ර වූ, විරූපී වූ, ඉල්පීගිය නහර වැල් ඇති, අයෙක් වෙමි. මෙය ස්ත්‍රීන්ට ලජ්ජාවට කාරණයෙකි. එ නිසා දරුවාගේ පියා මා නො දකීවා.

59. එසේ නම් යමක් හේතුකොට ගෙන තී දුකින් මිදී සමෘද්ධියට පත් වන්නී ද? සුවපත් වන්නී ද? එබඳු වූ කුමක් තොපට දෙම් ද? කිනම් උපකාරයක් කරන්නෙම්ද?

60. භික්ෂු සඞ්ඝයා වෙනුවෙන් සතර නමක් ද, පුද්ගලයන් හැටියට සතර නමක් ද, භික්ෂූන් වහන්සේලා අට නමක් සඳහා දානයක් දී ඒ පින් මට අනුමෝදන් කරනු මැනවි.

61. එකල්හි මම දුකින් මිදී සමෘද්ධියට පත් වන්නෙමි. සියලු කාමයන්ගෙන් සම්පූර්ණ වන්නෙමි. එය මැනැවැ යි ඇය පිළිගෙන - භික්ෂූන් අට නමක් වඩමවා දානයක් දුන්නී ය.

62. වස්ත්‍රයක් රෙදිපිළි ද පූජා කොට ඇයට ඒ පින් අනුමෝදන් කළා ය. ඒ පින් පෙත් එළ වූ කල්හි ම විපාකයන් පහළ විය.

63. මේ දක්ෂිණා වේ ප්‍රතිඵල වශයෙන් දිව්‍ය භෝජන සමාන වූ ආහාර ද පැන් ද, ඇයට පහළ විය. ඉන්පසු ව ඈ පිරිසිදු වූවා උතුම් කසීසළු දරන්නියක් මෙන් දිව්‍ය වස්ත්‍ර හැඳ පෙරවූවා ය.

64. විසිතුරු වූ වස්ත්‍රාභරණයන් ගෙන් සැරසී. සපත්නී (තිස්සා) වෙත එළඹියා ය. ඉතා විශිෂ්ඨ වූ ශරීර වර්ණයෙන් ප්‍රදේශය බබළවමින් සිටින්නී ය.

65. ඕසධී තාරකාව මෙන් සියලු දිසාවන් බබළවන මෙබඳු ශරීරයක් තිට කවර කුශල කර්මයකින් ලැබුනේ ද? කවර හේතුවකින් ඔබට සියල්ල සමෘද්ධ වන්නේ ද? ප්‍රිය වූ යම් සම්පතක් වේ ද ඒ සියල්ල ඔබට පහළ වේ.

66. මහානුභාව වූ දෙවඟන ! ඔබෙන් මෙය විචාරමි. මෙ පරිද්දෙන් දිලිසෙන, වර්ණවත් වූ ශරීරයක් ලබන්න මිනිසත් බවෙහි දී ඔබ කිනම් කුසල කර්මයක් කළෙහි ද? ඔබගේ වර්ණයෙන් සියළු දිසාවන් බැබළෙයි.

67. එක ම අයෙක් සැමියා කොට සිටි මම මත්තා ය. ඔබ තිස්සා ය. පෙර කරන ලද අකුසල කර්ම නිසා මම ප්‍රේත ලෝකයේ උපන්නෙමි.

68. නැගණිය තී විසින් දෙන ලද දානමය පින්කම හේතුකොට ගෙන, බිය නැති ව සතුටුවෙමි. සියලු නෑයන් සමගින් බොහෝ කාලයක් ජීවත් වෙව.

69. සුන්දරිය ලෝභ ද්වේෂ සහිත වූ මසුරු මලය දුරුකොට, මෙහි දී ධර්මයේ හැසිර දන් දී සෝක රහිත වූ, රජස් නැති, දිව්‍යස්ථානය වූ, වයසෙහි පවත්නවුන්ට වාසස්ථාන වූ, දෙව් ලොවට නින්දා නැති ව පැමිණෙව.

එහි **සබ්බං අහම්පි ජානාමි යථා ත්වං චණ්ඩිකා අහු** - ඊර්ෂ්‍යාවෙන් ද, ඵරුස වචන කියමින් ද, සිටි ඔබ විසින් කියන ලද සියලු දේ මම දනිමි. ක්‍රෝධයෙන් ද, ඵරුස වචන කියමින් ද. ඊර්ෂ්‍යාවෙන් ද, මසුරු බවින් ද, කෛරාටික කමින් ද යුක්ත වූයේ ය. **අඤ්ඤඤ්ච වො තං පුච්ඡාමි** - අනෙක් කරුණක් ඔබගෙන් දූන් විමසමි. **කෙනාසි පංසු කුණ්ඨිතා** - කවර කර්මයකින් කසළ පස්වලින් ආකීර්ණ වී සිටින්නේ ද? මුළු සිරුර පුරා පස් විසිරි ඇත යන අර්ථයි. **සීසං නහාතා** - හිස සහිත නහා - **අධිමත්තං** - අධිකතර **සමලඞ්කත තරා** - මනාකොට, වැඩියක්කොට අලඞ්කාරව සැරසුනි, **අධිමත්තා** යනු ද ඒ, අතිශයින් මත් වී, මානයෙන් මදයෙන් මත් වී, මාන්නයෙන් පෙළී යන අත්‍ථයි. **තයා** යුෂ්මතිය, **සාමිකෙන සමන්තයී** - ස්වාමියා සමග සුවදුක් ආගිය තොරතුරු ආදිය කථා කළා ය. **බජ්ජසි කච්ඡුයා** - කැසීම් රෝගයෙන් කසන්නේ ය අර්ථයි. **භෙසජ්ජහාරී** - බෙහෙත් සොයන්නේ ඖෂධ හාරන්නී, **උභයො** - දෙදෙනා ඔබ ද මා ද යන අර්ථයි. **වනං** යනු - කැලය **ත්වංවභෙසජ්ජ මාහරි** - ඔබ වෙදුන් විසින් කියන ලද පරිදි තමන්ට උපකාර වන්නාවූ බෙහෙත් ගෙන ආවා ය. **අහම්පි කපි**

**කචඡුනො** - මම වනාහි දුක් ස්පර්ශ ගෙන දෙන්නා වූ කහඹිලියා ගෙඩි ගෙනාවෙමි. කහඹිලියා තමන් සැඟවීයයි කිය යි. එහෙයින් කහඹිලියා තමන් විසින් ම සඟවා ගෙන ආ බව කියයි. **සෙය්‍යං ත්‍යාහං සමොකිරි** - තෙපි නිදා ගන්නා වූ සයනයෙහි මම කහඹිලියා කොළ සහ ගෙඩි හැම තැන ම විසිරවීමි. **සහායානං** - මිත්‍රයන්ගේ **සමයො** - එක් රැස්වීම, **ඤාතීනං** - බන්ධු වරයින්ගේ නෑයින්ගේ, **සමිති** - රැස්වීම්, එකතුවීම, **ආමන්තිතා** - මඬගල සම්මත වසයෙන් ආරාධනා කිරීම, **සසාමිති** - සපත්නිය සහ ස්වාමී පුරුෂයා - **නො ච ඛො අහං** - මම ආරාධනාවක් නො ලද්දේ වෙමි. **දුස්සන්ත්‍යාහං** - මම තොපගේ සාරියක් - **අනුපාදිං** - සොර සිතින් ගෙන සැඟවීමි - **පච්ච ගඝං** - අළුත් වටිනා වූ (මහාර්ග වූ) **අතාරෙසිං** - බහාලීමි, ගුථගන්ධිනී - අසුචි ගඳ හමන්නේ ය. **යං ගෙහෙවිජ්ජතෙ ධනං** - මේ ගෙදරට යම්කිසි ධනයක් ලැබී ද එය ඔබට ද මට ද දෙදෙනාට ම සමාන විය. සමසේ බෙදීම් වූයේ ය. **සනෙනසු** - දකින්නාවූම **දීපං** - පිහිටියේ ය. පින්කම් සඳහා කියයි. මෙසේ ඒ ප්‍රේතී තොමෝ තිස්සා විසින් විචාරණ ලද අර්ථය ප්‍රකාශ කරත් **තදෙවමං ත්වන්ති** ආදිය කීයේ ය.

එහි **තදෙව** යනු එකල්හි මම මනුෂ්‍යාත්ම භාවයේ සිටි කාලයෙහි ම, **තථෙවා** කියා ද පාඨයකි. යම් සේ මේ කාලයෙහි මෙසේ උපන්නෙමි යන අර්ථයි. **මං** තමන් දක්වයි. **ත්වං** - යනු තිස්සා දක්වයි. **අවච** - කීවා ය. යම් සේ එය දැක්වීමට කීවේ ද? **පාපකම්මං** - අතීතය කියන ලදී. **පාප කම්මානි** - ඔබ පාප කර්මයන් ම කළෙහි ය. පච්කම්වලින් වනාහි යහපත් ප්‍රතිවිපාක නො ලබයි. ඉක්බිති අයහපත් ප්‍රති විපාකම ලැබෙයි. යම් සේ මම පෙර මෙසේ කීවේ ද? අවවාද දුන්නේ ද එය එසේම කියයි. එය අසා තිස්සා **වාමතො මං ත්වං පචෙචසි** " ආදී වශයෙන් ගාථා කීහ.

එහි **වාම තො මං ත්වං පචෙචසි** - විරුද්ධ වසයෙන් ඔබ මා අවබෝධ කළෙහි. ඔබ හිතෛෂීව කීදේ පැසසිය යුතු කරුණක් කොට නො ගත්තෙහි. **මං උසූයසි.** මට ඊර්ෂ්‍යා කළා ය. මා නො ඉවසුවා ය. **පස්ස පාපාන කම්මානං විපාකො හොති යාදිසො** - පාප කර්මයන්ගේ විපාකය යම් සේ භයානක වේ ද? එය ප්‍රත්‍යක්ෂ වශයෙන් දකිම්යි කියයි. **තෙචඤ්ඤෙ පරිවාරෙන්ති** ඔබගේ ගෙදර දාසියෝ, (ඔබ විසින් පෙර පරිහරණය කරන ලද ආභරණයෝ ද) ආභරණ ද, ඔබ විසින් පෙර පරිහරණය කරන ලද අනෙක් දේ වෙනත් පිරිවර ජනයා ද පරිභෝග කරත්. මෙහි ලිඞ්ග විපර්යාසය කියන ලදී. **න හොගා හොන්ති සස්සතා** - වස්තු සම්පත් ස්ථිර

නො වන්නේ ය. අනිස්තිරය - එක් තැනක නො පිහිටයි - මියයන විට හැරදමා යයි. එහෙයින් ඒ පිළිබඳ ව ඊර්ෂ්‍යාව මසුරුවීම ආදිය නො කළයුතු ය. **ඉදානි භූතස්ස පිතා** - දැන් භූතයාගේ, මගේ පුතාගේ පියා කෙළෙඹියා, **ආපණා** - වෙළඳසැලින් ගෙදර එන්නේ ය. **අප්පෙව තෙ දදෙකිඤ්චි** - කෙළෙඹියා, ගෙට ආවායින් පසුව නුඹට දිය යුතු යම් වස්තුවක් දෙනු ඇත. **මාසු තාව ඉතො අගා** - මේ ගෙදර පිටුපසින් ඉවතට නො යන්නැ යි අනුකම්පාවෙන් කීවා ය. එය අසා ප්‍රේතිය තමාගේ අදහස ප්‍රකාශ කරමින් "නග්ගා දුබ්බණ්ණ රූපා මහි" ආදී ගාථාව කීහ.

එහි **කොපීන මෙතං ඉත්ථීනං** මේ නග්න වූ දුර්වර්ණ වූ කෘශ වූ රූපාදියෙන් යුක්ත වූ ස්ත්‍රීන්ගේ නග්න බව සිටීම වළක්වයි. **මාං භූතා පිතාද්දසා** එහෙයින් භූතයා ගේ පියා කෙළඹියා මා නො දකීවා. ලජ්ජාවෙන් යුක්තව කීය. එය අසා හටගත් අනුකම්පාව දයාව ඇති ව **හන්දකිං තාහං දම්මී** - **යන** ගාථාව **කී** ය.

එහි හන්දා - උද්‍යොගාත්‍ථියෙහි නිපාතයි. **කිනතාහං දම්මි** - මම ඔබට කුමක් දෙම් ද, වස්ත්‍ර ද නැත්නම් ආහාර ද, **කිං වා තෙධ කරොම්‍යහ** මේ කාලයෙ හි කුමක් හෝ අන්‍ය වූ උපකාරයක් කරන්නෙමි. එය අසා ප්‍රේතිය, **චත්තාරො භික්ඛු සඞ්ඝතො** ආදී ගාථා කීහ.

එහි **චත්තාරො භික්ඛු සඞ්ඝතො චත්තාරො පුන පුග්ගලා** - භික්ෂූන් වහන්සේලා සඞ්ඝයා වසයෙන් සතර නමක් ද පුද්ගලයන් වසයෙන් සතර නමක් ද මෙසේ භික්ෂූන් අට නමක් ගෙන්වා කැමති පරිද්දෙන් වළඳවා - මා උදෙසා මට පින් පෙත් දෙනු මැනවි. **තදාහං සුඛිතං හෙස්සං** - යම් කලෙක ඒ දක්ෂිණාව මට උදෙසයි ද? එකල්හි මම සුවපත් වී සියළු කාමයන්ගෙන් සමෘද්ධ වන්නෙමි.

ඒ අසා "තිස්සා" ඒ කාරණය තමන්ගේ ස්වාමියාට කියා, දෙවන දවසෙහි භික්ෂූන් අට නමක් වළඳවා, ඇයට පිං අනුමෝදන් කළහ. ඕ තොමෝ එකෙණෙහි ම දිව්‍ය සම්පත් ලැබ නැවත තිස්සා වෙත එළඹියා ය. එහි අර්ථය දක්වීමට සංගීති කාරකයෝ **සාධුතිසා පටිස්සුත්වා** ආදී ගාථා කීහ. "තිස්සා" වෙත එළඹ සිටියේ ම තිස්සා නැවත, **අභික්කන්තෙන න වණ්ණෙන** ආදී ගාථා තුනකින් විචාළා හ. **අහම්මත්තානි** - ආදී ගාථා තමන්ට කියා **චිරංජීවාහි ආදී** ගාථාවලින් ඇයට අනුමෙවෙනි කතා කොට, **ඉධ ධම්මං චරිත්වා** - ආදී ගාථාවලින් අවවාද දුන්නී ය.

එහි **තව දිනෙහා** - ඔබ විසින් දෙන ලද, **අසොකං විරජංමානං** සෝකභාවයෝ නිශ්ශෝක වී, සෝක රහිත වූ වහඳලි (දහඩිය) නැති බැවින් රජස් සහිත වූ දෙව් ලොව, මේ සියල්ල දිව්‍ය ලෝකය සඳහා කියන ලදී. **ආවාසං** නිවාස ස්ථානය. **වසවත්තීනං** - දිව්‍යමය ආධිපත්‍යයෙන් තමා වශයෙහි පවත්වන්නන්ට වාසභූමි වූ, **සමූලං** - ලෝභ ද්වෙෂ, සහිත මසුරු බව මූල නම් වේ. **අනින්දිතා** නින්දා නොකොට පැසසීය.

ප්‍රසංසා කටයුතු - **සගගමුපෙහි ඨානං** - රූපාදී පඤ්චකාම සම්පත්තියෙන් අග්‍රහෙයින් ස්වර්ග යයි නම් ලද, දෙව්ලොව පැමිණෙව, සුගතියට අරමුණු කොට යවයි. (ස්වර්ග පරායන) යන අර්ථය. සෙස්ස කියන ලද්දේ ම ය.

ඉක්බිති තිස්සා මේ ප්‍රවෘත්තිය කෙළෙඹියාට කියන ලදී. කෙළෙඹියා භික්ෂූන්ට කීහ. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට කීහ. භාග්‍යවතුන් වහන්සේ එය අර්ථෝත්පත්ති කොට ගෙන පැමිණි පිරිසට මේ ධර්මය දේශනා කළ සේක. එය ඇසූ මහාජනයා සංවේගයට පත් ව මසුරුමල හැරපියා දාන ශීලා දියෙහි නිරත වී සුගතියට ගමන් ඇරඹී ය.

මත්තා පෙත වත්‍ථු වර්ණනාව
නිමියේ ය.

—— // ——

## 2-4

"කාළි දුබ්බණ්ණ රූපා" යන මේ ප්‍රේතවස්තු දේශනාව ශාස්තෲන් වහන්සේ ජේතවන විහාරයෙහි වැඩ වාසය කරන්නේ, "නන්දා" නම් ප්‍රේතියක් අරබයා දේශනා කළ සේක. සැවැත් නුවරට නුදුරෙහි එක්තරා ගමක නන්දසේන නම් උපාසකයෙක් විසී ය. හේ ශ්‍රද්ධාවත් හ, ප්‍රසන්නය හ, ඔහුගේ භාර්යාව නන්දා නම් ඈ සැදැහැයෙන් තොර ය. අප්‍රසන්න පැවතුම් ඇත්තී ය. මැසිරි ය, සැඩය, ඵරුස වචන කියයි. ස්වාමියාට අගෞරව කරන්නීය. නැන්දනියට සෙරි ය කියා ආක්‍රෝශ කරන්නී ය. පරිභව කරන්නී ය. ඕ කෙටි කලකින් මිය ගොස් ඒ ගමට නුදුරෙහි හැසිරෙන ප්‍රේතියක් වී ප්‍රේත යෝනියෙහි උපන්නී ය. එක් දවසක් නන්දසේන උපාසකයා ගමින් නික්ම යද්දී නුදුරෙහි දී ම ලඟම වූ තැනක සිට තමන් දැක්වූවා ය හෙතෙම ඇය දැක,

කළු වූ දුර්වර්ණ වූ ශරීර ඇති, රළු දේහයක් ඇති, පිඟුවන් ඇස් ඇති, කළු දත් ඇති, තී මනුෂ්‍ය ස්ත්‍රියක් යයි මම නො සිතමි.

යන ගථාව කීහ.

එහි **කාලී** - කළු පැහැය. දැවුණු අඟුරක් සේ වර්ණ වූයේ ය, **ඵරුසා** - ගොරෝසු ශරීර ඇති, **භීරු දස්සනා** බිය උපදවන දැකුම් ඇති, සර්පයකු සේ බියකරු **භීරුදස්සකා** - යනු ද පාඨයකි. දුර්වර්ණ වූ දැකුම් ඇත්තී, නපුරු දැකීම් ඇති, දැකීමට නුසුදුසු යන අර්ථයි. **පිඞ්ගලා** - ගිනිදළු පැහැ ඇස් ඇත්තී, **කළාරා** - කළු පැහැ ගැන් වූ දත් ඇති, **න තමම ඤ්ඤාමි මානුසී** - මම ඔබ මිනිසකු යයි නො හඟිමි. ප්‍රේතියක් යයි සිතමි. යන අදහසයි. එය අසා ප්‍රේතිය තමන් ගැන පවසන්නේ, මේ ගාථාව කිවා ය.

නන්දසේනය, මම පෙර ජාතියෙහි නුඹේ භාර්යාව වූ නන්දා වෙමි. පව්කම් කොට මිනිස් ලොවින් චුත ව ප්‍රේත ලෝකයට පැමිණියේ වෙමි.

එහි, **අහං නන්දානන්දසෙනා** - ස්වාමී වූ නන්දසේනයඃ මම නන්දා වෙමි, **භරියා තෙ පුරෙ අහුං** - (මගේ) පෙර ජාතියෙහි ඔබ ගේ භාර්යාව වීමි. එයින් මතු

ඔබ කයින්, වචනයෙන්, මනසින්, කිනම් අකුසලයක් කළේ ද? කවර නම් කර්මයක විපාකයෙන් මෙසේ ප්‍රේත ලෝකයෙහි උපන්නේ ද?

එම උපාසකයාගේ විචාරීමට ඕ මේ ගාථාවලින් පිළිතුරු දුන්නා ය.

මම ක්‍රෝධයෙන් යුක්ත වීමි. රළු බස් කියන්නියක් වීමි. නුඹ කෙරෙහි ගරු නොකරන්නියක් වීමි, මම ඒ නිරර්ථක ක්‍රියාවන් නිසා මිනිස් ලොවින් ප්‍රේත අපායට පැමිණියෙමි. නැවත ඒ උපාසකයා කියන්නේ

එබැවින් තිට උතුරු සළුව දෙමි. මේ වස්ත්‍රය හැඳ ගනුව, මේ වස්ත්‍රය හැඳගෙන එව, තී ගෙදරට පමුණු වන්නෙමි.

වස්ත්‍ර ද ආහාර පාන ද ගෙට ගිය පසු තිට ලැබේ. තිගේ පුතුන් ද, තිගේ යෙහෙළියන් ද දැකීමට පුළුවන.

එවිට ඈ -

ඔබ විසින් අතින් අතට දෙන ලද්දක් මට නො ලැබෙයි. පහ වූ කෙලෙස් ඇති, බහුශ්‍රැත වූ සීල සම්පන්න වූ භික්ෂූන් වඩමවා.

ආහාර පානාදියෙන් සන්තර්පනය කරව, (භික්ෂූන්ට පූජා කරව) එයින් ලැබෙන පින් මට අනුමෝදන් කරව, එකල්හි මම සියලු කාමයෙන් සමෘද්ධ ව සුවපත් වන්නෙමි. එයිනික්බිති ව,

හෙතෙම මැනවැයි පිළිගෙන මහත් වූ දන් පැවැත්වී ය. ආහාර පාන වර්ග ද යුතු දේ ද රෙදි පිළි ද සෙනසුනු ද

ඡත්‍ර ද සුවඳ මල් මාලා ද, නන් වැදෑරුම් පාවහන් ද, පිළියෙළ කොට වීතරාගී වූ බහුශ්‍රැත වූ සුපේශල වූ සිල්වත් වූ, භික්ෂූන් වැඩමවා පූජාකොට භික්ෂූන් සතප්පවා ඒ කුශලයන් අනුමෝදන් කළේ ය.

එසේ පින් උදෙසූ විටම ඇයට විපාක ලැබිණ. ආහාර පාන ආදීය දන් දීමේ විපාක ඵලය මෙසේ වේ.

එයින් පසු ව නැහැමෙන් පිරිසිදු වූ ශරීර ඇති ව, හඳනා ලද පිරිසිදු වස්ත්‍ර ඇති ව, කසී සළුවලටත් වඩා උතුම් වස්ත්‍ර හැඳ, සැමියා වෙත එළඹීයා ය. සඞ්ගීති කාරකයන් විසින් ගාථා සතරක් කියන ලදී.

පින්වත් දෙව්දුව ! යම් බඳු වූ තී බැබලෙන්නා වූ ශරීර වර්ණයෙන් ඕසධී තරුව මෙන් සියළු දිසාවන් බබුළුවමින් සිටින්නෙහි ය.

කවර හේතුවකින් තීගේ මෙබඳු වූ ශරීර වර්ණයක් ඇති වී ද? කවර කුශලා නිසංශයකින් මෙබඳු යහපත් පල ඇතිවී ද? තිගේ සිත් පිනවන මේ භෝග සම්පත් කෙසේ උපදී ද?

මහානුභාව දෙවිය ! තිගෙන් විචාරමි. මිනිස් ජිවිතයේ දී කිනම් පිනක් කරන ලද්දේ ද කවර කුශල හේතුවකින් මෙසේ දිලිසෙන ආනු භාව ඇත්තී ද? තිගේ ශරීර වර්ණ ය සියළු දිසාවන් බබුළුවයි.

නන්දසේනය! (මගේ) පූර්ව ජාතියෙහි ඔබගේ බිරිඳ වූ නන්දා මම වෙමි. පාප කර්මයන් කොට ප්‍රේත ලෝකයට ආවෙමි.

ඔබ විසින් දෙන ලද දානයෙන් දුන් කුසල් අනුමෝදන් ව බිය නැත්තෙක් වීමි. ගෘහපතිය ඔබ සියළු ඥාතීන් සමග බොහෝ කාලයක් ජීවත් වේවා!

ගෘහපතිය! ලෝභ ද්වේශ ආදී මසුරු මල දුරුකොට මෙහි දී ධර්මයෙහි හැසිර දන් දී ශෝක රහිත වූ රජස් නැත්තා වූ, තමා වසයෙහි පවත්නවුන්ට වාසස්ථාන වූ, ස්වර්ගයයි කියන ලද දෙව් ලොවට නින්දා නැතිව පැමිණෙව.

උපාසකයාට ප්‍රේතිය විසින් කියන ලද පිළිතුරු ගාථා ය.

එහි දානංවිපුල මාකිරි - දක්ෂිණාර්හයන් නමැති ක්ෂේත්‍රයේ, දෙය්‍ය ධර්ම නමැති බීජ වපුරන්නාක් මෙන් මහා දන් පැවැත්වී ය. ඉතිරිය අනෙක් වස්තු සමානය, මෙසේ ඕ තොමෝ තමන්ගේ දිව්‍ය සම්පත්තිය හා එයට අදාළ කරුණු නන්දසේනට පහදා දී තමන් වසන තැනටම ගියා ය. උපාසක තෙමේ ඒ ප්‍රවෘත්තිය භික්ෂූන්ට දැන්වී ය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට දැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ එය අර්ථෝත්පත්තිකොට ගෙන පැමිණි සිටි පිරිසට ධර්ම දේශනා කළහ. ඒ දේශනා තොමෝ මහා ජනයාට සාර්ථක වූයේ ය.

**නන්දා ප්‍රේත වස්තු වර්ණනාව නිමියේ ය.**

—//—

## 2-5

**"අලඞ්කතො මට්ටකුණ්ඩලී"** මෙම කථා වස්තුව ශාස්තෘන් වහන්සේ ජේතවනා රාමයෙහි වැඩ වාසය කරන කල්හි මට්ටකුණ්ඩලී දේවපුත්‍රයා අරභයා වදාළ සේක.

එහි කිවයුතු යමක් වේ නම් එය පරමත්ථ දීපනී නම් වූ විමාන වත්ථු වණ්ණනාවේ කියන ලද්දේ ම ය. එහෙයින් එහි කියන ලද ආකාරයෙන් දත යුතු මෙහි ද මට්ටකුණ්ඩලී දේව පුත්‍රයාගේ විමාන දේවතා භාවය ආදිය ද විමාන වස්තු පාළියෙහි සඞ්ග්‍රහවීය. යම්හෙයකින් ඒ දේව පුත්‍රයා අදින්න පුබ්බක බ්‍රාහ්මණයාගේ පුත්‍ර ශෝකය උප යෝගී කොටගෙන සොහොනට ගොස්, ආදාහන කල තැනට කැටුව ගොස්, හඬන්නහුගේ ශෝකය පහකිරීම සඳහා තමන්ගේ දේවරූපය ප්‍රදර්ශනය කරවා, රත් සඳුනෙන් ආලේපකළ ගාත්‍රා ඇති ව දෙ අත් පිටුපසට බැදගෙන හඬන දුකින් මැඩුණු ප්‍රේතයකු මෙන් තමන් දැක්වීය. මනුෂ්‍යාත්ම භාවයෙන් පහවී ප්‍රේත ආත්ම භාවයක් ලැබීයයි ඒ කථාව ප්‍රේත වස්තු පාළියෙහි ද සංග්‍රහ කර දක්වන ලද්දේ යයි දත යුතු යි.

මට කොඩොල් ප්‍රේත වත්‍ථු වර්ණනාව
නිමියේ ය.

—//—

## 2-6

" උට්ඨෙහි කණ්හ කිං සෙසි " - මේ කථා වස්තුව ශාස්තෲන් වහන්සේ ජේතවන විහාරයෙහි වැඩ වසන්නේ එක්තරා පුතෙකු මළ උපාසකයකු අරභයා වදාළ සේක. සැවැත් නුවර වැසි එක්තරා උපාසකයකු ගේ පුතෙක් කාලක්‍රියා කළහ. හෙතෙම එම ශෝකයෙන් මඩනා ලද්දේ ස්නානය නො කරයි. ආහාර නොගනියි. රැකියාවෙහි නො යෙදේ. බුද්ධෝපස්ථානය සඳහා නො යයි. හුදෙක් දරුව ! ප්‍රිය පුත්‍රය මා හැර කොහි ගියේ ද කියමින් වැළපේ. ශාස්තෲන් වහන්සේ උදෑසන කාලයේ ලොව දෙස බලන්නේ ඔහුට සෝවාන් ඵල ලැබීමට ඇති හේතු වාසනා දැක, දෙවන දවසේ භික්ෂු සංඝයා විසින් පිරිවරන ලදු ව සැවැත්පුර පිඩු පිණිස හැසිර, කරන ලද බත් කිස ඇත්තේ භික්ෂූන් පිටත් කර යවා ආනන්ද තෙරුන් දෙවැනියා කොට ගෙන ඒ උපාසකයාගේ ගෙදරට වැඩම වූහ. බුදුන් පැමිණි බව උපාසකයාට කීය. ඉක්බිති ගෙදර මිනිස්සු ගේ තුළ ආසන පණවා ශාස්තෲන් වහන්සේ වඩා හිඳුවා උපාසකයා අල්වාගෙන ශාෂ්තෲන් වහන්සේ සමීපයටආහ. එකත් පසෙක හුන් උපාසකයා දෙස බලා උපාසකය! පැරණි නුවණැත්තෝ පණ්ඩිතයන් ගේ කථාව අසා මළ දරුවා ගැන ශෝක නො කළාහු ය යි වදාරා ඔහු විසින් අයදින ලදු ව අතීත කථාව ගෙන හැර දැක්වීය.

යටගිය දවස ද්වාරතී නගරයේ දස බෑ රජ කෙනෙක් වූහ. වාසුදේව, බලදේව, චන්ද දේව, සූරිය දේව, අග්ගිදේව, වරුනදේව, අජ්ජුන, පජ්ජුන, ඝත පණ්ඩිත - අඞ්කුර යන මොව්හු වූහ. ඔවුන් අතුරෙන් වාසුදේව මහරජුගේපුතා කළුරිය කළේ ය. ඒ හේතුවෙන් රජු ශෝකයෙහි ගිලුනේ සියලු කාර්යයන් අත්හැර ඇඳක ඇදිලිබැඳගෙන විලාප කියමින් හොත්තේ ය. එකල ඝත පණ්ඩිත තෙමේ මෙසේ සිතීය. මා හැර වෙන කිසිවෙක් මගේ සහෝදරයාගේ ශෝකය අත්හරවන්නට සමර්ථ නො වේ. උපායකින් ශෝකය දුරු කරන්නෙමි යි, හෙතෙම උමතු වෙසක් ගෙන සාවෙකු මට දෙව සාවෙකු මට දෙව යි කියමින් අහස බලාගෙන මුළු නුවර හැසුරුණේ ය. ඝත පණ්ඩිත තෙමේ උමතු වුයේ යයි සියලු නුවර කැළඹීන. එකල රෝහණෙයය නම් ඇමතියා වාසුදේව රජු සමීපයට ගොස් ඔහු සමග කථාව ආරම්භ කරමින් මේ ගාථාව කී ය.

කෘෂ්ණ ගෝත්‍ර ඇති වාසුදේව රජ තුමනි! නැගිටිනු මැනවි. ඔබ නිදීමෙන් කවර (වැඩක් ද) අර්ථයක් ද? නුඹගේ හදවත වැනි වූ දකුණැස බඳු වූ ස්වකීය

සහෝදර වූ සත පණ්ඩිතයන්ගේ වාතය බලවත් වී සාවෙකු ඉල්ලමින් විලාප කිය යි. කේශව නම් වාසුදේවය නැගිට බලණු මැනවි. මේ ගාථාව කීහ.

එහි **කණ්හා** - වාසුදේවයන්ගේ ගෝත්‍ර නාමයෙන් අමතයි. **කො අත්‍ථො සුපිනෙන** - නිදීමෙන් තොපට කවර නම් වෘද්ධියක් වේ ද? **සකො භාතා** - එක කුස උපන් සහෝදරයා - **හදයං චක්ඛුං'ව දක්ඛිණං** - හදවතට ද දකුණු ඇසට ද සමාන වේ යන අර්ථයි. **කස්ස වාතා බලී යන්ති** - ඔහු ගේ වරින් වර උපදින්නා වූ උම්මාද වාතය බලවත් වී ඇත්තේ වැඩෙත්, ඔහු මැඩ පවත්වත් **සසං ජප්පති** - හාවෙකු මට දියව් යයි විලාප නගති. **කෙසවො** සෝභන කෙසේ ඇති බැවින් කේශව යයි ව්‍යවහාර කෙරේ, ඔහුගේ ඒ නමින් අමතයි. ඔහුගේ වචනය අසා යහනින් නැගිටින බව දක්වමින්, සම්බුද්ධ වූ ශාස්තෘන් වහන්සේ මේ ගාථාව වදාළහ.

කේශව නම් වූ වාසුදේව රජු ඒ රෝහිණෙය්‍ය ඇමතියාගේ වචනය අසා සහෝදර කැක්කුමෙන් පෙළන ලදු ව වෙවුලිමින් නැගී සිටියේ ය.

රජු නැගිට වහා පහයෙන් බැස සත පණ්ඩිතයා ළගට ගොස් දෙ අතින් ඔහු දැඩිකොට අල්ලා ගෙන, ඔහු සමග කථා කරන්නේ මේ ගාථා තුන කීහ.

කිමෙක් ද? උමතු වූවෙකු මෙන් මේ මුළු ද්වාරවතී නුවර සාවා සාවායයි කියමින් යයි ද විලාප දෙයි ද කෙබඳු සාවකු කැමති වන්නේ ද?

රනින් කළා වූ මිණියෙන් කළා වූ, ලෝහයෙන් කළා වූ, රිදියෙන් කළා වූ සක් සිළා පබළුවෙන් කළා වූ සාවෙකු නුඹට කරවන්නෙමි.

වනය ගොදුරු කොට වෙනත් සාවෝ කැලයෙහි වසති. එවුනුන් නුඹට ගෙනෙන්නෙමි. කෙබඳු සාවෙකු කැමති වෙයි ද?

මෙහි **උම්මත්තක රූපොවා** - පිස්සකු මෙන්, **කෙවලං** - සියලු, **ද්වාරකං** - ද්වාරවතී නගරයෙහි හැසිරෙන්නේ, **සසො සසො ති ලපසි** - සාවා සාවා කියා වැළපෙයි. **ලොහමයං** - තඹ ආදී ලෝහවලින් නිම වූ, **රූපියාමයං** - රිදීයෙන් නිමකළ - යමක් කැමැත්තේ නම් කියව ! කුමක් සඳහා ශෝක වෙයි ද? වෙනස් වූ කැලෑවෙහි වනය ගොදුරුකොට ඇති සාවෝ සිටිත් ඔවුන් ගෙන එම් ද? යහපත් මුව ඇත්ත! කැමති දෙයක් කියව! (ආදි වශයෙන්)

හාවෙකුගෙන් ප්‍රයෝජන ඇතැයි යන අදහසින් සාවෙකු ගෙන ඒමට පැවරුවේ ය.

එය අසා ඝත පණ්ඩිත තෙමේ, මේ අදහස කී ය.

කේශව නම් වාසු දේවය! පොළව ඇසුරු කොට ඇති යම් සාවෝ සිටිත් ද ඒ සාවුන් මම නො කැමැත්තෙමි. සඳමඩලෙන් සාවෙකු කැමති වෙමි. ඒ සාවා මට ගෙන දෙව!

එහි - ඔහරා - පහතට ගනුවඃ ඒ අසා රජු නිසැකයෙන් ම, අනිවාර්යයෙන් ම සහෝදරයා උම්මත්තකු වී යයි දොම්නසට පැමිණියේ,

ප්‍රිය මළණුවනි සඳමඩලෙහි සාවා කැමැත්තෙහි ය. නො පැතිය යුත්තක් පතයි. ඉතා මිහිරි ජීවිතය හරින්නෙහි ය. යන ගාථාව කීහ.

එහි ඤාතිං - බාල සහෝදරයාට අමතයි, මෙය ද අර්ථයකි. මගේ ප්‍රිය (සහෝදරයා) ඤාතියා යම් ඉතා මිහිරි වූ තමන්ගේ ජීවිතය ඔහු විසින් ම අත්හරියි සිතමි. කිසියම් නො පැතිය යුතු දෙයක් පතයි. ඝත පණ්ඩිත තෙමේ ද රජුගේ කථාව අසා නිසසල ව සිට, ඔබ සඳේ සාවා ඉල්ලා එය නො ලැබුනේ නම් මරණයට පත්වන්නේ යයි දනියි. කවර හෙයකින් මියගිය පුතා වෙනුවෙන් ශෝක කරයි. මෙහි අර්ථය නො වැටහේන්නේ ද?

කෘෂ්ණ ගෝත්‍රවත් මහරජ යම්සේ අනුන්ට අවවාද කෙරෙයි ද? මෙසේ දන්නෙහි නම් කවර හෙයකින් පෙර මළ පුතු සඳහා අදත් සෝකවන්නේ මන්ද?

එහි එවඤ්චෙ කණ්හ ජානාසි - කෘෂ්ණ නම් සහෝදර මහරජ තුමනි ! නො ලැබියහැකි වස්තුවක් නම් නො පැතිය යුතයි යන් න දන්නෙහි නම්, යථඤ්ඤං - මෙසේ දන්නේ නම් තමන් එය නො පිළිපදිමින් අනුන්ට අවවාද දෙන්නෙහි ද? **කසමා පුරෙ මතං පුත්තං** - කවර හෙයකින් මෙයින් සාර මසකට පෙර මියගියා පුතකු සිහිකරමින් ශෝක වන්නේ ය. යන අර්ථයි. මෙසේ මම ඇතුල්වීථියෙහි සිටිමින් ඇසට පෙනෙන දෙයක් පැතුවෙමි. එසේ තිබයදී ඔබ නො පෙනෙන දෙයක් පතමින් ශෝක කරයි. කියා ඔහුට ධර්ම දේශනා කරන්නේ,

උපන්නා වූ මගේ පුත්‍රයා නොමැරේවා යන යමක් මිනිසෙකු විසින් හෝ අමනුස්සයෙකු විසින් හෝ නො ලැබිය හැකි වේද? ඒ නො ලැබිය හැකි දේ කවර හේතුවකින් ලැබේ ද?

97. කෘෂ්ණය පරලොවට ගිය පුතෙකු සඳහා ශෝක කරයි ද? ඔහු නැවත පමුණුවා ගැනීමට මන්ත්‍ර ප්‍රයෝගයකින් හෝ, මූල බෙහෙත් බලයකින් හෝ, නානා විධ ඖෂධ වර්ගවලින් හෝ කෝටි සංඛ්‍යාත ධනයකින් හෝ නුපුළුවන් වන්නේ ම ය. යන ගාථා දෙ කීහ.

එහි "යං" යනු සහෝදරය! මෙසේ උපන්නා වූ මගේ පුත්‍රයා නො මැරේවා යන්න මනුෂ්‍යයකු විසින් හෝ, දෙවියෙකු විසින් හෝ, නො ලැබිය හැකිය. නුඹ නො ලැබිය හැකි දෙයක් පතයි. නො ලැබිය හැකි දෙය වනාහී නුඹ කොහෙන් ලබන්න ද? යන අදහසයි. මන්තා යන්ත්‍ර මන්ත්‍රා දී ගුරුකම්වලින් හෝ **මූල භෙසජ්ජා** - මූල බෙහත් වර්ගයකින්, **ඔසධෙ** නානාවිධ ඖෂධ යෝගවලින් **ධනෙන වා කෙළ සියගණනක්** ධනයෙන් හෝ, මෙසේ මැරුණු යම් කෙනෙකු සඳහා ශෝක කරයි ද ඔහු මේ කිසිම දේකින් නැවත පමුණුවා ගත නොහැක්කේ ය.

තව ද සත පණ්ඩිතයෝ සහෝදරය! මේ මරණය නම් ධනය හේතුකොට ගෙන හෝ ජාතිය හේතුකොට ගෙන හෝ, වලක්වාලිය නො හැක්කේ ම ය.

බොහෝ ධන ඇත්තා වූ ද, මහත් භෝග සම්පත් ඇත්තා වූ ද, සියලු රට ඇත්තා වූ, කෙළවරක් නැති ධන ධාන්‍ය ඇත්තා වූ යම් රජ කෙනෙක් වෙත් ද ඔව්හු ජාතිය නිමිත්තකොට ජරාමරණ රහිතයෝ නො වූහ.

ක්ෂත්‍රියයෝ ය. බ්‍රාහ්මණයෝ ය, වෛශ්‍යයෝ ය, ශුද්‍රයෝ ය, සැඩොල් පුස්වඩු ආදීහු ද, මෙයින් අන්‍යයෝ ද, ඔවුන් සියල්ලෝත් ජාතිය නිමිතිකොට අජරාමරණ වූවෝ නො වෙති.

බ්‍රහ්මයා විසින් කියන ලද හෝ සිතන ලද, සයාකාර වූ, වේදය හදාරත් ද කියවත් ද, හෝම පූජා ආදිය කරත් ද, ජප කෙරෙද්ද, විද්‍යාඥානයෙන් යුක්ත වූ අය ද සෙස්සෝ ද අජරාමර නුවූහ.

සන්සුන් ස්වභාව ඇති, සංයම සිත් ඇති, තපෝගුණ ඇති, භික්මුණු, යම් ඍෂීහූ වෙත් ද? රාගා දී පව් තවන්නා වූ යමෙක් වේ ද? ඔව්හු ද සුදුසු කාලයෙහි මේ ශරීරය හැර දමත්.

භාවනාවෙන් මඩනා ලද සිත් ඇති ව වාසය කරන්නා වූ කරන ලද නිම වූ කටයුතු ඇති, ආශ්‍රව රහිත වූවෝද කුශල කර්ම ක්ෂය කිරීමෙන් මේ ශරීරය හැර දමත්, මේ ගාථා පහකින් රජුට ධර්මය දේශනා කළේ ය.

එහි **මහද්ධනා** - නිධන්ගත කරන ලද මහා ධනස් කන්ධයක් ඇති බැවින් බහුධන නම් වේ. **මහාභොගා** දිව්‍ය සම්පත් සමාන වූ මහත් වූ භව භෝග සම්පත්තීන් ගෙන් අනූන වූ, **රට්ඨවන්තො** - මුළු රටට ප්‍රධානියා වූ, (රජ වූ) **පහූතධන ධඤ්ඤා** යෙ - තුන් හතර අවුරුද්දකට ප්‍රයෝජන ගත හැකි පිණිස තැන්පත් කළ තැබිය යුතු වූ නිතර වැය වන ධන ධාන්‍යයාගේ කෙළවරක් නැති ධන ධාන්‍ය ඇති. **තෙපි නො අජරාමරා** - මෙසේ ඔව්හු ද මහා සම්පත් ඇති මහා මන්ධාතු මහා සුදස්සන ආදී ක්ෂත්‍රිය රජවරු ද අජරාමර නුවූහ. අන් අය ද ඒකාන්තයෙන් මරණයට පත් වේ යන අර්ථයි. **එතෙ** - පෙර කියන ලද ක්ෂත්‍රිය රජවරු ද, **අඤ්ඤෙ** අතරක් නැති ව මෙසේ වර්ණනා භූත වූ "අම්බස්ථා" දීහු ද **ජාතියා** - තමන්ගේ ජාතිය නිමිතිකොට අජරාමර නුවූහ යන අර්ථයි. **මන්තං** දූනීම, **පරිවත්තෙනන්ති** - අනුව පෙරළමින් හෝම කරමින් ජපකරත්, **ජළඞ්ගං** - ශික්ෂා කල්ප නිරුක්ති ව්‍යාකරන, ජ්‍යොතිස, ඡන්දස්, යන අංග සයෙන් යුත්ත වූ, **බ්‍රහ්මචින්තිතං** බමුණන්ගේ ප්‍රයෝජනය සඳහා බ්‍රහ්මයා විසින් කියන ලද හෝ සිතන ලද, **විජ්ජාය** - බ්‍රහ්මයා සමාන විද්‍යාවෙන් සමන් විත වූවාහු, ඔව්හු ද අජරාමර නුවූයේ ය. යන අර්ථ යි. ඉසයො යාම නියාම හා පිළිකුල් හැඟීම් උපදවන සංෂීහූ - **සන්තා** - කය වචනයන්හි ශාන්ත ස්වභාව ඇති, **සඤ්ඤතත්තා** - රාග ද්වේෂ මෝහාදීන් ගෙන් සංයත වූ සිත් ඇති, කය තැවීම් ආදියෙන් තපස මොවුන්ට ඇත්තේනුයි තපස් වී වරු - නැවත **තපස්සිනො** - සංචාරකයෝ, මෙසේ තපස්කම්හි නියැළී ශරීරයෙන් විමෝක්ෂය ප්‍රාර්ථනා කරනු කැමැත්තෝ. නොහොත් - **ඉසයො** - අධිශීල ශික්ෂාදිය සොයන්නේ යන අර්ථයෙන් ඍෂි වූ, එම අර්ථයෙන් පාපධර්මයෙන් මුළුමනින් නැති කිරීමෙන් ශාන්ත වූ, එක් අරමුණෙක සිත පිහිටුවා ගැනීමෙන් සංයමය ට පැමිණි, සම්‍යක් ප්‍රධන් වීර්යයෙන් කෙලෙස් තැවූ තපස් වී වූ, හටගන්නා වූ රාගාදී කෙළෙස් මර්දනය කළ බැවින් තපස් වී යයි කියන ලදි. **භාවිතත්තා** - චතුසත්‍ය කර්මස්ථානයන්ගේ වඩන ලදසිත් ඇති.

මෙසේ සත පණ්ඩිතයන් විසින් ධර්මය දේශනා කළ කල්හි එය අසා පහවගිය සෝක නමැති හුල් ඇති, ප්‍රසන්න වූ සිත් ඇති මහරජු සත පන්ඩිතයන් පසසමින් ඉතිරි ගාථා කීවේ ය.

පුත්‍ර ශෝකයෙන් ආද්‍ර වූ මගේ සිත, ගින්නකට ගිතෙල් ඉසින කලක් මෙන් ද, දිය ඉස ගින්නක් නිවන්නාක් මෙන් ද මගේ සියලුම විඩාව නිවුයේ ය.

මගේ හෘදය නිඃශ්‍රිත වූ සෝක නමැති හුල උදුරා දැම්මේ ය, මගේ ශෝකය යමෙක් දුරු කළේ ද පුත්‍ර ශෝකය නැවත නූප දී.

හෘදයෙහි තිබූ ශෝක නමැති හුල උදුරා දැමූ ඒ මම ඔබගේ බස් අසා සිතින් නිවුනේ වෙමි. නැවතත් ඒ පුත්‍රයා වෙනුවෙන් ශෝක නො වෙමි. නො හඬමි.

සත පණ්ඩිත තෙම තම වැඩිමල් සහෝදරයා පුත්‍ර ශෝකයෙන් සන්සිඳ වූ වා සේ ප්‍රඥා සහිත වූ අනුකම්පකාරී වූ යම් කෙනෙක් වෙත් ද මෙසේ ම කරත්.

සත පණ්ඩිතයා සිය වැඩි මහල් සොහොයුරා යහපත් වචනයෙන් ශෝක රහිත කළාක් මෙන් යමෙකුට මෙබඳු වූ ඇමතියෝ සේවකයෝ වෙත් ද, ඔවුන්ට ශෝකයක් නො වේ මැ යි.

**එහි ඝතො ජෙට්ඨංච භාතරං** - යම් සේ සත පණ්ඩිත තෙමේ තමාගේ ජ්‍යෙෂ්ඨ සහෝදරයා මියගිය පුතා නිසා සෝකයෙන් මඩින ලද්දේ ද? තමාගේ උපාය දක්ෂතාවයෙන්, මෙම ධර්ම කථාවෙන් පුත්‍ර ශෝකයෙන් මිදවී ය. මෙසේ අනෙක් නුවණැත්තෝ ද, තම ඥාතීන්ට උපකාර කළ යුතු ය යන අර්ථයි

**යස්ස එතා දිසා හොන්ති** - මේ අභිසම්බුද්ධ ගාථායි. එහි අර්ථය පුත්‍ර ශෝකයෙන් මැඩුනාවූ වාසුදේව මහරජු, යම් ආකාරයකින් සත පණ්ඩිතයන් විසින් ශෝකය දුරුකරනු පිණිස යහපත ධර්මයක් වචනයක් කීයේ ද? යම් බඳු වූ අන්‍ය යන්ටත් මෙබඳු ඇමතිවරු, ඥාතිවරු හිතවත්හු වේවා ! ඔහු ගේ ශෝකය මේ ගාථාවලින් දුරු වි ගියේ ය.

ශාස්තෘන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙන හැර දක්වා උපාසකය ! මෙසේ පැරණි පණ්ඩිතවරු පණ්ඩිතයන්ගේ කථා අසා පුත්‍ර ශෝකය නිවාගත්හයි කියා සිව්සස් වදාරා දේශනාව සමාප්ත කළ සේක. දේශනාවගේ අවසානයේ උපාසක තෙමේ සෝවාන් පෙළෙහි පිහිටියේ ය.

## කණ්හ ප්‍රේත වත්ථු වර්ණනාව
## නිමියේ ය.

—//—

## 2-7

"නගො දුබ්බණ්ණ රූපො" - යන මේ කථා වස්තුව "ශාස්තෲන් වහන්සේ ජේතවන විහාරයෙහි වැඩ වසන සමයේ ධනපාල නම් ප්‍රේතයා අරභයා වදාරණ ලදී.

බුදුවරයන් වහන්සේ නමක් ලොව පහළ නූ වූ කල්හී, දසන්න රට ඒරකච්ඡ නම් නගරයේ ධනපාල නම් සිටුවරයෙක් සිටියේ ය. හේ ශ්‍රද්ධා නැත්තේ ය. පැහැදීමක් නැත්තේ ය. තද මසුරෙකි. කර්මයන්හි විපාක නැතැයි කියන නාස්තික දෘෂ්ටි වාදියෙකි. ඔහු ගේ ක්‍රියා පිළිවෙළ දේශනා පාලියෙන් ම ප්‍රකට වේ.

හෙතෙම කළුරිය කොට මරු කතරෙක ප්‍රේතයකු වී උපන්නේ ය. ඔහු ගේ ශරීරය තල් කඳක් පමණ විය. ඉල්පීගිය සම රළු ය. අවුල් වූ, විරූප වූ හිස කෙස් ය. බියකරු දැකුම් ඇත්තේ ය. දුර්වර්ණ ය, අතිශයින් විරූප වූයේ භයානක දැකීම් ඇත්තේ ය. ඔහු පනස් පස් වසරක් මුළුල්ලෙහි බත් ඇටයක් හෝ දියබිඳක් නො ලබා ම, වියලුණු උගුර තොල් දිව ඇති ව සා පවසින් යුතු ව ඔබ මොබ හැසිරෙයි.

අපගේ භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වී, පවත්වන ලද උතුම් ධර්ම චක්‍ර ඇත්තේ, පිළිවෙළින් සැවැත් නුවරට වැඩමවා වසන්නේ, සැවත් නුවර වාසී වෙළෙන්දෝ පන්සියයක් පමණ ගැල්වල බඩු පුරවාගෙන උත්තරාපථයට ගොස් ඒ භාණ්ඩ අළෙවිකොට, එහෙන් ගත් බඩු ගැල්වල අසුරා ආපසු එනවිට සවස් යාමයේ එක්තරා දිය වියලී ගිය ගඟක් ලඟට පැමිණ ගොනුන් ලිහා රාත්‍රිය නවාතැන් ගත්හ. එහි දී මේ ප්‍රේතයා පිපාසයෙන් පෙළුනේ පැන් සඳහා පැමිණ එහි දී වතුර බින්දුවක් වත් නො ලැබ, පැන් ආශාව සිඳී කපා දැමූ තල් ගසක් මෙන් වැටුණේ ය. ඔහු දුටු වෙළෙන්දෝ.

නිර්වස්ත්‍ර විරූප වූ ඉතාම බියකරු දැකුම් ඇති ඉල්පී ගිය නහර වැල් ඇති උස් වූ ඉළ ඇට ඇති ඉතාමත් කෘශ වූ තෝ කවරෙක් ද? මෙසේ කරුණු විමසූ විට ප්‍රේත තෙමේ,

පින්වතුනි මම යමලෝකයයි කියන ලද ප්‍රේතලෝකයේ ප්‍රේතයෙක්මි. පෙර

පාපකර්මයන් කොට මිනිස් ලොවින් චුත ව ප්‍රේත ලෝකයට ගියේ වෙමි. නැවත වෙළඳුන් විසින්,

ඔබ විසින් කය වචනය සිත යන තුන් දොරින් කුමන අකුශල කර්මයක් කළේ ද? කවර අකුශල කර්ම විපාකයකින් ප්‍රේත ලෝකයට ගියේ වේ ද? ප්‍රේත ලෝකයේ උපන්නේ ද?

දසන්න රට ඒරකච්ඡ යයි ප්‍රසිද්ධ වූ නගරයක් විය. ඒ නගරයෙහි පෙර ආත්ම භාවයක දී මම ධනපාල නමින් සිටුවරයෙක් වීමි. මහජනයා ඒ නමින් මා දනිත්.

මට අමු රන් පිරූ කරත්ත අසූවක් විය. මට රත්තරන් ද මුතු ද වෛඩූර්ය ආදී බොහෝ මැණික් ද තිබුණි.

එපමණ මහා ධනයක් තිබුනු මට දන් දීමට කැමැත්තක් නො වී ය. යාචක ජනයෝ මා නො දකිත්වා යි ගෙයි දොර කවුළු වසාගෙන තනිව ම අනුභව කරමි.

ශ්‍රද්ධා නැත්තේ, මසුරෙක් තද මසුරෙක් වශයෙන් පරිභාසයට ලක්වීමි. දන් දෙන්නා වූ පින් කරන්නා වූ බොහෝ ජනයා ඒවායින් වැලැක්වීමි.

දන්දීමේ විපාක නැත. සීලයෙන් කවර ප්‍රතිඵලයෙක් ලැබේ ද? පැන් පොකුණු හා ළිං ද තනන ලද ආරාම උයන් වතු

පැන් හල්, යන එන තන්හි ඒ දඬු වනසාලීමි. මම නො කළ කුසල් ඇති ව, කරන ලද අකුසල් ඇති ව, ඒ අත්බවින් චුත වූයේ. (වෙමි)

ප්‍රේත යෝනියෙහි ඉපදී, සා පිපාසාවෙන් වඩනා ලද්දේ වෙමි. යම් දිනක මා කළුරිය කළේ ද පනස් පස් අවුරුද්දක් මුළුල්ලෙහි.

ආහාර අනුභවයක් හෝ පැන් බීමක් හෝ නො දනිමි. (කිසිවකුට කිසිවක් නො දීම යන) සංයමයක් වී ද? එය වැනසීමක් වෙයි. එය නොදීම යන සංයමය යි.

යම් පරිත්‍යාගයක් නො කිරීමක් වේ ද එය වැනසීමකැ යි ප්‍රේතයෝ ම දනිත්. මම පෙර බොහෝ ධනය තිබීයදී ත් දන් නුදුන්නෙමි. පින් කිරීමෙන් වැළකුනෙමි.

දාන වස්තු ඇති කල්හි තමන්ට පිනක් නො කෙළෙමි. ස්වකීය කර්ම විපාකයට පැමිණියා වූ මම දූන් පසු තැවෙමි.

සිව් මසකින් මතු (පස්වන මස) කාලක්‍රියාව වන්නේ ය. මම ඒකාන්තයෙන් කටුක වූ දරුණු වූ අවීචි මහා නිරයෙහි වැටෙන්නෙමි.

කොත් සතරක් ඇත්තේ ය. දොරවල් සතරක් ඇත්තේ ය. කොටස් වසයෙන් ප්‍රමාණ කරන ලදු ව, මනාකොට බෙදන ලදී. යකඩ පවුරකින් වටකරන ලදු ව යකඩ පියනකින් වසන ලද්දේ ය.

ඒ අවීචි මහා නරකයේ යකඩ භූමිය නිරන්තරයෙන් ගිනි දැලින් ගැවසුනේ ය. දිලිසුණේ ය. එය යොදුන් සියයක් තැන පැතිර සිටියේ ය.

මම ඒ මහා නිරයෙහි බොහෝ කලක් දුක් වින්දෙමි. මා විසින් කළ පාප කර්මයා ගේ විපාකය හේතුවෙන් මම බොහෝ ශෝක කරමි.

එහෙයින් තොපට කියමි. ඔබලාට යහපතක් වේවා. මෙතැන්හි යම් පමණ දෙනෙක් රැස් වී සිටිත් ද? ප්‍රකට වශයෙන් හෝ රහසිගත ව හෝ ලාමක වූ අකුශල කර්මයන් නො කරවු.

යම්කිසිවකු විසින් ළාමක හෝ පාප කර්මයක් කරන්නේ නම්, අහසට නැගීමත් ඒ අකුශලයේ දුකින් මිදීමක් නැත.

මව්ට ආදරය ඇත්තෝ වව්, මව්ට උපස්ථාන කරන්නේ මව්, පියාට ගරු සත්කාර කරන්නේ වව්. කුල දෙටුවන් පුදන්නේ  මහණ බමුණන් පුදන්නෝ වව්, මෙසේ කොට ස්වර්ග ලෝකයට පැමිණෙනු මැනවි.

එහි - **දසන්නානං** - මේ නම් ඇති රජුන් ගේ රට, **එරකච්ඡන්ති** - ඒ නගරයේ නම යි. **තත්ථ** - ඒ නගරයෙහි **පුබ්බෙ** - පෙර අතීත භවයෙහි. **ධනපාලොති මං විදුං** - ධනපාල සිටුවරයා යයි මා දනිත්, එම නම එදා මට අර්ථානුගත

(අන්වර්ථ) නම විය. **අසීති** ගාථා කීහ. එහි **අසීති සකට වාහනං** - කුරුණි විස්සක් බර උසුලන (වාහනය) (සකට) කරත්තය යයි කිය යි. එවැනි කරත්ත අසුවක්, අමුරන් වලින් පිරී තිබුනි. එසේ ම කහවණු ද, මට තිබුනේ ය යන යෙදුම යි. **පහුතමෙම ජාතරූපං** - රන්ම පහුත වේ, ඉතා විශාල ප්‍රමාණයක් තිබුනේ ය. යන සම්බන්ධය යි. **නමෙ දාතුං පියං අහො** - දන් දීමට ප්‍රයත්නයක් නොවී ය. **මාමං යාචන කාදදසු** - යාචකයෝ මා දකිත් යන හැගීමෙන් ගෙදර දොර ජනෙල් වසා අනුභව කළෙ මි. **කදරියො** තද මසුරු බව, **පරිභාසකො** - දන් දෙන අය දූන භයෙන් තැතිගත්තේ ය. **දදනතානං කරොනතානං** - උපයෝගාර්ථයෙහි සාමි වචන යි. දන් දෙන්නේ පින්කම් කරන්නේ, **බහුජ්ජනං** - බොහෝ සත්ත්වයන් කෙරෙහි දෙන්නාවූ ද, කරන්නාවූ ද, පිරිසක් එක් රැස් වී බහු ජන පුණ්‍ය කර්මයන් කරන්නා වූ න් එයින් වැලැක් වීම්. **විපාකො නසිදානසසා** - දන් දීම් ආදිය නිවාරණය කිරීම දක්වයි.

එහි **විපාකො නත්‍ථි දානසස** - දන්දීමෙහි කර්ම ඵලයක් නැත. හුදෙක් පින්කම් කිරීමෙන් ධන විනාසය පමණක් වේයයි දක්වයි. **සංයමසස** - සීලසංයමය - **කුතොඵලං** කවර නම් ඵලයක් ලබයි ද? සිල් රැකීමේ අදහස නිරර්ථක ම ය **ආරාධා** - විහාරාරාම හා වනපෙත් **පපායො** - පානීය ශාලා පැන්හල් දුගෙග ජලය අපහසු වීමෙන් දුර්ගම වූ තැන් **සඞකමනානි** - ඒ දඬු **තතොචුතො** - ඒ මිනිස් ලොවින් චුතවූයේ - **පඤ්චපණ්ණා සා** පනස් පහ - **යතොකාලකතො අහං** මම කළුරිය කළ දවසේ පටන්, **නාභාජානාමි** - මෙතෙක් කල් කෑමක් හෝ බීමක් නො දනිමි. **යො සංයමො සො විනාසො** - ලෝභාදී වශයෙන් කිසියම් නො දීම ආදී පිළිවෙතක් වී ද? එම සිතිවිල්ලක් වී ද විනාසයට එය හේතුවිය. ප්‍රේතයෝනියෙහි උපන් ප්‍රේතයන්ට මහා ව්‍යසනයට හේතුවක් වේ. **යො විනාසො සො සංයමො** මෙසේ යම් පරිදි කියන ලද අර්ථයාගේ ඒකාන්තක භාවය කියයි. **පෙතාහි කිර ජානන්ති** - මෙහි "හි" ශබ්දය අවධාරණයෙහි ය "කිර" ශබ්දය අනුශ්‍රවණ යෙහි ය. සංයමය, පිළිවෙත දියයුතු වස්තු තිබියදීත් පරිත්‍යාග නො කිරීම විනාසයට හේතුවීය යන අර්ථ යි. දාන වස්තුව නො දීම විනාශයට හේතුවක්ය යන කාරණය විපාක විඳින ප්‍රේතයෝ ම, ප්‍රත්‍යක්ෂ වශයෙන් දනිති. මිනිසුන් නො දනිත් යයි මෙයින් අදහස් නො වේ. ප්‍රේතයන් මෙන් සා පිපාසාදියෙන් වැඩුනා වූ මනුෂ්‍යයන් දක්නා ලැබෙන හෙයිනි. ප්‍රේතයෝ වනාහි පළමු අත් බැවෙහි ම කරන ලද කර්මය ප්‍රකට හෙයින් ම එහි අර්ථය මනා කොට දනිත්. ඒ නිසාම **අහං පුරෙ සංයමිස්සනති** ආදිය කීහ.

එහි **සංයමිස්සන්ති** - තෙමේ ම දානාදී පුණ්‍යක්‍රියාවෝ සංයමයෙන් කළ යුත්තේ ය. **බහුකෙ ධනෙ** - මහත් ධනය විද්‍යමාන කල්හි **ත** යනු එහෙයින්, **වො** යනු තෙපි, **භද්දංත්වා** - යහපත් ශුභ වූ, මිහිරි වූ වචනයක් ම වේවා **යාව නෙතත්ථ සමාගතා** යම්තාක් දෙනා මෙහි රැස්වූවෝ ද ඒ සියලු දෙනා මගේ වචනය අසාවා යනු අභිප්‍රාය යි. **ආවී** අනුන්ට ප්‍රකාශ කිරීම් වශයෙන් ප්‍රකට කිරීම යි. **රහො** රහසි ගතව හෝ අප්‍රකට වශයෙන් හෝ ප්‍රාණඝාතෙ මුසාවාද ආදී අකුසල් කය වචන මගින් ද ඉදින් රහසිගතවවත් අභිධ්‍යාදී වසයෙන් වත් ළාමක වූ පාපකර්ම නො කරන්න. නො කරවන්න. **සචෙතං පාපකං කම්මං** - ඒ පව්කම් කරන්නා වූ හෝ කරවන්නාවූ අය සතර අපායවලින් ද නිරයෙන් ද එතරවීමක් නැත. මිනිසෙකු ව උපන්නත් බොහෝ කෙටි ආයුෂ ඇත්තෙක් වැ ඒ අකුශල විපාකයත් විඳින්නේ ම ය. මෝක්ෂයක් හෝ මිදීමක් හෝ නැත. **උප්පච්චාපි පලායාතං** - පියාඹා අහසෙහි ගමන් කළත් මිදීමක් නැතැයි යන අර්ථ යි. මෙතැනින් හෝ එතැනින් පිටව යන්නා වූ තොපකරා කර්මය ලුහුබැඳ එන්නේ යයි දූන පහව යන්නා වූ තොපට ද ඒ කර්මයෙන් මිදීමක් නැත. ගති කාල ආදී ප්‍රත්‍යයන්හි එක්වීම ඇති වූ කල්හි ම විපාක දෙන්නේ ම ය. මෙම අදහස

අහසෙහි සිටියත් පාපකර්ම විපාකයෙන් මිදීමක් නැත. පර්වත ගුහාවකට ඇතුල් වූවත් මිදීමක් නැත. මුහුද මැද සිටියත් මිදීමක් නැත. යම් තැනක සිටියේ පාප කර්ම විපාකයෙන් මිදෙන්නේ නම් එබඳු ප්‍රදේශයක් ලෝකයෙහි ම නැත.

මේ ගාථාව ගෙනහැර දක්වී ය.

**මත්තෙය්‍යා** - මවට හිතවත්, **හොථා** - ඇයට උපස්ථානාදිය කරව්. එසේම **පෙත්තෙය්‍යාති** - දතයුතු යි. **කුලෙ ජෙට්ඨාප චායකා** - කුල ජ්‍යෙෂ්ඨ ගෞරව කිරීම බුහුමන් කිරීම් කරව්. **සාමඤ්ඤා** මහණ ශ්‍රවණ ආදී පිදිය යුත්තන්, **බ්‍රහ්මඤ්ඤා** - බාහිර පාප පූජකයා යන අර්ථයි. **එවං සගගං. ගමිස්සථා** - මෙසේ මා විසින් කියනලද ආකාරයෙන් පින් කොට දෙව්ලොව උපදීවා යනු අර්ථයි. මෙහි යම් කිසි අර්ථයක බෙදීමක් වේ නම් යට කියන ලද බල්ලාටිය ප්‍රේත වස්තුවෙහි කියන ලද ක්‍රමයෙන් ම දත යුත්තේ ය.

ඒ වෙළෙන්දෝ ඔහුගේ කීම අසා සංවේගයට පැමිණියේ ඔහුට අනුකම්පා කරමින් වතුර භාජනයක් ගෙනැවිත් ඔහු නිදිකරවා කටට වත්කළේ ය. ඉක්බිති මහා ජනයා විසින් බොහෝ වේලාවක් වත්කළ වතුර ඒ ප්‍රේතයාගේ

පාපකර්ම බලයෙන් යටි උගුරට නො බැස්සේ ය. පිපාසය කෙසේ සන්සිඳෙන්නේ ද? ඒ වෙළෙන්දෝ ඒ ප්‍රේතයාගෙන් කිමෙක් ද තොප විසින් කිසියම් ආශ්වාස මාත්‍රයක් ලබන ලද්දේ යි ඇසූහ. හෙතෙම මෙපමණ ජනයා විසින් මෙපමණ වෙලාවක් මගේ මුවට වත්කරන ලද ජලයෙන් එක බින්දු මාත්‍රයක් වත් උගුර තුළට ඇතුල් වූයේ නම් මේ ප්‍රේත යෝනියෙන් මිදීමක් නො වේවා යි කී ය. එහි දී ඒ වෙළෙන්දෝ එය අසා සංවේගයට පැමිණියේ පිපාසය සංසිඳවීමට කිසියම් උපායක් ඇත්දැයි ඇසූහ. ඔහු කියන්නේ මේ පාපකර්මය ක්ෂය වීමට නම් තථාගතයන්ට හෝ තථාගත ශ්‍රාවකයන්ට දන් දී ඒ පින් මට අනුමෝදන් කළයුතු වන්නේ ය. එවිට මම මේ ප්‍රේත ලෝකයෙන් චුත වීම ලබන්නෙමි ඒ ඇසූ වෙළෙන්දෝ සැවැත් නුවරට ගොස් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ මේ ප්‍රවෘත්තිය කියා සරණ සල්හි පිහිටා බුදු පාමොක් මහා සඞ්ඝයාට සතියක් මහ දන් දී ඒ ප්‍රේතයාට පින්පෙත් අනුමෝදන් කළහ. භාග්‍යවතුන් වහන්සේ එය අර්ථෝත්පත්ති කොට ගෙන සිව් පිරිසට ධර්ම දේශනා කළ සේක. මහා ජනයා ද තණ්හාව මසුරු මල පහ කොට දානාදී පින්කම්වල යෙදුනහ.

ධනපාල ප්‍රේත වස්තුව
නිමියේ ය.

——//——

# 2-8

"නග්ගො කිසො පබ්බජිතො සි භන්තෙ " - මේ (කථාවස්තුව) ධර්ම දේශනාව ශාස්තෲන් වහන්සේ ජේතවන විහාරයේ වැඩ වසන්නේ චුල්ලසෙට්ඨි ප්‍රේතයා අරබයා දේශනා කළහ.

බරණැස් නුවර එක් ගෘහපතියෙක් සැදැහැ නැත්තේ, (තෙරුවන කෙරෙහි) ප්‍රසන්න නූවූයේ මසුරු වූයේ තද ලෝභී වූයේ පුණ්‍ය ක්‍රියාවන්ට කැමැත්තක් නො දැක්වූයේ විය. ඔහු නමින් චුල්ල සෙට්ඨි නම් විය.

හෙතෙම කළුරිය කොට ප්‍රේත ලෝකයෙහි උපන්නේ ය. ඔහුගේ ශරීරය පහව ගියා වූ මස් ලේ ඇත්තේ. ඇට සම නහර පමණක් විය. හිස මුඩු විය. වස්ත්‍ර රහිත විය. ඔහුගේ දුව අනුලා අන්ධකවින්ද රට ස්වාමියාගේ ගෙයි වසමින් තම පියා උදෙසා බ්‍රාහ්මණයන් බුදිනු කැමති වූ හාල් ආදී දානෝපකරණ සම්පාදනය කළේ ය. ප්‍රේත තෙමේ එය දැන ආහාර තෘෂ්ණවෙන් අහසින් එහි ගොස් රජගහ නුවරට සැපත් විය. ඒ සමයෙහි අජාසත් තෙමේ දෙව්දතුන් විසින් මෙහෙයවන ලදු ව පියා මරවා ඒ විපිලිසරින් හා නරක සිහින දැකිමෙන් නින්දට නො පැමිණියේ මතු පහයට නැගී සක්මන් කරද්දී අහසින් යන මේ ප්‍රේතයා දැක, මෙසේ විචාළේ ය.

ස්වාමීනි ! වස්ත්‍ර රහිත වූ කෘශ වු පැවිද්දෙක් වූයෙහි ද? කවර හේතුවකින් රාත්‍රියෙහි කොහේ යන්නේ ද? ඒ කරුණ මට කියව ! හැකිකමක් ඇත්තේ නම් නුඹට සියලු භෝගයෙන් හා උත්සාහයෙන් වස්තුව ලබාදෙන්නෙමි.

මෙහි **පබ්බජිතො** - ශ්‍රමණයා - රජු වනාහි ඔහුගේ නග්න බව නිසා ද, හිස මුඩු නිසා ද මොහු ශ්‍රමණයෙක් යන හැඟීමෙන් **නග්ගො කිසො පබ්බජිතොසි** ආදිය කීහ. **කිස්ස හෙතු** - කවර නිමිත්තක් ද? **සබ්බෙන විත්තං පටිපාදයෙ තුවං** - ධනයෙන් හෝ උපකරණ වලින් හෝ සියලු භෝගයන්ගෙන් ඔබේ අදහස අනුව සියලු උත්සාහයෙන් අවශ්‍ය දේ සම්පාදනය කරන්නෙමි. එසේ කරන්නට ලැබීම ඉතා යෙහෙකි. මට හැකිවන්නේ ය. එහෙයින් **ආචික්ඛමෙතං** - ඔබ මෙසේ යන ගමන මට කියව! යන අර්ථ ය. මෙසේ රජු විචාරණ ලද්දේ, ප්‍රේතයා තමන්ගේ ප්‍රවෘත්තිය පැවැත්ම කියන්නේ

සියලු තැන ප්‍රකට වූ බරණැස් නම් නුවරක් ඇත. ඒ නගරයෙහි මම මහත් ධන සම්පත් ඇති, නිහීන සිත් ඇති, දන් නො දෙන්නා වූ කාම සැපතෙහි ගිජු සිත් ඇති, ගෘහපතියෙක් වීමි. දුසිල් කර්මය නිසා ප්‍රේත ලෝකයට පැමිණියේ වෙමි.

ඒ මම කරන ලද පාපකර්ම හේතුකොට ගෙන සාගින්නෙන් පීඩිත වූයේ වෙමි. ඒ හෙයින් ම කිසියම් ආහාරයක් ප්‍රර්ථනා කොට නෑයන් සමීපයට යමි. දන් නො දෙන සුළු තැනැත්තෝ පරලොව දී දානයාගේ විපාක ලැබේ යයි නො අදහත්.

මගේ දියණිය තොමෝ මව්පියන් උදෙසා ද මුතුන් මී මුතුන් උදෙසා ද දන් දෙමියි නිතර කියයි. දාන වස්තු සකසා බමුණන් වළඳවන්නී වෙයි. මම අන්ධක වින්ද නගරයට කෑමට යමි.

එහි **දුරඝුට්ඨං** යනු දුර සිටම ගුණ කීම් වසයෙන් කීර්තිය ප්‍රකාශ කෙරෙමින් ඝෝෂා කරන ලද කීර්තිය පැතිර යාද සියලු තන්හි ප්‍රකට වූ යන අර්ථයි. **අඩ්ඪකො** - ආඪ්‍ය වූ, මහත් වූ භෝග සම්පත් ඇති, **දීනො** නිහීන සිත් ඇති, නො දෙන අදහස් ඇති, එහෙයින් කීහ. **අදාතා ගෙධිත මනො ආමිසම්ං** - පඤ්චකාම සම්පත්තියෙහි ගිජු වූ බලවත් සේ ඇලුණු සිත් ඇත්තෙක් වීමි. **දුසසීලෙ‍යන සම විසයම්හි පතෙතා** - තමන් විසින් කරන ලද දුස්සීල කර්මයෙන් ප්‍රේත ලෝකයට පැමිණියේ වෙමි. **සො සූචිකාය කිලමතො** - ඒ මම ඉදිකටු වලින් වීදින්නා ක් මෙන් සා පිපාසා දෙකින් විදුන ලදු යේ නිරතුරු ව ම බඩගින්නෙන් ක්ලාන්ත බවට පැමිණියේ වෙමි. කිලමථො යනු ද මෙසේ ද පාඨයක් වේ. **තෙහි** මෙසේ දන් නො දීම් ආදී කියන ලද පාපකර්ම හේතුවෙන් ඒ ප්‍රේතයාට එම පාප කර්මයන් සිහි කරති. කර්ම ඉතා තියුණු දොම්නසක් ම උපදී. එහෙයින් මෙසේ කීහ. **තෙනෙවා** - ඒ හෙයින් ම ඇති වූ සාගිනි දුකින්, **ඤාතීසු** යාමි ඤාතීන් සමීපයට යමි. **ආමිසකිඤචි හේතු** යනු කිසියම් ආමිසයක් නිමිතිකොට, කිසියම් ආහාරයක් අපේක්ෂා කොට යන අර්ථයි. **අදානසීලා නච සද්දහනති දානඵලං හොති පරම්හි ලොකෙ** - මා යම්සේ ද එමෙන්ම අනෙක් මනිස්සු ද දන් නො දෙන සුළු වන්නේ ද ඔව්හු දානවිපාකය ඒකාන්තයෙන් පරලොව හිදී මට පිහිට වේයයි නො අදහත් ද? මා මෙන් ම ප්‍රේතයෙකු වී මහා දුක් අනුභව කරන්නේ ය යන අදහස යි. **ලපතෙ** කිය යි. **අභික්ඛණං** - නැවත නැවත, බොහෝ සෙයින්, කිම කි යන්නේ ද වේ. **දසසාමි දානං**

**පිතුනං පිතාමහං** - එහි "**පිතුනං**" යන්නෙන් මවු පියන් බාප්පා හා මහප්පා - (සුළු පියා හා මහ පියා) ගැනේ. **පිතාමහං** යන්නෙන් - සීය, මුත්තා, මීමුත්තා පියාගේ පියාගේ පියාගේ පියා ද ගැනේ. **උපකබට** - සැදුණු - සාදන ලද, **පරිවිසයනති** - වළඳවත් **අනධකවිනදං** - අන්ධක වින්ධ නම් නගරයට **භොතතුං** - අනුභව කරන්ට - මෙයින් මතු

අජාසත් රජු ඒ ප්‍රේතයාට මෙසේ කීය. ඒ දානය ද අනුභව කොට වහා එනු මැනවී, මමත් පූජාවක් කරන්නෙමි. ඉදින් යම් කරුණක් ඇත්නම් ඇදහිය යුතු වූ ඒ හේතු යුත්ත වචනය මට කියව මම අසමි.

එසේ යයි කියා එතැනට ගියේ ය. බත බමුණෝ වැළඳුවාහු ය. දක්ෂාණර්හයෝ නො වැළඳුහ. නැවත අනික්වර රජගහ නුවරට පෙරළා ආයේ ය. අජාසත් රජුගේ ඉදිරියෙහි පහළ වි ය.

රජු නැවත ද පැමිණි ප්‍රේතයා දක මමත් දානයක් දෙන්නම් ද ඇසී ය. යම් කරුණකින් ඔබ බොහෝ කලක් මුළුල්ලෙහි සෑසිමකට පත්වන්නේ ද? එයට යම් කිසි හේතු කාරණ ඇත්තේ ද එය මට කියව.

පින්වත් රජතුමනි බුදුන් ද සඬසයා ද ආහාරයෙන් වළඳවා පාන වර්ගයන් ද වළඳවා, සිවුරු ද පුජාකොට ඒ පිණ මට හිත වැඩ පිණිස පින් අනුමෝදන් කරනු මැනවි. එසේ කළ කල්හි මම බොහෝ කලක් එයින් සැනසීම ලබමි.

එය අසා එකෙණෙහි ම ප්‍රාසාදයෙන් නික්ම උදාර වූ නොහොත් ප්‍රණීත වූ දානය සියතින්ම සංඝයාට දී තථාගතයන් වහන්සේට ඒ ප්‍රවෘත්තිය කීය. ඒ ප්‍රේතයාට ද පින් අනු මෝදන් කළේ ය.

පින් ලද්දා වූ ඒ ප්‍රේත තෙමේ ඉතාමත් බබළමින් රජුගේ ඉදිරියෙහි පහළ විය. මම උත්තම ඉර්ධියට පැමිණි දෙවියෙක් වෙමි. මගේ ආනුභාව සම්පත්තියට සමව හෝ භෝග සම්පත්තියට සම වූ කිසි ම මනුෂ්‍යයෙක් නො වෙති.

මාගේ අප්‍රමාණ වූ දිව්‍ය ආනුභාවය බලනු මැනවි. නුඹ විසින් ආර්ය සඬසයාට මහදන් පවත්වා මට පින් පමුණුවන ලදී. මිනිස් දෙවි වූ මහරජ ! හැමකල්හි ම නිරන්තරයෙන් බොහෝ දාන වස්තුවෙන් පිනවණ ලද මම සුවපත් වූයේ වෙමි.

එහි - **තමවොච රාජා** - ඒ ප්‍රේතයාගේ එම වචන අසා සිටි අජාතසත්ත රජතෙම කීයේ ය. **අනුභවියානු තම්පි** - ඔබ ඔබගේ දුව විසින් දෙනු ලබන දානයට ගොස් එය අනුභව කොට, **එය්‍යාසි** - එනු මැනවි. **කරිස්සනති** - කරන්නෙමි. **ආචික්ඛ මෙ තං යදි අත්‍ථි හොතු** - ඉදින් කිසියම් කරුණක් ඇත්නම් ඒ කාරණය මට නො වළහා කියව, **සද්ධායිතං** - ශ්‍රද්ධා වෙන් කළයුතු ය. **හෙතුවචො** - හේතු යුක්ති වචන, අසවල් තැන, අසවල් ප්‍රකාරයෙන් අසවල් ආකාරයට දන් දීම කිරීමෙන් මට ලැබේය යි කියා කරුණු සහිත වූ වචනයෙන් මට කියව යන අර්ථ යි. **තථාති වත්‍වා** - මැනවැයි කියා, **තත්‍ථා** - ඒ අන්ධක වනයෙහි බමුණන් වළඳවන තැනට, **භුඤ්ජිංසු භත්තං නච පන දක්ඛිණාරහා** - දුශ්ශීල බ්‍රාහ්මණයන්ට දන් වැළඳුවුහ. ඔව්හු වනාහි දක්ෂිණාර්හ වූ සීලවන්තයෝ නො වූහ. සිල්වත් හු වැළඳුවේ නැත යන අර්ථයි. **පුනාපරනති** - නැවත ආපසු පෙරලා රජගහනුවරට ආවෙමි. **කිං දදාමි** කෙබඳු අතකින් දානය දෙන්නෙමි දැයි රජු ප්‍රේතයාගෙන් විචාළේ ය. **යෙන තුවං** - යම් කාරණයකින් ඔබට, **චිරතරං** - බොහෝ කල් **පීණිතො** සැහිමට පත්වේ ද? එය කියව යන අර්ථයි **පරිවිසියානා** වළඳවා **රාජා** අජාසත් රජු අමත යි. **මෙ හිතායා** මට හිතසුව පිණිස ප්‍රේත ආත්මභාවයෙන් මිදවීමට, **තතො** - එහෙයින් එම වචනයෙන් පසුව එම ප්‍රාසාදයෙන්, **නිපතිත්‍වා** නික්මී තාවදෙ වරුවෙහි (බතින්පෙර) මේ දානය දුන්නේ ය. **සහත්‍ථා** තමන්ගේ අතින්ම, **අතුලං** - ප්‍රමාණ නොකළ හැකි, මහත් වූ, ප්‍රණීත වූ (මිහිරිවූ) **දදිත්‍වා සඞෙඝ** - සඞ්ඝයාට ද **ආරොචයිං ප කතිං තථාගතස්ස** - ස්වාමීනි ! මේ දානය වූ කලි එක්තරා ප්‍රේතයකු සඳහා පූජා කරන ලදැ යි ඒ ස්වාභාවික ප්‍රවෘත්තිය භාග්‍යවතුන් වහන්සේට ප්‍රකාශ කළේ ය. පවසා ඒ දානයෙන් උපන් කුසල් ඔහු වෙතට පැමිනේවා යි ඒ ප්‍රේතයාට පිං අනුමෝදන් කළේ ය. **සො** - ඒ ප්‍රේත තෙමේ **පූජිතො** - පින් අනුමෝදන් කිරීමෙන් පසු ව **අතිවිය** - **සොභමානො** - දිව්‍යානුභාවයෙන් අතිශයින් බබළමින් **පාතුරහොසි** පහළ විය. රජු ඉදිරියේ තමන් දැක්වී ය. **යක්ඛොහමස්මි**, ප්‍රේත ආත්ම භාවයෙන් මිදෙන ලද්දෙමි දෙව් බවට පත් වීමි. **න මය්හම්දධි සමසදිසා මනුස්සා** - මගේ ආනුභාව සම්පත්තියට හෝ භවභෝග සම්පත්තියට සමාන මනුෂ්‍යයෙක් නැත. **පස්සා නුභාවං අපරි මිතං ම මයිදං** - යනු මම අපරිමාණ වූ දිව්‍යානුභාවයන් දැක මගේ සම්පත් ප්‍රත්‍යක්ෂ වශයෙන් රජුට දක්වන්නේ යයි කිය යි. **තයානුදදිටඨං අතුලං දදිත්‍වා සඞෙඝ** - ආර්ය සඞ්ඝයාට අසමාන වූ, මහත් වූ දන් දී මා කෙරෙහි අනුකම්පාවෙන් ඔබ විසින් දැන පමුණුවන ලද **සනත පසිතො සතතං** **සදා**

බහු - ආහාර පාන වර්ග වස්ත්‍ර ආදී බොහෝ දිය යුතු දාන වස්තූන්ගෙන් ආර්ය සඞ්ඝයා සන්තර්පනය කළ හෙයින් හැමදා දිවි ඇති තෙක් නිරන්තරයෙන් මම සන්තර්පනය වූයේ ප්‍රීතිමත් වූයේ වෙමි. **යාමාහං සුඛිතො මනුස්ස** දෙවා - එහෙයින් මම දැන් සුවපත් වීමි. මිනිස්දෙවි මහරජ කැමති පරිද්දෙන් කැමති තැනට යෙමියි රජුගෙන් විචාළේ ය. අවසර ගත්තේ ය.

මෙසේ රජුගෙන් අවසර ගෙන ප්‍රේතයා ගිය කල්හි අජාසත් ඒ කාරණය භික්ෂූන්ට කීය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ සැළ කළා හු ය. භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය අර්ථෝත්පත්ති කොට ගෙන පැමිණි සිටි පිරිසට ධර්ම දේශනා කළහ. එය අසා මහා ජනයා මසුරු මළ පහකොට දන් දිම් ආදී පින්කම් කටයුතු වල ඇලුණිහු වූහ.

චුල්ලසෙටඨී ප්‍රේත වස්තු වර්ණනාව
නිමියේ ය.

—//—

# 2-9

"යසස අත්ථාය ගච්ඡාමි" - මෙම ප්‍රේතවස්තු කථාව ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර වැඩ වසනසේක්. අඬකුර ප්‍රේතයා අරභයා වදාළ සේක.

මෙහි අඬකුර තෙම ඒකාන්තයෙන් ප්‍රේතයෙක් නො වේ. යම් හෙයකින් ඔහුගේ චරිතය වනාහී ප්‍රේතයන් හා සම්බන්ධ වූයේ ද එහෙයින් අඬකුර ප්‍රේත වස්තුව ය යි කියන ලදී. මේ එහි කෙටි කථාව යි.

උතුරු මධුරා නුවරට අධිපති වූ මහා සාගර රජුගේ පුත්‍ර වූ, උපසාගර නිසා උත්තරාපථයේ කංසභෝගයෙහි අසිතඤ්ජන නගරයේ මහාකංස රජුගේ දියණිය වූ, දේව ගර්භාගේ කුසයෙහි අඤ්ජන දේවිය, වාසුදේවය, බලදේවය චන්ද දේව, සූරියදේව, අග්ගි දේව, වරුණ දේව, අර්ජුන, පර්ජුන, සත පණ්ඩිත, අඬකුර, කියා වාසුදේව ආදිකොට ඇති යම් දස සහෝදරයන් හා අඤ්ජන දේවිය සමග එකොළොස් ක්ෂත්‍රිය කෙනෙක් වූ ද? ඔවුන් අතුරෙන් වාසුදේව ආදිකොට ඇති. සහෝදරයෝ අසිතඤ්ජන නුවර ආදිකොට ද්වාරවතී නුවර අවසන් කොට සියලු දඹදිව සැට තුන්දහසක් නුවරවල සියලු රජුන් චක්‍රයෙන් ජීවිත ක්ෂයට පත්කොට ද්වාරවතී නුවර වසමින් රාජ්‍යය කොටස් දහයකට බෙදා රජ කරවන්නාහු ය. සොහොයුරී අඤ්ජන දේවිය සිහි නො කළාහු වෙති. නැවත සිහි වී කොටස් එකොළහක් කරමු ය යි කී කල්හි සියල්ලට ම බාල වූ අඬකුර තෙමේ මගේ කොටස ඇයට දෙව්. මම වෙළදාම් කොට ජීවත් වන්නෙමි. තෙපි තම තමන්ගේ ජනපදවල මගෙන් බදු අය නො කොට මට බදු සහන දියව්ය යි කී වේ ය. ඔව්හු මැනවැයි පිළිගෙන ඒ කොටස සහෝදරියට දුන්නා ය. රජවරු නවදෙන ද්වාරවතී නුවර වසති. අඬකුර තෙමේ වෙළදාම් කරන්නේ නිතර මහා දන් පවත්වති. ඔහුට (අඬකුරට) වැඩ කැමති හිතවත් දාසයකු භාණ්ඩාගාරික වූ යේ ය. අඬකුර තෙමේ ඔහු කෙරහි ප්‍රසන්න වූ සිතින් ඒ දාසයාට එක් කුලදුවක් ගෙනැවිත් දුනි. ඒ දාසයා (දාසියගේ කුසෙහි) දරු ගැබක් ඇති වූ කල්හි ම මිය ගියේ ය. අඬකුර තෙමේ ඒ පුතා උපන් විට ඔහුගේ පියාට දුන් බත් වැටුප් ඔහුට දුන්නේ ය. ඒ දරුවා වැඩි වයස් වන විට මේ දරුවා දාසයෙක් වේ ද දාසයෙක් නො වේ ද යන ප්‍රශ්නයක් රජකුලයෙහි ඇති විය. එය අසා අඤ්ජන දේවිය දෙනක උපමා කොට ගෙන, මව් ස්වාමී දුවක් බැවින් පුත්‍රයා ද ස්වාමියෙක් යයි කියා දාස භාවයෙන් මිද වී ය. දරුවා ලජ්ජාවෙන් එහි විසීමට නො හැකි ව හේරුව

නගරයට ගොස් එක්තරා සන්නාලියකු ගේ දුවක සරණකොට ගෙන සන්නාලි ශිල්පයෙන් ජීවත් විය. එකල්හි හේරුව නුවර අසය්හ නම් සිටු වරයෙක් විය. ඒ සිටුවරයා මහණ බමුණන්ට ද දුගී මගී වණිබ්බක යාචකයන්ට ද දන් දෙයි. ඒ සන්නාලි තෙමේ අසය්හ සිටුවරයාගේ ගේ නො දන්නවුනට සතුටු සිතින් යුක්ත ව, අසය්හ සිටුගේ ගෙදරට දකුණු අත දිගු කොට මෙතැනට ගොස් කැමති දෙයක් ලබාගන්නැයි පෙන්වයි. ඔහුගේ කර්මය පෙළෙහිම දක්වෙයි. හෙතෙම මැතකාලයෙහි කළුරිය කොට කාන්තාරයක නුග ගසෙක භුමාටු දෙවියෙක් වී උපන්නේ ය. ඔහුගේ දකුණු අත කැමති කැමති සම්පත් දෙයි. එම හේරුව නගරයෙහි අසය්හ සිටුගේ දානයෙහි යෙදුණු සැදැහැ නැති අප්‍රසන්න වූ මිථ්‍යාදෘෂ්ටික වූ පින් කිරියවත්හි ආදර සිත් නැති එක්තරා පුරුෂයෙක් කළුරිය කොට ඒ දෙව්පුත් වසන තැනට නුදුරු තන්හී ප්‍රේතයෙක් ව උපන්නේ ය. ඔහු විසින් කරන ලද කර්මය ද පෙළෙහි ආයේ ය. අසය්හ මහ සිටුතෙම කළුරිය කොට තව්තිසා දෙව්ලොව සක්දෙව්දු ගේ පිරිවරෙහි කෙනෙකු බවට පත්විය.

පසු කලෙක අඞ්කුර තෙමේ ගැල් පන්සියයකින් ද, තවත් බමුණෙකුගේ ගැල් පන්සියයකින් දැයි ගැල් දහසකින් යුතු ව භාණ්ඩ රැගෙන මරුකතර මහ මගට පිළිපන්නේ ය. එහි දී මග වැරදී මංමුලා වී බොහෝ දවසක් එහි ම හැසිරෙන්නේ තණ ආහාර, දිය ආදිය සියල්ල අවසන් විය. අඞ්කුර තෙම සිය දූතයන් ලවා පැන් සොයවී ය. ඉක්බිති ව ඒ කැමති සම්පත් දෙන අත් ඇති දෙව් තෙමේ. ඔවුන්ගේ ඒ ව්‍යසනය දැක, අඞ්කුර විසින් තමන්ට පෙර කරන ලද උපකාර සිතා, ඒකාන්තයෙන් මොහුට මා විසින් මේ වෙලාවේ අවශ්‍යයෙන්ම පිහිට විය යුතු ය යි සලකා තමන් වසන නුගරුක දක් වීය.
ඒ නුගරුක වනාහී විහිදී ගිය අතු පතර ඇත්තේ ය. ඝනට වැඩුණු කොළ ඇති, මනා ව සෙවන ඇති, බොහෝ උඩින් ඇදුණු මුල් ඇති (පාරොහ), දිග පළලින් ද උසින් ද යොදුනක් පමණ විය. ඒ දුටු අඞ්කුර තුටු පහටුව ඒ ගස යට කඳවුරු බැන්ද වීය. දෙව්තෙම තමාගේ දකුණත දිගු කොට පළමු ව පැන් වලින් ජනයා සෑහීමට පත් කළේ ය. ඉන්පසු ව ඒ ඒ පුද්ගලයා යම් යම් දෙයක් කැමති ද ඒ ඒ දෙය දුන්නේ ය. මෙසේ එකල්හි මහජනයා නොයෙක් ආකාර ආහාර පාන ආදියෙන් ඒ ජනයා කැමති පරිද්දෙන් සෑහීමට පත් වූ පසු ව, වෙහෙස මහන්සිය තිවුණු කල්හි ඒ බමුණු වෙළඳ තෙමේ නුණුවනින් කල්පනා කරමින් මෙසේ සිතී ය. ධන ලාභය සඳහා මෙතැනින් කාම්බෝජයට ගොස් අපි කුමක් කරමු ද? මේ දෙවියා වනාහි යම් කිසි උපායකින් ගෙන යානාවට නංග්වා ගෙන අපේ නුවරටම යන්නෙමු යයි

සිතී ය. මෙසේ සිතා ඒ කාරණය අඞ්කුර වෙත කියන්නේ, ගාථා දෙකකින් කීහ.

භාණ්ඩ අලෙවිකොට ධනය උපයන්නෙමු ය යන අර්ථය පිණිස, කාරණය පිණිස අපි කාම්බෝජ රටට යන්නෙමු ද, මේ දිව්‍ය පුත්‍රයා කැමති කැමති සම්පත් දෙන බැවින් මේ දිව්‍ය පුත්‍රයා අපි ගෙන යමු.

මේ දිව්‍ය පුත්‍රයා මැනවින් යච්ඤා කිරීමෙන් හෝ, මර්දනය කොට බලහත්කාර යෙන් හෝ අල්ලා ගෙන සැප පහසු යානාවකට නංවාගෙන ද්වාරවති නුවරට වහාම යමු.

එහි **යස්ස අත්ථාය.** යම්කිසි කාරණයක් සඳහා **කාම්බොජං** - කාම්බෝජ නම් රටට, **ධනහාරක** බඩු විකුණා ධනය ගෙන ඒම පිණිස, **කාමදදො** කැමති කැමති දේ ලබා දෙන්නා වූ, **යක්ඛො** දේව පුත්‍රයා **නියාමසෙ** - කැඳවාගෙන යමු. පමුණුවා ගෙන යමු. **සාධුකෙන** යපත් ලෙස ආයාචනා කොට, **පසය්හ** - මැඩ පවත්වා බලහත් කාරයෙන් හෝ **යානං** - සුවපහසු වාහනයකට (නංවා) **ද්වාරකං** - ද්වාරවතී නුවරට,

මේ ඔහුගේ අදහස බලාපොරොත්තුවයි. යම් ප්‍රයෝජනයක් අර්ථයක් සඳහා අපි කාම් බෝජයට (යන්නට) යනු කැමැත්තේ ද, ඒ ගමනෙහි සංසිද්ධිය ප්‍රයෝජනය මෙහිදීම සිදුවිය. මේ දෙවියා කැමති කැමති දේ දෙන්නේ ය. එහෙයින් මේ දෙවියා ආරාධනාකොට, කැමැත්ත පරිදි හෝ ඉදින් එසේ නො යන්නේ නම් බලහත්කාරයෙන් හෝ යානයකට නංවා යානයේ දී දෙඅත් පිටුපසට බැඳ ඔහුද කැටුව වහා ද්වාරවතී නගරයට යමු.

ඒ බ්‍රාහ්මණයා විසින් මෙසේ කියන ලද කල්හි අඞ්කුර තෙමේ සත්පුරුෂ ධර්මයෙහි පිහිටා ඔහුගේ වචනය කීම ප්‍රතික්ෂේප කරමින්

යම් රුක් සෙවනක හිඳිනේ හෝ හෝනේ හෝ වේද ඒ ගසේ අතු නො බිඳිය යුතුය. එසේ කිරීමෙන් මිත්‍ර ද්‍රෝහී ළාමකයකු වන හෙයිනි.

එහි **නභඤ්ජයා** - නො සිඳිය යුතු ය. **මිත්තදුබ්භො** - මිත්‍රයන් අතුරෙහි ද්‍රෝහියෙක් වේ ම යි. ඔවුන්ට අනතුරු උපදවන්නෙක් වේ. යම් කිසිවෙක් වනාහි යම් සිහිල් සෙවන ඇති රුකක් ග්‍රීෂ්මයෙන් පීඩිත වූ පුද්ගලයාගේ

විඩා දුරු කරන්නේ වේ ද? ඒ රුකට පවා නපුරක් නො සිතිය යුතු ය. සත්ත්වයන් කෙරෙහි නපුරක් සිතීම ගැන කියනුම කවරේ ද? මේ දේවපුත්‍රයා සත්පුරුෂයෙකි. පෙරාතුව ම අපට උපකාර කළේ ය. අපගේ දුක් දුරු කළ කෙනෙක. අපට බොහෝ උපකාර ඇත්තෙක. ඔහුට කිසි අවැඩක් නො සිතිය යුතු ය. ඒකාන්තයෙන් ඒ දෙවිතෙම පුදනු ලැබිය යුත්තේම ය යි. දක්වීය. එය ඇසූ බ්‍රාහ්මණයා "**අත්ථස්ස මූලං නිඛනන්ති විනයො**" යයි කියන ලද නීති මංගල්‍ය නිසා අඞ්කුරයාට විරුද්ධ පක්ෂයෙහි සිට, මේ ගාථාව කීහ.

යම් රුකක සෙවනෙහි හිඳිනේ ද, නිදන්නේ ද? ඉදින් එබඳු වූ ප්‍රයෝජනයක් වේ නම්, ඒ ගසේ කඳ පවා (සමහරු) කපන්නේ ය.

එහි **අත්ථො චෙ තාදිසො සියා** එබඳු වූ දූව සම්භාරයකින් ඉදින් ප්‍රයෝජනයක් වේ නම්, ඒ ගසේ කඳ පවා ගන්නේ ය. අතු ආදිය ගැන කියනුම කමක් ද?

මෙසේ බ්‍රාහ්මණයා කී කල්හි අඞ්කුර තෙමේ සත්පුරුෂ ධර්මයෙහි පිහිටා පිළිගනිමින් කියන්නේ,

යම් ගසෙක සෙවනයට හිඳින්නේ ද නිදන්නේ ද ඒ ගසේ කොළයක් වත් නො කැඩිය යුතු ය. එසේ කඩන්නා මිත්‍ර ද්‍රෝහි පව්කාරයෙක් වේ. යන්න කීහ.

එහි **න තස්ස පත්තං භින්දෙය්‍ය** - ඒ ගසෙහි එක කොළයක් පමණවත් නො කඩන්නේ ය. අතු සිඳීම ගැන කියනුම කවරේ ද? නැවත ද බ්‍රාහ්මණයා තමාගේ වාදයෙහිම හිටිමින් මේ ගාථාව කීහ.

යම් රුක් සෙවනෙක හිඳිනේ ද හෝනේ ද, එම ගස මුලුත් සමගම උදුරා දමන්නේ ය.

එහි **සමූලම්පි තං අබ්බුහෙය්‍ය** මුල් සහිතවම සහමුලින් උදුරා දමන්නේ ය. (ලී වලින් ප්‍රයෝජන ඇති අය) මෙසේ බමුණා විසින් කියන ලද් ද අසා නැවත අඞ්කුර තෙමේ ඔහු නිහඬ කරවනු නිරර්ථක කරවනු කැමති ව, මේ ගාථා තුන කීහ.

කිසියම් පුරුෂයෙක් තෙම යමෙකුගේ ගෙහි එක් රැයක් පමණවත් වසන්නේ ද යමෙකු සමීපයෙහි කෑම් බීම් ආදිය ලබන්නේ ද ඒ පුරුෂයාට සිතින් වත් නපුරක් නො සිතන්නේ යයි උසස් පුරුෂයන් විසින් කළගුණ සැළකීම වර්ණනා කරන ලදී.

යමෙකුගේ ගෙයි එක් රැයක පමණවත් යමෙක් වාසය කරන්නේ ද, කෑම් බීම් ආදියෙන් උපස්ථාන කළේ ද ඔහුට සිතින්වත් අයහපතක් සිතන්නේ ද ඒ මිත්‍රද්‍රෝහියා දවයි. අභිංසක අත් ඇත්තේ ඒ මිත්‍ර ද්‍රෝහියා විනාශකරයි.

යම්කිසි කෙනෙක් පෙරකාලයෙහි කරන ලද උපකාර ඇත්තේ, පසු කාලයෙහි නපුරකින් පෙළා ද, උපකාර කරණයෙහි සෝදන ලද අත් ඇත්තෙකු විසින් අකෘතඥ වූ ඒ පුද්ගල තෙමේ යහපත නො දකී. අභිංසක හස්තය ඒ පුද්ගලයා විනාශ කරයි.

එහි යස්සා යම් පුද්ගලයකුගේ **එකරත්තිම්පි** එක් රැයක් පමණවත් විසුවේ ද? **යත්ථන්න පානං පුරිසො** යමෙකු සමීපයෙහි කිසියම් පුරුෂයෙක් ආහාර පාන හෝ කිසියම් භෝජනයක් ලැබුවේ ද? **න තස්ස පාපං මනසාපි** චෙතයෙ, ඒ පුද්ගලයාට අයහපතක් අනර්ථයක් (කිරීමට) සිතින් නො සිතුවේ ද කැමති නොවේ ද? කය වචනය දෙක ගැන කියනුම කවරේ ද? **කතඤ්ඤුතා සප්පුරිසෙහි වණ්ණිතා** කෘතොපකරණය බුද්ධාදී උතුමන් විසින් වර්ණනා කරන ලදී. ප්‍රසංසා කරන ලදී. **උපට්ඨිතො** සේවනය කරන්නේ මෙය වළඳන්න, මෙය බොන්න ආදී වශයෙන් ගෙනැවිත් දෙයි. ලගා කරයි. **අදුබ්භපාණී** නිවැරදි දෙ අත් සංයම වූ දෙ අත් **දහතෙ මිත්තදුහිං** මිත්‍ර දෝහි පුද්ගලයා දවයි. විනාශ කරයි. වැඩ කැමැති පුද්ගලයා කෙරෙහි අනෙකකු විසින් කරන ලද අපරාධය අවිශේෂයෙන් ඔහුට ම අවැඩ ගෙන දෙන්නේ ය. දූෂ්‍ය නො වූ පුද්ගල තෙමේ අර්ථ වශයෙන් ඔහු දවන්නේ නම් වෙයි. භාග්‍යවතුන් වහන්සේ එහෙයින් වදාළහ.

ක්ලේශයන් දුරුකළ පිරිසිදු සිත් ඇති පුරිෂෝත්තමයකුට, යම් කිසිවෙක් දූෂිත සිතින් නපුරක් කෙරේ ද? ඒ නපුර, නපුර කළ බාලයා වෙත ම එයි වෙත ම එයි කෙසේ ද උඩු සුළගට දූවු සියුම් දූහුවිල්ල යටි සුළග කරා පැමිණෙන්නක් මෙනි.

**යො පුබ්බෙ කත කල්‍යාණෙ** - යම් කිසි පුද්ගලයෙක් හොඳ හිතින් කරන ලද

පෙර උපකාර ඇති, **පච්ඡා පාපෙන හිංසති** - පෙර කරන ලද්දව පසුව පාපී අදහසින් (හිංසා කෙරේද? පීඩා කෙරේ ද) නපුරු වූ හිංසා කාරී වූ අනිටු වූ බාධා පමුණු වයි ද? **අල්ලපාණි හතො පොසො** - අල්ල පාණි නම් උපකාර කිරීමෙන් පිරිසුදු වූ සෝදන ලද අත් ඇති. පුරුෂයා යට කියන ලද පිළිවෙළින් නසන ලද්දා වූ හිංසාකළා වූ, ඔහුගේ හෝ පෙර කරන ලද්ද විසින් බාධාවන් හළ අල්ලපාණී හත නම් වේ. අකෘතඥ කළ ගුණ නො දත් පුද්ගලයා, **න සා භද්‍රානි පස්සති** - මෙසේ කියන ලද පුද්ගලයා මෙලොව ද පරලොව ද අර්ථ සිද්ධියක් නො දකී, නො විඳී නො ලබී යන අදහසයි.

මෙසේ සත්පුරුෂ ධර්මයට උදව් දීමෙන් අඞ්කුරයා විසින් මැඩපවත්වා කියන ලද ඒ බමුණා නිරුත්තර ව නිශ්ශබ්ද විය. දෙවි තෙමේ ඔවුන් දෙදෙනාගේ වචන හා ප්‍රති වචන අසා බ්‍රාහ්මණයාට කිපී මේ දුෂ්ඨ බ්‍රාහ්මණයාට කටයුතු දේ පසුව දනිමි යි සිතා තමා කිසිවකු විසින් මැඩ පැවැත්විය නො හැකි බව පළමු කොට දක්වමින්,

මම දෙවියෙකු විසින් හෝ මිනිසෙකු විසින් හෝ අතිශයින් මැඩ පැවැත්විය නො හැකිවෙමි. දිව්‍ය හෝ මනුෂ්‍ය ඓශ්වර්යකින් මැඩ පැවැත්විය නො හැකිවෙමි. මම උත්තම ඍද්ධියට පැමිණි දෙවියෙක් වෙමි. සැණෙකින්ම දුර යන්නේ ද වෙමි. (වර්ණ) රූප සම්පත්තියෙන් හා ශරීර ශක්තියෙන් යුක්ත වූයේ වෙමි.

එහි **දෙවෙන වා** - යම්කිසි දෙවියෙකු විසින් හෝ **මනුසෙසන වා** - මිනිසෙකු විසින් හෝ, මෙම වනයෙහි, **ඉස්සරියෙන වා** - දිව්‍ය ඓශ්වර්යයකින් හෝ මනුෂ්‍ය ඓශ්වර්යයකින් හෝ, එහි **දේවිස්සරියං නාම** - චාතුර් මහා රාජික, සුක්ක, සුයාම, ආදින්ගේ දිව්‍යඍද්ධියෙන්, **මනුස්සිස්සරියං** - සක්විති රජුන් ආදීන්ගේ පුණ්‍ය ඍද්ධියෙන් එහෙයින් ඓශ්වර්ය ග්‍රහණයන් මහානුභාව දෙව් මිනිසුන් සංග්‍රහ කෙරෙයි. දෙවියෝ මහානුභාවයෝ ම ය. තමන්ගේ පින් ඵලයෙන් රැකුල් ලත් මිනිසුන් පවා ප්‍රයෝග විපත්තියක් නැති කල්හි මැඩ පවත්වන්නට නො හැකි වෙත් අනෙක් දෙවියන් පිළිබඳ ව කියනු ම කවරේ ද? **හ** යනු අසහනයෙහි නිපාතයි. **න සුප්‍ප ස යෙහා** - විනාශ නො වන්නා වූ, **යකෙඛා හමසමි පරමදධිපපතෙතා** - තමන්ගේ පින වශයෙන් මම දේවත්වයට පැමිණියෙමි. දෙවි වූයේ ද එසේ මෙසේ දෙවියෙක් නො වෙමි. යළි දු උතුම් දිව්‍ය ඍද්ධියට පැමිණියේ වෙමි. **දුරඞ්ගමො** සැණෙකින් දුර ගමන් යාමට සමර්ථයෙමි. **වණ්ණ බලුප ප නෙනා** - රූප ශ්‍රීයෙන් ද. ශරීර ශක්තියෙන් ද පැමිණියේ සමන්විත වෙමි. මේ පදතුනෙන් මන්ත්‍ර ප්‍රයෝගාදී

බලයෙන් තමන් මැඩ පැවැත්විය නො හැකි බව දන්වයි. රූ සපුවෙන් යුත් තැනැත්තේ අනුන්ගෙන් බුහුමන් ලබයි. රූප සම්පත්තිය නිසා නො ගැලපෙන වස්තූන් ගෙන් හෘදය අවුල් විය යුතු නො වේ. වර්ණ සම්ප්‍රදායෙන් ද යටපත් කළ නො හැකි ය.

මෙයින් පසුව අංකුර සහ දේව පුත්‍රයා අතර ගාථා පසළොසකින් සංවාදයක් විය.

ඔබගේ දකුණු අත හැම ලෙසින් ම රන්වන් වෙයි. ඇඟිලි පසින් කැමති සම්පත් වැගිරෙන්නේ ය. විවිධ රස වැගිරෙත්. නුඹ ශක්‍රයායයි මම සිතමි.

මම ප්‍රකට දෙවියෙක් නො වෙමි. ගන්ධර්ව කායික දෙවියෙක් ද නො වෙමි. අඞ්කුරය සේරුව නුවරින් චුත ව මෙහි පැමිණියා වූ ප්‍රේතයෙක් යයි මා දනුව.

නුඹ පෙර අත්බැව් හි හේරුව නගරයෙහි දී කෙබඳු සිල් ඇත්තෙක් වී ද? කෙබඳු සමාචාර ඇත්තෙක් වී ද? කෙබඳු ශ්‍රේෂ්ඨ චර්යාවක් හේතු කොට ගෙන යුෂ්මතාගේ අත්වල පුණ්‍ය ඵලය උපන්නේ ද?

එකල්හී මම හේරුව නුවර සන්නාලියෙක් වීමි. ඉතා දුකසේ දිවි පැවැත්ම ඇති, දිළින්දෙක් වීමි. දන් දීමට කිසිවක් මගේ අත නො වීය.

කර්මඵල විශ්වාසයෙන් යුත්, දන් දීමෙහි ස්වාමී වූ පෙර පින් ඇති, පාපයට පිළිකුල් කරන සුළු අසය්හ සිටුවරයාගේ ගේ අසල කර්මාන්තශාලාව මැහුම්හල පිහිටි යේ ය.

එතනට නො යෙක් ගෝත්‍ර ඇති, සිඟන්නෝ ද, ගුණකියා ඉල්ලන්නෝ ද, පැමිනෙත්, ඔව්හු ඒ අසය්හ සිටුතුමාගේ නිවෙස මගෙන් විමසත්.

නුඹට යහපතක් වේවා! දානය කොතැනක දේ ද? කොතැනකට අපි යමුද ඔවුන් විසින් විමසන ලදුව මම අසය්හ සිටුතුමාගේ නිවස ඇති තැන පෙන්වමි.

අසය්හ සිටුතුමාගේ නිවසෙහි දන් දෙනු ලැබේ ද? එතනට යන්න. යුෂ්මතුන්ට සෙතක් වේ. යයි දකුණු අත දිගුකොට පෙන්වීමි.

ඒ හේතුවෙන් මගේ අත කැමති කැමති සම්පත් දෙන්නේ වෙයි. මිහිරි රස වෑහෙන්නේ වෙයි. ඒ උතුම් හැසිරීමේ හේතුවෙන් මගේ අතෙහි පුණ්‍ය විපාකය පහළ වෙයි.

නුඹ කිසිවෙකුට සිය අතින් දන් නුදුන්ලු. අනෙකකුගේ දානය අනුමෝදන් වෙමින් අත දිගුකොට පාර කීයේ ල.

ඒ හේතුවෙන් නුඹේ අත කැමති සම්පත් දෙන්නේල. මිහිරි රස වෑහෙන්නේල, ඒ උතුම් හැසිරීමේ හේතුවෙන් අතේ පුණ්‍ය විපාක පහළ වූයේල.

නො ඉවසිය හැකි දේ ඉවසන්නා වූ, ශරීරයේ රශ්මි නික්මෙන අසය්හ සිටුවරයාගේ උත්පත්ති ගමන හෝ නැවත පැමිණීම හෝ මම නො දනිමි. එහෙත් අසය්හ සිටුවරයා ශක්‍රයාගේ සහභාවයට පැමිණියේ යයි වෛශ්‍රවණ රජු හමුවේ දී මා අසා ඇත.

හොඳ දේ කිරීම සුදුසුමැයි. සම්පත් ඇති පරිද්දෙන් දන් දීම සුදුසු ම ය. සම්පත් දෙන අත දැක කවුරුනම් පින්කම් නො කරන්නහු ද?

මම මේ වැලිකතරෙන් පහව ගොස් ද්වාරවතී නුවරට නැවත පැමිණ යම් පිණක් මට සැප ගෙන දෙන්නේ ද? දන් වැට එළවා තබන්නෙමි.

ආහාර වර්ග ද පාන වර්ග ද වස්ත්‍ර සේනාසන ද දෙන්නෙමි. පැන් හල් ද ළිං ද කරවන්නෙමි. දුර්ගම ස්ථානයන්හි ඒ දඬු (පිහිටවන්නෙමි)

**එහි පාණි තෙ** - යනු ඔබේ දකුණු අත. **සබ්බසො වණ්ණං** - සියල්ල ස්වර්ණ වර්ණයහ **පඤ්චධාරො** - ඇඟිලි පහෙන් අනුන් කැමති කැමති වස්ත්‍ර ධාරාව එන්නේ ය. යන අරුතින් **පඤ්චධාරො මධුස්සවො** - මිහිරි රස උතුරා යන්නේ - එහෙයින් කියන ලදී. **නානා රසා පග්ඝරන්ති** - මිහිරි කටුක - තීත්ත ආදී නානා විධ රස උතුරා යන්නේ ය. යක්ෂයාගේ කැමැත්ත පරිදි දෙන්නා වූ මිහිරි ආදී රසයන්ගෙන් යුත්, කෑ යුතු පිවයුතු අනුභව කළයුතු දේ අතින් විසිරෙන්නේ මිහිරි රස වැගිරෙත් කියන ලදී. **මඤ්ඤෙහං තං පුරින්දදං**

ඔබ ශක්‍රයා යයි මම හඟිමි. මේ මහානුභාව සම්පන්න ශක්‍ර දිව්‍යරාජයායයි. මම සිතමි. යි යන අර්ථයි. **තමහි දෙවො වෙශ්‍රවණ** ආදී ප්‍රකට වූ දෙවිකෙනෙක් නො වෙමි. **න පි සකෙකා පුරින්දදො** පෙර ආත්ම භාවයෙහි දන්දීමෙහි පිහිටා පුරින්දද යයි නම් ලද ශක්‍ර දිව්‍යරජයා නො වෙමි. "**න ගන්ධබ්බා** - ගන්ධබ්බ කායික දෙවියෙක් නො වෙමි. **පෙතං මං අඞකුර ජානාහි** - අඞකුර පුරුෂයාණි ! මා ප්‍රේත යෝනියෙහි උපන් අයෙකු ලෙස දනුව මහාර් ධී ඇති එක් ප්‍රේතය **යකු වසයෙන්** දනුව ! **හෙරුවම්හා ඉධාගතා** - හේරුව නුවර සිට මෙහි පැමිණියෙ වෙමි. හේරුව නගරයෙන් චුත වී, මේ වාලුකා කාන්තාරයේ මෙම නුග රුකෙහි ඉපදීම් වසයෙන් ආවේ වෙමි. මෙහි ඉපදුනෙමි යන අර්ථයි. **කිං සීලො කිං සමාචාරො හෙරුවසම්ං පුරෙ තුවං** - පෙර පෙර ආත්ම භාවයෙහි හේරුව නුවර වසන්නා වූ ඔබ කවර සීලයක් රැක්කේ ද? කවර සමාචාරයක් වූයේ ද? පව්න් වැලකීම ලක්ෂණ කොට ඇති කෙබඳු සීලයක් සමාදන් වූයේ ද, ප්‍රාප්ති පුණ්‍ය ක්‍රියා ලක්ෂණ කොට ඇති කෙබඳු වූ සමාචාරයක නියුක්ත වූයේ ද? දන්දීම ආදී කුසල සමාචාර ඇසුරෙන් කිනම් සමාචාරයක නිරතවූයේ ද? යන අර්ථයි. **තෙන තෙ බ්‍රහ්ම චරියෙන පුඤ්ඤං පාණිම්හි ඉජ්ඣති** - කෙබඳු ශ්‍රේෂ්ඨ චරියාවකින් ඔබගේ අත්වලින් දැක්වෙන පුණ්‍ය ඵලය මේ අයුරින් සමෘද්ධ වීද? උත්තර පද ලෝපයෙන් පින් යන්න අදහස් කරන ලදී. එහෙයින් "**කුසලානං භික්ඛවෙ ධම්මානං සමාදාන හෙතු එවම් දං පුඤ්ඤං**" පවඩ්ඪති යන අකාරයෙන් පුඤ්ඤං යන්න කියන ලදී.

තුනනවායො - රෙදි මහන්නෙක් **සුකිච්ඡ වුත්ති** - ඉතාම දුක් සහිත ජීවිතයක් ගතකළෙමි. සැප පහසු ජීවිතයක් නො ලැබුවෙමි. **කපණෙ** - දිළින්දෙක් අසරණයා දීන වූ යන අර්ථයි. **නමෙ විජ්ජති දාත වෙ** - (මට දීමට කිසිවක් නො වී ය. මගීන්ට, මහණ බමුණන්ට දීමට කිසිම දිය යුතු වස්තුවක් මට නැත්තේ ය. සිතින් පමණක් දන් දුන්නේ ය. යන අදහසයි. **ආවෙසනං** - ගෘහය කර්මාන්ත කරන ශාලාව **අසය්හස්ස උපන්තිකෙ** - අසය්හ මහා සිටුවරයාගේ ගෙය කිට්ටුව **සද්ධස්සා** - කර්මඵල ඇදහීමෙන් යුක්තවූවහුට, **දානපතිනො** - නිරන්තරයෙන් දන් දීමෙහි පවතිමින්, ලෝභය මැඩ පවත්වා පරිත්‍යාග සම්පත්තියෙන් අනුනව, **ලජ්ජිනො** පවට පිළිකුල් කරන ස්වභාවයෙන් තත්‍රා එහි මගේ නිවාස ය. **යාචනකායන්ති** - යාචකජනයෝ අසය්හ සිටුගෙන් යමක් ඉල්ලාගනු කැමැත්තෙන් පැමිණෙත්. **නා නා ගොත්තා** නො යෙක් ආකාරයේ ගෝත්‍රවලට සම්බන්ධ වූවෝ **වණිබ්බකා** - ගුණ කියමින් ඉල්ලන්නෝ. යම්කිසි දායකයකුගේ පින්ඵල ගුණ යහපත් බව ආදිය වර්ණනාකරමින්, තමන්ගේ නැති බැරි බව කියමින් හැසිරෙන්නෝ,

**තෙවමංතත්‍ථ පුච්ඡන්ති** - තත්‍ථ යනු නිපාතයකි. ඒ යාචක වණිබ්බක ආදීහූ මගෙන් අසය්හ සිටුවරයාගේ නිවාසය විමසත්. මෙබඳු තන්හි දී කර්ම දෙකක් ඉවසත්. **කත්‍ථගච්ඡාම, භද්දං වො කත්‍ථ දානං පදීයතෙ** - ඔවුන් විචාරණ ආකාරය දක්වීමට නිදසුනකි. ඔබට යහපතක් ම වේවා ! අපි අසය්හ සිටු දන් පිරිනමන්නේ යයි අසා ආවෙමු. **කත්‍ථ දා නං පදීයතෙ** - කෙසේ නම් අපි එහි යමු ද? කොතැන්හි ගිය කල්හි ඒ දානය ලැබිය හැකි ද? **තෙසාහං පුට්ඨො වක්ඛාමි** - මෙසේ ඒ මාර්ගික ජනයා විසින් ලබන තැන් විචාරණ ලද මම, පෙර නො කළ පින් ඇති බැවින් මේ අන්දමින් කිසි දෙයක් දෙන්නට අපොහොසත් වූයේ, දන් දෙන තැන මොවුන්ට පෙන්ව මින් දාන වස්තු ලැබීමට උපාය කීමෙන්, ප්‍රීතිය උපදවා ගැනීමෙන්, මෙතෙකින් වත් බොහෝ පින් රැස් කර ගන්නෙමි යි දයාව කරුණාව පෙරදැරි කොට දකුණු අත දිගුකොට අසය්හ සිටුවරයාගේ මන්දිරය කීවෙමි. **පග්ගය්හ දක්ඛිණං බාහුං** ආදිය ඒ සඳහා කීය. **තෙන පාණි කාමදදො** - එසේ අනුන්ගේ දානය ප්‍රකාශ කිරීමෙන් අනුන් විසින් කරන ලද දානය මනාකොට අනුමෝදන් වීමේ හේතුවෙන් පමණක් දැන් මේ කාලයෙහි මගේ අත කප් රුකක් මෙන් ද කල්පලතාවක් මෙන් ද කැමති කැමති සම්පත් දෙන්නේ වෙයි. **තෙන පාණී මධුස්සව** වො - ඒ කුශල් හේතුවෙන් මගේ අතින් කැමති වස්තු වැහෙන්නෙ වෙයි. **නකිර ත්වං අදා දානං** - අනුශ්‍රවාත්‍ථයෙහි **නිපාතය** ඔබ වනාහි තමන් සතු දෙයක් පරිත්‍යාග නො කළේ ය. කිසියම් මහණ බමුණෙකුට තමන් සතු කිසි දාන වස්තුවක් සියතින් නුදුන්නේ ය. **පරස්ස දානං අනුමෝදමානො** - හුදෙක් අනුන් විසින් කරන ලද අනුන්ගේ දානය ඉතා යහපත මහදන් පවත්වන්නේ ය යි අනුමෝදන් වීමෙන්ම බබළයි. **තෙන පාණී කාම දදො** - ඒ පිණින් ඔබගේ අත මෙසේ කැමති දේ දෙන්නක් වූයේ ය. ආශ්චර්යකි, ඒකාන්ත කුශල කර්මයන්හි ස්වභාවය පැවැත්ම පුදුම සහගතය යන අදහයසි. **යො සො දානමදා භන්තෙ පසන්නෙනා සක පාණිහි** - දේවපුත්‍රයාට ගෞරවයෙන් ආමන්ත්‍රණය කරයි. පින්වතුන් වහන්ස ! අනුන් විසින් කරන ලද දානමය පින්කම් අනුමෝදන් වූ ඔබට මෙවැනි විපාකයක් මෙවැනි ආනුභාවයක් ලැබුනේ නම්, ඒ අසය්හ සිටුනම් කෙනෙක් ප්‍රසන්න සිත් ඇත්තේ ව සියතින් මහදන් පැවැත් වූ ඒ සිටුවරයා - **සොහිත්වා මනුස්සං දෙහං** - හෙතෙම මෙහි මනුෂ්‍යාත්මභාවය හැර **කිං** කොහේ **අනුසො** - නිපාත මාත්‍රයකි. **දීසතං ගතො** - කවර දිසාවකට ගියේ ද අසය්හ සිටුවරයාගේ ගති නිෂ්පත්තිය, මතු උත්පත්ති භවය කෙසේ වී ද යි විචාළේ ය. - **අසය්හසායි නො** - ලෝභයෙන් මඩනා ලද්දා වූ අනුන්ගේ මසුරු මල විසින් ඉවසිය

නො හැක්කා වූ, පරිත්‍යාගයන් නිසා සත්පුරුෂ ධර්මය සභාව වසයෙන් ඉසුලු වා වූ බැවින් අසය්හ සහිත නම් වේ. **අඞගීරසස්සා** - අග පසඟින් නික්මෙන්නාවූ බැබළීම, **රසෙති ජුතියා** යනු නාමාන්තරය වේ. තමන් වෙත එන්නා වූ යාචක පිරිස් දැක උදාර වූ සතුටට පත්ව සොම්නස උපදවා පැහැදුණ මුහුණු ඇතිව සිටි ඔහු ගැන ප්‍රත්‍යක්ෂ කොට, **ගතිමාගතං වා** - මේ ආත්මයෙන් චුත වී යාම ගතියයි. ඔහු ගේ ගති ය. අසවල් නම් ස්වභාවයට ගියේ ය යි කියා හෝ, අසවල් කාලයේ දී මෙහි එන්නේ යයි කියා හෝ කියන්නට මම නො දනිමි. එය වූ කල්හි මට විපාක වන්නක් අදාළ වන්නක් නොවේ. **සුතඤ්ච බො වෙසස වණ්ණසස සන්තිකෙ** - නැවත ද අපි වෛශ්‍රවණ රජුට උවැටන් සඳහා ගිය වේලේ ඔහුගේ සමීපයෙන් මෙසේ අසන ලදී. **සක්ක සහව්‍යතං ගතො අසය්හො** අසය්හ සිටුවරයා ශක්‍ර දේවේන්ද්‍රයාගේ සහ භාවයට ගොස් තාවතිංස දිව්‍ය ලෝකයේ උපන්නේ ය. යන අර්ථ යි. **අලමෙව කාතුං කල්‍යාණං** - යම් බඳු වූ යහපත් කුසල් දහම් කිරීමට සුදුසු වන්නේ ම ය. යුතුවන්නේ ම ය. එහි වූ කලි සියලු අංගයන්ගෙන් යහපත් වූ පහසු වූ පින්කම් දැක්වීමට, **දානදා තුං යථාරහං** - තමන්ගේ සම්පත් ඇති පමණින් සුදුසු පරිදි දන්දීම සුදුසු වන්නේ ම ය. එයට කාරණ කියමි. **පාණිංකාම දදං දිසවා** - යම්සේ අනුන් කරණ පින් අනුමෝදන් වීම් වශයෙන් දන් දෙන දානපතියාගේ නිවාසය අත දිගු කරමින් පෙන්වීම් පමණකින් මගේ අත් කැමති කැමති දේ දෙන අයුරු දුටුවේ නො වේ ද? මෙය දැක, **කො පුඤ්ඤං න කරිස්සති** - කවරෙක් නම් තමා පිහිට කොට පින් නො කරන්නේ ද? මෙසේ අනියම් වශයෙන් පුණ්‍ය ක්‍රියාවන්හි ආදර දක්වා දැන් තමා කෙරෙහි ඒ පින නියම කොට (දක්වන්නේ මේ ගාථා දෙක කීහ.)

එහි **සො අහං** - ඒ මම හි අවධාරනයෙහි නිපාතයි. **නූනා** - අදහසෙහි, **ඉතො ගන්ත්වා** මෙම කාන්තාරයෙන් ආපසු ගොස්, **අනුප්පත්වාන දාරකං** - ද්වාරවතී නුවරට සම්ප්‍රාප්තව, **පට්ඨපයිස්සාමි** - දන් වැට පවත්වමි. මෙසේ අඞ්කුර විසින් දන් දෙන්නෙමි යන ප්‍රතිඥාව කළෙන් යක්ෂයා තුටු පහටුව, පින්වත ! ඔබ නිසැකවම දන් දෙනු මැනවි. මම ඔබට සහයෝගය දෙන්නෙමි. යම්හෙයකින් නුඹගේ දාන වස්තුව ක්ෂය නො වීමට මම කටයුතු කරමි. යි ඔහු දන් දීමෙහි උත්සාහ ගන්වා,

නැවත බමුණාට කියනුයේ, එම්බල බමුණ ! ඔබ වනාහි මා වැන්නෙකු බලාත්කාරයෙන් ගැලට නංවාගෙන යනු කැමති වූයේ තමාගේ ප්‍රමාණය

නො දන්නෙහි ද? කියා ඔහුගේ භාණ්ඩ අතුරුදන් කරවා යක්ෂ හිංසාවෙන් හිංසා කරවා ඔහු බිය ගැන්වී ය. ඉක්බිති අඞ්කුර තෙමේ නොයෙක් ආකාරයෙන් යැද බ්‍රාහ්මණයා ලවා ක්ෂමා කරවා, ප්‍රසාදයට පත්කර සියලු භාණ්ඩ ප්‍රකෘති තත්ත්වයට පමුණුවා, රාත්‍රි කාලය පැමිණි කල්හි, යක්ෂයා ගෙන් වෙන් වී (යක්ෂයා හැර) යන්නේ එයට නුදුරින් ඉතා ම පිළිකුල් හා බියකරු පෙනුම් ඇති එක්තරා ප්‍රේතයකු දැක කරන ලද කර්ම විචාරමින්,

කවර හේතුවකින් තො පගේ ඇඟිලි කුණු වී වකුටු වී ද? කොඩොල් කළේ ද? ඇස්වලින් කඳුළු වගුරවත් ද? ඔබ විසින් කරන ලප පාපකර්මය කුමක් ද?

එහි **කුණ්‍ඩා** - වක්වී ද, **කුණ්‍ඩලි කතං** - මුවවිකාරයෙන්, හැකුළුනේ ද? විකාර වත් වී ද? **පඝ්‍ඝරන්ති** කඳුළු නමැති අසුචි වැගිරෙත්

ඉක්බිති ප්‍රේතයා සිරුරෙන් රැස් විහිදුණා වූ ගෘහපතියෙක් වූ ගෘහ වාසී වූ ඒ අසය්හ සිටුවරයාගේ දන් දෙන තැන, දන් දීමෙහි මම ද අධ්‍යක්ෂ වරයෙක් කරන ලද්දේ වීමි.

එහි ආහාර සඳහා පැමිණියා වූ යාචකයන් දැක පැත්තකට වී මුව හකුලුවා ගතිමි.

ඒ පාපකර්මයෙන් මගේ ඇඟිලි කුණු වී, මුහුණ ද කොඩොල් වී, ඇස්වලින් කඳුළු වැගිරීම ද සිදු වේ. මා විසින් කරන ලද පාප කර්මය මෙය යි.

එහි, **අඞ්ගීරසස්සා** යනාදිය අසය්හ සිටුවරයාගේ කීර්තිය යි. **සරමෙසිනො** ගෘහයෙහි වසන්නා වූ ගෘහපතියාගේ, **දානෙ අධිකතො අහුං** - දෙය්‍ය ධර්මයාගේ (දාන වස්තුවේ) ජනයාට දීමෙහි දානය පිළිබඳව මූලිකව ක්‍රියා කරන්නෙක්. වීමි.

**එකමන්තං අපක්කමමා** - ආහාර සඳහා පැමිණි යාචකයන් දැක දන්දීමෙහි නියුක්ත ව සිටින තැනැත්තා. දන් දෙන තැනින් ඉවත් නො වී නියමිත තන්හි ම සිට හටගත් ප්‍රීති සහගත සිතින් යුතු ව ප්‍රසාදයට පත් සිනහ සහගත මුවින් සිය අතින් ම දන් දිය යුතු ය. නැතිනම් සුදුසු පරිදි සුදුස්සන් යෙදවීය යුතු ය. මා වූකලි එසේ නොකොට එන්නා වූ යදියන් දුරදී ම දැක තමන් නොපෙනී එක්පසකට මුවා වී සිට මුහුණ හකුළුවා ගතිමි **අකාසි කුණ්ඩලී** මුඛං මුහුණ පුළුටු කරගෙන හකුළුවාගෙන සිටියෙමි. **තෙන** - එහෙයින්

යම්හෙයකින් එකල මම ස්වාමීයා විසින් දානාධිකාරියෙහි යොදවන ලද්දේ දන් දෙන කාලය එළඹ කල්හි මසුරු සිතින් මඩනා ලදු ව, දන් දෙන තැනින් ඉවත්වෙමින් පා හකුළුවාගෙන සිටියෙම් ද? මා අතින් දියයුතු දානය එසේ නො කොට දෙඅත් හකුළුවාගෙන සිටියෙම් ද? ප්‍රසන්න මුහුණින් සිටිය යුතු තැන මුහුණ හකුළුවා ගෙන පුලුටු කරගෙන සිටියෙමි ද? ප්‍රිය ඇසින් යහපත් ඇසින් බැලිය යුතු කල්හි. කළුකරගත් දෙනෙතින් බැලුයෙහි ද? එහෙයින් අතේ ඇඟිලි වකුටු විය. දෙපා ඇඟිලි වකුටු විය. මුහුණ ද කොඩොල් වී විරූප වී පුලුටු වීය. ඇස්වලින් ද අසුචි මෙන් දුගද වූ කඳුළු වැගිරෙන්නේ ය. යන අර්ථ යි. එහෙයින් කියන ලදී.

එහෙයින් මගේ ඇඟිලි කුණු වී වකුටු වීය. මුහුණ කොඩොල් වි විරූප වී ය. ඇස් වලින් ද දුගද හමන කඳුලු වැගිරෙන්නේ ය.

එපවත් ඇසු අඞ්කුර තෙමේ ප්‍රේතයාට ගරහමින්

නින්දිත පුරුෂය තෝ යම්හෙයකින් අනුන්ගේ දානයෙහි මුහුණ පුළුටු කර ගැනීම් හකුළුවා ගැනීම් ආදිය කළෙහි ද? ඒ නිසා ස්වභාවයෙන් ම, ධර්මානුකුල ව ම මුහුණ හැකිළී ගොස් ඇස්වලින් අසුචි මෙන් වූ කඳුළු වැගිරෙන්නේ ය.

එහි ධම්මෙන යුක්ති සහගත ව ම, යථා කාරණයෙන් ම, **තෙ** නුඹ, **කාපුරිසා** ලාමක පුරුෂය, පහත් වූ පුරුෂය ! **ය** යම් හෙයකින්, පරස්ස දාන ස්ස - අනුන්ගේ දානයෙහි, මේ පෙළ යි.

නැවත ඒ අඞ්කුර තෙමේ දානපති වූ ඒ සිටාණන්ට ගරහමින්, මේ ගාථාව කීහ.

ආහාර පාන, කෑ යුතු දේ, වස්ත්‍ර හා සේනාසන දන් දෙන්නා වූ පුද්ගලයා ඒවා අනුන් විසින් සිදු කළ යුත්තක් කොට කෙසේ පිළියෙළ කරන්නේ ද?

දන් දෙන්නා වූ පුද්ගලයා කෙසේ නම් අනුන් ලවා සිදු කරවන්නේ ද? තමන් විසින් ම ප්‍රත්‍යක්ෂ වශයෙන් දන තමන් අතින් ම දිය යුතු වන්නේ ය. එහි තමන් ම ව්‍යාවෘත විය යුත්තේ ය. අන් පරිද්දෙකින්, අනුන් විසින් කරන කල්හි තමන් ගේ දිය යුතු දාන වස්තු නිකරුණේ විනාශ වන්නේ ය.

දක්ෂිණාර්හයෝ බඩගින්නෙන් පෙළෙන්නාහු ය. මෙසේ සිටාණන්ට ගර්හා කොට දූන තමා පිළිපැදිය යුතු ආකාරය දක්වමින් ගාථා දෙකක් කීහ.

මම මෙහෙන් ගොස් ද්වාරවතී නුවරට පැමිණ මට පරලොව දී සුව එළවන අන්දමට දන් වැට පිහිටු වන්නෙමි.

ආහාර පාන ද වස්ත්‍ර හා සෙනසුන් ද දෙන්නෙමි. පැන් හල් හා පොකුණු පිහිටු වන්නෙමි. දුර්ගම ස්ථානයන් හි ඒ දඬු පාලම් බෝක්කු ආදිය ද තනවන්නෙමි.

ඒ නිසා ම කියන ලදී.

ඒ අඞ්කුර තෙමේ ඒ මරු කතරින් නික්මී ද්වාරවතී නුවරට පැමිණ තමන්ට සුව ගෙන දෙන්නා වූ යම් දානයක් වී නම් ඒ දානය පිහිටු වි ය.

පැහැදුණු සිතින් ආහාර ද බීම වර්ග ද, වස්ත්‍ර හා සෙනසුන් ද දන් දුන්නේ ය. පැන් තාලි හා ළිං ද පිහිටු වී ය.

කවරෙක් සාගිනි ඇත්තේ ද කවරෙක් පිපාසා ඇත්තේ ද, කවරෙකුට වස්ත්‍ර අවශ්‍ය ද (ඕව්හු අවශ්‍ය දේ ලබාගනිත් වා) කවරකුගේ රථවාහන අනතුරට පැමිණියෝ වෙද්ද? මේ වාහන සමුහයෙන් කැමති වාහනයක් යොදා ගනිත්වා.

කවරෙකුට කුඩ අවශ්‍ය ද? කවරෙක් සුවඳ මල්මාලා කවරෙක් පාවහන් කැමති වේ ද? මෙසේ ඒ අඞ්කුරයාගේ නිවසෙහි කපුවෝ ද. සුදු හැදගත් අරක්කැමියෝ ද, සුවඳ දෙන්නෝ ද උදයේ ද සවස ද හැමදාකම ඝෝෂා කෙරෙත්.

මේ සිව් ගාථාවෝ අඞ්කුරගේ දාන පිළිවෙත පැහැදිලි කිරීමට සඞ්ගීති කාරකයන් විසින් තබන ලදී.

එහි **තතො** හි යනු මරු කතරින්, **නිවත්තිත්වා** - යනු ආපසු නික්මී, **අනුප්පත්වාන ද්වා රකං** - ද්වාරවතී නගරයට සේන්දු වි, **දානං පට්ඨපයී අඞ්කුරො** යනු දෙවියා විසින් සම්පූර්ණයෙන් පුරවන ලද දානෝපකරණ ගබඩා ඇත්තේ ඒ අඞ්කුර තෙමේ මහා දානශාලා පිහිටු වී ය. **යං තුමස්ස**

**සුඛාවහං** - යනු යම් දානයක් තමන්ට මෙලොව හා පරලොව සුව එළවන්නේ ද **කො ඡා තො** - යනු කවරෙකුට බඩගින් ඇත්තේ ද හෙතෙම ඇවිත් කැමති පරිද්දෙන් ආහාර අනුභව කෙරේවා යන අදහස යි. සෙසු තන්හි ද මේ ක්‍රමය මැයි **තසිතො** - යනු පිපාසිත වූ, **පරිවස්සති** යනු වස්ත්‍ර හැඳගන්නේ ය. වාසය කරන්නේ ය. පොරවා ගන්නේ ය. යන අර්ථ ය. **සන්තානි** - විඩාවට පැමිණි. අබලන් වූ **යොග්ගානි** - රිය වාහන **ඉතො යොජෙන්තු වාහනං** යනු (වියගහ ආදිය අනතුරට පත් රථ වාහන ) - මේ වියගස් වලින් කැමති එකක් ගෙන වාහනවලට යොදුගනු **කො ඡත්තිච්ඡති** - යනු කොළ ආදි විවිධ ද්‍රව්‍යයන්ගෙන් තැනූ කුඩ යමෙක් කැමති වේ නම් ඔහු කැමති පරිද්දෙන් කුඩ ගනීවා යන අදහස යි. **සෙසුතැන්** වල ද මේ ක්‍රමය මය. **ගන්ධං** යනු සිව් දෑගඳ ආදී සුවඳ ද්‍රව්‍ය යි. **මාලං** යනු ගෙතූ නො ගෙතූ මල් **උපාහනං** - යනු අඩිය වැසූ හෝ නො වැසූ පාවහන් **ඉතිස්සු** - යනු නිපාතයකි. මෙසේ කිසිවෙක් බඩගිනි වූයේ ද කිසි පිපාසිත වූයේ ද ආදී අර්ථයි. **කප්පකා** - යනු කපුවෝ, ඇම්බැට්ටයෝ. **සූදා** - යනු කෝකියෝ, මාගධා - යනු සුවඳ ද්‍රව්‍ය දෙන අය **සදා** - යනු මුළු කාලය ම, දිනපතා උද යේ ද සවස ද ඒ අඞ්කුරගේ වාසස්ථානයෙහි එව කව බොව යනාදියෙන් ඝෝෂා කරයි. හඬ නග යි.

මෙසේ මහදන් පවත්වන්නා වූ (අඞ්කුරගේ දාන ශාලාව) කල් යත් යත් ම යාචකයන්ගේ තෘප්තියට පැමිණි හෙයින් යාචක ජනයන්ගෙන් හිස්විය. විරල විය. (දාන කෙළවර විය) එය දුක අඞ්කුර තෙමේ දානය පිළිබඳ ව උදාර අදහස් ඇති ව නො සතුටු සිතින් යුතු ව, තමාගේ දානමය ක්‍රියාවලියෙහි නියුක්ත සින්දක නම් තරුණයා අමතා මේ ගාථා දෙක කීහ. අඞ්කුර රජු සුවසේ සයනය කෙරේ යයි ජනයා දනි යි. සින්ධකය යම් හෙයකින් යාචකයන් නො දක්නෙම් ද එවිට මම දුකසේ නිදමි.

178. සින්ධකය ! ස්වල් ප වූ හෝ ගුණ කියා ඉල්ලන ජනයා ඇති කල් හි මම සුවසේ නිදමි. එසේ ඉල්ලන්නා වූ පුද්ගලයන් නැති කල්හි මම දුකසේ නිදමි.

එහි **සුඛං සුපති අඞ්කුරො** - අඞ්කුර රජතෙම කීර්තියෙන් ද, භෝග සම්පත්තියෙන් ද, අනූනව දානපතියෙක් ව, තම සම්පත්වලින් ද, දාන සම්පත්තියෙන් ද සතුටු ව සුවසේ නිද යි. සුවසේම පිබිදෙ යි. මේ අන්දමින් ජනයා මා ගැන සිත යි. **දුක්ඛං සුපාමි සින්ධකා** - සින්ධකය ! මම වනාහි

දුකින් ම නිදාගනිමි. කවර හෙයින් ද? **යං න පස්සාමි යාචකෙ** - යාචකයන් නො දකින නිසා - යම් හෙයකින් මගේ අදහසේ හැටියට දාන වස්තු ව පිරිනැමීමට බොහෝ යාචකයන් නො එන්නේ ද නො දක්නේ ද යන අර්ථයි. **අප්පකෙසු වණිබ්බකෙ** - යාචක ජනයා ස්වල්ප දෙනෙකු ඇති කල්හි දුකසේ නිදමි යන අදහස යි. **සු** යනු නිපාත මාත්‍රයකි. යාචකයන් ටිකදෙනෙක් ඇති කල්හි යන අර්ථයි.

ඒ අසා සින්ධක තෙමේ ඔහුගේ උදාර වූ දන්දීමේ කැමැත්ත ප්‍රකට කිරීමට කැමැත්තේ මෙසේ කීහ.

තව්තිසා දෙව්ලොවට හා සියලු ලෝකයාට ඊශ්වර වූ සක් දෙව් රජුන් ඔබට වරයක් දෙන්නේ නම්, ඔබ කෙබඳු වරයක් ඉල්ලන්නේ ද?

සියලු ලෝකයාට අධිපති වූ ද, තව්තිසා දෙව්ලොව අධිපති වූ ද ශක්‍රයා ඔබ කැමති වරයක් ගන්නැයි ඔබට වරයක් දෙන්නේ නම්, අඞ්කුර රජුනි කිනම් වරයක් ඔබ පතන්නේ ද ඉල්ලන්නේ ද? අඞ්කුර රජු තමාගේ අදහස තත් වූ පරිදි අගවා කියන්නේ

තව්තිසා වාසීන්ට අධිපති වූ සක් දෙව් රජු ඉදින් මට වරයක් දෙන්නේ නම්, උදය කාලයෙහි පිබිදුනා වූ මට, හිරු උදාවන කල්හි

දෙව් ලොවට ඇතුළත් වූ ආහාරයෝ උපදින්නා හු නම්, යාචක ජනයා සිල්වත් වන්නාහු නම්, දන් දෙන්නාවූ මගේ දාන වස්තුව අවසන් නො වන්නේ ද? මම දන් දී පසුතැවිලි නො වේනම්, දන් දෙමින් සිත පහදවන්නෙම් නම්, එබඳු වරයක් ශක්‍රයාගෙන් මම ඉල්ලා සිටිමි.

එහි **කාලුට්ඨිතස්ස මේ සතො** - උදය කාලයෙහි නැගිටීම, යාචකයන්ට දියයුතු දෙය්‍යධර්මය ගෞරව කිරීම් පිළිදගුම් කිරීම්, වීර්ය සම්පන්න වීම් ආදියට සමාන ය. **සුරියුග්ගමනම්පති** - හිරු උදාවන වේලාවෙහි. **දිබ්බා භක්ඛා පාතු භවෙය්‍ය** - දිව්‍යලෝකයෙහි ආහාර පහළවීම - **සීලවන්තොච යාචකා** - යාචකයන් ගේ සිල්වත් වීම හා ඔවුන් ගේ යහපත් චරියාධර්ම ඇති බව - **දදතො මෙ නඛීයෙථ** - එන්නා වූ සියල්ලන්ට දන් දෙනවිට දෙය්‍ය ධර්මයාගේ (දානවස්තුවේ) අවසන් වීමක් නො මැතිවීම - **දත්වා නානු පතෙය්‍ය** - දිය යුතු දන් දී කිසි විටෙක අපැහැදීමක් දූක පසුතැවිල්ලකට පත්

නො වීම, **දදං චිත්තං පසා දායෙ** - දෙන දේ සිතේ ප්‍රසාදයෙන් ම දීමට, පහන් සිතින් යුතුවම දන් දීමට, **එවං සක්කං වරං වරෙ** - ශක්‍ර දේවේන්ද්‍රයාගෙන් නීරෝගී බව, දිය යුතු දාන වස්තු ලැබීම, ප්‍රතිග්‍රාහක සම්පත්තිය (දීමට සුදුස්සන්ම) ලැබීම දාන වස්තුවේ ක්ෂය නො වන තත්ත්වය, දායක සම්පත්තිය, යන වර පස ඉල්ලන්නෙමි. මෙහි **කාලුට්ඨිතස්ස මෙ සතො** - උදය කාලයෙහි නැගිටීම යන්නෙන් නීරෝගී සම්පත්තිය, **දිබ්බා භක්ඛා පාතු භවෙය්‍යං** - දිව්‍යාහාර පහළ වීම, **සීලවන්තා ච යාචකා** - යාචකයෝ සිල්වත් හු වෙත්වා යන්නෙන් දක්ෂිණාර්හ සම්පදාව, **දදතො මෙ නඛීයෙථ**, මෙයින් දෙය්‍ය ධර්මයාගේ දාන වස්තුවේ අසීමිත බව **ක්ෂය** නොවන බව. **දත්වා නානු තපෙය්‍යහං දදංචිත්තං පසාදෙය්‍ය** - දන් දී පසුතැවිලි නොවීම යන්නෙන් දායක සම්පත්තිය, මේ පස්වැදෑරුම් සම්පත් කැමති වෙමි. ඒ සම්පත් වලින් දානමය පුණ්‍ය කර්මයාගේ උසස් බව උදාර බව පවතින්නේ ය. යන්න යි. මෙසේ අඞ්කුර තෙමේ තමාගේ අදහස පළ කිරීමෙන් පසු එහි සිටි නීති ශාස්ත්‍රය පුහුණු කළ සෝණක නම් එක් පුරුෂයෙක් ඒ අඞ්කුරයන් බොහෝ කොට දන් දීමෙන් මුදවනු කැමති ව, මේ ගාථා දෙක කීහ.

182. සියළු ධනය අනුන්හට නො දිය යුතු ය. දන් දිය යුතු ය. ධනය ද රැකිය යුතු ය. දීමට වඩා ධනය ම ශ්‍රේෂ්ඨ ය. අධික කොට දීමෙන් පරපුර නො පවතිත්.

183. නුවණැත්තෝ නොදීම ද, පමණ ඉක්මවා දීම ද නො පසසති. එහෙයින් දීමට වඩා වස්තුව රැකීම ම උසස් වේ. සම විධියෙහි පැවතිය යුතුය. එය බුද්ධිමතුන්ගේ ධර්මය යි.

මෙහි **සබ්බ විත්තානි** - සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වශයෙන් සියලු වස්තු උපකරණ ධනය යන අදහස යි. **පරෙ** - අනුන් කෙරෙහි, පිටස්තර උදවිය යන අර්ථ යි. **නදජ්ජ** **වෙච්ෙ** නො දිය යුතු ය. දක්ෂිණාර්හයන් ලැබුනේ ය යි කියා කිසිවක් ඉතිරිනොකොට සියලු ධනය පරිත්‍යාග නො කළ යුතු ය. යන අර්ථ යි. **දදෙය්‍ය දානඤ්චා** - සියලු දේ ම සියල්ලන් විසින් දාන ධර්මය නො කළ යුතු ය. තමන්ට ලැබෙන සම්පත් දැන, එය බෙදා වෙන්කොට ගෙන සුදුසු දේ දන්දිය යුතු ය. නො ලත් දෙය ලැබීම හා ලත් දෙය රැක ගැනීම හා ආරක්ෂා කිරීම සමතුලිත බවින් රැක්කයුතු ය.

වස්තුවෙන් එක් කොටසක් අනුභවය සඳහා ද කොටස් දෙකක් කර්මාන්ත සංවර්ධනය සඳහා ද, සතර වැනි කොටස විපතක දී ගැනීමට තැන්පත් කර තැබීම ද කළ යුතු ය. යනු කියන ලද ආකාරයෙන් ධනය රැක්ක යුතු ය. දාන වස්තුව එය මුල්කොට ඇති බැවින් මාත්‍රා තුන ම ඔවු නොවුන් පිරිසිඳු කිරීමෙන් සෙවිය යුතු ය. කියා නීති චින්තකයෝ කියති, **තස්මා** - යම් පරිද්දෙකින් ධනය රකිමින් ම දන් දීම ද කළ යුතු ය. දෙලොව හිත සුව පිණිස පිළිපැදිය යුතු ය. (සියල්ලට) ධනය මුල්කොට ඇති නිසා දීමට වඩා ධනය ම ශ්‍රේෂ්ඨ වෙයි. සුන්දරතර වෙයි. අධික වසයෙන් දීම නො කළ යුතු යි. යන අදහසයි. එහෙයින් කියන ලදී. **අතිප්පදා නෙන කුලා න හොන්ති** - ධනයෙහි ප්‍රමාණය නො දන දන් දීම අධික ව කිරීමෙන් කුල පරම්පරාව නො පවතිත් කුල පරපුර සිඳ දමත් දූන් නුවණැත්තන් විසින් ප්‍රශංසා කරන ලද අදහස් හි පිහිටුවමින් **අදානමති දානඤ්ච** යන ගාථාව කීහ.

එහි **අදානමති දානඤ්චා** - යනු බත් හැන්දක් වත් හාල් මිටක් වත් නො දීම ද ප්‍රමාණය ඉක්මවා පරිත්‍යාග නම් වූ අති දානය ද නුවණැති බුද්ධිමතුන් විසින් ප්‍රසංසා නො කරති. වර්ණනා නො කරති. සම්පූර්ණයෙන් නො දීමෙන් පරලොව සැපතින් පිරිහෙයි. අති දානයෙන් මේ ආත්මයෙහි කුල පරපුර පිරිහේ. **සමෙන ච තෙනයාා** - විසම නො වු ද ලෞකික උගතුන් විසින් නො ගැරහිය යුතු ද මැදුම් පැවැත්මෙන් පැවතිය යුතු ය. **සමීර ධම්මො** - මෙසේ කියන ලද පරිදි දීම - නො දීම යන ප්‍රතිපත්තියක් වේද? එය නුවණැත්තන් ගේ ප්‍රඥාව දරන්නන්ගේ නීති න්‍යායයෙහි දක්ෂ වූවන්ගේ ද ධර්මය වේ. ඔවුන් විසින් ගිය මාර්ගය දක්වයි.

ඒ අසා අඞ්කුර තෙමේ ඔහුගේ අදහස වෙනස් කරමින් කියන්නේ

පින්වත් මාණවකය ! මම දෙන්නෙම් ම ය. සත්සුන් සත්පුරුෂයෝ ම මා ඇසුරු කරති. නියමිත ස්ථානයන් පුරවමින් මහා වැස්සක් වසින්නක් මෙන් සියලු යාචක ජනයන් සතුටු කරවන්නේ නම් යෙහෙකි.

සිඟන්නන් දක යම් කිසිවකුගේ මුහුණ ප්‍රසන්න වේද? පහදී ද? දන් දී සතුටු වන්නේ ද ඒ ගෙයි වසන්නවුනට සැප ගෙන දේ.

යමෙක් යාචකයන් දක පහදී ද මුව මඩල පැහැදේ ද? දන් දී සතුටු සිත් ඇති වේද? මෝ තොමෝ කුසලයාගේ සම්පත්තිය පිරීම වේ.

දන් දීමට පෙර සතුටු සිත් ඇත්තේ වේ ද? දන් දෙමින් සිත පහදවන්නේ ද දන් දී අවසානයේ සිත සොම්නස් වේද? මේ පුණ්‍යයාගේ සම්පත්තිය යි. මේ ගාථා සතරින් තමාගේ පිළිපැදිය යුතු විධිය ආකාරය පැහැදිලි කළේ ය.

එහි අහො වතා - ඉතා යෙහෙකි, අරෙ ඇමතීම යි, **අහමෙව දජ්ජනති** - මම දෙන්නේම වෙමි. මේ සංක්ෂේපාර්ථය යි. තරුණය ! දීමට වඩා ධනයම ශ්‍රේෂ්ටය යි යම්කිසි නීති ශාස්ත්‍රඥයෝ මෙසේ යමක් කීව ද මම දෙන්නෙම් ම ය. **සනෙතා මෙ සප්පුරිසා භජෙය්‍යුං** - එසේ දන් දෙන කල්හි කය වචනය සිත සන්සුන් කරගත් සත්පුරුෂයෝ මා ආශ්‍රය සඳහා ඉදිරිපත් වනු ඇත. **මෙසොච තිනහා තහි පූරයනෙතා** - පහත් බිම් පුරවමින් වසින්නා වූ මහ වැස්සක් මෙන් සියලු යාචකයන්ගේ මන දොළ පුරවමින් ඔවුන් සන්තර්පනය කරන්නෙමි. එය ඉතා යහපත් වන්නේ ය. **යසස යාචනකෙ දිසඎා** - ගෘහවාසී වූ යම් පුද්ගලයෙක්, යදියන් දැක පළමු ව තමන් වෙත එළඹී පින්කෙත ය යි ශ්‍රද්ධාව හට ගැනීමෙන් මුහුණේ පැහැය දීප්තිමත් වේ ද, සතුටුවේ ද? ඒ යදියන්ට සුදුසු දේ දන් දෙමින් ප්‍රීති සොම්නසින් යුක්ත වේද? සිතේ ප්‍රසාදය ඇති ව ඔවුන් කැමති පරිද්දෙන් ඔවුන්ට දන් දී අනතුරු ව සතුටු වන්නේ ද? **එසා පුඤඤසස සමපදා** මේ පුණ්‍ය සම්පත්තිය සම්පූර්ණ වූයේ ය, හටගත්තේ ය යන අර්ථ යි. **පුබෙබව දානා සුමනො** පුණ්‍ය සම්පත් නිධානය අනුගාමික නිධානයක් තැන්පත් කරන්නේ ය යි පෙර මෙන් ම, දාන උපකරණ සකස් කිරීමේ පටන් ම යහපත් සිතැත්තේ, සතුටු සිත් ඇත්තේ වන්නේ ද? **දදං චිතතං පසාදයෙ** දෙන්නා වූ දාන වස්තුව දක්ෂිණාර්හයන්ගේ අත්හි තබත්ම අසාර වූ අනිත්‍ය වූ ධනයෙන් සාරවත් වූ දානය පින්කමක් කරන්නේ යයි තමා ගෙ සිත පහදවා ගනී ද? **දතඎා අතතමනො හොතීති** දක්ෂිණාර්හයන් වෙත දෙය්‍ය ධර්මය පරිත්‍යාග කොට නුවණැත්තෙක් නම් මා විසින් නො උපදනා පිණක් උපදවා ගත්තේ ය යි අනේ මැනැවි යහපතියි සතුටු සිත් ඇත්තේ ප්‍රමුදිත මනස ඇත්තේ, ප්‍රීතිය සොම්නස හටගත්තේ වේ. **එසා පුඤඤසස සමපදා** - යම් කිසිවෙක් මෙපරිද්දෙන් පූර්ව චේතනාව ය, මධ්‍යම චේතනාව ය, අපර චේතනාව ය, යන මොවුන් ගේ කර්මපල ඇදහීමෙන් සොම්නසින් යුතු වූ චේතනා සම්පූර්ණ කරන්නේ ය. මෝ තොමෝ පුණ්‍ය සම්පදා සම්පත්තිය යි. වෙනත් අදහසක් නැත්තේ ය. මෙසේ අඞ්කුර තෙමේ තමා ගේ පිළී පැදීමේ ක්‍රමය ප්‍රකාශ කොට බොහෝ සෙයින් සතුට පැමිණ, දන් දීමේ අදහසෙහි අභි වෘද්ධියට පැමිණ, දවස් පතා මහ දන් පැවැත්වි ය. එකල්හි සියලු රාජ්‍යවල නඟුල් උඩතබා මහා දන් පවත්වන කල්හි සියලු උපකරණ ඇති මනුෂ්‍යයෝ තම තමන්ගේ කර්මාන්ත අත්හැර සුවසේ හැසිරුණාහු ය. එකල්හි

රජවරුන්ගේ කොටුගෙවල් හිස්වූහ ඉක්බිති රජවරු අඬකුර වෙත දූතයන් යැවූහ. සහෝදරය ! ඔබගේ දන් දීම නිසා අපගේ ආදායම් මාර්ග විනාශ වූයේ ය. කොටු ගෙවල් හිස් වූහ. මෙහි කළයුතු යුතු කම් හා අර්ථ දැනගනීවා. එය අසා අඬකුර තෙමේ දක්ෂිණාපථයට ගොස්, ද්‍රවිඩ ප්‍රදේශයේ මුහුදට නුදුරු තන්හි මහා දන්හල් කරවා, මහා දන් වැට පවත්වා ආයු ප්‍රමාණය ගෙවා කා බුන් මරණින් පසු තව්තිසා දෙව්ලොව උපන්නේ ය. ඔහුගේ දාන ඓශ්වර්ය ද, ස්වර්ගෝත්පතිය ද විස්තර කරන සඞ්ගීති කාරකයෝ මේ ගාථා ලීහ.

දන්දීමේ අදහස ඇති අඬකුර රජුගේ ගෙදරදොර සහලින් පුරවන ලද කරත්ත හැටදහසක් ආහාර සඳහා සත්ත්වයන්ට නිතර දෙති.

මහා යාගයයි හැඳින් වූ දාන විධියෙහි යෙදුනා වූ තුන් දහසක් පමණ සේවකයෝ නොයෙක් අබරණින් සැදී, අඬකුර රජු නිසා ජීවත් වෙති.

මැණික් එබ්බූ කුණ්ඩලාභරණ පැළඳ ගත් සැට දහසක් තරුණ මාණවකයෝ අඬකුර රජුගේ නිවසෙහි දර පලත්.

අඬකුර රජුගේ මහා දානයෙහි සර්වාභරණයෙන් සැරසුණු තරුණියෝ සොළොස් දහසක් කුළු බඩු කුඩු කරත් අඹරත්.

සර්වා ලඞ්කාරයෙන් සැරසුණු තරුණියෝ දොළොස් දහසක්, අඬකුර රජුගේ දාන ශාලාවේ හැඳිගත් අත් ඇතිව ඉවීම් හා බෙදීම් කටයුතු කරත්.

අඬකුර රජු බොහෝ දාන වස්තු, බොහෝ ජනයන්ට බොහෝකලක් මුළුල්ලෙහි විශේෂයෙන් සකස් කොට ගරු බුහුමන් සහිතව නැවත නැවත සියතින්ම දන් දුන්නේ ය.

අඬකුර තෙම බොහෝ මාස ගණනක්, බොහෝ පක්ෂ ගණනක්, නොයෙක් ඍතු ගණනක්, බොහෝ වසර ගණනක් වසයෙන් දීර්ඝ කාලාන්තරයක් මහා දන් පැවැත් වී ය.

මෙසේ ඒ අඬකුර රජු දිගු කලක් දන් දී මහත් යාග කොට මිනිස් සිරුර හැර පියා තව්තිසා දෙව්ලොවට පැමිණියේ ය.

මෙහි **සටඨිවාහ සහස්සානි** - කරත්ත හැටදාහක්, සහල් ආදී ද්‍රව්‍ය පුරවන ලද ගැල් හැට දහසක්, **පුඤ්ඤපෙක්ඛස්සා** - අධිකලෙස යෙදුණු දන්දීමේ අදහස අඞ්කුර රජුගේ නිවසෙහි නිතර දවස්පතා, **ජන්තුනො** - සත්ත්වයන්ට ආහාර දීමේ යෙදීම, **තිසහස්සානි සූදා** - යනු තුන් දහසක් පමණ අරක්කැමියෝ බත් පිසන්නෝ, ඔව්හු ප්‍රධානයෝ ය. ඔවුන් අතර එකිනෙකාගේ විධාන අනුව වැඩ කරන බොහෝ දෙනෙකි. **සූදානන්ති** - ඉගෙනගනිත් හදාරත්. **ආමුක්ත මණි කුණ්ඩලා** - නොයෙක් ආකාර මැණික් ඔබ්බවන ලද කුණ්ඩලාභරණ දරමින්, නිදර්ශනයක් පමණි. මැණික් ඔබ්බවන ලද හිණ බැඳි පටි, වළලු, මාල ආදී ආභරණ ඔවුන්ට වූහ. **අඞ්කුරං උපජීවන්ති**, අඞ්කුර නිසා ජීවත් වෙති. අඞ්කුර රජු පිහිටකොට ඇති ව ජීවත් වෙති. **දානෙ යඤ්ඤස්ස ව්‍යාවටා** - මහා යාගය යයි හඳුන්වන ලද යාගය නම් වූ දානය සකස් කිරීමෙහි යෙදුනා වූ උත්සාහයට පැමිණියා වූ **කට්ඨං ඵාලෙන්ති මාණවා** - නොයෙක් විධියේ ඛාද්‍ය භෝජ්‍ය ආහාර විශේෂ පිසීම සඳහා ලස්සණට සැරසුණු තරුණ මිනිස්සු දර පලත්, බෙදාවෙන්කරත් **විධා** - ආහාර පාන පිසීම් බෙදීම් ආදිය විධානකටයුතු **පිණ්ඩෙන්ති** - කුඩු කිරීම් ඇඹරීම් ගලගෑම් ආදී කටයුතුවල යොදත්. **දබ්බිගාහා** - හැඳිගත් අත් ඇත්තෝ, **උපට්ඨිතා** - වසන තැන්වලට එළඹ සිටියෝ වෙත්. **බහුං** - මහත්, බොහෝ, පුළුල් වූ, **බහුනනං** - යනු බොහෝ විවිධ, **පාදාසි** - ප්‍රහර්ෂයෙන් තුටු සිතින් දුන්හ. **චිරං** යනු බොහෝ කල්. විසි දහසක් අවුරුදු ආයුෂ ඇති ව ඔහු උපන්නේ බොහෝ කාලයක් දන් දෙන්නේ එපරිදි දුන්නේ ය. එය දැක්වීමට **සක්කච්චඤ්චා** යනාදිය කීහ.

**සක්කච්චං** යනු සාදරයෙන් විධාන නොකොට, අවමන් නො කොට, **සහත්ථා** - කෑම බීමාදීය සියතින් ගෙන, **චිත්තීකත්වා** - ගරුබුහුමන් පෙරදැරිව, පූජාකොට, **පුනප්පුනං** - බොහෝ වාරයක්, එක වරායක් නොවේ නැවත කීපවිටක් පෙරැත්ත කරමින් දුන්නේ ය යන යෙදුමයි. දන් ඒ කාරණයම නැවත නැවත විස්තර කරන්නට **බහුමාසෙ** ආදී ගාථා කීහු.

එහි **බහුමාසෙ** - බක්මාසයේ සිට බොහෝ අනෙක් මාසවල **පක්ඛෙ** - මාසේපෝය පක්ෂයෙහි හා පසළොස්වක පක්ෂයේ. (සඳ නැති කල සහ ඇතිකල) **උතු සංවච්ඡරානි** - වසන්ත ගිම්හාන ආදී ඍතුන්හි, බොහෝ අවුරුදු වල වසර ගණනක් පුරා අත්‍යන්ත සංයෝගයේ යෙදිම වචන යි. **දීඝමන්තරං** - අතරක් නැතිව දිගුකලක්, මෙහි ද **චිරංපාදාසි** - බොහෝ කල් දන් වැට පැවැත් වූ බව කියා නැවත දානය නිරතුරු ව ම පැවැත් වූ බව දක්වන්නට. **බහුමාසෙහි** ආදිය කී බව දත යුතු යි. **එවං** යනු කියන ලද

ආකාරයෙනි, **දත්වා යජිත්වා** - අර්ථ වශයෙන් එක ම ය. සමහර දක්ෂිණාර්හයන්ට සමහර දාන වස්තු පරිත්‍යාග වශයෙන් දී, නැවත නොයෙක් දාන වස්තු බොහෝ කාලයක් මුළුල්ලෙහි සියලු යාචකයන්ට කැමති පරිද්දෙන් දන් දෙමින් මහායාග වශයෙන් පූජාකොට **සො හිත්වා මානුසං දෙහං තාව තිං සූප ගො අහොසි** ඒ අඞ්කුර තෙමේ ආයුෂ කෙළවර මිනිසත් බව හැර ප්‍රතිසන්ධි ගැනීම් වශයෙන් තව්තිසා දෙව්ලොව දේව නිකායෙහි උපන්නේ ය.

මෙසේ ඒ අඞ්කුර තෙමේ තව්තිසාවෙහි ඉපිද දිව්‍ය සම්පත් විඳින කල්හි අපගේ භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ ඉන්දක නම් මාණවකයෙක් පිඬු පිණිස වැඩම වූ ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේට පැහැදුනු සිතින් බත් හැන්දක් පිදීය. හෙතෙම මෑත කලෙක කළුරිය කොට ක්ෂේත්‍රගත පින්කමේ ආනුභාවයෙන් තව්තිසාවේ මහා සෘද්ධි ඇති මහානුභාව සම්පන්න දිව්‍ය පුත්‍රයකු වී ඉපි ද දිව්‍යමය රූප සම්පත් ආදී දස ආකාරයකින් අඞ්කුර දේව පුත්‍රයා අභිභවා බබළයි. එහෙයින් කියන ලදී.

ඒ ඉන්දක දෙව් තෙමේ අනුරුද්ධ තෙරුන්ට හැන්දක් පමණ බත් දන් දී, මිනිසත් බව හැර පියා තව්තිසා දෙව්ලොවට පැමිණියේ විය.

ඉන්දක දිව්‍ය පුත්‍රයා සම්පත් කරුණු දහයකින් අඞ්කුර දිව්‍ය පුත්‍රයා අභිබවා බබළයි සිත්කළු වූ රූප සම්පත්තියෙන් ද, ශබ්දයෙන් ද, රසයෙන් ද, සුවඳින් ද, ස්පර්ශයෙන් ද,

ආයු සම්පත්තියෙන් ද, පිරිවර සම්පත්තියෙන් ද, ලස්සණ සම්පත්තියෙන් ද, සැප සම්පත්තියෙන් ද, ඓශ්වර්ය සම්පත්තියෙන් ද, ඉන්දික දෙවියා අඞ්කුර දෙව් මැඩ බබළයි.

එහි **රූපෙ** - තමන්ගේ රූපසම්පත්තිය නිමිතිකොට යන අර්ථ යි. රූපයේ හේතුව **සදෙද** - ශබ්ද අනිත් තැන් වල ද එම ක්‍රමයමයි. **ආයුනා** - දෙවියන්ගේ ආයුෂ පිරිසිඳින ලද ප්‍රමාණයයි කියන ලද්දේ වේ ද? ඇත්තය එසේ කියන ලදී. එය වූ කලි බොහෝ වශයෙන් කියන කල (සාමාන්‍ය සම්ප්‍රදාය යි) ප්‍රයෝග විපත්ති ආදියෙන් සමහර දෙවිවරුන්ගේ මරණය අතරතුර වන්නේ ය. ඉන්දික දෙවියා තුන් කෝටි හැට දහසක් අවුරුදු දෙව්ලොව ජීවත් විය. එහෙයින් **ආයුනා අතිරොචතී** - යයි කියන ලදී. **යසසා**

- මහත් වූ පිරිවර සම්පත්තිය. **වණ්ණෙන** - වර්ණ සම්පත්තිය, ලස්සණ පෙනීම (රූපය හා පාට) මෙය රූපය සඳහා කියන ලදී. **ආධිපච්චෙන** - ඓශ්වර්ය ය.

මෙසේ අඞ්කුර හා ඉන්දක තව්තිසා දෙව්ලොව ඉපි ද දිව්‍ය සම්පත් වළඳන කල්හි, අපගේ භාග්‍යවතුන් වහන්සේ බුද්ධත්වයෙන් සත්වන අවුරුද්දේ ඇසළ මස සැවැත්පුර ගණ්ඩබ්බ රුක් මුල්හි යමක ප්‍රාතිහාර්ය කොට අනුක්‍රමයෙන් තුන් පියවරින් තව්තිසා භවනයට ගොස් පරසතු රුක මුල පාණ්ඩුකම්බල ශෛලාසනයේ වැඩ හිඳ යුගන්ධර පර්වතයේ දෙවැනි සූර්යා මෙන් බබළමින් දශවිධ ලෝකධාතුවෙන් රැස් වූ දිව්‍ය බ්‍රහ්ම පිරිසගේ ආලෝකය තමන්ගේ ශරීරාලෝකයේ මැඩ පවත්වා, අභිධර්ම දේශනාව දෙසීමට වැඩහුන් වේලේ, ලඟසිටි ඉන්දක දිව්‍ය පුත්‍රයා ද, දොළොස් යොදුනක් ඈත සිටි අඞ්කුර දිව්‍ය පුත්‍රයා ද දැක දක්ෂිණාර්හ සම්පත්තිය වර්ණනා කරනු පිණිස, මේ ගාථාව වදාළහ.

අඞ්කුරය තොප විසින් දීර්ඝ කාලයක් මහාදන් දෙන ලදී. (එහෙත්) ඉතා දුරින් සිටින්නෙහි ය. මාගේ හමුවට සමීපයට එව !

එය අසා අඞ්කුර තෙමේ, කියන්නේ, මා විසින් දීර්ඝකාලයක් බොහෝ දාන වස්තු පරිත්‍යාග කොට පවත්වන ලද මහා දන් දක්ෂිණාර්හ සම්පත්තිය නො ලැබීම නිසා කුඹුරක් නුවූ තැනෙක වපුරන ලද බීජ මෙන් මහත් ඵල නො ලැබුනේ ය. ඉන්දක වනාහි එක ම බත් හැන්දක් භික්ෂාව වසයෙන් පිදීම, දක්ෂිණාර්හ සම්පත්තියෙන් යුක්ත වූ බැවින් යහපත් කුඹුරක වපුල බීජ මෙන් මහත්ඵල මහානිසංස වූයේය යි. කීය. එහි අර්ථය පහදන සඞ්ගීති කාරකයෝ.

පුරිෂෝත්තම වූ බුදුන් වහන්සේ තව්තිසා දෙව්ලොව පරසතු රුක්මුල පාණ්ඩුකම්බල ගල් අස්නෙහි යම් කලෙක වැඩ හුන්නේ ද?

දස දහසක් ලෝක ධාතුවල දෙවිවරු රැස්ව මෙර මුදුනෙහි වසන්නා වූ බුදුහාමුදුරුවන් ඇසුරු කරති.

අඞ්කුර දෙවි එකල්හි දොළොස් යොදුනක් ඈතින් සිටියේ ය. ඉන්දක දෙවියා බුදුරදුන්ට නුදුරින්ම බබළමින් සිටී.

බුදුහාමුදුරුවෝ අඞ්කුර ද, ඉන්‍දක ද දෙව්වරුන් බලා, දීමෙහි සුදුස්සා පිළිබඳ ව ප්‍රකාශ කරමි මෙසේ වදාළහ.

බුදුහාමුදුරුවන් විසින් මෙහෙයවන ලද අඞ්කුර දිව්‍ය පුත්‍රයා මෙසේ කීයේ ය. මගේ දානය පිළිගැනීමට ඒ සඳහා සුදුස්සෝ නො සිටියහ. එවැනි දානයකින් කවර ප්‍රයෝජන ද?

මේ ඉන්දක දෙව් තෙම ඉතා සුළු දානයක් දී තාරකා සමූහයක් මැද පුන්සඳ මෙන් අතිශයින් බබළයි.

යම්සේ තද භූමි භාගය ඇති පොළවෙහි (බොරළු පොළවක) බොහෝ කොට වපුරන බීජ වලින් මහත් ප්‍රතිඵල නොලැබේ. ගොවියා සතුටු නො කෙරේ.

එසේ ම දුශ්ශීලයන් විෂයයෙහි පිහිටුවන ලද මහා දානය උදාර විපාක ඵල ලබා නො දේ. දායකයා සතුටට පත් නො වේ.

යම්සේ සරුසාර කෙතක වපුරන ලද බීජ ස්වල්ප වුවත්, මනාකොට වැසි ලද කල්හි ශස්‍ය ඵලය මහත් වී ගොවියා සතුටු කරවයි.

එසේ ම වූ ගුණවන්ත වූ, සිල්වතුන් කෙරෙහි, (විෂයයෙහි) කරන ලද ඉතා ස්වල්ප වූවත්, මහත් විපාක ඵල ලබා දෙයි.

එහි **තාවතිංසෙ** - තව්තිසා දෙව්ලොව, **සිලාය පණ්ඩු කම්බලෙ** - පාණ්ඩු කම්බල නම් වූ ගල් ආසනයෙහි, **පුරිසුත්තමො** - බුදුන් වහන්සේ බබළන්නේ ය යන යෙදීමයි. **දසසු ලොක ධාතුසු සන්නිපතිත්වාන දෙසනා** - ජාති ක්ෂේත්‍ර වසයෙන් හඳුන්වන සක්වල දස දහසක කාමාවචර දෙවියෝ, බ්‍රහ්ම දෙවියෝ, භාග්‍යවතුන් වහන්සේ ඇසුරු කිරීම, උන්වහන්සේගෙන් බණ ඇසීම සඳහා රැස්වී, **පයිරුපාසන්ති සම්බුද්ධං වසන්තං නග මුද්ධනි** - මහමෙර මුදුනේ යන අර්ථයි. **යොජනානි දස ද්වෙච අඞ්කුරොයං තදා අහු** මේ යථා ලෙසින් කියන චරිතයකි. එකල අඞ්කුර දෙවියා බුදුන් හමුවන විට දොළොස් යොදුනක් ඈතින් සිටියෙහි ය. ශාස්තෘන් වහන්සේ සිටි තැන සිට දොළොස් යොදුනක් ඈතින් සිටියේ ය. යන අර්ථයි. **චොදිතො භාවිතත්තෙන** - පාරමිතා පූරණයෙන් ද, ආර්ය මාර්ග භාවනා වැඩීමෙන් ද

යුක්ත වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මෙහෙයවනු ලබන්නේ. **කිං මයහං තෙනාති** - ආදිය ශාස්තෲන් වහන්සේට පිළිතුරු වශයෙන් අඞ්කුර දෙවියන් විසින් කියන ලද ගාථා.

එහි **දක්ඛිණෙය්‍යෙන සුඤ්ඤකං** - ශූන්‍ය වූ, හිස් වූ, විරහිත වූ දක්ෂිණාර්හ ගුණ ඇත්තන් විසින් එදා මගේ දානය පිළිගන්නා ලද හෙයින්, මාගෙ දානයාගෙ පුණ්‍ය ඵල විපාකය නින්දාවට පැමිණයේ ය. (හීන, අල්ප, වූයේ ය) **යක්ඛො** - දේව පුත්‍රයා - **දජ්ජා යනු දී, අතිරොචති අම්හෙහි** - මා හමුවෙහි ම අතිශයින් බබළයි. **හි යනු** නිපාතයකි. අප ඉක්මවා මැඩපවත්වා බබළයි යන අර්ථයි. යම් සේ ද, **චන්දො තාරගණෙ යථා** තාරුකා සමූහයා අතර චන්ද්‍රයා මෙනී, **උජ්ජඞ්ගලෙ** - අතිශය තද විෂම පොළවෙහි, කරමැටි බිමෙහි, සමහරු කියයි. **රොපිත** - කියන ලදී, වපුරා, උදුරා නැවත වැපිරීම. **නපි තොසෙති** - සතුටු නොවේ. ස්වල්ප පලදාව ඇති බැවින් සතුට නූපදී - **තථෙවා** යම් සේ කරමැටි බිමෙහි බොහෝ බීජ වපුරා මහත් වූ ඵල, උසස් වූ ඵල නො ලැබෙන්නෙ ද එවිට ගොවියා සතුටු නො වන්නේ ද, එසේම දුසිලුන් කෙරෙහි, සිල් නැත්තවුන් කෙරෙහි බොහෝ දාන වස්තූන් පිරිනැමුව ද, මහත් ප්‍රතිඵල, පැතුරුණු ප්‍රතිඵල නො ලැබෙන්නේ ය. එයින් දායකයෝ සතුටු නො වෙති යන අර්ථ යි. **යථාපි භද්දකෙ** - ගාථා දෙක්හි කියන ලද විපර්යාස අර්ථ දත යුතුයි.

එහි **සම්මාධාරං පවෙච්ඡ නෙත** - යනු වැසි දහර යහපත්ව පවත්නා කල්හි, අඩ මසකින්, දස දිනකින්, පස් දිනකින් වර්ෂා ජලය ලද කල්හි යන අර්ථ යි. **ගුණවන්තෙසු** යනු ධ්‍යානාදී ගුණ සම්පන්න වූ, **තාදිසු** - ඉෂ්ටාදී ආරම්මණයන්හි අකම්ප සමාන ලක්ෂණයට පැමිණියා වූ, **තාරනති** - ලිඞ්ග විපර්යාසය විසින් කියන ලදී. උපකාරය යන අර්ථයි. කෙබඳු උපකාරයක් ද? පුණ්‍ය උපකාරයයි කීයේ ය.

යම් පුද්ගලයකු විෂයෙහි දෙන ලද දානය මහත්ඵල වේ ද? (පින්කෙත නුවණින්) සොයා දන් දිය යුතු ය. නුවණින් සොයා දන් දෙන දායකයො ස්වර්ගයට යත්.

මේ මිනිස් ලොවේ යම් දක්ෂිණාර්හයෝ වෙත් ද ඔවුන් පරීක්ෂා කොට දීම බුදුන් වහන්සේ විසින් පසස්නා ලදී. යහපත් කෙතෙහි වපුරන ලද බීජ යම් සේ (ඵල දරා ද) දක්ෂිණාර්හයන් විෂයෙහි දෙන ලද දානය මහත්ඵල ඇත්තාහු වෙත්. සංගීති කාරකයන් විසින් තබන ලද ගාථා.

**එහි විචෙය්‍යා** - පරීක්ෂාකර බලා - දක්ෂිණාව පිළිගැනීමට සුදුසු සිල්වත්හු ම, ප්‍රඥාවෙන් පරීක්ෂාකර බලා. සෙසු සියල්ල කියන ලද්දේ ම ය. මෙම අඞ්කුර ප්‍රේත වස්තුව ශාස්තෘන් වහන්සේ විසින් තව්තිසා දෙව්ලොව දී දස දහසක් සක්වළ දෙවියන් ඉදිරියේ දී දක්ෂිණාර්හයන්ගේ ප්‍රතිග්‍රාහ සම්පත්තිය වර්ණනා කරනු පිණිස ම දේශනා කරන ලදහ. **මහාදානං තයා දින්නං** - ආදිය තමන් වහන්සේ විසින් ම උපදවන ලදී. එහි දී තුන් මසක් අභිධර්මය දේශනා කොට මහා පවාරණ දිනයෙහි දිව්‍ය සමූහයා විසින් පිරිරණ ලද්දු ව, සර්වඥයන් වහන්සේ දෙව්ලොවින් නික් ම සංකස්ස නුවරට බැස අනු පිළිවෙළින් දෙව්රම් වෙහෙර වැඩ වසන සේක් සිව් පිරිස මැද දක්ෂිණාර්හ සම්පත් ප්‍රකාශ කරනු පිණිස ම යසස අත්‍ථාය ගච්ඡමා ආදියෙන් විස්තර වශයෙන් දේශනා කොට, චතුරාර්ය සත්‍ය දේශනාව මුදුන් පැමිණවීය. දේශනාවගේ කෙළවර නොයෙක් කෙළ දහස් ගණනකට ධර්මාභිසමය පහළ වූයේ ය.

අඞ්කුර ප්‍රේත වස්තුව
නිමියේ ය.

—//—

# 2-10

"දිවා විහාර ගතං භික්ඛුං" - යන මෙම උත්තරමාතු ප්‍රේතවත්ථු කථාවෙහි අර්ථ වර්ණනාව වන්නේ ය.

ශාස්තෘන් වහන්සේ පිරිනිවන් පෑ කල්හි පළමු මහා සංගායනාව පවත්වා ආයුස්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ භික්ෂූන් වහන්සේලා දොළොස් නමක් සමග කොසැඹෑ නුවරු ව එක්තරා අරණ්‍යායතනයක විසී ය. එසමයෙහි උදේන රජුගේ එක්තරා ඇමතියෙක් මළේ ය. ඔහු විසින් පෙර නුවර කර්මාන්ත විධාන කරන ලද්දේ ය. එකල්හි රජතුමා ඔහුගේ පුත් උත්තර නම් තරුණයා කැඳවා ඔබ ද පියා විසින් පිහිටුවන ලද කර්මාන්තයන් විධාන කරවන්නැ යි කියා පියා සිටි ඇමති තනතුරේ ම පිහිටු වී ය. හෙතෙම මැනැවැයි පිළිගෙන එක් දවසක් නුවර ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ලී ගෙන ඒම පිණිස තවත් වඩුවන් පිරිසක් සමග වනයට ගියහ. එහි ආයුෂ්මත් මහා කාශ්‍යප තෙරුන් වසන තැනට පැමිණ, තෙරුන් පාංශුකුල සිවුරු දරා විවේක ව හිඳිනු දක ඒ ඉරියව්හි පැහැද කරන ලද පිළිසඳර කථාවෙන් පසුව වැඳ එකත්පස් ව සිටියේ ය. එවිට තෙරුන් වහන්සේ ධර්ම දේශනා කළහ. ඔහු ධර්මශ්‍රවණය කොට රත්නත්‍රයෙහි හටගත් ප්‍රසාද ඇත්තේ සරණ සිල්හි පිහිටා ස්වාමීනි අනුකම්පා කොට හෙට දවස භින්ෂුන් වහන්සේලා සමග මගේ දානය පිළිගනු මැනවැයි තෙරුන්ට ආරාධනා කළේ ය. ස්ථවිරයෝ ද නිශ්ශබ්දතාවයෙන් ඉවසා වදාළහ. හෙතෙම එතැනින් නික්ම නගරයට ගොස් මා විසින් හෙට දවස දානය සඳහා භික්ෂූන්ට ආරාධනා කරන ලදී. තොපත් මාගේ දන් දෙන තැනට ආ යුතුය යි අනෙක් උපාසකවරුන්ට කීයේ ය. හෙතෙම දෙවන දවස්හී උදෑසන ම ප්‍රණීත වූ ආහාර පාන පිළියෙළ කොට කල් දන්වා, භික්ෂූන් සමග වැඩිය තෙරුන් වහන්සේට පෙර ගමන් කොට, වැඳ උන්වහන්සේ පෙරටු කොට ගෙට වැඩමවී ය. ඉක්බිති මහා වටිනා කැප පලස් අතුළ ආසනයෙහි ස්ථවිරයන් හා භික්ෂූන් ද වැඩහුන් කල්හි ගඳදුම්, මල් , පහන් ආදියෙන් පූජා කොට ප්‍රණීත වූ ආහාර පානාදියෙන් වළඳවා පැහැදුණු සිතැත්තේ ඇඳිලිබැඳ අනුමෝදනාව අසා කරන ලද භුක්තානුමෝදනාවෙන් පසු ව තෙරුන් ගිය කල්හි පාත්‍රය රැගෙන අනුව යන්නේ නගරයෙන් නික්මී, නැවතී කියන්නේ ස්වාමීනි නුඹ වහන්සේලා නිතර මගේ ගෙදරට වැඩිය යුතුය යි ආයාචනා කොට තෙරුන් වහන්සේ ගේ අවවාදයෙහි පිහිටා සෝවාන් ඵලයට පැමිණියේ ය. හෙතෙම විහාරයක් ද කරවී ය. තමන්ගේ සියළු

ඥාතීන් සසුන් කෙරෙහි පහන් සිත් ඇත්තවුන් කළහ. එහෙත් ඔහුගේ මව වනාහි මසුරු මලයෙන් පීඩිත වූ සිත් ඇත්තී ව මෙසේ පරිභව කළාය. යම්හෙයකින් නුඹ මා අකමැති කල්හි ම මහණුන්ට කෑම් බීම් දෙයි. ඒ ආහාර පාන නුඹට පරලොව දි ලේ වී ඉපදේවා. විහාර පූජා දවසෙහි එක් මොනර පිල් මිටියක් දීමට අවසර දුන්නේ ය. ඕ තොමෝ කළුරිය කොට ප්‍රේත යෝනියෙහි උපන්නී ය. මොනරපිල් මිටියක් දන් දුන් පින අනුමෝදන් වීමෙන්, ඒ ප්‍රේතියගේ කේශයෝ නිල් වූයේ සිනිඳු වූයේ වෙළුණු අග ඇති ව සියුම් ව දිගට වැඩුණි. ඕ තොමෝ යම් විටක ගංගා නම් ගඟට පැන් බීම පිණිස බැස්සේ ද? එකල්හි නදිය ලෙයින් පිරේ. ඕ පණස් පස් වසක් සා පිපාසාවෙන් හැසිර එක් දවසක් කඞ්ඛාරේවත ස්ථවිරයන් ගංගා තීරයෙහි දිවා විහරණ යෙහි වැඩ හිඳිනු දක තමන්ගේ කෙස්වලින් ශරීරය වසාගෙන තෙරුන් වෙත එළඹ බීමට පැන් ඉල්ලුවා ය.

දුර්වර්ණ වූ බියකරු දකුම් ඇති, ඒ ප්‍රේතිය, ගං තෙරෙහි දිවා විහරණයට පැමිණි ඒ භික්ෂුව වෙත එළඹියා ය.

ඉතා දික් වූ හිසකෙස් බිම දක්වා එල්බෙත්. ඒ කේශයන්ගෙන් විළි වසාගත් ප්‍රේතිය භික්ෂුවට මෙසේ කීවා ය.

මේ ගාථා දෙක සංගිති කාරකයන් විසින් මෙහි යොදන ලද්දේ ය.

එහි **භීරුදස්සනා** භයානක දකුම් ඇති, කිපුණු පෙනීම් ඇති, රුද්දදස්සනා යනුවෙන් ද පාඨයකි. පිළිකුල් සහගත දකුම් ඇති. **යාවභූමාව ලම්බරෙ** - පොළව දක්වා දිගට එල්බ **පුබ්බෙ භික්ඛුනති - ච පචණා සමණා** කඞ්ඛාරේවත ස්ථවිරයන් සඳහා කියන ලදී. ඒ ප්‍රේතී තොමෝ තෙරුන් වෙත පැමිණ පැන් ඉල්වත්.

ස්වාමීනි ! මම යම් දවසක කළුරිය කළෙමි ද? එතැන්පටන් වසර පනස් පහක් මුලුල්ලෙහි, කෑමක් හෝ බීමක් හෝ නො දනිමි. නො ලදිමි. පිපාසයෙන් මිරිකෙමි පැන් ටිකක් සොයා ඇවිදින මට ස්වාමීනි පැන්ටිකක් දුනමැනවි. **තසිතා** යනු පිපාසිත බවයි. **පානියායා** - යනු වතුර ටිකක් බීම පිණිස ඇවිදින්නා වූ මට පැන් ටිකක් දෙන්න හාමුදුරුවනේ ! මෙයින් පසු

සිහිල් දිය ඇති මේ ගංගාව හිමාලයේ සිට ගලා එයි. මේ ගඞ්ගා නම් ගඟෙන් වතුර ගෙන බොව ! මගෙන් කුමකට ඉල්ලන්නේ ද?

ස්වාමීනි ! ඉදින් මම ගංගා නම් ගඟෙන් මම ම පැන් ගන්නේ නම්, එවිට මේ ගඟේ වතුර ලේ බවට පෙරලේ. එහෙයින් මම පැන් ඉල්ලා සිටිමි.

ඔබ කය වචනය සිත යන තුන් දොරින් කිනම් අකුසල කර්මයක් කරන ලද්දේ ද? කවර කර්ම විපාකයකින් ගඞ්ගා නදියේ ජලය තිට ලේ වන්නේ ද?

මාගේ පුතා උත්තර නම් විය. ඔහු මහත් ශ්‍රද්ධා ඇති උපාසකයෙක් වූයේ ය. ඔහු භික්ෂූන්ට දන් දෙද් දී මගේ අකමැත්ත විරුද්ධත්වය පළ කෙළෙමි.

ඔහු භික්ෂූන්ට සිවුරු ද පිණ්ඩපාතය ද, ගිලන් පස ද, සෙනසුන් ද දුන්නේ ය. මසුරු මළ යෙන් පිඩිත වී ඒ පින්කම් කෙරෙහි පරිභව කළෙමි අපහාස කළෙමි.

මා අකමැත්තෙන් නුඹ ශ්‍රමණයන්ට ආහාර, සිවුරු. ගිලන්පස, සේනාසන දෙන්නේ ද?

උත්තර (නම් පුත්‍රය) මේ සියලු පූජාවන් ම සංසාරයේ දී ඔබට ලේම වේවා යි (මම පරිභව කළෙමි) ඒ අකුසල කර්මයෙන් මට ගඞ්ගා නදියේ ජලය ද ලේම වන්නේ ය.

මේ තෙරුන්ගේ හා ප්‍රේතියගේ වචන හා ප්‍රතිවචන වෙයි.

එහි **හිමවන්තතො** - විශාල **වශයෙන්** හිම ඇති බැවින් හිමවන්ත වේ. හිමවත් යයි නම් ලද පර්වත රාජයා යි **සන්දති** - ගලාබසී, පවතී **එතො යනු** මේ මහා ගංගාවෙන්, **කිං** යනු කුමක් හෙයින් මගෙන් පැන් ඉල්ලන්නෙ ද මේ ගඞ්ගා නදියට බැස කැමති පරිද්දෙන් බීමට හැකි නේ ද යි දක්වයි. **ලොහිතං මෙ පරිවත්තති** යනු ගලායන ජලය මගේ පාප කර්ම වසයෙන් ලේ බවට පරිවර්තනය වෙයි. එයින් අතට ගන්නා වූ ජලයත් ලේ ම වන්නේ ය. **මය්හං අකාමායා** - මගේ නොකැමැත්ත පිට, (විරුද්ධත්වය පිට) **පවෙච්ඡති** - දෙයි **පච්චයං** - යනු ගිලන්පස **යමෙතං** යනු ශ්‍රමණයන්ගේ මේ චීවරාදී සිව්පසය, **පවෙච්ඡසී** - දෙයි. **එතං තෙ පරලොකස්මිං ලොහිතං හොතු උත්තර** යනු ශාප කිරීම් වශයෙන් කරන ලද පාප කර්මය. ඒ පාප කර්මයේ විපාක ඵල දිම යි.

එකල්හි ආයුෂ්මත් කඞ්ඛා රේවත ස්ථවිරයෝ ඒ ප්‍රේතිය උදෙසා භික්ෂු සංඝයා වෙත පැන් පිරිනැමී ය. පිඩු පිණිස හැසිර බත් ගෙන භික්ෂු සංඝයාට පූජා කළේ ය. කසළ ගොඩවල් වැනි තැන්වලින් පාංසුකූල රෙදි ගෙන සෝදා බිම ඇතිරීම සඳහා ද කොට්ටඋර ආදිය සඳහා ද භික්ෂූන්ට පූජා කළේ ය. ඒ හේතුවෙන් ඒ ප්‍රේතිය දිව්‍ය සම්පත් ලදහ. ඈ ස්ථවිරයන් වෙත පැමිණ තමන් විසින් ලද දිව්‍ය සම්පත්තිය තෙරුන්ට දක්වී ය. ස්ථවිරයන් වහන්සේ ඒ පුවත තමන් සමීපයට පැමිණි සිව් පිරිසට ප්‍රකාශකොට ධර්ම කථාව වදා ළේ ය. ඒ මහජනයා හටගත් සංවේග ඇතිව මසුරු මළ දුරුකොට දශකුශල ක්‍රියාවන් හි ද ධර්මයෙහි ද ඇලුණේ වූහ. මේ ප්‍රේත වස්තු දෙවැනි සංගායනාවේ දී සඞ්ගායනා කරන ලද බව දතයුතු යි.

උත්තර මාතා පේතවත්‍ථු වර්ණනාව
නිමියේ ය.

—— // ——

## 2-11

"අහං පුරෙ පබ්බජිතස්ස භික්ඛුනො" යනු මේ සූත්ත ප්‍රේත වස්තුව යි. එය කා වෙනුවෙන් උපන්නේ ද?

සැවැත් නුවර සමීප වූ එක්තරා ගමක, අපගේ ශාස්තෘන් වහන්සේ ලොව පහළ නො වූ කල්හි ම අවුරුදු හත් සියයකට පෙර එක්තරා දරුවෙක් එක් පසේ බුදු නමකට උපස්ථාන කළේ ය. ඔහුගේ මව ඔහු තරුණ වයසට පැමිණි කල්හි, සමාන කුලයකින් ඔහුට එක්තරා කුල දියණියක් විවාහ කොට ගෙන ආවා ය. විවාහ දවසෙහිම ඒ තරුණයා යහළුවන් සමග දිය නෑම සඳහා ගියේ සර්පයකු විසින් දෂ්ට කරන ලදුව මිය ගියේ ය. යකෙකු විසින් ගන්නා ලදැ යි සමහරු කියති. හෙතෙම පසේ බුදුවරයාට උපස්ථාන කරමින් බොහෝ කුශල කර්මයන් රැස් කළ සිටියත් (විවාහක) ඒ දැරිය කෙරෙහි පිළිබඳ සිත් ඇති බැවින් විමාන ප්‍රේතයෙක් වී උපනි. හේ මහාර්ධි සම්පත්න ය. මහේසාක්‍යය මහානුභාව සම්පන්න ය.

එකල්හි ඒ විමාන ප්‍රේත තෙමේ ඒ තරුණිය තමාගේ විමනට ගෙන එනු කැමැත්තේ කවර උපායකින් මෑ ඉහාත්මයෙහි ම විපාක දෙන්නා වූ කුශල කර්මයක් කොට මා හා සමාන මේ විමන්හි සිත් අලවන්නේ දැයි කියා ඇයට දිව්‍ය සම්පත් විඳිමට හේතු විමසමින්, පසේ බුදුන් සිවුරක් මසනු දැක මිනිස් වෙසින් එහි ගොස් වැඳ ස්වාමීනි නූල් වලින් ප්‍රයෝජන ඇත්තේ දැයි ඇසී ය. උපාසකය මම සිවුරක් මහමි යි පසේ බුදුන් වදාළහ. එසේ නම් ස්වාමීනි අසවල් තැනට නූල් සඳහා පිඬු සිගා වඩිනු මැන වැයි ඒ කුමරියගේ ගෙය පෙන්වී ය. පසේ බුදුන් වහන්සේ එහි වැඩමවා ගෙදොර වැඩසිටිසේක. එකල්හි එහි වැඩ සිටිය පසේ බුදුන් දැක ඒ තරුණිය මාගේ ආර්යයන් වහන්සේට නූල්වලින් වැඩ ඇතැ යි සිතා දන පහන් සිතින් එක් නූල් ගුලියක් පූජා කළා ය. එවිට ඒ විමාන ප්‍රේතයා, මිනිස් වෙසින් ඒ ගෙට ගොස් ඇගේ මවට යාඥා කොට ඈ සමග කීප දවසක් වාසය කොට, ඇගේ මවට අනුග්‍රහ පිණිස ඒ ගෙයි සියලු භාජනයන් රන් රුවන්වලින් පුරවා "මේ දෙවියන් විසින් දුන් ධනය කිසිවකු විසින් නො ගත යුතු ය යි කියා සියලු භාජනවල මතුපිට ලියා, ඒ තරුණිය රැගෙන තම විමානයට ගියහ.

ඇගේ මව බොහෝ ධන සම්පත් ලබා තම නෑදැයින්ට ද දුගී මගී යාචකාදීන්ට ද දී තමන් ද අනුභව කොට කළුරිය කරන්නී, ඉදින් මගේ දියණිය ආයේ නම්, ආ දිනක මේ ධනය ඇයට පෙන්වන්නැයි කියා කළුරිය කළා ය.

ඉක්බිති ව අවුරුදු සත් සියයක් ඇවෑමෙන්, අප භාග්‍යවතුන් වහන්සේ ලොව පහළව පවත්වන ලද උතුම් දම්සක් ඇති ව, අනු පිළිවෙලින් සැවැත්නුවර වාසය කරන කල්හි, ඒ විමාන ප්‍රේතයා සමග විසූ ඒ ස්ත්‍රීයට කළ කිරීමක් ඇති විය. ඕ ඔහුට කීවා ය. අර්ය පුත්‍රය මා මගේ (උපන්) නිවසට නැවත පමුණුවනු මැනවි.

මම පෙර මා වෙත පිඬු සිඟා පැමිණි ප්‍රව්‍රජිත නම් වූ, භික්ෂු වූ පසේ බුදුන්ට නූල් ගුටියක් පිදීමි. ඒ දානයාගේ මහත්ඵල විපාකය දැන් ලබමි. බොහෝ වූ කෝටි ගණන් වස්ත්‍රයෝ මට උපදිති.

මලින් ගැවසුනා වූ සිත් අලවන නොයෙක් චිත්‍රකර්ම ඇති නොයෙක් විසිතුරින් බබලන ස්ත්‍රී පුරුෂයන් විසින් සෙවුනා ලද, මේ විමන මම පරිභෝග කරමි. පොරවා ගනිමි (කැමති සළුවක්) බොහෝ වස්තු උපකරණ ඇත. ඒවා ක්ෂය නො වේ.

ඒ කුසල කර්මයේ හේතුවෙන් සැප විපාක වූ සැපය මේ විමානයෙහි දී ලැබේ. ඒ මම නැවත ද මිනිස් ලොවට ගොස් කුසල් දහම් කරන්නෙමි ආර්ය පුත්‍රය මා මගේ නිවසට පමුණුවනු මැනවි. මේ අදහස් පහළ කළහ.

එහි **පබ්බජිතස්ස භික්ඛුනො** - යනු මෙය පසේ බුදුන් සඳහා කියන ලදී. හෙතෙම තමාගේ කාමාදී වූ ක්ලේශ පරම්පරාව ඉතිරි නො කොට විනාශ කළ බැවින්, ප්‍රව්‍රජිතයෙක් වූ බැවින් පරමාර්ථ වශයෙන් ප්‍රව්‍රජිත යයි කිය යි. බිඳුනු කෙළෙස් ඇති බැවින් භික්ඛු යයි කීමට සුදුසු යි. **සුත්තං** - යනු කපු පුළුනෙන් තැනූ නූල්, **උපගම්මා** යනු මගේ ගෙට පැමිණ, **යාචිතා** - යනු ආර්යයෝ උදෙසා සිටිත් මේ ආර්යයන්ගේ ඉල්ලීමයි. මෙසේ කියා ඇත. කාය විඤ්ඤත්ති ප්‍රයෝග වශයෙන් - කයින් කරන හැඟවීම් වශයෙන් භික්ෂාවෙහි යෙදීම ඉල්ලීම, **තස්සා** - යනු ඇගේ නූල් දානයේ, **විපාකො විපුල ඵලූප ලබ්භති**. - යනු මහත්ඵල මහා විපාක ලබයි. භුක්ති විඳියි. බහු යනු නොයෙක් **වත්ථ කොටියො** - නොයෙක් දහදහස් ගණන් විවිධ වූ වර්ණවත් වූ වස්ත්‍ර - යන අර්ථ යි. **අනෙක චිත්තං** - යනු නොයෙක් චිත්‍ර කර්ම නොයෙක් මුතු මැණික් රුවන් ආදියෙන් විසිතුරු රූප, **නරනාරි සෙවිතං** යනු ස්ත්‍රීන් හා පුරුෂයන් වූ පිරිවර ඇසුරු කරමින් **සාහං භුඤ්ජාමි** යනු ඒ මම විමානය පරිභෝග කරමි. **පාරුපාමි** යනු කැමති කැමති පරිද්දෙන් නොයෙක් කෙළගණන් වස්ත්‍ර හඳිමි, පොරවමි **පහූත චිත්තා** - යනු

බොහෝ වූ පුළුල් වූ ගෘහෝපකරණ මහා වස්තුව මහත් **සම්පත් තාව බීයති** - යනු ඒ වස්තුව ක්ෂය නොවේ. ගෙවීයාමක් විනාශ වීමත් නො වේ. **තස්සෙව කම්මස්ස විපාකමන්වයා** ඒ නූල් දීම නම් වූ පුණ්‍ය කර්මයේ මෙලොව දීම විපාක දීමේ හේතුවෙන් ලද විපාකය වූකලී සුවයි. මිහිරි යි මනෝඥයි සිත්කළුයි ඒ සියලු සුවයන් මේ විමානයේ ලැබෙ යි. **ගන්ත්වා පුනරෙව මානුසං** - යනු නැවත මිනිස් ලොවට ගොස්, **කාහාමි පුඤ්ඤානි** යනු මාගේ සුබ විශේෂයන් වැඩි දියුණු කර ගැනීම සඳහා පින් කරන්නෙමි. මේ සා සම්පත් ලැබීමේ අදහස යි. **නයය්‍ය පුත්ත මං** - යනු ආර්ය පුත්‍රය මා මිනිස් ලොවට පමුණුවව ගෙනයව යන අර්ථ යි.

එය අසා ඒ විමාන ප්‍රේතයා ඈ පිළිබඳ සිතින් හා අනුකම්පායෙන් ගමන පිළිබදව අකමැත්තේ,

තී අවුරුදු සත්සියකට පෙර මෙහි පැමිණියා ය. මිනිස් ලොව දී ජරාවටත් වයෝවෘද්ධ බවටත් පැමිණෙන්නී ය. තීගේ සියළුම නෑයෝ ද කළුරිය කළාහු ය. මෙතැනින් එහි ගොස් තී කුමක් කරන්නී ද?

එහි **සත්තා** - යනු විභත්ති ලෝපයෙන් දක්වයි. පලායාමෙහි ඉවත් ව යාමෙහි පවත්නා (වර්තමාන) වචන යි. **වස්සසතා** - යනු අවුරුදු සත් සියයකින් අවුරුදු සත් සියයකට පෙර ඔබ මේ විමානයට ආවා ය. ඔබගේ පැමිණීමෙන් දූන් අවුරුදු සත් සියයක් ගෙවී ඇත යන අර්ථ යි. **ජිණ්ණාච වුද්ධාච තහිං භවිස්සසි** - යනු මේ දිව්‍යමය වූ ආහාර නිසා සෘතු නිසා එළඹුනු තත්ත්වයන් අනුව මෙපමණ කල් කර්මානු භාවයෙන් තරුණියක වශයෙන් සිටියා ය. මෙයින් චෙන් ව ගිය කල්හි කර්ම පිරිහී යාම නිසා මනුෂ්‍යයන්ගේ සෘතු හා ආහාර නිසා ජරාජීර්ණ වී, වයසට පැමිණ මිනිස් ලොව සිටින්නේ ය. කිමෙක් ද? **සබ්බෙව තෙ කාලකතා ඤාතකා** යනු දීර්ඝ කාලයක් ගතවීම නිසා ඔබගේ සියලු ම ඥාතීහු මිය ගියහ. එහෙයින් මේ දෙව්ලොවින් මිනිස් ලොවට ගොස් ඔබ කුමක් කරන්නේහි ද? ඉතිරි ආයුෂ ප්‍රමාණය ද මෙහිම ගෙවව, මෙහිම වසව යන අදහස යි.

මෙසේ ඔහු විසින් කියන ලද ද ඔහුගේ වචන නො අසා ඇය නැවත කියන්නී.

හිමියනි ! මෙතනට පැමිණ දිව්‍ය සම්පත් වින්දා වූ මං අවුරුදු සතක් ම

ගෙවුණි. ඒ මම නැවත මිනිස් ලොවට ගොස් පින් දහම් කරන්නෙමි. එබැවින් ආර්ය පුත්‍රය මා මගේ නිවසට ඇරලනු මැනැවි.

එහි **සතෙතව වසසානි ඉධාගතාය** - ස්වාමී පුත්‍රය ! මගේ මෙහි පැමිණීමෙන් **වර්ෂ සත් සියක්** ඉක්මගියේ යයි හඟිමි. කල් යැවී ය. වසර සත්සියයක්. දිව්‍ය සම්පත්තියන් දීර්ඝ කාලයක් තුළ විඳීම නිසා කල් ගතවිම නො සලකමින් මෙසේ කීහ.

මෙසේ ඈ විසින් ඇවිටිලි කරන ලද්දා වූ විමාන ප්‍රේත තෙමේ නොයෙක් ආකාරයෙන් ඇයට කරුණු කියාත්, තී මෙයින් සත් දිනකට වැඩිය ජීවත් නො වෙයි. තීගේ මැණියන් විසින් තබන ලද මා විසින් දුන් ධනය ඇත්තේ ය. ඒ ධනය ශ්‍රමණ බ්‍රාහ්මණ යන්ට දන් දී මේ විමනෙහි ම ඉපදීමට ප්‍රාර්ථනා කරව යි කියා, ඈ අතින් අල්ලාගෙන පැමිණ ගම මැද තබා මෙතැනට පැමිණි අනෙක් ජනයන්ට ද ශක්ති පමණින් පින් කරව යි අවවාද කරවයි කියා ගියේ ය. එහෙයින් කියන ලදී.

ඒ විමාන ප්‍රේත තෙම, වයසට පත් අතිශයින් දුර්වල වූ ඒ ස්ත්‍රිය බලහත්කාරයෙන් අතින් අල්වාගෙන නැවත ගමට පමුණුවා මෙතැනට පැමිණියා වූ අනිත් ජනයාටත් පින් කරවී සැප ලැබේ යයි කී ය.

එහි **සො** යනු ඒ විමාන ප්‍රේතයායි **තං** යනු ඒ ගැමි ළදයි, **ගහෙත්වාන පසය්හ බා හාය** යනු බලහත්කාරයෙන් පමුණුවන්නෙකු මෙන් ඇගේ අතින් අල්ලා ගෙන, **පවෙසයිත්වාන** ඈ ඉපදී හැදුණු වැඩුණු ගමට නැවත පමුණුවා, **ථෙරිං** - මහළු වූ, දිරීමට පත් වූ, වයෝ වෘද්ධ වූ, **සුදුබ්බලං** ජරාවෙන් දිරීමට පත්වුයේ ම අතිශය දුබල බවට පැමිණ, ඕ තොමෝ වනාහි එම විමානයෙන් ඉවත් වී ආපසු පැමිණීමට සැරසෙත් ම දිරාගිය වෘද්ධ වූ, මහළු වූ, වයසට ගියා වූ, තැන්තියක් වුවා ය. **වදෙසි** - යනු කියන ලද වචන ඒ අනුවට දැක්වීමට **අඤ්ඤම්පි ජනනති** - ආදිය කී ය. එහි අර්ථය, සොඳුර නුඹත් පින්කරව ! තී දැක් මට පැමිණෙන. මට ද එන අනිත් අයට ද හිස ගිණි ගත් අයෙකු වස්ත්‍රය ද නොබලා ගින්න නිවීමට උත්සාහගන්නාක් මෙන් යහපත් මුහුණින් යුතුව පින් කරවයි කියව දාන සීලා දී පින් කරව යි කී ය. පින ඒකාන්තයෙන් ම සිත්වල සැප විපාක ලබන්නේ ම ය. එහි සැකයක් නොකරව ! යනු වෙන් අවවාද දුනි. මෙසේ කියා ඔහු ගිය කල්හි ඒ ස්ත්‍රිය තමන්ගේ නෑයින් වසන තැනට ගොස් ඔවුන්ට තමන් හඳුන්වා දී ඔවුන් ළඟ

තබා තිබූ ධනය ගෙන ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට දන් දෙමින් තමන් සමීපයට වරින්වර එන්නාවූ ජනයන්ට මෙසේ කීවා ය.

කුසල් නො කිරීමෙන් ප්‍රේතයෝ ද මිනිස්සු ද වැනසෙත් සැප විපාක දෙන් නා වූ කුසල් දහම් හි හැසිර (පින්කර) සැපතෙහි පිහිටියාවූ දෙව් වූ ද මිනිස් වූ ද ප්‍රජාව මා විසින් දක්නා ලදී.

එහි - **අකතෙන** යනු තමන් විසින් නො උපදවන ලද්දා වූ ද, රැස් නො කරන ලද්දා වූ ද, සාධුනා කුසල කර්මයෙන්, ඉත්ථම්භූතාර්ථයෙහි කරණ විභක්ති ය. **විහඤ්ඤන්ති** - විනාශයට පැමිණෙන්නේ ය. **සුඛ වෙදනීයං** - සැප විපාක එළවන පින්කම්, **සුඛෙ ඨිතානි**, සැපතෙහි පිහිටා **සුසෙඨිතා** යනුවෙන් ද පාඨයකි. සැපයෙන් දියුණුවට පත්, ප්‍රීතිමත් - පිනාගිය යන අර්ථයි. මෙය ද එහි අදහස වන්නේ ය. යම් සේ වනාහි ප්‍රේත යෝ ද, එසේම මිනිස්සු ද, නො කරන ලද්දා වූ කුසල් නිසා ද, කරන ලද අකුසල් නිසා ද, වෙහෙසෙනු ලබන සා පිපාසා දී අනේක දුක්වලට පැමිණෙන්නා වූ මහා දුක් අනුභව කරන්නා වූ අය මා විසින් දක්නා ලද්දෙමි. සැප විපාක දෙන්නා වූ කර්මයන් කුසල් කොට ඒ කළා වූ කුසල කර්ම නිසා ද, නො කරන ලද අකුශල කර්ම නිසා ද දෙව් මිනිසුන් ඇතුළත් වූ ප්‍රජාව සුවයෙන් පසුවනු මා විසින් දක්නා ලදි. මා විසින් ප්‍රත්‍යක්ෂ කරන ලදි. එහෙයින් පව්කම් දුරින් දුරුකොට පුණ්‍ය ක්‍රියාවන්හි යෙදීම නැවත නැවත යෙදීම සිදුකළ යුතු ය.

මෙසේ අවවාද දෙන්නී ශ්‍රමණ බ්‍රාහ්මණා දීන්ට සත්දිනක් මහදන් පෙවත්වා, සත්වෙනි දවසේ කළුරිය කොට, තව්තිසා දෙව්ලොව උපන්නී ය. භික්ෂූහු ඒ ප්‍රවෘත්තිය භාග්‍යවතුන් වහන්සේට කීහ. භාග්‍යවතුන් වහන්සේ එය අර්ථෝත්පත්ති කොට ගෙන පැමිණ සිටි පිරිසට ධර්ම දේශනා කළහ. විශේෂයෙන් පසේ බුදුවරයන් කෙරෙහි දුන් දානයාගේ මහත් ඵල මහානිසංස බව වදාළේ ය. ඒ අසා මහාජනයා මසුරුමළ පහකොට දානාදී පින්කම් හි යෙදුනාහු වෙති.

**සූත්‍ර ප්‍රේතවස්තුවර්ණාව**
**නිමියේ ය.**

—//—

# 2-12

"සොවණ්ණ සොපාන ඵලිකා" - යන මේ ප්‍රේතවත්ථු කථාව ශාස්තෘන් වහන්සේ සැවැත්නුවර වැඩ වසන සමයෙහි කණ්ණ මුණ්ඩ ප්‍රේතියක (කන් සිඳුනු) අරභයා වදාළ සේක.

දුරාතීතයේ කාශ්‍යප බුදුන් දවස කිම්බිල නම් නුවර, එක්තරා සෝවාන් වූ උපාසකයෙක්, තවත් උපාසකවරුන් පස් දෙනෙකු සමග සමාන අදහස් ඇති ව භික්ෂූන් වසන තැන්, මල් වතු, ඒ දඬු දැමීම, සක්මන්මළු තැනීම ආදී පුණ්‍යකර්මයන්හි නියැලී වසන්නෝ. සංඝයාට විහාරයක් කරවා ඒ උපාසකයන් ද සමග කලින් කල විහාරයට යයි. ඔවුන්ගේ භාර්යාවෝද උවැසියන් වී ඔවුනොවුන් සමග තෙල් මල් පහන් සුවඳ ආදිය ගෙන කලින්කලට විහාරයට යන්නා හු අතරමග ආරාම විශ්‍රාමශාලාවන් හී නැවතී විහාරයට යති.

ඉක්බිති එක්දවසක් ධූර්තයෝ කිහිප දෙනෙක් ඈ ගේ රූප සම්පත්තිය දැක පිළිබඳ සිත් ඇති ව, ඔවුන්ගේ ශීලාචාර ගුණසම්පන්න බව ද දැන, මේ එකියක් සමග හාද වී එකියක ගේ සීල භේදය කරන්නට සමර්ථ කෙනෙක් ඇත්තේ දැ යි කථාවක් ඉපිද වූහ. එහි දී ඔවුනතුරෙන් එක් අයෙක් මම සමර්ථයෙමි යි කී ය. පුදුමයකි ඔබට එසේ කළ හැකි නම් අපි මසුරන් දහසක් දෙන්නෙමු යයි අනෙක් අය කීහ. පුදුම නො වෙනු මම එය කරමි යි දහසක් ඔට්ටු තැබී ය. නො කළහොත් තොප අපට දහසක් දිය යුතුය යි (ඔට්ටුව විය) හෙතෙම ලෝභයෙන් යෙහි බැඳුණු බයෙන් ද නොයෙක් උපායෙන් ගායනා කරන්නේ ඒ උපාසිකාවන් ශාලාවට ආකල්හි, මිහිරි හඬින් වීණා වාදනය කරමින්, මිහිරි ස්වරයෙන් පඤ්චකාම ගීත ගයමින්, ඒ ස්ත්‍රීන් අතුරෙන් එක් ස්ත්‍රියක් ගී හඬින් පොළඹවා, ඇය ශීල භේදයට පමුණුවා, ඈ සමග අසද්ධර්මයෙහි යෙදී, ඒ ධූර්තයන් දහසකින් පරාජය කරන ලදී. (මසුරන් දහස දිනා ගන්නා ලදී) ඔහු විසින් දහසකින් පරදන ලද අනෙක් ධූර්තයෝ මේ කාරණය ඒ ස්ත්‍රියගේ ස්වාමී පුරුෂයාට කීහ. ඔහු එය නො අදහන්නේ ඇගෙන් විමසී ය. කිමෙක් ද මෙබඳු දෙයක් අසවල් පුරුෂයෝ කියති. එබඳු දෙයක් සිදු වූ දැ යි ඒ පුරුෂයා ස්ත්‍රියගෙන් විචාළේ ය. ඇය මම එවැනි දෙයක් නො දනිමි, නො කෙළෙමි යි ප්‍රතික්ෂේප කොට, ඔහු එය නො අදන්නේ, ළග සිටි බල්ලෙකු පෙන්වා දිව්රීමක් කළා ය. ඉදින් යම් විධියකින් මා එවැනි පාපකර්මයක් කළේ නම් මේ කන් කොට කළු

බල්ලා ඒ ඒ භවයන්හි ඉපදුණු මා කා දමාවා යි කියා බොරු දිවිරීමක් කළා ය.

අනෙක් පන්සියයක් ස්ත්‍රීහු ද ඒ ස්ත්‍රීයගේ අනාචාර හැසිරීම දන්නේම, (ඇගේ ස්වාමි පුරුෂයා අනාචාරී ස්ත්‍රිය පිළිබඳව ඔවුන්ගෙන්) කිම මෝ තොමෝ එවැනි පාප ක්‍රියා වක් කළෝ ද නො කොළෝද දැයි ඇසූ කල්හි, අපි එවැන්නක් නො දනිමුයි බොරු කියා, ඉදින් අපි එසේ දන්නෙමු නම් සසර භවයක් භවයක් පාසා ඇගේම මෙහෙකාරියෝ වෙත්වායි දිවිරීමක් කළහ.

ඉක්බිති ඒ වරදෙහි බැඳුණු ගැහැණිය ඒ නිසාම විපිළිසර ව, දැවුණු හදින් යුතු ව වියලී වැඩි කල් නො ගොස් ම කළුරියකොට, හිමවත් පර්වතරාජයා සමීපයෙහි වූ සත්වැදෑරුම් මහවිල් අතුරෙන් එක්තරා කර්ණ මුණ්ඩ නම් විල්තෙර විමාන ප්‍රේතියක් ව උපන්නී ය. ඇගේ විමන අසල කර්ම විපාක අනුසාවියට සුදුසු වූ එක් විලක් ද පහළ විය. සෙසු පන්සියයක් ස්ත්‍රීහු කළුරිය කොට දිවිරීම් වශයෙන් ඇගේම දාසියන් වී උපන්නාහු ය.

ඈ පෙර කරන ලද කුශල කර්මයන්ගේ විපාකයෙන් දවල් කාලයෙහි දිව්‍ය සම්පත් අනුභව කොට රාත්‍රි කාලයෙහි පාප කර්ම බලයෙන් චෝදනා කරන ලදු ව යහනින් නැගිට පොකුණු තෙරට යයි. එතැනට ගිය ඒ ස්ත්‍රිය භයානක රූප ඇති සිඳුණු කන් අති තියුණු වූ දෑඩි වු දත් ඇති දිලිසෙන කිහිරි අඟුරු මෙන් ඇස් ඇති නිතර පවත්නා වූ විදුලියක් හා සමාන දිව ඇති, තියුණු නියපොතු ඇති, රළු දික් දුර්වර්ණ ලෝම ඇති, ඇත් පැටවකු පමණ වූ කළු බල්ලෙක් ඒ පොකුණෙන් නික්ම අවුත් ඉතා බඩසයින් පෙළුණකු මෙන් බලහත්කාරයෙන් බිම හෙලා මස් කා ඇට සැකිල්ල පමණක් ඉතිරිකොට දත්වලින් ඇදගෙන ඇවිත් පොකුණෙහි දමා අතුරුදන් වෙයි. ඕ තොමෝ ද ඒ පොකුණෙහි බහාලූ කෙනෙහි යළි ප්‍රකෘති රූපයෙන් විමනට පැමිණ යහනෙහි නිදන්නී ය. අනෙක් ස්ත්‍රීහු ඇයට දාසියන් වී විවිධ දුක් විඳිති. මෙසේ වසන්නා වූ ඔවුන්ට අවුරුදු පන්සිය පනහක් ගෙවිණි.

එසේ පුරුෂයන්ගෙන් වෙන් ව දිව සැප විඳින්නා වූ ඔව්හු කළකිරීමට, උකටලී බවට පත්වූහ. කර්ණ මුණ්ඩ විලෙන් ආරම්භව පර්වත සිදුරකින් නික්මී ගඞ්ගානම් ගඟට වැටෙන එක් ගඟක් ඇත. එසේම ඔවුන් වසන තැනට කිට්ටුව දිව්‍යමය ඵල ඇති අඹ දෙල් කොස් ආදී ගස්වලින් යුත් උයනක් හා සමාන කැලෑ ප්‍රදේශයක් ද ඇත.

ඒ ස්ත්‍රීහු මෙසේ සිතූහ. අපි මේ ඉදුණු අඹ ඵල ගෙන මේ ගඟට දමමු පාවී යන මේ අඹ ගෙඩි දැක, අඹ ලෝභයෙන් කිසියම් පුරුෂයෙක් මෙහි පැමිනියේ නම් අපි ඔහු සමග කම් සුව විඳින්නෙමු යි කියා ඒ ස්ත්‍රීහු එසේ කළහ. ඔවුන් විසින් එසේ දමන ලද අඹ ගෙඩි වතුර පාරට ගසාගෙන ගිය අඹ සමහරක් තාපසයන්ට ලැබීණ. සමහරක් වැද්දන් අතට පත්විය. සමහරක් කවුඩෝ රැගෙන ගියහ. සමහරක් ජලයේ රැඳුණහ. එක අඹ ගෙඩියක් ජලපහරට හසු වී බරණැසට ගියේ ය. බරණැස් රජු ලෝහ දැලකින් වට කරන ලද ගංගා ජලයට බැස දියනාන්නේ ගඟේ දියපරට ගසාගෙන ආ අඹ ගෙඩිය ලෝහ දැලේ රැඳුණි. වර්ණ ගන්ධ රසයෙන් යුත් වූ ඒ අඹගෙඩිය රාජපුරුෂයෝ රජුට දුන්හ. රජු ඒ අඹ ගෙඩියෙන් එක් කෑල්ලක් ගෙන විමසීම පිණිස සිරගෙයි දඬුවම් විඳින එක් සොරෙකුට දුන්නේ ය. ඔහු එය කා, දේවයිනි ! මා විසින් මේ හා සමාන අඹ මීට පෙර කා නැත. මේ දිව්‍යමය අඹ යයි මම සිතමියි කීය. රජු නැවත ද ඔහුට තම අඹ කෑල්ලක් දුන්නේ ය. හේ එය කා ශරීරයේ තිබූ ඇඟ රැළි නැති වී, පැසුණු හිසකෙස් නැති වී අතිශය මනහර රූපයෙන් යුත් තරුණයෙක් මෙන් වූයේ ය. රජු එය දැක පුදුමයට පත් ව ඒ අඹ ගෙඩිය කා ශරීරයෙහි විශේෂත්වයක් ලබා මෙවැනි අඹ ගෙඩි කොහේ හැදෙන්නේ දැයි මිනිසුන්ගෙන් විචාළහ. මිනිස්සු මෙසේ කීහ. දේවයන් වහන්ස ! හිමවත් පර්වත ප්‍රාන්තයේ ඇත්තාහ. එය ගෙන එන්නට හැක්කේ දැ යි රජු විචාළේ ය. දේවයන් වහන්ස වැද්දෝ දනිති. යි කීහ. රජු වැද්දන් කැඳවා ඔවුන්ට මෙවන් කියා සාකච්ඡා කොට එක් වැද්දෙකුට කහවණු දහසක් දී, තෝ වහා ගොස් මේ අඹ ඵල ගෙන එවයි නියම කළේ ය. හෙතෙම ඒ කහවණු අඹු දරුවන්ට දී මග උපකරණ ගෙන ගඟ ඉහළ කර්ණමුණ්ඩ විලට අභිමුඛව ගොස් මනුෂ්‍ය පථය ද ඉක්මවා කර්ණ මුණ්ඩ විලෙන් මෙහා සැට යොදුනක් පමණ ප්‍රදේශයේ දී එක් තාපසයෙකු දැක, ඔහු විසින් කියන ලද මගින් ගොස් නැවත තිස් යොදුනක් ගිය තැන එක් තාපසයකු දැක, ඔහු විසින් කියන ලද මගින් යන්නේ, නැවත පසළොස් යොදුනක් පමන තැන් ගොස් තවත් තාපස යෙකු දැක, ඔහුට තමන් පැමිණි කාරණය කීයේ ය. තාපසයා ඔහුට අනුශාසනා කළේ ය. මෙතැන්පටන් මෙම මහා ගංගාව හැර, කුඩා ගඟක් හමුවේ එහි උඩු ගං බලා යන විට යම් තැනක පර්වත සිදුරක් දක්කේ නම්, රාත්‍රියෙහි ගිනිහුළක් ගෙන ඇතුල් වෙනු මේ ගංගාව රෑ කාලයෙහි නැත. එහෙයින් තොපගේ ගමනට සුදුසු ය. යොදුන් කීපයක් ගිය තැන අඹ දක්නෙහි ය යි කීයේ ය.

හෙතෙම කී පරිද්දෙන් කොට උදයෙහි හිරු උදාවන කල්හි නානාවිධ රත්නයන්ගේ රශ්මි සමූහයෙන් බැබලුණු භූමියේ, ඵලබරින් නැමුණු අතු සමූහ ඇති නානාවිධ ගස් පෙළින් හෙබි, විවිධ පක්ෂී සමූහයා විසින් නාද කරන, ඉතා සිත්කළු වූ අඹවනයට පැමිණියේ ය.

එකල්හි ඒ විමාන ප්‍රේතියෝ එන්නා වූ ඔහු දුරදීම දැක මොහු මට අයිතිය මොහු මට අයිතියයි කියමින් ලඟට දුව ආවාහු ය. ඒ පුරුෂයා, වනාහි ඇලා සමග එහි දිව සැපත් වීදීමට සුදුසු වූ පිනක් සිදු කර නො තිබූ බැවින් ඒ ස්ත්‍රීන් දැක බිය වී, හඬ තලමින් දුව ගොස්, බරණැසට පැමිණ මේ ප්‍රවෘත්තිය රජුට සැල කළේ ය. එය ඇසූ රජු ඒ ස්ත්‍රීන් දැකීමට හා අඹ කෑමට හටගත් ආශා ඇති ව රාජ්‍යය ඇමතියන්ට භාර කොට මුව දඩයමේ යන අයෙකු මෙන් දුනු හීතල රැගෙන, කඩුව බැඳගෙන මිනිසුන් කීපදෙනෙකු පිරිවරා එම වැද්දා විසින් පෙන්වන ලද මග ඔස්සේ ගොස් දින කීපයකින් අතර තන්හි තන්හි මිනිසුන් නවතා වැද්දා පමණක් රැගෙන පිළිවෙලින් ගොස් වැද්දාත් එතැනින් නවත්වා හිරු උදාවන කල්හි අඹවනයට පැමිණියේ ය.

ඒ ඒ ස්ත්‍රීහු අලුත උපන් දෙව් පුතෙකු වැනි වූ ඒ රජු දැක පෙරගමන් කොට රජ යයි දැන හටගත් ආදර බුහුමන් ඇති ව, මනාකොට නහවා දිව සළු හැඳ පළඳවා මල් ගඳ විලවුන්වලින් මැනැවින් සරසා විමනට කැඳවාගෙන ගොස් නොයෙක් නොයෙක් මිහිරි රස දිව බොජුන් වළඳවා ඒ රජුට කැමති පරිද්දෙන් සේවනය කළාහු ය. මෙසේ අවුරුදු එකසිය පණහක් ඉක්ම ගිය කල්හී, ඒ රජු අර්ධ රාත්‍රියෙහි නැගී සිටියේ පරපුරුෂ සේවනය කොට ප්‍රේතී වූ ස්ත්‍රිය පොකුණු තෙරට යනු දැක කුමක් පිණිස මේ තැනැත්තිය මේ වේලේ යන්නේදෝ යි බලනුයේ විමසනු කැමති ව ලුහු බැඳ ගියේ ය. එකල්හි ඒ පොකුණු තෙරට ගිය ඇ බල්ලෙකු විසින් කනු ලබනු දැක මේ කුමක් දැයි නො දන්නේ තුන් දවසක් ම විමසා බලා මෙතෙක් මැගේ සතුරෙක් වන්නේය යි සිතා විෂපොවන ලද හීයකින් විද ඒ සුනඛයා මරා ඒ ස්ත්‍රීය පොකුණට බස්වා නැවත පළමු රූපය ලැබීමෙන් පසුව ගාථා දහයකින් ඇගෙන් ඒ ප්‍රවෘත්තිය විමසුවේ ය.

ඒ පොකුණෙහි රනින් කළ පඩි පෙළවල් හා පුවරු ද වෙති. රන්වන් වැල්ලෙන් යුක්ත විය. රුචිකර වූ පිරිසිදු සුවඳ ඇති සිත්කළු හෙල්මැලි පිපී තිබේ.

නොයෙක් රුක්වලින් ගැවසී ගත්තේ ය. අවට හාත්පසින් හමන සුළඟ

නන්විධ සුවඳින් යුක්තය. රත් නෙළුම් දියෙහි හැම තැන පිපී ඇත. සුදු නෙළුම් ද ඒ හා සමාන ව ඇත්තේ ය.

සිසිල් වූ ද, සුවඳවත් වූ ද මඳ සුළං හමයි. හංස කොක්වාළිහිණි සහ සක්වා ළිහිණියන් හඬින් අවට ප්‍රදේශ ගිගුම් ගනී.

විවිධ වර්ණවත් පක්ෂී සමූහයාගෙන් ගැවසී ගත්තේ ය. නන් වැදූරුම් පක්ෂීන්ගේ රාවයෙන් යුක්ත ය. බොහෝ සෙයින් ඵලදරණ ගස් ඇත්තාහ. අවට වනයේ විවිධ ජාති - සුවඳ මල් පිපී ඇත.

මෙබඳු වූ නුවරක් මිනිසුන් අතර මිනිස් ලොව නැත. රන් පැහැ රිදී පැහැ ඇති බොහෝ ප්‍රාසාදයෝ, වෙති.

සිව් දිසාවන්හි හාත්පස ඉතාමත් දැකුම්කළු ව බබළන්නාහ. ඔබගේ වතාවත් කිරීම සඳහා පන්සියයක් දාස ස්ත්‍රීහු ද වෙත්.

ඒ ස්ත්‍රීහු ද සක්වළළු, අඟුපළඳනා - (අතේ වැළමිටෙන් ඉහල බාහුවෙහි පළඳින ආභරණ) වන්ගෙන් සැරසී සිටිති. විවිධ වර්ණ හා සුවඳ මල් ගසා සරසණ ලද දිගු කේශ කලාපයෝ ඔවුන්ට තිබේ. සියළු කාමයන් ගෙන් ඒ ස්ත්‍රීහු සම්පූර්ණ වෙත්

කෙහෙල් මුවසම් පස තුරුණු අතුරණ ලද හා දික් ලොම් වලින් ගහණ කොදු පලස් අතුරණ ලද ස්වර්ණමය වූ බොහෝ ආසන ඔබට ඇත්තේ ය.

(මෙවැනි සම්පත් ඇති ඔබ) අර්ධ රාත්‍රිය මධ්‍යම රාත්‍රිය එළඹෙත් ම ඒ ආසනයෙන් නැගිටින ඔබ උයන් වත්තට යන්නී ය.

(එසේ යන ඔබ) ලා තණ සමූහයෙන් නිල්වන් වූ, ශුද්ධ වූ පොකුණු තෙරට ගොස් සිටී. (එසේ සිටින්නා වූ) ඔබව සිදුණු කන් ඇති බල්ලෙකු විසින් කා දමනු ලබන්නේ ය.

යම් කලෙක සුනඛයා විසින් කා ඉතිරි වූ ඇට සැකිල්ල පොකුණට බසිනෙහි ය. ඉක්බිති ව පෙර මෙන් ම යළි ශරීරය ඇති වේ.

ඉන්පසුව මනරම් වූ ප්‍රිය දැකුම් ඇත්තා වූ සියලු අඟ පසඟින් යුතු ව ඔබ

වස්ත්‍රයක් පොරවාගෙන මා හමුවට එන්නී ය. කන් සිඳුනා වූ සුනඛ තෙම මුළුමනින්ම ශරීර අවයවයන් කයි ද? මෙය කිනම් කර්ම විපාකයකින් සිදු වන්නේ ද? ඔබ කයින් වචනයෙන් සිතෙන් කවර ආකාරයක අකුශල කර්මයක් කරන ලද්දේ ද?

එහි **සොවණ්ණ සොපාන ඵලකා** - රනින් සෑදූ පියගැට පෙළ - **සොවණ්ණ වාලුක සණ්ඨිතා** - හාත්පස අවට රන්වන් වූ වැලිවලින් යුක්ත වේ. **තත්‍ථ** යනු පොකුණෙහි **සොගන්ධියා** - හෙල්මැලි, සුදු මානෙල්, **වග්ගූ** යනු සිත්කළු, රුචිකර, **සුචිගන්ධා** - යනු සිත් පිණායන සුවඳ **නා ගන්ධසමීරිතා** යනු නොයෙක් ආකාරයේ මනෝඥ සුවඳින් යුත් වාතයෙන් අවට පරිසරය සුවඳවත් වූ, **නානා පදුම සඤ්ඡන්නානි** - යනු සිය දහස් ගණන් වූ රත් පැහැ පිපුණු නෙළුම් වලින් සැදුණු ජල තලාව **පුණ්ඩරීක සමොගතා** - යනු සුදු නෙළුම් වලින් ආකීර්ණ වූ, **සුරභි සම්පවායන්ති** - යනු දිව්‍ය සුවඳ පොකුණෙන් හමාය යි යන අදහස යි. **හංස කොඤ්චාභිරුදා** - යනු හංසයන් විසින් ද කොස්වාලිහිණියන් විසින් ද හඬ නගන නාදකරන - **නානාදිජගණායුතා** - යනු විවිධ වර්ග පක්ෂීන් ගැවසී වසන්නා වූ, **නානාසර ගණායුතා** - යනු නොයෙක් වර්ගවල පක්ෂීන්ගෙන් සමන්විත වූ, **නානා ඵල ධරා** - නොයෙක් ආකාර ඵල දරන්නා වූ, සියලු කල්හි ම මල් ගෙඩි දරණ අතුපතර ඇති **නානා පුප්ඵධරාවනා** - යනු නොයෙක් වර්ගවල දිව්‍ය පුෂ්පයන් දිවමල් දෙන්නා වූ, පිපෙන්නා වූ වනරොද යන අර්ථයි. ලිංග විපර්යාසයෙන් වනා යයි කියන ලදී, **න මනුස්සෙසු ඊදිසං නගරං** - යනු යම්බඳු වූ මෙවැනි නගරයක් වේ ද මෙවැනි නගරයක් මිනිසුන් අතරෙහි නැත. මනුෂ්‍ය ලෝකයේ පහළ වී නැත. යන අදහස යි **රූපියාමයා** - රිදීයෙන් කළ, **දද්දල්ලමානා** - අතිශයින් බබළන්නා වූ, **ආභෙන්ති** බබළතී ශෝභමාන වෙත් **සමන්තා චතුරො දිසා** - අවට හාත්පස සතර දිසාවන්හි **යා** තෙමා - යම් මේ ඔබ, **පරිචාරිතා** - වතාවත් කරන්නා වූ උවැටන් කරන්නා වූ, **තා** යනු පිරිවරජනයා - **කාකම්බූ කෙයුරධරා** - යනු සක්වළලු අගුපලඳනා - වත්ගෙන් අතේ මැණික් කටුවේ දමන වළලු හා, වැලමිටෙන් උඩ බාහුවේ පළඳින රන් අභරණ අලංකාරව බබළන - **කඤ්චනාවෙල භූසිතා** - රන්වන් වූ හිස පළඳින මල්දම් වලින් මුදුන් මල්කඩ අලංකාර කළ කේශ කලාප ඇති, **කාදලිමිග සඤ්ඡන්නා** - යනු කෙසෙල් මුවන් සමින් කළ ඇතිරිලි ඇතුරූ **සජ්ජා** - යනු නිදීමට සුදුසු සේ සාදන ලද **ගොණක සන්ථතා** - යනු දික් ලොම් වලින් සාදන ලද සුවදායක කොඳුපලස් - **යත්‍ථ** යනු යම් ආසනයෙක් හී,

**වාසුපගතා** - වාසයට පැමිණි නිදිගත් යන අර්ථයි. **සමපත්තා යඩ්ඪරත්තිය** - මධ්‍යම රාත්‍රිය පැමිණි කල්හි, **තතො** - යනු ඒ නිදාගත් සයනයෙන්, **පොක්ඛරඤ්ඤා තීරෙ** - ඔබ පොකුණු තෙරට යන්නිය. **හරිතෙ** යනු නිල් වූ, **සද්දලෙ** - යනු තුරුණු තණ කොළ වලින් ගැවසී ගත් **සුභෙ** - යනු පිරිසිදු වූ, **සුභෙති වා** - ඇයට ඇමතීම යි. සොඳුරු නිල්පාට ලා තණකොළ වලින් ගැවසීගත් පොකුණු තෙරට ඔබ ගොස්, **ඨාසි** - සිටී යන අර්ථ යි. යෙදීම යි. **කුණ්ණ මුණ්ඩා** - යනු කැඩුණු කන් ඇති, සිඳුණු කන් ඇති, **ඛායිතා ආසි** - යනු කනු ලබන්නේ වේ. **අට්ඨිසංඛලිකා කතා** - යනු ඇටසැකිල්ල පමණක් ඉතිරි කරයි. යථා පුරෙ යනු සුනඛයා විසින් කෑමට පෙර, මෙන්, තතො යනු පොකුණට බැසීමෙන් පසු ව, **අඞ්ග පච්චඞ්ගී** යනු සම්පූර්ණ වූ සියලු අඟ පසඟ ඇතිවෙයි. **සුචාරු** - යනු අතිශය යහපත් සිත් වසීකරන, **පිය දස්සනා** - යනු දර්ශනීය, පියකරු - මනාප) **ආයාසී** - එන්නෙහි ය

මෙසේ ඒ රජු විසින් විචාරණ ලද්දා වූ ඒ ප්‍රේතිය ආදියෙහි පටන් තමා පිළිබඳ ප්‍රවෘත්තිය රජුට කියන්නී, මේ ගාථා පහ කීවා ය.

(යටගිය දවස) කිම්බිලා නුවර ශ්‍රද්ධාවත් වූ උපාසක ගෘහපතියෙක් වුයේ ය. මම ඔහුගේ බිරිඳ වීමි. ස්වාමියා ඉක්මවා හැසිරෙන සිල් නැත්තියක් වීමි.

මෙසේ ස්වාමියා ඉක්මවා හැසිරෙන මට මගේ ස්වාමියා (දිනක්) මෙසේ කී ය. යම්හෙයකින් තී මා ඉක්මවා හැසිරෙයි ද මෙය සුදුසු නො වේ, යහපත් නො වේ.

එහි දී මම කයින් හෝ සිතින් ඔබ ඉක්මවා නො හැසිරෙමි යි බොරු කීමි. එසේ කියා දරුණුම වූ දිවිරීමෙකින් දිවුරුවෙමි.

ඉදින් මම කායින් හෝ වචනයෙන් ඔබ ඉක්මවා හැසිරෙන්නේ නම් කන් කොට වූ මේ බල්ලා මගේ අවයවයන් කා දමාවා - (මෙසේ දිවුලෙමි)

ඒ අනාචාර අකුශලයාගේ ද බොරු කී අකුශල යේ ද, කර්ම විපාක අවුරුදු හත්සීයක් මුළුල්ලේ විඳින ලද්දෙමි. මේ කර්ම හේතුවෙන් ම මගේ ශරීර අවයව මේ කන් නැති බල්ලා අනුභව කරයි.

එහි **කිම්බිලාය** - යනු කිම්බිල නම් නම් ඇති නගරයෙහි, **අතිචාරිණී** - යනු භාර්යාව හෝ ස්වාමියා හෝ ඉක්මවා හැසිරීම අතිචාරිණී යයි කිය යි. එසේ ස්වාමියා ඉක්මවා හැසිරුණා වූ මා කෙරෙහි, ඒ මාගේ ස්වාමියා මෙසේ කීවේ ය, යන යෙදීම ය. **නෙතං ඡන්නං** යනු ආදී වශයෙන් දක් වූ ආකාරය යි **එතං ඡන්නං** - එය යුතු නො වේ. **නක්‍ඛත්ත් රූපං** - යනු සමාන අර්ථ ඇති වචනමයි. **යං** - යනු ක්‍රියාව පරාමර්ෂනය කිරීම යි. **අතිචරාසි** - යනු ඉක්මවා හැසිරෙයි. මෙයම පෙළ යි. යමෙක් ඔබ හෝ මා ඉක්මවා හැසිරේ ද? එය සුදුසු නොවේ. යන අර්ථයි. **ඝොරක** - දරුණු **සපථං** යනු දිවිරීම, **අභාසිසං** - යනු කීයේ ය. **ස්වාහං** - ඉදින් මම, **තං** - ඔබ **තස්ස කම්ම ස්සා** - යනු ඒ පාප කර්මයාගේ දුශ්ශීල කර්මයාගේ, මුසාවාදස්සා චා යනු මම එසේ ඉක්මවා නො හැසිරුණෙමි යනුවෙන් බොරු කී කර්මයෝ ද **උභයං** යනු විපාක දෙකක්, **අනුභූතං** - මා විසින් වළඳන්නෙමි, භුක්ති විඳින්නෙමි. යන අර්ථයි. **යතො** - යනු ඒ පාප කර්මයෝ,

මෙසේ කියා රජු විසින් තමන්ට කරන ලද උපකාරය ගැන ප්‍රශංසා කරන්නේ,

දේවයන් වහන්ස ! ඔබ මට වැඩ පිණිස මෙතැනට ආයේ ය. ඔබ මට බොහෝ උපකාර වූයේ ය. මම කන් සුන් බල්ලාගෙන් මිදුනේ වීමි. ශෝක නැත්තියක් ද බිය නැත්තියක් ද වූයෙමි.

දේවයන් වහන්ස ! මම ඔබ වඳිමි. ඇඳිලි බැඳ යාඥා කරමි. දේවයන් වහන්ස දිව්‍යමය වූ කාම සම්පත් වළඳනු මැනැවි. මා හා සමග ඇලෙනු මැනැවි. මේ අදහස් පැවසී ය.

එහි දේවා යනු රජුට ඇමතීම යි. **කණ්ණමුණ්ඩ ස්සා** - යනු කර්ණ මුණ්ඩ ප්‍රේතිය කෙරෙන් වෙන්වයාමේ මේ රජුගේ වචනය යි - ඉක්බිති රජු එහි වාසයෙන් නික්ම යනු කැමැත්තේ තම අදහස ප්‍රකාශ කළේ ය. එය අසා විමාන දෙව් දූ රජු කෙරෙහි පිළිබඳව සිත් ඇති ව එහි ම වසන ලෙස ආයාචනා කළය. ඒ සඳහා **නාහං දෙව නමස්සාමී** ගාථා කීහ. නැවත රජු එක් අදහසින් ම යනු කැමැත්තේ තමන්ගේ අදහස පවසමින් අවසාන ගාථාව කීයේ ය.

තී හා සමග දිව්‍ය සම්පත් අනුභවකොට ඇලුණේ වීමි. සුපින්වතිය. වහා මා නැවත මගේ නුවරට පමුණුවා ලවයි මම තී යදිමි.

එහි **තාහං** - ඒ මම, **සුභගෙ** - පිනෙන් යුත් තැනැත්තිය, **පතිතයාහිමං** - මගේ නුවරට මා ඇරලව, පමුණුවව, අනෙක් සියල්ල ප්‍රකට ය.

එවිට ඒ විමාන ප්‍රේතිය රජුගේ කීම අසා වියෝ දුක නො ඉවසන්නී ශෝක වී වියවුල් සිත් ඇති ව වෙවුලන ශරීර ඇති ව, නොයෙක් උපායවලින් ආයාචනය කොටත් ඒ රජ එහි නවත්වා ගැනීමට නො හැකි වන්නී, මහත් වටිනා බොහෝ රත්නයන් හා සමග රජ්ජුරුවන් නුවරට පමුණුවා, පහයට නංවා, හඬා වැළපී තමන් වසන තැනටම ගියා ය.

ඉක්බිති අපගේ භාග්‍යවතුන් වහන්සේ ලොව ඉපදී පවත්වන ලද උතුම් ධර්ම චක්‍ර ඇත්තේ පිළිවෙලින් සැවැත් නුවර වසන කල්හි එක් දවසක් මහ මුගලන් තෙරණුවෝ පර්වතයන් හි හැසිරෙන්නේ ඒ පිරිවර සහිත ස්ත්‍රීය දැක ඇයවිසින් කරන ලද කර්මය විචාළේ ය. ඇය ආදියේ පටන් සියලු ප්‍රවෘත්තිය තෙරුන්ට කීය. තෙරුන් වහන්සේ ඔවුන්ට ධර්ම දේශනා කළහ. ඒ පුවත මුගලන් තෙරුන් විසින් භාග්‍යවතුන් වහන්සේට දැන්වී ය. උන්වහන්සේ එය අර්ථෝත්පත්ති කොට ගෙන පැමිණ සිටි පිරිසට ධර්ම දේශනා කළ සේක.මහාජනයා සංවේගයට පත්ව පව්වලින් මිදී දානා දී පින්කම් කොට ස්වර්ග පරායණ වූයේ ය.

**කණ්ණ මුණ්ඩ ප්‍රේත වස්තු වර්ණනාව**
**නිමියේ ය.**

—//—

## 2-13

"අහුරාජා බ්‍රහ්ම දත්තො" - මේ උබ්බරී ප්‍රේත වස්තුව ශාස්තෲන් වහන්සේ ජේතවන විහාරයෙහි වාසය කරනකල්හි එක්තරා උපාසිකාවක් අරභයා දේශනා කළසේක.

සැවැත් නුවර එක්තරා උපාසිකාවකගේ ස්වාමිපුත්‍රයා කළුරිය කළේ ය. ඕ තොමෝ ස්වාමියාගේ වියෝගයෙන් දුකින් ආතුර වැ ශෝක කරන්නී ආදාහන කළ තැනට ගොස් හඬයි. භාග්‍යවතුන් වහන්සේ ඇයට සෝවාන් වීමේ හේතු සම්පත් ඇති බව දැක කරුණාවෙන් තෙත් වූ මනසින් යුතු ව ඇගේ ගෙට ගොස් පනවන ලද අසුනෙහි වැඩහුන් සේක. උපාසිකාව ශාස්තෲන් වහන්සේ වෙත පැමිණ වැඳ එකත්පසෙක සිටියා ය. ඉක්බිති වැ ශාස්තෲන් වහන්සේ ඇයි ද උපාසිකාවෙනි ශෝක කරන්නී ද ඇසී ය. එසේය ස්වාමීනි ! ප්‍රිය විප්‍රයෝගය නිසා ශෝක වන්නෙමි යි කී කල්හි ඇගේ ශෝකය පහකරනු කැමැත්තේ අතීත කථාව ගෙනහැර දැක්වී ය.

යටගිය දවස පඤ්චාල රට කපිල නුවර චූලනී බ්‍රහ්මදත්ත නම් රජෙක් රාජ්‍යය කළහ. හෙතෙම අගතිගාමී නොවී තමාගේ විජිතයෙහි ප්‍රජාවට හිතකර වූ දශරාජ ධර්මය කඩ නො කොට රාජ්‍ය විචාරණ කල්හි, කිසියම් දවසක තමන්ගේ රාජ්‍යයේ රටවැසියන් කුමක් කියන්නේ දැ යි අසනු කැමති ව, සන්නාලියකුගේ වෙස් ගෙන දෙවැන්නෙක් නැති ව තනි ව ම නගරයෙන් නික්ම ගමින් ගමට ජනපදයෙන් ජන පදයට හැසිරෙමින් සමස්ත රාජ්‍යය ම රාජද්‍රෝහීන් රහිත, පීඩා නැති ව, මිනිසුන් සතුටු වෙමින්, නො වැසූ දොරවල් ඇති ව වාසය කරනු දැක, සොම්නසින් යුතු ව නැවත නගරයට අභිමුඛ ව එන්නේ එක්තරා ගමක එක් දුගී වැන්දඹු ස්ත්‍රියකගේ ගෙට ගියේ ය. ඕ තොමෝ ඔහු දැක ආර්යයෙනි ! ඔබ කවරෙක් ද? කොහි සිට එන්නේ ද? ඇසී ය. මම සන්නාලියෙක් මි. කුලී පිණිස සන්නාලිකම් කරමින් ඇවිදින්නෙමි. ඔබලාගේ ගෙදර සන්නාලි කර්මයක් ඇත්නම් බත් හා වැටුප් දෙව්, නුඹලාටත් සන්නාලි කර්මය කරමි යි කී ය. අපට එවැනි කර්මාන්තයක් හෝ බත් වැටුප් නැත. ආර්යයෙනි වෙනත් අයගේ කාර්යයක් කරනු මැනැවි හෙතෙම කිහිප දිනක් එහි වසමින් ධාන්‍ය පුණ්‍ය ලක්ෂණ ඇති ඇගේ දුව දැක, මෑණියනි ! මේ දැරිය කිසිවකු විසින් විවාහ ගිවිසගන්නා ලද්දියක් ද නැතිනම් විවාහ ගිවිස නො ගන්නා ලද්දියක් ද, ඉදින් කිසිවකු විසින් විවාහ ගිවිස නො ගන්නා ලද්දියක් නම් මේ කුමරිය මට දෙව, මම නුඹලා සුවසේ ජීවත් කරවීමට පුළුවන් කෙනෙක් වෙමි. කීයේ ය. ඕතොමෝ

ආර්යයෙනි ! යහපතැයි කියා ඔහුට කුමරිය දුන්නා ය. හෙතෙමේ ඇය සමග කිහිප දිනක් වැස ඇයට කහවණු දහසක් දී " මම කීප දවසකින්ම එන්නෙමි, සොඳුර තී කල නො කිරවයි කියා තමන්ගේ නුවරට ගොස් නුවර හා ඒ ගම අතරමග පාර සමතලා කරවා සරසවා මහත් රාජානුභාවයෙන් ඒ ගෙදරට ගොස් ඒ කුමරිය කහවණු රැසක් මත සිටුවා රන් රිදී කළස්වලින් පැන් නහවා උබ්බරී යයි නම් කරවා අග මෙහෙසිය තනතුරෙහි තබා ඒ ගම ඇගේ නෑයන්ට දී මහත් රාජානුභාවයෙන් ඒ නුවරට ගෙනැවිත් ඈ සමග අභිරමණය කරමින් ජීවිතාන්තය දක්වා කල්යවා, රජ සුව විඳ ආයු කෙළවර කළුරිය කළේ ය. ඔහු කළුරිය කළ කල්හි ද, මළ සිරුර ආදාහන කළ කල්හි ද, උබ්බරී දේවිය ස්වාමියාගේ වියෝ දුකින් දැඩි ශෝකය නමැති හුල් ඇනුණු හදින් යුතු ව ආදාහන ස්ථානයට ගොස් බොහෝ දවස්වල සුවඳ දුම් ආදිය පුදා රජුගේ ගුණ වර්ණනා කරමින් උමතුවූවාක් මෙන් හඬමින් විලාප කියමින් ආදාහන ස්ථානය පැදකුණු කර යි. එ සමයේ අපගේ භාග්‍යවතුන් වහන්සේ බෝසත්වැ ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවී ධ්‍යාන ප්‍රව්‍රජ්‍යා අභිඥා උපදවා හිමවත සමීපයෙහි එක්තරා වන පෙදෙසක වසන්නේ, සෝක තැවුලින් තැවෙන්නා වූ උබ්බරිය දිවැසින් දැක අහසින් අවුත් දෘශ්‍යමානරූපී ව අහසෙහි ඒ ඒ තන්හි සිට මේ ආදාහන භූමිය කවරෙකුගේ ද? මේ ස්ත්‍රීය බ්‍රහ්මදත්ත ය යි කියමින් කවරෙකු සඳහා විලාප කියමින් හඬන්නේ දැ යි මිනිසුන්ගෙන් ඇසී ය. එය අසා මිනිස්සු ස්වාමීනි ! මේ තැනැත්තිය බඹදත් රජුගේ උබ්බරී නම් දේවිය වෙයි. ඕ තොමෝ රජු කළුරිය කළ තැන් පටන් මළ සිරුර දැවූ තැනට අවුත් බ්‍රහ්මදත්ත, බ්‍රහ්මදත්ත යයි ඔහුගේ නම කියමින් හඬමින් විලාප කිය යි. කීවාහු ය, ඒ කරුණ පවසන සංගිති කාරකයෝ මෙම ගාථා සය තැබූහ.

පඤ්චාල රට වැස්සන්ගේ මහාරථ නම් යෝධ වූ බඹදත් නම් රජෙක් විය. ඒ රජතෙම දිවා රාත්‍රීන්ගේ ඇවෑමෙන් කළුරිය කළේ ය.

එ කල්හි ඒ රජුගේ උබ්බරී නම් දේවිය ආදාහන ස්ථානයට ගොස් හඬයි. බඹදත් රජු නො දකින්නී බ්‍රහ්මදත්ත බ්‍රහ්මදත්ත යයි කියමින් හඬයි.

ඒ සොහොනට පසළොස් චරණ ධර්මයෙන් යුක්ත වූ, ඍෂි වූ තාපසයෙක් පැමිණියේ ය. එතැනට යම් මිනිස්සු සමූහයක් රැස් වූවාහු ද, ඒ ඍෂි වරයා ඔවුන් ගෙන් විචාළේ ය.

හාත්පස නන් වැදෑරුම් සුවඳ හමන්නා වූ, මේ සොහොන කවරෙකුගේ ද? මේ කාගේ භාර්යාවක් ද කවරෙකු සඳහා අඬන්නී ද?

මේ මිනිස් ලොවින් වෙන් වූ, තම ස්වාමියා වූ බ්‍රහ්මදත්ත රජු නො දකීමෙනි. බ්‍රහ්මදත්ත බ්‍රහ්මදත්ත යයි කියමින් හඬන්නී බ්‍රහ්මදත්ත රජුගේ භාර්යාවය යයි ඒ රැස් ව සිටි මිනිස්සු කීහ.

නිදුකාණනි, බ්‍රහ්මදත්ත රජුට යහපතක්ම වේවා! නානා විධ සුවඳ හමන මේ සොහොන ඒ බ්‍රහ්මදත්ත රජුගේ ය.

මේ ඔහුගේ බිරිඳ ඉතා දුර ගියා වූ ස්වාමියා නො දකින්නේ, බ්‍රහ්මදත්ත බ්‍රහ්ම දත්ත යයි කියමින් හඬන්නීය.

එහි අනු - යනු වූයේ ය. **පඤ්චාලා නං** - යනු පඤ්චාල රට වාසීන්ගේ, පඤ්චාල රට නම් වූ එක් ජනපදයෙක් විය. ජනපදයන්ට අධිපති වූ රජ කුමාරයා වශයෙනි ආරූඪ වශයෙන් පඤ්චාලානං යයි බහුවචනයෙන් දක්වේ. **රථෙසභො** - රථයන්හි වෘෂභ සමාන - මහාරථ යන අර්ථයි. **තස්ස ආළාහනං** යනු ඒ රජුගේ මළ සිරුර දැවූ තැන, **ඉසි** යනු ධ්‍යානා දී ගුණ මොහුට ඇත්තේනුයි ඉසිනම් **තත්‍ථ** - යනු ඒ උබ්බරි දේවිය සිටි තැන - සුසාන භූමිය යන අර්ථ යි. **ආගඤ්ඡි** - ගියේ ය. **සම්පන්න චරණො** - සීල සම්පන්න බව, ඉන්ද්‍රියයන් හි දමනය, භෝජනයෙහි පමණ දන වැළඳීම, නිදිවැරීම, ශ්‍රද්ධා දී සප්ත සද්ධර්මයෝ, සතර රූපාවචර ධ්‍යාන, මේ පසළොස් චරණ ධර්ම සඞ්ඛ්‍යාත ගුණයන් හි සමන් විත වූයේ, චරණ සම්පන්න යන අර්ථ යි. මුනි යනු තමන්ගේ හිත පිණිස ද අනුන්ගේ හිත පිණිස ද කළ යුතු දේ දනී යයි මුනි නම් වේ. **තෙ ච තත්‍ථ අපුච්ඡිංසු** - එහි තැන් තැන්වල සිටි මිනිසුන්ගෙන් විචාළේ ය. **යෙ තත්‍ථ සු සමාගතා** - යම් මිනිස් පිරිසක් ඒ සොහොන් බිම තැන් තැන් වල රැස් ව සිටියාහු ද? **සු** - යනු නිපාතයකි. **යෙ තත්‍ථා සුං සමාහිතා** යනුවෙන් ද සමහර තැනෙක සඳහන් වේ. **ආසු** යනු වූයේ ය යන අර්ථ යි. **නානාගන්‍ධ ස මෙරිතං** - නොයෙක් සුවඳ ජාතිවලින් හාත්පස සුවඳවත් කර සිටී. **ඉතො** මිනිස් ලොවින්, **දූරංගතං** - පරලොව ට ගියේ ය යි කීය යි. **බ්‍රහ්මදත්තා තී කන්‍දති** - බ්‍රහ්මදත්ත යන නම සංකේතවත් කොට වැළපීම් වශයෙන් කවරෙක් කැඳවයි ද? **බ්‍රහ්මදත්තස්ස භද්‍දනෙන බ්‍රහ්මදත්තස්ස මාරිසා** - යනු නිදුකාණනි! නොයෙක් සුවඳ හමන්නා වූ මේ සොහොන බ්‍රහ්මදත්ත රජුගේ ය. ඒ බ්‍රහ්මදත්ත රජුගේ

දේවිය ඒ බ්‍රහ්මදත්ත රජු ම සිහිකරමින් වැළපෙයි. එබඳු වූ මහේසිකාවට අනුකම්පා පූර්වක හිතවත් සිතින් මුදවන්නේ නම් පරලොව සිටින් නහුට ද නිතර සැපයක්ම වේ ය යි යන අදහස යි.

එවිට ඒ තාපස තෙමේ ඔවුන්ගේ වචන අසා අනුකම්පාව උපදවා, උබ්බරී සමීපයට ගොස් ඇගේ සෝකය පහකිරීම සඳහා

බ්‍රහ්මදත්තය යන නම් ඇති අසූහය දහසක් මේ සොහොනෙහි දවා ඇත. ඔවුන් අතුරෙන් කවර නම් බ්‍රහ්මදත්ත කෙරේ ඔබ ශෝක කරන්නී ද? යන ගාථාව කීහ.

එහි **ඡළා සීති සහස්සානි** - සයදහසකට අධික අසූදාහක් **බ්‍රහම දත්ත සස නාමකා** - බ්‍රහ්මදත්ත යයි මේ නම දරූ - **තෙසං කං අනුසොචති** ඔවුන් අතුරෙන් කවරෙක්, ඒ අසූ හයදහසක් වූ බ්‍රහ්මදත්ත වරුන් අතරෙන්, කීවෙනි කවර බ්‍රහ්මදත්ත සඳහා ඔබ වැළ පෙන්නේ ද? කවරෙකු උදෙසා ඔබට සෝකය පහළ වුයේ ද? යනුවෙන් විචාළේ ය.

මෙසේ ඔහු විසින් විමසන ලද උබ්බරී දේවි තමන් අදහස් කරන බ්‍රහ්මදත්තයන් ගැන කියන්නී, මේ ගාථාව කිහ.

ස්වාමීනි ! චූලනී නම් රජුගේ පුත් වූ, මහාරථ නම් යෝධයෙක් වූ පඤ්චාල රට වාසීන්ගේ යම් රජෙක් වී ද? සියලු කැමති දේ දෙන්නා වූ ඒ ස්වාමියා සොයමින් ශෝක කරමි.

එහි **චූලනී පුතෙතා** - චූලනී නම් ඇති රජුගේ පුත්‍ර වූ, **සබ්බ කාම දදං** යනු මගේ කැමති නොකැමැති දේ විමසා සියලු දේ දුන්නා වූ, සියලුම සත්ත්වයන්ට කැමති දේ දුන්නා වූ

මෙසේ උබ්බරී දේවිය කීමෙන් පසුව නැවත තාපස තෙමේ.

සියළු රජවරු බ්‍රහ්මදත්ත නැමැත්තෝ වූහ. ඒ සියලු රජවරු පඤ්චාල රට වැසියන්ගේ රථික ශ්‍රේෂ්ඨ වූ ද, චූලනී පුත්‍රයෝ ම වූහ.

මේ සියලු ම රජවරුන්ට තී අග මෙහෙසුන්ව වූහ. එසේ නම් පළමු රජුන් අමතක කර හැර පසු වූ රජු සඳඩහා වැලපෙන්නී ද? යන ගාථා දෙක කීහ.

එහි **සබ්බවහෙසුං** - යනු ඒ අසූ හය දහසක් සියලු ම රජවරු බ්‍රහ්මදත්ත නම් ඇත්තෝම වූහ. පඤ්චාල රටවැස්සන්ගේ ශ්‍රේෂ්ඨ රථික වූ චූලනී රජුන්ගේ ප්‍රත්‍රයෝම වූහ. මේ ඔවුන් අතුරෙන් එකෙකුට වත් රාජභාවාදී විශේෂයෝ නොවූහ. **මහෙසිත්තමාකාරයී** - ඔබ ද ඒ සියලු රජවරුන්ගේ පිළිවෙලින් අගමෙහෙසුන් වූහ. අනු පිළිවෙළින් පැමිණියේ යන අර්ථ යි. **තසතා** - ගුණයෙන් හා ස්වාමී බව්නුත් වෙනසක් නැති මෙ පමණ පළමු රජවරුන් සිටිය දී, ඒ රජවරුන් හැර පසුව වූ එක් රජෙකුට ම කවර කරුණකින් ඔබ ශෝක කරන්නේ දැ යි විචාළේ ය. ඒ අසා හටගත් සංවේග ඇති උබ්බරී තෙමෝ තාපසයාට මෙසේ කී ය.

263. නිදුකාණනි !යම් බඳු ස්ත්‍රී භාවයට පැමිණියා වූ මට, සසර බොහෝ ජාතීන් කියන සේක් ද? මා ස්ත්‍රී භාවයට පැමිණ බොහෝ කල් වන්නේ ද?

එහි ආතුමෙ - යනු තමන් කෙරෙහි **ඉත්ථි භූතායා** යනු ස්ත්‍රි භාවයට පැමිණ **දීඝරත්තායා** - බොහෝ කලක් වන්නේ ද? ස්ත්‍රි භාවයට පැමිණ බොහෝ කල් ස්ත්‍රියක්ම වූයේ ද? කෙනෙක් පුරිස භාවයටත් පැමිණියේ වේ ද? **යසසා මෙ ඉත්ථි භූතායා** - යම්බඳු ඒ ස්ත්‍රියක් වූ මා ඒ සියලු ම රජවරුන්ට මෙහෙසීන් වූයේ ය යි කියන්නේ ද? **ආහු මෙ ඉත්ථි භූතවා** යනු ද පාඨයි. එහි ආති යනු අනුස්සරණ (සිහි කිරීම්) **අර්ථයෙහී පාඨයි. හුමෙ** - තෙමේම සිහිකරමින් මා විසින් ස්ත්‍රි භාවයක් ලබා ස්ත්‍රියක්වසයෙන් ම මෙතෙක් කල් පැමිණ ස්ත්‍රීභාවය නො වෙනස් ව පැවැත්තේ ද? එසේ හෙයින් යම් මගේ මේ ස්ත්‍රි භාවය නිසා සියල්ලන්ටම පිළිවෙලින් මෙහෙසියන් වූයේ ම ද? මේ මහාමුනි තෙමේ හැමදාම සසරෙහි ස්ත්‍රීයක්ම වී යේය යි ප්‍රකාශ කරන්නේ ද? ඒ වචන අසා තාපස තෙමේ එහෙම නියමයක් සංසාරයේ නැත. ස්ත්‍රීයක් ස්ත්‍රීම වන්නේ ය පුරුෂයෙක් පුරුෂ වන්නේමය යන නියමයක් නැතිබව දක්වමින්, මේ ගාථාව කීහ.

264. ඔබ (සමහර කලෙක) ස්ත්‍රියක් වූවා ය. (සමහර කලෙක) පුරුෂයෙක් වූයේ ය. සමහර විට තිරිසන් යෝනියෙහි ද ඉපදුනේ ය. මෙසේ කියන ලද පරිද්දෙන් අතීත ආත්ම භාවයන්ගේ කෙළවරක් නො දක්නා ලැබෙයි.

එහි - **අහු ඉත්ථි අහු පුරිසො** - ඔබ කිසියම් කලෙක ස්ත්‍රීයක වූවා ය. කිසිකලක පුරුෂයෙක් වූයේ ය. හුදෙක් ස්ත්‍රී පුරිස බව පමණක්ම නො වේ. සමහර විටක තිරිසන් යෝනිවලට ද පැමිණියේ ය. කිසිදාක මෘගාදී සිවුපා බවට ද වෙනත් තිරිසන් යෝනි වලට ද පැමිණියේ වෙයි. **එවමෙතං අතීතානං**

**පරියනෙතා න දිස්සතී** - යනු මෙසේ කියනලද පරිදි ස්ත්‍රීභාවයට, පුරිසභාවයට, හා තිරිසන් ආත්මභාව වලට, පැමිණියා වූ අතීත ආත්ම භාවමයන් පිළිබඳව නුවණැසින් මහත් උත්සාහයෙන් බලන්නේ ද නො පෙනේන්නේ ම ය. හුදෙක් එකක්ම නො වේ. මේ සියල්ල සසරෙහි සැරිසරන්නා වූ සත්ත්වයන්ගේ ආත්ම භාවයන්ගේ කෙළවරක් නො දක්නේ ම ය. නො පෙනෙන්නේ මය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ **"අනමතග්ගොයං භික්ඛවෙ සංසාරො පුබ්බා කොටි න පඤ්ඤායති. අවිජ්ජා නීවරණ නං, සත්තානං තණ්හා සංයොජනානං සන්ධාවතං සංසර තං"** යනාදිය වදාරණ ලදී. මෙසේ ඒ තාපසයා විසින් කෙළවරක් නො පෙනෙන සසරෙහි කරණ ලද කර්මයාගේ බේදීම් ආකාරයෙන් දක්වමින් දේශනා කරන ලද ධර්මය අසා සංසාරය පිළිබඳ ව කළකිරුණු සිත් ඇති ව, ධර්මයෙහි පැහැදුණු මනසින් යුතුව, පහකරන ලද සෝක නමැති හුල් ඇතිව, තමාගේ පැහැදීම හා ශෝකය පහවීම ප්‍රකාශ කරමින් ගාථා තුනක් කීහ.

ගිතෙල් ඉසිනා ලද ගින්නක් මෙන්, ශෝක නමැති ගින්නෙන් ගිනිගන්නා වූ මා ජලය වත් කරන්නකු මෙන් සියලු දාහය නිවන්නේ ය.

හදවත ඇසුරේ පැවති ශෝක නමැති හුල උදුරන ලදී. ස්වාමියා කෙරෙහි හටගත් ශෝකය කිසියම් කෙනෙකු විසින් පහ කළේ ද?

ඒ මම ඉදිරුණු ශෝක නමැති හුල් ඇත්තේ වෙමි. සිහිල් වූයේ වෙමි. නිවුණේ වෙමි. මහා තාපසයාණන් වහන්ස ! ඔබේ වචනය අසා ශෝක නො කරමි. නො හඬමි.

මේ ගාථාවන්ගේ අර්ථය යට කියන ලද්දේ ම ය. දැන් කළ කිරුණු හදවතින් යුත් උබ්බරී දේවියගේ ප්‍රතිපත්තිය පිළිවෙත දක්වමින් ශාස්තෘන් වහන්සේ ගාථා සතරක් වදාළ හ.

ඒ තාපසයාගේ යහපත් වූ ධර්මය අසා (ඒ උබ්බරී දේවිය) පා සිවුරු ආදිය රැගෙන ගිහිගෙයින් වෙන් වී පැවිදි වූවා ය.

ඕ තොමෝ ගිහිගෙයින් නික්ම තපසට සුදුසු තන්හිම පැවිදි වූයේම බඹලොව ඉපදීම පිණිස මෛත්‍රී ධ්‍යානය වැඩුවාය.

ගමක් පාසා නියම් ගමක් පාසා ජනපදයක් රාජධානියක් පාසා හැසිරෙමින් උරුවේලා නම් ගම දී කළුරිය කළා ය. බඹලොව ඉපදීම පිණිස මෛත්‍රී භාවනාව වඩා ස්ත්‍රී භාවයෙහි සිත දුරුකොට බඹලොව උපන්නේ විය.

එහි **තස්සා** - යනු ඒ තාපසයාගේ **සුභාසිතං** - යනු අතිශය ප්‍රශස්ත වූ, ධර්මය යන අර්ථයි. **පබ්බජිතා සන්තා** - යනු ප්‍රව්‍රජ්‍යාවට පැමිණ, පැවිද්දට සමාන වී, කය වචනය දමනය කොට, **මෙත්ත චිත්තං** - යනු මෛත්‍රී සහගත සිත මෛත්‍රී ධ්‍යානයම කිය යි. **බ්‍රහම ලොකූප පත්තියා** - යනු එසේ මෙත් සිත් වඩන්නේ ද? බඹලොව උපදීම පිණිසම වන්නේ ය. විදර්ශනා වැඩීමේ අර්ථ නොවේ. සිව්සස් ඥානයට නොපැමිණ, බඹ විහරණ වඩමින්, තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව යම්තාක් භවසම්පත්තියටම පැමිණෙන්නාහු යනු යි. ගාමා ගාමං යනු ගමින් ගමට, **අංභාවෙත්වා** - වඩා - නැවත නැවත වඩා, "අභාවෙත්වා" යනු ද කිසිතැනක සදහනි. එහි අකාරය නිපාත මාත්‍රයකි. **ඉත්ථි භාවෙ විරත්ත චිත්තා** ස්ත්‍රී භාවය පිළිබඳ අදහස, අභිරුචිය, කැමැත්ත අත්හැර ස්ත්‍රී භාවයෙන් වෙනස් වූ සිත් ඇති ව, **බ්‍රහම ලොකූපගා** - යනු පිළිසිඳ ගැනීම් වශයෙන් ඔබ ලොවට පැමිණියේ ය. සෙස්ස යට කියන ලද පරිදි දෙති.

ශාස්තෘන් වහන්සේ මෙම ධර්ම දේශනාව ගෙනහැර දක්වා, ඒ උපාසිකා වගේ ශෝකය දුරු කොට මත්තෙහි සිව්සස් දේශනා කළ සේක. සත්‍ය දේශනාව සානයේ ඒ උපාසිකා තොමෝ සෝවාන් ඵලයෙහි පිහිටියා ය. එතැන්හි රැස් වූ පිරිසටද ධර්මදේශනාව සාර්ථක වූයේ ය.

**උබ්බරී කථා වස්තුව නිමියේ ය.**

**දෙවැනි උබ්බරී වර්ගය සමාප්ත යි.**

—//—

# 3-1

"**අභිජ්ජමානෙ වාරිම්හා** " - යන මේ කථා වස්තුව ශාස්තෘන් වහන්සේ වේළුවනයෙහි වැඩ වසන කල්හි එක්තරා වැදි ප්‍රේතයකු අරභයා වදාරණ ලදී. බරණැස් නුවර බටහිර දිසාවෙහි ගඟින් එතෙර වාසභ නම් ගම ඉක්මවා චුන්දත්ථික නම් ගමෙහි එක් වැද්දෙක් විසීය. ඔහු කැලයෙහි මුවන් මරා යහපත් මස් අඟුරු මත පිස කා ඉතිරි ඒවා කොල ගොටුවල බහා බැඳ කදින් ගෙන ගමට ආයේ ය. ඒ ගමැ බාල දරුවෝ ගම්දොර දී ඔහු දැක මට මස් දෙව, මට මස් දෙවයි අත් දිගු කොට ලඟට දිවයති. හෙතෙම ඔවුන්ට මස් ටික ටික දෙයි. ඉක්බිති එක් දවසක් මස් නො ලැබ, කොබෝලීල මල් පැළඳ මල් බොහෝවක් අතින් ගෙන ගමට යන්නාවූ ඔහු ගම්දොර දී, මට දෙව මට දෙව යි අත් ඔසවා ළගට දිවගියාහු ය. හෙතෙම ඔවුන්ට එක එක මල් පොකුර බැගින් දුන්හ. ඔහු මෑත කාලයෙක මැරී ගොස් ප්‍රේත යෝනියෙහි උපන්නේ ය. හේ විලිවැසුම් නැත්තේ ය. විරූප වූ ශරීර ඇත්තේ ය. බියකරු දැකුම් ඇත්තේ ය. සිහිනෙන් වත් ආහාර පාන නො ලබන්නේ ය. හිසේ පැළඳගත් කොබෝලීල මල් කළඹ ඇත්තේ ය. ඔහු දිනක් චුන්දත්ථි ක නම් ගම නෑයින්ගෙන් කිසියම් ආහාරයක් ලබන්නෙමි යි සිතා ගංගානම් ගග දියමත උඩුගං බලා යයි.

එසමයෙහි බිම්බිසාර රජුගේ මහ ඇමති කෝලිය තෙම කුපිත වූ පිටිසර ගමක් සංසිඳුවා ආපසු එන්නේ, ඇත් අස් ආදී බලසෙනග ගොඩ බිමින් යවා, ඔහු ගංගා නම් ගගේ යටි ගං බලා එන්නේ ඒ ප්‍රේතයා දුටුවේ ය. දැක ඔහුගෙන් මෙසේ විචාළේ ය.

1. ගඞ්ගා නදියේ දිය මත්තෙහි නග්න ව, (එහෙත්) ශරීරයේ උඩ කොටස දෙවියකු වැනි ව මල් පැළඳි  සරසන ලද හිස ඇති ව කොහේ යන්නේ ද? කොහේ වසන්නේ ද?

එහි, **අභිජ්ජමානෙ** - යනු පා තැබීමෙන් නො කැඩෙන නො බිඳෙන **වාරිම්හි ගඞ්ගායං** - යනු ගංගා නම් ගඟේ දිය මතුපිට, **ඉධ** යනු මෙතැන, **පුබ්බඩ්ඪ පෙතාවා** - යනු ශරීරයෙහි උඩකොටස ප්‍රේතයකු නොවන්නාක් මෙන්, ප්‍රේත යෝනියෙන් පහවුවාක් මෙන්, දිව්‍ය පුත්‍රයෙක් මෙන්, කෙසේ **මාලාධාරී අලඞ්කතො** - යනු මල් පැළඳ. මල්වලින් හිස් මුදුන අලංකර කරන ලද යන අර්ථයි. **කතථ වා සො භවිස්සති** - යනු කවර නම් ප්‍රදේශයක කවර නම් ගමක

තොපගේ වාසස්ථානය වන්නේ ද කියව යන තේරුමයි. දැන් එකල්හි ඒ ප්‍රේතයා විසින් කෝලිය ඇමතියා සමග කියන ප්‍රවෘත්තිය සඞ්ගීතිකාරකයෝ මෙසේ දක්වති.

වාසභ ගමටත්, බරණැසටත් අතර පිහිටි චුන්දත්ථික නම් ගමට යන්නෙමි යි ඒ ප්‍රේත තෙම කිය යි.

කෝලිය නමින් ප්‍රකට වූ මහ ඇමති තෙමේ ඒ ප්‍රේතයා දැක ඔහුට අත්සුණු ද වස්ත්‍ර යුගලයක් ද දුන්නේ ය.

නැව සිටි කල්හි කරනවැමි උපාසකයකුට ඒ වස්ත්‍ර යුගල දෙව්වේ ය. කපුවාට දුන් කල්හී එකෙණෙහිම ප්‍රේතයාගේ ශරීරයෙහි (රෙදි) වස්ත්‍ර දක්නාලදී.

ඉන්පසු ව යහපත් දිවසළු හැඳ මල් පැළැඳ, සැරසුණේ ය. දියයුතු සුදුසු ස්ථානයෙහි (දක්ෂිණාර්හ ස්ථානය) පිහිටියාහු දක්ෂිණාව මේ ප්‍රේතයාට පැමිණියේ ය. එහෙයින් ප්‍රේතයන්ට අනුකම්පා වෙන් නැවත නැවත දක්ෂිණාව දියයුතු වන්නේ ය.

එහි චුන්දත්ථිතං - යනු එනම් වූ ගමයි. **අන්තරෙ වාසභ ගාමං බාරාණසියං ච සන්තිකෙ** යනු වාසභ ගමට ද බරුණැස් නගරයට ද මැද මෙහි අන්තරා ශබ්ද යෝගය සාමීප්‍යයෙහි උපයෝග වචන යි. බරණැස් නුවර සමීපයෙහි ඒ ගම වේ. මෙහි ද ඒ අර්ථය මැයි. වාසභ ගමට ද, බරණැසට ද අතර පිහිටි චුන්දත්ථික නම් ගම, බරණැසට නුදුරෙහි වූ ඒ ගමට යන්නෙමි. **කොලිකෙ ඉති විස්සුතො** - යනු කෝලියනම් වූ ප්‍රචලිත නමයි. **සත්තුං භත්තඤ්චා** යනු අත්සුණු, බැදපුපිට්ටු, හා බත්, **පීතකඤ්ච යුගං** අදා යනු කහ පාට සහ රන්වන් පැහැ වස්ත්‍ර දෙකක්, දුන්නේ ය. කවර හෙයකින් දෙකක් දුන්නේ ද? **නාවාය තිට්ඨමානාය කප්පකස්ස අදාපයි** - යනු ගමන් කරන්නා වූ නැව නවත්වා එහි සිටි එක් උපාසක කරණවැමියකුට දුන්නේ ය. වස්ත්‍ර දෙකක් දෙන ලදැයි දැක්වේ. **ඨානෙ** - යනු ස්ථානයෙහිම, එකෙණෙහි ම, එතැන්දී ම, **පෙතස්සු දිස්සථා** - යනු ප්‍රේතයාගේ ශරීරයෙහි වස්ත්‍ර එකක් හැඳ එකක් පෙරවා දැක්වී ය. එහෙයින් කියන ලදී. **තතො සුවත්ථවසනො මාලාධාරී අලඞ්කතො" සුවත්ථවසනො** - මල් පැළැඳ යහපත් වස්ත්‍ර හැඳ ප්‍රසාදයට සතුටට පත් වැ, **ඨානෙ ඨිතස්ස පෙතස්ස දක්ඛිණා උපකප්පථා** - දක්ෂිණාව

පරිනැමූ මොහොතේ ම, එහි ඵල විපාක යම්හෙයකින් ප්‍රේතයා අනුමෝදන් වී ද, එකෙණෙහිම භුක්තිවිදීමට පත්විය. **තස්මා දජ්ජෙථ පෙතානං අනුකම්පාය පුනප්පුනං** - යනු ප්‍රේතයන්ට අනුකම්පාකොට, ප්‍රේතයන් උදෙසා, නැවත නැවත දක්ෂිණාව දිය යුතු ය. යන අර්ථ යි.

ඉක්බිති කෝලිය නම් මහාමාත්‍ය තෙම ප්‍රේතයාට අනුකම්පා කොට දන් වැට සම්පාදනය කොට ගඟ පහළට අවුත් සූර්යයා උදාවන කල්හි බරණැසට පැමිණියේ ය. භාග්‍යවතුන් වහන්සේ ද ඔවුන්ට අනුකම්පා පිණිස අහසින් අවුත් ගංතෙර වැඩසිටි සේක.

කෝලිය මහ ඇමති නැවෙන් බැස, තුටු පහටු සිත් ඇති ව භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කළේ ය. ස්වාමීනි ! අද මේ මගේ දානවස්තුව අනුකම්පා පෙර දැරිව ඉවසා වදාරණ සේක්වා ! භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දතාවයෙන් ඉවසා වදාළ හ. භාග්‍යවතුන් වහන්සේ ඉවසා වදාළ බව දැන, සිත්කළු භූමි භාගයක මහත් වූ අතුවලින් තැනූ මඩුවක නානාවිධ විරාග වර්ණයෙන් විසිතුරු වූ විවිධ වස්ත්‍ර වලින් අලංකාර ලෙස සරසා භාග්‍යවතුන් වහන්සේට අසුනක් පණවා පිරි නැමී ය. පණවන ලද අසුනෙහි බුදුන් වහන්සේ වැඩ සිටිසේක. ඉක්බිති ඒ මහ ඇමති තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ සුවඳ ද්‍රව්‍ය හා මල් ආදියෙන් පුදා වැඳ එකත් පසෙක සිටියේ යට සඳහන් තමන් විසින් ප්‍රේතයාට කී වචන ද, ප්‍රේතයා විසින් තමන්ට පිළිතුරු ද භාග්‍යවතුන් වහන්සේට දැන්වී ය. භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේලා පැමිණේවා යි සිතූ සේක. සිතීමට අනතුරු ව ම බුද්ධානුභාවයෙන් ආඥාකරන ලද ධෘතරාෂ්ට්‍ර හංස රජු කරා එන ස්වර්ණ හංසයන් මෙන් භික්ෂු සඞ්ඝයා ධර්මරාජයන් පිරිවරා ගත්හ. එකල්හි මහත් වූ ධර්ම දේශනාවක් වන්නේය යි මහජනයා ද රැස්වූහ, එය දැක ප්‍රසාදයට පත් සිත් සතන් ඇති මහා ඇමති බුද්ධ පුමුඛ මහා සඞ්ඝයා ප්‍රණීත වූ වැළඳිය යුතු දෙයින් ද පියයුතු දෙයින් ද සන්තර්පණය කළහ. භාග්‍යවතුන් වහන්සේ බත්කිස නිමවා මහා ජනයා වෙත අනුකම්පාවෙන් බරණැස සමීප වාසීන් පැමිණේවායි අධිෂ්ඨාන කළේ ය. ඒ සියල්ලෝ ම මහාජනයා රැස් වූහ. බොහෝ වූ ප්‍රේතයන් ද මහාජනයාට පෙනෙන්ට සැළැස්වී ය. ඔවුන් අතුරෙන් සමහරු ඉරී ගිය රෙදි වැරළි ඇන්දාහු වූහ. සමහරු තමන්ගේ කෙස් වලින් ම විලි වසා ගත්තෝ වූහ. තවත් කෙනෙක් නග්න ව ම සිටියාහ. සා පිපාසා දෙකින් මඩනා ලදු ව, සමින් වසන ලද ඇට කටුවලින් යුතු ශරීර ඇති ව, ඔබ මොබ ඇවිදින්නාහු මහාජනයාට ප්‍රත්‍යක්ෂ වශයෙන් පෙනුනාහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ ප්‍රේතයන් එක් තැනකට රැස් වී

තමතමන් පෙර කළ පාප කර්මයන් මහා ජනයාට ප්‍රකාශ කරන්නෝ ද එබඳු වූ ඉධ්‍යභි සංස්කාරයක් ඉටා වදාළහ. ඒ කරුණු විස්තර කරණ සඞ්ගීති කාරකයෝ මේ ගාථා කීහු

සමහර ප්‍රේතයෝ ඉරී වැහැරීගිය රෙදි කැබලි හැන්දෝ ද, තවත් සමහරු තමන් ගේ කෙස්වලින් ම ලජ්ජා ස්ථාන වසාගත්තෝ ද ආහාර පිණිස දිගින් දිගට යති.

ඇතැම් ප්‍රේතයෝ දුරතැන් කරා දුව ගොස් කිසිවක් නො ලබාම නතර වෙත්. සාගිනි ඇත්තෝ මුලාවෙන් යුතු ව කරකැවෙමින් බිම වැටෙති.

තවත් සමහරු තැන් තැන්හි වැටී, පෙර ජාතියෙහි කුසල් නො කොට අව්වෙහි ගින්නෙන් දැවුණාහු වෙති.

අපි පෙර ආත්මවල දී පාපධර්ම ඇති ළාමක ස්වරූප ඇති ගෘහපතියෝ කුල මච්චරු වීමු. දිය යුතු වස්තූන් තිබියදීත් දන් දී අපට පිහිටක් කර නො ගත්තෙමු.

බොහෝ වූ ආහාර පාන ද විසි කළෙමු. යහපත් ප්‍රතිපදා ඇති පැවිද්දන්ට කිසිවක් නො දුන්නෙමු.

නො කළ යුතු පව්කම් කැමැත්තෝ වීමු. කුසල්හි අලසයෝ වීමු. බොහෝ කෑවෝ වෙමු. මිහිරි වස්තුවට ප්‍රිය වීමු. බත් පිඩක් වත් නො දුන්නෙමු. ප්‍රතිග්‍රාහකයන්ට පරිභව කළෙමු.

ඒ ගෙවල් දොරවල් ද, දාසි දස්හු ද ආභරණ ද අද අපට නැත. අනෙක් අය ඒවා පරිභෝග කෙරෙති.

අවමන් කටයුතු පහත් කුල ඇත්තෝ වෙමු. සම්කරු කුල ඇත්තෝ, සැඩොල් කුල ඇත්තෝ, මිත්‍ර දෝහී වූවෝ, ඉතා අකරුණාවට පැමිණියෝ, නැවත නැවත කපු කුලවත්හු ද වෙති.

ඉතා දුප්පත් වූ හීන කුලයෝ වෙත් ද? ඒ ඒ හීන කුලයන්හි ම උපදිත් මෙය දැඩි ලෝභ කමේ විපාක යි.

පෙර පහකළ මසුරු මළ ඇතිව කළ කුසල් ඇතිව ම, දායකයෝ වෙත් ද ඔව්හු ස්වර්ග ලෝකය පුරවති. නන්දන වනය බබුළුවත්.

වෛජයන්ත ප්‍රාසාදයේ ඇලී කැමති පරිද්දෙන් කාම සම්පත් පරිභෝග කෙරෙත්. එයින් චුතව (මිනිස් ලොවදී) මහත් සම්පත් ඇති උසස් කුලවල උපදිති.

උසස් කුලවල උපන්නෝ කුළු ගෙවල් ද, ප්‍රාසාද ද, දික් ලොම් ඇති කොඳු පලස් අතුරණ ලද සයනාසන ද ලබති. දිනු සිරුරු ඇති ව මොනර පිල්වලින් සැදුණු විජිනි පත් (ඒවායින් ලබන සිහිල් පවන්) ලබති. පිරිවර ජනයා ඇත්තෝ වේ.

මල් මාලා දරති. (කුඩාවියේ දී) ඇකයෙන් ඇකයට මාරුවෙමින් සුවසේ වැඩෙත් කිරිමව්වරු උදේ සවස දෙක්හි උපස්ථාන කරත්.

ශෝක රහිත වූ, මනරම් වූ, දෙවියන්ගේ මහා වනය වූ. නන්දන වනයෙහි (හැසිරීම ස්පර්ශය) පින් නො කළවුන්ට නො ලැබේ. පින් කළවුන්ට ම ලැබේ.

පින් නො කළවුන්ට මෙලොව ද පරලොව ද සැපතක් නැත. පින් කළවුන් ට මේ ආත්මයේ දී ද පරලොව දී ද සැප ම ලැබේ.

දෙවියන් හා සහ වාසයට යනු කැමැත්තෝ බොහෝ පින් කළ යුතු ය. කරන ලද පින් ඇත්තෝ ම දිව්‍ය පඤ්චකාම සම්පත්තියෙන් සතුටු වෙත්.

එහි **සාතුනනවසනා** - ඉරුණු වැරහැලි වූ රෙදි කැබලි හැඳගත්, **එකෙ** - සමහරු **කෙස නිවාසනා** - තමන්ගේ ම හිසකෙස්වලින් ලජ්ජා ස්ථාන වසාගනී, **භත්තාය ගච්ඡන්ති** - මෙහි ගොස් එහේ දි හෝ මෙහේ දී ඉඳුල් බතක්, වමනය කරන ලද බතක්, ගැබ්මල ආදියක් ලබන්නේ නම් යෙහෙකැයි කිසිදෙසක නො ගොස් ආහාර පිණිස ම යති. **පක්කමන්ති දිසො දිසං** - දිසාවෙන් දිසාවට නොයෙක් යොදුන්ගණන් එහා මෙහා ගමන් කරතී දුරෙ දුර ඇත තැන්වල, **එකා** - එක් ප්‍රේතයෙක්, **පධා විත්වා** - බොහෝදුර දිවගොස්, අලද්ධාව නිවත්තරෙ - කිසිත් කැමක් හෝ බීමක් නො ලැබ නවතී, **පමුච්ඡිතා** - සා පිපාසා දෙකින් හටගත් මූර්ජා ඇති ව,

**හනන්තා** - කරකැවෙමින්, **භූමියං පටිසුම්භි තා** - මෙසේ මූර්ඡාවට පත්ව සිටගෙනම සිට බිම හෙළූ මැටි ගුලිසේ බිම ඇද වැටෙති. **තත්ථා** - ගිය තැන, **භූමියං පටිසුම්භිතා** - ප්‍රපාතයෙහි වැටුණක් මෙන්, සා පිපාසා දුකින්, සිටින්නට අසමර්ථ වීමෙන් බිම වැටෙත් එහි ඒ ගිය ගිය තැන්වල කෑමක් බීමක් නො ලැබේ ම, සිඳුණු ආසා ඇති ව, කිසිවකු විසින් පිටු පසින් සිට තල්ලු කලාක් මෙන් බිම වැටෙත් යන අර්ථයි. **පුබ්බෙ අකත කල්‍යාණා,** පෙර ආත්මයෙහි නො කරන ලද කුසල් ඇති. **අග්ගිදඩ්ඪාව ආතපෙ** ග්‍රීෂ්ම කාලයෙහි අව්ව ඇති ස්ථානයක ගින්නෙක් දවන්නාක් මෙන් සාගින්නෙන් හා දිය පිපාසාවෙන් දූවෙමින් මහා දුක් අනුභව කරත් යන තේරුමයි. **පුබ්බෙ**, අතීත ආත්මභාවයෙහි **පාපධම්මා** - යනු ඊර්ෂ්‍යාව, මසුරුබව, ආදී ලාමක ස්වභාවයන් **සරණියො** යනු ගෘහ මුලිකාවන්, ගෘහ ස්වාමීනීන්, **කුලමාතරො** - කුල දරුවන්ට මව්වරු වීමු. කුල පිරිසට මව් වරු වීමු. **දීපං** යනු පින්කම් හි පිහිටියේ යන අර්ථ යි. ඒ හේතුවෙන් සත්ත්වයෝ සුගතීන්හි පිහිටි බව පතිට්ඨා යයි කිය යි. **නා කම්හා** නො කෙළෙමු. **පහූතං** යනු බොහෝ, **අන්නපානම්පි** - යනු ආහාර වර්ග බීම වර්ග **අපිස්සු අවකිරියතී.** යනු "සු" යන්න නිපාතයක් පමණි. නො විසුරුව යි. වසාතබයි. **සම්ම ගත** **තෙ** - යහපතට පැමිණි, මනා පිළිපැදිව, මනා පිළිපැදීම් ඇති, **පබ්බජිතො** - යනු පැවිදි වූ, මේ සම්ප්‍රදානාර්ථයෙහි භුම්ම වචනයි. මනාව පිළිපැදි ප්‍රව්‍රජ්‍යාව ඇති කල්හි මනාව පිළිපැදි භික්ෂූන් වහන්සේලා ඇති කල්හි, **න ච කිඤ්චි අදම්හසෙ** ස්වල්ප දෙයක් වත් දෙය්‍ය ධර්ම වශයෙන් නුදුන්නෙමු යි පසු තැවිල්ලෙන් කියති. **අකම්ම කාමා** - නො කළයුතු කර්ම අකුසල් කැමති වෙති යි **අකම්මකාම නම්** වේ. මැනවින් කළයුතු කුසල් දහම් අකමැති වී නුයි - **අකම්මකාම** නම් වේ. නො කළ යුතු දේ අකම්මකාමා නම් වේ. කුසල ධර්මයන්හී නො කැමති වේනුයි යන අර්ථ යි. **අලසා** - කම්මැලි වීම, කුසලකර්මයන්හී. උත්සාහ නැති බව, **සාදුකාමා** - සැප මිහිරි වස්තුවලට ප්‍රිය වීම. **මහග්ඝසා** - බොහෝව ක් කෑම, පරිභෝග කිරීම, දිවා රෑ යහපත් වූ ද මිහිරි වු ද බොජුන් ලැබ දුගී මගී යාචකාදීන්ට කිසිත් නො දී තමන් විසින් ම පරිභෝග කිරීම දක්වයි. **ආලෝප පිණ්ඩදාතාරො** - බත් පිඩක් පමණ වත්, ආහාර ටිකක් දෙන තැනැත්තා, **පටිග්ගාහ කෙ** - යනු ඒ දාන වස්තුව දෙය්‍ය ධර්මය පිළිගත්තා තැනැත්තා, **පරිභාසිම්හ සෙ** - යනු ඒ ප්‍රතිගාහකයන්ට පරිභව කෙළෙමු. අවඥා කළෙමු. කවට කම් කළෙමු, විහිළු කළෙමු. **තෙසරා** අපි පෙර අපගේ ගෘහය යයි යමක් කෙරෙහි මමත්වය කළ ඒ ගෙවල් යම් සේ සිටී ද තිබේ ද දූන් ඒවායින් කිසි ම පිළිසරණක් නො ලැබේය යන අදහස යි. **තා ච දාසියො තාණොවා භරණානි නො** යනු, මෙහිද එම ක්‍රමය මැ යි. එහි **නො** යනු අපගේ, **තෙ** යනු ගෙවල් ආදිය

**අඤ්ඤෙ** යනු වෙනත් අය, **පරිභාරෙනති** - යනු පරිභෝග කරත්, පරි භෝග වශයෙන් භුක්තිවිඳීම කරති. යන අර්ථ යි. **මයං දු ක්ඛස්ස භාගි නො** - අප වනාහි පෙර ජාතියෙහි හුදෙක් ක්‍රීඩාවෙන් විනෝදයෙන් කල්යවා සම්පත් හැර යා යුතු ගමනට අනුගාමික ව යන්නා වූ කිසිවක් නො කොට නො දූන, දූන් සා පිපාසාදී දුකට භාජනය වෙමින් සිටින්නෙමු යයි තමන්ට අවලාද කියගනිත්. දූන් යම් හෙයකින් මේ ප්‍රේත යෝනියෙන් චුතව මිනිස් ලොව උපදින්නේ නම්, බොහෝ සෙයින් මේ කර්ම විපාක හේතුවෙන්, විපාක වශයෙන් හීන කුලවල දුගී දුප්පත් ව ඉපදීමට සිදු වේ. එහෙයින් ඒ අර්ථය දක්වන්නට වෙණිවා ආදී ගාථාවන් දෙක කියන ලදී.

එහි - **වෙණිවා** - යනු කුළු පොතු කුලයෙහි, නළකාර කුලයෙහි උපදී යන අර්ථයි. 'වා' ශබ්දය අනියමාර්ථයේ ය. **අවඤ්ඤා** - අවඥාවට හේතුවේ භාජන වේ. නින්දා කිරීම්, ගැරහීම් වලට භාජන වේ. **වමහනාති** යනුවෙන් ද පාඨයක් පෙනේ. අනුන් විසින් බාධා කෙරේ යන අර්ථ යි. **රථ කාරී** - සම්වලින් වැඩ කරන්නා, **දූබ්භිකා**, මිත්‍රද්‍රෝහී, මිත්‍රයන්ගෙන් බාධා ඇතිවන, **චණ්ඩාලී** - සැඩොල් කුලය, **කපණ**- අසරණ, දුකඛිත, අතිශයින් ම අකරුණාවට පත් ව **නහාපික** - ඇඳුම් අන්දවන්නා, කපුවා, පනික්කිය, මේ සියලු තත්ත්වයන් තැන්තැන්වල (ඇතිවන්නේ ය නැවත නැවත උපදින්නේ ය. යන යෙදීමයි. වරින් වර, මේ නිහීන කුලයන්හි ඉපදෙත් යනුවෙන් කී ය. **තෙසු තෙසෙවම ජායනති** - යම් යම් වෙනස් වෙනස් වූ නේසාද, පුක්කු ආදී පහත් කුලයන්හි (ඉපිදීම් ද, අතිශයින් හෙළා දකින්නා වූ, දුර්ගති වල ඉපදීම ඒ ඒ නිහීන කුලයන්හි ඉපද මසුරු මළයෙන් යුතු වූ අයගේ උත්පත්තිය මෙසේ වේ. එහෙයින් **එසා මච්ඡරිනො** ගති යන්න කියන ලදී,

මෙසේ පින්කම් නො කරන ලද පුද්ගලයන්ගේ උත්පත්ති ස්වභාවය දක්වා දූන් පින් කරන ලද්දන්ගේ උත්පත්ති ස්වභාවය දැක්වීමට - **පුබ්බෙච කත කල්‍යාණෙ** - ආදී ගාථා සතක් කියන ලදි. **සගග නෙත පරිපූරෙනති** - යමෙක් පෙර පූර්ව ජාතියෙහි කරන ලද යහපත් වූ දන් දීමා දි පින්කම්හි ඇලුනේ ද, පහකරන ලද මසුරු මළ ඇත්තේ ද, ඔව්හු තමන්ගේ රූප සම්පත් තියෙන් ද, පරිවාර සම්පත්තියෙන් ද සම්පූර්ණ වැ දිව්‍ය ලෝකය පුරවත් පරිපූර්ණ කරත් **ඔභාසෙනති ච නන්‍දනං** - තනි ව ම සම්පූර්ණ නො කරත්මැ යි. ඉක්බිති කල්පවෘක්ෂ ආදීන්ගේ පැහැයෙන් බබළන්නා වූ, නන්දන වනය තමන්ගේ වස්ත්‍රාභරණදියේ හා ශරීරයේ ප්‍රභාවයෙන් මැඩ පවත්වා තමන්ම බබළවා දිලිසෙත්. **කාම කාමිනො** - යම් පරිද්දෙකින් තමන් කැමති වන්නා

වූ කාමගුණයන්හි සම්පත් පරිභෝග කරමින් බැබලෙත් - **උච්චා කුලෙසු** - උසස් වූ ක්ෂත්‍රිය කුලය ආදී කුලයන්හි **සභොගෙසු** - මහා සම්පත්හි, **තතො චුතා** - ඒ දිව්‍ය ලෝකයෙන් චුත වී, **කූටාගාරෙව පාසාදෙ** - කුළු ගෙවල් සහිත වූ ප්‍රාසාදයන්හි. **විජිතඞ්ගා** - යනු ජයගත් ශරීර ඇතිව, **මොර හත්‍ථෙහි** - යනු මොනරපිලි වලින් යුක්ත වූ විජිනි පත් ගත් අත් ඇතිව, **යසස්සිනො** - පිරිවර ඇතිව කීර්තිමත්ව වාසය කරයි. යන අදහස යි. **අඞ්කතො අඞ්කං ගච්ඡන්ති** - යනු ළදරු කාලයෙහි ද ඤාතීන් ගේ ද, කිරිමව්වරුන්ගේ ද ඇකයෙන් ඇකයට යති. බිමට නො බසිත් යන අදහස යි. **උපතිට්ඨන්ති**, උපස්ථාන කරත්. **සුඛෙසිනො** - සැප කැමති වෙත්. **මා සීතංවා උණ්හං වා**, අල්පවූ ද දුකක් පරිහරණය කරන්නට විඳින්නට නො ලැබෙත් යන අදහස යි. **නයිදං අකත පුඤ්ඤානං** - යනු මෙසේ ශෝක වස්තු ඇති නො වන්නේ ශෝක වස්තු අහිත බැවින් නිශ්ශෝක වූ මිහිරි වූ, සුන්දර වූ තිදස් පුර තාවතිංස දෙව්ලොව මහා වන උපවනය වූ නන්දන වනය කුසල් නො කළ සත්ත්වයන්ට නො ලැබේ. **ඉධා** - යනු මේ මිනිස් ලොවෙහි විශේෂයෙන් පින් කළ යුතු වන්නේ ය. එය සඳහා ම පවතී. **ඉධා** යනු ඉහාත්මයෙහි ම **පරත්‍ථා** - මතු භවයෙහි, **තෙසං** යනු එහි කියන ලද පරිදි දෙවියන් කෙරෙහි, **සහව්‍ය කාමානං** - යනු සහභාවයට යනු කැමති වෙත්. **භොග සමඞ්ගිනො** - යනු සම්පත්වලින් යුක්ත වූ දිව්‍යමය වූ පස්කම් ගුණයෙහි යොදෙමින් සතුටු වෙත් යන අර්ථයි. සෙස්ස කියන ලද පරිදි ම ය.

ඒ ප්‍රේතයන් විසින් තමන් විසින් කරන ලද කර්මයන් ගේ ස්වභාවය ද, පින්කම්වල ස්වභාවය ද ප්‍රකාශ කිරීමෙන් පසු ව සංවේගපත් සිත් ඇති කෝලිය ඇමතිවරයා ප්‍රමුඛ එතැනට පැමිණි මහජනයාගේ අදහස්වලට අනුව භාග්‍යවතුන් වහන්සේ සවිස්තර ධර්මදේශනාවන් දෙසූ සේක.

දේශනාවසානයේ අසූ හාරදහසක් ප්‍රාණීන්ට ධර්මාභිසමය වූයේ ය.

**අභිජ්ජමාන ප්‍රේත වස්තුව**
**නිමියේ ය.**

—//—

# 3-2

"කුණ්ඩිනගරියො ථෙරො - ආදී වූ මේ ධර්මදේශනාව ශාස්තෘන් වහන්සේ වේළුවනාරාමයේ වැඩ වාසය කරන කල්හි ආයුෂමත් සානුවාසී ස්ථවිරයන්ගේ ඥාති ප්‍රේතයකු අරභයා දේශනා කළහ.

යටගිය දවස බරණැස් නුවර කිතවස්ස නම් රජුගේ පුත්‍රයා උයන්කෙළි කෙළ නැවැත් වූයේ, සුනෙත්ත නම් පසේ බුදුන්වහන්සේ පිඬු පිණිස හැසිර නගරයෙන් නික්ම යනු දැක රාජ ඖෂ්ණයෙන් මත් වී "මේ හිස මුඩු තැනැත්තා මට ප්‍රණාමය නො කොට යන්නේ යයි ඉතා නපුරු සිතින් ඇතු පිටින් බැස, කිම ඔබ විසින් පිණ්ඩපාතය ලබන ලද දැයි, කියා කථා කරමින්ම අතින් පාත්‍රය ගෙන පොළවේ ගසා බින්දේ ය. එකල්හි උන්වහන්සේ සියලු තන්හි කම්පා නො වන හෙයින් වෙනසක් නො කොට කරුණාවෙන් පැතිරුණු සෞම්‍ය වූ සොම්නස් සහගත ව නෙත් හෙලා පහන් සිත් ඇතිවම ඔහු දෙස බැලීය. එහෙත්, නිකරුණේ උපදවා ගත් ක්‍රෝධයෙන් යුත් සිත් ඇති ව "මා කිතවස්ස රජුගේ පුතා බව නො දන්නේ ද? ඔබ මා දෙස බලා කුමක් කරන්න ද? කියා අවමන් කරමින් ගියේ ය. ඔහු එතැනින් පිට වූ ඇසිල්ලේම ඔහුට නරකයේ ගින්දැල් වැදුනාක් මෙන් ශරීරය පුරා බලවත් දැවිල්ලක් හටගත්තේ ය. හෙතෙම ඒ මහා සන්තාපයෙන් මැඩුණු ශරීරය ඇති ව ඉතා දැඩි දුක් වේදනාවන්ගෙන් මිරිකී කළුරිය කොට අවීචි මහා නරකයෙහි උපන්නේ ය. හෙතෙම එහි දකුණු පසින් ද වම් පසින් ද, උඩු කුරුව හා යටිකුරුව ද බොහෝ ප්‍රකාරයෙන් පෙරළී සිට අසූහාරදහසක් අවුරුදු ගෙවා එයින් චුත වැ, ප්‍රේතයෙක් වී අසීමිත කාලයක් සාපිපාසා දී දුක් අනුභව කොට එයින් චුත වී මේ බුද්ධෝත්පාද කාලයෙහි කුණ්ඩි නුවර සමීප යේ ධීවර ගම්මානයක ඉපදුනේ ය. ඔහුට අතීත ජාතීන් සිහිකිරීමේ නුවණ පහළ විය. එහෙයින් හෙතෙම පෙර තමන් විසින්, පිළිවෙළින් අනුභව කළ දුක් සිහිකරමින් තරුණවියට පැමිණි යේ නමුත් පවට ඇති බිය නිසා නෑයන් සමග ද මසුන් ඇල්ලීමට නො යයි. නෑයන් යන කල්හි මසුන් මරන්නට අකමැත්තෙන් සැඟවෙයි. ඉක්බිති ව මසුන් අල්ලන දැල්කපා දමයි. ජීවත්වන මසුන් ගෙන ගොස් දියට දමයි. ඔහුගේ ඒ ක්‍රියාවන් නො රුස්නා නෑයෝ ගෙයින් එලවා දැමූහ. ඔහුගේ එක් සහෝදරයෙක් ස්නේහයෙන් සතුටු සිත් ඇත්තේ විය.

එ සමයෙහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ කුණ්ඩ නගරය ඇසුරු කොට සානුවාසී පර්වතයෙහි වාසය කරයි. ඉක්බිති ඒ ධීවර පුත්‍රයා නෑයන්

විසින් අත්හරින ලදු ව ඔබ මොබ සැරිසරන්නේ ඒ ප්‍රදේශයට පැමිණියේ ආහාර වේලාවට තෙරුන් සමීපයට ගියේ ය. තෙරුන් වහන්සේ ඔහු විචාරා ආහාර අවශ්‍යව ඇතැයි දැන ඔහුට බත් දී, අනුභව කිරීමෙන් පසුව ඔහුගේ සියලු ප්‍රවෘත්තිය දැන, ධර්ම කථාවෙන් ඔහු පැහැදුන බව දැන පැවිදිවන්නට කැමැත්තේ දැයි ඇසී ය. එසේ ය ස්වාමීනි පැවිදි වන්නෙමි යි කියේ ය. ස්ථවිරයන් වහන්සේ ඔහු පැවිදි කොට ඔහු ද සමගින් භාග්‍යවතුන් වහන්සේ සමීපයට ගියේ ය. එවිට ශාස්තෲන් වහන්සේ මෙසේ වදාළහ. ආනන්දය ! මේ තෙරණට අනුකම්පා කරව! හේ නො කරන ලද කුසල් ඇති බැවින් අල්පලාභී ය. ඉක්බිති ව ශාස්තෲන් වහන්සේ ඔහුට අනුග්‍රහ කරමින් භික්ෂූන්ගේ පරිභෝගය සඳහා පැන් කළ පිරවීමෙහි යෙදුවේ ය. එය දැක උපාසකවරු ඔහුට නිති බත් එළවූහ. ඒ සාමණේර නම ඉන්පසු කලෙකද උපසම්පදා ලැබ අර්හත් භාවයට පැමිණ භික්ෂූන් දොළොස් නමක් සමග සානුවාසී පර්වතයෙහි විසී ය. ඔහුගේ නෑයෝ පන්සියයක් පමණ දෙනා නො කල කුසල් දහම් ඇති ව, මසුන් මැරීමාදියෙන් රැස්කළ පව් ඇති ව, කළුරිය කොට ප්‍රේත ලෝකයෙහි උපන්නාහු ය. ඔහුගේ දෙමව්පියෝ අප විසින් මෙතෙම පෙර ගෙයින් නෙරපන ලද්දෙයයි කියා ලජ්ජාවෙන් ඔහු වෙත නො එළඹ, ඔහු වෙත සෙනෙහස දැක් වූ සහෝදරයා යැවූහ. හෙතෙමෙ තෙරුන් ගමට පිඬු පිණිස වැඩිය කල්හි දකුණු දණමඩල පොළවේ තබා කරන ලද ඇඳිලි ඇති ව තමන් දක්වා "මාතා පිතාච වො භන්තෙ" ආදී ගාථා කිහ. " කුණ්ඩිනගරියො ථෙරො" යනාදී වශයෙන් මුලින් ම ගාථා පහක්, ඒ සම්බන්ධතාවය දැක්වීම පිණිස සඞ්ගීති කාරකයන් විසින් දක්වන ලදී.

කුණ්ඩී නම් නුවර, උපන් සානුවාසී පර්වතයෙහි වසන්නා වූ පොට්ඨ පාද නමින් හඳුන්වන වඩනා ලද ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ඇති එක් ස්ථවිර නමක් වූයේ ය.

ඒ තෙරුන්ගේ මව් ද පියා ද සහෝදරයා ද දුගතියට පත්ව ප්‍රේත ලෝකයෙහි උපන්නාහු ය. මෙලොව දී පව්කම් කොට මෙයින් චුත වී ප්‍රේතලෝකයට ගියාහු ය.

දුප්පත් වූ ඉදිකටු මුණ බඳු රූක්ෂ වස්ත්‍රාදිය ඇති ක්ලාන්ත වූ ශරීර යෙන් හා සිතින් යුතු ව, නග්න ව ඒ තෙරුන්ට බියෙන් තැති ගත් නොහොත් නිතර මහත් බිය ඇති දරුණු පව්කම් කළා වූ ඒ ප්‍රේතයෝ නො දක්වත්.

ඒ තෙරුන්ගේ සහෝදරයා බියෙන් දුරු ව නිර්වස්ත්‍ර ව එක් පදික මාර්ගයක තනි ව චතුරඞ්ගයෙන් යන්නෙක් ව, අත්දෙකින් හා දණහිස් දෙකින් තෙරුන් වහන්සේට තමන් දක්වී ය. තෙරුන් වහන්සේ ද මෙනෙහි නො කොට නිශ්ශබ්දව වැඩියේ ය. එවිට ඒ ප්‍රේත තෙමේ මම සහෝදරයා වෙමි. ප්‍රේත ආත්මයට පැමිණියෙමි යි තෙරුන්ට කී ය.

ස්වාමීනි ! ඔබගේ මව්පියෝ පෙර මිනිසත් බවේ දී පව්කම් කොට, දුගති ය වූ යමලෝකයයි වහරන ප්‍රේතලෝකයේ උත්පත්තියට ගියහ.

ඔව්හු දුප්පත් වූහ. ඉදිකටු මෙන් රළු වස්ත්‍ර හදිති. නග්න වූහ. බඩගින්න නිසා ක්ලාන්ත වූ වෝය කෘූර වූ කර්ම ඇත්තෝ ය. ඔබ කෙරෙහි මහත් බියක් ඇති හෙයින් ඔබ දක්නට නො එන්නාහ.

කාරුණික වූ ඔබ වහන්සේ අපට අනුකම්පා කරනු මැනව. දන් දී අපට අනුමෝදන් කළ මැනව. ඔබ විසින් දෙනු ලබන දානයෙන් කෘූර කර්ම ඇති අප යැපෙන්නාහු ය. මිදෙන්නාහු ය.

එහි **කුණ්ඩි නගරියො ථෙරො** - මේ නම් නගරයෙහි උපන්, නගරයට සම්බන්ධ ස්ථවිරයන් වහන්සේ, **කුණ්ඩිත නගරො ථෙරො** - කියා ද සඳහන් වේ. එය එම අර්ථමැ යි **සානුවාසි නිවාසි තො** - යනු සානුවාසී පර්වතයේ වසන **පොට්ඨපාදෙති නාමෙනා** - නමින් පොට්ඨපාද වූයේ ය. **සමණො** - බහා තබන ලද දුරුකරන ලද පව් ඇති, **භාවිතින්ද්‍රියො** ආර්ය මාර්ග භාවනා වඩා,ඒ මගින් වඩන ලද ශුද්ධාදී ඉන්ද්‍රියයන් ඇති. රහත්වූයේ යන අර්ථයි. **තස්සා** - ඒ සානුවාසී තෙරුන්ට, **දුග්ගතා** - දුගතියට ගියා වූ, **සූචිකට්ටා** - ඉදිකටු වැනි රූක්ෂ වස්ත්‍රාදියෙන් පීඩාවට පැමිණ **සූචිගත්තා** යනු ද පාඨයකි. විදින කලක් මෙනී, **සූචිකා** - යනු බඩගින්නෙන් හා දිය පිපාසයෙන් පීඩාවට පැමිණ පෙලෙනා **සූචි කණ්ඨා** කියාද ඒ පාඨය යි. ඉදිකටු සිදුරක් වැනි කටක් ඇති, සමාණ මුහුණ ඇති **කිලන්තා** - ක්ලාන්ත වූ කය හා සිත් ඇති **නග්ගිනො** - නග්න වූ රූ ඇති වස්ත්‍ර නැති, **කිසා** - යනු ඇට හා සම පමණක් ඉතිරි වූ කෘශ වූ දේහය ඇති, **උත්ත සත්තා** - යනු මේ ශ්‍රමණයා අපගේ පුත්‍රයා තැති ගැනීමෙන් භයට පැමිණීමෙන්, **මහාතාසා** - යනු අප විසින් පෙර කරන ලද ක්‍රියාවන් නිසා හටගත් බිය ඇති ව **නදස්සෙනති** - යනු අපට පෙනී සිටිනු නො හැකිය. සමීපයට නො යත් **කුරූරිනො** යනු දරුණු වූ කර්මාන්ත **තස්ස භාතා** - යනු සානුවාසී

ස්ථවිරයන් ගේ සහෝදරයා **විචරිත්වා** - යනු එතෙර වී, බියවීම සන්ත්‍රාසය හැර යන අර්ථයි. "විතුරිත්වා" කියා ද පාඨයක් වේ. එතර වි සමාන වී, යුහුසුළු ස්වභාවය ඇති වී යයි කියන ලදී. **එකපථෙ** - එක් පදික මාර්ගයක **එකකො** - තනිවම, දෙවැන්නෙක් නැති ව, **චතුකුණ්ඩිකො භවිත්වා** නා සතර අංගයකින්, සතර තැනෙකින් නැමුණු ආත්ම භාවයක් පවත්නේනුයි චතු කුණ්ඩික නම් වේ. දෙදණින් හා අත් දෙකින් ගමන් කරන්නේ, සිටින්නේ, මෙසේ වූයේ ය. යන අර්ථ යි. හෙතෙමේ වනාහි පෙර සහාය දුන් තැනැත්තා (ක්‍රෝධ නොකළ තැනැත්තා) වශයෙන් මෙසේ කළේ ය. **ථෙරස්ස දස්සයීතු මං** - යනු තෙරුන් වහන්සේට තමන් උදෙසා යමක් කරන්නට දැක්වී ය. **අමනසී කත්වා** - මේ තෙමේ කවරෙක් දැයි සිහි නො කොට ආවර්ජනා නො කොට, **සො ච** ඒ ප්‍රේත තෙමේ ද, **තා තා පෙතගතො අහං** - යනු මම අතීත ආත්ම භාවයෙහි ඔබගේ සහෝදරයා ය. දැන් ප්‍රේතයකු වී මෙහි ආවේ යයි කියා දැක්වී ය. (තෙරුන් දක්වයි) යම් සේ වනාහි හැඟවීමට දැක්වීමට, **මාතාපිතාච** යනු ආදී වසයෙන් ගාථා තුනක් කීහ. එහි **මාතා පිතා ච තෙ**- යනු ඔබගේ මව් පියන් ද, **අනුකම්පම සසු** - අනුකම්පා පූර්වක ව අනුග්‍රහ දක්වනු මැනව, **අත්වාදිසහි** - **යනු** බලව! **නො** අපදෙස අපගේ, **තව දිනෙනනා** - යනු ඔබ විසින් දෙනු ලබන -

එය අසා ස්ථවිර තෙමේ යම් සේ පිළිපදින්නට සුදුසු පිළිවෙත දක්වමින්,

ස්ථවිරයන් වහන්සේ ද අනෙක් භික්ෂූන් දොළොස් නම ද පිඩු පිණිස හැසිර, දන් වැළඳීම නිමිති කොට එකට රැස්වූහ.

ස්ථවිරයන් වහන්සේ යම් යම් ලද දානය මට දෙනු මැනැවි. නෑයින්ට අනුකම්පා පිණිස සංඝික බතක් කරන්නෙමි යි අනෙක් සියල්ලන්ටම කීහ.

අනෙක් තෙරවරු ස්ථවිරයන්ට භෝජන බාර කළහ. ස්ථවිර තෙම සඞ්ඝයාට ආරාධනා කළේ ය. ස්ථවීර තෙම සඞ්ඝයාට දන් දී මවට ද පියාට ද සහෝදරයාට ද,

මාගේ නෑයින්ට මේ පින අත්වේවා! නෑයෝ සුවපත් වෙත්වායි පින් පැමිණ වීය. පින් පැමිණවීමට අනතුරුව

පවිත්‍ර වූ ප්‍රණීත වූ මිහිරි වූ නොයෙක් රස මසවුලෙන් යුත් දිව බොජුන් පහළවී ය. ඉන්පසු ව සහෝදරයා වර්ණවත් වූයේ ශක්තිමත් වූයේ. සුවපත් වූයේ තමන් දැක්වී ය.

ස්වාමීනි ! පිටිපස බලනු මැනැවි. බොහෝ වූ දිව්‍ය භෝජන ලදී. එහෙත් අපි නග්නයෝ වෙමු. ස්වාමීනි යම් කිසි අයුරකින් අප වස්ත්‍ර ලබමු ද? එසේ උත්සාහ වඩනු මැනැවි.

ස්ථවිර තෙමේ ඉවත දමන ලද රෙදි කැබලි කුණු ගොඩින් අහුලාගෙන විත් වස්ත්‍රයක් කොට සිව් දිගින් වඩින මහා සංඝයාට සඞ්ඝිකව පිරිනැමී ය.

ස්ථවිර තෙමේ රෙදි දන් දී, මවට ද පියාට ද සහෝදරයාට ද මේ පින් මගේ නෑයින්ට අත්වේවා ! ඔව්හු සුවපත් බවට පැමිණේවායි (පින් දුන්හ).

පින් පැමිණවීමට අනතුරු ව වස්ත්‍රයෝ ලැබුණහ. ඉන්පසු ව යහපත් වස්ත්‍ර හැඳ තමන් තෙරුන් වහන්සේ ඉදිරිපිට දක්වී ය.

නන්දරාජ රජුගේ රටෙහි යම් පමණ වස්ත්‍රයෝ වේ ද? ඊට වඩා බොහෝ වස්ත්‍රයෝ ස්වාමීනි! අපට ඇත්තාහ.

කෝසෙය්‍ය වස්ත්‍ර කම්බිලි ද, කොමු පිළි හා කපු පිළි ද, දිග පලලින් මහත් වූ වස්ත්‍රයෝ අහසෙහි ම එල්බෙත්

අපි ඒවා පරිහරණය කරමින්, අපේ හිතට යම් වස්ත්‍රයක් ප්‍රිය මනාප වේ ද අපි එය හැඳ පොරවන්නෙමු. ස්වාමීනි අපට යම් අන්දමකින් ගෙයක් ලැබේ නම් ඒ සඳහා උත්සාහ කරනු මැනවි.

ස්ථවිර තෙමේ කොළවලින් ගෙයක් කොට සිව් දිගින් වඩින මහා සඞ්ඝයාට පූජා කළේ ය. එසේ පූජා කර මවට පියාට හා සහෝදරයාට පින් අනුමෝදන් කළේ ය.

මා විසින් කරන ලද මේ පුණ්‍යකර්මය මගේ ඥාතීන්ට අනුමෝදන් කරමි. මගේ ඥාතීහු සුඛී සුවපත් වෙත්වා. පින් අනුමෝදන් කිරීමට අනතුරු ව ම ගෙයක් ලැබිණ.

බෙදන ලද කොටස් වශයෙන් (කාමර වශයෙන්) කුළු ගෙවල් සහිත ගෙවල් පහළ වූහ. මේ ප්‍රේත ලෝකයෙහි අපගේ ගෙවල් යම්බඳු වේ ද එවැනි ගෙවල් මිනිසුන් අතර ද නො වෙතී.

දෙව්ලොව ප්‍රාසාදයෝ යම් බඳු විද? එමෙන් ම අස් ගෙවල් ඉතාමත් දිලිසෙමින් හාත්පස සිව් දිශා බබළවති.

ස්වාමීනි ! යම් කිසි විධියකින් අපට පැන් ලැබෙන්නේ ද ඒ සඳහා උත්සාහ ගන්නාමෙන් අයැද සිටියහ. ස්ථවිර තෙමේ ධබරාව පුරවා සිව්දිගින් වඩින මහා සඞ්ඝයාට පූජා කළේ ය.

ස්ථවිර තෙමේ පැන් පූජා කොට මවට පියාට හා සහෝදරයාට ඒ පින් අනුමෝදන් කළේ ය. මගේ ඤාතීහු මේ පින් අනුමෝදන්ව සැපවත් බවට පැමිණේවා.

පින් දීමෙන් අනතුරුව පැන් පොකුණු පහළ විය. ගැඹුරු වූ සතරැස් පොකුණු පහළ විය.

පොකුණු සුදු වැලි තලායෙන් හා සිහිල් ජලයෙන් යුක්ත විය. යහපත් තොටුපළවල් ඇත. එහි සිහිල් ජලය මනා සුවඳින් යුක්ත වූ අතර ජල මත්තෙහි හෙල පියුම් ආදී මල්වල රේණු ඉසිරී පැවතුනි.

එහි නා පැන් බී තෙරුන්ට දක්වූහ. ස්වාමීනි ! බොහෝ වූ පැන් පහළ විය. අපගේ පාදයෝ දුකින් පැලෙති.

ගල් කැට ඇත්තා වූ ද කටු ඇත්තා වූ ද ප්‍රදේශයන්හි ඇවිදින්නා හු කොරගසමින් යමු. ස්වාමීනි ! යම්සේ වාහනයක් ලබමුද එයට උත්සාහ කරනු මැනවි.

ස්ථවිර තෙමේ එක්පට වහන් සඟලක් ලැබී එය සිව් දිගින් වඩින මහා සඞ්ඝයාට පූජා කොට ඒ පින් අනුමෝදන් කළහ.

පින් අනුමෝදන් කිරීමෙන් පසු ව එම ප්‍රේතයන්ට රථයක් පැමිණියේ ය.

ස්වාමීනි ! ඔබ වහන්සේට යහපතක් වේවා ! ආහාර දීමෙන් ද? වස්ත්‍ර දීමෙන් ද? පැන් දීමෙන් ද, ගෙවල් දීමෙන් ද, වාහන දීමෙන් ද, අපට අනුකම්පා කරන ලදහ. ස්වාමීනි ! ලෝකයෙහි කරුණා සම්පන්න වූ භික්ෂු වූ ඔබ වහන්සේ වැඳීමට පැමිණියෝ වෙමු. යන ගාථාවෝ පැවසුහ.

එහි **ථෙරො චරිත්වා පිණ්ඩාය** - යනු ස්ථවිර තෙමේ පිඬු සිඟීමෙහි හැසිර **භික්ඛූ අඤ්ඤෙ ච ද්වාදස** - යනු තෙරුන් සමග වසන්නා වූ අනෙක් භික්ෂු හු, **එකජ්ඣනන්ති** යනු එක්තැනටම රැස්වූහ. කුමක් සඳහා ද? **භත්ත විස්සග්ග කාරණා** - යනු ආහාර ගැනීම නිමිති කොට බත් කිස පරිභෝග කිරීම සඳහා **තෙ** යනු ඒ භික්ෂූහු **යථා ලද්ධං** - යම් යම් දෙයක් ලැබුවේ නම්, **දදාථි** - යනු දෙනු මැනව, දෙව්, **නීයාතයංසු** යනු දුන්නාහු ය. **සඞ්ඝං නිමන්තා යී** යනු ඒ භික්ෂූන් දොළොස්නමට සාංඝික වසයෙන් ඒ බත් දීමට ආමන්ත්‍රණය කළහ. **අන්වාදිසී** - යනු යම් කෙනෙකුන්ට දෙන්නේ ද එය දක්වීමට. **මාතා පිතුචභාතුනො ඉදමෙම ඤාතී නං හොතු සුඛිතා හොන්තු** ඤාතයො ආදිය කියන ලදී. **සමනන්තරානුද්දිට්ඨෙ** - යනු උදෙසා දීමෙන් අනතුරු ව, **භොජන උප්පජ්ජථා** - යනු ඒ ප්‍රේතයන්ට ආහාර ලැබුනේ ය. කොයි ආකාරයෙන් ද? කීයේ ය. **සුචී** යනු පවිත්‍ර වූ ආකාරයෙන් සැපවත් වූ ආකාරයෙන්

එහි **අනෙක රස බ්‍යඤ්ජනං** - යනු නොයෙක් රසවලින් යුක්ත ව්‍යංජනයන්ගෙන් යුතුව, නොහොත් නොයෙක් රස නානාවිධ එළවළු මාළු පිනි ආදිය, **තතො** - යනු ආහාර ලැබීමෙන් පසු ව **උද්දිස්සයී භාතා** - සහෝදරයා වූ ප්‍රේතයා තෙරුන්ට තමන් දක්වී ය. **වණ්ණවා බලවා සුඛී** - යනු ඒ ආහාර ලැබීමෙන් එකෙණෙහි ම රූප සම්පත්තිව බල සම්පන්නව, සැපවත් වී, **පහුතං භොජනම්හ නෙත**- යනු ස්වාමීනි ඔබගේ දන් දීමෙහි ආනුභාවයෙන් පුලුල් වූ, බොහෝ වූ භෝජන අප විසින් ලද්දෙමු. **පස්ස නග්ගා මහසෙ** යනු බලනු මැනව අප වනාහි නග්න වූවෝ වෙමු. එහෙයින් වස්ත්‍ර ලැබීම සඳහා උනන්දු වනු මැනවි. උත්සාහයක යෙදෙනු මැනැවි. **යථා වත්ථං ලභාමසෙ** - යනු යම් ප්‍රකාරයක යම් කිසි උත්සාහකින් අපි සියල්ලන් වස්ත්‍ර ලබමු ද එසේ උත්සාහ කරනු යන අර්ථයි. **සඞ්කාර කූටම්හා** -යනු ඒ ඒ තන්හි තැබූ කසළ ගොඩවලින්, **උච්චිණිත්වා න.** යනු එකතු කිරීම් වශයෙන් විමසීම් වශයෙන් ගෙන, **නන්තකෙ** - යනු අසු ලා ගත් කැලි කැලි වූ රෙදි කැබලි ඉවත දමූ රෙදි කැබලි පිලොතික නම් වේ. ස්ථවිරයන් වහන්සේ ඒවායින් සිවුරක් කොට සඞ්ගයාට පිරිනැමී ය. එහෙයින් කීහ. **පිලොතිකං පටං කත්වා සඞ්ඝෙ චාතුද්දසෙ අදා** - යනු රෙදි කැබලි වලින් වස්ත්‍රයක් කොට සිව්දිගින් වඩින මහ සඟනට දුන්නේ ය. එහි **සඞ්ඝෙ චාතුද්දසෙ අදා** - යනු සතර දිගින් වැඩියා වූ භික්ෂු සංඝයාට - මෙය සම්ප්‍රදාන අර්ථයෙහි භුම්ම වචනයි - **සුවත්ථා වසනො** - යනු යහපත් වූ වස්ත්‍ර ලැබී ය. **ථෙරස්ස දස්සයී තුමං** යනු තෙරුන්ට තමන් දක්වමියි දක්වූයේ ය. ප්‍රකට වුයේ ය. මෙහි විලි වැසුනේ ය යි පටිච්ඡදා - වේ. **කූටාගාර නිවෙසනා** - යනු කුළු ගෙවල් ඇති අනෙක් නිවාසවලට සමාන වූ ගෙවල්, මෙය ලිඞ්ග

විපර්යාස වශයෙන් කියන ලදී. **විභත්තා** - යනු සම සතරැස් දිග පළල ඇති සම සටහන් ඇති. (කාමර වෙන්කරන ලද) බෙදන ලද **භාගසො මිතා** - යනු කොටස් වශයෙන් වෙන්කළ - **නො** -යන අපගේ, **ඉධ** - යනු මේ ප්‍රේත ලෝකයෙහි, **අපි දිබ්බසු** - යනු අපි යනු නිපාතයකි. දිව්‍ය භවනයන්හි, දෙව් ලොවෙහි යන අර්ථයි. **කරකං** යනු ධර්ම කරකය, **පුරෙත්වා** - දියෙන් පුරවා **වාරිකිඤ්ජක්ඛ පූරිතා** - යනු එහි දිය මතුපිට පියුම් උපුල් ආදී මල්වල රේණු වලින් සමුහවසයෙන් පිරෙන ලදී. **ඵලන්ති** - මල් ඵල කොළ ආදියෙන් විහිදුනේ ය. යන අර්ථයි **ආහිණ්ඩමානා** - යනු හැසිරෙන්නේ ගමන් කරන්නේ, **ඛඤ්ජාමා** - යනු කොර ගැසීම් වශයෙන් යමු. **සක්ඛරෙ කුසකණ්ටකෙ** - යනු බොරළු ගල්කැට සහිත භූමියෙහි, ගල් කැට සහ කටු පැගෙන්නාහ. යන අර්ථයි. **යානං** - යනු රිය ආදී කිසියම් වාහනයකී, **සපාටිකං** - එක් පටක් ඇති වහන්සඟලක් **රථෙන මාගමුං** යන, මකාරය පද සන්ධි කිරීමෙහි ය. රියෙන් පැමිණියාහු ය. **උභයං** යනු වාහන දීමෙන්, බත් ආදී සිව්පස දානයෙන්, ජල දානයෙන් බෙහෙත් දීමෙන් ද සඞ්ග්‍රහ කරන ලදී, ඉතිරි දෙය පළමු කියන ලද පරිද්දෙන් ම දත යුතු ය.

ස්ථවිරයෝ මේ ප්‍රවෘත්තිය භාග්‍යවතුන් වහන්සේට දැන් වීය. භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය අර්ථෝත්පත්ති කොටගෙන මෙයින් පෙර ඔබ ද ඉතා ඈත අතීතයේ ආත්ම භාවයෙක්හි ප්‍රේතයකු වී මහා දුක් අනුභව කළේ යයි වදාරා තෙරුන් විසින් යාඥා කළ කල්හි සුත්ත ප්‍රේත වස්තුව වදාරා පැමිණ සිටි පිරිසට ධර්මය දේශනා කළහ. එය අසා මහා ජනයා හටගත් සංවේග ඇත්තේ දාන ශීල ආදී පින්කම්වල නිරත වූයේ ය.

සානුවාසික ප්‍රේත වත්ථු වර්ණනාව
නිමියේ ය.

——//——

# 3-3

"වෙළුරියථම්භං රුචිරං පභස්සරං - මේ ධර්ම දේශනාව ශාස්තෲන් වහන්සේ සැවැත් නුවර වැඩ වසන කල්හි එක්තරා ප්‍රේතියක අරභයා වදාළහ.

යටගිය දවස කාශ්‍යප බුදුරජුන්ගේ කාලයේ දී, එක්තරා ස්ත්‍රියක් සිල් වත් වූයේ ආචාර සම්පන්න වූයේ, කල්‍යාණ මිත්‍රයන් සමග හැසිරෙමින් ශාසනයෙහි ප්‍රසාදයට පැමිණියේ, මැනැවින් බෙදන ලද, විසිතුරු ටැම් හා හිණි පෙති පංතිවලින් යුත් භූමිතල ඇති ඉතා අලංකාර දකුම්කළු, එක් සොල්දර තට්ටු ආවාසයක් කරවා එහි භික්ෂූන් පදිංචි කරවා ප්‍රණීත වූ ආහාර පාන යන්ගෙන් වළඳවා භික්ෂු සඞ්ඝයට පවරා දුන්නී ය. ඕ තොමෝ ඊට මෑත භාගයෙහි කළුරිය කොට, අනෙක් පාපකර්මයක හේතුවෙන් හිමවත් පර්වත රාජයා සමීපයේ රථකාර විල අසල විමාන ප්‍රේතියක් වී උපන්නී ය. සඞ්ඝයාට ආවාස පූජාකළ පුණ්‍යානු භාවයෙන් සියල්ල රුවන් මුවා වූ මහත් වූ හාත්පස අතිශයින් ප්‍රසාදය එළවන්නා වූ මනහර වූ රමණීය වූ සිත්කළු වූ පොකුණු සහිත වූ, නන්දන වනය හා සමාන ව බබළන්නා වූ විමානයක් ඇයට පහළවිය. ඕ තොමෝ ද රන්වන් පැහැ ඇති, සිත් ගන්නා රූ ඇති දකුම්කළු වූ දුටු දුටුවන් පහදවන්නියක් වූවා ය. ඕ තොමෝ පුරුෂයන් ගෙන් තොරව දිව සැප විඳින්නා වූ ඈ තුළ කළ කිරීමක් නො ඇල්මකී උපන්නේ ය. ඕ තොමෝ උකටලී බවෙන් යුතු ව එක් උපායක් ඇතැයි සිතා දිව්‍යමය වූ අඹගෙඩි නදියෙහි පා කෙළේ ය. සියල්ල කණ්ණමුණ්ඩ ප්‍රේත වස්තුවේ ආ නයින් ම දතයුතු යි. මෙහි වනාහි බරණැස් වැසි එක් තරුණයෙකි ගඞ්ගාවෙහි පාවූ එක් අඹ ගෙඩියක් දැක ඒ අඹවල හටගැනීම සොයා පිළිවෙළින් ගොස්, ඒ නදිය දැක ඒ අනුව ඇය වසන තැනට ගියේ ය. ඕ තොමෝ ඔහු දැක තමන් වසන තැනට කැඳවාගෙන ගොස් පිළිසඳර කථාකරමින් හුන්නේ ය. හෙතෙමේ ඇය වසන තැන සම්පත් දැක ඒ පිළිබඳ තොරතුරු මේ ගාථා මගින් විමසී ය.

මහත් දිව්‍යනු භාව ඇති දෙවඟන! වයිරෝඩි මැණික් වලින් තැනූ කුළුණු ඇති, පැහැපත් වූ, රැස් විහිදුණු, නො යෙක් සිතියම් ඇති විමානයට නැගී අහස්තල යෙහි චන්ද්‍රයා මෙන් බබළමින් සිටින්නී ය.

ඔබගේ ශරීරය රන්වන් පැහැ ඇත්තේ ය. රත් වී දිළිසෙන පැහැ ඇත්තීය.

වාත්තුකළ වැනි වූ රූපය අතිශයින් දර්ශනීය වේ. අසමාන වූ රූපවත් දෙවඟන ! ඔබ හුදෙකලාව වසන්නේ, ඔබට ස්වාමියෙක් නැත්තේ ද?

ඔබගේ මේ පොකුණු සමීපයේ හාත්පස බොහෝ මල් ඇත. බොහෝ හෙළ පියුම් ඇත. රුවන් වැල්ලෙන් හාත්පස ගැවසී ගත්තේ ය. එහි මඩ ද දියසෙවෙල් ද නැත.

දර්ශනීය වූ නෙත් පිනවන්නා වූ, මේ හංසයෝ ද ජලයෙහි හැමකල්හි හැසිරෙති. සියලු හංසයන් එක්ව නාදකරන්නේ නො විසුරුණු හඬ ඇත්තේ, මිහිඟු බෙර වාදනයෙහි මෙන් හඬ ඇත්තේ ය.

ඉසුරුමතිය ! ඔබ දිව්‍යමය සෘද්ධියෙන්, ඉතාමත් දිලිසෙමින්, රුවන් නැවෙහි එල්ඹී සිටින්නෙහි ය. දිගු නෙත්හි කළු වූ ඇහි බැම ඇත්තී ය. නිතර සිනහවෙන් යුත් ඔබ ප්‍රියවදන් කියන්නී ය. සියළු අඟ පසඟ ඉතා ශෝභනවත් ය. අතිශයින් බබළයි.

මේ විමන රජස් රහිත ය. සමභූමියෙහි පිහිටියේ ය. සිත්කළු වනය හිත සතුටු කරමින් සුවය හා ප්‍රීතිය වර්ධනය කරන්නේ ය. අළාමක දැකුම් ඇති ස්ත්‍රිය ! මම ඔබ සමග මේ නන්දන වනයෙහි හෝ විමනෙහි ඇලෙන්නට කැමැත්තෙමි.

එහි, **තත්‍ථ** එම විමානයෙහි, **අපවසසි**, කැමති කැමති තාක් කල් හිඳියි වසයි, දෙවී ! ඇයට අමතයි. **මහානුභාවෙ** - මහත් වූ දිව්‍යානු භාවයෙන් සමන්විත වූ, **පථද්ධනී** - තමන්ගේ ගමන්මාර්ගයෙහි බොහෝ කාලයක්, ගුවන් තල මතුයෙහි යන අර්ථයි. **පණ්ණරසෙව චන්දිමා** - වෙසක් මස පිරිපුන් සඳ මඬල මෙන් බැබළෙයි යන අර්ථයි. **වණ්ණෝපි තෙ කනකස්ස සන්නිභො** - යනු ඔබගේ ශරීර පැහැය ද ගින්නෙන් රත් වූ රන්වන් රත්රන් හා සමාන ය, ඉතාමත් සිත් ගන්නා සුළු ය. එහෙයින් කියන ලදී. **"උත්තත්ත රූපො භුසදස්සනීයො "** - මහාර්ග වූ අතුලෙ, යනු දෙවඟනට ඇමතීම යි. අසමාන රූප ශ්‍රී ඇත්තේ යන අර්ථ යි. **නත්‍ථීච තුය්හ සාමිකො** - ඔබට සැමියෙක් නැත් ද? **පහූතමාලා** - යනු නෙළුම් මානෙල්, ආදී බොහෝ මල් වර්ග බහුල, **සුවණ්ණා චුණ්ණා** - යනු රන්වන් වැලි ඇති, **සමන්තා මොත්තා** - යනු හාත්පස විසුරුණා වූ, තත්‍ථා යනු ඒ පොකුණුවල, **පඞ්කා පණකො ච** යනු මඩ ද දියසෙවෙල් ද නො මැත. නොපෙනේ. **හංසාපිමෙ දස්සනියා**

**මනෙරමා** - යනු මේ හංසයෝ ද මනරම්, සුබ දසුන් ඇත්තාහ. **අනුපරි යන්ති** - යනු අනුව හැසිරෙත්. **සබ්බදා** - යනු සෑම සෘතුවකදී ම, **සමයපා-සාමුඛි** කව, **වග්ගු** යනු මිහිරි,**උපනදන්ති** - යනු හඬ නගත් **බින්දුස්සරා** - යනු නො විසුරුණු හඬ ඇති රාගී භූත වූ හඬ ඇති, **දුන්දුභී තංව සොසො** ඒ පොකුණෙහි හංසයන් විසින් පතුරුවන මිහිරිහඬ, මිහිඟු බෙරයක හඬමෙන් පැතිරේ **දද්දල්ලමානා** - යනු අතිශයින් දිලිසෙත් **යසසා** - යනු දිව්‍ය සෘද්ධියෙන්, **නාවායා** - පොකුණු දෝණියෙහි පියුම් වලින් ගැවසී ගත්තා වූ, මහාර්ඝ වූ රන්වන් නැවක් බඳු වූ,පර්යඬ්කයෙහි හිඳ දිය කෙළි කෙළින්නා වූ විමාන ප්‍රේතිය දක මෙසේ කී ය. **අවලම්බා** - යනු එල්ඕ, හේත්තුවන පුවරු වෙහි හේත්තු වී, **තිට්ඨසි** - යනු පවතින ස්වභාවය, සිටින්නෙහිය. යන මෙය ස්ථාන ශබ්දයාගේ ස්වරූපයයි. නවතිය යන අර්ථය දෙන, වෙනස් වීම ප්‍රතික්ෂේප කළ වචන යි.

නිසජ්ජසී - යනු ද පාඨයකි. නිදා හුන්නේම යන අර්ථයි - දතයුතු යි. **ආලාරපම්හෙ** - යනු කළුවූ ද දික්වූ ද ඇහි බැම, **හසිතෙ** - සිනහසෙන්නී, සිනහවෙන් පිරුණු තැනැත්තී, සිනහවෙන් පිරුණු මුව ඇත්තී, **ප්‍රියංවදෙහි** - ප්‍රියවචන කථා කරන්නී, **සබ්බඞ්ග කල්‍යාණී**,(සියළු අඟ පසඟ සුන්දර වූ ද, ලස්සන වූ ද ප්‍රියමනාව වූ ද) සුන්දර වූ සිත්කළු වූ ලස්සන වූ සියලු අඟ පසඟින් යුක්ත වූ යන අර්ථ යි. **විරොචෙසි** - බැබළෙයි. **විරජං** - යනු කැත කුණු පහ වූ, නිර්දෝෂ වූ, **සමෙධීතනන්ති**, යනු සම තැනිතලා භූමි භාගයෙහි, සිටි සිව්රැස් වූ ශෝභමාන වූ, තැනිතලා වෙහි සිටි, හාත්පස උවදුරු වලින් තොර යන අර්ථයි. **උය්‍යානවන්තං** යනු සිත් සතන් තුටුකරන වනය සහිත, **රතිනන්දවඩ්ඩනං** -යනු ඇල්මද සතුට ද වඩන්නේය යන අරුතින් රතිනන්දි වඩ්ඩනං, සැපය ද ප්‍රීතිය ද වර්ධනය කරත් යන අර්ථයි. **නාරී** , යනු ඇයට ඇමතීමයි. **අනොම දස්සනෙ** - යනු සර්ව සම්පූර්ණ වූ අඟ පසඟින් සිත් සතුටු ද වඩන්නේය යන අරුතින් **රතිනන්ද වඩ්ඩනං**, සැපය ද ප්‍රීතිය ද වර්ධනය කරත් යන අර්ථයි. නාරී, යනු ඇයට ඇමතීමයි. **අනොම දස්සනෙ** යනු සර්ව සම්පූර්ණ වූ අඟ පසඟින් සිත් සතුටු කරන දැකුම් ඇති, **නන්දනෙ** යනු තුටු කරවන, **ඉධ** යනු නන්දන වනයෙහි හෝ විමානයෙහි හෝ, **මොදිතුං** - යනු සිත් ඇලවීමට කැමති යයි අදහස් කරයි.

මෙසේ ඒ මාණවකයා විසින් කියන ලද කල්හී, ඕ විමාන දේවතාවිය ඔහුට පිළිතුරක් දෙමින් මෙසේ කීයේ ය.

61. මෙහි විපාක වින්ද යුතු වූ කුශල කර්මයක් කරව, නුඹගේ සිත මෙහි පිහිටුවාවා. මෙහි විපාක වින්ද යුතු වූ කුශල කර්ම කිරීමෙන් කැමතිවිය යුතු කාමයෙන් යුත්ත වූ මා ලබන්නේ ය.

මෙහි **කරොහි කම්මං ඉධ වෙදනීයං** - යනු මේ මෙහි දිව්‍ය විමානයෙහි විපාක විඳීමට සුදුසු පින්කමක් කරව, රැස් කරව, **ඉධ නිහිතං** - යනු මෙහි පැමිණෙන්නට ඉධනිත්තනත්ති යනුවෙන් ද පාඨයක් වේ. මේ ස්ථානයෙහි ඉපදීමට පුනර් භවයට ඔබගේ හිත නැමේවා, **මමං** - යනු මා **ලච්ඡසී** - යනු ලබන්නෙහි ය.

ඒ මාණවකයා ඒ විමාන ප්‍රේතියගේ වචනය අසා එහි මනුෂ්‍ය වාසයට ගියේ, එහි සිත පිහිටුවා, එයට සුදුසු පින්කම් කොට, නොබෝ දිනකින් ම කළුරිය කොට එහි උපන්නේ ය. එම විමාන ප්‍රේතියගේ ස්භාවයට පැමිණියේ ය. ඒ අර්ථය ප්‍රකාශ කරමින් සංගීති කාරකයෝ මේ අවසාන ගාථාව කීහු.

හෙතෙම මැනවැයි ඇගේ වචනය පිළිගෙන එහි විපාක විඳීමට සුදුසු වූ කුශල කර්ම කළේ ය. මාණවකයා එසේ කුශල කර්මයන් කොට ඇගේ සහභාව යට පැමිණියේ ය.

එහි සාධු - යනු පිළිගැනීම් අර්ථයෙහි නිපාත යි. **තස්සා** - යනු ඒ විමාන ප්‍රේතියයි. **පටිස්සුණිත්වා** - යනු ඇගේ වචනය පිළිගෙන **තහිං වෙදනීයං** - ඇගේ විමාන යෙහි ඇය සමග විඳීය යුතු සුඛ විපාක විඳීමට සුදුසු කුසල කර්ම, සහව්‍යතං යනු සහ භාවයට එක්ව විසීමට, ඒ මාණවකයා ඇය සමඟ එක්ව විසීමට උපන්නේ ය. යන යෙදීම යි.

මෙසේ ඔවුන් දෙදෙනා බොහෝකල් දිව්‍ය සම්පත් අනුභව කරන්නාහු පුරුෂයා කර්මය ක්ෂය වීමෙන් කළුරිය කළේ ය. ස්ත්‍රිය වනාහි තමන්ගේ කුශල කර්මය ක්ෂේත්‍රගත බැවින් එක් බුද්ධාන්තරයක් එහි සම්පූර්ණ වසයෙන් විසීය. ඉක්බිති අපගේ භග්‍යවතුන් වහන්සේ ලොවැ පහළ වී පවත්නා ලද උතුම් දම්සක් ඇත්තේ පිළිවෙලින් දෙව්රම් වෙහෙර වැඩ වසන කල්හි ආයුෂ්මත් මහා මුගලන් ස්ථවිර තෙමේ එක් දවසක් පර්වත චාරිකාවෙහි හැසිරෙන්නේ එකී විමානය ද විමාන ප්‍රේතිය ද දැක "**වෙළුරියථම්භං රුචිරං පභස්සරං**" ආදී ගාථාවෙන් විචාළේ ය. ඕ තොමෝ උන්වහන්සේට මුල පටන් තමාගේ කථා ප්‍රවෘත්තිය කීවා ය. එය අසා

ස්ථවිරයන් වහන්සේ සැවැත් නුවරට පැමිණ භාග්‍යවතුන් වහන්සේට දැන්වීය. භාග්‍යවතුන් වහන්සේ එය අර්ථෝත්පත්ති කොට ගෙන එකතු වූ පිරිසට දහම් දෙසූ හ. ඒ අසා මහජනයා දන් දීම් ආදී පින්කම් කරමින් ධර්මයෙහි නිරත වූවෝ ය.

රථකාර ප්‍රේත වත්ථු වර්ණනාව
නිමියේ ය.

——//——

## 3-4

"භුසානි එකො සාලිං පුනාපරො" ආදී වූ මේ ධර්මදේශනාව ශාස්තෘන් වහන්සේ සැවැත් නුවර වාසය කරන කල්හි ප්‍රේතයන් සතර දෙනෙකු අරභයා වදාළ හ.

සැවැත් නුවරට නුදුරු එක්තරා ගමක එක් කූට වෙළෙන්දෙක් හොරට කිරීම් මැනීම් ආදියෙන් ජීවිකාව කළේ ය. හෙතෙම හැල් වී වල බොල් රැගෙන, තඹ පැහැති මැටි තවරා ඉතා බරකොට රත්හැල් හා කලවම් කොට විකුණුවේ ය. ඔහුගේ පුතා ගෙට ආවා වූ මගේ මිත්‍ර සහෘදයන්ට ආගන්තුක සත්කාර නො කළේයයි කිපී වියගහ ගෙන මව්ගේ හිසට ගැසුවේ ය. ඒ වෙළෙන්දාගේ යෙහෙළිය, සියල්ලන්ගේම ප්‍රයෝජනය පිණිස තබන ලද මස් සොරෙන් කා, නැවත ගෙදර අය විසින් විචාරණ ලදු ව "ඉදින් මා විසින් මේ මස් කන ලද්දේ නම් සසර උපදින භවයක් පාසා තමාගේ පිටමස් කඩාගෙන කන්නියක් වෙම්වා" දිව්රීම් කළා ය. ඒ වෙළඳාගේ භාර්යාව වනාහි යම්කිසි උපකරණයක් ඉල්වන අයට නැතැයි කියන ඉදින් ඔවුන් විසින් නැවතත් ඉල්ලමින් පීඩා කරන ලදු ව, "ඉදින් තිබෙන දේ නැතැයි කියා මා කියන්නේ නම් උපන් උපන් තන්හි අසුචි කන්නියක් වෙම්වා යි මුසාවාදයෙන් දිව්ළා ය. ඒ සතර දෙනා ම මෑත කාලයක කළුරිය කොට වින්ධ්‍යා වනයෙහි ප්‍රේතයන් වී උපන්නාහු ය. එහි සොර වෙළඳ තෙමේ කර්ම ඵලයෙන් දිලිසෙන්නා වූ රත්හැල් බොල් දෙ අතින් හැරගෙන තමන් හිස් මුදුනේ විසුරුවා ගනිමින් මහා දුක් අනුභව කරයි. ඔහුගේ පුතා යකඩ පොල්ලකින් තමාගේම හිසට ගසා හිස පොඩි කරගනිමින් මහත් වූ දුක් අනුභව කරයි. වෙළෙන්දාගේ යෙහෙළිය කර්ම විපාකයෙන් ඉතා මුවහත් ඇති පුළුල් වූ දික් වූ තමාගේම නියවලින් තම පිටමස් ඇද කඩ කඩා කඩා කමින් අප්‍රමාණ දුක් විඳියි. ඔහුගේ බිරිඳට සුවඳැති, සුපිරිසිදු, පහකළ කළු සහල් ඇති හැල් සහල් බත් ලඟට ලැබුණු කල්හිම නොයෙක් මැස්සන් ආදී කෘමි සමූහයාගෙන් ගැවසීගත් අතිශයින් පිළිකුල් වූ දුගඳ වූ අසුචි බවට පැමිණේ. ඒ අසුචි ඇය දෙ අතින් ගෙන කමින් මහා දුකක් විඳියි. මෙසේ ඒ සතරදෙනා ප්‍රේතාත්මභවයෙහි ඉපි ද මහා දුක් අනුභවකරන කල්හි ආයුෂ්මත් මහා මුගලන් තෙරණුවෝ පර්වත චාරිකාවෙහි යෙදෙන කල්හි එක් දවසක් එතැනට වැඩියේ මේ ප්‍රේතයන් දැක - මේ ගාථාවෙන් ඔවුන් විසින් කරන ලද කර්මයන් විචාළේ ය.

එකෙක් හැල් වී තම හිස විසුරුවා ගනි යි. නැවත තවත් කෙනෙක් (ඔළුවට ගසාගනි යි) මේ ස්ත්‍රිය ද තම පිටිමස් කඩාගෙන කයි. තී ද අපවිත්‍ර වූ අමනාප වූ පිළිකුල් කටයුතු වූ අසුචි අනුභව කෙරෙයි මේ කවර අකුශල කර්මයක්හුගේ විපාක ද?

එහි **භුසානි** - යනු බොල් වී, **එකො** - යනු එකෙක්, **සාලිං** යනු සහල්, මෙය සාමි අර්ථයෙහි උපයෝග වචනයි. හැල් බොල් වී තමන්ගේ හිසෙහි විසුරුවා ගනී යන අදහස යි. **පුනාපරො** - යනු නැවත අනිකෙක්, යම් කිසිවෙක් තම මවගේ හිසට පහර දුන්නේ ද? හෙතෙම යකඩ මුගුරකින් තමාගේම හිසට පහර දී හිස දෙකඩ වීමට පැමිණෙයි. ඒ සඳහා කියන ලදී. **සකමංස ලෝහිතං** - යනු තමාගේ ම පිට මස් ද ලේ ද පරිභෝග කරත්, කති යන යෙදීමයි. **අකන්තිකං** - යනු කැමති නො වන, මනාප නො වන පිළිකුල් **කිස්ස** අයං **විපාකො** - මේ ප්‍රතිඵල කවර පාප කර්මයන්ගේ ද? මේ කොළ විඳින්නේ කවර කර්මයන්ගේ විපාක ද?

මෙසේ තෙරුන් වහන්සේ විසින් කරන ලද කර්මයන් විචාරණ ලදුව කුට වෙළෙන්දා භාර්යාව ද, අනෙක් සියල්ලෝ ද, තමන් විසින් කරන ලද කර්ම කියති.

මෙතෙම පෙර ආත්ම භාවයේ දී මවට පීඩා කළේ ය. මෙතෙම වනාහි කුට වෙළෙන්දෙකි. මැය මස් කා බොරුකීමෙන් වඤ්චා කළා ය.

මම මිනිස් ලොව ඉපදී සියලු කුලයන් අතර පොහොසත් වූ ගෘහපතිනියක් වීමි. යම් යම් ගෘහභාණ්ඩ තබාගෙනම සැඟෙවෙමි. කිසිවකුත් නො දුන්නෙමි.

මෙය මාගේ ගෙයි නැතැයි කීමෙන් බොරු කීමෙන් වසාලීම් ද මාගේ ගෙයි තිබියදීම සැඟවුයේ ද මගේ ආහාරය අශුචි වේවා.

ඒ අකුශල කර්මයාගේ ද මුසාවාද අකුසලයේ ද, කර්ම දෙදෙනාගේ විපාකයෙන් සුවඳසැල් හාලේ බත් ද මා හට අසුචි බවට පෙරළෙ යි.

68. කුශල කර්මයෝ හිස් නො වෙත්මැයි. කරන ලද කර්මය (විපාක නොදී) නො වැනසේ ම ය. දුගඳ වූ හටගත් පණුවන් ඇති අශුචි මම දූන් අනුභව කරමි. පානය ද කරමි.

එහි, **අයං** - යන්නෙන් පුතා දක්වීයයි කිය යි. **හිංසති** - යනු උත්සාහයෙන් පීඩා කරයි. මුගුරෙන් පහර දුන්නේ ය යන අර්ථයි. **කූට වාණිජො** - යනු වඤ්චාවෙන් වෙළදාම් කරයි යන අර්ථ යි. **මංසානි ඛාදිත්වා** - යනු අනුන්ට සාධාරණ වූ මස් තමන්ම කා කෑවේ නැතැයි මුසාවාදයෙන් වඤ්චා කළේ ය. **අගාරිණී** - යනු ගෙයි ස්වාමී දුව - **සනෙතසු** යනු අනුන් විසින් ඉල්ලනු ලබන ගෘහෝපකරණ පෙනී පෙනීම, **පරිගුයහාමි** - යනු සැඟවීම් කාල විපර්යාසයෙන් මෙය කියන ලදී. මාව **කිඤ්චි ඉතො අදං** - යනු මා සන්තක වූ කිසිවක් ඉල්ලන්නන්ට හෝ අනුන්ට නො දුන්නෙමි. **ඡාදෙමි** - යනු මේ ගෙයි නැතැයි බොරු කීවේ ය. **ගූථංමෙ පරිවත්තනති** - යනු සුවඳ හැල් සාලේ බත් ද, මගේ කර්ම විපාකයෙන් අසුචි බවට පරිවර්තනය වේ. පෙරළේ. **අවඤ්ඣා** යනු හිස් නො වන්නේ ය. ප්‍රතිඵල රහිතය. **නහි කම්මං විනස්සති** - යනු හේතු සහිත වූ කර්ම ඵල විපාක නො දී විනාශ නො වන්නේ ය. **කිමිජං** යනු පණුවන් උපන්, පණුවන් හටගත් කෘමි කුල, **මීළහං** - යනු අසුචි, සෙස්ස යට සඳහන් කරන ලද සත්ත්වයන් පිළිබඳව කී ආකාරය මැ යි.

මෙසේ තෙරුන් වහන්සේ ඒ ප්‍රේතියගේ වචන අසා ඒ ප්‍රවෘත්තිය භාග්‍යවතුන් වහන්සේට දැන්වී ය. ඒ අර්ථෝත්පත්ති කොටගෙන භාග්‍යවතුන් වහන්සේ පැමිණි සිටි පිරිසට ධර්ම දේශනා කළහ. ඒ දේසනා මහා ජනයාට ඵලදායී වූයේ ය.

භූසප්‍රේත වස්තුව
නිමියේ ය.

——//——

# 3-5

**"අචෙඡර රූපං සුගතසස ඤාණං"** යනු කුමාර ප්‍රේත වස්තුවයි,එය කවරෙකු නිසා උපන්නේ ද?

සැවැත් නුවර බොහෝ උපාසකයෝ දහම්හි හැසිරෙන්නන්ව නගරයෙහි මහත් මන්ඩපයක් කරවා විවිධ පැහැයන්ගෙන් යුත් රෙදිවලින් අලංකාර කරවා කල් ඇතිවම බුදුරජාණන් වහන්සේට හා භික්ෂු සංඝයාට ආරාධනා කොට, මහා වටිනා පසතුරුණු අතුරා පිළියෙළ කළ අසුන්වල බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා වඩා හිඳුවා සුවඳ මල් ආදියෙන් පුදා මහා දන් පවත්වති. ඒ දුක එක්තරා මසුරු මළයෙන් නැගී සිටින ලද සිත් ඇති එක් පුරුෂයෙක්, ඒ සත්කාර නො ඉවසන්නේ මෙසේ කීහ. මේ සියල්ල කසල ගොඩේ දැමුවේ නම් යහපතී ය. මේ හිස මුඩු මහණුන්ට දීම යහපත් නොවේ" යයි කීයේ ය. උපාසකවරු එය අසා කළකිරුණු සිත් ඇති ව, යම් හෙයකින් මේ පුරුෂයා විසින් බුද්ධ ප්‍රමුඛ මහා සඞ්ඝයා කෙරෙහි අපරාධයක් කොට, පාපයෙහි නියුක්ත වූයේ ය යි, ඒ බව ඔහුගේ මවට දන්වා, "යව ශ්‍රාවක සඞ්ඝයා සහිත භාග්‍යවතුන් වහන්සේ ක්ෂමා කරවා ගන්නැයි කීහ. ඕ තොමෝ මැනවැයි පිළිගෙන පුත්‍රයා තැතිගන්වමින් වැරැද්ද හඟවා භාග්‍යවතුන් වහන්සේ හා භික්ෂු සංඝයා වෙත එළඹ පුත්‍රයා විසින් කරන ලද වරද කියමින් ක්ෂමා කරවාගෙන භාග්‍යවතුන් වහන්සේට හා භික්ෂු සඞ්ඝයාට සත් දිනක් කැඳ දානයක් පූජා කළේය. ඇගේ පුත්‍රයා වැඩි කල් නොගොස්ම කළුරිය කොට, අපවිත්‍ර වූ ක්‍රියාවන්ගෙන් ජීවිතය රක්නා වෛශ්‍යාවකගේ කුසෙහි උපන්නේ ය. ඕ තොමෝ ද ඔහු උපන් කෙණෙහිම පිරිමි දරුවකු යයි දැන සොහොනෙහි දැම්මවී ය. හෙතෙම තමාගේ කුසල ශක්තියෙන් ගන්නා ලද ආරක්ෂාව ඇත්තේ කිසිදු උවදුරකින් තොරව මවගේ ඇකයෙහි මෙන්ම සුවසේ නිදා ගත්තේ ය. දෙවියෝ ඔහුට අරක් ගත්තහු යයි කියති.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ අළුයම් කාලයෙහි මහා කරුණා සමාපත්තියෙන් නැගී සිට බුදු ඇසින් ලොව බලා වදාරන්නේ, සොහොනෙහි හැර දමන ලද ඒ දරුවා දැක හිරු උදාවන වේලාවෙහි සොහොනට වැඩම කළේ ය. ශාස්තෘන් වහන්සේ මෙහි වඩින්නේ යම්කිසි

කාරණයක් සඳහාම විය යුතුයයි සිතූ මහා ජනයා ද එහි රැස්වූහ. භාග්‍යවතුන් වහන්සේ පැමිණ සිටි පිරිස ඉදිරියේ "මේ දරුවා ළාමක කෙනෙකැයි නො සිතිය යුතු ය. යම්කිසි හෙයකින් දැන් සොහොන් බිම හැර දමන ලදු ව අසරණව අනාථව සිටියි, මතු කාලයෙහි වනාහි මේ අත්බැව්හි ද, පරලොව අත්බැව්හි ද මහත් සම්පත් ලබන්නේ යයි වදාරා, රැස්ව සිටි මිනිසුන් විසින්, කුමක් ද ස්වාමීනි මේ ළදරුවා විසින් පෙර ජාතියේ කරන ලද කර්මය කවරේදැයි විචාරන ලදු ව,

(සැවැත් නුවර) ජනයා විසින් බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට මහත් වූ පූජාවක් කළේ ය. එහිදී මේ ළමයාගේ සිතට අනාදරයක් අගෞරවයක් අනාථත්වයක් ඇති වී ඵරුස වූ අසභ්‍ය වූ වචන කීයේ ය.

ආදී වශයෙන් ඒ දරුවා විසින් කරන ලද කර්මය, අනාගත කාලයෙහි පැමිණිය යුතු සැප සම්පත් ද ප්‍රකාශකොට රැස් වූ පිරිසෙහි අදහස්වලට අනුරූප වූ ධර්මයක් කියා, මත්තෙහි චතුරාර්ය සත්‍යය ගැබ් වූ සාමුක්කංසික ධර්මදේශනාවක් කෙළේ ය. සිව්සස් දේශනාවගේ කෙළවර අසූහාර දහසකට ධර්මය අවබෝධ වූයේ ය. අනතුරුව අසූකෙළක් ධනය ඇත්තා වූ එක් කෙළඹියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයේ දී ම ඒ දරුවා මගේ පුතා යයි භාර ගත්තේ ය. භාග්‍යවතුන් වහන්සේ මෙපමණකින් මේ දරුවා රක්නා ලද්දේ ය. මහා ජනයාට අනුග්‍රහ කරන ලද්දෙය යි සිතා විහාරයට වැඩමවී ය.

හෙතෙම මෑත කාලයෙහි, ඒ කෙළෙඹියා කළුරිය කළ කල්හී, ඔහු විසින් උරුම කරන ලද ධනය පිළිපදිමින් කුල පරම්පරාව පිහිටුවමින්, එම නගරයෙහි මහත් සම්පත් ඇති ගෘහපතියකු වී දානාදී කුසල කර්මයන්හි නියුක්ත වූයේ ය. ඉක්බිතිව එක් දවසක් භික්ෂු සඞ්ඝයා දම් සභාවෙහි රැස් වී (මේ පිළිබඳ) කථාවක් ඉපිදවූහ. ආශ්චර්යයකි, ශාස්තෲන් වහන්සේ ඒකාන්තයෙන් ම සත්ත්වයන් කෙරෙහි අනුකම්පා ඇත්තෝ ය. අද මහත් සැප සම්පත් අනුභව කරන, උදාර ලෙස මහත් වූ පින්කම් කරන මේ දරුවා (පුද්ගලයා) එදා අනාථව සොහොන් බිම සිටියේ ය. ඒ අසා ශාස්තෲන් වහන්සේ මහණෙනි ! මෙහුගේ සම්පත් මෙපමණක් ම නොවේ. මොහුගේ ආයුකෙළවර තව්තිසා දෙව්ලොව සක් දෙවිරජුගේ පුත්‍රයා වී උපදින්නේ ය. මහත් වූ දිව සැපත් ද ලබන්නේ ය යි. ප්‍රකාශ කළහ. ඒ අසා භික්ෂූන් ද

මහජනයා ද මේ කාරණය දැක උපන් ඇසිල්ලේ අමු සොහොනේ දමන ලද එකුමරුට එහි වැඩමවා සංග්‍රහ කළසේකැයි කියා ශාස්තෘන් වහන්සේගේ ඥාණ විෂයට ස්තුති කොට ඒ ආත්මයේ ඔහුගේ ප්‍රවෘත්තිය කථා කළාහුය. ඒ කාරණය ප්‍රකාශකරන සඞ්ගීති කාරකයෝ මේ ගාථා සය කීහ.

ශාස්තෘන් වහන්සේ යම්සේ පුද්ගලයා ප්‍රකාශ කළ සේක් ද, සර්වඥයන් වහන්සේගේ සර්වඥතාඥාන ආශ්චර්යමත් වන්නේ ය. උත්සන්න කුසල ධර්ම ඇත්තා වූ සමහර පුද්ගලයෝ (උපතේදී) නිහීන වෙති. ඉතා සුළු පින් ඇති සමහරු උසස්ව උපදිත්.

අමු සොහොනට විසි කරන ලද මේ කුමාරයා ඇඟිල්ල උරමින් රාත්‍රියේ යැපිණ. කරන ලද පින් ඇති ළදරුවා යක්ෂ භූතයෝ ද නො පෙළූහ. සර්ප ජාතීහු ද හිංසා නො කළහ.

සුනඛයෝ ද, මේ කුමරුගේ පාදයන් පිරිමැද්දාහ. කවුඩෝ ද හිවල්ලු ද පෙරලූහ. පක්ෂි සමූහයා ගැබ්මල පහකරත්. කවුඩෝ වනාහි ඇස්මල පහකරත්.

කිසි ම මිනිසෙක් මේ ළදරුවා රැකීම නො කළහ. බෙහෙත් හෝ අබ දුම් ඇල්ලීම හෝ නො කළහ. නැකැත් යෝග ද නොගත්තහ. හාල් ආදී ධාන්‍ය වර්ග නො විසුරුවාහු ය.

රාත්‍රියෙහි ගෙනැවිත් අමුසොහොනෙහි දමාගිය ඉතාම දුප්පත් වූ වෙඬරු පිඩක් බඳු වූ වෙවුලන්නා වූ, ජීවත්වේදෝ නොවේදෝ සැක සහිත වූ, මේ ළදරුවා

දෙව් මිනිසුන් විසින් පුද දෙන මහා ප්‍රාඥවූ තථාගතයන් වහන්සේ ම දුටු සේක ඔහු දැක ම මේ ළදරුවා මේ නගරයේ ම උසස් කුලීනයෙක් ද සම්පත් හිමි ස්වාමියෙක් ද වන්නේය යි ප්‍රකාශ කළ සේක.

මේ අයගේ ව්‍රත සමාදානය කවරේ ද? බ්‍රහ්මචරියාව කුමක් වී ද? මනාව පුරුදු කරන ලද කෙබඳු වූ ශ්‍රේෂ්ඨ චරියාවක් නිසා මේ විපාක ලැබී ද? එබඳු

වූ විපතට පැමිණ මෙබඳු වූ සැප සම්පත් ද දිව සැපත් ද මතුයෙහි විඳින්නේ ද?

එහි **අචෙඡර රූපං** - යනු ආශ්චර්ය ස්වභාවය යි. (පුදුම සහගත පැවැත්මයි) **සුගතසස ඤාණං** - යනු අන්‍යයන්ට අසාධාරණ වූ (නො පිහිටන්නා වූ) සම්මා සම්බුද්ධ ඥාණය, ආසයානුසය ඥාණය ආදී සර්වඥතාඥනය සඳහාම කියන ලදී. එය ද අන්‍යයන්ට අවිෂය වූ මේ ඥාණයෝ කෙසේ වූයේ ද? **සතථා යථා පුගගලං බ්‍යාකාසි** - යනු ශාස්තෲන් වහන්සේගේ දේශනාවන්ගෙන් මේ ඥාණයන්ගේ ආශ්චරිය භාවය දැනගත හැකි වන්නේ ය. දක්වන්නේ ය. දැන් එහි ව්‍යාකරණ දක්වන්නේ **උසසනන පුඤඤාපි භවනති හෙකෙ පරිතත පඤඤාපි භවනති හෙකෙ** - යනාදිය කීයේ ය. එහි අර්ථය, ශක්ති සම්පන්න කුශල කර්මයෝ පෙරදැරි වූ කල්හි ද සමහර පුද්ගලයෝ ලබන ලද හේතු ඇති එබඳු කුශලයාගේ වශයෙන් ජාති ආදියෙන් නිහීන ව උත්පත්ති වශයෙන් නිහීනව උපදිති. ඉතා අල්ප වූ ද කුශලධර්ම ඇති සමහර සත්ත්වයෝ ක්ෂේත්‍ර සම්පත් ආදී හේතුවෙන්, ඒ පින් මහත් ආලෝක ඇති බැවින් උදාර ලෙස උපදිත් **සීවථිකාය** - යනු සොහොන් බිමෙහි, **අඞගුටඨසෙනහෙනා** - යනු ඇඟිල්ලෙන් දක්වන ලද ස්නේහයෙන්, දෙවියන් විසින් ඇඟිලිවලින් වත්කරන ලද කිරිවලින් යන අර්ථයි. **න යකඛ භූතා න සිරිංසපා** - යනු පිශාචාදීන්ගෙන් ද, යක්ෂ ආදීන් ගෙන් ද බඩ ගා යන සර්ප ජාතීන්ගෙන් ද, වෙනත් යන එන්නා වූ ද හැසිරෙන්නා වූ ද කිසිවෙකුගෙන්, **න විහෙඨයෙ යුං** - යනු කිසි බාධාවක් නො වී ය. **පලිහිංසු පාදෙ** - යනු (සුනඛයෝ) තමන්ගේ දිවෙන් ළදරුවාගේ පාදයෝ ලෙව කෑවාහු ය. **ධඞකා** - යනු කවුඩෝ **සිගාලා පරිව තත යනති** - යනු මේ කුමාරයාට කිසිදු විපත්තියක් නැතිව ආරක්ෂා කරන්නෝ සිවල්ලු ජීවත්ව නිරෝගීව ඇති බව දැනගනු පිණිස එහා මෙහා පෙරළත්, **ගබභායං** - යනු ගැබමල **පකඛිගණා** - ගිජු ලිහිණි උකුසු ආදී පක්ෂී සමූහයා - **හරනති** - යනු පහකරති, **අකඛිමලං** යනු ඇස්වල කබ, **කෙචි** යනු සමහර මිනිස්සු හා අමනුෂ්‍යයෝ වනාහි ආරක්ෂාව සංවිධානය කළහ. **ඔසධං** - යනු ඒ අවස්ථාවේ හා මතු ජීවිතයේ ද නිරෝග භාවය සඳහා බෙහෙත්, ඖෂධ **සාසපධූපනං ච** - යනු යම් දරුවෙකු උපන් කල්හි දරුවාගේ ආරක්ෂාව සඳහා අබවලින් දුම් ඇල්ලීම කරයි ද එය ද මේ දරුවාට කළ කෙනෙක් නො වූහ. **නකඛතත යොගමපි න අගගහෙසු**. යනු උපන් වේලාව බැලීමක් ද

නො ගත්හ අසවල් රාශීයේ, අසවල් නැකතේ, අසවල් තිථියේ, මේ මොහොතේ මෙතෙම උපන්නේ යයි මෙසේ ජාතකර්මයකුත් මේ ළදරුවාට නො කළේ ය. යන අර්ථයි. **න සබ්බ ධඤ්ඤා නිපි ආකිරිංසු** - යනු උපන් දරුවා පිළිබඳව මඞ්ගල විධි කරන්නේ අබ තෙල් මිශ්‍රකර හාල් ආදී ධාන්‍ය වර්ග විසුරුවද්ද එවැන්නක් ද මේ දරුවා වෙනුවෙන් නො කළේ ය. යන අර්ථ යි. **එතාදිසං** යනු මෙබඳු වූ, **උත්තම කිච්ඡ පත්තං** - යනු අවශ්‍යයෙන් ම කළ යුතු කිසිවක් සිදු නො වූ බැවින් අතිශයින් දුකට පත්, **රත්තානභතං** - යනු රාත්‍රියෙහි ගෙනැවිත් දැමූ බැවින්, **නොනීත පිණ්ඩං විය** - යනු වෙඬරු පිඩක් හා සමාන වූ, මස් වැදල්ලක් පමණක් යයි කියන ලදී. **පවෙධමානං** යනු දුබල බැවින් කම්පා වන්නා වූ **සසංසයං** - යනු ජීවත් වේ ද? ජීවත් නොවේ ද? සැකසහිත වූ, **ජීවිතාවසෙසං** - යනු ජීවත් වීමට හේතු වන සාධක කරුණු කිසිවක් නැති හුදෙක් ප්‍රාණය පමණක් ම ඉතිරි වූ, **අග්ගකුලිකො භවිස්සති භොගතො** - යනු සම්පත් ඇත්තා වූ ද, සම්පත් ලබන්නා වූ ද අග්‍ර වූ කෙළඹියෙක් ද අග්‍ර වූ කුලිකයෙක් ද වන්නේ ය යන අර්ථ යි.

**කිස්ස වතං** - යනු මේ ගාථා ශාස්තෲන් වහන්සේ සමීපයෙහි සිටි උපාසකයන් විසින්, ඔහු විසින් කරන ලද කර්මය විමසීම් වශයෙන් කියන ලදී. අමු සොහෙනෙහි රැස් ව සිටි අයගේ දැනගැනීම පිණිස, **කිස්සා** - කුමක් ද මොහුගේ **වතං** යනු ව්‍රත සමාදානය, නැවත **කිස්සා** - යනු මොහුගේ පුරණ ලද ව්‍රත සමාදානය, බඹ සර හැසිරීම, එසේ යමක් කර ඇත්තේ දැ යි විමසීම ය. **එතාදිසං** - යනු මෙබඳු ගණිකාවගේ කුසෙහි ඉපිද මෙබදු වූ අමුසොහොනෙහි හැර දමන ලද **බ්‍යසනං** - යනු අනර්ථය, **තථාරූපං** යනු මෙස් වූ මෙබඳු වූ **අඞ්ගුට්ඨ සෙනහෙන** යා පෙති රත්තිනත් දෙවියන් තුළ ඇති වූ ස්නේහය නිසා අභිලිවලින් කිරි එරෙන්නට පටන්ගත්හ. - ආදියෙන් **අයඩකුමාරො නගරස්සිමස්ස අග්ග කුලීනො භවිස්සතීති**. ආදී කියන ලද ප්‍රකාරයෙන්ම අර්ථ වේ. **ඉද්ධිං** - යනු දිව්‍ය සෘද්ධි, දිව්‍ය සම්පත් කියනලද්දේ ම ය. **දැන්** මෙසේ ඒ උපාසකයන් විසින් විචාරණ ලද ප්‍රශ්න වලට භාග්‍යවතුන් වහන්සේ දෙන ලද පිළිතුරු සංගීති කාරකයෝ ගාථා සතරකින් මෙසේ දැක්වූහ.

ජනසමූහයා බුදුන් පෙරදැරිකරගත් භික්ෂු සංඝයාට මහත් පූජාවක් කළේ ය. එහි දී මොහුගේ සිතට අගෞරව අදහසක් ඉපදිණි. අසත්‍ය වූ නො කිය යුතු වූ රළු වචනයක් කී ය.

පසුව ඒ ලාමක විතර්කය පහකොට ප්‍රීතිය ද පැහැදීම ද ලැබ ජේතවනාරාමයේ වැඩ සිටි තථාගතයන්ට සත් දිනක් කැඳ දානයක් දුනි. ඒ මඟින් උවැටන් කළේ ය.

මොහුගේ ව්‍රත සමාදානය ද, ශ්‍රේෂ්ඨ චරියාව ද එය වේ. මනා සේ කරන ලද ඒ කර්මයාගේ විපාකය මෙසේ වන්නේ ය.

ඒ කුමාරයා මේ මිනිස් ලොව වසර සියයක් මුළුල්ලෙහි සියලු කාම සම්පත්තීන් විඳ, මරණයෙන් පසු පුනර්භවයෙහි ශක්‍රයාගේ සහභාවයට යන්නේ ය.

එහි **ජනතා** - යනු ජන සමූහයා උපාසක සමූහයා යන අදහස යි. **නත්‍රා** යනු ඒ පූජාවන්ගේ, **අස්සා** - යනු මේ දරුවාට, **චිත්තස්ස අහු අඤ්ඤථත්ත** යනු පෙර භවයෙහි සිතේ අන්‍යථාභාවයක්, අනාදරයක් , අගෞරවයක්, හේතු රහිත බවක්, වූයේ ය. **අසබ්භං** - යනු සත්පුරුෂ බවට ශත්‍රු වූ අයුතු වූ ඵරුෂ වචනයක් කීයේ ය. සො යනු මෙතෙම, **තංවිතක්කං** - යනු ඒ පව්කාර විතර්කය **පටිවිනොදයිත්වා** - යනු මවගේ කථාවෙන් ඒත්තුගැනීමෙන් පසුව සංසිඳුවා, **පීති පසාදං පටිලද්ධා** - යනු ප්‍රීති ප්‍රසාදය උපදවා. **යාගුයා උපට්ඨාහි** - යනු කැඳ දානයෙන් උපස්ථාන කළේ ය. **සත්ත රත්ත** යනු සත් දවසක්, **තස්ස වතං තමපන බ්‍රහමචරියං** - යනු එය මා විසින් යට කියන ලද ආකාරයෙන් තමන්ගේ සිත පහදවා දෙන ලද දානය මේ පුද්ගලයාගේ ව්‍රතය වේ. යහපත් හැසිරීම ද එයම වේ. වෙනත් කිසිවක් නැත යන අර්ථ යි. **ඨත්වාන** යනු මේ මිනිස් ලොව ආයු පරිමාණයෙන් සිට, **අභිසම්පරායං** යනු මීලඟ භවයෙහි **සහව්‍යතං ගච්ඡති වාසවස්සා** - යනු ශ්‍රක්‍ර දේවේන්ද්‍රයාගේ පුත්‍රයා වෙමින් ඔහුගේ සහවාසයට යන්නේ ය. අනාගතාර්ථයෙහි ද මේ වර්තමාන කාල වචන යි. අනෙක් සියල්ල කියන ලද පරිදි ම ය.

**කුමාර ප්‍රේත වස්තු වර්ණනාව**
**නිමියේ ය.**

—//—

## 3-6

"නගගා දුබ්බණ්ණ රූපාසි" යන ප්‍රේතකතාව ශාස්තෲන් වහන්සේ ජේතවන විහාරයෙහි වැඩ වාසය කරන කල්හී "සේරිණී" නම් ප්‍රේතියක් අරභයා වදාළසේක.

කුරුරට හත්ථිනී පුරයෙහි සේරිණී නම් වූ එක්තරා වෙසඟනක් වූවා ය. එකල භික්ෂූන් වහන්සේලා වරින් වර උපෝසථ විනය කර්ම කිරීම සඳහා හත්ථිනා පුරයට වැඩම කරවති. එක්වරක් එහි මහා භික්ෂු රැස්වීමක් විය. ඒ දුටු මිනිස්සු තල, සහල්, ගිතෙල් වෙඬරු, මී පැණි, ආදී දානෝපකරණ පිළියෙළකොට මහාදන් පැවැත්වූහ. එසමයෙහි සැදැහැ නැති වූ, පැහැදීම් නැත්තාවූ, මසුරු මළයෙන් යුක්ත වූ සිත් ඇති ඒ ගණිකාව වෙත, මෙහි එව ! මේ දාන වස්තුවට තීත් අනුමෝදන් වව, යි කියා ඒ මිනිසුන් විසින් පොළඹවන ලද්දේ උත්සාහ කරන ලද්දී නමුත් "මේ හිස මුඩු මහණුන්ට දන් දීමෙන් කවර ප්‍රයෝජනයක් ද යි කියා අප්‍රසාදය ම ඔවුන්ට ප්‍රකාශ කළා ය. පරිත්‍යාගමය වූ දානවස්තුවක අල්පයක් නම් කොයින් ද? ඕ තොමෝ මෑත කාලයෙහි කළුරියකොට එක්තරා ප්‍රත්‍යන්ත ජනපදයක අඟලක් මත්තෙහි ප්‍රේතියක් ව උපන්නී ය.

ඉක්බිත්තෙන් හස්තිනී පුර වාසී එක්තරා වෙළෙන්දෙක් වෙළදාම පිණිස ඒ ප්‍රත්‍යන්ත ජනපදයට ගොස් රෑ අළුයම් වේලේ යම්කිසි ප්‍රයෝජනයක් සඳහා අඟල මත්තට ගියේ ය. ඒ ප්‍රේතිය ඔහු දැක හැඳින ගෙන නිර්වස්ත්‍ර ව ඇට සම් පමණක් ඉතිරි වූ වස්ත්‍ර ඇති ව, ඉතාමත් බියකරු දැකුම් ඇති ව, නුදුරෙහි සිට තමන් දැක්වීම ය. ඒ උවසු වෙළෙන්දා ඇය දැක,

80. නිර්වස්ත්‍ර ව විරූප වූ බියකරු දැකුම් ඇති, කෘශ වී මස් ලේ නැති බැවින් ඉල්පී ගිය නහර වැල් ඇති, උස්ව ගිය ඉල ඇට ඇතිව මෙහි සිටින්නා වූ තී කවරී ද? යයි විමසී ය.

ඒ ප්‍රේතිය ද?

ස්වාමීනි ! මම ප්‍රේතියක් වෙමි. පෙර පාප කර්ම කරන ලදුව යම ලෝකයයයි හඳුන්වන ප්‍රේත ලෝකයෙහි ඉපදී, ඉතා දුකට පත් ප්‍රේතියක් වෙමි. ගාථාවෙන් තමන් හැඳින්වූවා ය.

නැවත වෙළෙන්දා විසින් එම්බල ප්‍රේතිය තී කයින් වචනයෙන් සිතින් කිනම් අකුශලයක් කරන ලද්දී ද? කවර වූ කර්මයක විපාක වශයෙන් මිනිස් ලොවින් චුත ව ප්‍රේත ලෝකයේ උපන්නී ද?

යනුවෙන් ඇය විසින් කරන ලද අකුසල් ගැන විමසී ය.

නො වළක්වන ලද (සසර සයුරෙන් එතෙර වීමට තොටුපළක් බඳු වූ) තීර්ථ නම් වූ මහණ බමුණන් ඇති කල්හි, කිසිම දෙයක් නො දී, අඩමස්සක් පවා විශේෂයෙන් රැස් කළෙමි. දානවස්තු ගෙදර තිබිය දී ත් තමන්ට පිහිටක් සඳහා එය නො යෙදුවෙමි.

දිය තිබහ ඇති ව නදිය කරා ආ විට නදියේ දිය හිස් වේ. උෂ්ණ වේලාවක ගහක් යටට පැමිණිය හොත් එතැනට අව්ව පැමිණේ.

වාතය ද ගිනි සමානව මාගේ ශරීරය දවමින් හම යි. වහන්ස ! මේ දුක් ද ඊට වඩා දරුණු වූ අනෙක් දුකටත් සුදුසු වෙමි.

ඔබ හත්ථිනා පුරයට ගොස් මගේ මවට මෙසේ කියන්න. යම ලෝකයයි හඳුන්වන ප්‍රේත ලෝකයේ ප්‍රේතියක් ව ඉපදී සිටින ඔබේ දියණිය මා විසින් දක්නා ලදී. මට හමුවී ය.

මෙලොව දී පව්කම් කොට, මෙ ලොවින් චුතව දැන් ප්‍රේතියක්ව ඉපදී සිටී. කිසිවකුට නො කියා, නො දන්වා මා විසින් එකතු කර තබන ලද වස්තුවක් ඇත්තේ ය.

(මා නිදාගන්නා ලද) පර්යඞ්කයාගේ (ඇඳේ) යටින් සාරලක්ෂයක ධනයක් තබන ලද්දේ ය. ඒ වස්තුව ගෙන මා උදෙසා දන් දෙන ලෙස ද, මවගේ ජීවිකාව කරගන්නා ලෙස ද කියව !

89. මාගේ මව් තොමෝ දන් දී මට පින් අනුමෝදන් කෙරේවා එකල්හි මම සියලු සම්පත් වලින් සමෘද්ධ වී සුවපත් වන්නෙමි. මේ ගාථා හයෙන් තමන් විසින් කරන ලද කර්මයන් ද, ඒ උපාසකයා විසින් හා මව විසින් කළ යුතු ක්‍රියා වන් ද කියන ලද්දී ය.

එහි - **අනාවටෙසු තිත්‍ථෙසු** - යනු කිසිවෙකු විසින් නො නවත්වන ලද ගංගා පොකුණු ආදී තොටුපලවල දී මිනිස්සු නහත් ද? දිය කිස කරද්ද එබඳු තැන් වලදී, **විචිණිං අද්ධමාසකං** - යනු මිනිසුන් සිහිනැතිව අමතක ව තබාගිය යම් කිසි දෙයක් ලබන්නෙමි නම් මැනවැයි සිතා ආශාවෙන් මඩනා ලදු ව අඩමසක් පමණ, නොහොත් **අනාවටෙසු තිත්‍ථෙසු** - යනු එළඹීමෙන් කිසිවෙකු විසින් නො නවත්වන ලද සත්ත්වයන්ගේ යහපත් ව්‍යාපාරයන් ගේ ශුද්ධියට ඉවහල්වන නිසා තීර්ථ නම් වූ, ශ්‍රමණ බමුණන් ඇති කල්හි **විචිණිං අද්ධමාස කං** - යනු තද මසුරු මළයෙන් යුක්ත වූ සිත් ඇති බැවින් කිසිවක් කිසිවකුට නො දෙමින් විශේෂයෙන් අඩමසක් තණ්හාවෙන් එකතු කළෙමි. පිනක් රැස් නො කෙළෙමි. එහෙයින් කියන ලදී. **සන්තෙසු දෙය්‍ය ධම්මෙසු දීපං නාකාසි මත්තනො හොති තසිතා** පිපාසයෙන්, **රිත්තකා** - යනු කවුඩන් විසින් බොන තරමට පිරී ඉතිරී ගලන්නා වූ ගඟ මගේ පාපකර්මයෙන් දිය සිඳී හිස්ව වැලි පමණක් බවට පත් වේ. **උණ්හෙසු** - යනු උෂ්ණ කාලයෙහි **ආතපො පරිවත්තති** යනු සෙවණ ඇති තැනකට මා එළඹි කල්හි එතැනට තද අව්ව වැටේ. **අග්ගිවණ්ණො** - යනු සුළඟ ස්පර්ශයෙන් (ඇඟ) ගිනි ගන්නා සමාන වේ. **දහන්ති උපවායති** යනු එහෙයින් කියන ලදී, **එතඤ්ච භන්තෙ අරහාමි** - යනු, භන්තෙ යනු ඒ උපාසක වෙළෙන්දාට ගරු කිරීම් සඳහා කියයි. හිමියනි මෙපරිදි වූ යං කියන ලද පිපාසාදී දුක් හා මෙයටත් වඩා දරුණු වූ තවත් දුක්ද විඳීමට මම සුදුසු වෙමි. නින්දිත වූ පාපකර්ම යන් කළ හෙයින් යන අදහස යි. **වජ්ජෙසි** - යනු කියන්න කියව ! **එත්‍ථ නික්ඛිත්තං අනක්ඛාතං** - යනු මෙපමණකින් මෙහෙන් නික්ම යන්නේ ද (ගොස්) කිව යුතුම ය. දූන් ඇගේ ප්‍රමාණයෙන් තැන්පත්කරන ලද දේ දක්වන්නී - **චත්තාරි සහස්සානි පල්ල ඞ්කස්ස** ච හෙට්ඨතො ආදිය කීවාය. එහි **පල්ල ඞ්කස්සා** යනු පෙර තමන් විසින් නිදීම සඳහා පරිහරණය කරන ලද පර්යඞ්කයේ (ඇඳේ) **තතො** යනු තැන්පත් කරන ලද ධනයෙන් එක් කොටසක් ගෙන මා උදෙසා දන් දේවා, **තස්සා** යනු ඉතිරිවා මගේ මවට ය.

මෙසේ ඒ ප්‍රේතිය විසින් කී කල්හි ඒ උපාසක තෙමේ ඇගේ වචනය පිළිගෙන තමන් පැමිණි කාර්යයන් ඉටුකරගෙන අවසන හත්ථිනා පුරයට ගොස් ඇගේ මව සමග ඒ කතා පුවත කීවේ ය. එහි අර්ථය දැක්වීමට, සංගීති කාරකයෝ

ඒ උපාසක තෙමේ යහපතැයි එය පිළිගෙන හත්ථිනා පුරයට ගොස් ඇගේ මවට සියල්ල කීයේ ය.

පාප කර්මයන් සිදුකොට, මෙලොවින් චුත වී ගිය ඔබගේ දුව, කරන ලද පව්කම්වල හේතුවෙන් යම ලෝකයයි කියනු ලබන ප්‍රේත ලෝකයෙහි ඉපිද ඉතා දුක්ඛිත තත්ත්වයේ සිටිනු මා විසින් දක්නා ලදී.

මෙහිදී අකුශල කර්මයන් හි හැසිර මෙලොවින් චුත වී, ප්‍රේත ලෝකයෙහි ඉපිද, දුකට පත් ව සිටින ඔබගේ දුව මා විසින් දක්නා ලදුව, මේ පුවත මගේ මවට කියන්නැයි මා සමාදන් කරවුවා ය.

මා විසින් කිසිවකුට නො කියා රැස්කළ ලක්ෂ හතරක්, මා නිදි ගත් ඇඳේ පර්යඞ්කය යට ඇත. එය ගෙන මා වෙනුවෙන් දන් දී පින් අනුමෝදන් කරව ! ඉතිරි කොටස් මවගේ ජීවත් වීමට ගන්න.

මගේ මව දන් දී ඒ පින් මට අනුමෝදන් කෙරේවා එවිට මම සියලු කාමයන්ගෙන් සමෘද්ධියට පත් ව මේ දුකින් මිදී සුවපත් වන්නෙමි.

එහෙයින් ඕ තොමෝ දන් දුන්නී ය. දී ඒ ප්‍රේතියට පින් පැමිණ වීය. ප්‍රේතිය ද සුවපත් වී මනහර දැකුම් ඇති විය. මේ ගාථා කීහ.

එසේ කී කල්හි ඇගේ මව එය අසා භික්ෂු සඞ්ඝයාට දන් දී ඇයට පින් අනුමෝදන් කළා ය. ප්‍රේතිය සුවපත් ශරීර ඇත්තෝ වූවා ය. ශරීරය මනා දැකුම් ඇත්තේ විය. ඉක්බිති වස්ත්‍ර හැඳ ලබන ලද සැපත්හි පිහිටා තම මවට තමන් දක්වා ඒ කරුණු කීය. මව භික්ෂූන්ට මේ කරුණු දැන්වී ය. භික්ෂූහු ඒ ප්‍රවෘත්තිය බුදුන් වහන්සේට දැක්වූහ. භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය

අර්ථෝත්පත්තිකොට ගෙන පැමිණ සිටි පිරිසට දහම් දෙසූහ. ඒ දේශනාව මහාජනයාට ඵලදායි වූයේ ය.

සේරිණී ප්‍රේත වස්තු වර්ණනාව
නිමියේ ය.

—//—

## 3-7

"නරනාරි පුරක්ඛතො යුවා" ආදී මේ ප්‍රේතවත්ථු දේසනාව භාග්‍යවතුන් වහන්සේ වේළුවන විහාරයෙහි වාසයකරද්දී මිගලුද්ද නම් ප්‍රේතයා අරභයා වදාළ සේක.

රජගහනුවර එක්තරා වැද්දෙක් රෑ දාවල් දෙක්හි මුවන් විද බැඳ මරා ජීවිකාව කරයි. ඔහුට එක් උපාසකයෙක් මිත්‍රව සිටියේ ය. ඒ උපාසක තෙමේ ඔහු සියලු අයුරින් පව්කම්වලින් වලක්වා ලීමට නො හැකි ව, යහළුව මෙහි එව රාත්‍රි කාලයෙහි වළකුවයි රාත්‍රි කාලයෙහි පින්කම් හි යෙදවී ය. ඒ වැද්දා රාත්‍රියෙහි ප්‍රාණඝාතයෙන් වැළකී දහවල් දවසේ ප්‍රාණඝාතය කරයි. හෙතෙම ටික කලකින් කළුරියකොට රජගහ නුවර සමීපයේ විමාන ප්‍රේතයෙක්ව ඉපදී දහවල් කාලයෙහි මහත් දුක් විඳ, රාත්‍රි කාලයෙහි දිව්‍යමය පඤ්චකාම සම්පත් විඳියි. ඔහු දැක ආයුෂ්මත් නාරද ස්ථවිරයන් වහන්සේ ගාථාව කියා මෙය පිළිවිසීය.

දිව්‍ය පුත්‍රයන් හා දෙව් දූවරුන් විසින් පිරිවරන ලදුව, තරුණ වූ ඔබ රාත්‍රි කාලයේ සිත්කලු වූ කාම ගුණයන්ගෙන් යුක්ත ව හොබී. දවල් දවස නොයෙක් කම් කටොළු අනුභව කරයි. ඔබ පෙර අත් බැව්හි දී කවර නම් අකුශල කර්මයක් කළේ ද?

එහි - "**නරනාරී පුරක්ඛතො**" යනු පිරිවර සහිත ව,දිව්‍ය පුත්‍රයන් විසින් ද දිව්‍ය දුහිතෘන් විසින් ද පෙරටු කරගනිමින් ඇසුරු කරමින්, **යුවා**, තරුණ වූ, **රජනීයෙහි** යනු කැමති විය යුතු රාගාදිය උපදින්න හේතු වන්නා වූ, **කාමගුණෙහි**, කාම කොට්ඨාසයන්හි, **සොභසි** සමගි බවින් බබළයි. රාත්‍රිකාලයෙහි බබළයි යන අදහසයි. **දිවසං අනු හොසි කාරණං** - යනු දවල් කාලයෙහි නොයෙක් ආකාරයේ දුක් මරණ (අනුභව කරයි) පීඩා ආදිය විඳියි. **රජනී** යනු රාත්‍රියෙහි යෙහී යනු නිපාතය පමණි. **කිං අකාසි පුරිමාය ජාතියා** - යනු මෙසේ සුව දුක් දෙක මේ අන්දමින් පැවතීමට මෙයින් පෙර ජාතියෙහි කුමන කර්මයක් ඔබ කළෙහි ද? එය විස්තර ව කියනු මැනැවි.

එය අසා ප්‍රේතයා තමන් විසින් කරන ලද කර්මයකියන්නේ,

මම රම්‍ය වූ සිත් අලවන්නා වූ ගිරිව්‍රජ නම් වූ රජගහනුවර පෙර ආත්මයෙහි අත්වල ලේ වැකුණු දරුණු වූ මුව වැද්දෙක් වීමි.

එකල්හි ඉතා දරුණු වූ, අනුන්ට හිංසා කිරීමෙහිම ඇලුණු, නො හික්මුණු මම කිසිවකු සමග විරුද්ධත්වයක් නැති බොහෝ තිරිසන් සතුන් කෙරෙහි ඉතා නපුරු සිත් ඇති ව හැසිරුණෙමි.

ඒ මට එක්තරා සහාය වු කුළුපග වූ උපාසක මිත්‍රයක් සිටියේ ය. ඔහු යහපත් සිත් ඇති ව, මා කෙරෙහි අනුකම්පා කරමින් මා පවින් වළක්වාලීමට නැවත නැවත උත්සාහ කළේ ය.

සහෝදරය ! ළාමක අකුසල කර්ම නො කරව, දුගතියට නො යව, පරලොව දී සැප විඳීමට නම් ප්‍රාණඝාත අකුසල කර්මයන්ගෙන් වෙන්වව !

පරලොව සැප කැමති වූ, අනුකම්පක වූ ඔහුගේ වචනය අසා, නුවණ නැති ව බොහෝ කලක් පවෙහි ඇලුණා වූ මම ඔහුගේ අනුශාසනාව නො පිළිපැද්දෙමි.

ගුණ යහපත් නුවණැති ඒ උපාසකයා නැවත නැවතත් මා වෙත දයාවෙන් මා සුචරිතයෙහි පිහිටුවී ය. දහවල් කාලයෙහි සතුන් මරන්නේ නම් රාත්‍රි කාලයෙහි පව්කම් වලින් වලක්වා !

මම ඒ අනුව දහවල් දවස සතුන්මරා රාත්‍රි කාලයෙහි වෙන් වූයේ සංවර ඇත්තෙක් වීමි. මම රාත්‍රි කාලයෙහි දිව්‍ය සම්පත් විඳිමි. දවල් දවස දුගතිගාමීව දුක් විඳිමි.

ඒ කුශල කර්ම හේතුවෙන් රාත්‍රියෙහි දෙව් සැප විඳිමි. දවල් කාලයහි බද්ධ වෛර ඇත්තවුන් මෙන් හාත්පසින් ම සුනඛයෝ සපා කෑමට එළවාගෙන එති.

යම් පුරුෂයෝ ස්ථිර වශයෙන් තථාගත ශාසනයෙහි දහම්හි හැසුරුණේ ද නිතර නිතර පින්කම්හි අනුගත වේ ද? ඒ පින්වත්හු

ඒකාන්තයෙන් අසඞ්ඛත වූ නිවන් මගට පැමිණෙන්නේ ය යි සිතමියි.

මේ ගාථා කීහ.

**සඤ්ඤතක් එහි ලුද්දො** - යනු දරුණු වූ **ලොහිතපාණී** යනු නිතර නිතර සත්ත්ව ඝාතනයෙන් පිපාසයෙන් පෙළුණේ, **දාරුණො** - යනු දරුණු ලෙස සත්ත්වයන්ට හිංසා කළේ ය. යන අර්ථ යි. **අවිරොධ කරෙසු** - යනු කිසිම විරුද්ධත්වයක් නො කරන්නා වූ මුව - සා ආදී සතුන්, **අසංයමා** - යනු අසංවර දුශ්ශීල, **සකලානු සාසති**, සර්වප්‍රකාරයෙන් අනුශාසනා කළේ ය. හැම කල්හි ම ප්‍රාණඝාතයෙන් වෙන් වෙනු යනු අර්ථයි. **චිර පාපාභිරතො** - යනු බොහෝ කාලයක් පාපයෙහි නියැලුනේ, **සංයමෙ** - යනු යහපත් හැසිරීමෙහි, **නිවෙසයී** - යනු යෙදෙන්නේ ය. **සචෙ දිවා හනසි පාණිනො අථ තෙ රත්තිං භවතු සංයමො** - යනු කටයුතු කරනලද ආකාරය දක්වීමයි. හුල් උගුල් සෑදීම ආදියෙන් රාත්‍රියෙහි ද ප්‍රාණවධ කිරීමෙහි අනුයුක්ත වූයෙමි. **දිවා ඛජ්ජාමි දුග්ගතො** - යනු දූන් දුගතියට ගියේ මහා දුකට පැමිණියේ දවල් කාලයෙහි කනු ලබන්නෙමි. ඔහුගේ වනාහි දවල් කාලයෙහි බල්ලන් විසින් මුවන් කනු ලබන්නාක් මෙන් කර්මයට සරිලන විපාක වශයෙන් දවල් කාලයෙහි මහත් මහත් වූ බල්ලන් දුවවිත් මොහු වෙත පැමිණ ඇට පමණක් ඉතිරිකොට ශරීරයේ අන් සියල්ල කා දමයි. රාත්‍රී කාලය පැමිණි කල්හි ඔහු ප්‍රකෘති තත්ත්වයට පත් වේ. දිව්‍ය සම්පත් විඳි යි. එසේ හෙයින් කියන ලදී.

ඒ කුශල කර්මයාගේ විපාකයෙන් රාත්‍රියෙහි දිව්‍ය සම්පත් වළඳමි. දවල් කාලයෙහි බද්ධ වෛර ඇත්තවුන් මෙන් සුනඛයෝ හාත්පසින් කෑමට දිව එති.

එහි - **පටිහතා** - යනු බද්ධ වෛරයකින් බැඳුනු සිත් ඇත්තාක් මෙන් වී, **සමන්තා ඛාදිතුං** යනු මගේ ශරීරය කෑමට හාත්පසින් දිව එත්. මෙය තමන්ට අතිශය භය උපදවන්නා වූ කාලය - ගෙන දක්වන ලදී. ඔවුන් පැමිණ ශරීරයේ ඇට පමණක් ඉතිරිකොට කා දමා යති. **යෙච තෙ සතතානුයොගිනො** - යනු මේ අවසාන ගාථා වේ සංක්ෂේපාර්ථය යි. මම වනාහි රාත්‍රී කාලයෙහි ප්‍රාණවධයෙන් වෙන් වූ පමණකින් මෙබඳු වූ සම්පත්

භුක්ති විඳිමි. යම්කිසි පුරුෂයෙක් සුගත වූ බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි අධිශීල සඞ්ඛ්‍යාත ධූරයන්හි යෙදෙන්නෝ නම්, දැඩි කොට යෙදෙන්නේ නම්, නිරන්තරයෙන් සැම කල්හිම ඒ පුණ්‍යවන්තයන් අනුව යෙදෙමින් හුදෙක් ලෞකික සැප ද, අසම් මිශ්‍ර වූ නිර්වාණ පදය ද ලබා අමෘත පදයට පැමිණෙන්නේ ය. යි හඟිමි. ඔවුන් කිසිදු බැඳිමකින් තොර ව අධිගමයට පැමිණේ. එහි අධිගමය ද නැත. වෙන්වීමක් අදහස් කරයි.

ඔහු විසින් මෙසේ කියන ලද කල්හි ස්ථවිර තෙමේ ඒ ප්‍රවෘත්තිය ශාස්තෘන් වහන්සේට දැන්විය. ශාස්තෘන් වහන්සේ එය අර්ථෝත්පත්ති කොට ගෙන පැමිණ සිටි පිරිසට දහම් දෙසූ හ. අනෙක් සියල්ල පෙර කී පරිදි දත යුත්තේ ය.

මිගලුද්දක ප්‍රේත වත්‍ථු වර්ණනාව
නිමියේ ය.

——//——

## 3-8

"කූටගාරෙ ච පාසාදෙ" ආදී මෙම ප්‍රේත වස්තු දේශනාව භාග්‍යවතුන් වහන්සේ වේළුවන විහාරයෙහි වැඩ වාසය කරන කල්හි වෙනත් මිගලුද්දක ප්‍රේතයකු අරභයා වදාරණ ලදහ.

රජගහනුවර වනාහි මුවන් මරා ජීවත්වන එක්තරා මාණවකයෙක් මහත් සම්පත් ඇත්තේ වී නමුත් ඒ භෝග සම්පත් හැර දමා රෑ දවල් දෙක්හි මුවන් මරමින් ජීවත් වේ. ඔහුගේ එක් යහළු උපාසකයෙක් දයානුකම්පාව නිසා "යහළුව" ප්‍රාණඝාතයෙන් වෙන් වෙව, මේ අකුශලය නුඹට දීර්ඝ කාලයක් අහිත පිණිස දුක් පිණිස වන්නේ යයි අවවාද දුන්නේ ය. හෙතෙම එය නො පිළිගත්තේ ය. ඉක්බිත්තෙන් ඒ උපාසක තෙමේ තමන්ගේ සිත් ඇදහන්නා වූ එක්තරා රහතන් වහන්සේ නමකගෙන්, ස්වාමීනි ! අසවල් පුරුෂයා වෙත, ඔහු ප්‍රාණඝාත අකුසලයෙන් යම්සේ මිදේ ද? එසේ ඒ සඳහා ඔහුට ධර්ම දේශනා කළ මැනවැයි ඉල්ලීමක් කළේ ය. අනතුරුව එක් දවසක් ඒ ස්ථවිරයන් වහන්සේ රජගහ නුවර පිඬු සිඟමින් හැසිරන්නේ ඔහුගේ ගේ දොරකඩ වැඩ සිටිසේක. එය දුටු ඒ වැදි තෙම ගරු බුහුමන් පෙරදැරිව පෙරගමන් කොට, ගෙට වඩමවා ආසනයක් පනවා පිරිනැමී ය. පණවන ලද අසුනෙහි උන්වහන්සේ වැඩ සිටියහ. ඔහු ද තෙරුන් වෙත එළඹ හිඳගත්තේ ය. ඒ තෙරුන් වහන්සේ ප්‍රාණඝාතයෙහි ආදීනව පවසා, එයින් වෙන්වීමේ ආනිසංස ද වදාළසේක. හෙතෙම එය අසා එයින් මිදෙන්නට නො කැමැති විය. ඉක්බිති තෙරණුවෝ ඔහුට මෙසේ කීය. මාණවකය ! ඉදින් තොපට සම්පූර්ණයෙන් ප්‍රාණඝාතයෙන් මිදෙන්නට නො හැක්කේ නම් අවම වසයෙන් රාත්‍රි කාලයෙහි වත් එයින් මිදෙනු මැනැවි. හෙතෙම යහපති ස්වාමීනි, රාත්‍රි කාලයෙහි මිදෙමියි පොරොන්දු විය. සෙස්ස පෙර කී වස්තුව හා සමාන වේ. ගාථාවෝ වනාහි.

දිව්‍යමය වූ, කූටාගාරයෙහි ද ප්‍රාසාදයෙහි ද, දික් ලොම් ඇති කොඳු පලස් අතුරන ලද යහන්හි සැතපෙමින්, මනාව වාදනය කරන පඤ්චාඞගික තූර්ය වාදනයෙන් සිත් අලවමින් සිටියි. (කූටාගාරය නම් එක් කැණිමඩලක් යොදා තැනූ වටගෙයයි.)

ඉන්පසු රැය පහන් වූ කල්හි හිරු උදා වූ කල්හි සොහොනෙහි දමන ලදුව බොහෝ දුක් විඳින්නෙහි ය.

ඔබ පෙර ආත්මයේ කයින් වචනයෙන් සිතෙන් කවරාකාර පාපකර්ම කළේ ද?

මම රමණීය වූ, සිත් පිනවන්නා වූ ගිරිබ්‍රජ නම් වු රජගහ නුවර, පෙර ඉපදී අසංවර වූ රෞද්‍ර වූ, මුව වැද්දෙක් වීමි.

එහි දී ශ්‍රද්ධාවන්ත උපාසකයෙක් මගේ  සමීපම සුහද වූ මිත්‍රයෙක විය. ගෞතම බුද්ධ ශාසනයේ එක් භික්ෂුවක් මගේ කුලුපග භික්ෂුවක් විය.

ඒ අය මා කෙරෙහි අනුකම්පාවෙන් මා ප්‍රාණඝාතයෙන් වැළැක්වීමට නැවත නැවත උත්සාහ කළේ ය. ප්‍රාණඝාත අකුසල කර්ම නො කරව ! මතු භවයෙහි දුගතියකට නො යවා

ඉදින් පරලොව දී සැප කැමැත්තේ නම් සංවර නො වු ප්‍රාණඝාතයෙන් වෙන්වව, මම හිතානුකම්පී වූ ඔවුන්ගේ වචන සුව කැමති වූ මා නොඅසා,

බොහෝ කලක් පවෙහි ඇලුනා වු, අනුවණ වූ මම ඔවුන්ගේ වචනය පිළි නොගත්තෙමි. බොහෝ යහපත් නුවණැති හෙතෙම මා කෙරෙහි දයාවෙන් සංවරයෙහි පිහිටු වී ය.

ඉදින් ඔබ දවල් කාලයෙහි සතුන් මරන්නේ නම් - රාත්‍රි කාලයෙහි සංයමයෙන් යුතු ව ප්‍රාණඝාතයෙන් වෙන්වීමි.

මම රාත්‍රි කාලයෙහි දෙව් සැප විඳිමි. දවල් කාලයෙහි දුකට පැමිණෙන්නෙමි. ඒ කුශල කර්මයාගේ විපාකයෙන් අමානුෂික වූ දිව්‍ය සැප වළඳමි. දවල් කාලයෙහි බද්ධ වෛර ඇත්තවුන් මෙන් සුනඛයෝ හාත්පසින් මා කෑමට පැමිණෙති.

ඒ පුරුෂයෝ වනාහි තථාගත ශාසනයෙහි ස්ථිර වශයෙන් ම ශීලාදී කුශලධර්මයන්හි යෙදුණේ ද? ඒ පින්වත්හු හුදෙක් නිවණටම පැමිණෙන්නේ ය යි හඟිමි.

මේ ගාථාවල අටුවාව පෙර කියන ලද පරිදි ම ය.

දෙවන මිගලුද්දක ප්‍රේතවත්ථු වර්ණනාව
නිමියේ ය.

——//——

## 3-9

**"මාලි කිරිටි කෙයුරී"** ආදී වූ මෙම ප්‍රේත කථා වස්තුව ශාස්තෲන් වහන්සේ වේළුවන විහාරයෙහි වැඩ වසන කල්හි එක් වංචනික ලෙස නඩු ඇසූ ප්‍රේතයකු අරභයා වදාළහ.

එකල්හි බිම්බිසාර මහ රජු මාසයකට සය දිනක් පෙහෙවස් සමාදන් වේ. ඒ රජුට අනුව බොහෝ මිනිස්සු ද පෙහෙවස් සමාදන් වෙති. රජතුමා තමන් ලඟට පැමිණි අයගෙන්, කිම ඔබ විසින් පෙහෙවස් සමාදන් වන ලද්දේ ද? නැතිනම් පෙහෙවස් සමාදන් නොවන ලද්දේ දැයි විමසයි. ඒ මිනිසුන් අතරෙහි එක්තරා අධිකරණ නායකයෙක් විය. හේ කේලාම් කියන, කෛරාටික, අල්ලස් ගන්නා දරුණු ක්‍රියා ඇත්තෙකි. ඔහු පෙහෙවස් සමාදන් නො වූයෙමි යි රජුට කියන්ට බියවෙමින් දේවයිනි පෙහෙවස් සමාදන් වෙමි යි කියේ ය. ඉක්බිති ඔහු රජු සමීපයෙන් නික්මුණු විට, යහළුව කිම ඔබ අද පෙහෙවස් සමාදන් වූයේ ද කියා යහළුවෙක් ඇසී ය. මම රජුට බියෙන් රජු ඉදිරියේ දී මෙසේ කී වෙමි. මම පෙහෙවස් සමාදන් නුවූයෙමි යි කීයේ ය. එවිට යහළුවා කියන්නේ, ඉදින් එසේ වී නම් ඔබට අද අර්ධ උපෝසථය සමාදන් විය හැකිය. ඔබට අර්ධ උපෝසථය වේවා ! අර්ධ උපෝසථාඞ්ගයන් සමාදන් වෙව ය, කීයේ ය. හෙතෙම ඔහුගේ වචනය මැනැවැයි පිළිගෙන ගෙදර ගොස් ආහාර නොගෙනම, මුව සෝදා උපෝසථ ශීලය ඉටා රාත්‍රියෙහි වාසයට පැමිණියේ ආහාරයෙන් හිස් වූ කුස තුළ බලවත් වාතය හේතුවෙන් හටගත් උදර රෝගයකින් සිඳින ලද ආයුසංස්කාර ඇත්තේ මිය ගියේ ය. මරණයට අනතුරුව පර්වත කුහරයෙක විමාන ප්‍රේතයෙක්ව උපන්නේ ය. ඔහු එක් රැයක් අර්ධ උපෝසථය රැකීම් පමණකින් දිව්‍ය විමානයක් ලැබී ය දෙවඟනන් දස දහසක් පිරිවර ඇතිවිය. දිව සැප ලැබීය. වඤ්චනිකලෙස විනිශ්චය කළ විපාකයෙන් ද පිසුණු බස් කීමේ විපාකයෙන් ද තමන්ගේ පිටේ මස් තමන් ම කඩාගෙන කයි. ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නා වූ ආයුෂ්මත් නාරද ස්ථවිරයන් වහන්සේ මේ ප්‍රේතයා දැක,

දිවමල් දරන්නා වූ, හිස් වෙළුම් ඇති, බාහු වළලු ඇති ඔබගේ ශරීරයේ සඳුන් ගල් වන ලදහ. මුවෙහි වර්ණය ප්‍රසන්නය හ. ළහිරු වර්ණයෙන් බබළයි.

ඔබට අත් පා මෙහෙවර කරන දෙව් වූ පරිචාරිකාවෝ මේ පිරිසෙහි ඇත් ද ඒ පරිචාරිකාවෝ දස දහසක් දෙවඟනෝ ම වෙති.

සක්වළලු හා අඟු පළඳනා දරන්නාහ. ස්වර්ණමය වූ මුදුන් මල් කඩින් සැරසුණාහ. ලොමු දැහැගන්වන සුළු මහානුභාව ඇත්තෙහි ය. එහෙත් තමාගේ අතින්ම තමන්ගේ ම පිටේ මස් කඩාගෙන කයි.

කයින් වදනින් සිතින් කරන ලද අකුශල කර්මය කුමක් ද? කවර වූ කර්ම විපාකයකින් තමාගේ ම පිටේ මස් තමා ම කඩා ගෙන කන්නේ ද?

මම මිනිස් ලොව දී මුසාවාදයෙන් හිස් වචන වලින් ශඨ බවින් හා වඤ්චාවෙන් ද තමන්ට අයත් රාජකාරි කටයුතු වල දී අවැඩ පිණිස හැසිරුණෙමි.

එහි දී මම පිරිස් මැදට ගොස් ඇත්ත කිවයුතු තන්හි දී, න්‍යාය යුක්ති ධර්මය හැර දමා අධර්මය අනුව පැවතියේ ය.

යම්සේ මම අද මගේ පිටමස් කම් ද? යමෙක් අනුන්ගේ පිටමස් කන්නේ ද යුක්තිය අයුක්තිය කරන්නේ ද හෙතෙමේ ද මා සේම තමා විසින්ම තමන් කා දමයි.

පින්වත් නාරදයන් වහන්ස, නුඹ වහන්සේ විසින් මගේ රූපය දක්නා ලදී. අනුකම්පා පූර්වකව යමෙක් යම් යහපතක් හොඳක් කියන්නේ ද? පිසුණු බස් හා බොරු නොකියනු මැනැවි. කේලාම් නොකියනු මැනවි. නුඹලා ද බොරු හා කේලාම් කියා මා සේ පිටමස් කන්නෙක් නො වෙනු මැනවි. තෙරුන් වහන්සේ ගාථා සතරකින් ඇසී ය. ඔහු ද ගාථා සතරකින් එහි අර්ථය විසඳීය.

එහි - **මාලී**. මල්දම් දරන්නා - දිව්‍ය පුෂ්පයන්ගෙන් සැදුම්ලද යන අදහසයි. **කිරීටි** - හිස් වෙළුම, තලප්පාව, **කෙයූරී** වළලු අත් සැරසීම සඳහා යන අර්ථ යි. **ගත්තා** - යනු ශරීර අවයව, **චන්දනුස්සදා** යනු සඳුන් රස (සුවඳ ආලේප) ගැල් වූ **සූරිය වණ්ණාව සොභසි** - යනු ළාහිරු පාටින් බබළන්නෙක් වී, **අරුණ සදිසි වණ්ණවා** යනු ද පෙළේ සඳහනි. අරුණනති අරුණ යනු අරුණ

දෙවියන කෙරෙන් පෙනෙන වර්ණයට සමාන යනුයි. එය ආර්ය කාශ්‍යප වර්ණයයි. දෙවියන් සමාන වර්ණ ඇති.

**පාරිසජ්ජා** - යනු පිරිස් පිරිවරා ගෙන, උපස්ථායකයින් යන අර්ථ යි. **තුවං** යනු ඔබ, **ලොමහංසන රූපවා** - යනු බලන්නන් ලොමු දැහැ ගන්වන සුළු රූපයන් යුත්, මහානුභාවයෙන් යුත් බව කියන ලදී. **උක්කඩ්ඪා** - යනු උගුල්ලා උදුරා කපා යන අර්ථ යි. **අවාරිසං** - යනු හැසිරුණෙමි. පිළිපැද්දෙමි, **පෙසුඤ්ඤ මුසාවාදෙන** - හිස්වචන, කේලාම් හා බොරු කීමෙන්, **නිකතී වඤ්චනාය වා** - යනු කෛරාටික කමින්, වඤ්චා කිරීමෙන්, නියම ප්‍රතිරූපය දක්වන්නේ යයි අනුන්ට පෙන්වා වෙනස් විධියකින් වංචා කිරීම.

**සච්චකාලෙ** - යනු සත්‍යය පැහැදිලි කළයුතු කාලයෙහි, **අත්‍ථං** - යනු මෙලොවදීම විපාක දීම් ආදියට හිතවත් වූ, **ධම්මං** - යනු කාරණය, න්‍යාය, **නිරාකත්වා** - යනු හැරදමා අත්හැර. **සො** - යනු යමෙක් පිසුනාවාචාදියෙහි යෙදේද එවැනි සත්ත්වයෝ අනෙක් සියල්ල යට කියන ලද පරිදි ම ය.

කුට විනිච්ඡයික ප්‍රේත වස්තු වර්ණනාව
නිමියේ ය.

——//——

## 3-10

"අන්තළික්ඛස්මිං තිට්ඨනෙන " - යනුවෙන් දැක්වෙන්නේ ධාතු විවණ්ණක ප්‍රේත වස්තු කථාව යි.

භාග්‍යවතුන් වහන්සේ කුසිනාරා නුවර උපවත්තන නම් මල්ල රජවරුන්ගේ සල්වනයෙහි සල් ගස් දෙකක් අතර (පනවන ලද ආසනයේ) පිරිනිවන් පෑ වදාළ කල්හි, ධාතු බෙදීම ද කළ කල්හි අජාසත් රජු තමන් විසින් ලත් ධාතු කොටස ගෙන සත් හවුරුදු සත්මස් සත් දිනක් මුළුල්ලෙහි බුදුගුණ සිහිකරමින් මහත් පූජා පැවැත්වී ය. ඒ ධාතු පූජෝත්සවයේ දී, අප්‍රමාණ වූ අසඬ්ඛ්‍ය ගණන් මිනිස්සු සිත් පහදවාගෙන ස්වර්ග ලෝකවල ඉපදුනාහු වෙති. අසූහය දහසක් පමණ මිනිස්සු බොහෝ කලක් පුරුදු පුහුණු කළ අශ්‍රද්ධාවෙන් හා මිථ්‍යා දර්ශනයෙන් ද වරදවා ගනු ලැබූ සිත් ඇති ව, පැහැදිය යුතු තන්හි තමන්ගේ සිත් දූෂිත කරගෙන ප්‍රේතයන් වී උපන්නාහු ය. එකල්හී රජගහ නුවර ධනසම්පත් ඇති එක්තරා කෙළඹියක්හු ගේ බිරින්ද, දුවණිය හා යෙහෙළිය පහන් සිතින් යුතුව ධාතු පූජාවන් කරන්නෙමු යයි. සුවඳ ද්‍රව්‍ය මල් ආදිය ගෙන ධාතු තැන්පත් කළ ස්ථානයට යාමට පිටත්වූහ. එවිට ඒ කෙළඹි තෙම "ඇටවලට පූජා කිරීමෙන් කවර ප්‍රයෝජනයක් දැයි කියා ඔවුන්ට බැණ නින්දා කොට ධාතු පූජාවේ නුගුණ කීවේ ය. පවුලේ උදවිය ඒ කීම භාර නොගෙන ධාතු පූජාව සඳහා ගොස් ධාතුන් වහන්සේලා වැඳ පුදා ගෙට ආහ. ඔව්හු හදිසි අසනීපයකින් මඩනා ලදු ව ටික දිනකින් මිය ගොස් දෙව්ලොව උපන්හ. ගෘහපතියා වනාහි ක්‍රෝධයෙන් මඩනා ලදු ව, නොබෝ කලකින් මිය ගොස් ඒ පාප කර්මයෙන් ප්‍රේතයකු වී උපනි. එක් දවසක් ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයෝ සත්ත්වයන් කෙරෙහි අනුකම්පාවෙන් යම්සේ මනුෂ්‍යයෝ ඒ දේවතාවන් හා ප්‍රේතයන් දක්නා කැමැත්තෝ ය. එබඳු වූ ඍද්ධ්‍යභිසංස්කාරයක් අධිෂ්ඨාන කළහ. එසේ කොට මළුවෙහි සිටි (ඉහත කී) ධාතු පූජාවේ නුගුණ කී ප්‍රේතයාගෙන් ගාථා තුනකින් කරුණු විමසී ය.

අහසෙහි සිටින්නා වූ ඔබගේ ශරීරයෙන් කුණු ගඳ හමන්නේ ය. දුගඳම හමා යන්නේ ය. තොපගේ කුණු ගඳ හමන්නා වූ මුඛය කෘමීහු කති. පූර්ව ජාතියෙහි කිනම් පාප කර්මයක් කළෙහි ද?

එහෙයින් තියුණු මුවහත් ඇති ශස්ත්‍රයක් ආයුධයක් ගෙන නැවත නැවත කට කපත් ලුණු ජලය ඉසිමින් නැවත නැවත කට කපන්නේ ය.

ඔබ කයින්, වචනයෙන් මනසින් කවර නම් අකුසල කර්මයක් කරන ලද්දේ ද? කවර කර්මයක විපාකයකින් මෙවන් දුකකට පැමිණියේ ද? දුකක් විඳින්නේ ද?

නිදුකාණනි මම පෙර ආත්මයේ, සිත් අලවන්නා වූ අලංකාර වූ, ගිරිබ්බජ යන නම් ඇති රජගහනුවර බොහෝ යස ඉසුරු සම්පත් ඇති ඓශ්වර්යයෙන් යුත් කෙළඹියෙක් වීමි.

එකල්හි (පෙර ආත්මයේ) මෝ තොමෝ මගේ බිරිඳ වූවාය. මෑ දියණිය ද, මෑ යෙහෙළිය ද වූහ. ඔවුන් මල් ද, උපුල් ද අලුත් වූ සුවඳ විලෙවුන් ද ගෙන, චෛත්‍ය පූජාවට යන්නියෝ මම වැළැක්වීමි. ඒ පාප කර්මය මා විසින් කරන ලදී.

සයාසු දහසක් පමණ වූ අපි, ස්ථූප පූජාවන් පවත්වන කල්හි, ඒ පිළිබඳව දොස් කීවෝ ද? ඒ නිසා ම වෙන් වෙන් වශයෙන් තමන් විඳිනු ලබන මහ දුක් වේදනා ඇතිව අතිශයින් නරකය හා සමාන ප්‍රේත අපායෙහි පැසෙමි. දුක් විඳිමි.

බුදුන්ගේ චෛත්‍ය පූජාව පිළිබඳ ව උත්සවය පවත්වන කල්හී යමෙක් දොස් කියයි ද ඔවුන් ඒ පිනෙන් බැහැර ව යයි.

දිව මල් මාලා දරමින් අලඞ්කාර ලෙස සැරසුණු, මල් පූජා කිරීමේ විපාකය භුක්ති විඳින්නා වූ, සම්පතින් සමෘද්ධ වූ පිරිවර සමග එන්නා වූ මේ දෙවඟනුන් දෙස බලව,

ආශ්චර්යමත් වූ, අද්භූත වූ, ලොමු දැහැ ගන්වන සුළු, මේ විපාක දැක නුවණැත්තෝ ඒ තථාගතයන් කෙරෙහි නමස්කාර කෙරෙත්.

ඒ එසේම ය. මම මෙයින් චුත ව ගොස් නැවත මිනිසත් බව ලබා ප්‍රමාද නොවී නැවත නැවතත් ස්ථූප වන්දනාව කරමි.

මෙහි - **දුග්ගන්ධා** යනු ප්‍රිය නො වූ ගඳ, මිණී කුණු වූ ගඳ ඇති යන අර්ථ යි. **පූතිවායසී** - යන්න එහෙයින් කියන ලදී. **තතො** - යනු දුර්ගන්ධය වහනය වන්නේ මත්තෙහි කෘමීන්, පණුවන් විසින් කණු ලබන්නේ, **සත්ථං ගහෙත්වාන ඔක්කන්තන්ති පුනප්පුනං** - යනු කර්මය විසින් මෙහෙයවන ලද සත්ත්වයෝ තියුණු මුවහත් ඇති ආයුධ ගෙන, නැවත නැවත ඔබගේ මුඛය කපයි, **ඛාරෙන පරිප්ඵොසිත්වා ඔක්කන්තන්ති පුනප්පුනං** - කැපූ කැපූ කෙණෙහි කරදිය ඉසීමෙන් නැවත නැවත කපත්. **ඉස්සරො ධන ධඤ්ඤස්ස සුපහූ තස්සා** - යනු අතිශය බොහෝ වූ ධන ධාන්‍යයන්ගෙන් ඓශ්වර්යයෙන් යුත් කෙනෙක් වීමි. ආඪ්‍ය වූ මහා ධන ඇති යන අර්ථ යි. **තස්සායං මෙ භරියා ච ධීතාච සුණිසා චා** - යනු ඇය මගේ පෙර අත් බැව්හි භාර්යාව ය. මෝ දියණියයි. මෑ පෙර යෙහෙළිය වන නිසා මෙහිද යෙහෙළියම විය යුතුය. නැතහොත් මුලින් හමුවන දෙතැනම ලේළිය කළ යුතුයයි. ඔව් හූ දෙවියන් වී අහසේ සිටියවුන් දක්වමින් කිය යි. **පච්චඞ්ග** යනු අළුත්, **ථූපං හරන්තියො වාරෙසි** යනු ස්තූප පූජාවට පිටත්වන්නේ ධාතු වන්දනාව හරහා ප්‍රතික්ෂේප කළෙමි. **තං පාපං පකතං මයා** - යන ඒ පාප කර්මය මා විසින් කරන ලදී. ඒ ධාතු පූජාවේ නුගුණ කීමේ පාපය, විඳවමි. මා විසින් විපිළිසරට පැමිණ කී ය. **ඡළාසීති සහස්සානි** - යනු අසූ හය දාහක් පමණ, **මයං** යනු ඒ ප්‍රේත තෙමේ තමන් හා වසන පිරිස ගැන කිය යි. **පච්චත්ත වෙදනා** - යනු වෙන වෙනම තමන් විසින් විඳිනු ලබන මහා දුක් වේදනා දකියි. **නිරයං** - යනු බලවත් දුක් වේදනා ගෙන දෙන ප්‍රේත විෂය නිරයට සමානකොට කීයේ ය. **යෙච ඛො ථූප පූජාය වත්තනෙතා අරහතො මහෙ**, යනු අර්හත් වූ සම්‍යක් සම්බුදුන් වහන්සේගේ ස්ථූපය උදෙසා පූජා පවත්වන කල්හි, මා මෙන් ථූප වන්දනාව පිළිබඳව ආදීනව දෝස ප්‍රකාශ කරන්නා වූ කළා වූ අය ඒ පින් කමෙන් වෙන් වේ. ඒ පිනෙන් බැහැර වූවාහු වෙති.

**ආයන්තියො** යනු අහසින් පැමිණියාහු - **මාලාවිපාකං** යනු ථූපය පිණිස කරණ ලද මල් පූජාවේ විපාක ඵලය, **සමිද්ධා** - යනු දිව්‍ය සම්පත්තීන් සමෘද්ධ වූහ. **යසස්සි නියො** - යනු පිරිවර ඇත්තාහු, **තඤ්ච දිස්වානං** - යන ඔවුන් විසින් කරන ලද පුණ්‍යයාගේ විපාක වසයෙන් ආශ්චර්ය වූ අද්භූත වූ ලොමු දෑහැගන්වන සුළු ඉතා මහත් වූ විපාක විශේෂය දැක, **නමො කරොන්ති සප්පඤ්ඤා වන්දන්ති තං මහාමුනිං** යනු ස්වාමිනී ! කාශ්‍යපයන්

වහන්ස මේ ස්ත්‍රීහු උතුම් වූ පුණ්‍ය ක්ෂේත්‍ර තත්ත්වයට පත්වූයේ වදිති අභිවාදනය කරත්, නමස්කාර කරත් යන අර්ථයි.

ඉක්බිති ඒ ප්‍රේතයා හටගත් සංවේග ඇත්තේ, සංවේගාත්මක ව තමන් විසින් කරන ලද්ද දක්වන්නේ, සොභි නූනා - ආදී ගාථාව කීහ. එය ඉස්මතු කර දක්වීම් වශයෙන් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ එය අර්ථෝත්පත්ති කොට ගෙන පැමිණ සිටි පිරිසට ධර්මය දේශනා කළහ.

ධාතු විවණ්ණක ප්‍රේත වත්‍ථු වර්ණනාව
නිමියේ ය.

—//—

තුන්වෙනි චූල වර්ග වත්ථු වර්ණනාව නිම යි.

# 4-1

වෙසාලී නාම නගරත්ථි වජ්ජීනං මේ අම්බසක්ඛර ප්‍රේත වස්තු කථාව යි. එය කවුරුන් නිසා උපන්නේ ද?

භාග්‍යවතුන් වහන්සේ ජේතවන විහාරයෙහි වැඩ වාසය කරන කල්හි අම්බසක්ඛර නම් ලිච්ඡවී රජු විශාලා නුවර රාජ්‍යය කරවී ය. හේ මිථ්‍යා දෘෂ්ටික ය. නාස්තික වාදී ය. එ සමයෙහි විසාලා නුවර එක්තරා වෙළෙන්දකුගේ වෙළඳපල ඉදිරිපිට මඩ වලින් ගැවසුණු බිම් පෙදෙසක් විය. බොහෝ මිනිස්සු එහි වැටී කරදරයට පත්වෙති. ක්ලාන්ත වෙති. සමහරු මඩ තැවරීමෙන් පිඩා විඳිති. එය දුටු මේ වෙළෙන්දා මේ මිනිසුන් මඩ නො පාගාවා, කරදරයට පත් නොවෙත්වා යි සිතා දුගඳ නැති සුදු පැහැයෙන් යුත් ගව හිස් ඇට කටු ගෙන්වා මඩ මතුපිට දැම්මවී ය. හෙතෙම ස්වභාවයෙන් ම සිල්වත් වූයේ ය. ක්‍රෝධ නො කළේ ය. මොලොක් වචන ඇත්තේ ය. අනුන්ගේ ඇති පරිදි ගුණ කියන්නේ ය. හෙතෙම එක් දවසක් තම යහළුවකු දියනහන විට ප්‍රමාදයකින් හිමියාට නො පෙනී ඔහු හැඳි වස්ත්‍රය ක්‍රීඩා අදහසින් සඟවා තබා, ඔහුට දුක් උපදවා පසුව දුන්නේ ය. ඔහුගේ බෑණා කෙනෙක් අනුන්ගේ ගෙවල්වලින් බඩු සොරකම් කොට ඔහුගේ කඩේ තැබුවේ ය. බඩු හිමියෝ බඩු සොයා ගොස් කඩේ තිබුණු බඩු සමග ම ඔහුත් ඔහුගේ බෑණාත් අල්ලා ගෙන ගොස් රජුට භාරදුන්හ. රජු මොහුගේ හිස කපා දමවි, ඔහුගේ බෑණ උලතබව යි නියම කරවී ය. රාජ භටයෝ එසේ කළහ. හෙතෙම කළුරිය කොට භූමාටු දෙවියෙක් වී උපන්නේ ය. හෙතෙම ගවහිස්වලින් මගතොට පිළිසකර කළ පිණෙන් සුදු පැහැවූ දිව්‍යමය මනෝ ජව සම්පන්න වූ ආජානීය අශ්වයකු ලැබී ය. ගුණවතුන්ගේ ගුණ කීම් හේතුවෙන් ඔහුගේ ශරීරයෙන් දෙව් සුවඳ විහිදෙ යි. වස්ත්‍රය සඟවා තැබූ අකුශල යෙන් නග්න වූයේ යි. හෙතෙම තමන් පෙර කළ කර්මය බලමින්, ඒ අනුසාරයෙන් උලතබන ලද තමන්ගේ බෑණා දැක කරුණාවෙන් චෝදනා කරන සිත් ඇති ව ශීඝ්‍රයෙන් යන අසු පිට නැගී අඩ රැයෙහි, උල සිටුවන තැනට ගොස් තුදුරෙහි සිට පින්වත ජීවත් වව ජීවත්වීමම ශ්‍රේෂ්ඨය. යයි දවසින් දවස කිය යි.

එකල්හි අම්බසක්ඛර රජු ඇතු පිට නැගී නගර ප්‍රදක්ෂිණාවෙහි යෙදුනේ, එක්තරා ගෙයක ජනේලය හැර වා කවුලුවෙන් රජසිරි නරඹමින් එක් ස්ත්‍රියක් දැක පිළිබඳ සිත් ඇති වූයේ, පසු අසුනෙහි සිටි පුරුෂයාට මේ ගෙයත් මේ ස්ත්‍රියත් සිත්හි තබා ගනුවයි කියා, පිළිවෙලින් රජගෙට ගොස් රජගෙට ඇතුල් වූයේ (පසුපස අසුනේ සිටි) පුරුෂයා කැඳවී ය. සගය යව! අසවල් ස්ත්‍රිය විවාහක ද අවිවාහක ද යි වහා දැනගෙන එනුයි යැවී ය. හෙතෙමේ එහි ගොස් ඇය විවාහක බව දැන, රජුට කීයේ ය. රජු ඇය ලබා ගැනීමට උපායක් සිතා ඇගේ ස්වාමි පුරුෂයා කැඳවා ! එම්බල පුරුෂය ! ඔබ මට උපස්ථාන කරවයි කීය. හෙතෙම අකමැත්තේම විය. එහෙත් රජුගේ වචනය නියමය නො කරන තමන් කෙරෙහි රාජ දණ්ඩනය පසු පස එන බව සිතා බියෙන් රාජ උපස්ථානය පිළිගෙන දිනපතා රාජ සේවය පිණිස යයි. රජු ද ඔහුට බත් වැටුප් දී, කිහිප දවසක් ඉකුත් වූ කල්හී උදේම උවැටන් සඳහා පැමිණි ඔහුට මෙසේ කීය.

සගය ! අසවල් තැන එක් පොකුණක් ඇත. ඒ පොකුණෙන් අරුණුවන් මැටි හා රතු උපුල් රැගෙන එව යව් ! ඉදින් අදම නො පැමිණයහොත් තොගේ ජීවිතය නැත. ඔහු ගිය කල්හි දොරටු පල්ලාට කීයේ ය. අද හිරු බසින්නට පෙර ම නුවර සියලු දොරවල් වසා දමනු මැනවි. ඒ පොකුණ විශාලා මහ නුවර සිට තුන් යොදුනක් පමණ ඈතින් පිහිටියේ ය. එසේ වුවත් ඒ පුරුෂයා මරණ භයින් බියපත් ව ඉතා වේගයෙන් ගොස් පෙරවරුයේම ඒ පොකුණ වෙතට පැමිණියේ ය. ඒ පොකුණ ද අමනුෂ්‍යයකු විසින් ආරක්ෂා කරන බව කලින් අසා තිබුණු නිසා බිය වූ ඔහු, පොකුණට නො බැස, මේ පොකුණේ යම් කිසි උපද්‍රවයක් ඇත්දැයි හාත්පස බලමින් වල වටේ ඇවිදි යි. පොකුණ අරක්ගත් තැනැත්තා අමනුෂ්‍යයා ඔහු දැක කරුණා සිතින් මිනිස් වෙසින් පැමිණ, ඇයි ද පුරුෂය ඔබ කුමක් සඳහා මෙහි ආයේ දැ යි ඇසී ය. හෙතෙම පුරුෂයා තමන් ආ කරුණ හා සියලු ප්‍රවෘත්තිය කීය. හෙතෙම (අමනුෂ්‍යයා) එසේ නම් තොපට අවශ්‍ය දෙයක් ගෙන යන්නැයි කියා තමන්ගේ දිව්‍යරූපය දක්වා අතුරුදන් විය. ඒ පුරුෂයා අරුණුවන් මැටි ද රත් උපුල් ද ගෙන හිරු බැස යාමට කලින්ම නගරයේ දොරටුව වෙත පැමිණියේ ය. ඔහු දුටු ද්වාර පාලකයා ඔහු කෑගසද්දීම විවෘත කර තිබූ දොර වැසුවේ ය.

ඒ පුරුෂයා දොර වැසූ නිසාම නගරයට ඇතුල්වීමට අවකාශ නො ලබා

දොරටුව ළඟ උල තබා සිටි පුරුෂයා දැක, ඔහුට කියන්නේ හිරු බසින්නට පෙරම ආවා වූ මා කෑ ගසද්දී ම දොරටුපාලයා දොර වැසුවේ ය. මම කල් ඇතුවම ආවෙමි. මා අත වරදක් නැත. නුඹ විසින් මේ කරුණ දැනගනු මැනවි, කියා ඔහු සාක්ෂිකරුවකු කළේ ය. ඒ අසා උල පිට සිටි පුරුෂයා මෙසේ කී ය. මම හුල තබන ලදු ව මරණයට කැප වූවෙක් වෙමි. මා කෙසේ නම් ඔබට සාක්කි කියන්න ද? මෙතැන එක් මහත් ඍද්ධි ඇති ප්‍රේතයෙක් මා සමීපයට එන්නේ ය. ඒ ප්‍රේතයා සාක්කිකරු කරවයි කීයේ ය. එවිට මා විසින් ඒ ප්‍රේතයා කෙසේ නම් බැලිය හැකිදැයි ඇසී ය. ඒ පුරුෂයා එතැනම සිටියේ මැදියම් රෑ එතැනට පැමිනි ඒ ප්‍රේතයා දැක මේ පිළිබඳ ව ඔහු සාක්කිකරු කළේ ය.

පසුවදා උදේ රජු කියන්නේ තා විසින් මගේ අණ ඉක්මවන ලදී. එබැවින් තට රාජ දඩුවම් පමුණුවන්නෙමි" එකල්හි ඒ පුරුෂයා, දේවයන් වහන්ස මා විසින් නුඹ වහන්සේගේ අණ නො ඉක්මවන ලද්දෙමි. හිරු බැස යන්නට කලින්ම මම මෙහි ආවෙමි යී කී ය. එකල ඊට තොපට සාක්ෂි කවරේදැ යි රජු ඇසී ය. මේ උල සිටුවා සිටින පුරුෂයා ලඟට රාත්‍රියේ නග්න ප්‍රේතයකු එයි. ඒ ප්‍රේතයා මට සාක්ෂි කියන්නේ ය. මේ කීම අප විසින් කෙසේ ඇදහිය යුතුදැයි රජු විසින් ඇසූ කල්හි අද රෑ නුඹ වහන්සේ විසින්, නුඹ වහන්සේට ඇදහිය හැකි පුරුෂයකු මා හා සමග එවනු මැනැවි යී කී ය. ඒ ඇසූ රජු තමා මැ එතනට ගොස් ඒ පුරුෂයා සමග සිටිද්දී ප්‍රේතයා එතනට අවුත් "පින්වත ජීවත් වෙව ජීවිතයම ශ්‍රේෂ්ඨය" කියා කී කල්හි, රජු ඒ ප්‍රේතයාගෙන් කරුණු විචාළේ ය. රජු ගාථා පහකින් ප්‍රේතයාගෙන් කරුණු විමසී ය" සෙය්‍යා නිසජ්ජා නයි මඝස අත්ථි" ආදී ගාථා රජු විසින් විචාළ ගාථා ය. වෙසාලි නාම නගරත්ථි ආදී ගාථාව මෙහි සම්බන්ධය ඇති කිරීම සඳහා සංගීතිකාරකයන් විසින් තබන ලදී. වජ්ජි රජවරුන්ගේ විසාලා නම් නුවරක් විය. එහි "අම්බ සක්ඛර" නම් ලිච්ඡවී රජෙක් සිටියහ. ඔහු නගරයෙන් පිටත දී ප්‍රේතයකු දැක, කරුණු දැන ගැනීම සඳහා එතැනදීම ඔහුගෙන් කරුණු විචාළේ ය.

මොහුට නිදීමක් ද හිඳීමක් ද නැත ඉදිරි ගමනක් ද ආපසු ගමනක් ද නැත. ආහාරයක්, පානයක්, කුඩා කෑමක්, වස්ත්‍රයක්, ඉන්ද්‍රියයන් පිනවීමක් මොහුට නැත.

මේ අයට පෙර අනුකම්පා කළා වූ නෑයින් ද, පෙර සිටි මිත්‍රයෝ ද දැන් නැත. ඒ හැම දෙන විසින් අත් හැර දමන ලද ආත්ම භාවයක් ඇත්තේ ය.

මළවුන්ට මිත්‍රයෝ නැත. සම්පතින් හා වස්තුවෙන් පිරිහුණු අය මිත්‍රයන් විසින් හැර දමනු ලබත්, මිත්‍රයෝ ධනය දැකම පිරිවරා ගනිත්. භව සම්පත් වලින් සමෘද්ධ වූ අයට ම බොහෝ මිත්‍රයෝ සිටිති.

මොහු සියලු වස්තු සම්පතින් පිරිහුණේ ය. දුප්පත් ය ලෙයින් වැකුණු සිරුර ඇත්තේ ය. ඇතුළතින් පැළුණු ශරීර ඇත්තේ ය. තණ අග රැඳුණු පිනි බිඳුවක් මෙන් අද හෝ හෙට මොහු මිය යන්නේ ය.

යක්ෂය ! මෙබඳු වූ ඉතාමත් දුකට පත් ව කොසඹ හුලෙහි නංවන ලද්දහු ට, ඔබ ජීවත් වෙව ජීවිතය ම ශ්‍රේෂ්ඨය යි කවර කරුණක් නිසා නුඹ කියන්නේ ද?

එහි **තත්‍ථ** යනු එහි විසාලා නුවරෙහි, **නගරස්ස** බාහිරං යනු නගරයෙන් පිටත වූ, විශාලා මහ නුවරට පිටතින් ම පවතින්නා වූ, යන සම්බන්ධයි. **තත්‍ථේව** - යනු යම් තැනෙක්හි එය දක්නේ ද එම ස්ථානයෙහි ම, තං යනු ඒ ප්‍රේතයා **කාරණත්‍ථිකො** - යනු ජීවත්වෙව ජීවිතය ම, ජීවත් වීම ම ශ්‍රේෂ්ඨ ය, යයි කියනු ලබන්නා වූ කාරණයෙන් අර්ථයක් වී, **සෙය්‍යා නිසජ්ජා නයිමස්ස අත්‍ථි**, යනු පිට පැලුණු ලක්ෂණ ඇති ව මේ හුලෙහි නංවා ඇති පුරුෂයාට නිදීමක් හෝ පර්යඞ්කයක් හෝ හිඳීමක් හෝ වෙනත් කිසිවක් නැත. **අභික්කමො නත්‍ථි පටික්කමො** - යනු ගමනක් යාමේ ලකුණක් හෝ ආපසු පැමිණීමක් හෝ කිසිදු ගමනක් මොහුට නැත්තේ ය. **පරිචාරිකා සා පීති** - යනු, කෑමක්, බීමක්, කෑලි කෑලි කඩාගෙන කෑමක් නිදීමක් වස්ත්‍ර පරිභෝගයක් ආදී කිසි ලකුණක් හෝ, ඉන්ද්‍රිය පිරි වැරීමක් හෝ මොහුට නැත. (අත්හරින ලද ජීවිතාශා ඇත්තේ යන අර්ථ යි) **පරිහරණ සාපි** - යනු ආහාර පරිභෝග වශයෙන් හෝ ඉන්ද්‍රිය පරිහරණ වසයෙන් හෝ කිසිවක් මේ තැනැත්තාට නැත. අත්හරින ලද ජීවිත ආශා ඇත්තේ ය. **පරිචරණසාපි** යනුවෙන් කිසි තැනක දක්වේ. දිට්ඨ **සුතා, සුහජ්ජා, අනුකම්පකා යස්ස පුබ්බෙ අහෙසුං** - යනු සමීපයෙහි සිටි සහායකයෝ, නො දුටු මිතුරෝත්, යම් යම් මිත්‍රයෝත්, දයාව කරුණාව දැක් වූ අයත් පෙර මොහුට සිටියහ.

**දට්ඨුම්පි** - යනු ඒ අය දූන් දක්නට නැත. කොහේ වසන්නේ ද යන අර්ථ යි. **විරාධිතත්තො** - යන අත්හැර දමන ලද බව, **ජනෙන තෙන** යනු ඒ ඤාති මිත්‍ර ආදී ජනයා, **නඞ්ගතත්තස්ස භවන්ති මිත්තා** - යනු පහ වූ විඤ්ඤාණය ඇති මළා වූ මිත්‍රයෝ නම් නැත. මොහුගේ මිත්‍රයන්ට කළයුතු කිසිවක් ඉතිරි වී නැත්තේ ය. **ජහන්ති මිත්තා විකලං විදිත්වා** - යනු මළ අය සිටීවා (අත්හැරේවා) ජීවත් වුවත් භෝග විනාශයට පත් වූ පුරුෂයා දූන මොහුගෙන් ගතයුතු කිසිවක් අපට නැතැයි දූන මිත්‍රයෝ දුරුකරති, **අත්ථඤ්ච දිස්වා පරිභාරයන්ති** - යනු ඔහු සන්තක ව යම් සම්පත් හා ධනය ඇතැයි දූක ම, ප්‍රිය වාදී ව සිනහසුණු මුහුණින් යුතු ව ඔහු පිරිවරා ගනිත්. **බහුමිත්තා උග්ගතත්තස්ස හොන්ති** - යනු භවභෝග සම්පත්තියෙන් උසස් වූ, සමෘද්ධ වූ, අයට බොහෝ නොයෙක් විධියේ මිත්‍රයෝ ඇතිවෙත්, මේ ලෝකස්වභාවය යි. යන අර්ථයි. **නිහීනත්තො සබ්බ භොගෙහි** - යනු සියලු උපභෝග පරිභෝග සම්පත්තීන් ගෙන් පිරිහීමට පත් වූ, **කිච්ඡො** යනු දුකට පත්, **සම්මක්ඛිතො** - යනු ලෙයින් වැකුණු සිරුරු ඇති, **සම්පරිභින්නගත්තො** - යනු හුල තැබීමෙන් සිරුර තුළ පැළුණු ස්වභාව ඇත්තේ, **උස්සාව බින්දුව පලිමපමානො** - යනු තණ අග රැඳුණු පිනි බිඳුවක් හා සමාන වූ **අජ්ජ සුවෙ** - යනු අද හෝ හෙට මේ නම් වූ පුරුෂයාගේ ජීවිතයේ නිරුද්ධ වීම විනාශය සිදුවන්නේ ය. එයින් මතුවට නො පවත්නේ ය යන අර්ථ යි. **උත්තාසිතං** - යනු ආරෝපනය කළ වටකළ **පුචිමන්දස්ස සූලෙ** - යනු කොසඹ ගසක කඳින් කරන ලද හුල **කෙන වණ්ණෙන** - යනු කවර කාරණයකින්, **ජීව භො ජීවිතමෙව සෙය්‍යො** යනු පින්වත ජීවත් වෙව ! කුමක් හෙයින් ද? උලෙහි ඉන්දවන ලද මේ පුරුෂයාට ජීවත් වීමට වඩා මරණය සිය දහස් ගුණයකිනි. සුන්දරතර වේ. මිහිරි වේ.

මෙසේ රජු විසින් විචාරණ ලදුව ඒ ප්‍රේත තෙමේ තමාගේ අදහස ප්‍රකාශ කරන්නේ ගාථා හතරක් කීයේ ය.

රජතුමනි ! මේ පුරුෂ තෙම මගේ සහලේ නෑයෙකි. මම පූර්ව ආත්ම භාවය සිහි කරමි. ළාමක ස්වභාව ඇති මේ පුරුෂයා නිරයෙහි නො වැටේවා යි මා තුළ කාරුණික සිතක් පහළ විය.

ලිච්ඡවී රජතුමනී ! පව්කම් කළා වූ මේ පුරුෂයා මෙතැනින් චුත වී පව්කළ

ජනයන්ගෙන් උත්සන්න වූ දරුණු ස්වභාව ඇති, මහත් දුක් ඇති, මහත් සන්තාප ඇති කටුක බිය උපදවන්නා වූ මහා නරකාදියෙහි උපදින්නේ ය.

මෙතෙම ඒකාන්තයෙන් ම දුක් වූ කටුක වූ, බිය ජනක වූ, ඒකාන්තයෙන්ම තියුණු දුක් ඇති, මහා නරකයෙහි නො වැටේවා එසේ මහා නරකයට නො වැටී මේ හුල උඩ ම සිටීම යහපත් වෙයි.

මේ තෙම මාගේ වචනය අසා නිරා දුකට පමුණුවන ලද්දෙකු සේ ප්‍රාණය හැරලන්නේ ය. එහෙයින් ඒ ජීවිතයේ නිරෝධය මා විසින් කරන ලද්දක් නො වේවා ! ඔහු සමීපයේ (මෙයට වඩා) යමක් නො කියමි.

එහි **සාලොහිතො** - යනු සමාන ලේ ඇත්තේ, උත්පත්ති සම්බන්ධයෙන් සම්බන්ධ වේ. ළඟ නෑයෙක් යන අර්ථ යි. **පුරිමාය ජාතියා** - යනු පෙර ආත්ම භාවයෙහි, **මා පාපධම්මො නිරයං පපාතං** - යනු පාප ධර්මයෙන් යුත් වේ. පුරුෂයා නිරයෙහි නො වැටේවා ! නිරයෙහි නූපදීවා මේ දූක මා තුළ කාරුණික බවක් ද උපන්නේ ය. යනු යෝජනා යි **සත්තුස්සදං** - යනු පච්කරණ ජනයාගෙන් උත්සන්න වූ, නොහොත් පස් වැදෑරුම් බැඳුම් ද, මුවෙහි පැසෙන්නා වූ ලොහෝදිය වැක්කිරීම ද, අඟුරු පර්වතයට නංවාලීම ද, ලොහෝ කටාරමෙහි බහාලීම ද, අසිපත්‍ර වනයට පමුණුවා ලීම ද, වේතරණී නදියෙහි පා කර හැරීම ද, මහානිරයෙහි බහාලීම ද, මේ සත් ආකාරයෙන් හා පඤ්චවිධ බන්ධනාදි දරුණු දුක් කරදර වලින් ද, පිරී පවත්නා නිරයට ඇතුල්වෙති. **මහාභිතාපං** යනු මහාදුක් මහා ගිනියම් කිරීම් - රත් කිරීම්, **කටුකං** - යනු නොනිමි දුක්, **භයානකං** - යනු බිය එළවන්නා වූ, බිය ජනන වූ, **අනෙක භාගෙන ගුණෙනා** - යනු නොයෙක් ආකාර ආනිසංසයන් ගෙන්, **අයමෙව සූලො නිරයෙන තෙනා** - යනු එබැවින් මීලඟ උත්පත්ති ස්ථාන වූ නිරයට වඩා මේ හුල පිට හිඳීමම යහපත් ය. ශ්‍රේෂ්ඨ ය, **තිස්සකෙක** යන මෙය කරණ වචනයි. **එකන්ත තිප්පං** යනු ඒකාන්තයෙන් ම තියුණු වූ දුක් නියත වූ මහාදුක් යන අර්ථ යි. **ඉදං සුත්වා වචනං ම මෙසො** - මෙසේ කියන්නා වූ මේ මගේ වචන අසා දුකට පත් වූ මේ පුරුෂයා මගේ වචනයෙන් නිරය දුකට පමුණුවන ලද්දෙකු (මෙන්) වී **විජහෙය්‍ය පාණං** - යනු තමාගේ ජීවිතය අත්හරින්නේ නම්, **තස්මා** - ඒ කාරණයෙන් මා **මෙකතො** යනු මොහුගේ මේ ජීවිත හරණය මා විසින් කරන ලද්දක් නො

වේවා යි සිතා මේ වචන මොහු ඉදිරියේ මම නො කියමි. එසේ හෙයින්ම "ජීවත් වෙව, ජීවිතයම ජීවත්වීමම ශ්‍රේෂ්ඨය යන මෙය ම කියන්නේ ය යන අදහස යි.

මෙසේ ප්‍රේතයා විසින් තමන්ගේ අදහස් පැවසීමෙන් පසු නුවර රජ තෙමේ ප්‍රේතයාගේ ප්‍රවෘත්තිය විචාරන්නට අවසර පතන්නේ මේ ගාථා කීහ.

මේ පුරුෂයා පිළිබඳ මේ කාරණ මා විසින් දැන ගන්නා ලදී. තවදුරටත් ඔබ අපට අවකාශ දෙන්නේ නම් අනෙකක් ද විචාරන්නට කැමැත්තෙමි. එයත් විචාරමි. අප කෙරෙහි නො කිපෙනු මැනවි.

ඒකාන්තයෙන් මෙය මාගේ බලාපොරොත්තුව විය. අප්‍රසන්නයාහට නො කීවෙමි. අකමැත්තෙන් ඇදහිය යුතු වචන ඇත්තෙකැයි සිතා කැමති පරිද්දෙන් විචාරනු මැනැවි. ම හැකි පරිදි ඉවසිය හැකිනම් කියමි.

එහි **අඤ්ඤාතො** - යනු, දැන ගන්නා ලදී, **ඉච්ඡාමසෙ** - යනු කැමැත්තෙමු. නො අපගේ, **න ච කුජ්ඣිත ඛ්‍යං** - යනු මේ මිනිස්සු යම් කිසිවක් විචාරත්නුයි ඒ පිළිබඳව ක්‍රෝධ නො කළ යුතු ය. **අද්ධා** - යනු ඒකාන්තයෙන්, **පටිඤ්ඤා** මේ යනු දැන ගැනීම් වසයෙන් විචාරන්නේ නු යි අවසර ඇත්තේ ය යන අර්ථ යි. **තදා අහු** - යනු ඒ කාලයෙහි ප්‍රථම දර්ශනයේ දීම ඇති, වූයේ ය. **නාවික්ඛතා අප්ප සන්නස්ස හොති** - යනු කරුණක් විචාළ කල්හි අප්‍රසන්නයාට කීමක් නැත. ප්‍රසන්න සිත් ඇත්තාම ප්‍රසන්නයාට කිසිවක් කිය යි. එකල්හි ඔබ මා කෙරෙහි අප්‍රසන්න වූයේ ය. මම ද ඔබ කෙරෙහි අප්‍රසන්න වූවෙමි. ඒ කරුණෙන් මා දැන ගෙන කියනු කැමැත්තක් නො වීය. දැන් වනාහි මම නුඹගේ අකැමැත්තෙන් ඇදහිය යුතු වචන ඇත්තෙක් වීමි. ඒ කාරණයෙන් ඔබ කැමැත්තෙන් මගෙන් විචාරව ! **පුච්ඡස්සුං මං කාමං යථා විසයෘං** යනු ඔබ විමසීමට තමන් කැමති යමක් වේ නම් එය විචාරනු යම් විධියකින් මට ඉවසිය හැකි දෙයක් නම්, එය මගේ නුවණේ ප්‍රමාණයෙන් මම කියන්නෙමි. යන අදහසය මෙසේ ප්‍රේතයා විසින් විමසීමට අවසර දුන් කල්හි රජු මේ ගාථාව කියේ ය.

යක්ෂය මම යම්කිසි දෙයක් දෑසින් දකින්නෙමි ද ඒ සියල්ල මම අදහන්නෙමි.

ඉදින් එය දැක නො අදහන්නේ නම්, මට නිග්‍රහ කරව.

එහි අර්ථය මා යම් කිසි දෙයක් ඇසිනුත් දකින්නේ නම් ඒ සියල්ල එසේම විශ්වාස කරන්නෙමි. එය දැක ඔබගේ වචනය මා නො අදහන්නේ නම් මට නිග්‍රහ කරනු මැනවි. නොහොත් **යං කිඤ්චානං චක්ඛුනා පස්සිමි** මම යම් කිසිවක් දිව්‍ය ඇසින් දකින්නෙම් නම්, නො දකින්නා වූ අනෙකාට **සබ්බම්පි තාහං අභිසද්දෙහෙය්‍ය** - නුඹ විසින් ඇසූ දුටු දේ සියල්ල මම විශ්වාස කරමි. තා කෙරෙහි මගේ මනා පැහැදීම එබඳුම වේය යන අදහස යි. අවසාන පදයාගේ වනාහි අර්ථ කියන ලද පරිදිම ය. එය අසා ප්‍රේත තෙම,

ඔබගේ මේ ප්‍රතිඥාව ම මට සැබෑ වේවා ! ඔබට දැනගනු සඳහා ම දූෂිත සිතින් තොරවම මේ ධර්මය කියමි. එය අසා පැහැදීමක් ලබව, ඔබ විසින් අසන ලද්දා වූ ද, නො අසන ලද්දා වූ ද, යම් ධර්මයක් යම් සේ දන්නා ලද්දේ ද ඒ සියල්ල ඔබට කියමි.

දැකුම් කළු වූ සුදු අශ්වයන් යෙදූ අශ්ව යානාවකින් මේ හුල ඉන්නා වූ අය සමීපයට මම එන්නෙමි. මේ යහන අද්භූතය. දැකුම්කළුය. මෙය කිනම් කර්මයක විපාකයෙන් ලබන ලද්දේ ද?

වේසාලී නම් නගරයමැද මාර්ගයෙහි මඩවලින් යුත් මහවළක් විය. මම පහන් සිතින් යුතු ව සුදු වූ ගවහිස් ගෙන්වා ඒ මඩවළ පිරවීමි.

මේ ගවහිස් මතින් අපි ද අනික් අය ද, ගමන් කළෙමු. මේ අද්භූත වූ දර්ශනීය වූ අශ්ව රථය ඒ මඩවළ ගොඩ කළ පිනේ විපාක යයි.

යක්ෂය ! තොපගේ ශරීරය ද සියලු දිසාවන් බබළවයි. තොපගේ ශරීරයේ සුවඳ ද දස දෙස පැතිර ය යි. ඍද්ධියට පැමිණියේ මහානුභාව ඇත්තේ, එහෙත් ඔබ නග්නයෙක් විය. ඒ කවර විපාකයකින් ද?

ක්‍රෝධ නැති නිති පහන් සිතින් ප්‍රිය මනාප සිළුටු වචන වලින් නිතරම මහ ජනයා ඇමතීමි. මේ කර්මයාගේ විපාකයෙන් දිව්‍යමය වූ ශරීර වර්ණයෙන් නිතර බබළයි.

ධර්මයෙහි පිහිටි යහපත් මිනිසුන්ගේ ගුණ වර්ණනාව මම කළෙමි. එය මම පහන් සිතින් ම කළෙමි - ඒ කුශල කර්මයේ විපාකයෙන්, මගේ ශරීරය දිව්‍යමය සුවඳ ඇත්තේ ය.

දූෂිත සිත් නැති ව, කෙළි කවටකමක් කිරීමේ අදහසින් සිනහ මුහුණින් යුතුවම නාන කොටෙහි ජලස්නානය කරන යහළුවකුගේ ගොඩ තිබුණු වස්ත්‍රයක් ගෙන සැඟවීමි (පසුව දුනිමි) ඒ අකුසල විපාකයෙන් නග්න වීමි.

යමෙක් ක්‍රීඩා සඳහා හෝ මෙවැනි පවක් කෙරේ ද ඔහුට මෙ බඳු වූ කර්ම විපාකයන් ලැබෙත් - යමෙක් වනාහි ක්‍රීඩා සිත් නැති ව සොර සිතින් මෙ වැනි අකුසල කර්මයක් කළහොත් විපාක කෙබඳු වන්නේ ද?

යමෙක් දුෂිත මනෝ විතර්ක ඇති ව, කයින් ද වචනයෙන් ද කිලුටු වූවෝ වෙත් ද? ඒ සිත් අකුශල කර්ම කෙරේ ද? ඔවුහු මරණින් මත්තෙහි නිසැකවම නිරයෙහි උපදී.

සමහරු සුගතිය ප්‍රාර්ථනා කරමින් දන්දීමෙහි ඇළුනේ යහපත් ආත්මභාව ඇත්තාහු මිය පරලොව යාමෙන් පසු ව නිසැකවම සුගතියට පැමිණෙති.

මේ ඒ දෙදෙනාගේ ප්‍රශ්න හා පිළිතුරු ගාථාවෝ වෙත්. එහි **සච්චපටිඤ්ඤා තවමෙසා හොතු** - යනු ඔබගේ මේ ප්‍රතිඥාව මට ඇත්තක්ම වේවා! **සුත්වාන ධම්මං ලභස්සු පසාදං** - යනු මා විසින් කියනු ලබන ධර්මය අසා මිහිරි ප්‍රසාදය ලබවු. **අඤ්ඤාතත්ථිකො** - යනු නො දන්නා දෙය දැනගනු කැමැත්තේ, **යථා පජානං** - යනු යම් සේ අනුන් විසින් ද දතයුතු **කිස්සෙතං කම්මස්ස අයං විපාකො** - යනු මේ සියල්ල කවර කර්මයක් හුගේ විපාක ද? **එතං** යනු නිපාතයක් පමණි. කවර කර්මයක්හුගේ යෙදීමක් ද පලදීමක් ද? කිස්සතෙ යනු කිසිවක් කියත්, **චික්ඛල්ල මග්ගෙ**- යනු මඩවලින් ගැවසුණු මාර්ගයෙහි, නරකං යනු මහ වළක් **එකාහං** යනු මම එකක් (එකගවහිසක්) **නරකස්මිං නික්ඛිපිං** - යනු යම්සේ මඩ නො පාගා යන්නේ ද? ඒ සඳහා ඒ මඩ වළෙහි බහාළීමි **තස්ස** -යනු සුදු පාට වූ ඒ ගොන් හිසෙහි - (මෙහි පාළි පෙළෙන් කියැවෙන්නේ සුදු ගවහිස් ගොඩක් දමා මඩවළ වැසූ ආකාරයකුයි. ගාථාවෙන් සහ අටුවා වෙන් කියවෙන්නේ එක ගවහිසක් මඩ වළට දැමූ

ආකාරයකු යි) **ධම්මෙඨිතානං** - යනු ධර්මයෙහි හැසිරෙන, සමවායෙහි හැසිරෙන - **මනෙතම්** - යනු කීර්තිය මනාකොට ප්‍රකාශ කරමි. **ඛිඩ්ඩත්ථිකො** - යනු සිනහව බලාපොරොත්තුවෙන් (සොරසිතකින් නො වේ) නොව **පදුට්ඨ චිත්තො** - යනු දූෂ්‍ය සිතකින්, සොර සිතකින්, ලෝභ සිතකින් තොර ව, යහළුවාගේ වස්ත්‍රය සැඟවූයෙමි, සොරසිතින් ගෙනයාමක් නො වේ. විනාශ කිරීමේ අදහසකින් ද නො වේ. යන අදහස යි. **අකිළමානො** - යනු ක්‍රීඩා අදහසකින් තොර ව, ලෝභාදියෙන් දූෂිත සිතින්, **කිං තස්ස කම්මස්ස විපාක මාහු** - යනු එවැනි වූ ප්‍රකෘති පාපකර්මයක කටුක වූ දුක් වූ, දුක් විපාක නුවණැත්තෝ කෙසේ කියන්නාහු ද? **දුට්ඨ සංකප්පමනා** - යනු කාම, ව්‍යාපාද සංකල්පාදී වසයෙන් දූෂිත වූ මනො විතර්ක මෙයින් මනෝ දුශ්චරිතය කීහ. **කායෙන වාචාය සං කිලිට්ඨා** - යනු ප්‍රාණඝාත ආදී වශයෙන් කය වචනයන්හි කිලුටු වීම. - **ආසමානා** - යනු ආශීර්වාද කරන ලබන, ප්‍රාර්ථනා කරනු ලබන,

මෙසේ ප්‍රේතයා විසින් කෙටියෙන් කර්ම ඵලය බෙදා දක්වනු ලැබූ කල්හි, රජු එය නො අදහමින් මේ ගාථාව කීයේ ය.

කුශලා කුශල කර්මයාගේ විපාකය, කවර ආකාරදැයි කියා ඔබගේ කීමෙන් මා අදහන්නෙම් ද? මම කවරක් දැක අදහන්නෙම් ද? කවර නම් නුවණැත්තෙක් මේ කාරණය මට විශ්වාස කරවන්නේ ද?

එහි - **තං කිං ජානෙය්‍යං අහං අවෙච්චා** - යනු යම් කිසි විධියකින් ඔබ විසින් යම් දූෂිත වූ දුෂ්ට වූ සංකල්පයකින් මිනිසකු කයින් වචනයෙන් පව්කම් ආදිය කෙරේ ද මතුයෙහි කල්‍යාණ වූ පාපයාගේ කර්ම විපාකය බෙදා දක්වන ලද්දේ ය. එය වෙනත් ආකාරයක හේතුවක් නිදසුනක් නැති ව මා විසින් කෙසේ අදහන්න ද? **කිං වාහං දිස්වා අභි සද්දහෙ** - යනු කෙබඳු හෝ වේවා ප්‍රත්‍යක්ෂ වූ නිදර්ශනයක් දැක පිළිගන්නෙම්. **කොවාපි මං සද්දහා පෙය්‍ය එතං** යනු කවර නම් දැනුමක් පුද්ගලයෙක්, නුවණැති පුද්ගලයෙක්, මේ කාරණය මට විශ්වාස කරවන්නේ ද? එය කියව යන අර්ථ යි. එය අසා ප්‍රේත තෙම තවත් කරුණකින් රජුට ප්‍රකාශ කරන්නේ මේ ගාථාවන් කීය.

මේ කුශලා කුශල කර්මයන්ගේ විපාකය මෙසේ ප්‍රත්‍යක්ෂ වසයෙන් දැකීමෙන් ද, ඇසීමෙන් ද අදහනු මැනැවි. කුසල අකුසල කියා දෙකක් නැත්තේ නම් සත්ත්වයන් සුගතියට හෝ දුගතියට යාම කෙසේ සිදු වන්නේ ද?

මේ මනුෂ්‍ය ලෝකයෙහි මිනිස්සු කුශලාකුශල කර්මයන් නො කරන්නේ නම් දෙව්ලොවට හෝ අපායට ගිය සත්ත්වයෝ කොහෙන් ද මිනිස්ලොව උපන්නන් අතර උසස් පහත් යයි මිනිස්සු නො වන්නාහ.

යම් හෙයකින් මිනිස් ලොව මිනිස්සු කුසල් හෝ අකුසල් කරන්නේ ද? එහෙයින් ම සත්ත්වයෝ දෙව්ලොව ට ද නරකයට ද යත් මිනිස් ලොවේ ද උස් පහත් මිනිස්සු සිටිත්.

දුක් සැප විඳීමට සුදුසු වූ අකුසල හා කුසල කර්මයන්ගේ විපාක දෙවැදෑරුම් වේ. දෙවියෝ සැප විඳිමින් ඉඳුරන් හසුරුවත්. අඥානයෝ කර්මය කර්ම ඵලය. නොපිළිගතාහු නොදක්නාහු දුකට පැමිණෙත්.

එහි දිසවා යනු ප්‍රත්‍යක්ෂ වශයෙන් දැකත්, **සුත්වාච** - යනු ධර්මය අසා ඒ අනුසාරයෙන් දැනගත්තේ අනුමාණ කරන්නේ **කල්‍යාණ පාපස්සා** - යනු කල්‍යාණ වූ ද, පාපී වූ ද, කුසලයාගේත් අකුශලයාගේත්, මේ සැප විපාකය මේ දුක් විපාකය යි ඇදහිය යුත්තාහ. **උභයෙ අසන්තෙ** - යනු යහපත් වූ ද අයහපත් වූ ද දෙවැදෑරුම් කර්මයන් අවිද්‍යමාන කල්හි **සියානු සත්තා සුගතා දුග්ගතා වා** - යනු මේ සත්ත්වයන් දෙව්ලොව යන්නේ අපායට යන්නේ හෝ ඒකාන්තයෙන් දුගතියට යන්නේ දිළිඳු වන්නේ පොහොසත් වන්නේ කවර හේතුන් නිසාදැ යි යන අර්ථය. .

දැන් යම් පරිද්දෙකින් කියන ලද්දේ ද එහි අර්ථය **නොචෙත්ථ කම්මා නීති යස්මාච කම්මානීති** මේ ගාථා දෙකින් අතිරේක අර්ථය ම විභාග වේ. එහි **හීනප්පණීතා** - යනු කුල රූප ආරෝග්‍ය, පරිවාර, ආදියේ හීන බව හෝ මහත් බව, **ද්වයජ්ජ කම්මානං විපාක මාහු** යනු දෙක දෙපරිදිය. අද මේ කර්මයන්ගේ සුචරිත දුශ්චරිතයන්ගේ දෙවැදෑරුම් විපාක දැන කියත් ඒ කෙසේ කියත් ද? **සුඛස්සච දුක්ඛස්සඛ වෙදනීයං** - යනු යහපත් හා අයහපත්

ලෙස භුක්ති විඳීමට යෙදේ. **තා දෙවතායො පරිචාරයන්ති** - යනු යමෙක් උසස් වශයෙන් සැප වේදනාවන් විඳිනු ලැබෙත්. ඔහු දෙව්ලොව දෙවියන් වී දිව්‍ය සැපයෙන් සන්තර්පනය වී පිරිවර සමග වෙසෙත්. **පච්චෙන්ති බාලා අවයතං අපස්සිනො** - යනු අඥානයෝ කර්මය ද කර්ම ඵලය ද දෙකම නොදක්නාහු නො අදහන්නාහු පාපයෙහි ගැලුණු ඔව්හු, දුක් වේදනාවන්ගේ විපාක භුක්ති විඳිමින් නිරයාදීන්හි කර්මානු රූපව දුකට පැමිණෙති.

මෙසේ කර්මඵල විශ්වාස කරන බව වනාහි කවර හෙයකින් මෙබඳු වූ දුකක් අනුභව කරන්නේ ද? කියා රජුගේ ප්‍රශ්නය අනුව යෙදීම සඳහා මේ ගාථාව කීහ.

තමන් විසින් පෙර කරන ලද කර්මයෝ මට නැත්තේ ද? යළි වස්ත්‍ර ද සෙනසුන් ද ආහාර පාන ද දී පින් අනුමෝදන් කරන්නේ ද එබදු කෙනෙක් මට නැත් ද? ඒ හේතුවෙන් මම නග්න වූයෙමි. දුක් පැවතුම් ඇත්තේ ද වෙමි.

එහි - **නමත්ථි කම්මානි සයං කතානි** - යනු යම් හෙයකින් වස්ත්‍ර ආදිය ලැබීමට හේතු වූ මා විසින් ම පෙර ආත්ම යේ කරන ලද සිත්තම් මට නැත්තේ ය. **දත්වාපි මෙ නත්ථි සො ආදිසෙය්‍යා** - යනු ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට දන් දී, අසවල් ප්‍රේතයාට මේ පින් අනුමෝදන් කරමියි අනුමෝදන් කරවන්නට ද කෙනෙක් මට නැත. **තෙනම්හි නග්ගො කයිරාච වුත්ති**. යනු මේ කාරණ දෙකින් මම දූන් නග්නව ද, සිටිමි. වස්ත්‍ර නැති ව සිටිමි. දුක් වූ ජීවිකා වෘත්තිය ඇත්තෙකු වීමි. යි කී ය. ඒ අසා රජතෙමේ ඔහුට වස්ත්‍ර ආදිය ලබා දීමට කැමැත්තෙන් මේ ගාථාව කීහ.

එම්බා ප්‍රේතය ! යම් කිසි හේතුවකින් කාරණයකින් ඔබ වස්ත්‍ර ආදිය ලබන්නෙහි ද? කිසි හේතුවක් වන්නේ ද? එවැන්නක් ඇත්නම් ඇදහිය යුතු වූ මට එය කියව, හේතු සහිත ව කියන වචනය මම අසමි.

එහි **යෙන** යනු යම් කාරණයකින් ඔබ වස්ත්‍ර ලබන්නේ ද එබඳු යම් කාරණා ඇත්නම් එය මට කියව යන අර්ථ යි. යදත්ථි යනු යමක් ඇත්තේ ය. ඉක්බිති ඒ ප්‍රේත තෙමේ ඒ කාරණය කියන්නේ,

ධ්‍යාන වඩන්නා වූ, සුසිල්වත් වූ, අර්හත් වූ, ක්ලේශයන්ගෙන් මිදුණු ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වූ, ප්‍රාතිමෝක්ෂ ශීලය ආරක්ෂා කරන්නා වූ, සිහිල් වූ, සම්‍යක් දෘෂ්ටිය වැළඳ ගන්නා වූ,

මෘදු වූ දාන ශීලි වූ, යහපත් වචන ඇති, යහපත් මුහුණු ඇති, මනාව දත් ආගම ධර්මය ඇති, පමණ දන කතාකරන්නා වූ, පින් කෙත් වූ, මෛත්‍රී පැවතුම් ඇති, මිථ්‍යා විතර්කයන්ගෙන් වෙන් වූ, නිදුක් වූ ආශා නැති, භවයෙන් මිදුණු, පහකරන ලද රාගාදී හුල් ඇති, අහංකාර රහිත වූ අවංක වූ, සතරවිධ උපධි රහිත වූ, ක්ෂය කරන ලද සියලු ප්‍රපංචයන් ඇති, ත්‍රි විද්‍යාවන්ට පැමිණියා වූ, දීප්තිමත් වූ,

ප්‍රකට නො වූ, දුටුවද සුවසේ නො දත හැකි, "කප්පින" නම් වූ, එක් භික්ෂු නමක් ඇත්තේ ය. වජ්ජීන් අතර උන්වහන්සේට මුනි යයි ප්‍රකාශ කරත්. යක්ෂයෝ හා භූතයෝ ද, ගුණවත් වූ සුන්දර වූ ශීලවන්ත වූ ඒ භික්ෂුව දනිති.

උන් වහන්සේට එක් වස්ත්‍ර යුගලක් හෝ වස්ත්‍ර යුගල දෙකක් මා උදෙසා පූජාකොට, ඒ වස්ත්‍ර පිළිගන්නා ලද්දේ ද එසේනම් ඒ පින්මට අනුමෝදන් කරනු මැනවි, (ඉක්බිති ව) හැඳ පෙර වූ වස්ත්‍ර ඇති මා ඉන්පසු ඔබට දැකිය හැක්කේ ය.

එහි **කප්පිනකො නාමා** යනු ජටිලයන් දහසක් අතුරෙන් ආයුෂ්මත් උපාලි ස්ථවිරයන්ගේ උපාධ්‍යායන් සඳහා කිය යි. **ඉධා** යනු මේ විසාලා නුවර සමීපයේ, **ඣායී,** යනු අග්‍ර ඵල ධ්‍යාන වඩන්නා වූ, **සීතිභූතො** යනු සියලු ක්ලේශයන් විධ්වංසනය කිරීමෙන් සිහිල් බවට පැමිණි. **උත්තම දිට්ඨිප්පත්තො** උතුම් අග්‍ර ඵල වූ සම්මා දිට්ඨියට පැමිණි, **සඛිලො** - යනු මෘදු වූ, **සුවචො** යනු යහපත් වචන කථා කරන්නා වූ, **ස්වාගමො** - යනු මනාව දත් ආගම ධර්ම ඇති, **සුප්පටිමුත්තකො ච** යනු යහපත් කථාවන් පමණ දන කරන්නා වූ **අරණ විහාරී,** යනු මෛත්‍රී සහගත සිතින් දවසරින, **සන්තො** යනු ක්ලේෂ යන්ගෙන් වෙන් වූ, ක්ලේෂ ප්‍රහාණය කළ, **විධූමො** යනු පහකළ මිථ්‍යා විතර්ක දුම් ඇති **අනීඝො** - යනු නිදුක් වූ, **නිරාසො** යනු ආශාවන් ගෙන් දුරු වූ, **මුත්තො** - යනු සියලු භවයන්ගෙන් මිදුණේ, **විසල්ලො** යනු රාගාදී හුල් පහකරන ලද්දේ, **අමමො** - යනු අහඞ්කාර, ආඩම්බර විරහිත වූ,

**අවඞ්කා** - යනු කය වචනය සිත ආදීන්හි අකුටිල වූ, **නිරූපධී** යනු ක්ලේශ අභිසංස්කාර ආදී උපධි රහිත වූ, **සබ්බපපඤ්ච ඛීණො** - යනු ක්ෂය කරන ලද තණ්හාදී ප්‍රමාදයන් ඇති, **ජුතිමා** - යනු නිරුත්තර ඥාණ රශ්මියෙන් දීප්තිමත් වූ, **අප්පඤ්ඤාතො** - යනු මුලුමනින්ම අල්පේච්ඡ වූ, තම නැණ ගුණ උගත්කම් ප්‍රකට නො කරන්නා වූ, **නසුජානො** - යනු ගැඹුරු බවින් දක්කේ නමුදු මෙවන් ශීල සමාධි ප්‍රඥා ගුණ ඇත්තෙකැයි සිතා ගත නොහැකි. **ජානන්ති තං යක්ඛභූතා අනෙජා** යනු යක්ෂ භූත ආදී අමනුෂ්‍යයන් විසින් ද තෘෂ්ණා රහිත අර්හත් උතුමෙකැයි දනිත්, **කල්‍යාණ ධම්මං** යනු සොඳුරු සිල් ගුණයුත්, **තස්ස** යනු ඒ කප්පින මහා ස්ථවිරයන්ට **එක යුගං** යනු වස්ත්‍ර යුගල එකක්, **දුවෙ වා** යනු වස්ත්‍ර යුගල දෙකක් හෝ, **මමුද්දිසිත්වාන**, යනු මා උදෙසා, **පටිග්ගහිතානිච තානි අස්සු** - යනු ඒ වස්ත්‍ර යුගලයෝ උන් වහන්සේ විසින් පිළිගන්නා ලද්දේ නම්, **සන්නද්ධ දුස්සං** යනු වස්ත්‍ර ලැබී හැඳ පොරවා ගෙන සැරසුණු යන අර්ථ යි.

ඉක්බිති ව රජතෙම තෙරුන් වසන තැන විචාරමින් මේ ගාථාව කී ය.

කවර පෙදෙසක වසන්නා වූ ඒ ශ්‍රමණයන් වහන්දෑ වෙත අපි දූන් ගොස් දක්නෙමු ද? ඒ කවරෙක් දැයි දැක අපගේ සැකය ද විචිකිච්ඡාව ද, මිථ්‍යා දෘෂ්ටි නමැති හුල් ද පහකරන්නේ ද?

එහි **කස්මිං පදෙසෙ** - යනු කිසියම් ප්‍රදේශයෙක්හි, **සමජ්ජා** - යනු සො + අජ්ජ, හෙතෙම අද, "ම" කාරය පද සන්ධිය සඳහා ය. එවිට ප්‍රේත තෙමේ.

කපිනච්චානා ප්‍රදේශයේ හුන්නා වූ සත්‍ය නාම ඇති, ආශ්චර්ය වූ තමාගේ කෘත්‍යයෙහි ම නියැලෙන්නා වූ අප්‍රමාදී වූ ඒ කප්පින භික්ෂූන් වහන්සේ බොහෝ දෙවියන් විසින් පිරිවරන ලදු ව, ධර්ම කථා වදාරමින් වැඩ සිටියහ.

එහි **කපිනච්චනායං** - යනු වඳුරන් නටන බැවින් කපි නච්චන යන ව්‍යවහාරය ලත් පෙදෙස, **සච්චනාමො** - යනු ධ්‍යාන වඩන්නා වූ සීලවන්ත වූ අර්හත්වයට පත් වූ, ආදී ගුණ නාමයෙන්හි ස්වාභාවික නාම ය යි. වෙනස් නො වන නාමය යි. මෙසේ ප්‍රේතයා කී කල්හි රජු එකෙණෙහි ම තෙරුන් සමීපයට යනු කැමැත්තේ,

මම එසේ කරන්නෙමි. දූන් ශ්‍රමණයන් වෙත ගොස් වස්ත්‍ර යුග්මයක් පූජා කරන්නෙමි. ඒ වස්ත්‍ර පිළිගන්නා ලද්දාහු, වස්ත්‍රයෙන් සැරසුණා වූ ඔබව ද දකිමු.

එහි කස්සාම - යනු කරන්නෙමි. ඉක්බිති ප්‍රේතයා, තෙරුන් වහන්සේ දෙවියන්ට ධර්මය දේශනා කරන කාලය බැවින් මේ වේලාව ගමනට නුසුදුසු බව දක්වන්නේ.

පින්වත් ලිච්ඡවී රජුනි ! නො කල්හි පැවිද්දෙකු වෙත නො එළඹේවායි ආයාචනා කරමි. එය රජවරුන්ගේ ධර්මය නො වේ. එබැවින් සුදුසු කල්හී එහි ගොස් හුදෙකලාව උන්නා වූ ස්ථවිරයන් මුණගැසෙනු මැනව,

එහි සාධු යනු අයැදීමේ නිපාත යි. වොලිච්ඡවී නෙ ස ධම්මො - අකාලයෙහි යමෙකු වෙත එළඹීම ලිච්ඡවී රජුන් වන තොපගේ රාජ ධර්මය නො වේ. තත්‍ථෙවා - එම ස්ථාන යෙහි ම.

මෙසේ ප්‍රේතයා කී කල්හි රජු මැනවැයි පිළිගෙන තමාගේ නිවෙස්න වෙතම ගොස්, නැවත සුදුසු වේලාවෙහි වස්ත්‍රයුගල අටක් ගෙන්වා ගෙන තෙරුන් වෙත එළඹ, එකත්පස්ව සිට පිළිසඳර කථා කොට, ස්වාමීනි ! මගේ මේ වස්ත්‍රයුගල අට පිළිගනු මැනවැයි ඉල්ලා සිටියේ ය. එය අසා ස්ථවිර තෙමේ කථාව ඉපිදවීම පිණිස මහරජතුමනි ! පෙර ඔබ කිසිදු දෙයක් නො දෙන සුළු ශ්‍රමණ බ්‍රහ්මණයන් වෙහෙස කරවන ස්වභාව ඇත්තෙකි. කෙසේ නම් මේ ප්‍රණීත වස්ත්‍ර දෙනුකැමැත්තේ වී ද? කී ය. ඒ අසා රජු ඒ කාරණය කියමින් ප්‍රේතයා සමග එකතු වීම ප්‍රේතයා හා තමන් අතර ඇත්තා වූ කථා සල්ලාප සියල්ල තෙරුන්ට ප්‍රකාශ කොට වස්ත්‍ර පූජාකර ප්‍රේතයාට අනුමෝදන් කළේ ය. ඒ ප්‍රේතයා විසින් දිව්‍ය වස්ත්‍ර දරමින් ඉතා අලංකාර ව සැරසී අශ්වයා පිට නැගී තෙරුන් වහන්සේගේ ද රජුගේ ද ඉදිරියෙහි පහළ විය. ඒ දුටු රජු සතුටු සිත් ඇති ව ප්‍රමුදිතවැ ප්‍රීති සොමනසින් යුතු ව, ඒකාන්තයෙන්ම ප්‍රත්‍යක්ෂ වශයෙන්ම මා විසින් කර්ම විපාකය දක්නා ලදී. නැවත මම පාපකර්ම නො කරමි. පින්කම්ම කරමි යි කියා ඒ ප්‍රේතයා සාක්ෂි කොට තැබී ය. ඒ ප්‍රේතයා ද ඉදින් ලිච්ඡවි රජතුමනි ! මෙතැන් පටන් අධර්මය අත්හැර ධර්මයෙහි හැසිරෙවයි මෙසේ කියා, එසේ ධර්මයේ හැසිරුනේ නම් මම නුඹට සාක්ෂි

කරන්නෙමි. නුඹ සමීපයට මම ද එන්නෙමි. හුල සිටුවන ලද පුරුෂ යා ද හුලෙන් ඉවත් කර වන්නැයි කී ය. එසේ ඇති කල්හි ඔහු ජීවිතය ලබා ධර්මයෙහි හැසිරීමෙන් දුකින් මිදෙන්නේ යයි ද කීය. කලින් කළ තෙරුන් වහන්සේ වෙත ද පැමිණ ධර්මය අසමින් පින් කරව යි රජුට කියා ප්‍රේතයා ගියේ ය.

ඉක්බිති රජු තෙරුන් වැඳ නගරයට පිවිස වහ වහා ලිච්ඡවී රජ පිරිස කැඳවා ඔවුන්ගේ අනුමැතිය ලබා, හුල පිට උන් පුරුෂයා උලෙන් මුදවා මොහු සුවපත් කරව් යයි වෙදුන්ට අණ කළේ ය. ඉන්පසු තෙරුන් වෙත පැමිණ ස්වාමීනි ! නිරයගාමී අකුසල් කර්ම කොට සිටින්නෙකුට නිරයෙන් මිදීමට පුළුවන් වන්නේද යි විචාළේ ය. මහරජ උදාර වූ පින්කම් කළේ නම් නිරයෙන් මිදීම වන්නේ ය යි කියා තෙරුන් වහන්සේ රජු සරණයෙහි ද පන්සිල්හි ද පිහිටුවී ය. තෙරුන්ගේ අවවාදයෙහි පිහිටි හෙතෙම පසු ව සෝවාන් විය. උල අවුණා සිටි පුරුෂයා ද නිරෝගීවී ගිහිගෙයි කලකිරී භික්ෂූන් වෙත පැමිණ පැවිදිවී කෙටිකලකින් රහත් බවට පැමිණියේ ය. ඒ කාරණා දක්වමින් සඞ්ගීති කාරක යෝ මේ ගාථාවෝ කීහු.

ඒ ලිච්ඡවී රජු එසේ යයි කියා දාස සමූහයා විසින් පිරිවරණ ලදු ව එහි ගියේ ය. ඒ නුවරට එළඹ සිය නිවසෙහි වාසයට පැමිණියේ ය.

ලිච්ඡවී රජු සුදුසු කාලයෙහි රාජකාරී කටයුතු කොට නහා කා බී සුදුසු කාලය එළඹි කල්හි පෙට්ටියෙන් වස්ත්‍ර යුගල අටක් ගෙන්වී ය.

ඒ රජු ඒ පෙදෙසට එළඹ, සන්සුන් සිත් ඇති, පිණ්ඩපාතයෙන් පෙරළා වැඩම වූ, සිහිල් සෙවණ ඇති රුක්මුල නැවතී වැඩ හුන්නා වූ ඒ ශ්‍රමණයන් වහන්සේ දුටුයේ ය.

උන්වහන්සේ වෙත පැමිණි රජු නිරෝගී බව ද, පහසු විහරණය ද විචාළේ ය. ස්වාමීනි මම විශාලා මහනුවර අම්බසක්ඛර නම් ලිච්ඡවී රජු වෙමි. යි (තමන් හැඳින්වීය)

ස්වාමීනි ! මගේ මේ යහපත් වූ වස්ත්‍ර යුග්ම අට ඔබ වහන්සේට පූජා කරමි. එය පිළිගනු මැනැවි යම්සේ මම සතුටු සිතින් යුක්තවම මේ කාරණය සඳහාම මෙහි පැමිණියෙමි.

ශ්‍රමණයෝ ද බ්‍රාහ්මණයෝ ද ඔබගේ රජගෙය දුරින්ම දුරු කරති. ඔබගේ ගේ ඉදිරියේ දී භික්ෂූන්ගේ පාත්‍රා පොඩි කරත් සඟල සිවුරු ඉරා දමත්.

නැවත පා නමැති කෙටේරි වලින් ශ්‍රමණයන්ගේ හිස් යටිකුරු ව හෙළති. පැවිදි වූ ශ්‍රමණයෝ ඔබ විසින් මේ අන්දමින් වෙහෙසට පත් කරනු ලැබෙති.

ඔබ තණ අගින් තෙල් බිඳක් වත් (දන්) නුදුන්නෙහි ය. මං මුළා වුවකු හට පාර තොට නො කීවෙහි ය. අන්ධයාගේ සැරයටිය උදුරාගත්තේ ය. මෙබඳු වූ තද මසුරු වූ නො හික්මුණු ඔබ කුමක් දැක කවර ගුණයක් නිසා අප හා බෙදා දෙන ස්වභාවය ඇති වූයේ ද?

ස්වාමීනි ! නුඹ වහන්සේ යමක් කියනසේක් ද? ඒ සියල්ල මම පිළිගනිමි. ක්‍රීඩා සිත් ඇතිව, දූෂිත සිත් නැතිව ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට මම වෙහෙස කළෙමි. ස්වාමීනි ඒවා මට පව්ම වන බව දනිමි.

ක්‍රීඩා සිතින් පව්කම් රැස් කළ ප්‍රේතයෙක් (මම දුටුවෙමි) අසම්පූර්ණ ආහාර පාන ඇති ව, නාඹර තරුණ වියේ වූ ඔහු නග්න භාවයම හිමි වීමෙන් දුක් විඳියි. ඊට වඩා දුකක් මොහුට ඇත්තේ ද?

ස්වාමීනි ! ඒ ප්‍රේතයා දැක සංවේගයට පත්වීමි. ඒ හේතුවෙන් මම ඔබ වහන්සේට වස්ත්‍ර දානය දෙමි. මේ වස්ත්‍ර යුග්ම අට පිළිගනු මැනවි. මේ පින් ඒ ප්‍රේතයා අනුමෝදන් වේවා !

දන් දීම ඒකාන්තයෙන් නොයෙක් ප්‍රකාරයෙන් ප්‍රශංසා කරන ලදී. දෙන්නා වූ නුඹට ක්ෂය නො වන ස්වභාවය ඇති වේවා ! නුඹ ගේ වස්ත්‍ර යුගල අට පිළිගනිමි. ප්‍රේතයාහට මේ දානමය පුණ්‍යය පැමිණේවා.

ඒ ලිච්ඡවී රජ තෙම ඉන්පසුව මුව සෝදාගෙන තෙරුණුවන්ට වස්ත්‍ර යුගල අට පුදා, ඒ වස්ත්‍රයෝ පිළිගන්නා ලද්දෝ වෙත්වා වස්ත්‍රයන්ගෙන් සැරසුණු ප්‍රේතයා ද දකිත්වා.

ආජානීය අශ්වයා පිට නැගී, සඳුන් සුණු ගල්වන ලද උතුම් රූ ඇතිව මනාකොට රෙදි හැද පොරවා සැරසුණු ඒ ප්‍රේතයා මහත් යක්ෂ සෘද්ධියට පැමිණි පිරිවර සහිතව පැමිණ ඔවුන් දුටුවේ ය.

ඒ ලිච්ඡවී රජතෙම ඔහු දැක සතුටු සිත් ඇති ව, ඔද වැඩි සිත් ඇති ව, තුටු පහටු සිත් ඇතිව, ඇතිව, තුටු පහටු සිත් ඇතිව, අතිශය භාග්‍ය සම්පන්න ශරීර ඇති ව (පැමිණි ඔහු නිසා) සාංදෘෂ්ටික වූ කර්මය ද, කර්ම විපාකය ද සියැසින් ප්‍රත්‍යක්ෂ වශයෙන් ම දැක.

ඔහු වෙත පැමිණ මෙය කීයේ ය. ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට දන් දෙන්නෙමි. නොදිය හැකි කිසිම වස්තුවක් මට නැත. යක්ෂය ඔබ මට බොහෝ උපකාර වූවෙහි ය.

ලිච්ඡවි රජුනි ! නුඹ මට ඒක දේසයක් වූ වස්ත්‍ර දානය දුන්නේ ය. මේ දානය හිස් නොවේමැ යි අමනුෂ්‍ය වූ මම මනුෂ්‍ය වූ තොප සමග සාක්ෂි කරන්නෙමි.

යක්ෂය ! ඔබ මට යහපත් ගමන් ඇත්තෙක්, මග පෙන්වන්නෙක් විය. නෑයෙක් ද පිහිටක් ද මිත්‍රයෙක් ද වෙයි. නැවත දෙවියෙක් වෙයි. ඔබ නැවත නැවතත් දැකීමට මම කැමැත්තෙමි. එය එසේ ම වේවා යි යාඥා කරමි.

ඉදින් ඔබ අශ්‍රද්ධාවත් වන්නේ නම්, තද මසුරු කෙනෙක් වන්නේ නම්, මිථ්‍යා ප්‍රතිපත්ති සිත් ඇති වන්නේ නම්, ඒ හේතුවෙන් ම මා දකින්නට නො ලබන් නෙහිය. නුඹ දුටුව ද කථා නො කරන්නෙමි.

ඉදින් ඔබ කුශල ධර්ම කෙරෙහි ගෞරව ඇත්තේ නම්, දන් දීමෙහි ඇලුණේ වී නම්, සංග්‍රහ කිරීමෙහි කැමැත්ත දක්වන්නේ නම්, ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට පැන් හලක් මෙන් වන්නේ නම්, එසේ ඇති කල්හි මා දක්නට ලබන්නෙහි ය.

නුඹ දැක ද කථා කරන්නෙමි. ඔබට යහපතක් ම වේවා ! යමෙකු නිමිති කොට මම සාක්ෂි කළෙමි ද හුල සිටි පුරුෂයා නිසා ය යි සිතමි. මේ පුරුෂයා වහාම හුලෙන් මුදවනු මැනවි.

අපි එකිනෙකා සාක්ෂි කළෙමු ද? හුල සිටි මේ තැනැත්තා එයින් මිදුනේ නම් ඔහු මැනැවින් කුසල ධර්මයන් හි හැසිරෙමින් අපාදුකින් මිදෙන්නේ ය.

අන් තැනෙක වින්ද යුතු වූ අකුශල කර්මයක් වන්නේ ද? (ඒ සඳහා) සුදුසු කාලයෙහි කප්පින තෙරණුවන් වෙත එළඹ උන්වහන්සේ හා සාකච්ඡා කොට උන්වහන්සේගෙන් විචාරව !

හෙතෙම ඔබට අර්ථානර්ථ කියන්නේ ය. ඒ භික්ෂුව වෙත ම එළඹ දූෂිත සිතින් තොරව විචාරව ! බහුශ්‍රැත වූ හෙතෙම ඔබ විසින් අසන ලද්දා වූ ද නො අසන ලද්දාවූ ද සියලු කුශල ධර්මයෝ දත් පරිදි කියන්නේ ය. සුගති ගාමී වූ ධර්මය අවබෝධ කර දෙන්නේ ය.

ඒ රජු එහි දී අමනුෂ්‍යයා සමග රහසින් කථාකොට ඔහු සාක්ෂි කොට ලිච්ඡවීන්ගේ සමීපයට ගියේ ය. එහි රැස් වූ පිරිසට මෙසේ කියේ ය.

පින්වතුනි ! මගේ වචනය අසත්වා ! වරයක් ඉල්ලන්නෙමි. කැමති වන අර්ථය ලබන්නෙමි. රෞද්‍ර ක්‍රියා නිසා කරන ලද ශරීර දඬුවම් ඇති, උල තැබූ පුරුෂයා, ඇලුණු ස්වභාව ඇත්තේ ය. යම් දිනක හුල හිඳුවන ලද්දේ ද මේ තාක් විසි රැයක් පමණ, ජීවත් ද නො වේ. මළේ ද නැත.

දැන් මම ඔහු ඒ දඬුවමින් මුදවන්නෙමි. සමූහයා කැමති පරිද්දෙන් එය අනු දනීවා. මොහු ද, රාජාඥා කළ අනික් තැනැත්තා ද වහාම මුදවනු මැනැවි. එසේ කරන්නා වූ ඔබට කවරෙක් නම් (එපා) කියන්නේ ද? රුචි පරිද්දෙන් සමූහයා අනුදනියි.

ඒ රජු හුල සිටුවා ඇති තැනට ගොස්, හුල සිටි පුරුෂයා වහාම මුදවා යහළුව බිය නො වෙව! යයි ඔහුට කීයේ ය. වෙදුන් ද ඒ තැනට කැඳවී ය.

කරුණු දැනගනු කැමති වූ ලිච්ඡවී රජු සුදුසු කාලයෙහි ඔහු හා සමග කප්පිණ තෙරුන් වෙත එළඹ දාන සංවිභාග කොට ඉදිරියෙහි ඉද උන්වහන්සේගෙන් මෙසේ විචාළේ ය.

රෞද්‍ර වූ ක්‍රියා නිසා හුල හිඳුවන ලද පුරුෂයා (රජුකෙරෙහි) ඇලුණු ස්වභාව ඇත්තේ ය. යම් දින ක හුල හිඳුවන ලද්දේ ද? මේ වන විට විසි රැයක් පමණ ඉක්ම ගියේ ය. ජීවත් ද නො වෙයි. මළේ ද නැත.

ස්වාමීනි ! මා විසින් එහි ගොස් ඒ පුරුෂයා මුදවන ලදී. මේ යක්ෂයාගේ වචනය් ම යි. යම් හේතුවකින් හෙතෙම නරකයට නො යන්නේ ද කිසියම් වෙන යමක් සිදු වන්නේ ද?

ස්වාමීනි ! හේතු කරුණක් ඇත්නම් කියනු මැනැවි. ඇදහිය යුතු හේතු යුක්ත වචනය අසමි. මෙහි දී ඒ කර්මයන්ගේ විපාක නොවිඳ වැනසීමක් හෝ ගෙවී යාමක් ඇත්තේ ද?

ඉදින් ඒ පුරුෂයා කුසල කර්මයන්හි මනාව හැසිරෙන්නේ නම් සකස් කොට දිවා රෑ දෙක්හි අප්‍රමාදී ව (පින්) කටයුතු කරන්නේ නම් හෙතෙම නිරා දුකින් මිදෙන්නේ ය. අකුශල කර්මය අන් තැනකදී විපාක දෙන්නේ ය.

ස්වාමීනි ! ඒ පුරුෂයා පිළිබඳ අර්ථය දැනගන්නා ලදිමි. දැන් මට ද අනුකම්පා කළ මැනව. මහා ප්‍රාඥයන් වහන්ස, යම්සේ මා නිරයට නොයන්නෙමි ද? ඒ සඳහා මට අනුශාසනා කරනු මැනවි. අවවාද කරනු මැනැවි.

පහන් සිත් ඇති ව අද ම බුදුන් දහම්, සඟුන් සරණයව ! එසේ ම ශික්ෂා පද පස සමාදන් ව කඩ නො කොට ආරක්ෂා කරව් !

වහා ම ප්‍රාණ ඝාතයෙන් වෙන්වෙව ! අනුන් විසින් නුදුන් දෙයක් දුරු කරව ! (නො ගනුව) මත් පැන් බොන්නෙක් නො වව බොරු නො කියව! ස්වකීය භාර්යාවගෙන් ම සතුටු වෙව ! නිවැරදි වූ සැප විපාක දෙන්නා වූ මේ ආර්ය වූ උත්තම අංග අටෙන් යුක්ත වූ උපොශතය රකුව !

සිවුරු ද. පිණ්ඩපාතය ද ගිලාන ප්‍රත්‍යය ද සේනාසන ද, වස්ත්‍ර ද සෙනසුන් ද අහාර ද, පාන වර්ග ද, කෑ යුතු දේ ද (යනාදියෙන්)

විශේෂයෙන් ප්‍රසන්න වූ සිතින්, ඍජු ව පිළිපන්නවුන් විෂයෙහි, දෙව, සිල්වත් වූ වීතරාගී වූ බහුශ්‍රැත වූ භික්ෂූන් සන්තර්පනය කරව, එය සදාකල්හි පින් වැඩෙනු පිණිස හේතු වේ.

එසේම මනාව කුශල කර්මයන් කරමින්, සකස්ව රෑ දවාල්හි අප්‍රමාදීව කටයුතු කරන්නා වූ තොප අපාය දුකින් මිදේ. අකුශල කර්ම අන්තැනක දී විපාක දේ.

අදම ප්‍රසන්න සිතින් යුතුව බුදුන්, දහම්. සඟුන් සරණ යමි. එසේම ශික්ෂා පද පහ ද සමාදන්ව කඩ නොකර ආරක්ෂා කරන්නෙමි.

වහාම ප්‍රාණඝාතයෙන් වෙන්වෙමි. නුදුන් දෙය ගැනීමෙන් දුරුවෙමි. මත්පැන් නො බොමි. බොරු නො කියමි. සිය භාර්යාවගෙන්ම සතුටු වෙමි. මේ පන්සිල් රකිමින් අඞ්ග අටකින් යුත් ශීලයන් ද සමාදන්ව මනාකොට පැහැදුනු සිතින් කුශලයන්හි නිරත වෙමි.

සිවුරු ද පිණ්ඩපාතය ද, ප්‍රත්‍යයන් ද, සයනාසන ද, ආහාර පාන වර්ග ද කෑ යුතු දේ ද, වස්ත්‍ර ද, සෙනසුන් ද,

බුද්ධ ශාසනයෙහි ඇලුණා වූ. සිල්වත් වූ, බහුශ්‍රැත වූ, රහත් වූ, භික්ෂූන්ට පූජා කරමි. සිව්පසය දීම කඩ නො කරමි.

මේ අන්දමින් අම්බසක්ඛර ලිච්ඡවී රජතෙම විශාලා මහනුවර සැදූහැවත් බුදු සිත් ඇති, උපාසකයෙකු වී ජනයාට උපකාරී වූයේ භික්ෂු සංඝයාට ද සකස් කොට උපස්ථාන කළේ ය.

හුල ඉන්ද වූ පුරුෂයා නිරෝගී ව සුවපත් වී, තනිව හැසිරෙන්නේ උතුම් කප්පින නම් වූ ස්ථවිරයන් වෙත අවුත් පැවිදි වූයේ ය. දෙදෙනම සුදුසු ලෙස ශ්‍රාමණ්‍ය ඵලයන්ට පැමිණියහ.

කරුණු දක්නා වූ සත්පුරුෂයන්ට සත්පුරුෂයන්ගේ ආශ්‍රය මෙබඳු වූ මහත් ප්‍රතිඵල ඇති කරයි. මහත් ආනිසංස ගෙන දෙයි. හුල සිටි පුරුෂයා රහත් ඵලයට ද, අම්බසක්ඛර රජු සෝවාන් ඵලයට ද පැමිණියහ.

මෙහි **වාසුප ගඤ්ජීත්වා** යනු නිවාසයට පැමිණියේ ය, **ගිහි කිච්චා** යනු ගෙදර දොර අවශ්‍ය වූ දරුපවුල් ආරක්ෂා කිරීමේ කටයුතු **විචෙයා** - යනු සුන්දර වූ වස්ත්‍රයන් ගෙන් සැරසී **පටික්කමන්ති.** යනු පිණ්ඩපාතය අවසන් කොට පෙරළා පැමිණියේ, එහෙයින් කී ය. **ගොචරතො නිවත්තනත,** **අවොච** යනු විශාලා මහනුවර ලිච්ඡවී රජවරු එසේය ස්වාමීනි ආදිය කී ය. **විපාටයන්ති** - යනු ගලවාදමත් **පාද කුඨාරිකාහි,** යනු පා නමැති කෙටේරි වලිනි, **පාතයන්ති,** යනු පහතට හෙලන ලදී. **තිණෙනාපි** යනු තණ අගින් වත්, **මූළ්හ සස මග්ගමපි නපාවදාසි** - යනු මං මුළා වූ මිනිසකුට මාර්ගයවත් නො පෙන්වී ය. නො කීයේ ය. මෙසේ සිටි පුද්ගලයෙක් කෙසේ නම් මේ අන්දමට වෙනස් වූයේ ද? ක්‍රීඩා ශීලි වූ රජු. **සයමාදියා සි** යනු අන්‍යයාගේ අතින් සැරයටිය තමන් විසින්ම සිඳගනී. **සංවිභාගං කරොසි** තමන් විසින් පරිභෝග කරන ලද වස්ත්‍රවලින් එකක් බෙදන්නේ ය. කොටස් කරන්නෙහි ය. **පවෙචමි භනෙත යං ත්වං වදෙසි** - යනු ස්වාමිනි ඔබ බින්දේය ආදී යමක් කියයි ද එය මම දනිමි. මේ සියල්ල මා විසින් කරන ලද්දේ යයි දකිමි. **එතමපි** - යනු මේ සියල්ල ක්‍රීඩා අදහසින් කරන ලදී. **ඛිඩ්ඩා** - ක්‍රිඩා පිණිස, **පසවිත්වා** - යනු රැස්කොට, **වෙදෙති** යනු භුක්ති විදී, **අසමත්තභොගී** - යනු සම්පූර්ණ නො වූ භෝග ඇති, එයම අසම්පූර්ණ වූ භෝග ඇතිවම දක්වීමට, **දහරො යුවා** ආදිය කියන ලදී. **නග්ග නියසසා** - යනු නග්න භාවය, නිර්වස්ත්‍ර බව, **කිංසු තතො දුක්ඛ තරසස හොති,** යනු එයින් නිර්වස්ත්‍රව භාවයෙන් දුකට පත් අසවල් නම් වූ අශ්ව ප්‍රේතයා **යක්ඛසසිමා ගච්ඡනතු දක්ඛිණායො** - යනු මේ මා විසින් දෙනු ලබන වස්ත්‍ර දානයේ පින් ප්‍රේත තෙමේ අනුමෝදන් වේවා! **බහුධා පසත්ථං** යනු නොයෙක් ආකාරයෙන් බුද්ධාදීන් වර්ණනා කිරීම යි. **අක්ඛය ධම්ම මත්‍ථු** යනු ක්ෂය නො වන ධර්මය වේවා **ආචමයිත්වා** - යනු අත් පා සේදීමට පෙර මුව සෝදා, **චන්දන සාරලිත්තං** - යනු සාරවත් සඳුන් සුණු අතුළ, **උළාර වණ්ණ** යනු දකුම් කළු රූපය, **පරිවාරිතං** යනු අනුව පවත්නා වූ පිරිවර ජනයා පිරිවරා, **යක්ඛමහිද්ධි පත්තං** - යනු මහත් වූ යක්ෂ සෘද්ධිය දිව්‍ය සෘද්ධිය පතුරුවා සිට, **තමෙනමවොච,** යනු මෙසේ කී ය. **එකෙදෙසං අදාසි** - යනු සිව්පසයෙන්

එක් කොටසක් වූ වස්ත්‍ර දානය සඳහා කියන ලදී. **සක්කිං** යනු හැකි බව, **මමාසී**, යනු මට කී ය, **දෙවතාසී** යනු මගේ දෙවියා ඔබ වන්නේ ය යන යෙදුම යි. **විප්පටිපන්න චි තෙතා** - යනු මිථ්‍යා දෘෂ්ටිය වැළඳ ගත් සිතින් යුත්, ධාර්මික ප්‍රතිපදාව හැර අධාර්මික ප්‍රතිපදාවට පිළිපන් යන අර්ථ යි. **යතො නිදානං** යනු යම් නිමිත්තක් හේතුවක් යමෙකු සමීපයට පැමිණීමට හේතු කාරණ - **සංවිභජිත්වා** - යනු දාන කටයුතු සංවිධානය කොට බෙදා වෙන් කොට, **සයමමුඛෙනුපනිසජ්ජ පුච්ඡි** යනු අනෙක් පුරුෂයන් නොයවා ඉදිරියේම ඉඳගෙන විචාළේ ය. **සන්නිසිතං** , යනු රැස්වීම් වශයෙන් සිටියාහු **ලභිස්සාමි අත්ථං** යනු කැමති වූ දේ ලබන්නෙමි **පණිහිත දණ්ඩා**, තබන ලද ශරීර දඬුවම, **අනුසත්තරූපො** - යනු රජු කෙරෙහි ඇලුණු ස්වභාවය, **වීසති රත්ති මත්තා** - යනු රාත්‍රි විස්සක් පමණ ඉක්ම ගියේ ය, යන අර්ථ යි. **තාහං** යනු ඒ මම. **යථාමතී**, යනු මගේ කැමැත්ත පරිදි, **එතං ච අඤ්ඤංචා** - යනු මේ හුල ඉන්දවන ලද තැනැත්තා එහි රජ අණ පරිදි (අරුණුවන් මැටි ගෙන එනු සඳහා) යවන ලද තැනැත්තා **ලහු පමුඤ්චා** - යනු වහා මුදා හරව, **කොතං වදෙථා** යනු ධාර්මික කර්මය කරන්නා වූ මේ වජ්ජි රටෙහි කවරෙක් නම් මෙය එපා කියද්ද ? මෙය නැවැත්වීමට කිසිවක් නොවේ යන අර්ථ යි. **තිකිච්ඡකාන ඤ්චා** - යනු වෛද්‍යවරුන් **යක්ඛස්ස වචො** - යනු ප්‍රේතයාගේ වචන, ස්වාමීනි ප්‍රේතයාගේ වචනයෙන් මෙය කරන ලද්දේ ය යි දක්ව යි. **ධම්මානී** - යනු පෙර කරන ලද පාපකර්මයන් මැඩ පවත්වන්නට සමත් පින්කම්, **කම්මං සියා අඤ්ඤත වෙදනීයං** - යනු ඒ පාපකර්මයන් උපපජ්ජ වේදනීය වූ ඒ පාප කර්මයන් අහෝසි කර්ම නම් වේ. යම්කිසි අපරාපරිය වේදනීය කර්ම වනාහී විඳිය යුතු විපාක වන්නේ ය. සංසාරයේ හැසිරෙන්නා වූ යම් අවස්ථාවක යන අර්ත යි. **ඉමංචා** - යනු තමා විසින් කියන ලද ආසන්න වූ ප්‍රත්‍යක්ෂම වූවකැ යි කියන ලදී. **අරියං අට්ඨඞ්ගුවරෙනූ පෙතං** - යනු පිරිසිදු අර්ථයෙන් ආර්ය වූ ප්‍රාණඝාතයෙන් වෙන් වීම ආදී, අඞ්ග අටකින් යුක්ත වූ උතුම් වූ උපෝසථ ශීලය යි. **කුසලං** - යනු නිවැරදි වූ **සුඛුද්‍රයං** - යනු සැප විපාක, සදා **පුඤ්ඤං පවඩ්ඪති**, යනු

පුණ්‍ය කර්ම කොට මෙපමණක් ප්‍රමාණවත්යයි සතුටට පත් නොවී වරින් වර සුචරිත ධර්ම පුරන්නාහට සියලු කල්හිම පින් වැඩේ. වරින් වර සුචරිත ක්‍රියාවන්හි යෙදෙන්නන්ට පින් සංඛ්‍යාත වූ සිත්වල උපරිම මට්ටමෙන් වැඩේ උතුරා යයි යන අර්ථ යි.

මෙසේ තෙරුන් විසින් කියන ලද කල්හි රජු අපාය දුකින් බිය පත් වූ සිත් ඇති ව, තුණුරුවන් කෙරෙහි හා කුසල ධර්මයන් කෙරෙහි මනාව වැඩුණු ප්‍රසාද සිත් ඇති ව, එතැන් පටන් සරණ ශීලාදිය සමාදන් වී, අදම බුදුන් සරණ යෙමි යි ආදිය කීහ.

එහි **එතාදිසො** - යනු කියන ලද පරිද්දෙන්, **වෙසාලියං අඤ්ඤතරො උපාසකො** - යනු විශාලා මහනුවර දහ දහස් ගණන් උපාසකයන් අතර එක්තරා උපාසකයෙකු වී, **සද්ධොති** - කල්‍යාණ මිත්‍ර ආශ්‍රයෙන් ඔහුගේ පෙර භවයන් පිළිබඳව වෙනත් සිය ගණන් ආත්ම භාවයන් දක්වීමට යයි කියන ලදී. පෙර හේ ශ්‍රද්ධා නැති වූයේ කර්කශ වූයේ භික්ෂූන්ට ආක්‍රෝශ කළේ සඞ්ඝයාට ද සැහැසිකම් කළේ වූයේ ය. දැන් වනාහි ශ්‍රද්ධාවත් වූයේ මෘදු පැවැතුම් ඇත්තේ භික්ෂු සඞ්ඝයාට සකස් කොට උපස්ථාන කළේ ය.

එහි **කාරකරො** - යනු උපකාර කරන්නෙක් වී, **උභො** යනු උලතැබූ පුද්ගලයා ද, රජු ද, **සාමඤ්ඤඵලානි අජ්ඣගු** - යනු සුදුසු සේ ශ්‍රාමණ්‍ය ඵල වලට පැමිණියාහු ය. ඒ අර්ථය දක්වීම සඳහා **සුලාවුතො අගගඵලං අඵසස, ඵලං කනිට්ඨමපන අමබ සකඛරො** ආදිය කියන ලදී.

එහි **ඵලං කනිට්ඨං** යනු සෝවාන් ඵලය සඳහා කියන ලදී. යමක් වනාහි අර්ථ යෙන් විභාග නොකෙළේ ද එය අවබෝධයට පහසු වේ. මැ යි.

මෙසේ රජු හා ප්‍රේතයා තමන් විසිනුත් කියන ලද කථා ප්‍රවෘත්තිය ආයුෂ්මත් මහා කපපින තෙරුන් වහන්සේ, බුදුන් වහන්සේ වැඩීමට සැවැත්නුවරට පැමිණ විට බුදුන්ට සැළ කළෝ ය. ශාස්තෘන් වහන්සේ ඒ කාරණය අර්ථෝත්පත්ති කොට ගෙන පැමිණ සිටි පිරිසට මේ ධර්ම දේශනාව කළහ. ඒ දේශනා තොමෝ මහා ජනයාට සාර්ථක වූයේ ය.

අමබසක්ඛර ප්‍රේත වස්තු වර්ණනාව
නිමියේ ය.

—//—

# 4-2

"සුණාථ යක්ඛස්ස වාණිජානං ච" යනු සේරිස්සක ප්‍රේතයාගේ කථා වස්තුව යි. ඒ කථාවස්තුව යම් හෙයකින් සේරිස්සක විමානවත්ථුව හා වෙනසක් නැති වේ. එහෙයින් එහි අර්ථෝත්පත්ති කථාව ද ගාථා වන්හි ද යමක් කිවයුතු ද? ඒ සියල්ල පරමත්ථ දීපනී නම් වූ විමානවත්ථු වේ වර්ණනා කරන ලද්දේ මැ යි. එබැවින් එහි කියන ලද පරිද්දෙන්, එය දතයුත්තේ ම ය.

සේරිස්සක ප්‍රේතවස්තු වර්ණනාව
නිමියේ ය.

——//——

# 4-3

**"රාජා පිඞගලකො නාම"** ආදී වූ මෙය නන්දක ප්‍රේත වස්තුව යි. එහි උත්පත්ති කථාව කවරේද යත්.

ශාස්තෲන් වහන්සේ පිරිනිවන් පා වසර දෙසීයක් ගතවීමෙන් පසුව, සුරට්ඨ දේශයේ පිඞ්ගල නම් රජකෙනෙක් විසී ය. ඔහුගේ සේනාපතියා නන්දක නම් විය. හේ මිථ්‍යා දෘෂ්ටි ගත්තෙකි. විපරීත අදහස් ඇත්තේ ය. දුන් දෙයෙහි විපාක නැත ආදී වශයෙන් මිථ්‍යා අදහස් ගෙන හැසිරුණේ ය. ඔහුගේ දුව උත්තරා නම් උපාසිකාව සුදුසු කුලයකට විවාහ කර දෙන ලද්දේ විය. නන්දක සේනාපතියා කළුරිය කොට වින්ධ්‍යා පර්වතයේ මහත් විශාල වූ නුග ගසෙක ද්වේමාතික ප්‍රේතයකු වී උපන්නේ ය. එම සේනාපතියා කළුරිය කළ කල්හි ඔහුගේ දුව උත්තරා තොමෝ සිහිල් සුවඳ ජලයෙන් පිර වූ වතුර කළයක් ද කොමු පිටියෙන් තනන ලද වර්ණයෙන් හා සුවඳින් යුක්ත වූ කැවුම් වලින් පිරුණු නැඹිලියක් ද එක්තරා රහතන් වහන්සේ නමකට පුද දී, මේ දක්ෂිණාවගේ කුසල් මගේ පියා අනුමෝදන් වේවා යි උදෙසී ය. එම දානය දීමෙන් දිව්‍යමය වූ පැන් ද අපමණ වූ දිව බොජුන් ද, ඒ ප්‍රේතයාට පහළ විය. ඒ දැක හේ මෙසේ සිතී ය. මා විසින් දුන් දෙයෙහි විපාක නැතැ යි දෘෂ්ටි ගෙන, එම දෘෂ්ටියෙන් මහ ජනයා ද දෘෂ්ටි ගන්වන ලදී. ඒ මගින් මා විසින් පව් කරන ලද්දෙමි. දැන් පිඞ්ගල නම් රජු ධර්මාශෝක රජුට උපස්ථාන කොට නැවත මේ මගින් ආපසු යන්නේ ය. ඒකාන්තයෙන් මම ඔහුගේ නාස්තික දෘෂ්ටිය දුරලන්නෙමි. කියා සිතී ය. වැඩිකල් නො ගොස්ම පිඞ්ගල රජු ධර්මාශෝක රජුට උවැටන් කොට නැවත ආපසු ඒමට මගට පිළිපන්නේ ය. ඉක්බිති (ඔහු) ප්‍රේතයා තමන් වසන තැනට අභිමුඛව ඒ මග මැවී ය. රජු මධ්‍යාහ්න කාලයේ ඒ මගින් යයි. ඔහු ගමන් ගන්නා මග ඉදිරියෙන් මග පෙනේ, ඉක්ම වූ මග අතුරුදහන් වෙයි. සියල්ලට පසු ව යන පුරුෂයා මග අතුරුදන් වූවා දැක බියට පත් වූයේ මහත් සේ කෑ ගසමින් දුවගොස් රජුට කීයේ ය. ඒ අසා රජු බියට පත් වූයේ කළ කිරුණු සිත් ඇති ව, ඇතු පිට සිටම සතර දිසා බලන්නේ, ප්‍රේතයා වසන නුගරුක දැක සිව්රඟ සෙනඟ සමග ඒ නුගරුක වෙත ගියේ ය. ක්‍රමයෙන් රජු නුගරුක මුලට පැමිණියේ සර්වාභරණයෙන් සැරසුණු ප්‍රේතයා රජු වෙතට පැමිණ, පිළිසඳර කතා කොට, කැවුම් ද, වතුර ද,

දුන්නේ ය. පිරිවර සහිත රජු දිය නා කැවුම් කා වතුර බී සන්සිඳුණු ගමන් විඩාව ඇත්තේ, නුඹ දෙවියෙක් ද, ගන්ධර්වයෙක් ද යි ප්‍රේතයාගෙන් විචාළේ ය. ප්‍රේතයා ආරම්භයේ පටන් තමන්ගේ සියලු පුවත් කියා රජුගේ මිථ්‍යා දර්ශනයෙන් මුදවා ශරණයෙහි ද ශීලයෙහි ද පිහිටු වී ය. එහි අර්ථය විස්තර කරනු සඳහා සඞ්ගීති කාරකයෝ මේ ගාථා දක්වූහ.

සුරට්ඨ දේශයට අධිපති වූ, පිඞ්ගල නම් රජෙක් වූයේ ය. ඔහු මෞර්ය ධර්මාශෝක රජුන්ට උපස්ථානයට ගොස් නැවත සුරට්ඨ දේශය බලා ආපසු ආයේ ය.

රජු උෂ්ණත්වයෙන් යුතු මධ්‍යාහ්න කාලයෙහි මහ මගට පිළිපන්නේ ප්‍රේතයා විසින් නිමාවට පත්කළ මාර්ගයක් වූ, මොළොක් බිම ඇති, සිත්කළු වූ මහා මාර්ගය දුටුවේ ය.

රජතෙම රියැදුරු ඇමතුවේ ය, රියැදුරු, මේ මාර්ගය සිත්කළු ය, උවදුරු නැත්තේ ය. සුවපත් බව ඇත්තේ ය. උවදුරු රහිත ය. රියැදුර මේ මගින් යව, මේ මගින් සුරට්ඨ දේශයට සමීප වෙමු.

සුරට්ඨාධිපති වූ රජතෙම සිව්රඟ සෙනග පිරිවරා ඒ මගින් ගියේ ය. බියට පත් වූ යම් පුරුෂයෙක් සුරට්ඨ දේශයේ රජුට මෙසේ කීයේ ය.

බිය ජනක වූ, ලොමු දැහැගන්වන්නා වූ, නපුරු මගකට අපි පිළිපන්නෝ වෙමු. ඉදිරියෙහි පාර අපට පෙනේ, අප විසින් පසු කරන්නා වූ මග අපට නො පෙනේ.

තිරිසතුන්ගේ සමීපයෙහි වූ නපුරු මගකට අපි සේන්දු වූයෙමු. අමනුෂ්‍යයන් පිළිබඳ දුගඳ හමයි. දරුණු වූ ශබ්ද ඇසේ.

කළ කිරුණු සිත් ඇති සුරාශ්ට්‍ර රජු රියැදුරාට මෙසේ කීයේ ය. බියජනක වූ, ලොමු දැහැ ගන්වන්නා වූ, නපුරු මගකට අප සේන්දු වූයෙමු. ඉදිරියේ යනමග අපට පෙනේ. අප පසු කරන මග නො දක්නේ ය.

නිරිසතුන්ගේ සමීපයෙහි වූ, නපුරු මගකට අපි පේන්දු වූයෙමු. අමනුෂ්‍ය ගඳ හාත්පසින් හමයි. දරුණු වූ ශබ්ද ඇසේ.

ඇතු පිටට නැගී සිව් දිසා බලන්නේ, නීලා කාසය හා සමාන වූ, වැහි වළා කුලක ශ්‍රීයාව පාන්නා වූ, සිත් කළු වූ, සෙවණ සහිත වූ, පොළවට මුල් එල් ලෙන්නා වූ නුග රුක දුටුවේ ය.

නිල් අහස හා සමාන වූ, වැසි වළාවක ශ්‍රීයාව දක්වන්නා වූ, (ගසක් පෙනේ යයි) රියැදුරා අමතා රජු කීයේ ය.

නිල් අහස හා සමානව කළු වළාවක් මෙන් වූ සෙවණ සහිත වූ පාදපයන් ගෙන් යුත්, එය නුග ගසක් වේ.

නිල්වන් වූ මේකුළක් හා සමාන වූ, යම් නුග ගසක් දිස්වේ ද? සුරාට්ඨ යේ රජු ඒ වෘක්ෂය දෙසට ගියේ ය.

ඇතු පිටට නැගී රජු ඒ නුගරුක වෙත එළඹියේ ය. ඇමතිවරුන් ද පිරිවර ද සමග වූ මහරජු රුක් මුල්හි හුන්නේ ය.

දියෙන් පිරුණා වූ පැන් තලියක් ද, මිහිරි වූ කැවුම් ද එහි විය. සියලු අබරණින් සැරසුණු, දිව්‍ය වර්ණයන්ගෙන් යුත්, එක් පුරුෂයෙක් සුරාශ්ට්‍ර රජු වෙත පැමිණ මෙසේ කීයේ ය.

මහරජ යහපත් ගමනක් වේවා ! ඔබගේ පැමිණීම නපුරු ගමනක් නො වේ. රජතුමනි ! කැවුම් කා වතුර බොනු මැනැවි.

ඇමති ගණයා ද පිරිවර ද, සහිත වූ රජු කැවුම් කා පැන් බී, සුරාශ්ට්‍ර රජු මෙසේ ඇසී ය.

ඔබ දෙවියෙක් වෙහි ද, නැතිනම් ගන්ධර්වයෙක් ද? එසේත් නැතිනම් පුරින්ද වූ ශක්‍රයා ද? ඔබ කවුරුදැ යි අප නො දන්නේ කෙසේ නම් ඔබ දැනගන්නෙහි ද?

මහරජුනි ! මම දෙවියෙක් නො වෙමි. ගන්ධර්වයෙක් ද නො වෙමි. ශක්‍රයා ද නොවෙන්නෙමි. සුරට්ඨ දේශයේ සිට මෙහි පැමිණි මම ප්‍රේතයෙක් වෙමි.

ඔබ පෙර සුරට්ඨ රටෙහි කෙබඳු සිල්වතෙක් වූයේ ද? කවරනම් බ්‍රහ්ම චරියාවක් ආරක්ෂා කළෙහි ද? ඔබේ කුමන ආචාර ධර්මයක් හේතු කොට ගෙන මෙසේ මහානුභාව සම්පන්න වී ද?

සතුරන් දමනය කරන්නා වූ රට වඩන මහරජතුමනි ! ඔබ වහන්සේ ද, ඇමති පිරිස ද, පරිවාර ජනයෝ ද, පුරෝහිත බමුණා ද, මෙය අසත්වා

දේවයන් වහන්ස ! සුරට්ඨ රටෙහි සිටි මම පාපී චේතනා ඇති, මිථ්‍යාදෘෂ්ටි වූ, දුශ්ශීල වූ තද මසුරෙක් වූ, ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට පරිභව කළා වූ පාපකාරී පුරුෂයෙක් වීමි.

මම දන් දෙන්නා වූ අයට ද, අනුන්ට උපකාර කරන අයට ද, අනතුරු කරන්නෙක් වීමි. දන් දෙන්නා වූ බොහෝ ජනයා එයින් වැළැක්වීමි.

දානයාගේ මතු විපාක නැතැයි ද, ශීලයෙන් සංයමයෙන් ඵල විපාක නැතැයි ද, නො දැමුණු අය දමනය කරන්නෙක් ආචාර්ය වරයෙක් නැතැයි ද මම විශ්වාස කළෙමි.

සත්ත්වයෝ එක සමාන වෙති. ජ්‍යෙෂ්ඨයෙක් වැඩිහිටියෙක් නැත. වැඩිහිටියන් පිදීමෙන් ප්‍රතිඵලයක් නැත. බලයක් හෝ වීර්යයක් නැත. උට්ඨාන වීර්ය පුරුෂ පරාක්‍රමයක් ද නැත්තේ ය.

දානඵල විපාකයක් නැත. මිනිස්සු දුක් සැප ආදිය ස්වභාව ධර්මයේ උපත් වසයෙන් ලබයි.

මව් පිය කෙනෙක් සහෝදර සහොදරියෝ නැත. මෙ ලොවින් මතු පරලොවක් නැත. මහා දානයක් හෝ දුරසිට එළවන සත්කාරය නැත. මනාකොට තබන ලද්දක් ද නො පොනේ.

යමෙක් පුරුෂයෙකු නසන්නේ ද? අනිකකුගේ හිස සිඳින්නේ ද? එයින කිසිදු විපාකයක් ඝාතකයාට සිදු නො වේ. කිසි පුද්ගලයෙක් කිසිවෙකු නො නසයි. සප්තකායයන්ගේ සිදුරු අතරෙහි ඇතුළ් වෙයි.

සත්ත්වයන්ගේ ජීවය බිඳලිය නො හැකි ය. ඒ ජීවය (නිත්‍ය ස්වභාව හෙයින්) ගුළියක් මෙන් වේ. (ජීවයෝ ද ශරීරයෝ ද නිත්‍ය ස්වභාව වෙත්)

යම් සේ නූල් ගුළියක් දිග හැරීම් වශයෙන් (වෙළුම්හැරී) දමූ කල්හි එය ලිහී යා ද එසේ ම ජීවය ද ලිහිල් වී පලා ය යි.

මේ ගමින් නික්මී අනික් ගමකට යයි ද? එසේ ම ජීවය ද අනිත් ශරීරයකට ඇතුල් වේ.

යම් සේ ගෙයින් නික්මී අනෙක් ගෙයකට ඇතුල් වන පුද්ගලයකු මෙන් ජීවය ද අනික් ශරීරයකට ඇතුල් වෙයි.

යම් බාලයෙක් හෝ පණ්ඩිතයෙක් හෝ වේවා ! ඔව්හු මහා කල්පයක්, අසූ හාර ලක්ෂයක් වැනි කාලයක් සසරෙහි ඔබ මොබ සැරි සරා අවසානයේ දුක් කෙළවර කරති. (කුශලා කුශල කර්මයෝ අනවශ්‍යයහ)

සත්ත්වයන්ගේ සැප දුක් දෙක, ඉහත සඳහන් කාල පරිච්ඡේදයන්හි විඳින ලද  පමණ ය. සත්ත්වයෝ අතිශයින් මුලාවට පත් ව හැසිරෙති ජින භූමියෙහි සිටියෙක් පමණක් සියල්ල දනී.

මම පෙර ආත්මයෙහි මෙබඳු දෘෂ්ටි ඇත්තෙක් වූයෙමි. අතිශයින් මුළාවූයේ මෝහයෙන් වැසුනේ, මිසදිටු අදහස් ඇත්තේ, සිල් නැත්තේ, තද මසුරු වූයේ හා අනුන්ට පරිභව කරන්නෙක් ද වූයෙමි.

මෙතැන් සිට සයමසක් මත්තෙහි. මගේ කළුරිය කිරීම සිදු වන්නේ ය. ඉතාම තියුණු වූ දරුණු වූ කටුක වූ නිරයට ඒකාන්තයෙන්ම මා වැටෙන්නේ ය.

එහි කොන් සතරක් ඇත්තේ ය. දොරටු සතරක් ඇත්තේ ය. සම්පූර්ණ පරිමාව කොටස් කර බෙදා ඇත්තේ ය. යකඩ පවුරකින් පිට කරන ලද එය යකඩ පියනකින් වසා ඇත්තේ ය.

ඒ අවීචි මහා නරකයේ යකඩමය වූ භූමියේ නිතර ගිනි දැල්වලින් දිලිසේ. යොදුන් සියයක් හාත්පස හැමතැන ගිනි දැල් පිරී පවතී. පැතිරී යයි.

මහරජ ! අවුරුදු ලක්ෂයක් ඉකුත් වූ විට එතැනින් ශබ්දයක් ඇසේ. එහි ආයුෂ කාලය සියයක් කොටස් වූ අවුරුදු කෝටියක් වේ.

යම් සත්ත්වයෙක් හවුරුදු කෝටියක් මුළුල්ලෙහි නරකයෙහි පැසෙත් ද? ඔව්හු මිථ්‍යාදෘෂ්ටිකයෝ ද, දුශ්ශීලයෝ ද, ආර්යෝපවාද කළෝ ද වෙති.

එහෙයින් මම ඒ නරකාදියේ බොහෝ කලක් කටුක දුක් වේදනා විඳින්නෙමි. ඒ මා විසින් කරන ලද කර්මයාගේ විපාක යි. මා විසින් ම එය විඳිය යුතු නිසා මම බොහෝ ශෝක කරමි.

සතුරන් තසන්නා වූ, රට වඩන්නා වූ මහරජ තුමනි ! අසනු මැනැවි, යහපතක් ම වේවා ! මාගේ උත්තරා නම් දියණි තොමෝ.

යහපත් වූ කුශල කර්ම කර යි. නිත්‍ය පන්සිල් හි ද, උපෝසථ ශීලයෙහි ද යෙදුණී වෙයි. දාන සංවිභාග ඇති ඕ හික්මුණු තැනැත්තියක් ද වේ. පහකළ මසුරු මළ ඇත්තා වූ ඇය,

අන්කුලයක යෙහෙළියක් වුවත් ශික්ෂා පද කඩ නො කරණ සුලු . ශ්‍රීමත් ශාක්‍යමුනී වූ බුදුරජාණන්ගේ උපාසිකාවක් වේ.

යට හෙළන ලද ඇස් ඇත්තී, සිහි ඇති, රකින ලද ඉඳුරන් ඇති, මනාව හික්මුණු සීල සම්පන්න වූ, භික්ෂුවක් ගමට පිඬුපිණිස වැඩම වූ වේලේ.

මහරජ ඔබට වැඩක් ම වේවා ! ගෙපිළිවෙළින් වසමින් ඒ ගෙට වැඩියේ ය. උත්තරා ඒ භික්ෂුව දුටුවා ය.

ඕ තොමෝ පැන් පිර වූ පැන් බඳුනක් ද, විසිතුරු වූ කැවුම් ද ඒ භික්ෂුවට පූජාකොට, කළුරිය කළ මගේ පියාට මේ පින් ලැබේවා යි පින් පැමිණ වූවා ය.

ඒ පින් දීමට අනතුරු ව එවේලේ ම එහි විපාක මට උපන්නේ ය. වෛශ්‍රවණ මහරජු මෙන් සියළු කාම සම්පත්තීන්ගෙන් මම සමෘද්ධ වූ වෙමි.

සතුරන් නසා රට වඩන්නා වූ මහරජ තුමනි ! මෙය අසනු මැනවි. දෙවියන් සහිත ලෝවැස්සන්ට වඩා බුදුන් වහන්සේ අග්‍ර යයි කියන ලදී. මහරජුනි ! අඹු දරුවන් සහිතව ඒ බුදුන් සරණ යනු.

ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙන් පොහොසත් වූ අමෘත පද වූ දහම් සරණයෙහි අඹු දරුවන් සමග පිහිටනු මැනැ ව.

සතර මාර්ගයන්ට පැමිණියා වූ ද, සතර ඵලයන්ට පැමිනියා වූ ද? මේ සඞ්ඝයා ඍජුපටිපන්න වූයේ ය. ප්‍රඥාවෙන් ශීලසංවරයෙන් යුක්ත වූයේ ය. මහරජ. අඹු දරුවන් සමග ඒ සඞ්ඝයා සරණ යව.

වහා ම ප්‍රාණඝාතයෙන් වළකිනු මැනැවි. ලෝකයෙහි අයිතිකරුවන් විසින් නුදුන් දෙයක් නො ගතයුතුම ය. මද්‍යපානය නො කරව, බොරු නො කියව, තමන්ගේ භාර්යාව ගෙන්ම සතුටට පත්වෙව !

යක්ෂය ! ඔබ මට වැඩ කැමැත්තෙහි ය. පින්වත් දෙවිය මට හිතවත් ය. නුඹගේ වචනය කරමි, ඔබ මගේ ආචාර්ය වරයා වෙහි ය.

මම බුදුන් සරණ යෙමි, බුදුන්ගේ අනුත්තර වූ ධර්මය ද ශ්‍රාවක සංඝයා ද පිහිට කොට පවතිමි.

වහාම ප්‍රාණඝාතයෙන් වෙන්වෙමි. නුදුන් දෙයක් නො ගනිමි. මත් පැනින් දුරුවෙමි. බොරු නො කියමි. මගේ බිරිඳ ගෙන් ම සතුටට පත්වෙමි.

ලාමක වූ මිථ්‍යා දෘෂ්ටිය සුළඟේ පා කර හරිමි. සැඬ දිය පහර ඇති නදියෙහි පාකර හරිමි, බුදුන්ගේ සසුනෙහි ඇලුණේ වෙමි.

සුරට්ඨාධිපති වූ රජු මෙය කියා ලාමක වූ මිථ්‍යා දර්ශනයෙන් වැළකී බුදුන්ට නමස්කාර කොට පෙර දිග බලා රාජ රථයට නැංගේ ය.

එහි **රාජා පිඞ්ගලකො නාම සුරට්ඨානං අධිපති අහු** - යනු පිඟුවන් වූ ඇස් ඇති බැවින් පිඞ්ගල නමින් ප්‍රකට විය. සෞරාෂ්ට්‍ර දේශයට ඊශ්වර වූ බැවින් අධිපති වූ බැවින් රජු නම් විය. **මොරියානං** - යනු මෞර්ය රජු ධර්මාශෝක රජු සඳහා කිය යි. **සුරට්ඨං පුනරා** ගමා යනු සුරට්ඨ දේශයට එන්නා වූ මගට පසුව ආයේ ය. **පඞ්කං** - යනු මෘදු භූමිය **වණ්ණනා පථං** - යනු ප්‍රේතයා විසින් මවන ලද පහසු වූ මාර්ගය, **ඛෙමො** - යනු බිය නැති - **සොවත්ථිකො** - යනු සැප පහසු බව උසුලන්නා වූ, **සිවො** - යනු උවදුරු නැති, **සුරට්ඨානං සන්තිකෙ ඉතො** - යනු මේ මාර්ගයෙහි යන්නා වූ මා විසින් සුරට්ඨ රටට ළඟා වේම යයි. **සොරට්ඨො** - යනු සුරට්ඨ දේශයට අධිපති, **උබ්බිග්ගරූපො** යනු තැතිගත් ස්වභාව ඇති, **හිංසනං** යනු භය උපදවන, **ලොම හංසනං** යනු බියට පත් වූ විට ලොම් කෙලින් වීම, **යම පුරිසානං සන්තිකෙ** - යනු ප්‍රේතයන් වසයෙහි පවත්නෙමු. **අමානුසො වායතිගන්ධො** - යනු ප්‍රේතයන් ගේ ශරීර දුර්ගන්ධය ගහනය වේ. හම යි. **සොසො සුයති දාරුණො** යනු ප්‍රත්‍යෙක වූ නිරයෙහි කාර්ය කරන්නා වූ සත්ත්වයන්ගේ රුදුරු වූ ශබ්ද ඇසේ. **පාදපං** යනු පා සමාන වූ මුල්වලින් දිය බොන්නා වූ යන අදහසින් ලත් නම් ඇති විශාල වෘක්ෂ, **ඡායා සම්පන්නං** - යනු සෙවණැල්ල සහිත වූ **නීලබ්භවණ්ණ සදිසං** - යනු පැහැයෙන් නිල් මේ කුළක් බඳු - **මෙඝවණ්ණ සිරිනිභං** - යනු කළු වළාවක් සමාන ව දිස්වෙන්නා වූ **පූරං පානීයස්ස කරකං** - යනු පැනින් පිරුණා වූ දිය බඳුනක්, **පූවෙ** - යනු කඩා කෑ යුතු **විතෙත** - යනු රස හඳුනන ජනයන් විසින් මිහිරි වශයෙන් **හඟින** දේ ඒ ඒ තැන්වල භාජනවල පුරවා තබන ලද කැවුම් දුටුවේ ය. **අථො තෙ අදූරාගතං** යනු මෙහි අථ යනු නිපාතයක් පමණි. අවධාරණාර්ථ යෙහි, මහරජ ඔබ ආ ගමන අසුභ ගමනක් නොවේ. යහපත් ගමනකි. මා විසින් පිළිගන්නා ලද ගමනකි. **අරින්දම** යන සතුරන් මඩින සුළු **අමච්චා පාරිසජ්ජා** - යනු ඇමතිවරු ද පිරිවර ද, ඔබගේ පුරෝහිත බමුණෝ ද මේ වචන අසාවා යන යෝජනා යි. **සුරට්ඨසමා අහං** - යනු මමත් සුරට්ඨ දේශයෙන් දෙව යනු

රජුට ඇමතීම යි. **මිච්ඡාදිට්ඨි** යනු නාස්තික දෘෂ්ටිය හා විපරීත දර්ශන ඇති, **දුස්සීලො** - යනු සිල් නැති, **කදරියා** - යන තද මසුරුබව, **පරිභාසකො** යනු ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට ආක්‍රොශ කළේ. **වාරයිස්සං** - යනු වැළැක්වීම්, **අන්තරායකරො අහං** - යනු මම දන් දෙන්නා වූ ද උපකාර කරන්නා වූ ද අයට අන්තරාය කරවීමි. වැළැක් වීමි. නැවැත් වීමි. අනුන් විසින් දෙනු ලබන්නා වූ දානමය පින්කම්, බොහෝ ජනයා වෙතින් බොහෝ වාරයක් මම නැවැත්වීමි. විපාකො **නත්ථි දානස්ස** - **ය**නු දන් දීමේ විපාක නැත ආදී විපරීතා කාර දර්ශන. එහි දන් දීමෙන් ඇති වන්නාවූ ඵලයක් විපාකයක් නැතැ යි දන්දීම් නැවැත්වීම් වැළැක් වීම්. **සංයමස්ස කුතො ඵලං** - සීල් රැකීමෙන් කවර නම් ප්‍රතිඵලයක් ද විපාකයක් ද, මේ සියල්ලෙන් කිසිදු ඵල විපාකයක් නැතැයි යන අදහසයි. එහෙයින් කියන ලදී. **අදන්තං කො දමෙස්සති, සමතුල්‍යානි භූතානි** යනු මේ සත්ත්වයෝ සියලු දෙනා ම ඔවුනොවුන් සම සමයෝ ය. තුල්‍ය යෝ ය. එහෙයින් ජ්‍යෙෂ්ඨ කියා කොටසක් නැත. **කුතො ජෙට්ඨා පචායිනො** - යනු වැඩිහිටියන්ට ගරු කිරීමය රැක බලා ගැනීම ය, වැඳුම් පිදුම් කිරීම ය. ආදී පින්කම් කියා දෙයක් නැත. යන අර්ථ යි. **නත්ථි බලං** - යනු සත්ත්වයෝ තමන්ගේ බලයෙහි පිහිටා වීර්යය කොට මිනිසාගේ සෞභාග්‍යය ආදිය ලබා ගනියි. අර්හත් සම්පත්තිය දක්වා පැමිණෙති, එහි වීර්ය බලයකියා දෙයක් නැත. එය පිළිකෙව් කරයි. වීර්යයක් හෝ නැත. **කුතො උට්ඨාන පොරිසො** - යනු පුරුෂ වීර්යයෙන්, මිනිස් ක්‍රියා කාරිත්වයෙන් පවතීය යන මේ ප්‍රවාදය ප්‍රතික්ෂේප කිරීම් වසයෙන් කියන ලදී. **නත්ථි දාන ඵලන්නාමා** - යනු දානයාගේ, දීමෙහි ප්‍රතිඵල කියා කිසිවක් නැත්තේ ය. දෙය්‍ය ධර්මයෙන් පරිත්‍යාග කිරීම, ගින්නට දමන්නාක් වැනි, අළු කරන්නාක් වැනි, නිෂ්ඵල වූ කාර්යයකි යන අර්ථ යි. **න විසොධෙති වෙරිනං,** යනු මෙහි **වෙරිනං** - යනු වෛර වශයෙන් ප්‍රාණඝාත ආදී වශයෙන් කරන ලද පව්කම් පුද්ගලයාගේ දාන ශීලා දී වශයෙන් පැවති සෝදා හැරීමට පිරිසුදු කිරීමට හෝ පුළුවන් කමක් නැත. කිසිවක් කිසිවෙකු ශුද්ධ නො කර යි. පෙර - **විපාකො නත්ථි දානස්සා** - යනු තමන් විසින් අනුන්ට දීම හා අනුන් විසින් ද කරන දන් දීමාදිය නැවැත්වීමේ වැළැක්වීමේ දර්ශනය යි. **නත්ථි දානඵලං නාමා** - ආදිය වනාහි තමන්ගේ මිථ්‍යා දෘෂ්ටි ප්‍රවේශය දක්වන්නේ යයි දත යුතු යි. **ලද්ධෙය්‍යං** - යනු ලැබිය යුතු බවයි. කෙසේ නම් ලැබිය යුත්තේ ද? කීවේ ය. **නියති පරිනාමජා** - යනු මේ සත්ත්වයෝ යම් කිසි සැපක් හා දුක ක් ලබන්නේ නම් ඒ ස්වාභාවික

විපරිනාම් වසයෙන්ම ලබ යි. එය කරන ලද කර්මානු රූපව ලැබෙන්නක් වත්, ඊශ්වර ආදීන් විසින් දෙනු ලබන්නක් වත් නොවේ ය. යන අදහස යි. **නත්‍ථි මාතා පිතා භාතා** - මව් පිය ආදීන් කෙරෙහි පිළිපදින්නා වූ යහපත් පිළිවෙත් හා වැරදි පිළිවෙත්වල ස්වභාවය සඳහා කිය යි. **ලොකො නත්‍ථි ඉතො පරං** - යනු මේ ලෝකය වශයෙන් හෝ පරලෝකය වශයෙන් හෝ කිසිවක් නැත. ඒ ඒ තන්හි දී ම සත්ත්වයෝ විනාශවෙත් යන අදහස යි. **දින්නං** - යනු මහා දාන යි. **හුතං** නු දුර සිට කරනු ලබන සත්කාරය යි. ඒ නිසා උපදින්නා වූ ප්‍රතිඵලයක් සුවයක් නැත්තේ ය යි ප්‍රතික්ෂේප කර යි. **සුනිහිතං** යනු මනාකොට තබන ලද්දකි, **න විජ්ජති** - යනු ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට දෙන දානය අනුගාමික නිධානයක් ය යි කියති, එය විද්‍යාමාන නොවේ. ඔවුන්ගේ ඒ වචන නිකම් කියන ලද්දක් පමණි යන අර්ථ යි.

**න කොචි කිඤ්චි හනති** - යනු යම් පුරුෂයෙක් වනාහි අනෙක් පුරුෂයකු මරයි ද? අනෙක් පුරුෂයකුගේ හිස සිඳියි ද? එහිදී පරමාර්ථ වශයෙන් කිසිවෙක් කිසිවෙකු සත්ත්වයෙකු නොමර යි. සත්ත්වයන්ගේ පෘථුවි ආදී සප්ත ධාතු කායය සිදුරු බැවින් මරන්නාක් මෙන් වේ. කෙසේ ද? ශස්ත්‍රය ඇතුල්වීම කියන ලදී. **සත්තන්නං විවර ම න්තරෙ** - යනු පෘථුවි ආදී සප්ත ධාතු ශරීරයාගේ සිදුරු අතර ආයුදය විදගෙන ඇතුල් වේ. එහෙයින් සත්ත්වයෝ කඩු ආදිය ගෙන එයින් පහර දී මරනුලද්දක් මෙන් පෙනේ. සත්ත්ව ජීවය වූ කල්හි නිත්‍ය ස්වභාවය ඇති බැවින් නො සිඳිය හැකිය යන අදහස යි. **අච්ඡෙජ්ජ භෙජ්ජො ජීවො** - මේ සත්ත්වයන්ගේ ජීවය අවි ආයුධ වලින් නො බිඳිය හැකි ය. නොසිඳිය හැකි ය. නිත්‍ය ස්වභාව හෙයිනි, **අට්ඨංසො ගුළපරිමණ්ඩලො** - යනු ඒ ජීවය වනාහි සමහර කලෙක අටපට්ටම් වෙයි. සමහර විටක බෝලයක් මෙන් වෙයි. **යොජනානං සතං පඤ්චසා** - යනු රහත්බවට පත්විමට සුදුසු වන විට යොදුන් පන්සියයක් උස වෙයි. **කොජිවං ඡෙතුමරහති** - යනු නිත්‍ය වූ විකාර රහිත වූ ජීවය කවරෙක් නම් අවි ආයුධවලින් නසන්නට සමත් වේද? කැපීම් ආදියෙන් කිසිවෙකුට වෙනස් කළ නො හැකි ය. **සුත්තගුළෙ** - වෙළුම් (දඟ) සහිත නූල් බෝලයකි. **නිබ්බෙඨෙන්තා** - යනු වෙළුම් (දඟ) හැරීම් වශයෙනි, **නිබ්බෙඨෙනතං පලායති** - යනු (යමෙකු විසින්) කන්දක් මුදුනක හෝ ගසක් මුදුනක හෝ සිට වෙළුම් (දඟ) සහිතවම නූල නිම වූ කල්හි නො යේ ද? ඉවත නො දුවයි ද **එවමෙවං** -

මෙසේ ම ඒ නූල් බෝලය යම්සේ දඟ සහිතවම යයි ද, නූල ක්ෂණිකව නො යයි ද මෙසේම මේ ජීවය මහාකල්ප අසූ හතර දහසක් මුළුල්ලේ ආත්ම භාවය නැමති නූල් බෝලය නො වෙළෙමින් පවති යි. එහෙයින් උඩ නො පවතින්නේ ය. **එවම්පි සො ජීවො** - යනු යම්සේ කිසි පුරුෂයෙක් තමාගේ ගමේ නිවසින් පිටත්ව ගොස්, අනෙක් ගමකට පිවිසේ ද? මෙය දෙවියන් විසින් කරන ලද්දක් වන්නේ කෙසේ ද? මෙසේම මේ ජීවය ද මේ කාය ශරීරයාගෙන් නික්ම අනෙක් ශරීරයකට නියත වසයෙන්ම පැමිණේ. යන අදහස යි. **බොන්දිං** - ශරීරය, **චුළාසීති,** යනු අසූ හතරයි. **මහාකප්පුනො** - යනු මහා කල්පය යි. එහි අනවතප්ත විල වැනි එක් මහා විලකින් වර්ෂ සියයකට වරක් තණ අගකින් එක බින්දුවක් බැගින් දිය බින්දු ඉවත් කරයි ද? මේ උපක්‍රමයෙන් සත් වරක් ඒ විල සිදී ගියේ ද එය එක් මහා කල්පයක් නම් වේ. මෙවැනි මහාකල්ප අසූ හාර දහසක් සංසාරයාගේ ප්‍රමාණය වේ. යයි කියත්. **යෙ බාලා යෙච පණ්ඩිතා** - යනු යම්කිසි අන්ධ බාලයෙක් (මහා මෝඩයෙක්) හෝ ප්‍රඥාව සහිත වූ යන සියල්ලෝ **සංසාරං ඛෙපයිත්වාතා** - යනු පෙර කියන ලද කාල පරිච්ඡේදය සංසාරයේ ඔබ මොබ (ආත්මයෙන් ආත්මය) ඉපදීම් වශයෙන් සසර ගෙවා, **දුක්ඛ ස්සන්තං කරිස්සරෙ** - යනු සංසාර වෘතය ගෙවා දුක් කෙළවර කරන්නාහු ය. පණ්ඩිතයන්ට වුවත් අතරතුර ශුද්ධියක් ලැබිය නො හැක්කේ ම ය. බාලයන්ට ද එයට වඩා ඉහළින් යමක් නැත. එය ම ලැබිය යුතු ය.

**මිතානි සුඛ දුක්ඛානි දොණෙහි පිටකෙහි වා** - යනු සත්ත්වයන්ගේ සුව දුක් දෙක ද්‍රෝණයකින් හෝ කුඩයකින් හෝ, වෙනත් මිනුම් භාජනයකින් හෝ මණින ලද්දක් මෙන්, පෙර කියන ලද කාල පරිච්ඡෙදයෙන්ම, ප්‍රමාණ කරන ලද බැවින්, ඒ ඒ සත්ත්වයන්ගේ නියති පරිද්දෙන් ස්වභාව ධර්ම පරිණාමය අනුවම සමව පවත්නේ ය. **ජිනො සබ්බං ජානාති** - යනු ජින භූමියෙහි සිටි අයෙක් මේ සියල්ල දනී. සංසාරයාගේ සමතික්‍රමණය වනාහි සංසාරයෙහිම කරකැවීමකි. **සම්මුළ්හාය ඉතරා පජා - එවං දිට්ඨී පුරෙ ආසිං** - යනු යම් පරිද්දෙකින් කියන ලද නාස්තික දෘෂ්ටිය පෙර මම ඇදහුවෙමි. විශ්වාස කළෙමි. **සම්මුළෙහා මොහ පාරුතො** යනු යම්පරිදි කියන ලද ඒ දෘෂ්ටිමය හේතුවෙන් අතිශයින් මුළාවෙන් මුලාවට පත් වූයෙමි. ඒ සහජාත මෝහය පොරවා ගත් කල්හි සියලුම කුසල බීජයන් වැසුණේ, නැසුනේ ය යන අදහස යි.

මෙසේ පෙර තමන් විසින් උපදවා ගන්නා ලද පාප දෘෂ්ටියක් වීද, ඒ හේතුවෙන් ම කරන ලද පාප කර්මයන් දක්වා දූන් තමන් විසින් විඳිය යුතු අනුභව කළයුතු එහි ඵල විපාක දක්වමින් **ඔරං මෙ ඡහි මා සෙහි** යනාදිය කීහ.

එහි **වස්ස සතසහස්සානි** - යනු අවුරුදු සිය දහසක් ඉක්මවා යන වචනය ශේෂයි භූම්‍යාර්ථයේ පවත්නා ස්වභාවය යි. අවුරුදු සිය දහසක් කල් විඳිය යුතු ය. යන අර්ථ යි. **සොසො සුයි තාවදෙ** යනු මේ යම් කලෙක මෙතෙක් කල් ඉක්මවී ද එදා පටන් එහි පවත්නා වූ, අවුරුදු ලක්ෂයක් ඉක්ම ගිය කල්හි ද ඒ නිරයෙහි ශබ්ද ඇසේ. **ලක්ඛො එසො මහාරාජ** - යනු සියය බැගින් කොටස් වූ අවුරුදු කෝටියක්, මහරජ නිරයෙහි වසන්නා වූ සත්ත්වයන්ගේ මේ ආයු කාලය යි. මෙය කියන ලදී. දහයේ ඒවා දහය සියය යි. දහයේ ඒවා සියය දහස නම්, දහයේ ඒවා දස දහස ශත සහස්‍ර නම් ශත සහස්‍ර දහස කෝටි නම්, එය කෝටි වශයෙන් සියදහසක් වර්ෂ කෝටියකි. ඒ වනාහි නේරයිකයන්ගේ ආයු වර්ෂ ගණන වශයෙන් දත යුතුයි.

මිනිසුන්ගේ හෝ දෙවියන්ගේ මෙබඳු වූ ආයුෂයන්ට වඩා නිරයගාමී සත්ත්වයන්ගේ ආයු ප්‍රමාණය නොයෙක් ලක්ෂ කෝටි ගණනකි. එහෙයින් කියන ලදී. **කොටි සත සහස්සානි නිරයෙ පච්චරෙ ජනා** යම්බඳු වූ පාප කර්මයකින් මෙසේ සත්ත්වයන් නිරයෙහි වැටෙන්නේ ද එහි නියමය වශයෙන් දක්වීමට **මිච්ඡාදිට්ඨී ච දුස්සීලා යෙ ච අරියූපවාදිනො** - යන්න කියන ලදී. **වෙදිස්සං** - දූනගන්නේ ය.

මෙසේ තමන් විසින් විඳිය යුතු වූ අකුශල විපාක දක්වා දූන් **කෙන තෙ බ්‍රහ්මචරියෙන ආනුභාවො අයං තවා** - රජු විසින් විචාරන ලද අර්ථය කියා ඔහු සරණයෙහි ද ශීලයෙහි ද, පිහිටවනු කැමැත්තේ **තං සුණොහි මහාරාජ** - ආදිය කීහ.

එහි **සීලෙසු පොසථෙ රතා** - යනු නිත්‍ය (පඤ්ච) ශීලයෙහි ද උපෝසථ ශීලයෙහි ද කැමැත්ත වැඩීය. අදා දූන්නේ ය. **තං ධම්මං** යනු ආර්ය අෂ්ඨාංගික මාර්ගය හා නිර්වාණ පදය.

මෙසේ ප්‍රේතයා විසින් ශරණයෙහි ද සීලයෙහි ද සමාදන් කරවන ලද රජු පිබිදුනු සිතින් යුතුව, ඔහු විසින් තමන්ට කරන ලද උපකාරය පිළිබඳව ගුණ වර්ණනා කොට සරණාදියෙහි පිහිටමින්, අත්‍ථකාමො - ආදී ගාථාවන් කියා පෙර තමන් විසින් ගන්නා ලද පාපී දෘෂ්ටියෙන් බැහැරවන බවට පොරොන්දු දී, ඔපුණාමි, ආදී ගාථා කී ය.

එහි **ඔපුණාමි මහා වනෙ** - යනු මහා සුලඟක් හමා බොල් හරින්නාක් මෙන් ඒ මගේ පාප දෘෂ්ටින්, දෙවිය, ඔබගේ ධර්ම දේශනා නමැති වාතයෙන් පා කර හරිමි, **නදියා වා සීඝගාමියා** - යනු සැඩ පහ රින් ගලන්නා වූ මහා නදියක තණ ලැලි කැබලි, කසල පා වී යන්නාක් මෙන් මගේ මිථ්‍යා දෘෂ්ටිය පා කර හරිමි, යන අදහස යි. **වමාමි පාපකං දිට්ඨිං** - යනු මගේ සිතෙහි හටගත්තා වූ මිථ්‍යා දෘෂ්ටිය මුඛයෙන් වමනය කර ඉවත දමමි. ඒයට කාරණා කීහ. **බුද්ධානං සාසනෙ රතො** - යනු යම් හෙයකින් ඒකාන්තයෙන් අමා වැහෙන්නා වූ භාග්‍යවත් වූ බුදුන්ගේ ශාසනයෙහි ඇලුනේ, සිත් ඇලවූයේ වෙමි. එහෙයින් ඒ මිථ්‍යාදෘෂ්ටි සඞ්ඛ්‍යාත විෂ වමාරමි, යන යෙදීම යි. මෙය වර්ණනා කරමින් සංගීති කාරකයෝ අවසාන ගාථාව තැබූහ.

එහි **පාමොක්ඛා** - යනු පෙර දිග දිසාවට අභිමුඛ ව, ඉදිරිය බලා **රථමාරුහි** - යනු රජ ගමන සඳහා තමන්ගේ රාජ රථයට නැංගේ ය. රථය යක්ෂයාගේ ආනුභාවයෙන් එදිනම තමන්ගේ නුවරට පැමිණ රාජ මාලිගාවට පිවිසියේ ය.

හෙතෙම ඊට පසු වෙලාවක මේ ප්‍රවෘත්තිය භික්ෂූන්ට කීයේ ය. භික්ෂූහු එය ස්ථවිර වරුන්ට දැන්වූහ. ස්ථවිරවරු තුන්වන සංගායනාවේ දී සඞ්ගායනයට සජ්ඣායනාවට නැගූහ.

නන්දක ප්‍රේත වත්‍ථු වර්ණනාව
නිමියේ ය.

——//——

# 4-4

"උට්ඨෙහි රෙවතෙ සුපාප ධම්මෙ" යනු මේ රේවතී ප්‍රේතවස්තු කථාව යි.

එය රේවතී විමානවස්තුව හා වෙනසක් නො වේ ද? එයෙහිත් එහි එන්නා වූ අර්ථෝත්පත්තියෙහි හා ගාථාවලත් යමක් කිවයුතු වන්නේ ද එය පරමත්ථ දීපනී විමාන වත්ථු වර්ණනාවෙහි කියන ලද ආකාරයෙන්ම දත යුතු යි. මෙය වනාහි නන්දිය දේව පුත්‍රයාගේ වශයෙන් විමානවස්තු පාලියෙ සංග්‍රහයට නගා ඇත ද, රේවතිය පිළිබඳ වූ ගාථා වශයෙන් රේවතී ප්‍රේත වස්තුව යයි ප්‍රේත වත්ථු පාලියෙහි නගා ඇති බව දත යුතු යි.

රේවතී ප්‍රේත වස්තු වර්ණනාව
නිමියේ ය.

——//——

# 4-5

"ඉදං මම උච්ඡුවන මහන්තං " යනු මේ උච්ඡු ප්‍රේතවස්තු කථාව ය. කවරෙක් නිසා උපන්නේ ද?

භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ වේළුවන විහාරයේ වැඩ වසන කල්හි, එක්තරා මිනිසෙක් උක්දඬු මිටියක් කර තබාගෙන එක් උක්දඬු කැබැල්ලක් කමින් යයි. එකල්හි ශීලවන්ත වූ, කල්‍යාණ ධර්ම ඇති එක් උපාසකයෙක් පිටි පසින් එන්නා වූ බාල දරුවෙකු සමග මහ මඟ ගමන් කරයි. දරුවා උක්දඬු දැක උක්දඬු කෑල්ලක් ඉල්ලා හඬයි. උපාසක තෙමේ හඬන්නා වූ දරුවා දැක, උක්දඬු ගෙන යන මිනිසා සමග කථා කළේ ය. ඒ පුරුෂයා වනාහි උපාසකයා සමග කිසිවක් කථා නො කළේ ය. උපාසක තෙමේ හඬන්නා වූ දරුවා පෙන්නා මොහුට උක්දඬු කෑල්ලක් දෙවයි කීයේ ය. ඒ අසා ඒ මිනිසා නො ඉවසමින්, අවමන් සිත් උපදවා අනාදරයෙන් එක් උක්දඬු කෑල්ලක් පිටි පස්සට විසි කළේ ය.

හෙතෙම ඉන් පසු කලෙක කළුරිය කොට බොහෝ කාලයක් පුරුදු කරන ලද ලෝභ කමේ විපාක වශයෙන් ප්‍රේත යෝනියේ උපන්නේ ය. එහි ඵලය නම් ස්වකීය කර්මයට සමාන වෙයි. අට කිරියක් (අමුණු තිස් දෙකක්) පමණ පැතිර පවත්නා වූ අදුන්වන් මෝල් ගස් පමණ උක්ගස් වලින් ඝන ව ගැවසීගත් මහත් උක්වනයක ඔහු උපතලැබී ය. ඒ ප්‍රේතයා උක්දණ්ඩක් කනු කැමතිව ඔහු උක් වනයට ගිය හොත් උක්දඬු ඔහුට හිංසා පීඩා කෙරෙත්, ඒ ප්‍රේතයා එයින් සිහි නැතිව වැටෙයි එක් දවසක් ආයුෂ්මත් මහමුගලන් ස්ථවිරයන් වහන්සේ පිඬු පිණිස රජගහ නුවරට වඩිනා සේක්, අතරමග දී ප්‍රේතයා දුටුවේ ය. ඒ ප්‍රේත තෙමේ මුගලන් හිමියන් දැක තමන් විසින් කළ කර්මය පිළිබඳ ව විචාරමින් ගාථා කීය.

ස්වාමීනි ස්වල්ප නුවූ කුසල විපාක වශයෙන් මහත් වූ උක්වනයක මම උපත ලැබීමි. එහෙත් එය දැන් මගේ පරිභෝගයට අවකාශ නො දෙයි. මේ වූකලි කෙබඳු අකුසල කර්මයක්හුගේ විපාකයක් ද?

මම යම්කිසි උක් රසයක් අනුභව කිරීමට උත්සාහ කරමි ද? ප්‍රයෝග කරමි ද, එහි දී මම කපනු ලබමි, වැනසෙමි. සුන් බල ඇතිව බැගෑපත්ව, අතිශයින්

විලාප කියමි. මේ කෙබඳු අකුසල කර්මයක විපාකයක් ද?

ස්වාමීනි ! මම ශක්ති නැති ව ( මූර්ඡාවී ) බිම වැටෙමි. ගොඩට ගත් මත්ස්‍යයකු අව්වෙන් රත්වූවාක් මෙන් පෙරළෙමි. හඬන්නා වූ මගේ ඇස්වලින් කඳුළු ගලන්නේ ය. මේ කෙබඳු අකුශල කර්මයෙක විපාක ද? කියා කියනු මැනවි.

හිමියනි ! බඩ ගිනි ඇත්තේ වෙමි. උගුර තොල් තල්ල වියලුනේ ය. සිහිල් සුවය නොවිඳිමි. කෙසේ නම් උක්රස අනුභව කරන්නෙම් ද? මේ කාරණය මම ඔබගෙන් විමසමි.

ඔබ පෙර ආත්ම භවයෙහි මිනිසෙක් වී ඉපිද සිටියේ ය. එහිදී අකුසල කර්මයන් කෙළෙහි ය. ඒ පිළිබඳ විස්තර මම තොපට කියමි. තොප එය අසා දනුව.

ඔබ දිනක් උක් දන්ඩක් කමින් (පාරේ) ගියේ ය. ඔබේ පිටු පසින් තව පුරුෂයෙක් ලුහු බැඳ ගියේ ය. හෙතෙමේ ඔබට කිට්ටු වී ළං වී ආමන්ත්‍රණය කරමින් කථා කළේ ය. ඔබ ඔහු සමග කථා නො කළේ ය.

හෙතෙමේ කථා නො කරන ඔබගෙන් උක්දණ්ඩක් දෙවයි ඇයැදී ය. ඔබ ඔහුට පිටුපසින් උක් දණ්ඩක් දූමී ය. ඒ කර්මයාගේ විපාකය මෙය යි.

එබැවින් තෝ පිටිපසින් උක්දඬු ගනුව, එසේ ගෙන යැපෙන තාක් කනු මැනවි. එයින් තෝ සතුටු සිත් ඇති වන්නෙහි ය. තුටු වූයේ වන්නේ ය. ඔද වඩවා පිණා යන්නේ ය.

ඒ ප්‍රේත තෙමේ ගොස් පිටිපසින් උක්ගස් ගත්තේ ය. එසේ ගෙන යැපෙන තරම් ඇති තාක් කෑවේ ය. එයින් ඔහු සතුටු සිත් ඇත්තේ වූයේ ය. ඔදවැඩි බවට පැමිණියේ ය. පුමුදිත වූයේ ය.

මේ ප්‍රේතයා විසින් ද, මුගලන් තෙරුන් විසින් ද කියන ලද ගාථා යි.

එහි **කිස්සා** - යනු කෙබඳු ආකාරයක කර්මයක් ද යන අදහස යි. **හඤ්ඤාමි** - යනු විනාශ වෙමි. පීඩාවට පත්වෙමි. **විහඤ්ඤාමි** - යනු බාධා කළෙමි. විශේෂයෙන් පෙළෙමි යන අර්ථ යි. **ඡිජ්ජාමි** - යනු කම් කඩුපත් වලින් කපන්නාක් මෙන් උක් කොළවලින් මගේ සිරුර කැපේ යන අර්ථ යි. **වායමාමි**, යනු උක්දඬු කෑමට උත්සාහ කරමි. **පරිසක්කාමි** - යනු ප්‍රයෝග කරමි උපායයොදමි **පරිභුඤ්ජිතුං** - යනු උක්රස විඳීමට කෑමට යන අර්ථ යි. **ඡින්නත්ථාමො** - යනු සිඳුනා වූ උත්සාහ ඇතිව, සිඳුනා වූ වීර්ය ඇතිව, පිරිහීගිය ශක්ති ඇතිව, **කපණො** - යන දීන වූ, **ලාලපාමි** - යනු දුකින් ආද්‍ර වී, දුකින් මැඩ පැවැත් වී, අතිශයින් වැළපීමි. **විඝාතො** - යනු සිතේ කරදරයට පත්වී, සුන් වූ ශක්තිය ඇතිවී, **පරිපතාමි ඡමායන්ති** - යනු නැඟී සිටින්නට අපොහොසත් වන්නේ බිම පෙරළෙමි **පරිවත්තාමි** - යනු කරකැවෙමි. පරිභ්‍රමණය වෙමි. **වාරිචරොවා** - යනු මාළුවෙකු මෙන්, සමෙම යනු ග්‍රීෂ්ම කාලයේ පොළවේ, **සන්තසිතො** - යනු උගුර තොල් තල්ල ආදිය වියළී තැවුණු ස්වභාවයෙන් යුතුව, **සාතසුඛං** යනු සිසිලස නමැති සුවය, **න වින්දෙ** - නො ලබමි. **තං** යනු ඔබ **විජානා** යනු දැනගනුව, අවබෝධ කරව, **පයාතො** - යනු යන්නට සුදානම් වීම **අන්වගඡ්** - යනු ලුහුබැඳ ගියේ ය. **පච්චාසනෙන්තා** - යනු ප්‍රාර්ථනා කරන්නේ **තස්සෙතං කම්මස්සා** - යනු මෙහි **එත** යනු නිපාතයක් පමණි. ඒ කර්මයාගේ යන අර්ථයි. **පිට්ඨිතො ගණ්හයාසි** - යනු තමාගේ පිටු පසින් ම උක්දඬු ගනු මැනවි. **පමොදිතො** - යනු සතුටට පත්වූයේ **ගහෙත්වාන තං බාදි යාවදත්ථං** - යනු තෙරුන්ගේ ආඥා නියමයෙන් උක් ගෙන කැමැති පරිද්දෙන් කා මහත් වූ උක්ගසක් ගෙන තෙරුන්ට පැමිණවී ය. ස්ථවිර තෙමේ ඔහුට අනුග්‍රහ කරනු පිණිස එකෙණෙහි ම ඒ උක්දණ්ඩ ගෙන වේළුවනාරාමයට ගොස් භාග්‍යවතුන් වහන්සේට දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සඞ්ඝයා සමඟ පරිභෝග කොට (පින්) අනුමෝදන් කළේ ය. ප්‍රේතයා පහන් සිත් ඇතිව වැඳ ගියේ ය. එතැන් පටන් සුවසේ උක්ගස් කෑයේ ය. හෙතෙම ඉන් පසු කාලයක මරණයට පත්වී තව්තිසා දෙව්ලොව උපන්නේ ය. ඒ ප්‍රේතයාගේ ප්‍රවෘත්තිය මිනිස් ලොව ප්‍රකට වූයේ ය. ඉක්බිති මිනිස්සු ශාස්තෘන් වහන්සේ වෙත එළඹ ඒ පුවත විචාළාහු ය. ශාස්තෘන් වහන්සේ ඔවුන්ට ඒ අර්ථය විස්තරකොට ධර්ම දේශනා කළහ. ඒ අසා මිනිස්සු මසුරුමළයෙන් දුරුවූවෝ වූහ.

උච්ඡු ප්‍රේත වස්තු වර්ණනාව

නිමියේ ය.

——//——

# 4-6

"සාවත්ථි නාම නගරං " ආදියෙන් ඇරඹෙන මෙම කථා වස්තුව ශාස්තෘන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසද් දී, ප්‍රේතයන් දෙදෙනකු අරභයා වදාළ සේක. සැවැත් නුවර වනාහි කොසොල් රජුගේ පුත්‍රයන් දෙදෙනෙකු ප්‍රථම වයසෙහි සිටියාහු යෞවන මදයෙන් මත් වී පරදාර අකුශල කර්මය කොට, කළුරිය කොට, දිය අගලක් මතුපිට ප්‍රේතයන් වී ඉපදුනාහ. ඔව්හු රාත්‍රියෙහි භයානක ශබ්දයකින් මුරගා හැඬුවාහු ය. මිනිස්සු ඒ අසා බියෙන් (ත්‍රස්ත වී) තැති ගෙන මෙසේ කළ කල්හි මේ අවමගුල සන්සිඳේවිය යි සිතා බුදුන් ප්‍රමුඛ භික්ෂු සඞ්ඝයාට මහා දන් පවත්වා ඒ ප්‍රවෘත්තිය භාග්‍යවතුන් වහන්සේ ට සැළකළාහු ය. භාග්‍යවතුන් වහන්සේ උපාසකවරුනි ! ඒ ශබ්දය ඇසීමෙන් තොපට කිසිත් අන්තරාවක් නොවේය යි වදාරා ඔවුන්ට ධර්මදේශනා කිරීම පිණිස මේ ගාථා වදාළහ.

හිමාලය වනයාගේ එක් පැත්තකින් සාවත්ථි නමින් නුවරක් වූයේ ය. එහි රජ පුත් වූ කුමාරවරු දෙදෙනෙක් සිටියාහුය යි මා විසින් අසන ලදී.

සිත් ඇලවිය යුතු කාමයන්හි ඇළුණු කම් සුව විඳිමින් සතුටුවන සුළු වූ වර්තමාන සැප සම්පතෙහි පමණක් ගිජු වූ ඔවුහු අනාගත සැපය නො බැලුවාහු ය.

ඔවුන් දෙදෙන මේ මනුෂ්‍ය ආත්ම භාවයෙන් චුතව, පරලොවට පැමිණියෝ ය. ඔව්හු තමන්ගේ පෙර දුශ්චරිතයන් නිසා නොපෙනෙන සුළු රූප ඇතිව මේ සැවැත්නුවර අසල දූන් විලාප දෙත්.

නොයෙක් පිදිය යුත්තන් සිටි කල්හි, දියයුතු වස්තුව තිබුණු කල්හි, තමන්ට සැප එලවන්නා වූස්වල්ප වූ ද පිනක් කරන්නට නො හැකි වීමු.

අපි යම් පව්කමකින් රාජ කුලයෙන් චුතව ප්‍රේත ලෝකයෙහි උපන්නාහු සාපිපාසා දුකින් මඩන ලදුව හැසිරෙමු. ඊට වඩා ළාමක වූ පාප කර්මයක් තවත් කොයින් ද?

මෙලොව දී (මිනිස් ලොවෙහි දී) ස්වාමියන් වී සිට දැන් අස්වාමිකයෝ වෙත්, මිනිස් බැවින් උසස් වූ ඒ මිනිස්සු ප්‍රේත යෝනියෙහි පහත්ව ඉපිද සා පිපාසා දෙකින් යුක්තව හැසිරෙත්.

මිනිස්සු ඉසුරු මදයෙන් මත් වී, එහි දෝෂය දැන, ඉසුරුමදය හැරපියා ස්වර්ගයට යන්නෙක් වන්නේ ද ඥාණවන්ත වූ ඒ මිනිසා ශරීරයාගේ බිඳීමෙන් ස්වර්ගයට පැමිණෙ යි.

එහි - **ඉති මෙ සුතං** - යනු හුදෙක් තමන්ගේ නුවණැසින්ම දැක, ඉක්බිති ලෝකයෙහි ප්‍රකට බැවින් මෙසේ මා විසින් අසන ලදී යන අර්ථ යි. **කාමස්සාදාභි නන්දිනො** - යනු කාම ගුණයන්හි ආශ්වාද වසයෙන් සතුටුවන සුලු **පච්චුප්පන්න සුඛෙ ගිද්ධා** - යනු වර්තමාන සුවයෙහි පමණක් ගිලී ගැති වී, **න තෙ පස්සං සුනාගතං** - යනු දුසිරිත් හැර සුචරිතයෙහි හැසිර අනාගත භවයෙහි දෙව මිනිස් සුව ලැබීමට සුව විඳීමට ඔව්හු නොසිතූහ. **තෙධ සොසෙන්ත්‍ය දිස්සන්තා** - යනු ඔව්හු පෙර රාජ පුත්‍රයන් සෝෂා කරත්, හඬක් කුමක් නිසා හඬන්නේ ද යත් කීයේ ය. **පුබ්බෙ දුක්කට මත්තනො** යනු දැන් ඒ ඔවුන්ගේ හැඩීමට වැළපීමට කාරණ හේතු- ඵල බෙදා දැක්වීමට, **බහුසු වත සන්තෙසු** - ආදිය කියන ලදී. එහි **බහුසු සන්තෙසු** - යනු අප්‍රමාණ වූ දක්ෂිණාර්හයන් පෙනී පෙනී, **දෙය්‍ය ධම්මෙ උපට්ඨිතෙ** - යනු තමන් සන්තකයෙහි දියයුතු දාන වස්තුව අත ළඟම තිබිය දී, ලැබී තිබිය දී යන අර්ථ යි. **පරිත්ත සුඛාවහං** - අනාගතය සඳහා සැප එළවන්නා වූ ස්වල්ප මය වූ පින්කමක් වත් කිරීමට තමන්ට සුවසේ නිරුපද්‍රිත ව කරන්නට නො හැකි වූවෙමු යන යෙදීම යි. **කිං තතො පාපකං අස්සා** - යනු එහෙයින් ළාමක වූ පාපී වූ අනිකක් ම අප විසින් කරන ලදී. **යං නො රාජකුලා චුතා** - යම්කිසි පාප කර්මයකින් අපි රජ කුලයෙන් චුත වූවෝ මෙහි ප්‍රේත විශයෙහි ප්‍රේතයන් වී ඉපදී සා පිපාසා දෙකින් යුක්ත ව හැසිරෙමු . යන අර්ථ යි. **සාමිනො ඉධ හුත්වාතා** යනු මේ ලෝකයෙහි යම් කිසි තැනක පෙර ස්වාමීන් වී හැසිරෙත්. දැන් එහිම එතැනම අස්වාමිකයන් වී හැසිරෙති. **මනුස්සා උන්න තොනතා** - යනු මිනිසුන් ව සිටි කාලයේ ස්වාමීන් වී කළුරිය කොට කර්ම වශයෙන් අඩු පාඩු ඇතිව හැසිරෙත්. සා පිපාසා දෙකින් යුතුව, සංසාරයාගේ ප්‍රකෘති ස්වභාවය බලනු මැනවි. **එවමාදිනවං ඤත්වා ඉස්සරමද සමභවං** - යනු මෙසේ ඓශ්වර්ය මදයෙන් මත් වී හටගන්නා වූ

අපායෙහි ඉපදීම් සංඛ්‍යාත ආදීනව දෝස දැක, ඓශ්වර්ය මදයෙන් පුණ්‍ය කර්මවලින් ඈත් වී සිට **භවෙ සගඟ ගතො නරො** - යනු ස්වර්ගයට දිව්‍ය ලෝකයට යෑම සුදුසු වන්නේ ය.

මෙසේ ශාස්තෘන් වහන්සේ ප්‍රේතයන්ගේ ප්‍රවෘත්ති කථාව වදාරා ඒ මිනිසුන් විසින් දෙන ලද දානයේ පින් ප්‍රේතයන් වෙත උදෙසා පැමිණ සිටි පිරිසගේ අදහස් අනුව ධර්ම දේශනා කළ සේක. එම දේශනා තොමෝ මහා ජනයාට සාර්ථක වූයේ ය.

**කුමාර ප්‍රේත වස්තු වර්ණනාව**
**නිමියේ ය.**

——//——

# 4-7

**"පුබ්බෙ කතානං කම්මා නං "** ආදියෙන් ආරම්භවන මේ ප්‍රේත වස්තු කථාව ශාස්තෲන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන කල්හි රාජ පුත්‍ර ප්‍රේතයකු අරභයා වදාළ හ. එහි අතීතයෙහි යම් කිතවස්ස නම් රජ කෙනෙක් වූයේ ද? ඒ රජුගේ පුත්‍රයා අතීතයෙහි වූ පසේ බුදුවරයකුට අපරාධ කොට බොහෝ අවුරුදු ගණනක් නිරයේ පැසී, ඒ කර්මයාගේම ඉතිරි වූ විපාකයෙන් ප්‍රේතයකු වී උපන්නේ ද? ඔහු මෙහි රාජපුත්‍ර ප්‍රේතයා යනුවෙන් හඳුන්ව යි. ඔහු ගේ කථාව යට කී සානුවාසික ප්‍රේතයාගේ කථා වස්තුවෙහි විස්තර වශයෙන් ආයේ ම ය. එහෙයින් එහි කී ආකාරයෙන් ම ගතයුතු යි. එකල්හි සාණුවාසික තෙරුන් තමන් ගේ ඥාති ප්‍රේතයන් පිළිබඳව කී කල්හි ශාස්තෲන් වහන්සේ හුදෙක් තොපගේ නෑයෝ පමණක් ප්‍රේතයෝව නො උපදිත්, ඔබ ද මෙයින් ඉක්ම ගිය අත් බැව්හි දී ප්‍රේතයෙක් වී මහා දුක් වින්දේ ය, යනුවෙන් කී කල්හි, ඒ තෙරණුවන් විසින් ආයාචනා කළ කල්හි, මේ රාජ පුත්ත ප්‍රේතවස්තුව වදාළ සේක.

පෙර ජන්මයන්හි කරන ලද අකුසල කර්මයන්ගේ විපාකය සිත මනරම් වූ කල්හි රූප, ශබ්ද, ගන්ධ රස, ස්පර්ශ හේතුවලින් මැඩ පවත් වන්නේ ය.

බොහෝ වූ නැටුම් - ගැයුම්, කාමරතිය, ක්‍රීඩා ආදිය විඳ උයනෙහි සිත් අලවා රජගහ නුවරට පිවිසෙන්නේ,

දමුණු සිත් ඇති, සමාහිත වූ, අල්පේච්ඡ වූ, ලජ්ජා සහිත වූ පාත්‍රයට ලැබුණු දෙයකින් ආහාරයෙහි සතුටු වූ, සුනේත්‍ර නම් පසේ බුදුන් දුටුවේ ය.

රාජ පුත්‍රයා ඇතු පිටින් බැස ස්වාමීනි පිණ්ඩපාතය ලබන ලද්දේ දැයි විමසා උන්වහන්සේගේ අතින් පාත්‍රය ඇරගෙන උඩට ඔසවා

තද පොළවෙහි පාත්‍රය ගසා බිඳ දමා සිනහසෙමින් මදක් ඉවත්ව සිට මහණ ! මම කිතව රජුගේ පුත්‍රයා වෙමි. ඔබ මට කුමක් කරන්නෙ හි ද?

ඒ අකුශල කර්මයාගේ විපාකය කටුක විය. ඒ කර්මයෙන් රාජ පුත්‍රයා නිරයෙහි උපන්නේ ය.

කරන ලද දරුණු පව් ඇති ඔහු, සුවාසුදහස් සයක්ම, අවුරුදු නහුත ගණනක් නරකයෙහි මහා දුකට පැමිණියේ ය.

අඥාන වූ රාජ පුත්‍රයා උඩු බැලීම ද, යටි කුරුව ද, වම් ඇලයෙන් හා දකුණු ඇලයෙන් යුතුව ද, උඩුකුරු පා ඇතිව ද, බොහෝකල් නිරයේ පෙළුණේ ය.

කරණ ලද පව් ඇති ඔහු නොයෙක් අවුරුදු දහස් ගණනක් මුළුල්ලේ නිරයෙහි ඉතාමත් දුකට පැමිණියේ ය.

අපරාධයන් කෙරෙහි මෛත්‍රී පතුරුවන, යහපත් පැවැතුම් ඇති, ඍෂි වරයන් වෙත, වැරදි අත්දමින් මෙවැනි පව්කම් කරන පුද්ගලයෝ එබඳුම වූ කටුක වූ දරුණු වූ විපාක විඳිත්.

ඒ රාජ පුත්‍රයා ඒ නරකයෙහි බොහෝ කාලයක් මුළුල්ලෙහි අනේක දුක් විඳ එයින් චුත වූයේ, සා  පිපාසා දෙකින්ම මැඩුණා වූ ප්‍රේත යෝනියෙහි ඉපිදුනේ, ප්‍රේතයෙකු වී.

යම් කෙනෙක් සම්පත් මදයෙන් මත් වී කරන පාප කර්මයන්හි ආදීනව දැක, ඉසුරු මදය හැරපියා යටහත් පැවැත්මෙන් පවතින්නේ ද

බුදුන් කෙරෙහි ගෞරව සහිත වේ ද? නුවණැත්තෙක් වූ හෙතෙම මේ ආත්මයේ දීම පැසසීමට භාජනය වී, මරණින් මතු දෙව් ලොවට පැමිණේ

මෙම රාජපුත්‍ර ප්‍රේත වස්තුව වදාළ සේක.

**එහි පුබ්බෙ කතානං කම්මානං විපාකො මථයෙ මථං** - යනු පෙර ජාතිවලදී කරන ලද අකුසල කර්මයන්ගේ විපාකය, මහත්ව උපදිනු ලබන්නේ, අඥබාලයන්ගේ සිත් කළඹන්නේ ය. මැඩපවත්වන්නේ ය. අනුන්ට අනර්ථ කිරීමෙන් තමන්ටම අනර්ථ උපදවා ගන්නේ ය, යන අදහස යි. දූන් සිත

මර්දනය කිරීම් වශයෙන් දක්වන්නට, **රූපෙ සද්දෙ** - ආදිය කියන ලදී. එහි, **රූපෙ** - රූපහේතුවෙන්, යම් රූපාරම්මණයක් ලැබීම නිමිති කොට ගෙන යන අර්ථ යි. **සද්දෙ** - ආදියෙහි ද මේ න්‍යායමයි ක්‍රමය මැයි. මෙය සාධාරණ කිරීමේ අර්ථයෙන් අසාධාරණ නියමයන් දක්වන්නේ, **නච්චගීත** ආදිය කීයේ ය. එහි **රතිං** යනු කාමයේ ඇල්මයි. **ඛිඩ්ඩං** යනු යහළුවන් හා කරන ක්‍රීඩාව යි. **ගිරිබ්බජං** යනු රජගහ නුවර යි. **ඉසිං** යනු අශෛක්ෂ වූ සීලාදීන් ගෙන් යුක්ත වන අර්ථයෙන් ඉසි යනු වේ. **සුනෙත්ත** - මේනම් පසේ බුදුන් වහන්සේ, **අත්ත දන්තං** - යන උතුම් වූ දැමීමෙන් දමනය කරන ලද සිතින් **සමාහිතං** - යනු අර්හත් ඵල සමාපත්තියෙන් සමාහිත වූ, **උඤ්ඡෙ පත්ත ගතෙ රතං** යනු භික්ෂාචාරයෙන්, පිණ්ඩ පාතයෙන් පාත්‍රයට ලැබුණු දෙයකින් ආහාර වශයෙන් සතුටු වන්නා වූ, **ලද්ධා භත්තෙනති ච බ්‍රැවී,** යනු ස්වාමීනි පිණ්ඩපාතය ලැබුනේ ද විශ්වාසනීය අර්ථයෙන්, කීයේ ය. **උච්චං පග්ගය්හා** - යනු එසවීමට හැකිතාක් පාත්‍රය ඔසවා, **ථණ්ඩිලෙ පත්ත මභින්දිත්වා** - යනු ගොරෝසු වූ තද වූ මහ පොළවේ ගසා පාත්‍රය බිඳ, **අපක්කමී** - යනු මදක් ඈතට ගියේ ය, අඥබාල වූ මේ තරුණයා නිකරුණේ මහා අනර්ථයකට තමන් විසින්ම පත්වන්නේ යයි, කාරුණික වශයෙන් බැලූ පසේ බුදුන්ට රාජ පුත්‍රයා මෙසේ කී ය, **රඤ්ඤො කිතවස්සාහං පුත්තො - මං භික්ඛු කරිස්සසී** - යනු මම කිතව රජුගේ පුත්‍රයා වෙමි. මේ මුඩු මහණ මට කුමක් කරන්නෙහි ද? **එරූසස්සා** - දරුණු ලෙසින්, කටුකො අනිටු ලෙසින්, යං යම් විපාකයක්, **සමප්පිතො** - යනු ඇලුනේ ඡළෙවා **චතුරාසීති වස්සානි, නහුතානි චා** - අවුරුදු අසුහාර දහ බැගින් සයවරක්, උඩුකුරුව සයනය කිරීමෙන්, යටිකුරුව හෙවීමෙන්, වම් පසින් ද දකුණු පසින් ද, හා උඩුකුරුව ද දෙපා එල්බෙමින් ද, ඒ ඒ එක් එක් වසර අසූ හාර දස බැගින් දුක් වින්දේ ය. එහෙයින් කියන ලද,

යම් හෙයකින් මේ වර්ෂයෝ නහුතයක් වේ. එහෙයින් නහුතා යයි කියන ලදී. **භුසං දුක්ඛං නිගච්ඡත්ථො** - යනු අතිශය වූ දුකට පැමිණියෙමි. **පූගානි** - යනු අවුරුදු සමූහ මුළුල්ලේ, මෙය පෙර ගාථාව ද සමග අත්‍යන්ත සංයෝගයේ උපයෝග වචනයයි දතයුතු යි. **එතාදිසං** යනු මෙබඳු වූ, **කටුකං** - යනු මහත් දුක්, භාව නපුංසක නිර්දේශය යි. **එකමන්තං නිසිදි** ආදිය මෙනි. කුඩා වූ ද දෝසයන්ගෙන් ද වෙන් වූ, මනා පැවතුම් ඇති උතුමන් කෙරෙහි තරහ බවින් ක්‍රෝධයෙන් යුතුව පාපකර්ම කරන

පුද්ගලයන්ට මෙබඳු වූ දුෂ්කර වූ, අතිශය දුක්වලට පැමිණීමට හේතු වේ, යන යෙදීම යි. **සො** - යන ඒ රාජ පුත්‍රයා - **තත්‍ථා** - යනු නිරයෙහි **දුක් වේදයිත්‍වා** යනු විඳ අනුභව කොට, **නාමා** යන ඉහත ප්‍රකට වූ ආකාරයෙන් **තතො** චුතො - නිරයෙන් චුත වූයේ, ඉතිරිය කියන ලද පරිදි ම ය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ රාජ පුත්‍රයාගේ ප්‍රේත කතා වස්තුව රැස් වූ මහ ජනයා ඉදිරිපිට දී වදාරා සංවේග උපදවා මත්තෙහි සිව් සස් වදාළ සේක. චතුරාර්ය සත්‍යය දේශනාවේ කෙළවර බොහෝ දෙනා සෝවාන් ආදී මාර්ග ඵලවලට පැමිණියා හු ය.

**රාජ පුත්‍ර ප්‍රේත වත්‍ථු වර්ණනාව**
**නිමියේ ය.**

——//——

# 4-8

"ගූථ කූපතො උග්ගන්ත්වා" ආදී මේ ප්‍රේත කථා වස්තුව ශාස්තෲන් වහන්සේ ජේතවන විහාරයෙහි වැඩ වාසය කරන්නේ එක් අශුචි අනුභව කරන්නා වූ ප්‍රේතයකු අරභයා වදාළ සේක.

සැවැත් නුවරට නුදුරෙහි එක්තරා ගමක එක්තරා කෙළඹියෙක් කුළුපග භික්ෂුවක් උදෙසා විහාරයක් කරවී ය. නොයෙක් ජනපදවලින් පළාත් වලින් පැමිණි භික්ෂූහු එහි විසූහ. ඒ භික්ෂූන් දුටු මිනිස්සු පැහැදුනු සිතින් යුතුව සිව්පසයෙන් උපස්ථාන කළහ. කුළුපග භික්ෂුව එය නො ඉවසා ඊර්ෂ්‍යාවෙන් යුතුව ඒ භික්ෂුන්ගේ දොස් දක්වන්නේ කෙළෙඹියා වෙත නුගුණ කියවී ය. කෙළෙඹියා ඒ භික්ෂූන්ට ද, කුළුපග භික්ෂුවට ද දොස් පැවරී ය. අනතුරුව කුළුපග භික්ෂුව කළුරිය කොට එම විහාරයෙහිම වැසිකිළියේ ප්‍රේතයකු වී උපන්නේ ය. කෙළඹියා ද කළුරිය කොට ඒ ප්‍රේතයාගේම හිස මත්තෙහි ප්‍රේතයකු වී උපන්නේ ය. ආයුෂ්මත් මහා මුගලන් ස්ථවිරයෝ මේ දෙදෙනා දැක විමසමින් මේ ගාථාව කීහ.

කවරෙක් නම් අශුචි වළෙන් නැගී බැගෑපත් ව ඉන්නේ ද? පාප කර්ම වලින් පෙළුණු ඔබ කෙසේ නම් නිසැකව හඳුනාගන්නේ ද?

එය ඇසු ප්‍රේතයෝ

මා විසින් කරවන ලද ආවාසයෙහි ඊර්ෂියාවෙන් පෙළුණු කුලයා කෙරෙහි මසුරු වූ තද මසුරු සිත් ඇති පරිභව කරන්නා වූ, තෘෂ්ණාවෙන් බැඳුණු නේවාසික කුළුපග භික්ෂු නමක් සිටියේ ය.

ඒ කුළුපග භික්ෂුවගේ කීම් ඇසු මම ප්‍රියශීලි ශික්ෂාකාමී භික්ෂූන්ට නින්දා කළෙමි. ඒ අකුසල කර්ම විපාකයෙන් ප්‍රේත ලෝකයේ උපන්නෙමි.

එහි **අහු ආවාසිකො මය්හං** - යනු මගේ ආවාසයෙහි, මා විසින් කරවන ලද විහාරයෙහි එක් භික්ෂුවක් නේවාසිකව ස්ථිර පදිංචි කරුවෙකුව සිටියේ ය. **අජ්ඣාසිතො මය්හං ඝරෙ** - හිතවත්කම නිසා කුළුපග වීම නිසා. මගේ

ගෙහි තෘෂ්ණාභි නිවේසන වසයෙන් බැඳීමෙන් ඇතුළත්වීමෙන් (එය කරවී ය) **තස්ස** යනු ඒ කුළුපග භික්ෂුවට, **භික්ඛවො** - යනු භික්ෂුව, ශ්‍රමණයා **පරිභාසිතනති** - යනු ආක්‍රොශ කළේ ය. ( පරිභව කළේය) **පෙතලොකෙ මිතො ගතො** - යනු මේ ආකාරයෙන් ප්‍රේත යෝනියට පැමිණියේ, ප්‍රේතයෙක් වූයේ,

තොපට මිත්‍ර ස්වරූපයෙන් කුළුපග වූ, අමිත්‍ර වූ, යම් මහණෙක් වී ද? ඒ අනුවණයා මරණින් මතු පරලොව කෙබඳු ගතියකට පැමිණියේ ද?

එහි **මිතත වණෙණා** - මිත්‍ර රූපයෙන් මිත්‍ර පතිරූපකයෙක් වශයෙන් නැවත ප්‍රේත තෙමේ තෙරුන්ට තම අදහස් ප්‍රකාශකරන්නේ, ගාථා දෙකක් කීහ.

ඒ පාපකර්මය කරන ලද, ඒ ශ්‍රමණ ප්‍රේතයාගේ හිස මුදුනේම මම දූන් සිටිමි. හෙතෙමේ ද ප්‍රේත ලෝකයට පැමිණියේ මගේම මෙහෙකරුවෙක් වූයේ ය.

ස්වාමීනි ! සෙස්සෝ යම් අශුචියක් හෙළත් ද? ඒ මගේ ආහාරය වේ. මම යම් අශුචියක් හෙළන්නේ ද ඒවා අනුභව කිරීමෙන් ඒ ශ්‍රමණ ප්‍රේතයා දිවි රැකගනියි.

එහි තසෙසවා - යනු ඒ මගේ පූර්ව ආත්ම භාවයේ දී කුලුපග භික්ෂුව වූ ප්‍රේතයාගේ **පාපකමම සසා** - යනු පවිටු වූ වැරදි සහගත වූ හැසිරීම් ඇති පැවැතුම් ඇති - **සීසෙ තිටඨාමි මත්ථ කෙ**- යනු ඔළුව උඩ සිටිමි. සිටියේ ද මුදුනෙහිම සිටමි. සීස ප්‍රමාණ වූ අහසෙහි නො වෙමි යන අර්ථ යි. **පරවිසයං පතොතා** - යනු මිනිස් ලොව ඉපිදසිට, වෙනත් විෂය කට ආත්මභාවයකට යන්නේ ප්‍රේත විෂයටම ගියේ ය. පත්වූයේ ය. **මමෙවා** - යනු මගේම මෙහෙකරුවෙක් වූයේ ය. යන වචනයි. **යංහදනෙත හදනකඤෙඤා** - යනු ස්වාමිනි ආර්ය වූ මෞද්ගල්‍යායනයන් වහන්ස ! ඒ වැසිකිළියෙහි අන්‍යයෙහි වර්චස් හෙළත් ද? **එතං මෙ හොති භොජනං** - යනු ඒ අශුචි දවසක් දවසක් පාසා මට අහාර වේ.

**යං හදාමි** - ඒ වර්චස් අනුභව කොට මම වර්චස් කෙරෙමි ද? **එතං සො උපජීවති** - යනු ඒ මගේ වර්චස් ඒ කුලුපග ප්‍රේතයා දිනපතා අනුභව කරමින්, ඔහු ජීවත්වෙයි. ආත්ම භාවය පවත්වාගෙන යයි යන අර්ථ යි.

ඔවුන් දෙදෙනා අතුරෙන් කෙළෙඹි තෙමේ සුපේශල සිල්වත් භික්ෂූන්ට "මේ ආහාර වළඳනවාට වඩා තොපගේ අශුචි කෑම හොඳයයි බැණ වැදුනේ ය. කුලූපග භික්ෂුව වනාහි කෙළෙඹියා එසේ කීමෙන් පොළඹවා තෙමේ ද එසේම බැණ වැදුනේ ය. ඒ නිසා ඒ කුලූපග ප්‍රේතයාගේ ජීවිකාව කෙළෙඹියාගේ ජීවිකාවටත් වඩා කිලිටු වූයේ ම ය.

ආයුෂ්මත් මුගලන් ස්ථවිරයෝ මේ කථා පුවත භාග්‍යවතුන් වහන්සේට දැන් වීය. භාග්‍යවතුන් වහන්සේ එය අර්ථෝත්පත්ති කොට ගෙන ඊර්ෂා කිරීමෙහි ආක්‍රොශ කිරීමෙහි ආදීනව දක්වා පැමිණ සිටි පිරිසට ධර්මදේශනා කළහ. ඒ දේශනාව මහා ජනයාට සාර්ථක වූයේ ය.

ගූථ ඛාදක ප්‍රේත වත්‍ථු වර්ණනාව
නිමියේ ය.

——//——

## 4-9

"ගූථ කූපතො උග්ගන්ත්වා" ආදී මේ ප්‍රේත වස්තු කථාව ශාස්තෘන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවාසය කරමින්, එක්තරා අශුචි කන්නා වූ ප්‍රේතියක අරභයා දේශනා කළහ.

එහි වස්තුව ඉහත කී (ගූථඛාදක ප්‍රේතවස්තුව) හා සමාන වේ. එහි උපාසකයා විසින් විහාරය කරවන ලද්දේය කිය උපාසකයා වසයෙන් ආයේ ය. මෙහි වනාහි උපාසිකාවක වීමම විශේෂ යි. ඒ කථාවස්තුවේත් ගාථාවලත් වෙනසක් නැත්තේ ය.

ගූථ ඛාදක පෙති වස්තු වර්ණනාව
නිමියේ ය.

——//——

## 4-10

"**නග්ගා දුබ්බණ්ණ රූපාත්ථ**" ආදී වශයෙන් ආරම්භවන ප්‍රේත වස්තුව, ශාස්තෲන් වහන්සේ ජේතවනයෙහි වැඩ වාසය කරන කල්හි ප්‍රේතයන් සමූහයක් අරභයා දේශිතය හ. සැවැත්නුවර වනාහි මිනිසුන් සමූහයක්, කණ්ඩායමක් වී අශ්‍රද්ධාවෙන් යුතු ව, අප්‍රසන්න භාවයකින් යුතු ව, මසුරු මළයෙන් පරිපීඩිත සිත් ඇති ව, දානාදී සුචරිත ක්‍රියාවන්ට විරුද්ධ ව, කාල යක් ජීවත් වී, කය බිඳීමෙන් (මරණයෙන්) පසු ව නගරය සමීපයෙහි ප්‍රේත යෝනියෙක ඉපදුනාහු වෙති. එක්දවසක් ආයුෂ්මත් මුගලන් ස්ථවිරයන් වහන්සේ සැවැත්නුවර පිඬුපිණිස හැසිරෙන්නේ අතරමග දී ප්‍රේතයන් දැක මේ ගාථාවෙන් කරුණු විචාළහ.

තෙපි විලි වැස්මක් නැතිව නග්නව, කෘශ වී, ඉල්පී ගිය නහර වැල් ඇතිව, උස්ව නැගුණු ඉල ඇට පෑදී, දුර්වර්ණව, දුර්වල ශරීර ඇත්තෝ ය. තෙපි කවරහු ද?

එහි **දුබ්බණ්ණ රූපාත්ථ** යනු දුර්වර්ණ ශරීර ඇත්තෝ වවු කෙනු තුමෙහත්ථ - යනු තෙපි කිනම්හු වෙත් ද? **මාරිසා** යනු ඔහු තමන්ගේ ස්වරූප වශයෙන් අමතයි. ඒ අසා ප්‍රේතයෝ

ස්වාමීනි අපි යමලෝකය යයි කියනු ලබන ප්‍රේත ලෝකයේ උපන් දුකට පැමිණියා වු ප්‍රේතයෝ වෙමු. මිනිස්ලොව දී පව්කම් කොට ප්‍රේත ලෝකයෙහි උත්පත්තිය ලැබුවෙමු.

යන ගාථාවෙන් තමන්ගේ ප්‍රේත භාවය ප්‍රකාශ කොට,

නැවත තෙරුන් විසින් මෙසේ අසන ලදී.

ඔබලා මිනිස් ලොව දී කය වචනය සිත යන තිදොරින් කවරනම් අකුශල කර්ම කළාහු ද? කවර කර්මයක විපාකයකින් ප්‍රේතයන් වී උපන්නාහු ද? යන ගාථාවෙන් කරන ලද කර්මය විචාළේ ය.

මහණ බමුණන් ඇති කල්හි, දිය යුතු දාන වස්තුව අප සන්තකව පැවති කල්හි, කිසිවෙකු විසින් නො වළක්වන ලද්දා වූ අපි, අඩ මස්සක් පවා විශේෂයෙන් රැස් කළෙමු. තමන්ට පිහිටක් වන පරිද්දෙන් කිසිවෙකුට කිසිවක් නො දුන්නෙමු. තෘෂ්ණායෙන් මැඩුණෙමු.

දිය පිපාස වූ විට නදිය කරා පැමිණියහොත් නදියේ ජලය හිඳී යයි. උෂ්ණය ඉවසනු නොහැකි ව සෙවණ තැනකට පැමිණියේ නම් එතනට තද අව්ව වැටේ.

හමා එන සුළඟ ගින්දර හා සමාන ව ශරීරය දවමින් හමායේ. ස්වාමීනි ! පව් කල තැනැත්තන්ට ලැබෙන මෙයට වඩා වැඩි වූ තවත් දුක්වලට ද සුදුසු වෙමු.

බොහෝකල් සාදුකින් පෙළෙන්නා වූ අපි ආහාර සඳහා ගිජුවෙමින් දීර්ඝ සැතපුම් ගණන් යන්නෙමු. එහෙත් කිසිවක් නොලබාම නවතිමු. අපගේ පින් නැති බව ගැන දුක්වෙමු.

බඩගිනිව සා පිපාසා දෙකින් ක්ලාන්ත වූ (අපි) කරකැවිල්ල ඇතිවී බිම වැටෙන්නෙමු. ඇද වැටෙන්නෝ වෙමු. උඩුකුරුව වැටුණාහු විසිරුණු අවයව ඇත්තේ වෙමු. (සමහරවිට) යටිකුරුව ද වැටෙන්නෙමු.

ඒ හැම තැන ම වැටුණා වූ, බිම වැටුණා වූ අපි ළය ද හිස ද පොළවේ ගටා ගන්නෙමු. අපගේ පින් නැති බව ඉතා දුක්ගෙනදේ, පුදුම සහගත ය.

ස්වාමිනී ! මේ දුකට ද, ළාමක වූ අනෙක් දුක්වලට ද අපි සුදුස්සෝ වෙමු. දෙයයි ධර්මය ලඟ තබාගෙන අපි අනාගතය සඳහා පින් රැස් නො කෙළෙමු.

අපි මෙයින් චුතව ගොස් මිනිසත් බව ලැබ පරිත්‍යාග ශීලීව සීල සම්පන්නව බොහෝ කුසල් ඒකාන්තයෙන්ම කරන්නෙමු. මෙසේ තමන් විසින් කළයුතු කර්ම කීහු.

එහි **අධියොජනානි ගච්ඡාම** - යනු යොදුන් ගණනාවක් යමු. කුමකට ද? **ඡාතා ආහාරගෙධිනො** - යනු බොහෝකාලයක් සා පිපාසා වෙන් පීඩා විඳ ආහාර පිළිබඳ ගිජු කමින්, දැඩි ලෙස ආසා කරමින්, මෙසේ ගොස් ද කිසි ම ආහාරයක් නො ලැබ ම නවතින්නෙමු. **අප්පපුඤ්ඤතා** යනු පින් නැතිකමින් ! යහපත් කටයුත්තක් නො කරන ලද බැවින්, **උත්තානා පතිකිරාමා** - යනු කිසිදවසක උඩුකුරුවී බිම වැටී විසිරුණු අත පය ඇත්තේ වෙමු. **අවකුජ්ජා පතාමසෙ** යනු සමහර දවස්වල ඉනින් වැටී සිටින්නෙමු. **තෙව** යනු ඒ අපි **උරං සීසඤ්ච සටෙමා** - යනු මුනින් යටවී වැටී නැගිට ගනු නොහැකිව, වධයට හා වේදනාවට පැමිණ වෙවුළමින් තමාගේම හිසත් ළයත් ගටා ගන්නෙමු. ඉතිරියට සඳහන්, කියන ලද පරිදිම දන්නේ ය.

ස්ථවිරයන් වහන්සේ මේ පුවත භාග්‍යවතුන් වහන්සේට දැන්වූහ. භාග්‍යවත් හු ඒ කාරණය අර්ථෝත්පත්තිකොට ගෙන පැමිණ සිටි පිරිසට ධර්මය දේශනා කළහ. එය ඇසූ මහාජනයා මසුරුමළ හැර දන්දීම් ආදී පින්කම් කරමින් සුචරිතයෙහි නිරත වූවෝ වූහ.

**සමූහ ප්‍රේත වස්තු වර්ණනාව**
**නිමියේ ය.**

—//—

# 4-11

"දිට්ඨා තයා නිරයා තිරච්ඡා න යොනි"- මේ ප්‍රේතවස්තු කථාව ශාස්තෲන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ වසන සමයේ එක්තරා විමාන ප්‍රේතයකු අරභයා වදාළ සේක. සැවැත් නුවර වාසීහු ද, පැළලුප් නුවර වාසීහු ද, වෙළෙන්දෝ බොහෝ භාණ්ඩ පුරවාගත් නැවකින් ස්වර්ණ භූමියට ගියෝ ය. එහි දී එක් වෙළෙන්දෙක් රෝගාතුර වී මාගමක් කෙරෙහි බැඳුණු සිතින් කළුරිය කළේ ය. හේ කරන ලද කුසල් බලයෙන් දෙව්ලොව නො ඉපද මුහුද මැද විමාන ප්‍රේතයකු වී උපන්නේ ය. ඔහු යම් ස්ත්‍රියක් කෙරෙහි දැඩිසේ සිත් බැඳගත්තේ ද ඒ ස්ත්‍රිය ද ඒ නැවෙන් ම ස්වර්ණ භූමියට යමින් සිටියා ය. ඉක්බිති ඒ විමාන ප්‍රේතයා අදාළ ස්ත්‍රිය ගනු කැමති ව නැවේ ගමන නතර කළේ ය. අනතුරු වෙළෙන්දෝ කවර හෙයින් අපගේ නැව නැවතුනේ දැයි සිතාබලන්නේ කාලකණ්ණියා සොයා ගැනීමට කුසපත් ඇද්දේ ය. අමනුෂ්‍යයාගේ සෘද්ධි ශක්තියෙන් තුන් වරක් ම ඒ කාලකණ්ණි සලාකපත ඔහු විසින් පිළිබඳ සිත් බැඳි ස්ත්‍රිය වෙතම පැමිණියේ ය. ඒ දුටු වෙළෙන්දෝ හුණමිටියක් මුහුදට දමා ඒ මත්තට ස්ත්‍රිය බැස්සුවා ය. ස්ත්‍රිය හුණ කාලාපය මතු පිටට බැස්ස වූ කෙණෙහි ම නැව ස්වර්ණ භූමිය කරා වේගයෙන් ගමන් කෙළේ ය. විමාන ප්‍රේතයා ඒ ස්ත්‍රිය තමන්ගේ විමානයට ගෙනගොස් ඇය සමග ජීවත්වූහ. ඈ එක් අවුරුද්දක් ඔහු සමග ජීවත්වී කළකිරුණු සිතින් යුතුව ඒ විමාන ප්‍රේතයා යදිමින් මෙසේ කීවා ය. මා මෙහි වසන්නී මගේ පරලොව ගමන සඳහා පිනක් දහමක් කර ගැනිමට මම අවකාශ නො ලබමි. එබැවින් මා පැළලුප් නුවරට පමුණුවව ඕතොමෝ මෙසේ ආයාචනා කරන ලද්දී, විමාන ප්‍රේතයා ඇයට,

තී විසින් නිරයෝ ද, දෙවියෝ ද යෝනීහු ද, ප්‍රේතයෝ ද අසුරයෝ ද යළි මිනිස්සු ද දෙවියෝ ද දක්නා ලදී. තමාගේ කර්මවිපාක තෙමේ ම දුටුවෙහි ය. තී කිසිකෙනෙකු විසින් නො දක්නා ලෙස පැළලුප් නුවරට ගෙන යමි. එහිදී කුසල් දහම්හි හැසිරෙව යනුවෙන් කීවේ ය.

එහි දිට්ඨා තයා නිරයා - තී විසින් එක් පසෙක නිරය දකින ලදී. තිරච්ඡා න යොනි - යනු මහත් අනුභස් ඇති නාග සුපර්ණ ආදී තිරිසන් සත්ත්වයෝ ද තී විසින් දක්නා ලදී. පෙතා - යනු සා පිපාසාදී දෙයින් දුක්විඳින්නා වූ

ප්‍රේතයෝ ද, **අසුරා** - යනු කාල කඤ්ජක ආදී භේදවලින් යුත් අසුරයෝ, **දෙවා** - යනු එක් පසෙක චාතුර්මහාරාජික දෙව්වරු ද දක්නා ලදී. ඒ විමාන ප්‍රේත තෙමේ තමන්ගේ ආනුභාවයෙන් අතරතුර ඇය කැඳවා ගෙන ගොස් ප්‍රත්‍යක්‍ෂ නිරයාදිය පෙන්වමින් හැසිරුණේ ය. එහෙයින් මෙය කී ය. **සය මද්දස කම්මවිපාක මත්තනො** - යනු නිරයාදී තැන්වල විශේෂ යෙන් ගොස්, තම තමන් විසින් කරන ලද කර්මයන්ගේ විපාක තමන් විසින්ම විඳින අන්දම ප්‍රත්‍යක්ෂයෙන් දුටුවේ ය. **නෙ ඝසාමි තං පාටලිපුත්ත මං කඛතං** - යනු දැන් මම කිසි කෙනෙකුට නො පෙනෙන පරිදි මනුෂ්‍ය රූපයෙන්ම පැළලුප් නුවරට ගිහින් ඇරලමි. ඔබ වනාහි **ගන්ත්වා** ගොස් **කුසලං කරොහි කම්මං** - යනු කර්මයන්ගේ විපාක ඔබ ඇස් දෙකින්ම ප්‍රත්‍යක්ෂ වශයෙන්ම දක්නා ලද හෙයින් යුක්තියෙහි පිහිටා කුසල ධර්මයන්හි ඇලෙනු මැනවි යන අර්ථය යි. ඉක්බිති ඒ ස්ත්‍රිය ඔහුගේ වචන අසා තමන් විසින් මෙසේ කියන ලදී.

යක්ෂය ! ඔබ මට වැඩ කැමැත්තේ වෙහි, දෙවිය ඔබමට හිත කැමැත්තේ වෙහි. ඔබගේ වචන අනුව මම කටයුතු කරමි. ඔබ මගේ ගුරුවරයා වන්නෙහි ය.

මා විසින් නිරයෝ ද තිරිසන් ගත සත්ත්වයෝ ද, ප්‍රේතයෝ ද, අසුරයෝ ද, නැවත දෙවියෝ ද දක්නා ලද්දෙමි. තමන් විසින් කරන ලද පින් පව්වල විපාක තමන් විසින් ම විඳින අන්දම දුටුමි. එහෙයින් මම බොහෝ කුසල කර්මයන් කරමි.

ඉක්බිති ඒ ප්‍රේත තෙමේ ඒ ස්ත්‍රිය ගෙන අහසින් ගොස් පැළලුප් නුවර මැද සිටුවා ගියේ ය. ඉක්බිති ඇගේ ඤාති මිත්‍රාදීහු ඇය දැක අපි පෙර ඔබ මුහුදේ දමන ලදුව මළේ යයි ඇසුවෙමු. ඒ ඔබ සුවසේ ආපසු පැමිණ දැකීමෙන් ඉතා සතුටට පත්වීමු යි කැඳවා රැස් වී ඇගේ ප්‍රවෘත්තිය විචාළේ ය. ඕ ඔවුන්ට මුල පටන් තමන් දුටු දේ ද, අනුභව කළ සම්පත් ද, ආදී සියල්ල කීවා ය. සැවැත්නුවර වැසි ඒ වෙළෙන්දෝ පිළිවෙළින් පැමිණි කල්හි ශාස්තෘන් වහන්සේ සමීපයට එළඹ වැඳ එකත්පස් ව සිටිමින් ඒ ප්‍රවෘත්තිය

භාග්‍යවතුන් වහන්සේට සැළකළෝ ය. භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය අර්ථෝත්පත්ති කොට ගෙන මේ ධර්ම දේශනාව කළේ ය. ඒ අසා මහාජනයා සංවේගයට පත්වූයේ දානාදී කුසල ධර්මයන්හි නියැලුනෝ වූහ.

පැළලුප් නුවර ප්‍රේතවස්තු වර්ණනාව
නිමියේ ය.

—//—

# 4-12

"අයඤ්ච තෙ පොක්ඛරණී සුරම්මා" යන මේ ප්‍රේත වස්තු කථාව ශාස්තෲන් වහන්සේ සැවත් නුවර වැඩ වසද් දී අම්බප්‍රේතයා අරභයා වදාළහ. සැවැත්නුවර පිරිහීගිය සම්පත් ඇති එක්තරා ගෘහපතියෙක් සිටියේ ය. ඔහුගේ බිරිද කළුරිය කළා ය. එක ම දියණියක් ඔවුන්ට සිටියා ය. ඒ ගෘහපතියා තමන්ගේ මිතුරෙකුගේ ගෙදර දියණිය නවත්වා ණය වශයෙන් ගත් කහවණු සියයකින් බඩු රැගෙන වෙළඳුන් සමග වෙළදාමේ ගියේ, ටික දිනකින් මුල් මුදල ද, ලාභ වශයෙන් කහවණු පන්සියයක් ද ලැබ වෙළඳ සමූහයා සමග නැවත සිය ගමට පැමිනියේ ය. අතරමග දී සොර මුළක් වෙළඳුන් මැඩගෙන පැමිණියාහු ය. වෙළෙන්දෝ ඔබ මොබ පලාගියාහ. ඒ ගෘහපතියා එක්තරා ගසෙක කහවණු සඟවා තබා අඳුරෙහි සැඟවිණි. සොරු ඔහු අල්ලා මැරී ය. හෙතෙම ධනාශාවෙන් එහිම ප්‍රේතයෙක්ව උපන්නේ ය. වෙළෙන්දෝ සැවැත් නුවරට ගොස් ඔහුගේ දියණියට ඒ ප්‍රවෘත්තිය කීහ. ඕ තොමෝ පියාගේ මරණයෙන් හා මතු ජීවත්වීමේ බියෙන් බලවත් ලෙස හටගත් කණගාටුවෙන් දැඩි සේ හැඬුවා ය. ඉක්බිති ඇගේ පියාගේ යහළු කෙළඹියෙක් "යම් සේ කුඹලෙකු විසින් තනන මැටි භාණ්ඩ සියල්ල බිඳීමෙන් අවසන් වන්නේ ද? එමෙන් ම සත්ත්වයාගේ ජීවිතය ද බිඳීම මරණයෙන් අවසන් වේ. මරණය සර්ව සාධාරණයි. වැළැක් විය නො හැක්කේ ය. එබැවින් ඔබේ පියා මළ කල්හි ඉතා දැඩි සේ ශෝක නො කරව, නො වැළපෙනු මැනව මම තිගේ පියා වෙමි. තී මගේ දුවයි. මම තී කෙරෙහි පියාගේ යුතුකම් ඉටුකරමි. ඔබ තාත්තාගේ ගෙදරදී මෙන්ම මේ ගෙදර අමුතුකොට නො සිතා සිත් අලවා වසවයි කියා අස්වැසී ය.

ඕ තොමෝ ඔහුගේ වචනයෙන් සන්සිඳුණු ශෝක ඇතිව, පියා කෙරෙහි මෙන් ගෞරව පූර්වකව වතාවත් කරන්නී තමන්ගේ දුගී බැවින් ඔහුට වතාවත් කරන්නීව සිට, මිය ගිය පියා උදෙසා මතකදන් (ප්‍රේත කෘත්‍යය) දෙනු කැමතිව, කැඳ පිස සිරියෙල් පැහැය ඇති ඉඳුණු අඹගෙඩි රං තැටියක තබාගෙන කැඳ සහ අඹ, දාසියක ලවා ගෙන්වාගෙන විහාරයට ගොස් ශාස්තෲන් වහන්සේ වැඳ මෙසේ කීවා ය.

භාග්‍යවතුන් වහන්ස ! මාගේ දක්ෂිණාව පිළිගෙන මා කෙරෙහි අනුකම්පා කරනු මැනැව, ශාස්තෘන් වහන්සේ මහා කරුණාවෙන් හටගත් සිත් ඇතිව ඇගේ අදහස් මුදුන්පත් කරමින් හිඳිනාකාර දැක්වීය. ඕ තොමෝ තුටු පහටු සිත් ඇතිව පණවන ලද බුද්ධාසනයෙහි වැඩහුන් බුදුන්ට, තමන් විසින් ගෙන එන ලද පිරිසිදු වස්ත්‍රය අතට දුන්නා ය. පණවන ලද අසුනෙහි බුදුහු වැඩ උන්හ. ඕ තොමෝ බුදුන්ට කැඳ පිළිගැන්වී ය. භාග්‍යවතුන් වහන්සේ කැඳ පිළිගත්සේක. ඉක්බිති සඞසයා වෙත කැඳ පිළිගැන්වී ය. කැඳ පුදා නැවත දෙ අත් සෝදා අඹගෙඩි බුදුන්ට පිළිගැන්වී ය. භාග්‍යවතුන් වහන්සේ අඹ වැළඳූහ. ඕ භාග්‍යවතුන් වහන්සේට වැඳ මෙසේ කීවා ය. ස්වාමීනි ! මා විසින් මේ කරන ලද, පසතුරණ, කැඳ හා අඹ පිළිගැන්වීම් වසයෙන් වූ දානමය පින්කමේ පිං මගේ මියගිය පියා වෙනුවෙන් අනුමෝදන් කරනු මැනවි, උදෙසාවා, භාග්‍යවතුන් වහන්සේ එසේම වේවා යි පවසා පින් අනුමෝදන් කළේ ය. ඕ භාග්‍යවතුන් වැඳ පැදකුණු කොට ආපසු ගියා ය.

ඇය විසින් දක්ෂිණාව දුන් කෙණෙහිම ඒ ප්‍රේතයා අඹ උයන් විමාන, පොකුණු, ආදිය හා මහත් දිව්‍යසම්පත් ලදහ. ඉක්බිති ඒ වෙළෙන්දෝ ඉන්මතු දවසෙක වෙළඳාමෙහි යන්නේ ඒ මගට සේන්දු වූයේ පෙර විසූ තැනම එක් රාත්‍රියක් ගෙවූහ. ඒ දුටු ඒ විමාන ප්‍රේතයා උයන්, විමන්, සමග තමන් ඔවුන්ට දැක්වී ය. ඒ වෙළෙන්දෝ එය දැක ඒ ලත් සම්පත්තීන් පිළිබඳව විමසන්නේ, මේ ගාථා දෙක කීහ.

ඔබගේ මේ පොකුණු ඉතා රමණීය වේ. සමතලා මනා තොටුපළ ඇත්තේ ද පිරුණු දිය ඇත්තේ ද, පිපුණු මල් ඇත්තේ ද වේ. බඹර සමූහයා විසින් නිතර ගැවසී ගත්තේ ය. ඔබ විසින් මේ මනරම් පොකුණ කෙසේ ලබන ලද්දේ.

ඔබගේ මේ අඹ උයන ඉතා සිත්කළු වේ. සියලු සටතුන්ට සුව එළවන අතර, එල දරයි. මනාව පිපුණු මල් ඇත්තේ බඹර සමූහයා පිරිවරණ ලද්දේ වෙයි. මේ විමන හා උයන ඔබ කෙසේ ලබන ලද්දේ ද?

එහි **සුරම්මා** - යනු විශේෂයෙන් මැනවින් සිත් අලවන්නේ ය. **සමා** - යනු උස් මිටි නැතිව සමතලා වූ, **සුපතිත්ථා** යනු රුවන්මය හිණි පෙළ ඇති යහපත් වූ තොටුපළ **මහොදකා** - යනු නිතර පිරුණු ජලය, **සබ්බොතුකං** -

යනු මල් සමූහයෙන් ගෙඩි සමූහයෙන් ද පිරුණ ගස් වැල්නිසා, සෑම ඍතුවක දීම සුව එළවන එහෙයින් කීය. **ධාරයනෙ ඵලානී ඵල දරයි. පුප්ඵිතං** යනු නිරන්තරයෙන් පිපුණු මල් ඇත්තේ ය. ප්‍රේත තෙමේ ඒ අසා පොකුණ ආදී ප්‍රතිලාභයන් ලැබුණු ආකාරය දක්වමින් මෙ ගාථාව කීහ.

මගේ දුව විසින් (බුදුන්ට) ඉදුණු අඹ හා පැන් ද කැඳ ද දන් දෙන ලද හේතුවෙන්, සිත්කළු වූ සිහිල් සෙවණ ද උයන් වතු ද මට ලැබිණ.

**තෙන මෙ ඉධ ලබ්භති** - යනු යම් හෙයකින් බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට ඉදුණු අඹ ද, පැන් ද කැඳ ද, මා උදෙසා මගේ දියනිය විසින් දානයක් දෙන ලදී. ඒ දුව විසින් දෙන ලද දානයේ විපාකයෙන් මෙහි මේ දිව්‍යමය වූ අඹ වනයෙහි සියලු ඍතු වලදීම අඹගෙඩි ද, වේ දිව්‍ය පොකුණ හා දිව පැන් ද, කැඳ හා පසතුරුණු දානයෙන් උයන් විමාන කප්රුක් මනරම් වූ සිහිල් සෙවණ ආදිය ලැබුණේය යන අර්ථ යි.

මෙසේ ද කියා ඒ විමාන ප්‍රේත තෙමේ ඒ වෙළඳුන් (පමුණුවා) ගෙන්වා, පන්සියයක් කහවණු දක්වා මෙයින් භාගයක් තෙපි ගනි වු භාගයක් මාගත් ණය ගෙවා සුවසේ ජීවත් වන්නැයි මගේ දුවට දෙනු මැනවි යි කීයේ ය. වෙළෙන්දෝ පිළිවෙළින් සැවැත්නුවරට පැමිණ, ඔහුගේ දියණියට කථාකොට ඔහු විසින් තමන්ට දුන් භාගය ද ඇයටම දුන්නාහු ය. ඕ තොමෝ කහවණු සියයක් ණය කරුවන්ට දී ඉතිරිය තමාගේ පිතු සහායක වූ කෙළෙඹියාට දී තෙමේ වතාවත් කරගෙන සිටී. හෙතෙමේ මේ සියල්ල තොපටම වේවා යි ඇටම ඒ කහවණු දී, තමාගේ වැඩිමල් පුතාගෙ ස්වාමිදුව කළේ ය. ඕ තොමෝ පසු කලෙක එක් පුතෙකු ලැබ ඔහු නලවමින් දන් දීමෙහි ද, දැමුණු බවෙහි, (කීකරු කමෙහි ) ද, සීල සංයමයේ ද සාන්දෘෂ්ටික වූ කර්ම විපාකය බලව, මම ස්වාමීන්ගේ ගෙදර දාසියක් වී සිට නැවත යෙහෙළණියක් වී අද ස්වාමී දුව ද වීමි. යන මේ කීවා ය.

ඉක්බිති එක් දවසක් ශාස්තෘන් වහන්සේ, ඇගේ මුහුකුරා ගිය නුවණ දැක ආලෝකය විහිදුවා ළඟ සිටියාක් මෙන් තමන් දක්වා ඇයට

සැප ස්වභාවයෙන් නො සැපය ද, ප්‍රිය ස්වභාවයෙන් අප්‍රිය ද සුඛ ස්වභාවයෙන් දුක ද ප්‍රමාද වූ පුද්ගලා යටපත් කරයි. යන ගාථාව වදාළහ.

ගාථාවගේ කෙලවර ඕතොමෝ සෝවාන් ඵලයෙහි පිහිටියා ය. ඕ තොමෝ දෙවන දවසේ බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයාට දන් දී මේ සියලු පුවත් භාග්‍යවතුන් වහන්සේට කියා සිටියේ ය.

භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය හේතුකොට ගෙන අරමුණු කොට ගෙන පැමිණ සිටි පිරිසට ධර්මය දේශනා කළහ. ඒ දේශනා තොමෝ මහාජනයාට සාර්ථක වූයේ ය.

අම්බ ප්‍රේත වස්තු වර්ණනාව
නිමියේ ය.

——//——

## 4-13

**"යං දදාති න තං හොති"** ආදී වූ මෙය අක්ඛදායක ප්‍රේතයාගේ කථා වස්තුවයි. කවරෙකු නිසා මෙය උපන්නේ ද? භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවන විහාරයේ වැඩ වසන සමයෙහි සැවැත්නුවර වාසී එක්තරා උපාසකයෙක් ගැල්වල භාණ්ඩ පුරවාගෙන ආපසු සැවැත් නුවරට පැමිණීම සඳහා කරත්තයට නැගී මාර්ගයට අවතීර්ණ විය. ඔහු මාර්ගයේ ගමන්කරමින් එනවිට අතරමග දී එක් කරත්තයක අලවංගුව බිඳිණ.

එකල්හි එක්තරා පුරුෂයෙක් ගසක් කපා ගැනීම සඳහා පොරවක් ද අත්පොරවක් ද රැගෙන තම ගමින් නික්ම වනයෙහි හැසිරෙන්නේ, ගැල බිඳුනු තැනට පැමිණ, අලවංගුව බිඳීයාම නිසා දොම්නසට පැමිණිසිටි වෙළෙන්දා දැක, මේ වෙළෙන්දා සිය ගැල බිඳීම නිසා යාමට නො හැකි ව වනයේ ම ක්ලාන්ත වේ යයි අනුකම්පාකොට ගසක අත්තක් කපා අලවංගුවක් තනා කරත්තය තනා දුන්නේ ය.

හෙතෙම ඉන්පසු මෑත කාලයේ කළුරිය කොට ඒ වනයේ ම භූම්‍යස්ථ දෙවියෙකු ව උපන්නේ ය. ඔහු තමා විසින් කරන ලද කර්ම සිහිනුවණින් සලකා බලන්නේ, රාත්‍රියෙහි යටකී උපාසක වෙළෙන්දගේ ගෙට ගොස් ගේ දොරකඩ සිට, මේ ගාථාව කීහ.

යම් දාන වස්තුවක් දේ ද එයම නොවේ. (වැඩියක් ම) දෙන්නේමය එසේ දී දෙලොව දුකින් එතෙර වෙයි. ඒ දාන හේතුවෙන් දෙලොව සැපතට පැමිණේ. පුබුදුවව, පින්කම්හි පමා නො වෙව.

එහි - **යං දදාති න තං හොති** - යම් දෙය්‍ය ධර්මයක් දානවස්තුවක් දෙයි ද විපාකදෙන්නේ ඒ දෙය ම නො වේ. තවත් බොහෝ දේ මනාප දේ, සිතට ප්‍රිය වූ දේ, සිත් අලවන දේ, විපාක වශයෙන් ලැබෙන්නේ ම ය. එහෙයින් **දෙථෙවදානං** - කැමති වූ පරිද්දෙකින් දන් දිය යුත්තේ ම ය. එයට කරුණු මෙසේ කියමි. **දත්වා උභය තරති** - යනු දන් දී ඉහාත්ම යෙහි ද, පරලොව ද දුක් අනර්ථ ඉක්මවයි. **උභයං තෙන දානෙන ගච්ඡති** - යනු ඉහාත්ම වශයෙන් ද පරලො වශයෙන් ද, දොලොවම ඒ දානමය පිනෙන් සැපයට

පැමිණෙයි. සැපයට පමුණුවයි. තමන්ගේ ද අනුන්ගේ ද හිත සුව පිණිස ම මේ අර්ථය යෙදිය යුතු ය.

ජාගරථ මා පමජ්ජථා - යනු මෙසේ දෙලොව ම අනතුරු දුක් නිවාරණය සඳහා ද දෙලොවම හිත සුව පිණිස ද, දන් දීමම වටී. දානෝපකරණ පිළියෙළ කොට එහි අප්‍රමාදී වව, නිදි නොලබව, යන අර්ථයි. ආදර හිතවත් කම් වශයෙන් ද, නැවත නැවත කීම් වශයෙන් ද, මෙය කියන ලද්දේ ය.

වෙළෙන්දා ද තමන්ගේ කාර්යයන් අවසන් කොට, ක්‍රමයෙන් සැවැත්නුවරට පැමිණ දෙවැනි දවසේ ශාස්තෲන් වහන්සේ වෙත එළඹ වැඳ එකත්පස්ව සිටිමින් මේ ප්‍රවෘත්තිය බුදුන්වහන්සේට දැන්වී ය. ශාස්තෲන් වහන්සේ එය අර්ථෝත්පත්ති කොට ගෙන පැමිණ සිටි පිරිසට ධර්මය දේශනා කළහ. ඒ දේශනා තොමෝ මහා ජනයාට සාර්ථක වූයේ ය.

අක්ඛරුක්ඛ ප්‍රේත වස්තුව
නිමියේ ය.

——//——

# 4-14

**"මයං භොගෙ සංහරිමහා "** මේ භෝග සංහරන ප්‍රේත වස්තු කථාවයි. එය කවුරුන් නිසා උපන්නේ ද? භාග්‍යවතුන් වහන්සේ වේළුවනාරාමයේ වැඩ වසන සමයේ රජගහනුවර වාසී ස්ත්‍රීහු සතර දෙනෙක් හොර මැණීම් කිරීම් ආදී වශයෙන් ගිතෙල්, පැණි, තෙල්, ධාන්‍ය ආදිය වෙළදාම් කොට නුනුවණින් ධනය රැස්කොට ජීවත් වී, මරණයෙන් පසුව පිටිනුවර දිය අගලක් මතුපිට ප්‍රේතියන් වී උපන්නාහ. ඇලා රාත්‍රියෙහි දුකින් පීඩිතව මඩනා ලදු ව.

**මයං භොගෙ සංහරිමහා සමෙන විසමෙන ච**
**තෙ අඤ්ඤෙ පරි භුඤ්ජන්ති - මයං දුක්ඛස්ස භාගිනී,**

ආදී වශයෙන් විලාප කියමින්, භයානක වූ මහ හඩින් මුර ගෑවාහු ය. මිනිස්සු ඒ අසා බියෙන් තැත් ගැනී, රැ නිදි නො ලැබ, උදය කාලයේ බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට මහා දන් පිළියෙළ කොට ශාස්තෲන් ප්‍රමුඛ මහා සඞ්ඝයා පමුණුවා ප්‍රණීත වූ ආහාර පානාදියෙන් වළදවා, භාග්‍යවතුන් වහන්සේ වළදා අවසන පාත්‍රයෙන් ගත් අත් ඇතිව වැඩහුන් කල්හි ඒ ප්‍රවෘත්තිය උන්වහන්සේට සැළ කළහ. භාග්‍යවතුන් වහන්සේ උපාසකවරුණි ! ඔවුන්ගේ ඒ ශබ්දයෙන් තොපට කිසිදු අන්තරාවක් නැත. ප්‍රේතියන් සතරදෙනෙක් දුකින් පීඩිත වී, තමන් විසින් කරණ ලද පාපකර්මයන් කියමින් වැළපීම් වශයෙන් වැළපෙන්නා වූ ශබ්දය යි. වදාරා මේ ගාථාව වදාළහ.

එහි **භොගෙ** - යනු පරිභෝග කළ යුතු යන අර්ථයෙන් භෝග නම් වස්ත්‍රාභරණාදිය වශයෙන් මසුරු මළයෙන් බැඳුනු සිත් ඇති ව, **සංහරිමහා** යනු මසුරු මළයෙන් බැදුණු සිත් ඇති ව, කිසිවකුට කිසිවක් නොදී ධනය රැස් කළෙමු **සමෙන විසමෙනවා** - යනු යුක්තියෙන් ද අයුක්තියෙන් ද, සාධාරණ නැති අසාධාරණ ප්‍රතිපත්ති මගින් ඒ වස්තූන් අපි රැස් කළෙමු. දැන් ඒවා වෙනත් අය භුක්ති විදිති. **මයං දුක්ඛස්ස භාගිනී** යනු අපි වනාහි කිසිම සුචරිතයක් නොකොට, දුශ්චරිතයන්ම කරන ලද බැවින්, දැන් ප්‍රේත යෝනියෙහි ඉපදී මහත් වූ දුක්වලට හිමි කාරියෝ වීමු. මහත් දුක් විදිමු යන අර්ථය යි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ ප්‍රේතීන් විසින් කියන ලද ගාථාව වදාරා ඔවුන්ගේ අතීත ප්‍රවෘත්ති කථාව කියා එය මූලික හේතුව කොට ගෙන පැමිණ සිටි පිරිසට ධර්ම දේශනා කොට මත්තෙහි සිව්සස් ප්‍රකාශ කළහ. සිව්සස් ප්‍රකාශය අවසානයේ දී බොහෝ දෙනා සෝවාන් ඵල ආදී මාර්ග ඵලයන්ට පැමිණුනාහු ය.

භෝග සංහරණ ප්‍රේත වස්තු වර්ණනාව
නිමියේ ය.

—//—

# 4-15

"සට්ඨිවස්ස සහස්සානි" යනු මේ සෙට්ඨිපුත්ත ප්‍රේතවත්‍ථු කථාව යි. කවුරුන් නිසා උපන්නේ ද? භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩ වසන කල්හි, ප්‍රසේනජිත් කෝසල රජු අලංකාර රාජාභරණයෙන් සැරසී, උතුම් ඇතා පිට නැගී මහත් වූ රජසිරින් මහත් වූ රාජානුභාවයෙන් නගර සංචාරයේ යෙදෙද්දී, එක්තරා ගෙයක උඩුමහල් තලයෙහි කවුළු පියන් හැරගෙන රජසිරි බලන්නා වූ, රූප සම්පත්තියෙන් දෙවඟනක් බඳු වූ එක් ස්ත්‍රියක දැක, පෙර නොදුටු අරමුණෙහි වහාම උපන්නා වූ ක්ලේශ සහගත හැසිරීමෙන් යුක්ත වූ, වැළඳගත් සිත් ඇති ව, කුල රූප ආචාර ආදී ගුණ යුත් ඇතොවුරු කාන්තාවන් ඇතිකල්හිඳු ස්වභාව වශයෙන් මහා පෙරළෙන්නා වූ දමනය නොකටහැකි සිතේ ස්වභාව වශයෙන්, ඒ ස්ත්‍රිය කෙරෙහි පිළිබඳ සිත් ඇති ව, පසු අසුනෙහි සිටි පුරුෂයාට, මේ ගේ හා මේ ස්ත්‍රිය පිළිබඳව සනිටුහන් කරගනුවයි කියා රජ වාසලට පිවිසිය යේ ය. අනෙක් සියල්ල අම්බසක්ඛර ප්‍රේත වස්තුවෙහි ආ පරිද්දෙන් දත යුතු ය. මෙහි කියන්නේ (ඊට වඩා) ඇති වෙනසයි.

මෙහි දී ඒ පුරුෂයා හිරු බසින්නට පෙරම පැමිණ නුවර දොර වැසූ කල්හි තමන් විසින් ගෙන එන ලද අරුණුවන් මැටි හා උපුල් ආදිය නුවර දොර කවුළුවෙහි එල්වා නිදා ගැනීමට ජේතවනයට ගියේ ය. රජු වනාහි සිරියහනෙහි නිදන්නේ මැදියම් රෑ ස, න, ද, සො, යන මේ අකුරු සතර යටි උගුරෙන් කියන ලදුව මරහඬක් මෙන් ඇසුනේ ය. ඒ වූකලී ඈත අතීතයේ සැවැත්නුවර වැසි සම්පත් මදයෙන් මත් වූ සිටුපුත්‍රයන් සිව් දෙනෙකු විසින් තරුණ කාලයේ දී පරදාර සේවන කර්ම වසයෙන් බොහෝ අකුසල් කොට, එයින් පසු කලෙක කළුරිය කොට ඒ නගරය සමීපයෙහිම ලෝකුඹු නරකයේ මුවවිටට පැමිණ එක එක ගාථාව කියනු කැමතිව කියන ලද ඒ ගාථාවන්ගේ මුල් අකුරු පමණක්ම කියා වේදනාවට පත්වී ලෝකුඹු නරකයෙහිම ගිලුණාහු ය.

රජු ඒ ශබ්දය අසා බියෙන් තැතිගත් සිත් ඇති ව,

උකටලීවැ, ලොමු දැහැගැනීම් ඇතිව, ඒ රාත්‍රිය දුකසේ කල් ගෙවා, රෑ පහන් වූ කල්හි පුරෝහිතයා කැඳවා ඒ ප්‍රවෘත්තිය කිවේ ය. පුරොහිතයා රජු බිය පත් වූ බව දැන, ලාභයෙහි ගිජුව මට සහ බමුණන්ට ලාභ උපදින මගක් උපායක් ඇත්තේ යයි සිතා, මහරජ ! ඒකාන්තයෙන් මහත් උපද්‍රවයක් ඇතිවන්නේ ය. සබ්බ චතුෂ්ක යාගය කළ යුතු යයි කීයේ ය. රජු ඔවුන්ගේ විසඳුම් පිළිතුරු අසා ඇමතිවරුන් කැඳවීය. සර්ව චතුෂ්කයාගය කරන්නට උපකරණ සපයන්නැයි ඇමතිවරුන්ට නියෝග පැනවී ය. මල්ලිකා දේවිය මෙය අසා මහරජතුමනි ! කවර හෙයකින් මේ බමුණන්ගේ වචන අසා නොයෙක් සතුන්ට වධ හිංසා පමුණුවන්නේ කවර හෙයින් ද? සියලු තන්හි නො පැකිලෙන නුවණින් යුත් භාග්‍යවතුන් වහන්සේගෙන් ඇසියයුතු නොවේ දැයි රජුට කීවා ය. රජ තෙමේ ඇගේ වචනය අසා ශාස්තෲන් වහන්සේ වෙත ගොස් ඒ පුවත භාග්‍යවතුන් වහන්සේට දැන්වීය. භාග්‍යවතුන් වහන්සේ මහරජ තොපට ඒ ශබ්දයෙන් කිසිම අන්තරාවක් නැතැයි වදාරා අතීතයේ පටන් ඒ ලෝකුඹු නිරයේ උපන් සත්ත්වයන්ගේ සියලු කථා ප්‍රවෘත්තිය වදාරා ඔවුන් විසින් වෙන වෙනම කියන්නට පටන්ගත් ගාථා සම්පූර්ණ කොට වදාළ සේක.

ලෝකුඹු නරකයෙහි පැසෙන්නා වූ අපට සැට දහසක් අවුරුදු ඉක්ම ගියේ ය. කවර කලෙක අපගේ මේ දුක් කෙළවර වන්නේ ද?

නිදුකාණනි ! මගේ ද ඔබගේ ද දුක් විදීමේ කෙළවරක් නැත. අවසාන යක් කොයින්ද? කෙළවර දක්නට නො ලැබේ. එබඳු වූ පව්කම් අප විසින් කරන ලදී.

යම්කිසි වස්තුන් ඇති කල්හි අපි (දන්) නො දුනිමු. ඉතා නරක දිවි පැවැත්මක් ඇතිව ජීවත් වීමු. දාන වස්තුව තිබියදීත් තමන්ට පිහිටක් කර නො ගත්තෙමු.

ඒ මම මෙයින් මිදී මිනිසකු වී ඉපදුන හොත්, සීල සම්පන්න වී බොහෝ වශයෙන් කුසල් කරන්නට යුහුසුළු වෙමියි කීයේ ය.

**එහි සට්ඨිවසස සහස්සානි** - යනු අවුරුදු සැට දහසක්

එකල්හි වනාහි ලෝකුඹු නිරයේ උපන් සත්ත්වයෝ, එහි පතුලට යාමට වසර තිස් දහසක් ගතවෙයි. යටටම යයි. එයින් උඩට එන්නෝ වසර තිස්දාහක දී මුවවිටි පෙදෙසට (කටළගට) පැමිණෙති. ඒ හැඟීමෙන් හෙතෙම "සට්ඨිවස්ස සහස්සානි පරිපුණ්ණානි සබ්බසො" යන ගාථාව කියනු කැමැත්තේ, ස යන්න පමණක් කියා බලවත් වේදනාවට පැමිණියේ (නැවත) යටට ගිලී ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ ඒ ගාථාව රජුට සම්පූර්ණාකාර වදාළහ. අනෙක් ගාථා පිළිබඳව ද මේ ක්‍රමයමැයි. එහි **කදා අන්තො භවිස්සති** - යනු ලෝකුඹු නිරයේ පැසෙන්නා වූ අයගේ මේ දුක කවරදා නම් කෙළවර වන්නේ ද **තථාහි** යනු ඔබගේ හා මගේ මේ දුකෙහි කෙළවරක් අන්තයක් නො පෙනෙන්නේ ය. යම් සේ ඔබ හා අප විසින් යම්කිසි ආකාරයක අකුසල කර්මයන් කරන ලද්දේ ද ඒ අනුව දුක් අවසන් නො වන්නේ යයි කිව යුතු යි. **දුජ්ජීවිතං** - යනු නුවණැත්තන් විසින් ගර්හා කරන ලද දිවි පැවැත්ම, **යෙ සන්තෙ** - යනු අප සතුව දන් දිය යුතු වස්තූන් තිබිය දී, **න දදම්හසෙ** - යනු නුදුන්නෙමු අපට පිහිට වන්නා වූ කිසිවක් කරන්නට, අපි නො පෙළඹුනෙමු යන්න කීමට **සන්තෙසු දෙය්‍ය ධම්මෙසු දීපං නාකම්හ අත්තනො** - ආදිය කියන ලදී. **සො** යනු ඒ මම **නූනා** - වත්ත පරිවිතර්කයෙහි නිපාත යි. **ඉතො** - යනු මේ ලෝකුඹු නරකයෙන්, **ගන්ත්වා** - යනු චුත වී, ගොස් **යොනිං ලද්ධාන මානුසිං** - යනු මිනිස් යෝනියෙහි මනුෂ්‍ය ආත්මභාවය ලැබ, **වදඤ්ඤූ** යනු යාචකයන් පරිත්‍යාග ශීලිවෙමියි කිය යි. **සීලසම්පන්නො** - යනු ශීලයෙන් හා ආචාර සම්පන්න බවින් යුක්ත වී, **කාහාමි කුසලං බහුං** - යනු පෙර මෙන් ප්‍රමාදයට නො පැමිණ බොහෝ සෙයින් මහත් වූ කුසල කර්මයන් කරන්නෙමි යි. පින් රැස්කරන්නෙමි යන අර්ථය යි.

ශාස්තෘන් වහන්සේ මේ ගාථා වදාර විස්තර වශයෙන් ධර්මදේශනාකළ සේක. දේශණාවසානයේ රතු උපුල් ගෙනා පුරුෂයා සෝවාන් පෙළෙහි පිහිටියේ ය. රජු හටගත් සංවේග ඇත්තේ පරදාර සේවන අදහසින් වෙන්වී ස්වදාර පරිහරණයෙන් සතුටු වූයේ ය.

සෙට්ඨි පුත්‍ර ප්‍රේත වස්තු වර්ණනාව

නිමියේ ය.

——//——

## 4-16

"කිං නු උමමත්ත රූපොවා" මේ ප්‍රේත වත්‍ථු කථා ධර්මදේශනාව ශාස්තෲන් වහන්සේ වේළුවන විහාරයෙහි වැඩ වසද් දී එක්තරා ප්‍රේතයකු අරබයා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර ගල්විදීමේ දක්ෂ හා අකුරු ගැසීමේ දක්ෂ එක්තරා කොරෙක් නුවර දොරටුවේ නුගරුක මුළ හිඳගෙන ගල්කැට විදීමෙන් ඇත්, අස්, රථ, මිනිස්, ගෙවල්, කොඩි, පුන්කළස්, ආදී වූ රූප කොළවල සිතුවම් කර දක්වයි. නගරයේ දරුවෝ ක්‍රීඩා සඳහා මස්සක් අඩමස්සක් කොරාට දී කොරා ලවා විවිධ රූප නිමවති. එක් දිනක් බරණැස් රජු නුවරින් පිටත් ව ඒ නුගරුක මුලට පිවිසියේ නුග පත්වල ඇත් අස් ආදී විවිධ රූප බොහෝසෙයින් දක මිනිසුන්ගෙන් මේ කොළවල මෙසේ නොයෙක් විධියේ රූප සටහන් කවරෙකු විසින් කරන ලද්දේ දැයි විචාළහ. එවිට මිනිස්සු ස්වාමීනි ! මොහු විසිනැයි කොරා පෙන්නුහ. රජු ඔහු කැඳවා මෙසේ කී ය. සගය මා විසින් පෙන්වනු ලබන පුරුෂයකු කථාකරමින් සිටින විට, ඔහු නො දැනුවත්වම ඔහුගේ කුස එළුබෙටි වලින් පිරවිය හැකිද යි විචාළේ ය. හෙතෙම පුළුවනි යයි කී ය. රජු තමන්ගේ රාජ භවනයට ඔහු ගෙන්වා, බොහෝ කථා කරන්නා වූ පෙරෙවි බමුණා කෙරෙහි කළකිරුණු සිත් ඇති ව, පෙරෙවි බමුණා ගෙන්වා, තිරයෙන් වට කරන ලද, මහජනයාගෙන් හිස් වූ ස්ථානයක හිඳ පෙරෙවි බමුණු හා කථාව ආරම්භ කරමින් පිළා කැඳවී ය. පිළානැලියක් පමණ එළුබෙටි රැගෙන ගොස්, රජුගේ සිතු විලි දැන, පුරෝහිතයාගේ අභිමුඛයෙහි හුන්නේ ඔහුගේ උගුර ලඟට එනතෙක් විද්දේ ය. පුරෝහිතයා ද එළුබෙටි වමාරා දැමී ය නොහැකි ව ගිල්ලේ ය. ඉක්බිති රජතෙම ඔහුට මෙසේ කී ය. ඔබ විසින් තොර තෝංචියක් නැති ව කථා කිරීමේ විපාකය දැන් විදින ලදී. ඔබගේ බඩ එළුබෙටි වලින් පිරී ඇත. පුරෝහිතය දැන් යව, ගොස් කුකුරුමාන් ගෙඩි හා පුවඟු කොළ ආදියෙන් සකස් කල කැඳ බී එළුබෙටි වමාරා දමවයි එසේ කළවිට ඔබ සුවපත් වන්නේ ය යි. පිටත්කර හැරියේ ය. පිළා කෙරෙහි පැහැදුණු රජු ඔහුට ගම්වර තුදුසක් දුන්නේ ය.

එතැන් පටන් පිළා ගම්වර ලැබ තමන් සැපවත් වෙමින්, පිනමින් අනුන් ද පිරිවර ජනයා ද සැපවත් කරවමින් පිනවමින්, ශ්‍රමණ බ්‍රාහ්මණ ආදීන්ට සුදුසු පරිදි දන් දෙමින් මෙලොව හා පරලොව සඳහා අර්ථවත් වැඩෙහි යෙදෙමින් සුවසේ ජීවත් වේ. තමන් සමීපයට ශිල්ප ඉගෙනීම සඳහා එන්නා වූ අයට බත් වැටුප දුන්නේ ය. ඉක්බිතිව එක් පුරුෂයෙක් ඔහු සමීපයට පැමිණ මෙසේ කී ය. ආචාරීන් වහන්ස ! මටත් මේ ශිල්පය උගන්වනු මැනැවි. මට බත් වැටුප් අවශ්‍ය නැත. හෙතෙම ඒ පුරුෂයාට ශිල්පය දී හික්මවීය. හෙතෙම ශිල්ප උගෙන උගත් ශිල්පය විමසනු කැමැති ව, ගංතෙරට ගොස්, ගංතෙර වැඩසිටි සුනෙත්ත නම් වූ පසේ බුදුන් වහන්සේගේ හිසට ගලක් අතකුරු ගැසීමෙන් හිස බින්දේය. පසේ බුදුන් වහන්සේ ගං තෙරම පිරිනිවන් පෑ සේක. මිනිස්සු ඒ පුවත අසා එහිදී ම ගල් මුල් දඬු ආදියෙන් ගසා ඔහුගේ දිවි තොර කළහ. හෙතෙම කළුරියකොට අවීචි මහා නිරයේ ඉපිද බොහෝ වර්ෂ දහස් ගණනක් නිරයේ පැසී එම කර්මයාගේම විපාක වශයෙන් මෙම බුද්ධොත්පාදයෙහි රජගහ නුවරට නුදුරුව ප්‍රේතයකු වී උපන්නේ ය. ඔහුගේ කර්මයට සරිලන විපාක වශයෙන් අකුසල කර්ම වේගයෙන් ඔසවන ලදුව, පෙරවරුයේ ද, මධ්‍යාහ්නයේ ද, සවස් කාලයේ ද යකඩ කුළු සැට දහසක් හිස මතුපිට වැටී සුන් බුන් වූ හිස ඇති ව ඉතා බලවත් වේදනාවට පැමිණ බිම වැටෙයි. යකුළු පහර වැදීම අවසන් වූ විගස ප්‍රකෘති සිහි ඇතිව, තිබූ පරිදි හිසින් යුතුව සිටි යි. එක් දවසක් ආයුෂ්මත් මහා මුගලන් ස්ථවිරයෝ ගිජුකුළු පව්වෙන් බසිද් දී මේ ප්‍රේතයා දැක මේ ගාථාවෙන් කරුණු විචාළේ ය.

ඔබ උමතු ස්වභාව ඇත්තෙකු මෙන් ද, බියට පත් වූ මුවෙකු මෙන් ද කුමක් හෙයින් ඔබ මොබ දුවයි ද? නිසැක වම පව්කම් ඇත්තෙකි. කුමක් හෙයින් නාද කරමින් කෑ ගසමින් හැසිරෙන්නේ ද?

එහි **උම්ම ත්ත රූපො වා** - යනු උමතු වූවාක් මෙන්, උමතු බවට පැමිණියාක් මෙනි, **මිගො භන්තාවධා වසී** - යනු බියටපත් වූ මුවෙකු මෙන්, එහා මෙහා දුවයි. හෙතෙමේ වනාහි යකුළු පහර හිසෙහි වැටෙන කල්හි ද, ආරක්ෂාවක් නො දකින්නේ, ඒ පහර වළක්වාගනු රිසියෙන් ඔබ මොබ දුවයි. එසේ වුවත් අකුසල කර්ම වේගයෙන් ඔසවන ලදු ව කොහේ හිටියත් යකුළු පහර හිස මත්තෙහි වැටේ ම ය. **කින්නු සද්දා යසෙ තුවං** කුමක් නිසා ඉතා දුක් බව හඟවන ශබ්දයක් කරමින් හැසිරෙන්නේ ද? ඒ අසා

ප්‍රේතයා මෙසේ ගාථා දෙකකින් පිළිතුරු දුන්නේ ය.

ස්වාමීනි ! යමලෝකය නමින් හඳුන්වන ප්‍රේත ලෝකයෙහි උපන්නා වූ මම ප්‍රේතයෙක් වෙමි. මිනිසකුව සිටින කල කරන ලද පාප කර්ම හේතුවෙන් මෙසේ ප්‍රේත ලෝකයෙහි දුගතියෙහි උපත ලද්දෙමි.

මගේ හිසෙහි අනූන වූ යකුළු පහර හැටදහසක් හැම දිසාවකින්ම වැටෙත්, ඒ යකුළු පහර මගේ හිස පොඩි කරත්. බිඳ දමති.

මෙහි, **සට්ඨිකූට සහස්සානි** - හැට දහසක් පමණ වූ කුළු ගෙඩි පහරවල් **පරිපුණ්ණානි** - යනු අඩු නැති ව, **සබ්බසො** - හැම පැත්තෙන් ම, වැටේ ඒ ප්‍රේතයාට යකුළු පහරවල් හැට දහසක් වදින්නට තරම් මහත් වූ විශාල වූ පර්වත කූටයක් පමණ හිසක් ඇත්තේ විය. ඒ හිසෙහි අස් ලොමක් බහාලන තරම් වත් ඉඩක් නො තබා ඔහුගේ හිස මතුපිට යකුළු පහර වදී. එයින් ඔහුගේ මස්තකය බිඳෙයි පොඩි වේ ඒ නිසා මහත් හඬ දී ශබ්ද කරයි. **සබ්බසො සීසෙ මය්හං නිපතන්ති, තෙ භින්දන්ති ච මත්ථකන්ති** - යනු එහෙයින් කියන ලදී. ඉක්බිති ව ස්ථවිරයන් වහන්සේ ඔහු විසින් කළ කර්මය විචාරමින්

ඔබ ඔබගේ කය වචනය සිත යන මේ තිදොරින් කවර පාප කර්මයක් කළේ ද? කවර කර්ම විපාකයකින් මෙවන් දුකකට පැමිණියේ ද?

එකක්වත් අඩු නැතිව සැට දහසක් යකුළු පහරවල් වැදී, තොපගේ හිස බිදී ය යි. මස්තකය පොඩි වේ.

මේ ගාථා දෙක වදාළහ.

එවිට ප්‍රේතයා තමන් විසින් කරන ලද අකුසල කර්මය පැහැදිලි කරමින් මේ ගාථා තුන කීහ.

වඩන ලද ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් ඇතිව, ගසක් මුල භාවනානු යෝගීව වැඩ සිටි, බිය නැත්තා වූ සුනේත්‍ර නම් පසේ බුදුන් වැඩ සිටිනු මම දුටුයෙමි.

උන්වහන්සේ ගේ හිස ගල් විදුම් පහරකින් පොඩි කළෙමි. ඒ අකුසල කර්මයේ විපාකයෙන් මේ දුක මට පැමිණියේ ය.

නො අඩු වූ සැට දහසක් යකුළු පහරවල් හැම පැත්තෙන්ම, මගේ හිසට වදී, එයින් මගේ හිස පොඩි වෙත්.

එහි **සම්බුද්ධස්ස** - යනු පසේ බුදුන්, **සුනෙත්තං**, යන සුනේත්‍ර නම් වී **භාවිතින්ද්‍රියං** - ආර්ය මාර්ග භාවනාවෙන් වැඩුණු ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් ඇති, **සාලිත්ත කප්පහාරෙන** - යනු ගල් දුන්නෙහි ඇඟිලි තබා ගල් විදීම හෝ ගල් වලින් අතකුරු ගැසීම, සාලිත්තක යයි කියනු ලැබේ. සාලිත්තකප්ප හරණෙන යනු ද සමහර තැනක හින්දිස්සන්ති - බිඳෙන්නේ ය. (පොඩි වන්නේ ය)

ඒ අසා ස්ථවිර තෙමේ තමා විසින් ම පෙර කරන ලද කර්මයට අනුරූපව, දූන් තමා විසින් ම එහි ඵල විපාක විඳිනු ලැබේ. ඒ කර්මයාගේ විපාක දූන් ලබා ඇත. එය දක්වමින්.

නින්දිත පුරුෂය ඔබට ධර්මානුකූලවම, සුදුසු පරිද්දෙන්ම විපාක දී ඇත. අඩුවක් නැතිව සැටදහසක්මවූ, හාත්පසින් වදින්නා වූ යකුළු පහරවලින් තොපගේ හිස බිඳේ, මස්තකය පොඩි වේ. යන අවසාන ගාථාව කීහ.

එහි, **ධම්මෙන** - යනු සුදුසු වූ කාරණයෙන් ම තෙ, නුඹ එකල්හි පසේ බුදුන් වහන්සේට අපරාද කිරීමෙන් තොප විසින් කරන ලද පාප කර්මයාගේ, සුදුසුම වූ මේ විපාකය ඵලය තොප වෙතම පමුණුවන ලද්දේ ය. එහෙයින් කිසියම් දෙවිකෙනෙකු විසින් හෝ, මාරයෙකු විසින් හෝ බ්‍රහ්මයකු විසින් හෝ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් හෝ මෙය වළක්වන්නට නො පිළිවන් වන්නේ යයි දූක්වීය.

මෙසේ වදාරා ඉන්පසු පිඬු පිණිස හැසිර කරන ලද බත්කිස ඇත්තේ, (දානය වළඳා) සවස් වේලෙහි ශාස්තෲන් වහන්සේ වෙත එළඹ මේ පුවත භාග්‍යවතුන් වහන්සේට සැළකළේ ය. භාග්‍යවතුන් වහන්සේ ඒ අර්ථය අර්ථෝත්පත්ති කොට ගෙන සිව් පිරිසට ධර්මය දේශනා කරන්නේ, පසේ

බුදුවරුන්ගේ ගුණානුභාවය ද, කර්මයන් වඳ නො වන බව ද, ප්‍රකාශකළ සේක. මහා ජනයා සංවේගයට පැමිණියේ ශ්‍රද්ධාව උපදාව පව්කම් බැහැර කොට දන් දීමාදී පුණ්‍ය කර්මයන් හි නියැලුණේ වූවාහු ය.

සට්ඨිකූට සහස්ස ප්‍රේත වස්තු වර්ණනාව
නිමියේ ය.

——//——

## සතර වෙනි මහාවර්ග වස්තු වර්ණනාව මෙතෙකින් සමාප්ත යි.

## පේතවත්ථු අට්ඨකථාව නිමියේය.

# සූචිය


අ

අකුසලකර්ම 210-213
අඞ්කුර 118 -119 - 120 - 121
අඞ්ගුත්තර නිකාය 03
අගතිගාමී නොවී 160
අඟපසඟ 157
අඟපසඟින් නික්මෙන බැබළීම 126
අඟුපළඳනා 210- 155 -156
අජරාමර 101-102
අජාතසත්ත 112-113
ආජානීය 216-233
අඩමස්සක් 198
අද්භූත 213
අඳබාල 262-263
අධර්මය 231
අධිශීල 262
අන්ධක වින්ද 111
අනභිමුඛයෙහි 14
අනර්ථය 263
අනාචාර අකුසලය 157
අනිෂ්ට 63
අනුත්තර 01
අනුමෝදන් 89
අනුගාමිකව යන්නා වූ 173
අනුගත 203
අනුරුද්ධ තෙරුන් 137
අනුසාවියට සුදුසු 152
අනුසාසනා 203
අනුමෙවෙණි බණ 19
අනේපිඬු සිටු 19
අබතෙල් 195
අබවලින් දුම් ඇල්ලීම 194
අභිසම්බුද්ධ ගාථා 103
අභිවාදනය 214
අතිසංස්කාර 229
අඥානයෝ 226-22
අම්බ සක්ඛර 230
අර්හත් ඵල සමාපත්තිය 263
අරණ විහාරී 228
අරුණුවන් මැටි 217
අමානුෂික 207
අමුරන් 108
අමුසොහොන 195
අමෘත පදය 205
අල්පේච්ඡ 229
අල්ලපාණි 121
අවයව 157-156
අවිද්‍යමාන 226
අවීචිමහා නරකය 55-56
අසය්හ 122
අර්ධ උපෝසථය 209

ආ

ආකීර්නවී 90
අක්‍රෝෂ කිරීම 62
ආගන්තුක භික්ෂුව 14
ආඪ්‍ය වූ 04
ආත්ම භාවය 09-114
ආත්මය තැවීම 12
ආඥ වූ 04

ආයුසංස්කාර 209
ආර්ය සඞ්ඝයා 115
ආර්ය පුත්‍රය 148
ආශ්චර්යමත් වූ 213
ආවාසය 14

ඇට සැකිල්ල 152-157
ඇවිට්ලි කරන 149
ඇතුල් වීථිය 100
ඇස්මල 193-194

ඉ

ඉඳුරන් 80
ඉන්දික දෙවියා 136-137
ඉන්ද්‍රිය සංවරය 228
ඉසිපතනාරාමය 60
ඊර්ෂියාවෙන් 88

උ

උකුසු 194
උඩු ගංබලා යනවිට 153
උත්තරා පථය 116
උතුම් දම්සක් ඇත්තේ 188
උතුරු සළුව 53
උදරාග්නිය 35-36
උපද්‍රවය 217
උපන් වේලාව 194
උපසාගර 116
උපාධ්‍යායයන් 228
උබ්බරී 101
උපොශථය 236
උලතබව 216

ඌරු මුව 13

ඒ

ඒරකච්ඡ නගරය 105
ඒරක රජු
ඓශ්වර්යයෙන්

ඕසධී තාරකාව 88
ඖෂධ 89-100-193

ක

2. ක්ෂේත්‍ර සම්පත් 193
1. ක්ෂිණාශ්‍රව 07

කපිල නුවර 154
කම්පිල්ල රට 159
කම්බිලි 73
කර්න මුණ්ඩ විල්තෙර 151
කර්මස්ථාන 64
කලන්දක නිවාප 04
කවුඩෝ 193
කසාවත් වස්ත්‍ර 23
කසීරට 65
කසීසළු 88
කහඹිලියා 89
කරණමුණ්ඩ ප්‍රේතිය 157
කර්කශ 237

කායද්වාර 11-12-36-40
කාය බලය 32
කාසි පුර 22

කිතවස්ස රජු 174
කිම්බිල නුවර 150

කිරි මව් 19

කිසිවකු කෙරෙන් බියක් නැති 80

කුණ්ඩි නුවර 174
කුඹුරක් නොවූ තැනක 137
කුලිකයෙක් 194
කුළුපග 265
කුහරය 207

කූටාගාරයෙහි 204
කෙළෙඹියා 38-41-42-210
කෙහෙල් මුවසම් 154
කේලාම් කීම 15-17
කෛරාටික 207

කොටු ගෙවල් 134
කොඳු පලස් 154
කොබෝලීල 166
කොටු පිළි 75
කොස්වාළිහිණි 154

කෝලීය අමාත්‍ය 123
කෝසෙය්‍ය වස්ත්‍ර 75

කෘශවී 196
කෘෂ්ණ ගෝත්‍ර 98

ඛජ්ජ භෝජ්ජ 27
ඛල්ලාටිය 57-108
ඛෙත්තූපමා 07

ග

ගණිකාවකගේ කුස 194
ගන්ධබ්බ කාරික 123
ගර්භ පාතනය 37

ගැබ් මළ 170
ගැබ හෙළීමේ කර්මය 41
ගුල් සමූහය 48

ගිජුළිහිණි 193

ගෙය්‍ය 03
ගෘහසන්ධි 04

ඝත පණ්ඩිත 97-102

ච

චතුරංගයෙන් යන 176
චිරං ජීවන්තු 29
චුන්දත්තීක ගම 167
චූලනී බ්‍රහ්මදත්ත 159

ජ

ජනපදයෙන් ජනපදයට 159
ජන සමූහයා 194-195
ජාතකර්මය 194
ජේතවනාරාමය 50

ත

තපෝ ගුණ 101
තව්තිසා දෙව්ලොව 136
තල කැරලි 57
තල මුරුවට 55

තිරීයේ 194
තිරෝකුඩ්ඩ 22
ත්‍රිපිටකය 02
ත්‍රිවිද්‍යා 226

ද

දක්ෂිණාර්හයන් 28- 112
දත්වැට 122
ද්වාරවතී නගරය 92
දරු ගැබ 34-36-39- 40
දරුවගේ පියා 88
දස බෑ රජුන් 97
දස දහසක් ලෝකධාතු 137
දශ රාජධර්මය 154

දිවිරීම 34-40- 151
දිව්‍ය සම්පත් 194
දිව්‍ය ඍද්ධි 194

දුර්වර්න දකුම් ඇත්තී 93
දුස්සීල කර්මය 111
දුශ්චරිත 36
දෛව්‍ය ධර්ම 95
දෙවඟන 57
ද්‍රවිඩ ප්‍රදේශයේ 134

ධනධාන්‍ය 63-64
ධර්මචක්‍ර ඇත්තේ 105- 158
ධර්ම චක්‍ර සූත්‍ර දේශනාව 91
ධූර්තයෝ 150
ධෘතරාෂ්ට්‍ර හංසරජු 169

න

නග්න 39- 52
නගර ගුත්තික 05
නගර වැස්සෝ 21
නඟුල් උඩතබා 134
නන්ද සේන 93
නය ක්‍රමය 02
න්‍යාය යුක්ති ධර්මය 208
නහර වැල් 88

නාරද 12-13
නැකතේ 194
නිරෝධය 219
නිහීන කුලයන් 172
නුවාම 77

ප

පක්ෂි සමූහයා 193
පඤ්ච කාම සම්පත්තිය 92
පඤ්චාංගික තූර්ය වාදන 204
පඤ්චවිධ බන්ධන 221
පරපුරුෂ සේවනය 153
පර්යාප්ති ධර්මය 02
පර්යඞ්කය 197
පරිචාරිකාවෝ 208
පරිබව කරන්නී 93
පරිභෝග 234
පසලොස්වරණ ධර්ම
පාන භෝජන 28

පැඳුම් දෙස 78

පිඟුවන් ඇස් ඇත්තී 93

පිට්ඨධී තලිකා 21
පිනඩ පාතය 263
පින් කෙත 133
පිසුණා වාචා 209

පුතාගේ පියා 88
පුනර්භව 66- 195
පුරෝහිතයා 264
පුලත්නත් 81

පූතිමුඛ 13
පූයා ලේ 47- 48
පූයා වෙත් 41

ප්‍රකෘති 230
ප්‍රපංච 202
ප්‍රසාදය 282-204
ප්‍රඥා 01
ප්‍රාතිමෝක්ෂ සීලය 216

බ

බත් වැටුප් 159
බද්ධ වෛර 202
බාධාවක් නොවීය 135
බාහු වළලු ඇති 207
බෙදා වෙන්කරත් 135

භේරුව නුවර 123

ම

මගධ රට 23
මගධ රජු 32
මඞ්ගල විධි 194

මතකදත් 275
මදයෙන් 89
මරණානුස්මෘතිය 69
මරු කතර 104
මල්ලිකා දේවී
මස්වැදල්ලක් 194
මසුරන් දහසක් 150
මසුරුමළ 109
මහාකාරුණා සමාපත්තිය 65
මහා රථ 160
මහා සාගර රජු 115

මාණාවකයෙක් - 204
මැසිරිය 93
මිථ්‍යා දෘෂ්ටි 71
මිත්‍ර ප්‍රතිරූපකයන් 266

මී මුතුන් 111

මුගලන් 265
මුඩු මහණ 263

මානයෙන් 89

මෝක්ෂයක් 108

ය

යාචක ජනයා 129
යාචකයන් 130- 133
යුගල 226

ර

රත්හැල් 187
රාජපුත්‍රයා 264
රුචිකර 63
රෝහණෙයා ඇමති 97

ල

ලාමකයකු 117
ලාමක විතර්කය 194
ලාමක පාප කර්මය 15
ලිච්ඡවී 228
ලෝකුඹු නරකය 238-284-285

ව

වත්‍යු දේවතා 10- 26
වහදූලි නැති 93
වංචනික 207
වාග් ද්වාරයෙන් 11
වාග් දුශ්චරිත 49

විකල වූවකු 04
විචාරත්ත්‍ර 220
විචි කිච්ඡා 227
විද්‍යා ඥානයෙන් 100
විධිවංසනය 226
වින්ධයා අඩවිය 48
විනිශ්චය 02
විපත්තියකි 193
විපිළිසර 212
විමානය 52
විමාන ප්‍රේතිය 55- 149
විමාන ප්‍රේත 145-147
විස්තරාර්ථ 02

ව්‍යාපාරයන් 198
විලාපකීම 20
වෙයාකරණ 03

වෛඩූර්ය 105
වෛශ්‍ය 50
වෛශ්‍රවණ 20
වෛජයන්ත ප්‍රාසාදය 170
විශාඛ සිටුවරයා 241
විපරීත දර්ශන ඇති 248

ස

සක්වළලු 154- 155
සත් වැදූරුම් මහවිල් 157
සතරවිධි උපධි 226
සතර මාර්ග 246
සතර ඵල 01
සන්තර්පනය 114
සපත්නී 37
සබ්බ චතුෂ්ක යාගය 284
සපථ 37
සප්තකායයන් 244
සම්පත් - සම්පත්මදය 25-262
සම්‍යක් දෘෂ්ටිය 226
සමාධි
සන්නාලියෙක් 159
සරණ සිල්හි පිහිටා 141
සර්ප ජාතීන් 193
සහමුලින් 118
සහලේ ක්‍රතීනි 39- 40

සහභාවයට ගිය 125-185-195
සමෘද්ධියට 88
සාන්දෘෂ්ටික 277
සාමණෙරයන් 62- 64
සාමුක්කංසික 42

සින්ධක 129
සිව්පසයෙන් 265- 234
සිව්වරම් මහරජුන් 19
සිව්සස් 264

සුචරිත 237
සුගතිය 92
සුදු නෙළුම් 155
සුන්දරිය 89
සුනෙත්ත 174- 263
සූකර මුඛ 12

ස්වර්ණජොති පංක්තිය 134
ස්තූප පූජාව 211
ස්වදාර පරිහරණය 285
සේනාසන 234

1. සංකිච්ච තෙරුන් 66
2. සංකල්පයකින්
3. සංගීතිකාරක 198
7. සංසාරය 164
8. සංසාර මෝචක 72
5. සංවිභාග 233
6. සංවේගාත්මක 213
4. සංයමයෙන් 205
9. සංක්ෂේපාර්ථ 202

සාංදෘෂධීක 231

හැල් වී 187
හෝම පූජා 100



THE BO-TREE AT ANARAJAPOORA.

ටෙනන්ට් 1859

හදන්ත බුද්ධඝොෂාචාය්‍ය්‍යපාදයන් අනුරාධපුර
ශ්‍රී මහා බෝධිය අසල ප්‍රදේශයෙහි වැඩවසමින්
සිහළට්ඨකථා පාලියට පරිවර්තනය කළ බව
බොහෝදෙනාගේ විශ්වාසයයි

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737
විද්‍යුත් තැපැල: bcc456@sltnet.lk, info@buddhistcc.com
www.buddhistcc.com

ISBN 978-955-1604-13-4